185 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 185 - இல. 2
**Volume 185 - No. 2**

2009 නොවැම්බර් 04 වන බදාදා
2009 நவம்பர் 04, புதன்கிழமை
**Wednesday, 04th November, 2009**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

**OFFICIAL REPORT**

(අශෝධිත පිටපත/பிழை திருத்தப்படாதது/**Uncorrected**)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා සම්මුඛ පරීක්ෂණයකට කැඳවීම

**වරප්‍රසාද :**

2009.10.22 දින විකාශය කරන ලද "පත්තර සිරස්තල" වැඩසටහනේදී කළ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

හෙළ උදාව ජාතික ව්‍යාපාරය [සංස්ථාගත කිරීමේ] – [ගරු (පූජ්‍ය) අක්මීමණ දයාරතන හිමි]- පළමු වන වර කියවන ලදී

පුරාවස්තු සුරැකීමේ සංවිධානය [සංස්ථාගත කිරීමේ] – [ගරු අන්ජාන් උම්මා මහත්මිය]- පළමු වන වර කියවන ලදී

**අතුරු සම්මත ගිණුම (2010):**

විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**

ඇමෙරිකා එක්සත් ජනපදය ජනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් කරුණු විමසීමට උත්සාහ කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

அமெரிக்க உள்துறைப் பாதுகாப்புத் திணைக்களத்தினால் ஜெனரல் சரத் பொன்சேகா நேர்காணலுக்கு அழைக்கப் பட்டமை

**சிறப்புரிமை:**

2009.10.22ஆம் திகதி ஒலிபரப்பப்பட்ட 'பத்தர சிரஸ்தல' நிகழ்ச்சியின்போதான கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

ஹெல உதாவ தேசிய இயக்கம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு (வண.) அக்மீமன தயாரதன தேரர்] – முதன்முறை மதிப்பிடப்பட்டது

தொல்பொருட்கள் பாதுகாக்கும் ஒழுங்கமைப்பு (கூட்டிணைத்தல்) – [மாண்புமிகு (திருமதி) அன்ஜான் உம்மா] – முதன்முறை மதிப்பிடப்பட்டது

**கணக்கு வாக்குப்பணம் (2010) :**

விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

ஐக்கிய அமெரிக்க இராச்சியம் ஜெனரல் சரத் பொன்சேகாவிடம் விசாரணை செய்ய முயற்சித்தமை

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Summons by US Department of Homeland Security to General Sarath Fonseka for an Interview

PRIVILEGE:

Comment Made in "Paththara Sirasthala" Programme Aired on 22nd October, 2009

PRIVATE MEMBERS' BILLS:

Hela Udawa National Movement (Incorporation) Bill – [The Hon. (Ven.) Akmeemana Dayaratana Thero] – Read the First time

Organization of Protection of Antiquities (Incorporation) Bill – [The Hon. (Mrs.) Anjan Umma] – Read the First time

VOTE ON ACCOUNT (2010):

Debate adjourned

ADJOURNMENT MOTION:

Attempts to Question General Sarath Fonseka by United States of America

2 — PL 004551 — 1,150 — (2009/11)

# පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2009 නොවැම්බර් 04 වන බදාදා
2009 நவம்பர் 04, புதன்கிழமை
Wednesday 04th November, 2009

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු වී.ජ.මු. ලොකුබණ්ඩාර මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு டபிள்யு. ஜே. எம். லொக்குபண்டார] தலைமை வகித்தார்கள்.
*The Parliament met at 9.30 a.m.,* MR . SPEAKER [THE HON. W.J.M. LOKUBANDARA] *in the Chair.*

# නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

## කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව 2009 ඔක්තෝබර් මස 30 වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ)

තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

# උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු මනෝ විජයරත්න මහතා (ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனோ விஜயரத்ன - தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mano Wijeyeratne-Minister of Enterprise Development)
ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2007 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2007 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

## අල්හාජ් එස්.එම්.එම්. හුසේන් පුණ්‍යාය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
அல்ஹாஜ் எஸ்.எம்.எம். ஹுஸைன் தரும நம்பிக்கைப்பொறுப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்
AL HAJ S.M.M. HUSSAIN CHARITABLE TRUST (INCORPORATION) BILL

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு இரா. சந்திரசேகர் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Ramalingam Chandrasekar - Deputy Chairman of Committees)
கௌரவ சபாநாயகர் அவர்களே, அல்ஹாஜ் எஸ்.எம்.எம். ஹுஸைன் தரும நம்பிக்கைப் பொறுப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம் பற்றிய "பி" நிலையியற் குழுவின் அறிக்கையையும் கூட்ட அறிக்கையையும் நான் சமர்ப்பிக்கின்றேன்.

**"அறிக்கை**

சட்டவரைஞரால் செய்யப்பட்ட திருத்தங்களுடன்கூடிய 'அல்ஹாஜ் எஸ்.எம்.எம். ஹுஸைன் தரும நம்பிக்கைப்பொறுப்பு (கூட்டிணைத்தல்)' சட்டமூலத்தை குழு பரிசீலித்து இணைக்கப்பட்டுள்ள மறுபதிப்பில் திருத்தப்பட்டவாறு ஏற்றுக்கொண்டுள்ளது."

***පනත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2009 නොවැම්බර් 05 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***
*சட்டமூலம் நிலைக்குழு "பி" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2009 நவம்பர் 05 வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*
*Bill, as reported by Standing Committee "B", to be considered upon Thursday, 05th November, 2009.*

## මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
மஹிந்தானந்த அலுத்கமகே மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
MAHINDANANDA ALUTHGAMAGE FOUNDATION (INCORPORATION) BILL

**ගරු සුජාතා අලහකෝන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுஜாதா அழஹக்கோன்)
(The Hon. (Mrs.) Sujatha Alahakoon)
ගරු කථානායකතුමනි, "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ "ඒ" ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

**"වාර්තාව**

'මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2009 නොවැම්බර් 05 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***
*சட்டமூலம் நிலைக்குழு " ஏ " இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2009 நவம்பர் 05, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*
*Bill, as reported by Standing Committee "A.", to be considered upon Thursday, 05th November, 2009.*

## ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

இலங்கை கருத்திட்ட முகாமையாளர் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

INSTITUTE OF PROJECT MANAGERS SRI LANKA (INCORPORATION) BILL

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, "බී" ස්ථාවර කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ "බී" ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත. "

***පනත් කෙටුම්පත "බී ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2009 නොවැම්බර් 05 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு " பி" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2009 நவம்பர் 05, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "B", to be considered upon Thursday, 05th November, 2009.*

## පෙත්සම්

மனுக்கள்

PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.
ගරු පියසිරි විජේනායක මහතා - පැමිණ නැත.
ගරු සී.ඒ. සූරියආරච්චි මහතා - පැමිණ නැත.

**ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(மாண்புமிகு சரத்சந்திர ராஜகருணா)
(The Hon. Sarathchandra Rajakaruna)

ගරු කථානායකතුමනි, මම මොරටුව, අඟුලාන, දුම්රිය පොළ පාර, නවෝදා උද්‍යානය, අංක 128/30 දරන ලිපිනයෙහි පදිංචි ඒ.එච්.එස්.ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්. දිවෙල්ගම මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Vajira Abeywardena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(i) ගාල්ල, මහින්ද මාවත, අංක 22/1, දරන ලිපිනයෙහි පදිංචි ජී. ජනිතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(ii) මීගොඩ, වටරැක පරණ පාර, අංක 36/1 දරන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. මහින්ද ගාමිණී මහතාගෙන් ලැබුණු පෙත්සම;
(iii) බදුල්ල, බදුලුඔය, කන්දකැපුල්පත, සයිපන් එක ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ඩිංගිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;
(iv) ගාල්ල, මහ නගර සභාවේ ආරක්ෂක අංශයෙහි සේවය කරන ජී.ජී. සෝමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම;
(v) අවිස්සාවේල්ල, තල්දුව, කිරිඅම්මලාකන්ද පාර, අංක 717 දරන ලිපිනයෙහි පදිංචි එම්.ජී. චන්දන ලසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(vi) ගාල්ල, පනන්ගල, එප්පල, අංක 59 දරන ලිපිනයෙහි පදිංචි කේ.එච්. ගුණදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චන්ද්‍රසේන විජේසිංහ මහතා**
(மாண்புமிகு சந்திரசேன விஜேசிங்ஹ)
(The Hon. Chandrasena Wijesinghe)

ගරු කථානායකතුමනි, මම ගාල්ල, මාගාල්ල, හීරළුගොඩ, ශ්‍රී සුධර්මාරාම පාර පදිංචි රොෂාන් වීරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

## පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ගැනීම : ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු

பிலியந்தல மத்திய மகா வித்தியாலயம் : புலமைப்பரிசில் பரீட்சைப் புள்ளிகள்

ADMISSION OF STUDENTS TO PILIYANDALA CENTRAL COLLEGE : MARKS SCORED AT SCHOLARSHIP EXAMINATION

0274/'09

1. **ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට (ජාතික පාසල) 2009 වර්ෂයේ 6 වැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමට 5 ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු පිළිවෙළ අනුගමනය කළේද;

(ii) 2009 වර්ෂයේ 6 වැනි ශ්‍රේණියට ඇතුළත් කර ගත් ළමුන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන්, ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි පාසල සහ ලබා ගත් ලකුණු සංඛ්‍යාව කොපමණද;

(iii) පෝෂිත පාසල් ලෙස ප්‍රමුඛස්ථානය ලබා දෙන ප්‍රාථමික පාසල් තිබේ නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හමුදා ක්‍රියාන්විතයේ යෙදී සිටින අයගේ දරුවන් කොපමණ සංඛ්‍යාවක් ඒ අතරේ සිටීද;

(ii) එලෙස ඇතුළත් වීමට ඉල්ලුම් කර, එහෙත් පාසලට ඇතුළත් කර නොගත් දරුවන් සංඛ්‍යාව, එම දරුවන්ගේ නම් හා ශිෂ්‍යත්ව විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු පිළිවෙළ සැලකිල්ලට නොගෙන පාසලට ඇතුළත් කර ගෙන ඇති දරුවන් හා ඔවුන් ලබා ගෙන ඇති ලකුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස ඔවුන් ඇතුළත් කර ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009 ஆம் ஆண்டில் பிலியந்தல மத்திய மகா வித்தியாலயத்தின் (தேசிய பாடசாலை) 6ஆந் தரத்திற்கு மாணவர்களைச் சேர்த்துக்கொள்ளும் பொருட்டு ஆண்டு 5 புலமைப் பரிசில் பரீட்சையின் புள்ளிகள் முறை கடைப்பிடிக்கப்பட்டதா என்பதையும்,

(ii) 2009ஆம் ஆண்டில் 6ஆந் தரத்திற்குச் சேர்த்துக் கொள்ளப்பட்ட மாணவர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள், முகவரி, புலமைப்பரிசில் பரீட்சைக்குத் தோற்றிய பாடசாலை மற்றும் பெற்ற புள்ளிகள் யாவையென்பதையும்,

(iii)போசிக்கப்படுகின்ற பாடசாலைகள் என்ற வகையில் முன்னுரிமை வழங்கப்படுகின்ற பாடசாலைகள் இருப்பின் அவை யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இவர்கள் மத்தியில் இராணுவ நடவடிக்கையில் ஈடுபட்டுள்ளவர்களின் பிள்ளைகள் எத்தனை பேர் உள்ளனரென்பதையும்,

(ii) இவ்விதமாகச் சேர்த்துக்கொள்ளப்பட விண்ணப்பித்த போதிலும் பாடசாலைக்குச் சேர்த்துக்கொள்ளப்படாத பிள்ளைகளின் எண்ணிக்கை, அப்பிள்ளைகளின் பெயர்கள் மற்றும் புலமைப்பரிசில் பரீட்சையில் பெற்ற புள்ளிகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(இ) (i) புலமைப்பரிசில் பரீட்சைப் புள்ளிகளின் வரிசைக் கிரமத்தைக் கருத்திற்கொள்ளாமல் பாடசாலைக்குச் சேர்த்துக்கொள்ளப்பட்டுள்ள பிள்ளைகள் அத்துடன் அவர்கள் பெற்றுள்ள புள்ளிகள் யாதென்பதையும்,

(ii) இவ்விதமாக இவர்கள் சேர்த்துக்கொள்ளப்பட்டமைக்கான காரணங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(*a*) Will he inform this House-

(i) whether order of merit at the Grade Five Scholarship Examination was followed in admitting students to Grade 6 of Piliyandala Central College (National School) in 2009;

(ii) the number of students admitted to Grade 6 in 2009, their names, addresses, schools from which they sat for the scholarship examination and the marks scored; and

(iii) the names of primary schools given priority as catchment schools, if any?

(*b*) Will he submit to this House-

(i) the number of children of those in military operations, among the said number; and

(ii) the number of children who had applied for admission, but not admitted, their names and marks scored?

(*c*) Will he state-

(i) the names of children admitted disregarding the order of merit and the marks scored; and

(ii) the reasons for such admissions?

(*d*) If not, why?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)

(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම් 01හි සඳහන් කර ඇත.

(iii) ඔව්. එම පාසල් වන්නේ

(1) පිළියන්දල අංක 01 කනිෂ්ඨ විද්‍යාලය

(2) සෝමවීර චන්ද්‍රසිරි කනිෂ්ඨ විද්‍යාලය

(3) මාම්පේ කනිෂ්ඨ විද්‍යාලය

(4) හැඩිගම සුදර්ශන කනිෂ්ඨ විද්‍යාලය

(ආ) (i) 1කි.

(ii) 3කි.

| *අනු අංකය* | *ශිෂ්‍යයාගේ නම* | *ලබා ගත් ලකුණු* |
|---|---|---|
| 01 | එච්.ඩී.කේ.එස්. ගුණසේකර | 84 |
| 02 | කේ.එම්. කාවින්ද පෙරේරා | 79 |
| 03 | බුද්ධික පසිඳු ගමගේ | 72 |

(ඇ) (i)

| *අනු අංකය* | *ශිෂ්‍යත්ව විභාගය සඳහා ඉදිරිපත් වූ පාසල* | *ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | පිළියන්දල අංක 01 කනිෂ්ඨ විද්‍යාලය | 122 |
| 02 | සෝමවීර චන්ද්‍රසිරි කනිෂ්ඨ විද්‍යාලය | 74 |
| 03 | මාම්පේ කනිෂ්ඨ විද්‍යාලය | 14 |
| 04 | හැඩිගම සුදර්ශණ කනිෂ්ඨ විද්‍යාලය | 02 |
| | | -------- |
| | | 212 |

ඉහත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නම් හා ලබා ගත් ලකුණු ඇමුණුම 02හි සඳහන් කර ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

ව්‍යාජ ලේඛනයක් මඟින් පාසලට ඇතුළත් කර ඇති ශිෂ්‍යයාගේ නම යූ.ඩී. ප්‍රභාත් අවිශ්ක වන අතර, ලබා ගත් ලකුණු සංඛ්‍යාව 77කි.

(ii) 1. අනුබද්ධ කර ඇති පාසල්වල සිසුන් වීම නිසා පාසලට ඇතුළත් කර ගෙන ඇත.

2. ව්‍යාජ ලේඛන මඟින් විද්‍යාලයට ඇතුළු වූ ශිෂ්‍යයා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

(ඈ) පැන නොනඟී.

* සභාමේසය මත තබන ලද ඇමුණුම්:
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annexes tabled :*

*Annex I*

**GRADE 5 SCHOLARSHIP SELECTION LIST - 2008 (SINHALA MEDIUM)**
**PARTICULARS OF STUDENTS SELECTED FOR PLACEMENT**

Piliyandala M.M.V. No. of Vacancies : 160 Cut-off Mark : XXX
Piliyandala No. Selected : 120

| *No.* | *Student Name* | *Index No.* | *Sex* | *Present School* | *Address* | *Marks* | *Bursary* | *Admission No.* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | SAMARAPPULI N.P.S. | 1205820 | M | Mahinda K.V. | Bokundara, Piliyandala | 133 | Yes | _ |
| 2 | JAYAKODY K.R.H.D. | 1600745 | M | Sri Saralankara M.V. | Kindelpitiya, Welmilla Handiya | 132 | Yes | _ |
| 3 | KODITHUWAKKU N.P. | 1178849 | M | Kottawa Dharmapala Model P.V. | Pelanwatta, Pannipitiya | 132 | Yes | _ |
| 4 | DISSANAYAKA M.D.S.D. | 1200585 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 131 | Yes | _ |
| 5 | SENANAYAKE P.U. | 1194593 | M | Piliyandala No. 1 K.V. | Piliyandala | 131 | Yes | _ |
| 6 | ABAYAKOON M.S.R.F. | 1200410 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 130 | Yes | _ |
| 7 | HASAN A.A.D.E. | 1258940 | M | Kahatuduwa W.N. Perera K.V. | Kahatuduwa, Polgasowita | 130 | Yes | _ |
| 8 | KURUKULASOORIYA G.P.S.S. | 1200852 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 130 | Yes | _ |
| 9 | WANITUNGE S.A. | 1110632 | M | Lumbini V. | Colombo 5 | 130 | No | _ |
| 10 | ABEYRATHNA P.K.I. | 1201255 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 129 | Yes | _ |
| 11 | CHATHURANGA W.M. | 1260847 | M | Wethara K.V. | Polgasowita | 129 | No | _ |
| 12 | HATHWELLA J.T. | 1260146 | M | Wethara K.V. | Polgasowita | 129 | Yes | _ |
| 13 | KALUBOWILA K.A.D.S.U. | 1201018 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 129 | Yes | _ |
| 14 | PATHIRATNE W.P.G.U. | 1195255 | F | Piliyandala No. 1 K.V. | Piliyandala | 129 | Yes | _ |
| 15 | RASHMIKA R.A.M. | 1200879 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 129 | Yes | _ |
| 16 | THAKSARA K.G.R. | 1199552 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 129 | No | _ |
| 17 | AMARASINGHE I.N. | 1257340 | F | Mattegoda Vidyadeepa M.V. | Hiripitiya, Pannipitiya | 128 | Yes | _ |
| 18 | KURUPPU M.S.S. | 1197479 | F | Piliyandala No. 1 K.V. | Piliyandala | 128 | No | _ |
| 19 | MADHUSHANI W.A.J. | 1259865 | F | Ambalangoda Siripathi V. | Ambalangoda, Polgasowita | 128 | Yes | _ |
| 20 | KODIKARA P.P. | 1260197 | M | Wethara K.V. | Polgasowita | 127 | Yes | _ |
| 21 | MADHUSHANI P.D.S.H. | 1201492 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 127 | Yes | _ |
| 22 | MADUSANKA J.P.A.D. | 1191900 | M | Hermann Gmeiner School | P.O.Box 05, Piliyandala | 127 | Yes | _ |
| 23 | RUPASINGHE S.D.K. | 1200860 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 127 | Yes | _ |
| 24 | WIJESINGHA D.R.P. | 1260987 | M | Wethara K.V. | Polgaswita | 127 | No | _ |
| 25 | HIDELLAGE H.H. | 1197207 | F | Piliyandala No. 1 K.V. | Piliyandala | 126 | No | _ |
| 26 | KANISHKA P.V. | 1200437 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 126 | Yes | _ |
| 27 | MADHAWA D.G. | 1199218 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 126 | No | _ |
| 28 | RANDIKA U.K.S. | 1199781 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 126 | No | _ |
| 29 | WIJESEKARA G.D.Y.R. | 1207792 | M | Sir John Kothalawala V. | Piliyandala | 126 | No | _ |
| 30 | ARACHCHI K.I.K. | 1195859 | M | Piliyandala No. K.V. | Piliyandala | 124 | No | _ |
| 31 | DE SILVA K.N.D. | 1176404 | F | Mahamaya Balika M.V. | Pepiliyana Road, Nugegoda. | 124 | Yes | _ |
| 32 | KAWINDI B.J. | 1198505 | F | Mampe K.V. | Piliyandala | 124 | Yes | _ |
| 33 | PERERA G.B.G. | 1195468 | F | Piliyandala No. K.V. | Piliyandala | 124 | Yes | _ |
| 34 | PERERA H.A.T.L. | 1601229 | F | Sri Saralankara M.V. | Kindelpitiya, Welmilla Handiya. | 124 | Yes | _ |
| 35 | SANDAMALI M.K.K. | 1582330 | F | Olaboduwa M.V | Gonapola Junction | 124 | Yes | _ |
| 36 | HEWAWALASMULLAGE S.T. | 1197223 | F | Piliyandala No1. K.V. | Piliyandala | 123 | No | _ |
| 37 | NAVOD N.G.A. | 1200453 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 123 | Yes | _ |
| 38 | NAYAR C.L. | 1580736 | F | Palannoruwa M.M.V. | Gonapola Junction | 123 | Yes | _ |
| 39 | PERERA M.N.R. | 1238167 | M | Rawathawatthe Methodist V. | Rawathawatthe, Moratuwa | 123 | No | _ |
| 40 | RANASANKA I.S. | 1196111 | M | Piliyandala No1. K.V. | Piliyandala | 123 | No | _ |
| 41 | RANAWEERA K.M.D. | 1195417 | F | Piliyandala No1. K.V. | Piliyandala | 123 | Yes | _ |
| 42 | RAVEENA H.A.R. | 1195379 | F | Piliyandala No1. K.V. | Piliyandala | 123 | Yes | _ |
| 43 | UDESHANI H.A.L. | 1178300 | F | Kottawa Dharmapala M.V. | Horana Rd, Kottawa | 123 | No | _ |
| 44 | ANURADHA G.G. | 1260510 | F | Wethara K.V | Polgasowita. | 122 | Yes | _ |
| 45 | GAMAGE S.C.W.V. | 1192302 | M | Hermann Gmeiner School | P.O. Box, 05, Piliyandala | 122 | No | _ |

| No. | Student Name | Index No. | Sex | Present School | Address | Marks | Bursary | Admission No. |
|---|---|---|---|---|---|---|---|---|
| 46 | HEWARUPPA H.H.A. | 1197274 | F | Piliyandala No1. K.V. | Piliyandala | 122 | No | _ |
| 47 | NISANSALA K.H. | 1201522 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 122 | Yes | _ |
| 48 | PATHIRAJA P.A.O.D. | 1195620 | M | Piliyandala No. 1 K.V. | Piliyandala | 122 | No | _ |
| 49 | SACHITHRA J.R. | 1201093 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 122 | Yes | _ |
| 50 | SEWWANDI H.D.C. | 1201239 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 122 | Yes | _ |
| 51 | SUDHIRA M.D.S. | 1199234 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 122 | No | _ |
| 52 | THARUKA N.J.P.D. | 1192230 | M | Hermann Gmeiner School | P.O. Box. 05, Piliyandala | 122 | No | _ |
| 53 | UDAYANGA V.I. | 1260111 | M | Wethara K.V. | Polgasowita | 122 | Yes | _ |
| 54 | WICKREMASINGHA R.T. | 1201484 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 122 | Yes | _ |
| 55 | BANDARA R.B.S.P. | 1582950 | F | Olaboduwa M.V. | Gonapola Junction | 121 | No | _ |
| 56 | GUNAWARDANA P.A.T.R. | 1199897 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 121 | No | _ |
| 57 | KAVINDA K.A.D.S. | 1194160 | M | Pilip Atigala M.V. | Madapatha | 121 | No | _ |
| 58 | KUMARA M.D.S.D. | 1200950 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 121 | Yes | _ |
| 59 | PERERA K.P.S. | 1597710 | F | Sri Saddhatissa M.V. | Walgama, Bandaragama | 121 | Yes | _ |
| 60 | PERERA K.P.S. | 1583344 | M | Sri Sumanajothi P.V. | Ingiriya | 121 | Yes | _ |
| 61 | SADEESHANI W.O.J. | 1195409 | F | Piliyandala No. 1 K.V. | Piliyandala | 121 | Yes | _ |
| 62 | ABEYKOON T.U. | 1259687 | M | Ambalangoda Siripathi V. | Ambalangoda, Polgasowita | 120 | Yes | _ |
| 63 | CHANUKA J.M.H. | 1199749 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 120 | No. | _ |
| 64 | DAMAYANTHI J.P.K. | 1601199 | F | Sri Saralankara M.V. | Kindelpitiya, Welmilla Handiya | 120 | Yes | _ |
| 65 | DAPE W.R.P. | 1208268 | M | Sir Jhon Kothalawala V. | Piliyandala | 120 | No. | _ |
| 66 | DHANANJAYA A.D.M. | 1600516 | M | Sri Saralankara M.V. | Kindelpitiya, Welmilla Handiya | 120 | Yes | _ |
| 67 | LAKSHANI A.C. | 1209957 | F | Dharmasena Atigala B.M.V. | Kesbewa, Piliyandala | 120 | Yes | _ |
| 68 | MALSHANI K.D.B. | 1201573 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 120 | Yes | _ |
| 69 | PERERA U.A.O. | 1226479 | M | Lalith Athulathmudali M.V. | Hena Road, Mount Lavinia. | 120 | Yes | _ |
| 70 | PIYUMAL M.V.D.E. | 1200402 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 120 | Yes | _ |
| 71 | RANAWEERA U.G. | 1191993 | M | Hermann Gmeiner School | P.O. Box. 05, Piliyandala. | 120 | Yes | _ |
| 72 | YAPA Y.A.P.H. | 1161652 | M | Chandrarathna Manawasingha V. | Ambagahapura, Boralasgamuwa. | 120 | Yes | _ |
| 73 | BANDARA S.M.M.H. | 1196537 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | No | _ |
| 74 | DHANANJAYA K.K.D.H. | 1194860 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | Yes | _ |
| 75 | DILSHAN W.V.A.C. | 1162039 | M | Chandrarathna Manawasingha V. | Ambagahapura, Boralasgamuwa. | 119 | No | _ |
| 76 | FERNANDO S.S.A. | 1196120 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | No | _ |
| 77 | FONSEKA W.H.N.R. | 1192124 | F | Hermann Gmeiner School | P.O. Box. 05, Piliyandala. | 119 | Yes | _ |
| 78 | GOMAS S.G.G.M.D. | 1207440 | F | Sir John Kothalawala V. | Piliyandala | 119 | Yes | _ |
| 79 | KALUBOWILA M.M. | 1201182 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 119 | Yes | _ |
| 80 | KAUSHALYA K.A.S. | 1209922 | F | Dharmasena Atigala B.M.V. | Kesbewa, Piliyadala. | 119 | Yes | _ |
| 81 | KULARATHNA B.D.C.I. | 1196588 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | No | _ |
| 82 | KULATHUNGA M.K.D.V. | 1194933 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | Yes | _ |
| 83 | MADHURANGA W.S.L.V. | 1194771 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | Yes | _ |
| 84 | NAWANJANEE W.N. | 1259350 | F | Olaboduwa Zoysa M.V. | Koralaima, Gonapola Junction. | 119 | Yes | _ |
| 85 | NETHSARA T.H.N. | 1203126 | M | Erewwala East Dharmapala V. | Pannipitiya | 119 | Yes | _ |
| 86 | PEIRIS H.R.D.N.A. | 1196855 | F | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | No | _ |
| 87 | PERERA L.M.D. | 1574000 | M | Thakshila M.V. | Horana | 119 | Yes | _ |
| 88 | RANASINGHE S.N. | 1598341 | F | Bandaragama M.M.V. | Bandaragama | 119 | Yes | _ |
| 89 | SAMADHI I.L. | 1198190 | M | Mampe K.V. | Piliyandala | 119 | Yes | _ |
| 90 | UDUWANA A.S. | 1197339 | F | Piliyandala No.1 K.V. | Piliyandala | 119 | No | _ |
| 91 | WIJESINGHE W.P.M. | 1199382 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 119 | No | _ |
| 92 | APSARA M.B.K. | 1200062 | F | Somaweera Chandrasiri V. | Piliyandala | 118 | No | _ |
| 93 | ARIYARATHNA J.D.P. | 1580906 | F | Palannoruwa M.M.V. | Gonapola Junction | 118 | Yes | _ |
| 94 | BANDARA I.B.M.S. | 1161644 | M | Chandrarathna Manawasingha V. | Ambagahapura, Boralasgamuwa. | 118 | Yes | _ |
| 95 | GAMAGE G.M. | 1257641 | F | Deepangoda K.V. | Brahmanagama, Pannipitiya. | 118 | Yes | _ |
| 96 | JAYOMI P.D. | 1209299 | F | Dharmasena Atigala B.M.V. | Kesbewa, Piliyandala. | 118 | No | _ |
| 97 | KAVINDI K.D.R. | 1195492 | F | Piliyandala No.1 K.V. | Piliyandala | 118 | Yes | _ |
| 98 | KUMARAGE D.H.N. | 1195891 | M | Piliyandala No.1 K.V. | Piliyandala | 118 | No | _ |
| 99 | LOKUGAMA W.M. | 1199404 | M | Somaweera Chandrasiri V. | Piliyandala | 118 | No | _ |
| 100 | MADURANGI W.M.I. | 3431487 | F | Ethimale Stage 11 M.V. | Ethimalewewa | 118 | Yes | _ |

| No. | Student Name | Index No. | Sex | Present School | Address | Marks | Bursary | Admission No. |
|---|---|---|---|---|---|---|---|---|
| 101 | MUTHUMINI W.A.A.N. | 1209566 | F | Dharmasena Atigala B.M.V. | Kesbewa, Piliyandala. | 118 | Yes | _ |
| 102 | PEIRIS M.G.S.S. | 1207075 | M | Sir John Kothalawala V. | Piliyandala | 118 | Yes | _ |
| 103 | THEJANA G. L. D. | 1195590 | M | Piliyandala No. 1 K. V. | Piliyandala | 118 | No | _ |
| 104 | UDARA W. A. A. T. | 1240374 | F | Moratuwa M. V. | Moratuwa | 118 | Yes | _ |
| 105 | WEERAKOON A. W. H. S. N. | 1161741 | M | Chandrarthna Manawasingha V. | Ambagahapura, Boralesgamuwa | 118 | Yes | _ |
| 106 | WEERASINGHE K. B. N. | 1209477 | F | Dharmasena Atigala B. M. V. | Kesbewa, Piliyandala | 118 | Yes | _ |
| 107 | WIJESIRI W. K. M. | 1192116 | F | Hermann Gmeineer School | P. O. Box. 05, Piliyandala | 118 | Yes | _ |
| 108 | ARACHCHI I. K. H. | 1918117 | F | Janadhipathi V. | Kotuwa, Matara | 117 | No | _ |
| 109 | BANDARA M. G. P. C. | 1193430 | M | Pilip Atigala M.V. | Madapatha | 117 | Yes | _ |
| 110 | GAYANTHA M. P. | 1196219 | M | Piliyandala No. 1 K. V. | Piliyandala | 117 | No | _ |
| 111 | HANSAKA R. P. D. R. | 1196472 | M | Piliyandala No. 1 K. V. | Piliyandala | 117 | No | _ |
| 112 | KALHARA H. M. A. | 1195697 | M | Piliyandala No. 1 K. V. | Piliyandala | 117 | No | _ |
| 113 | MADURANGA A. A. D. | 1215760 | M | St. John's M. V. | Nugegoda | 117 | Yes | _ |
| 114 | MADUSHIKA E. A. H. | 1192094 | F | Hermann Gmeiner School | P. O. Box. 05, Piliyandala | 117 | Yes | _ |
| 115 | NIROSHANA M. D. S. | 1574949 | M | Thakshila K. V. | Horana | 117 | No | _ |
| 116 | PERERA K. A. C. C. | 1596667 | M | Bandaragama M. M. V. | Bandaragama | 117 | Yes | _ |
| 117 | RASANJALI H. H. K. T. | 1224751 | F | Buddhist Girls' M. V. | Mount Lavinia | 117 | No | _ |
| 118 | SATHSARA U. D. N. | 1196251 | M | Piliyandala No. 1 K. V. | Piliyandala | 117 | No | _ |
| 119 | SILVA W. K .A. | 1193279 | M | Kahapola K. V. | Kahapola, Madapatha | 117 | Yes | _ |
| 120 | MADUSANKA R. M. G. | 2143712 | M | Ellawela K. V. | Ellawela | 116 | Yes | _ |

| අ.අ. | නම | විභාග අංකය | ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි පාසල | ලකුණු සංඛ්‍යාව | ලිපිනය |
|---|---|---|---|---|---|
| 1. | කේ.ඩී.ඩී. හංසනී | 1201450 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 133 | 9/1බී, අළුබෝගහවත්ත, ජඹුරලිය, මඩපාත, පිළියන්දල. |
| 2. | සී.පී. ගමගේ | 2220644 | කුමාර වි. - බලංගොඩ | 133 | 4, ග්‍රීන්රේන්ජ්, කිරිමැටි තැන්න, බලංගොඩ. |
| 3. | එස්.එන්.එච්. ආරච්චි | 1175882 | මහාමායා බා.වි. - නුගේගොඩ | 131 | 61, පන්සල පාර, දිවුලපිටිය, බොරලැස්ගමුව. |
| 4. | ඒ.යූ. ජයසිංහ | 1195921 | පිළියන්දල අංක 01 ක.වි. | 131 | 348/2, දේවාල පාර, පොල්ගහකොට්ටනුව, බටකැත්තර, මඩපාත, පිළියන්දල. |
| 5. | ජේ.ඒ.ආර්.එල්. දිල්ශාන් | 1200674 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 130 | 85/බී, මඩපාත, පිළියන්දල. |
| 6. | එම්.එම්. ප්‍රියදර්ශන | 1161679 | චන්ද්‍රරත්න මානවසිංහ වි. | 130 | 110, ඇහැළපේ පාර, කටුවාවල, බොරලැස්ගමුව. |
| 7. | කේ.පී. අයෝධ්‍යා | 1210025 | ධර්මසේන අටිගල බා.වි. | 129 | 103 ඒ, කුඩ මාදුව පාර, හොන්නන්තර දකුණ, පිළියන්දල. |
| 8. | පී.එම්.ටී.ජේ. බණ්ඩාර | 1202278 | විද්‍යාලෝක ම.වි. - ඇරැව්වල | 128 | 194/7, මිහිර මාවත, මකුළුදූව, පිළියන්දල. |
| \`9. | එම්.ඒ.සී.ජේ. මනතුංග | 1199536 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 127 | 102/67, පුවක්ගස්වත්ත, මාකන්දල කැස්බෑව. |
| 10. | ආර්.යූ.ආර්.එල්. කරුණාරත්න | 1194828 | පිළියන්දල අංක 01 ක.වි. | 127 | ගුණතිලක වත්ත, මඩපාත පාර, කොළමුන්න, පිළියන්දල. |
| 11. | එස්.ඒ.එස්. සුහසිංහ | 1196421 | පිළියන්දල අංක 01 ක.වි. | 127 | 49 ආර්, කහපොල, මඩපාත. |
| 12. | ඩී.ඩී. අත්තනායක | 1199439 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 126 | 1/10, ගල්වලන්ද පාර, මකුළුදූව පාර, පිළියන්දල. |
| 13. | ජී.ජී.වයි. ලක්ෂාන් | 1200690 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 126 | 120/1/බී, පින්නවලවත්ත, මඩපාත, පිළියන්දල. |
| 14. | ටී.ඩබ්.එම්.අයි.අයි. දිසානායක | 1200305 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 125 | 118/4, නිසල පෙදෙස, නාම්පමුණුව, පිළියන්දල. |
| 15. | කේ.ආර්. නිසංසලා | 1260677 | වැතර ක.වි. | 125 | 116/ඒ/1, ගයාල් මහේෂ් මාවත, කහතුඩුව, පොල්ගස්ඕවිට. |
| 16. | එන්.ආර්. කළුආරච්චි | 1196367 | පිළියන්දල අංක 01 ක.වි. | 125 | 22/6, ශ්‍රී බිම්බාරාම පාර, කොළමුන්න, පිළියන්දල. |
| 17. | කේ.එන්. දිල්හාර | 1260863 | වැතර ක.වි. | 124 | 249, හොරණ පාර, කහතුඩුව, පොල්ගස්ඕවිට. |
| 18. | ඒ.ඒ.ටී. මධුෂාන් | 1259660 | සිරිපති වි. - අම්බලන්ගොඩ | 124 | 2/1පී, හෙරලියාවල, පොල්ගස්ඕවිට. |
| 19. | පී.වී.එස්.ආර්. පෙරේරා | 1195840 | පිළියන්දල අංක 01 ක.වි. | 124 | 101/6 බී, කුඩ මාදුව පාර, හොන්නන්තර, පිළියන්දල. |
| 20. | ඩී.එම්.ඒ.එම්. අල්විස් | 1202235 | විද්‍යාලෝක ම.වි. - ඇරැව්වල | 122 | 637 ඒ, ශ්‍රී විජය මාවත, ඇරැව්වල, පන්නිපිටිය. |
| 21. | එච්.එම්. බිම්සර | 1227700 | ලලිත් ඇතුලත්මුදලි ම.වි. - ගල්කිස්ස | 122 | 52, ශ්‍රී ධර්මාරාම පාර, වලව්වත්ත නිවාස, රත්මලාන. |
| 22. | ආර්.එච්.කේ. පෙරේරා | 1200011 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 121 | 87, කොළඹ පාර, පිළියන්දල. |
| 23. | එච්.එම්.සී.ජේ. බණ්ඩාර | 1202790 | විද්‍යාලෝක වි. - ඇරැව්වල | 121 | 448, මාම්පේ උතුර, කොළඹ පාර, පිළියන්දල. |
| 24. | ටී.ජී.අයි. උදයශාන් | 1200801 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 121 | 1/1, එගොඩහේන වත්ත, මාම්පේ, පිළියන්දල. |
| 25. | ඒ.එම්. විජේමාන්න | 1196561 | පිළියන්දල අංක 01 ක.වි. | 118 | 200/1, පළමු පටුමග, එගොඩවත්ත පාර, බොරලැස්ගමුව. |
| 26. | කේ.ටී.එස්.කේ. ජදූෂන් | 1245724 | ද සොයිසා නවෝද්‍යා වි. - මොරටුව | 117 | 2 එම්/7/2, සොයිසාපුර මහල් නිවාස, මොරටුව. |
| 27. | කේ.ටී.ඩී. පෙරේරා | 1577026 | හොරණ තක්ෂිලා ම.වි. | 115 | 194/1ඊ4, තල්ගහහේන පාර, කැස්බෑව. |
| 28. | ඊ.ඒ.බී. හංසමාලි | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 111 | 34/2, උන්දුරුගොඩ, පොල්ගස්ඕවිට. |
| 29. | ඩබ්.ටී. වාසනා | 1260499 | වැතර ක.වි. | 106 | 116/3, ලියනගේ මාවත, වෙනිවැල්කොළ, පොල්ගස්ඕවිට. |
| 30. | සී.එල්. ඔලබොඩුව | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 104 | 104/ඩී, පාලගම, පොල්ගස්ඕවිට. |

| අ.අ. | නම | විභාග අංකය | ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි පාසල | ලකුණු සංඛ්‍යාව | ලිපිනය |
|---|---|---|---|---|---|
| 31. | එස්.ඩී.පී. ගීතාංජන | 1261002 | වැතර ක.වි. | 102 | 10/17, හොරතුඩුව පාර, හල්පිට. |
| 32. | ටී.එම්.අයි. මධුශංක | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 102 | 21/සී/7, බෙරවාවල, මඩපාත. |
| 33. | එම්.ඩී. හංසිකා | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 102 | 373/1, ප්‍රගති මාවත, කහතුඩුව. |
| 34. | බී.එච්.ඩී.ඩී. පීරිස් | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 099 | 102, වැතර, පොල්ගස්ඕවිට. |
| 35. | එච්.ඒ.එස්.ජී. කාවින්ද රත්නපාල (ක්‍රියාත්විත) | 3674552 | අග්‍රබෝධි වි. - කන්තලේ | 093 | 76, වීර මාවත, බෝකුන්දර, පිළියන්දල. |
| 36. | කේ.ටී.එච්. චතුරංග | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 092 | 132, දියකඩ පාර, වෙනිවැල්කොළ, පොල්ගස්ඕවිට. |
| 37. | අයි.පී. හිරන්ත | 1194607 | පිළියන්දල අංක 01 ක.වි. | 089 | 284/7, මඩපාත පාර, කුරුළුවත්ත, පිළියන්දල. |
| 38. | ඩබ්.ඒ.එස්. දුල්මිණි | 1197649 | පිළියන්දල අංක 01 ක.වි. | 089 | 119/6, අබේරත්න මාවත, මකුළුදූව, පිළියන්දල. |
| 39. | එන්.එම්.ඒ.ටී. ජනන්ජය | 1196073 | පිළියන්දල අංක 01 ක.වි. | 089 | 2 ඒ, ග්‍රීන්වීව්, කොට ගෙදර, මඩපාත. |
| 40. | එස්.ඒ.ඩී. හංසිකා | 1197495 | පිළියන්දල අංක 01 ක.වි. | 086 | 134/ඒ, විජයනන්දනාරාම පාර, හොන්නන්තර, පිළියන්දල. |
| 41. | ඩී.එම්.සී. මධුශංක | 1200887 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 086 | 42/3, තුම්බෝවිල, පිළියන්දල. |
| 42. | ඩබ්.ජී.එම්. ලක්ෂිත | 1192655 | මාකඳන ශ්‍රී සුදර්ශන වි. | 085 | 66/6, කැකුණගහවත්ත, මාකන්දල, මඩපාත. |
| 43. | එච්.ඩී.කේ.එස්. ගුණසේකර (ක්‍රියාත්විත) | 1200283 | සෝමවීර චන්ද්‍රසිරි වි. | 084 | 39, ජඹුරලිය, මඩපාත, පිළියන්දල. |
| 44. | ජේ.ජී.එච්.කේ. ජයසිංහ | ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් යොමු කර ඇති ලිපියකි. විභාගයට පෙනී සිටි පාසල හා විභාග අංකය සපයා ගත නොහැක. පොදු ලිපියක් නිකුත් කර ඇත. (ඇමුණුම 02) | | 083 | 110, ජයසෙවණ, ශ්‍රී ප්‍රේමරත්න මාවත, බටුවන්දර, මඩපාත. |
| 45. | එච්.පී.ඩී. හිරෝෂාන් | 1196138 | පිළියන්දල අංක 01 ක.වි. | 082 | 32/1, හොරණ පාර, කැස්බෑව. |

*ඇමුණුම - 02*

**පෝෂිත පාසල්**

බප/පිළි/අංක 01 කණිෂ්ඨ විද්‍යාලය

| අංකය | ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම | ශිෂ්‍යත්ව ලකුණු |
|---|---|---|
| 1 | ප්‍රියශාන් රමේෂ්ක පනාගොඩ | 116 |
| 2 | වික්‍රමආරච්චිගේ නෙමේෂා දිල්කි | 116 |
| 3 | සඳුනි මධුෂිකා වල්පොල | 116 |
| 4 | එම්.ඩී. තිෂිණි තත්සරණි | 116 |
| 5 | ජේ.එම්. විදුර මල්ෂක ජයසුන්දර | 116 |
| 6 | ඒ.ඩී. දිල්කි නයනමිණි | 116 |
| 7 | එම්.එම්. භාග්‍යා තත්සරණි ද ලිවේරා | 115 |
| 8 | රන්නුලු තිහාන් සඳල් ලිවේරා කරුණාරත්න | 115 |
| 9 | ඩබ්ලිව්.ඒ.ඩී.එච්. කේතුමාලිකා | 115 |
| 10 | එම්.එල්. ඒසිනි මිනෝෂිකා | 115 |
| 11 | ඩබ්ලිව්.ඒ. අංජලී විදාගම | 115 |
| 12 | එස්.ඩී. විකසිත මනරම් | 114 |
| 13 | දිනුක් තිමිර විතානගේ | 114 |
| 14 | එච්.එල්. ඉෂාන් තත්සර | 114 |
| 15 | එස්. මල්කි අප්සරා | 114 |
| 16 | කේ.කේ. ඉසුරිකා උත්පලා දසනායක | 114 |
| 17 | ඩබ්ලිව්. කේ.ඩී. කවින්ද මධුෂාන් | 113 |
| 18 | ඒ.ඩී. නිෂාදි සඳුපමා | 113 |
| 19 | කේ.ජී.එල්. නිමේෂනි | 113 |
| 20 | එල්. සචිනි ලකීෂා | 112 |
| 21 | ඩී. අජේන් ෂමෝද් කුමාරගේ | 112 |
| 22 | වයි.එම්.එස්.එම්. සහන් නිම්සර සිල්වා | 112 |
| 23 | ඩබ්ලිව්. නවෝද දෙවන්මින | 112 |
| 24 | ටී.ඩබ්ලිව්.ඩී. බෙත්මි අංජනා | 112 |
| 25 | එල්.එම්. උත්තරා දිව්‍යාංජලී | 111 |
| 26 | එච්. මුදිත මිහිරාජ් | 110 |
| 27 | ආර්.ඒ. තරුෂිකා දේවින්දි | 110 |
| 28 | කේ.ඒ.ජේ. පසිඳු චතුරංග ප්‍රනාන්දු | 110 |
| 29 | ඉසිවර පවන් ජයසිංහ | 110 |
| 30 | ආර්. චමිඳු කල්හාර ධර්මරත්න | 109 |
| 31 | බී.එස්. ලංකාපුත්‍ර ඩෝස්ට් | 109 |
| 32 | ඩබ්ලිව්.වී.සී. ප්‍රකාශ් | 109 |
| 33 | නිසලි මාකලන්ද | 109 |
| 34 | එන්.කේ.පී. පියුමාල් සිල්වා | 109 |
| 35 | කේ.ඒ.ඩී. මධුෂාණි | 109 |
| 36 | ඒ.ඩී. තරුෂි නෙත්මිණි | 108 |
| 37 | කේ.ඒ.ජී. ඉසුරු බුවනක | 108 |
| 38 | ඒ.එම්. තිළිණි රවීෂා | 108 |
| 39 | හංසනී කුමාරි වීරසේකර | 108 |
| 40 | ඩබ්ලිව්.ඩී.ඒ.එච්. ගුණසේකර | 107 |
| 41 | එන්.එස්. තේනුවර | 107 |
| 42 | පී.ඩී. හසිත කේෂාන් | 107 |
| 43 | එම්.ටී. ඉෂාරා ලක්ෂාණි | 107 |
| 44 | ඒ.ඒ.ඩී. කනිල ධනංජන | 107 |
| 45 | ඩබ්ලිව්.ටී. තාරකී රවින්ද්‍යා | 107 |
| 46 | එම්.ජී.ජී. රන්දික | 107 |
| 47 | ඩබ්ලිව්.ඩී.ආර්. පබසරා වික්‍රම | 107 |
| 48 | යූ.ඩී. සංඛ ප්‍රභාත් සමරසේකර | 106 |
| 49 | එම්. සුමේෂ් අශාද | 106 |
| 50 | එච්.කේ. මහේල අධිමාන් හරිස්චන්ද | 106 |
| 51 | ආර්.එම්. භාෂිනී උපේඛා රත්නායක | 106 |
| 52 | කොල්ලු පතිරගේ උසානි රන්දිමා කල්දේරා | 106 |
| 53 | ඩබ්ලිව්.ඩී.ටී. අත්පලා වික්‍රමගේ | 104 |
| 54 | ඩබ්ලිව්.ඒ.ඩී. ගහනිකා | 104 |
| 55 | එම්.ඩබ්ලිව්.ඩී. සාරාංගා | 104 |
| 56 | පී. නෙරංජන් ලියනගමගේ | 103 |
| 57 | ටී.ඩී. පසිඳු බිම්සර | 103 |
| 58 | ආර්.ඩී. රුවන් පිතරණ | 103 |
| 59 | පී.ටී.පී. දනන්සූරිය | 103 |
| 60 | ටී.එස්. සංදීපනී පීරිස් | 102 |
| 61 | ඩී.එන්. වෙල්ලාල ගොඩගේ | 102 |
| 62 | පී.කේ. සමාධි කල්හාර | 102 |
| 63 | එස්.එන්.ඩී. කරුණාරත්න | 102 |
| 64 | ටී.ඩී. ලොකුගම විදානගේ | 101 |
| 65 | පවනි භාග්‍යා ගමගේ | 101 |
| 66 | සලෝමි හදර්ශා වනිගසිංහ | 100 |
| 67 | ඒ.ඒ.එම්. හංසනී | 100 |
| 68 | පී.ඩී.යූ. පීරිස් | 100 |
| 69 | කේ.එච්.පී. ආරියරත්න | 100 |
| 70 | ඒ.ජී. ලොකුවිතාන | 100 |
| 71 | බී.එල්. සචිනි ලක්ෂිකා බන්දුල | 100 |
| 72 | ආර්.එම්.එච්. රවිනාත් රත්නායක | 99 |
| 73 | ඊ.එම්. ජයංගනී අල්විස් සමරකෝන් | 99 |

| අංකය | ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම | ශිෂ්‍යත්ව ලකුණු |
|---|---|---|
| 74 | එන්.එම්.එන්.ජී.ඩී මධුෂිකා ලක්ෂිකා | 99 |
| 75 | උමේෂා කාවින්දි සතරසිංහ | 99 |
| 76 | ඩබ්ලිව්.ඕ. විමාෂා විශ්වනී | 99 |
| 77 | බී.එච්.පී. ප්‍රවීන් ජයසිංහ | 99 |
| 78 | ඒ. නෙත්මි සඳරුවනි සිල්වා | 98 |
| 79 | ජී.ඩබ්ලිව්. කමිල කුමාර | 98 |
| 80 | දිනේෂි වත්සලා ජයසූරිය | 97 |
| 81 | සතරසිංහ ආරච්චිගේ රවිෂා චමෝදි | 97 |
| 82 | වයි.ආර්. චතුස්ක කවිඳු | 97 |
| 83 | ආර්. චතුර තීක්ෂණ මධුහංස | 96 |
| 84 | එම්. පියුමල් ලසිඳු ජයලත් | 96 |
| 85 | ඩී. හේෂානි සඳමිණි | 96 |
| 86 | එස්.ආර්. අෂාන් රවිශ්ක සෙනෙවිරත්න | 96 |
| 87 | පී.ඩබ්ලිව්. ගිහාන් කාවින්ද | 96 |
| 88 | ඩී.කේ. නිල්මි ප්‍රභාවා | 96 |
| 89 | ඩබ්ලිව්. එරංජිත් දිල්ෂාන් සිල්වා | 95 |
| 90 | එම්. සුමුදු ප්‍රියංකා ප්‍රනාන්දු | 95 |
| 91 | කේ.එස්. දේශාන් කටුලන්ද | 95 |
| 92 | ඩී.කේ. චාමික ඒෂාන් | 95 |
| 93 | යූ.ඩී. නයනා දිල්රුක්ෂි | 95 |
| 94 | එස්.ඒ.ඩී. කවිඳු ෂාමල්ක | 95 |
| 95 | එච්. අනුෂ්ක සසිඳු ප්‍රනාන්දු | 94 |
| 96 | කේ.ඩී. පැතුම් පියුමාල් | 94 |
| 97 | ඩබ්ලිව්. එම්.ජී. මධුෂාන් කුමාර | 93 |
| 98 | බානුක අශ්වාන් කුමාරසිංහ | 92 |
| 99 | ඩී.ඩී.ඒ.ඩී. සෙව්වන්දි ශසිකලා | 92 |
| 100 | කේ.බී. කසුන් ලහිරු පෙරේරා | 92 |
| 101 | ඩබ්ලිව්.ඒ. කේශාන් කාවින්ද ගුණතිලක | 91 |
| 102 | ජී.ඩී. අනුරාධ යශශ් ශ්‍රී යසෝදා | 91 |
| 103 | ඩී.එම්. සමිඳු කනිෂ්ක | 91 |
| 104 | ඒ. දුලක්ෂ දිල්හාන් සිල්වා | 90 |
| 105 | කේ.ඩබ්ලිව්.ඩී. මහේෂා එරන්දි පෙරේරා | 90 |
| 106 | එච්.බී. මනකල් ගුණසේකර | 90 |
| 107 | එම්.බී.එම්. බිම්සර ප්‍රනාන්දු | 90 |
| 108 | එච්.ඒ.ටී. නිරුෂිලා ජයදේව | 89 |
| 109 | එම්. සචින් කනිෂ්ක පීරිස් | 89 |
| 110 | කේ.පී. කාවින්දායා දිල්මි ජයසේකර | 89 |
| 111 | ඩබ්ලිව්.ඒ. ශ්‍යාමි දුල්මිණි | 89 |
| 112 | සෞම්‍යා වස්සාන උක්වත්ත ආරච්චි | 89 |
| 113 | රවින්දි තාරුකා විජේසූරිය | 89 |
| 114 | පසිඳු හසලංක | 89 |
| 115 | පසිඳු හිරන්ත | 89 |
| 116 | ඒ.වී. මලින්ත සලිඳු | 88 |
| 117 | යූ.කේ. තරුෂි මාලක | 87 |
| 118 | එච්.පී. ශචින් යසංක | 85 |
| 119 | කේ.එස්. කවිඳු ඉෂාන් | 85 |
| 120 | එම්.ඩී.බී. රුක්ෂාන් | 85 |
| 121 | කේ.ඩබ්ලිව්. එම්. දිනූක තාරක බණ්ඩාර | 81 |
| 122 | යූ.ඩී. ප්‍රභාත් අවිශ්ක | 77 |

**සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලය**

| අංකය | ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම | ශිෂ්‍යත්ව ලකුණු |
|---|---|---|
| 01 | ඉසිනි නයනතාරා ලංගප්පුලි | 116 |
| 02 | පී.එම්.සී. නිපුල් මංජිත | 116 |
| 03 | එම්.ඩී. සහන් අකලංක | 115 |
| 04 | ජේ.එච්. රුචිර ලක්ෂිත | 115 |
| 05 | ජී. අශාන් නයනජිත් | 115 |
| 06 | ටී. ජනනි නිමේෂිකා චතුරංගි පීරිස් | 115 |
| 07 | කේ.ඒ. තරුෂ චමල් සඳරුවන් | 114 |
| 08 | ටී. ෂමල් අනුෂ්ක පරිස් | 114 |
| 09 | ඒ.ජී. දිසාරා පියුමාලි | 114 |
| 10 | එල්.ඩබ්ලිව්. නදීෂා ජීවන්ති | 114 |
| 11 | ඩබ්ලිව්. රහින් වත්සලා ප්‍රනාන්දු | 113 |
| 12 | එම්.ඒ. එශාන් දිල්රුක් | 113 |
| 13 | පී.කේ. පැතුම් ලක්ෂිත පෙරේරා | 112 |
| 14 | පී. පුලස්තික ගයාෂාන් පෙරේරා | 112 |
| 15 | බී.ඩබ්ලිව්. පසිඳු ජයශාන් | 112 |
| 16 | පී.ඩබ්ලිව්. අකිල මධුෂාන් වීරසිංහ | 111 |
| 17 | එම්.ඩී. වෙනුරි නර්මදා විමර්ශනී | 110 |
| 18 | කේ.ආර්. දේවින්දි උත්පලා පෙරේරා | 110 |
| 19 | කේ.ඩී.එච්. භානුක හේමවංශ | 109 |
| 20 | ඒ.එච්. ඉසුරි පූර්නාමා ඩයස් | 109 |
| 21 | එල්. දීමන්ත මධුෂාන් පෙරේරා | 108 |
| 22 | එම්. කවිශ්ක ගිම්හාන | 108 |
| 23 | එස්.ඒ.හසිනි ගයංගිකා සූරවීර | 107 |
| 24 | අයි.යූ. අශේන් නිල්නුවන් | 107 |
| 25 | කේ.ඩී. කවිඳු ලක්ෂාන් | 107 |
| 26 | එච්.පී.ඩී. අවින් සංජය | 107 |
| 27 | කේ.එම්.ඩී. සමිත සාරංග | 107 |
| 28 | එන්. රශිප්‍රභා එරංගා | 107 |
| 29 | කේ.ඒ. කෞෂල්‍යා නදීෂානි | 106 |
| 30 | ඒ.ඩී.එස්.එන්. අමරතුංග | 106 |
| 31 | ඕ.කේ.ඩී.එස්. දම්සක් ඕපාත | 105 |
| 32 | ජී.එස්.එම්. විජේසිංහ රාජරත්න | 105 |
| 33 | කේ.එම්.ඒ.පී.ජී. ඉමල්කා සෙව්වන්දි | 105 |
| 34 | එච්.ඩබ්ලිව්.එච්. පාරින්දායා තිලකරත්න | 105 |
| 35 | එස්.එච්. පියුමි සංදීපනී | 104 |
| 36 | ජී. හසිනි නිමේෂිකා | 103 |
| 37 | අයි.එම්. නිශාදි මධුරංගනී | 103 |
| 38 | කේ.ඒ.ජී. අකලංක | 102 |
| 39 | විහග සුපුන් තාරක අල්විස් වීරසිංහ | 102 |
| 40 | ආර්.කේ. අබේවික්‍රම ගුණවර්ධන | 102 |
| 41 | ජී. කල්ප කනිෂ්ක | 102 |
| 42 | බී.ඩී. ඉමේෂශී දිලක්ෂණ | 102 |
| 43 | ජී.පී. ඉමේෂ් රන්දික | 102 |
| 44 | කේ.ජී. නිමාෂා කාවින්දි | 101 |
| 45 | ඩී.එම්.ඩී. නදුන් පුෂ්ප කුමාර | 101 |
| 46 | පසනි භග්‍යා කලුපහන | 100 |
| 47 | පී. ටෂින් ඉමාෂා පෙරේරා | 100 |
| 48 | ඒ. සදුනි මධුෂිකා පීරිස් | 100 |
| 49 | ඩී. කවිඳු ක්‍රිෂාන් | 100 |
| 50 | කේ.ඩී.එස්. අවිශ්ක ආසිරි | 100 |
| 51 | ආර්.එම්. සිතිර කලනක බණ්ඩාර | 99 |
| 52 | ආර්.එම්. කෞසි දිල්හාරා රත්නායක | 99 |
| 53 | කේ. හසිත් සදරුවන් පෙරේරා | 98 |
| 54 | ඩබ්ලිව්. දිල්ෂාන් ධනංජය | 98 |
| 55 | ඩී.කේ.ඩී. මීදුමී අංජලී | 97 |
| 56 | කේ. ජනිත් නවෝද්‍යා | 97 |
| 57 | කේ.එල්. පින්සර ශ්‍රී සාරංග | 97 |
| 58 | ජී. සදුන් මධුවන්ත | 96 |
| 59 | එච්. ප්‍රමිදු භාග්‍ය | 95 |
| 60 | එච්.ඩබ්ලිව්. චමිත අනුරංග | 95 |
| 61 | ගීත් රන්දික මදූෂාන් එල්ලාවල | 94 |
| 62 | තරුෂි දිනේෂිකා හැගොඩගමගේ | 94 |
| 63 | එම්. අරවින්ද රංජන් මෙන්ඩිස් | 94 |
| 64 | ඩබ්ලිව්. උපේක්ෂා සෙව්වන්දි | 94 |
| 65 | බී.ඒ. කවිත්ක චමුපති පීරිස් | 93 |
| 66 | ටී.එච්.ඩබ්ලිව්. පැතුම් සදරුවන් වික්‍රමසිංහ | 93 |
| 67 | පී.එල්. කවීශා විහංගි | 92 |
| 69 | ඒ. ශෂිකා චතුරංගනී සිල්වා | 92 |
| 70 | ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ. නදුන් ශෙහාර | 91 |
| 71 | අයි. කවීශ මධුභාෂන | 91 |
| 72 | ඩබ්ලිව්.ටී. නවෝද්‍යා නිර්මානි ප්‍රනාන්දු | 90 |
| 73 | තරුෂි හිමායා මනම්පේරි | 89 |
| 74 | එම්.කේ. දම්සරණි විමලසෝම | 85 |

**මාම්පේ කනිෂ්ඨ විද්‍යාලය**

| අංකය | ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම | ශිෂ්‍යත්ව ලකුණු |
|---|---|---|
| 01 | වයි.පී. ජනිත ප්‍රභාත් මලින්දරත්න | 116 |
| 02 | බී. නෙත්මි කුෂානි | 114 |
| 03 | ආර්.එම්. තරිඳු දිලක්ෂ | 113 |
| 04 | එච්.ඒ. යශෝධා කසුනි | 111 |
| 05 | පී.ආර්.එස්. අමන්ත ද සිල්වා | 109 |
| 06 | ටී.එම්. පසිඳු ප්‍රනාන්දු | 106 |
| 07 | ඕ. කලන මධුරංග | 102 |
| 08 | කේ.ඒ. අරුණි ඉන්ද්‍රචාපා අල්විස් | 102 |
| 09 | කේ.ඩී. පැතුම් නිර්මල | 101 |
| 10 | පී.ඩබ්ලිව්.ටී. මධුභානි වික්‍රමසූරිය | 100 |
| 11 | කේ.ආර්. ඩිල්සාන් වීරසිංහ | 97 |
| 12 | ඩබ්ලිව්.කේ. හේෂාන් පෙරේරා | 96 |
| 13 | ආර්.ඒ.ඩී. හර්ෂනී පේමරත්න | 94 |
| 14 | එච්. නදීකා | 92 |

**හැඩිගම ශ්‍රී සුදර්ශන විද්‍යාලය**

| අංකය | ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම | ශිෂ්‍යත්ව ලකුණු |
|---|---|---|
| 01 | ඩබ්ලිව්. මධුෂිකා චතුරංගනි | 99 |
| 02 | පී.ඩබ්ලිව්.එස්. විකුම් ලක්රුවන් | 92 |

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ගරු ඇමතිතුමනි, දැන් ළමයි ඇතුළත් කර ගන්න අවම ලකුණු ප්‍රමාණයක් තිබෙනවා නේ? එම අවම ලකුණු ප්‍රමාණය සලකන්නේ නැතිව වෙනත් ළමයින් සංඛ්‍යාවක් පාසලට ඇතුළත් කර ගෙන තිබෙනවා. ඒ අවම ලකුණු ප්‍රමාණය සැලකිල්ලට නොගෙන - මම කියන්නේ පෝෂිත පාසල් සම්බන්ධව නොවෙයි - සුදුසුකම් තිබෙන ළමයි ඇතුළත් කර ගන්නේ නැතිව සුදුසුකම් නැති ළමයින් සංඛ්‍යාවක් ඇතුළත් කර ගෙන තිබෙනවා. එහෙම වුණේ ඇයි?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය ශිෂ්‍යත්ව විභාගයේ කඩ ඉම් ලකුණ නියම වන පාසලක් නොවෙයි. ඒ නිසා සාම්ප්‍රදායිකව කෙරෙන්නේ පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය අවට තිබෙන්නා වූ පෝෂිත පාසල් හතරේ දරුවන්, ඒ දරුවන් ලබා ගත් ලකුණු අනුපිළිවෙළ අනුව ඇතුළත් කිරීමයි. ඇමුණුම 02 මඟින් මම ඔබතුමාට මේක තව දුරටත් පැහැදිලි කරන්නම්. මේ පිළිතුරේ එම ඇමුණුම තිබෙනවා. ඔබතුමාට එය පරිශීලනය කළ හැකියි. උදාහරණයක් කිව්වොත්, පිළියන්දල අංක 01 කනිෂ්ඨ විද්‍යාලයෙන් පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කර ගත්ත ශිෂ්‍යයන්ගේ ලකුණු අනුපිළිවෙළ පටන් ගන්නේ 116න්. එතකොට එකසිය දහසයේ ඉඳලා පල්ලෙහාට යනවා. අනිකුත් පෝෂිත පාසල්වලත් ඒ ආකාරයෙන්මයි. මේ ලේඛනය අනුව ලකුණු 116න් පටන් ගන්නා අතර අවසාන ලකුණ 77 වනවා. මොකද, ශිෂ්‍යත්ව විභාගයේදී පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට කඩ ඉම් ලකුණක් නියම වන්නේ නැහැ. නමුත් ඒ අවට තිබෙන පෝෂිත පාසල්වලට ඒ සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඒ නිසා ශිෂ්‍යත්වයෙන් වැඩිම ලකුණු ගත් අනුපිළිවෙළ අනුව, පාසලේ තිබෙන ඉඩ ප්‍රමාණයට අනුව පෝෂිත පාසල් හතරෙන් දරුවන් ඇතුළත් කර ගෙන තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ඔබතුමාගෙන් මා දෙ වන අතුරු ප්‍රශ්නය අහන්නේ පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට අදාළ නිසායි. ගරු ඇමතිතුමනි, මේ පාසල ක්‍රීඩා පාසලක් කළා. එතකොට මේ පාසලට තිබුණු ක්‍රීඩා පිටිය සංවර්ධනය කළා. නමුත් දැන් මේ පාසලේ දරුවන්ට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. මෙතැනදී "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා වාගේ" වැඩක් තමයි වෙලා තිබෙන්නේ. දැන් ඒ දරුවන්ට ඒ ක්‍රීඩා පිටියට බහින්න විධියක් නැහැ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඇයි?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ඒ පාසලේ ළමයින්ට ඒ ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරන්න ඉඩකඩක් නැහැ. ඒ වාගේම තමයි- [බාධා කිරීමක්]

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

එහෙම කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්නය අහන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. අනික් කරුණ තමයි ඒ ක්‍රීඩා පිටිය නඩත්තු කරන්න වැඩ පිළිවෙළක් නැහැ. හුඟක් උසට තුත්තිරි ගස් වැවිලා තිබෙනවා. ඒ වාගේම පාසලට තිබුණු ප්‍රධාන කාර්යාලය - විදුහල්පති කාර්යාලය - කඩා බිඳ දමා තිබෙනවා. එතැන පාසල මධ්‍යයේ - ගොඩනැඟිලි මැද - swimming pool එකක් හදනවාය කියා මුල්ගලක් තියා තිබෙනවා. නමුත් තවම එහෙම එකක් නැහැ. ඒ නිසා මේ පාසලේ දරුවන්ට විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ ඒ පාසලට තිබුණ දේවල් පවා මේ වන විට අහිමි වී තිබෙනවා. අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂයේ සිට තමුන්නාන්සේලාගේ පක්ෂයට ඇවිල්ලා ඇමතිකමක් ගත්තු දේශපාලනඥයකුගේ බලපෑම තමයි සැලසුමකින් තොරව කරන මේ වැඩ පිළිවෙළ සඳහා තිබෙන්නේ. මෙහෙම දෙයක් වන්න හේතුව ඇයි? ඇයි, මේ දරුවන්ට මේ අසාධාරණය කරන්නේ?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වනවා ඒ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මේ පිළිබඳව අවධානය යොමු කිරීම සම්බන්ධයෙන්. හැබැයි මෙතෙක් පාසලේ විදුහල්පතිතුමා හෝ සංවර්ධන සමිතිය හෝ ආදි ශිෂ්‍ය සංගමය හෝ මේ ආකාරයෙන් මේ දරුවන්ට අසාධාරණයක් වන බවට අමාත්‍යාංශයට හෝ මට හෝ වාර්තා කරලා නැහැ. ප්‍රදේශයේ මහ ජන නියෝජිතයකු හැටියට ඔබතුමාට මා ස්තුතිවන්ත වන්නේ ඒකයි. කොහොම වුණත් පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට විශාල මුදල් ප්‍රමාණයක් ලැබුණා. මොකද දිවයින පුරාම මීට පෙරත් තිබුණා, ක්‍රීඩා පාසල් කියන අදහස. බස්නාහිර පළාතේ ක්‍රීඩා පාසල් තුනක් තිබුණා. දළ වශයෙන් හේනමුල්ල, හංවැල්ල රාජසිංහ විද්‍යාලය වැනි විද්‍යාල. මේ අදහස තුළ, ඒ කියන්නේ පාසල තුළින් බිහි වන දරුවන් තමයි ජාතික මට්ටම කරා ගෙන යන්නට ඕනෑය කියන අදහස තුළ ජාතික පාසල් ක්‍රීඩා තරගයේදී දක්ෂකම් දක්වන දරුවන් තෝරා ගෙන ඒ දරුවන්ට නේවාසික පහසුකම් ලබා දීලා, වඩාත් ක්‍රීඩා පහසුකම් තිබෙන පාසලක අධ්‍යාපනය ලැබීමට සැලැස්වීම තුළින් අධ්‍යාපනය සමඟ ක්‍රීඩාවත් දියුණු කර ගැනීමේ අවස්ථාව ලබා දීම තමයි මේකේ මූලික පරමාර්ථය වුණේ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයට මෙවැනි ක්‍රීඩා පාසල් සඳහා මුදල් විශාල ප්‍රමාණයක් එක වර මිඩංගු කිරීමට තිබෙන අපහසුතාව නිසා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් මෙසේ තෝරා ගත් පාසල් කිහිපයක් - පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය, හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය, මාදම්පේ සේනානායක විද්‍යාලය, දික්වැල්ල විජිත විද්‍යාලය - දැන් ආරම්භ කරලා, ඊ ළඟ වටයේ ජනවාරියේ දී වැඩ ආරම්භ වනවා නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය සහ පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය යන විද්‍යාලවල. මේ ආදී වශයෙන් මේ වැඩ පිළිවෙළ, එක් එක් පළාත් මට්ටමෙන් පාසල් තුන බැගින් තෝරා ගෙන ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළක්. ඉතින් ඒ යටතේ තමයි පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට මේ පහසුකම ලැබිලා තිබෙන්නේ. එතෙක් නොතිබුණු හොඳ ක්‍රීඩාංගණයක් ලැබිලා තිබෙනවා. පිහිනුම් තටාකය සඳහාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙනුයි මුදල් වෙන් වන්නේ. ඒ සඳහා මුදල් වෙන් වනවා. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය ජනවාරි මාසයේ නව තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහා යෝජනා කරලා, ලබන අවුරුද්දට මුදල් වෙන් කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ලක්ෂ 25ක් වියදම් කරලා ශාලාව අලුතෙන්ම සකස් කළා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ මුදල වියදම් කිරීම නිසා ඒ පාසලට ඒක විශාල ප්‍රතිඵලදායක වැඩක් වුණා. හැබැයි මේ දරුවන්ට පිට්ටනිය පාවිච්චි කරන්න නොදෙනවාය කියන අදහසට මට කිසි සේත් එකඟ වන්න බැහැ. ක්‍රීඩා කරන ළමයින්ට හවස් වරුවේ පාවිච්චි කරන්න පුළුවන්. නමුත් පොදුවේ සෑම දරුවකුටම ක්‍රීඩාංගණය භාවිත කිරීමට අවසර තිබෙන්න ඕනෑ කියලා මම වහාම දැනුම් දෙන්නම්. මොකද, ක්‍රීඩාංගණය පාසලින් වෙන් වන්නේ නැහැ. පාසල තුළමයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ගරු කථානායකතුමනි, මම තුන් වන අතුරු ප්‍රශ්නය අහනවා. පහේ ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධ ප්‍රශ්නයක් ඇසූ නිසා එයට සම්බන්ධ කරමින් මම මේ ප්‍රශ්නය අහන්නේ. ගරු ඇමතිතුමා දන්නවා, මෙවර ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු මට්ටම පසු ගිය වසරට සාපේක්ෂව ගත්තොත් ලකුණු 20කින් විතර වැඩි බව. මගේ දැනීමේ හැටියට ගිය වසරේ සාමාර්ථය තිබුණේ ලකුණු 117න්.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගිය අවුරුද්දේ ලකුණු 133යි. මේ අවුරුද්දේ 144යි. ඊට එපිට අවුරුද්දේ 150ට තිබුණා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ගරු ඇමතිතුමනි, පහ වසර ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම සම්බන්ධව අපේ එකඟතාවක් නැහැ. ඒකෙන් දරුවන් හෙම්බත් වනවා කියන එක තමයි අප පිළිගන්නේ. නමුත් දැන් ඒක පවත්වන නිසායි මේ අතුරු ප්‍රශ්නය අහන්නේ. ලකුණු 143ක් ගත්ත දරුවාත් ශිෂ්‍යත්ව විභාගයෙන් fail කියන තත්ත්වයට - අසමත් කියන තත්ත්වයට - තමයි පත් වන්නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඒ කිසිම කෙනෙක් fail නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ මෙන්න මේ කාරණයයි. දරුවන් මානසික වශයෙන් විශාල බිඳ වැටීමකට ලක් වනවා, මේ pass, fail කියන තත්ත්වය මත.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

එතකොට සියයට 72ක් වාගේ ප්‍රතිශතයක ලකුණු ගන්න ළමයාත් අසමත් කියන ගණයට තමයි වැටෙන්නේ. ඒ නිසා අපි ඔබතුමාට යෝජනා කරනවා, - මේක හොඳ උත්තරයක් නොවෙයි. ළමයින්ගේ මානසිකත්වය බේරා ගන්න තිබෙන පැලැස්තර උත්තරයක් - අවම වශයෙන් ශිෂ්‍යත්වයට යම් ලකුණු ප්‍රමාණයක්, එනම් ලකුණු 80ක් හරි 90ක් හරි ගන්න ළමයින්ට සමත්භාවය දීලා උසස් පාසල්වලට තෝරා ගැනීම සඳහා පමණක් ඔය ඔබතුමන්ලාගේ cut-off point තියන්න කියලා. මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලායි ප්‍රශ්න කරන්නේ. අපි දැන ගන්න කැමැතියි, ඒ ගැන ඔබතුමාගේ අදහස මොකක්ද කියලා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

(v) ප්‍රතිපාදන ඉතිරි වීමට විවිධ හේතූන් බලපා ඇති අතර, ඉන් ප්‍රධාන හේතූන් සාරාංශ කොට පහත දක්වා ඇත.

* ඇණවුම් කරන ලද ජල නළ උපාංග සැපයීම ප්‍රමාද වීම නිසා මේ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වූ මුදල් ඉතිරි වීම.
* වර්ෂාව සහ ගංවතුර නිසා ජල යෝජනා ක්‍රමවල ඉදිකිරීම් කටයුතු නතර වීම.
* වැටුප් හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් වෙන් කර තිබුණේ අනුමත සම්පූර්ණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වුවත් වර්ෂය තුළ බඳවා ගෙන ඇත්තේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% ක් පමණි.
* මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන අවුරා තැබීම.
* ඇපකර ලබා දීමේ දී සිදු වූ ප්‍රමාදය නිසා අත්තිකාරම් මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් වීම.
* ව්‍යාපෘතිවල වැඩ සැලසුම් ප්‍රතිශෝධනය කිරීම නිසා කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාද වීම.
* භාණ්ඩාගාරය අක්මුදල් සම්පූර්ණයෙන් නිදහස් නොකිරීම.
* සාමාන්‍ය අපේක්ෂිත ඉතිරිවීම් හා අරපිරිමැස්මෙන් වියදම් දැරීම නිසා වූ ඉතිරිවීම් ද මීට හේතු වී ඇත.

නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය 2006

| | | | | |
|---|---|---|---|---|
| (අ) | (i) | අය වැයෙන් වෙන් කළ මුළු මුදල | රු. | 30,218,307,300 |
| | (ii) | පුනරාවර්තන | රු. | 174,220,000 |
| | | ප්‍රාග්ධන | රු. | 30,044,087,300 |
| | (iii) | ඔව්. | | |
| | (iv) | **මුළු වියදම** | **රු.** | **19,988,360,788** |
| | | පුනරාවර්තන | රු. | 167,712,021 |
| | | ප්‍රාග්ධන | රු. | 19,820,648,767 |
| | | **මුළු ඉතිරිය** | **රු.** | **10,229,946,512** |
| | | පුනරාවර්තන | රු. | 6,507,979 |
| | | ප්‍රාග්ධන | රු. | 10,223,438,533 |

(v) ප්‍රතිපාදන ඉතිරි වීමට විවිධ හේතූන් බලපා ඇති අතර, ඉන් ප්‍රධාන හේතූන් සාරාංශ කොට පහත දක්වා ඇත.

* සුනාමි සම්බන්ධව මඩකලපුව වෙරළ ගොඩ කිරීම සඳහා වියදම් දැරීමට අධිකාරී බලය 2006 වර්ෂයේදී වෙනත් ආයතනයකට මාරුවීම නිසා අය වැය අධ්‍යක්ෂ වෙත එම ප්‍රතිපාදන අවුරා තබන ලෙස දන්වා සිටීම.
* උතුරු නැඟෙනහිර පළාත්වල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට ආරක්ෂක හේතූන් මත සුදුසු වාතාවරණයක් නොතිබීම.
* JBIC ආයතනයේ එකඟතාව ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා සමහර කොන්ත්‍රාත් 2007 වර්ෂය දක්වා කල් තැබීම.
* වැඩ බිම් හඳුනා ගැනීමේ හා සැලසුම් සකස් කිරීම ප්‍රමාද වීම, පළපුරුදු කොන්ත්‍රාත්කරුවන්ගේ හිඟය, උතුරු නැෙඟෙනහිර ප්‍රදේශවලින් කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීමේ අපහසුතාව හා නියමිත වේලාවට බිල්පත් ඉදිරිපත් නොකිරීම නිසා ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ ප්‍රතිපාදන නියමිත ලෙස භාවිතයට නොගැනීම.
* ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන් බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම.
* වර්ෂ අවසානයේ ඍජු විදේශ ගෙවීම් බිල්පත් භාණ්ඩාගාරයට ඉදිරිපත් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම.
* මහා භාණ්ඩාගාරය අක්මුදල් සම්පූර්ණයෙන් නිදහස් නොකිරීම.
* සාමාන්‍ය අපේක්ෂිත ඉතිරිවීම් හා අරපිරිමැස්මෙන් වියදම් දැරීම නිසා වූ ඉතිරිවීම් ද මීට හේතු වී ඇත.

නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය 2007
(2007 පෙබරවාරි සිට නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය නමින් ස්ථාපිත කරන ලදී.)

| | | | | |
|---|---|---|---|---|
| (අ) | (i) | අය වැයෙන් වෙන් කළ මුළු මුදල | රු. | 33,549,794,000 |
| | (ii) | පුනරාවර්තන | රු. | 184,069,0 |
| | | ප්‍රාග්ධන | රු. | 33,365,725,000 |
| | (iii) | ඔව්. | | |
| | (iv) | **මුළු වියදම** | **රු.** | **21,827,968,881** |
| | | පුනරාවර්තන | රු. | 161,926,109 |
| | | ප්‍රාග්ධන | රු. | 21,666,042,772 |
| | | **මුළු ඉතිරිය** | **රු.** | **11,721,825,119** |
| | | පුනරාවර්තන | රු. | 22,142,891 |
| | | ප්‍රාග්ධන | රු. | 11,699,682,228 |

(v) ප්‍රතිපාදන ඉතිරි වීමට විවිධ හේතූන් බලපා ඇති අතර, ඉන් ප්‍රධාන හේතූන් සාරාංශ කොට පහත දක්වා ඇත.

* ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් විභාග වන නඩුවලට උසාවියෙන් තීන්දු ලැබීමට ප්‍රමාද වීම හා කොන්ත්‍රාත්කරුවන් බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම.
* ආධාර ප්‍රදානය කරන ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කිරීම 4 වන කාර්තුවේ දී සිදු වීම, එම ආයතනයේ අනුමැතිය ලැබීමට ප්‍රමාද වීම, උපදේශකවරුන් තේරීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම.
* උතුරු පළාතේ හා නැඟෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම.
* ණය ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම.

* උපදේශන කොන්ත්‍රාත් පිරිනැමීමේ දී සිදු වූ මූලික ප්‍රමාදයන්, අමතර වැඩ සහ වෙනස්කම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම.
* උප කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා ණය දෙන ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම.
* කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රමාද වීම නිසා සැලසුම් කළ පරිදි වියදම් දැරිය නොහැකි වීම.
* භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අග්‍රිම මුදල් සම්පූර්ණයෙන් නොලැබීම.
* සාමාන්‍ය අපේක්ෂිත ඉතිරිවීම් හා අරපිරිමැස්මෙන් වියදම් දැරීම නිසා වූ ඉතිරිවීම් ද මීට හේතු වී ඇත.

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධණ අමාත්‍යාංශය 2008

| | | | |
|---|---|---|---|
| (අ) (i) | අය වැයෙන් වෙන් කළ මුළු මුදල | **රු.** | **7,713,616,210** |
| (ii) | පුනරාවර්තන | රු. | 140,320,910 |
| | ප්‍රාග්ධන | රු. | 7,573,295,300 |
| (iii) | ඔව්. | | |
| (iv) | **මුළු වියදම** | **රු.** | **5,146,394,941** |
| | පුනරාවර්තන | රු. | 133,570,230 |
| | ප්‍රාග්ධන | රු. | 5,012,824,711 |
| | **මුළු ඉතිරිය** | **රු.** | **2,567,221,269** |
| | පුනරාවර්තන | රු. | 6,750,680 |
| | ප්‍රාග්ධන | රු. | 2,560,470,589 |

(v) ප්‍රතිපාදන ඉතිරි වීමට විවිධ හේතූන් බලපා ඇති අතර, ඉන් ප්‍රධාන හේතූන් සාරාංශ කොට පහත දක්වා ඇත.

* අය වැය චක්‍රලේඛ අංක 141 අනුව වියදම් පාලනය කිරීම.
* ව්‍යාපෘතිවල වැඩකටයුතු කරගෙන යන අවස්ථාවේ දී බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා ඉඩම් නිරීක්ෂණය කිරීමේ දී හා පවරා ගැනීමේ දී ගැටලු උද්ගත වීම හේතුවෙන් සැලසුම් කරන ලද වැඩකටයුතු ප්‍රමාද වීම සහ නීතිමය කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඉඩම් පවරා ගැනීම හා මැනුම් කටයුතු ප්‍රමාද වීම සහ ඉංජිනේරු සැලැස්ම වෙනස් කිරීමට සිදු වීම.
* කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරු විසින් අතරමැදි බිල්පත් නිසි වේලාවට ඉදිරිපත් නොකිරීම.
* මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම සම්පූර්ණයෙන්ම නිදහස් නොකිරීම.
* සාමාන්‍ය අපේක්ෂිත ඉතිරි වීම් හා අරපිරිමැස්මෙන් වියදම් දැරීම නිසා වූ ඉතිරිවීම් ද මීට හේතු වී ඇත.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය 2009

| | | | |
|---|---|---|---|
| (අ) (i) | අය වැයෙන් වෙන් කළ මුළු මුදල | **රු.** | 9,568,023,000 |
| (ii) | පුනරාවර්තන | රු. | 155,475,000 |
| | ප්‍රාග්ධන | රු. | 9,412,548,000 |
| (iii) | ඔව්. | | |
| (iv) | **මුළු වියදම** (අගෝස්තු දක්වා) | **රු.** | **3,971,076,228** |
| | පුනරාවර්තන | රු. | 85,000,232 |
| | ප්‍රාග්ධන | රු. | 3,886,075,996 |
| | **මුළු ඉතිරිය** | **රු.** | **5,596,946,772** |
| | පුනරාවර්තන | රු. | 70,474,768 |
| | ප්‍රාග්ධන | රු. | 5,526,472,004 |

(v) මෙහි ඉහත දක්වා ඇති වියදම 2009 අගෝස්තු 31 දක්වා වූ කාල සීමාවට පමණක් අදාළ වන බැවින් ඉදිරියේ දී ඇස්තමේන්තුගත ප්‍රතිපාදන දැරීමට අපේක්ෂා කෙරේ.

(අ) ප්‍රධාන ආයතන 10

1. භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
2. නාගරික සංවර්ධක අධිකාරිය
3. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
4. රීල් සමාගම
5. ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
6. නාගරික නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
7. ලුනාව පාරිසරික වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
8. ගාලු නගර සංවර්ධන ව්‍යාපෘතිය
9. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
10. කොළඹ පිටත වටරවුම් මාර්ග හා අනුබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

(ඇ) පැන නොනඟී.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බැහැ, වේලාව නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂයේ කණ්ඩායම් නායකතුමාත් ඇතුළුව ගත්ත තීරණය අනුව ප්‍රශ්න වේලාව පෙ.ව. 10.30 වන විට ඉවරයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අතුරු ප්‍රශ්නය පසුව මගෙන් අහන්න. උත්තර දෙන්නම්.

## වියළි කලාපීය ජීවනෝපාය පිළිබඳ උපකරණ ව්‍යාපෘතිය : වෙන් කළ මුදල

**உலர் வலய வாழ்வாதாரம் தொடர்பான உபகரண கருத்திட்டம்: நிதி ஒதுக்கீடு**

"IMPLEMENTS USED FOR LIVELIHOOD IN DRY ZONE" PROJECT : MONEY ALLOCATED

0467/'09

10. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) "වියළි කලාපීය ජීවනෝපාය පිළිබඳ උපකරණ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය කෙදිනක ආරම්භ කර කෙදිනක අවසන් වීමට නියමිතව තිබේද;

(ii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් සපුරා ගැනීමට බලාපොරොත්තු වන අරමුණ කවරේද;

(iii) "වියළි කලාපීය ජීවනෝපාය පිළිබඳ උපකරණ ව්‍යාපෘතිය" සඳහා 2007 වර්ෂයේ කොපමණ මුදලක් වෙන් කළේද;

(iv) වෙන් කළ මුළු මුදලින්, වර්ෂය අවසානයේ වැය කර ඇති ප්‍රතිශතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2007 වර්ෂය සඳහා වෙන් කළ මුදල් ඉතිරි වූයේ නම් කවර හේතුවක් නිසා එලෙස ඉතිරි වූයේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) "உலர் வலய வாழ்வாதாரம் தொடர்பான உபகரண கருத்திட்டம்" எனும் பெயரில் ஒரு கருத்திட்டம் ஆரம்பிக் கப்பட்டதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இக்கருத்திட்டம் எப்போது ஆரம்பிக்கப்பட்டு எப்போது நிறைவு செய்யப்படுவதற்கு உத்தேசிக்கப் பட்டுள்ளது,

[ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා]

(ii) இக்கருத்திட்டம் செயப்படுத்தப்படுவதன் மூலம் எய்துவிப்பதற்கு எதிர்பார்க்கப்படும் நோக்கம் யாது,

(iii) 'உலர்வலய வாழ்வாதாரம் தொடர்பான உபகரண கருத்திட்டத்துக்கு' 2007 ஆம் ஆண்டு எவ்வளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டது,

(iv) ஒதுக்கப்பட்ட முழுத்தொகையில் வருட இறுதியில் செலவு செய்யப்பட்டுள்ள சதவீதம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) 2007 ஆம் ஆண்டுக்கு ஒதுக்கப்பட்ட நிதி மீதமிருப்பின், மீதமாவதற்கான காரணம் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services:

(a) Is he aware that a project by the name of "Implements used for Livelihood in Dry Zone" was commenced?

(b) Will he inform this House-

(i) the scheduled dates for commencement and completion of the aforesaid project;

(ii) the objective expected to be achieved through the implementation of the project; and

(iii) the amount of money allocated in the year 2007 for the project by the name of "Implements used for Livelihood in Dry Zone"; and

(iv) the amount that had been spent by the end of the year as a percentage of the amount allocated?

(c) If the money allocated for the year 2007 has not been spent fully, will he state the reason for it?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) "වියළි කලාපීය ජීවනෝපාය පිළිබඳ උපකරණ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් මෙම අමාත්‍යාංශයේ ආරම්භ කර නොමැත.

(ආ) (i)
(ii) ඉහත (අ) අනුව අදාළ නොවේ.
(iii)
(iv)

(ඇ) ඉහත (අ) අනුව අදාළ නොවේ.

(ඈ) ඉහත (අ) අනුව අදාළ නොවේ.

## ශ්‍රී ලංකා - ඉන්දියානු ගිවිසුම් : විස්තර
**இலங்கை - இந்திய ஒப்பந்தங்கள் : விபரம்**
SRI LANKA- INDIA AGREEMENTS : DETAILS

0474/'09

11. **ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව 1948 සිට මේ දක්වා ඉන්දීය රජය සමග අත්සන් තැබූ ගිවිසුම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ආණ්ඩු කාලවලදීද;

(iii) එම එක් එක් ගිවිසුම්වලට අත්සන් තැබූ පුද්ගලයින්ගේ නම් හා තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 සිට මේ දක්වා කාල පරිච්ඡේදය තුළ ඉන්දීය රජය සමග රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා වට කොපමණ සංඛ්‍යාවක් පවත්වා තිබේද;

(ii) එම සාකච්ඡා පැවැත්වූ දිනයන් කවරේද;

(iii) එම සාකච්ඡා පැවැත්වූ ස්ථාන කවරේද;

(iv) එම සාකච්ඡාවලදී දෙරට නියෝජනය කළ පුද්ගලයින්ගේ නම් හා තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) இலங்கை 1948 முதல் இன்று வரை இந்திய அரசாங்கத்துடன் கைசாத்திட்டுள்ள உடன்படிக்கைகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) அது எந்த அரசாங்கங்களின் காலகட்டத்தில் என்பதையும்,

(iii) மேற்படி ஒவ்வொரு உடன்படிக்கையிலும் கைசாத்திட்டவர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) (i) 2005 முதல் இற்றை வரையிலான காலகட்டத்தில் இந்திய அரசாங்கத்துடன் இராஜதந்திர மட்டத்தில் எத்தனை சுற்று பேச்சு வார்த்தைகள் இடம் பெற்றுள்ளன என்பதையும்,

(ii) மேற்படி பேச்சுவார்த்தைகள் நடைபெற்ற திகதிகள் யாவையென்பதையும்,

(iii) பேச்சுவார்த்தைகள் நடைபெற்ற இடங்கள் யாவை யென்பதையும்,

(iv) மேற்படி கலந்துரையாடல்களின்போது இரண்டு நாடுகளையும் பிரதிநிதித் துவப்படுத்தியவர்களது பெயர் மற்றும் பதவிகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House-

(i) the number of Agreements Sri Lanka has signed with the Indian Government from 1948 up to now;

(ii) the governments in office when they were signed; and

(iii) the names and designations of those who were signatories to each of the aforesaid Agreements?

(b) Will he state-

(i) the number of rounds of talks held with the Indian Government at diplomatic level, within the period from 2005 up to now;

(ii) the dates on which the aforesaid talks were held;

(iii) the venues where talks were held; and

(iv) the names and designations of the persons who represented the two countries at the aforesaid talks?

(c) If not, why?

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. The Question has not been properly constructed, Sir. මෙන්න මේකයි තිබෙන ප්‍රශ්නය. මේ ප්‍රශ්නයෙන් අහන්නේ 1948 සිට මේ දක්වා ඉන්දියානු රජය සමඟ ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ගිවිසුම් ප්‍රමාණය. ගරු කථානායකතුමනි, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ ගිවිසුම් ගැන අහපුවාම අපට ඉතාමත් අපැහැදිලියි. There are Agreements, there are Accords, there are Treaties and there are MoUs. So, if I am to answer that Question, it must be properly constructed. ඒ අවශ්‍ය උත්තරය ලබා ගන්න අවශ්‍ය ප්‍රශ්නය හරියට ඉදිරිපත් කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලේකම්තුමා ඒ පිළිබඳව මන්ත්‍රීතුමා එක්ක සාකච්ඡා කරලා එතුමාට දන්වන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
එහෙම නම් මේක විග්‍රහ කර හරි විධියට යොමු කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12, ගරු රවි කරුණානායක මහතා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, පිළිතුර සභාගත කරන්න.

## පළාත් සහ ජාතික මට්ටමේ පාසල් : ගුරුවරුන්

### தேசிய மற்றும் மாகாண மட்டப் பாடசாலைகள் : ஆசிரியர்கள்

### SCHOOLS AT PROVINCIAL AND NATIONAL LEVELS : TEACHERS

0534/'09

12. **ගරු රවි කරුණානායක මහතා**
( மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2009 ජූලි 01,
2002 ජූලි 01,
1995 ජූලි 01,
යන දිනයන්හි දී ක්‍රියාත්මකව පැවති පළාත් මට්ටමේ සහ ජාතික මට්ටමේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වැටුප් ප්‍රමාණයන් සමඟ පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගුරු සිසු අනුපාතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වසර පහ තුළ වාර්ෂිකව පළමු වන ශ්‍රේණියට ඇතුළත් කළ ළමුන් සංඛ්‍යාව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2009 ஜூலை 1
2002 ஜூலை 1
1995 ஜூலை 1
ஆகிய திகதிகளில் மாகாண மட்டங்களிலும் தேசிய மட்டத்திலும் இயங்கிய பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) இன்றைய தினத்திலுள்ளவாறு மாகாண மட்டத்திலும் தேசிய மட்டத்திலுமுள்ள ஆசிரியர்களது எண்ணிக்கை எவ்வளவென்பதையும் அவர்களுக்கு வழங்கப்படும் சம்பளத்தொகை எவ்வளவு என்பதைத் தனித்தனி யாகவும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) ஆசிரிய, மாணவ விகிதாசாரம் என்னவென்பதை அவர் தெரிவிப்பாரா?

(இ) கடந்த ஐந்து வருடங்களாக ஆண்டுதோறும் முதலாம் தரத்திற்கு அனுமதிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை என்னவென்பதையும் அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of schools that are operative at provincial level and national level as at;
01st July, 2009
01st July, 2002
01st July, 1995; and

[ගරු රවි කරුණානායක මහතා]

(ii) the number of teachers as at today along with the amount of salaries, separately as provincial level and national level?

(b) Will he state the student to teacher ratio?

(c) Will he also state the number of children admitted to Grade 1 classes annually for the last five years?

(d) If not, why?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

පිළිතුර සූදානම්. ගරු කථානායකතුමාගේ නියෝගය අනුව පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| අනු අංකය | දිනය | ජාතික පාසල් | පළාත් පාසල් |
|---|---|---|---|
| 01 | 2009 ජූලි 01 | 333 | 9329 |
| 02 | 2002 ජූලි 01 | 323 | 9506 |
| 03 | 1995 ජූලි 01 | 184 | 10085 |

(අ) (ii)

| | ජාතික පාසල් | | පළාත් පාසල් | |
|---|---|---|---|---|
| පළාත් | ගුරුවරුන් සංඛ්‍යාව | වැටුප් මුදල | ගුරුවරුන් සංඛ්‍යාව | වැටුප් මුදල |
| 01. බස්නාහිර | 7,857 | 2,131,347,768.00 | 33,490 | 8,808,199,596.00 |
| 02. මධ්‍යම | 4,245 | 1,131,086,676.00 | 37,271 | 6,852,547,656.00 |
| 03. දකුණ | 6,289 | 1,675,638,360.00 | 23,328 | 5,913,998,076.00 |
| 04. උතුර | 965 | 240,801,912.00 | 11,272 | 2,913,487,716.00 |
| 05. නැගෙනහිර | 2,084 | 540,000,252.00 | 15,491 | 3,770,029,644.00 |
| 06. වයඹ | 3,545 | 951,682,356.00 | 23,478 | 6,140,572,824.00 |
| 07. උතුරු මැද | 1,025 | 257,892,480.00 | 13,094 | 2,944,136,952.00 |
| 08. ඌව | 2,615 | 702,683,436.00 | 14,744 | 3,420,456,672.00 |
| 09. සබරගමුව | 3,005 | 806,387,892.00 | 18,886 | 4,707,716,268.00 |
| එකතුව | 31,630 | 8,437,521,132.00 | 191,054 | 45,471,145,404.00 |

(ආ) 1: 18කි.

| (ඇ) වර්ෂය | පළමු ශ්‍රේණියට ඇතුළත් කළ ළමුන් සංඛ්‍යාව |
|---|---|
| 2004 | 303269 |
| 2005 | 319078 |
| 2006 | 322431 |
| 2007 | 332200 |
| 2008 | 326447 |

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 13 -0778/'09 - (1), ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 14 - 0468/'09 - (1), ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

## ගෘහස්ථ ගෑස් සිලින්ඩර : බදු
**வீட்டுப் பாவனை எரிவாயுச் சிலிண்டர்: வரி**
DOMESTIC GAS CYLINDER : TAXES

0475/'09

15. **ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ ගෑස් සිලින්ඩරයකින් රජය අය කරනු ලබන බදු මුදල කොපමණද;

(ii) 2009 පෙබරවාරි මාසයේදී කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ ගෑස් සිලින්ඩරයකින් අය කරන මුදල කොපමණ ප්‍රමාණයකින් වැඩි කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගෘහස්ථ ගෑස් සිලින්ඩර මත පනවන ලද බදු මුදලින් 2008 වර්ෂයේදී රජය ඉපයූ මුළු ආදායම කොපමණද

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 12.5 கிலோகிராம் அடங்கிய வீட்டுப் பாவனைக்கான ஓர் எரிவாயுச் சிலிண்டரிலிருந்து அரசாங்கம் அறவிடுகின்ற வரித் தொகை எவ்வளவென்பதையும்,

(ii) 2009 பெப்ருவரி மாதத்தில் 12.5 கிலோகிராம் அடங்கிய வீட்டுப் பாவனைக்கான ஓர் எரிவாயுச் சிலிண்டரிலிருந்து அறவிடுகின்ற தொகை எந்தளவில் அதிகரிக்கப்பட்டதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) வீட்டுப்பாவனைக்கான எரிவாயுச் சிலிண்டர்கள் மீது விதிக்கப்பட்ட வரியின் மூலம் 2008ஆம் ஆண்டில் அரசாங்கம் ஈட்டியுள்ள மொத்த வருமானம் எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House of-

(i) the amount of tax money levied by the Government from one 12.5 kilogram domestic gas cylinder; and

(ii) the amount by which the tax money levied from one 12.5 kilogram domestic gas cylinder was increased in February, 2009?

(b) Will he state the total amount of money earned by the Government in the year 2008 from the tax that was imposed on domestic gas cylinders?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) 2009 සැප්තැම්බර් 30 දිනට,

| *බදු වර්ගය* | *බදු ප්‍රතිශතය* | *මුදල රු.* |
|---|---|---|
| නිෂ්පාදන බදු | කි.ග්‍රෑමයකට රු 30.60 | 382.50 |
| සමාජ වගකීම් බද්ද | නිෂ්පාදන බදු මුදලින් 1.5% | 5.74 |
| වරාය සංවර්ධන බද්ද | මි.ර.ගැ.වටිනාකමින් 5% | 35.32 |
| මුළු බදු මුදල | | 426.56 |

මෙසේ ගෑස් සඳහා බදු පනවන ලද්දේ විදේශීය වෙළෙඳ පොළේ මිල ගණන් පහත යමින් තිබූ අවධියකය. එසේ බදු පනවන විට මිල පහළ යෑමේ වාසියෙන් කොටසක් පාරිභෝගිකයාටත් ලැබෙන ලෙස මෙම බදු පැනවීම සිදු කර ඇත. ඒ අතරම නිෂ්පාදන සඳහා වැඩි වශයෙන් බලශක්ති ප්‍රභේදයක් ලෙස විශාල ප්‍රමාණයෙන් ගෑස් භාවිත කරනු ලබන දේශීය නිෂ්පාදකයින්ට දිරි දීමක් සහ සහනයක් වශයෙන් ඔවුන්ව නිෂ්පාදන බදුවලින් නිදහස් කර ඇත.

ඒ අතරම ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල ඉහළ යන අවස්ථාවලදී බදු අඩු කිරීම තුළින් දේශීය වෙළෙඳ පොළ මිල ගණන් වෙනස් නොකර සිටීමට ද රජය කටයුතු කර ඇත. එයට හොඳම උදාහරණය වන්නේ 2009 නොවැම්බර් 01 වන දින ගෑස් මිල රු. 163කින් ඉහළ යෑමට තිබුණ බදු අඩු කිරීම තුළින් ෂෙල් ගෑස් සිලින්ඩරයක මිල නොවෙනස්ව පවත්වා ගැනීමට රජය කටයුතු කර ඇත.

(ii) ෂෙල් ගෑස් මිල රු. 310කින් සහ ලාෆ්ස් ගෑස් මිල රු. 334කින් අඩු කරන ලදී.

(ආ) රු. මිලියන 126යි.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රකාශය. [බාධා කිරීම්] ගරු රංගෙ බණ්ඩාර මහතා නැඟී සිටියේ ඇයි? [බාධා කිරීමක්] ඊ ළඟට අහන්න. ගරු අනුර දිසානායක මහතාගේ ප්‍රකාශය. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ ආසනයේ නොවෙයි ඉන්නේ.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

# එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා සම්මුඛ පරීක්ෂණයකට කැඳවීම
## அமெரிக்க உள்துறைப் பாதுகாப்புத் திணைக்களத்தினால் ஜெனரல் சரத்பொன்சேகா நேர்காணலுக்கு அழைக்கப்பட்டமை
## SUMMONS BY US DEPARTMENT OF HOMELAND SECURITY TO GENERAL SARATH FONSEKA FOR AN INTERVIEW

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, තිස් වසරක් පුරා අපේ රටට විශාල විනාශයක් සිදු කළ බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවත්, මහ ජනතාවත් ඉතා විශාල කැප කිරීමක් සිදු කර තිබෙනවා. එසේ රටට ජයග්‍රහණය හිමි කර දීම සඳහා ඉමහත් මෙහෙවරක් කළ හමුදා නායකයින්ට එරෙහිව දියත් වන ක්‍රියා මාර්ග පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට මා බලාපොරොත්තු වනවා.

එල්ටීටීඊ සංවිධානය දැවැන්ත අවි බලයක් හා පිරිස් බලයක් සහිතව ලෝකයේ ප්‍රබලතම ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වුණා. ඔවුන්ට අති නවීනතම අවි ආයුධ හා දක්ෂ විදේශීය යුද උපදේශකයන් සිටියා. එවැනි බලවත් සංවිධානයක් යුදමය වශයෙන් පරාජය කිරීම සඳහා ඉතාම දියුණු යුද උපක්‍රම හා විශාල කැප කිරීමක් අවශ්‍යයි. ඒ යුද උපක්‍රම තේරීමේදී හා යුද බිමේ එම සැලසුම් යථාර්ථයක් බවට පත් කිරීමේදී අප රටේ ආරක්ෂක හමුදාවන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළා. ඒ සඳහා හමුදා නායකත්වය දැවැන්ත කාර්ය භාරයකට උර දුන් බව මෙම ගරු සභාව පිළිගන්නවා ඇතැයි මම විශ්වාස කරනවා. ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක සේවාවේ විශාල පිරිසක් මෙම ජයග්‍රහණය වෙනුවෙන් විවිධාකාරයේ කැප කිරීම් කළා. එමෙන්ම, එම ආරක්ෂක අංශවලට නායකත්වය දුන් හමුදා නායකයින් නොසිටින්න මෙම

[ගරු අනුර දිසානායක මහතා]

ජයග්‍රහණය අපේ රටට හිමි කර ගැනීමට හැකි වන්නේ නැහැ. ත්‍රස්තවාදය පරාජය කිරීමේ යුද්ධය මෙහෙයුමේදී එවකට යුද හමුදාපතිවරයාව සිටි වත්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා අති සුවිශේෂී කාර්ය භාරයක් කළා. ඒ බව මෙම ගරු සභාවේ සිටින සියලු දෙනා පිළිගන්නා බවට කිසිදු සැකයක් නැහැ.

රට වෙනුවෙන් ඓතිහාසික කාර්ය භාරයක් ඉටු කළ ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමේ උත්සාහයක් පිළිබඳව වාර්තා වී තිබෙනවා. මේ වන විට පෞද්ගලික සංචාරයක් සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයට ගොස් සිටින සරත් ෆොන්සේකා මහතාට අද දින එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂක හා ආගමන විගමන දෙපාර්තමේන්තුව ඉදිරියේ පෙනී සිටින ලෙස දැනුම් දී තිබෙනවා. තමන්ට එවැනි දැනුම් දීමක් ලැබුණු බව ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා තානාපති කාර්යාලයටත්, ආරක්ෂක ලේකම්වරයාටත් දැනුම් දී තිබෙනවා.

මෙය අපේ රටේ ආරක්ෂාවත්, රටට ජයග්‍රහණය හිමි කර දීමට දායක වූ හමුදා නායකයින්ගේ ආරක්ෂාවත් පිළිබඳ බරපතළ අවදානමක් ඇති කරන බව මා විශ්වාස කරනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ පුරවැසිභාවය අපේක්ෂා කරන අයට සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට සිදු වනවා. ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා ගෙන්වන්නේ එවැනි සම්මුඛ පරීක්ෂණයකට නම් එහි ප්‍රශ්නයක් නැහැ. නමුත් දැනට වාර්තා වන අන්දමට ඔහුගෙන් ශ්‍රී ලංකාවේ සිදු වූ යුද මෙහෙයුම් පිළිබඳ ප්‍රශ්න කිරීමේ සූදානමක් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීවරයාගෙන් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර යුද හා දේශපාලන ක්‍රියා මාර්ග පිළිබඳ ප්‍රශ්න කිරීමක් කරන්නේ නම් එය ඉතාම බරපතළ බව අප සියලු දෙනා පිළිගන්නවා. පසු ගිය කාලයේ සිදු කළ යුද මෙහෙයුම්වලදී ජාත්‍යන්තර නීතියට හා සදාචාරයට පටහැනි දේවල් සිදු වී ඇතැයි ඇමෙරිකා එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩලයට වාර්තාවක් පවා පසු ගිය දිනවල ඉදිරිපත් වී තිබුණා. එම නිසා ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් එවැනි දේ පිළිබඳ ප්‍රශ්න කරනු ඇතැයි බොහෝ මාධ්‍ය වාර්තා කොට තිබෙනවා. එවැනි ප්‍රශ්න කිරීමක් සිදු කිරීමට ඇමෙරිකා එක්සත් ජනපදයට කිසිදු අයිතියක් නැහැ. එමෙන්ම එවැනි ප්‍රශ්න කිරීමකට ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා කැඳවීම තුළ එතුමාගේ ආරක්ෂාව පිළිබඳ ඉතාම බරපතළ අවදානමක් ඇති වී තිබෙනවා.

එබැවින් මෙම ප්‍රශ්න කිරීම පිළිබඳව මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු විය යුතු යැයි මා සිතනවා. දැනට සිදු වෙමින් පවතින සිදුවීම් රටේ ජාතික ආරක්ෂාවටත්, රට වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ ජෙනරාල් සරත් ෆොන්සේකා ඇතුළු හමුදා නායකයින්ටත් තර්ජනයක් එල්ල කර තිබෙනවා. එබැවින් මේ පිළිබඳව ශ්‍රී ලංකා රජය කඩිනමින් පියවර ගත යුතුව තිබෙනවා. මේ වන විටත් ඒ සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට ආණ්ඩුව පියවර ගනු ඇතැයි මම විශ්වාස කරනවා. ඒ නිසා පහත ප්‍රශ්න පිළිබඳව ගරු අගමැතිතුමා හෝ මෙම ගරු සභාවට කරුණු ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. මේ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද?
2. ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවීම සම්බන්ධයෙන් ආණ්ඩුව මේ වන විට ගෙන ඇති රාජ්‍යතාන්ත්‍රික පියවර කවරේද?
3. උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව එක්සත් ජනපද ආණ්ඩුව සමඟ සාකච්ඡා කිරීමට රජයේ විශේෂ නියෝජිත පිරිසක් නම් කර තිබේද?
4. මේ පිළිබඳව එක්සත් ජනපද ආණ්ඩුව සමඟ සාකච්ඡා කර ඇත්නම් එහිදී එළඹුණු එකඟතා කවරේද?
5. මේ පිළිබඳව ශ්‍රී ලංකා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට ලිඛිතව උපදෙස් ලබා දී තිබේද?

උක්ත ප්‍රශ්න පිළිබඳව රජය පාර්ශ්වයෙන් මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි විශ්වාස කරන අතර මේ පිළිබඳව මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ස්තුතියි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Rohitha Bogollagama - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, මාගේ මිත්‍ර ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් කරන ලද විශේෂ ප්‍රකාශය සම්බන්ධයෙන් රජය වෙනුවෙන් පිළිතුරු සැපයීමට මා බලාපොරොත්තු වනවා.

අපගේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචාරයක යෙදී සිටියා. ඒ සංචාරයේ කාලය තුළදී 28 වන දා ඔහුට දුරකථන ඇමතුමක් ලැබී තිබුණා, ඇමෙරිකා එක්සත් ජනපදයේ ඔක්ලහෝමා ප්‍රාන්තයේ ස්වදේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුවට - to the Oklahoma Office of Homeland Security - පැමිණ කට උත්තරයක් ලබා දෙන්නය කියලා. එහිදී වඩාත් සඳහන් කර තිබෙනවා, මේ කට උත්තරය ලබා ගන්න උත්සාහ කරන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධයෙන්ය, ඔහු පසු ගිය කාලයේ මේ රටේ එල්ටීටීඊ ත්‍රස්තවාදී යුද්ධය මෙහෙයවන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් සිදු කෙරුණු මානුෂික අපරාධ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගන්නය කියලා. ඒ ප්‍රකාශය ලංකාවට ලැබුණේ සරත් ෆොන්සේකා මහතාගෙන් අපගේ ආරක්ෂක ලේකම්වරයාටයි. ඒ අනුව ඔහු ශ්‍රී ලංකාවේ තානාපති ජාලිය වික්‍රමසූරිය මහතා දැනුවත් කරලා, රජය විධියට විශේෂයෙන්ම සරත් ෆොන්සේකා මැතිතුමාට අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික සහයෝගය, සහාය ලබා දෙන්න මා කටයුතු කර ගෙන ගියා.

ඒ අනුව නොවැම්බර් මාසයේ 02 වන දින සවස 3.00ට ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපතිවරිය වන පැට්‍රීෂියා බුටෙනිස් මැතිනිය මාගේ විදේශ කටයුතු අමාත්‍යාංශයට කැඳවා ඉල්ලීමක් කළා, සරත් ෆොන්සේකා මහතා ශ්‍රී ලංකාවේ රජයේ ඉතාමත්ම වැදගත් තනතුරක් දරන ආරක්ෂක ප්‍රධානියෙක්; ඔහු සතු සියලු තොරතුරු, වරප්‍රසාද තොරතුරු - privileged information - කිසිදු ආකාරයකින් තුන් වන පාර්ශ්වයකට ලබා දීමට රජයේ නිලධාරිවරයකු හැටියට නොහැකියි කියන කාරණය සම්බන්ධයෙන්. ඒ ස්ථාවරය උඩ මා එම ඉල්ලීම කළා. එතුමියට මා ලිඛිතව භාර දුන්නා, ශ්‍රී ලංකා රජයේ තත්ත්වය පිළිබඳව Aide Memoire කියන රාජ්‍ය තාන්ත්‍රික හුවමාරු ලිපිය. මේ ලිපියේ මා විශේෂයෙන් සඳහන් කළේ, වරප්‍රසාදයක් ඇති තොරතුරු ශ්‍රී ලංකා නිලධාරිවරයකුගෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ කිසිම දෙපාර්තමේන්තුවකට ලබා ගැනීම සඳහා අවතීර්ණ වන්නට රජයක් විධියට හෝ රටක් විධියට ඇමෙරිකා එක්සත් ජනපදයට කිසිදු අවකාශයක් නැහැ කියලායි. ඒ අනුව මා ඉල්ලා සිටියා, ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාව 04 වන දින සවස 3.00ට ඔක්ලහෝමා ප්‍රාන්තයේ ස්වදේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කැඳවා පවත්වන්නට යන ඒ සම්මුඛ පරීක්ෂණය වහාම නවත්වා, සරත් ෆොන්සේකා මහතාට ශ්‍රී ලංකාවට පැමිණීමට අවකාශය ලබා දෙන්නය කියලා. ඒ අනුව රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව තුළින් ඊයේ සවස් භාගයේත්, ඊයේ රාත්‍රී භාගයේත්

මා ඇමෙරිකා එක්සත් ජනපදය සමඟත්, විශේෂයෙන්ම තානාපති පැට්‍රීෂියා බුටෙනිස් මහත්මිය සමඟත් සාකච්ඡාවන් පැවැත්වූවා. අප බලාපොරොත්තු වනවා, එහි ප්‍රතිඵලයක් විධියට මේ කැඳවා තිබෙන සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිඵල අපට ලැබෙනවාය කියන එක.

අපි දරලා තිබෙන මේ ප්‍රයත්නය නිසා ඒ සම්මුඛ පරීක්ෂණයට සරත් ෆොන්සේකා මහතා නොකැඳවලා, නැත්නම් ඊට නොපෙනී සිට එතුමාට ශ්‍රී ලංකාවට ඒමේ අවකාශය ලැබෙනවායි කියන එකයි මගේ විශ්වාසය. විශේෂයෙන්ම, -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තවම එකඟතාවකට ඇවිත් නැද්ද?

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
ගරු මන්ත්‍රීතුමනි, මම තවම කථා කරනවා නේ? තවම මම කථා කරලා අවසාන නැහැ නේ. පොඩ්ඩක් ඉන්න. I will explain to you. [බාධා කිරීමක්] දැන් කරුණාකරලා මගේ කථාව කරන්න දෙන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ.

මේක ඉතාමත්ම වැදගත්. මේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවන් පවත්වා ගෙන යන කොට ආවාට ගියාට පිළිතුරු දීලා කාටවත් මේවායෙන් ගොඩ එන්න බැහැ. අනිත් එක, ප්‍රකාශ කළ පමණින්ම, පාර්ලිමේන්තුව තුළ ඔබතුමාගේ වාගේ ප්‍රකාශවලින් පමණක් මේවාට විසඳුම් හොයා ගන්නත් බැහැ. මේකට ක්‍රමවේද කීපයක් තිබෙනවා. මේ ක්‍රමවේද තුළ අපි රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවන් පවත්වා ගෙන යන කොට විශේෂයෙන්ම අපට අවශ්‍ය ඒ ප්‍රතිඵල ලබා ගත යුතුයි. මම මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා අදාළ ලෙස අපිට ඒ ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාවක් තිබෙන බව. ගෝඨාභය රාජපක්ෂ ලේකම්වරයා - අපේ ආරක්ෂක ලේකම්තුමා- යම් කොටු කර ගැනීමකට උත්සාහයක් තිබුණා නම්-

ඇමෙරිකා එක්සත් ජනපදය තුළ Tamils Against Genocide - TAG - කියා සංවිධානයක් තිබෙනවා. නීත්‍යානුකූලව හෝ නොයෙකුත් ක්‍රියා මාර්ග තුළින් අපේ යම් යම් පිරිස් කොටු කර ගැනීමේ ක්‍රමවේදයකට එන්න මෙන්න මේ සංවිධානයේ යම් මෙහෙයුමක් තිබෙනවා. ඒ ගැන අපි දැනුවත් වෙලා තිබෙනවා. අද “The Island” පුවත් පතේ මේ ගැන සුවිශේෂ කතු වැකියකුත් තිබෙනවා. ඒ කතු වැකිය කියෙව්වාම පෙනෙනවා ත්‍රස්ත හස්තවලින් කොච්චර දුරට ව්‍යාකූලත්වයක් ගොඩ නඟන්න උත්සාහ කරනවාද කියන එක. අද "දිවයින" පුවත් පතෙත් මේ පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඉන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තමුන්නාන්සේ නොවෙයි නේ- [බාධා කිරීමක්]

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
Why are you all getting excited? When I am hitting the LTTE why are you getting excited? Mr. Gotabhaya must be protected. Why is he getting targeted? -[*Interruption.*] All this is connected. ඔබතුමා මේකේ පසු බිම ගැන දැන ගන්න. Why are you against my speaking for Mr. Gotabhaya? He is the centrepiece here; he is the centrepiece.

ගරු කථානායකතුමනි, මෙහි ඉතාමත්ම වැදගත් අවස්ථාව මෙයයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් ඉතාමත් පැහැදිලිව කිව්වා, මේ ත්‍රස්තවාදය පරාජය කරලා ලබා ගෙන තිබෙන නිදහස අද ශ්‍රී ලංකාවේ සියලුම ජන කොටස්වලට ලැබී තිබෙනවා, එහෙම නම් ඒ කාර්යය මෙහෙයවීමේ වගකීම එතුමා භාර අර ගෙන තිබෙනවා කියන එක. ඒ අනුව තමයි අද රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපි ලෝකයට හඬ නඟලා කියන්නේ, අපේ තිබෙන ශක්තිය, අපේ තිබෙන සම්බන්ධතාව, අපේ තිබෙන මිත්‍රත්වය. මෙන්න මේ, මේ රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවේදය තුළින් අද ශ්‍රී ලංකාවේ උන්නතියට, ශ්‍රී ලංකාවේ යහපතට පාවිච්චි කරන අවස්ථාවක් විධියට සරත් ෆොන්සේකා ජනරාල්තුමාගේ මේ සිද්ධිය අපිට මේ ගරු සභාවට එළි දක්වන්න පුළුවන්.

අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්න මාලාවක් යොමු කළා. එහි පළමු වෙනි එක තමයි මේ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද කියන එක. ඒකට උත්තරය මේකයි.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන නිලධාරි තනතුර ශ්‍රී ලංකා රජයේ ඉහළම මට්ටමේ නිලයකි. මෙම තනතුර උසුලන ජෙනරාල් ෆොන්සේකා මහතා ඇමෙරිකා එක්සත් ජනපදයට ගොස් ඇත්තේ කලින් නියම කර ගත් කටයුත්තක් සඳහා නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයකිනි. තවද, රජයේ සේවයේ නිරතව සිටි කාලයේදී ජෙනරාල් ෆොන්සේකා මහතාගේ අනුදැනීමට ලක්ව ඇති තොරතුරු "වරප්‍රසාද ලත් තොරතුරු" ලෙස සැලකිය යුතු ඒවාය. එහෙයින් ශ්‍රී ලංකා බලධාරීන්ගේ අවසරය හා අනුමැතිය නොමැතිව එම තොරතුරු තුන් වැනි පාර්ශ්වයකට හෙළිදරවු කිරීමට හෝ එවැනි තුන් වැනි පාර්ශ්වයක් සමඟ බෙදා හදා ගැනීමට හෝ ඔහුට කිසිම අයිතියක් නොමැත. එසේම ජෙනරාල් ෆොන්සේකා මහතා සමඟ කිසිම ආකාරයක සම්මුඛ සාකච්ඡාවක් කිරීමෙන් ඇමෙරිකාවේ ස්වදේශීය ආරක්ෂක කටයුතු දෙපාර්තමේන්තුව වැළකී සිටිය යුතුය යන්න ශ්‍රී ලංකා රජයේ ස්ථාවරයයි.

දෙ වන ප්‍රශ්නය සහ උත්තරය මෙසේයි. ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවීම සම්බන්ධයෙන් ආණ්ඩුව මේ වන විට ගෙන ඇති රාජ්‍ය තාන්ත්‍රික පියවර කවරේද? ඒ රාජ්‍ය තාන්ත්‍රික පියවර සම්බන්ධයෙන් විශේෂයෙන්ම මා තමුන්නාන්සේලා දැනුවත් කළා. අපි ඇමෙරිකා එක්සත් ජනපදයට ලිඛිතව ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරයත්, මේ පරීක්ෂණය පැවැත්විය නොයුතු බවත් ප්‍රකාශ කර ඇමෙරිකා තානාපතිවරිය ශ්‍රී ලංකාවේදීත්, අපේ තානාපතිවරයා හරහා ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව වොෂින්ටනයේදීත් දැනුවත් කරලා ඒ සම්බන්ධයෙන් නිරතුරුවම කටයුතු කර තිබෙන බව ප්‍රකාශ කරනවා.

තුන් වනුව, උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව එක්සත් ජනපද ආණ්ඩුව සමඟ සාකච්ඡා කිරීමට රජයේ විශේෂ නියෝජිත පිරිසක් නම් කර තිබේද කියා අසා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍යතාවක් නැහැ. වොෂින්ටන් නුවර අපේ තානාපතිවරයකු ඉන්නවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපතිවරියක් ඉන්නවා. ඒ දෙ ගොල්ල අතර ශ්‍රී ලංකා රජයේ විදේශ කටයුතු අමාත්‍යවරයා විධියට මමත්, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් නිරතුරුවම කටයුතු කර ගෙන යනවා. ඒ නිසා ඒ සඳහා විශේෂ නිලධාරිවරුන් පත් කිරීමේ අවශ්‍යතාවක් නොමැත.

මේ පිළිබඳව එක්සත් ජනපද ආණ්ඩුව සමඟ සාකච්ඡා කර ඇත්නම් එහිදී එළඹුණු එකඟතා කවරේද කියා ඊ ළඟට අසා තිබෙනවා. ශ්‍රී ලංකා රජය මඟින් දන්වන ලද රජයේ ස්ථාවරය ඇමෙරිකාවේ ස්වදේශීය ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවේ වෙසෙන ඇමෙරිකානු තානාපතිවරිය මේ මස 02 වැනි දින මා හමු වූ අවස්ථාවේදී එකඟත්වය පළ කර ඇත. ඒ හා සමගාමීව ඊයේ රාත්‍රී එතුමිය මා දැනුවත් කළා, අපගේ ඒ ඉල්ලීම අදාළ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව.

පස් වනුව මේ පිළිබඳව ශ්‍රී ලංකා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ජනරාල් සරත් ෆොන්සේකා මහතාට ලිඛිතව උපදෙස් ලබා දී

[ගරු රෝහිත බෝගොල්ලාගම මහතා]

තිබේද කියා අසා තිබෙනවා. එවැනි ලිඛිත උපදෙසක් නොව, පූර්ණ කාලීනව ශ්‍රී ලංකාවේ තානාපති ජාලිය වික්‍රමසූරිය මහතා අපගේ උපදෙස් අනුව කටයුතු කරමින් එතුමා සමඟ සම්බන්ධ වෙලා සියලු කටයුතු සඳහා එතුමාට අවශ්‍ය පූර්ණ සහයෝගය හා අදාළ සියලුම සහාය, අනුග්‍රහය, සම්බන්ධීකරණය සහ මේ සම්බන්ධයෙන් සංවිධානය යොමු කරලා තිබෙන බව මම මේ සභාවට ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ අනුව ශ්‍රී ලංකාවේ කීර්ති නාමයට හානියක් නොවන ආකාරයෙන්, ඒ වාගේම ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ තිබෙන විදේශ සම්බන්ධතා ශක්තිය විශේෂයෙන්ම එළිදැක්වෙන අවස්ථාවක් විධියට මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ශ්‍රී ලංකා රජයට හැකි වන බවට මම මේ සභාව දැනුවත් කරනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා. [බාධා කිරීම්] පැහැදිලි කිරීමක් ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා. කතා කරන්න. [බාධා කිරීම්] පැහැදිලි කිරීමක්. මොකක්ද? [බාධා කිරීම්] පැහැදිලි කර ගැනීමක්.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි එදා ඉන්දු - ලංකා ගිවිසුමෙන් පසුව ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා, ත්‍රිවිධ හමුදාවේ උදවිය - [බාධා කිරීමක්] ඒක තමයි වග කීමෙන් ආරක්ෂා කිරීමේ පනත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමකට එකඟද?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

වග කීමෙන් ආරක්ෂා කිරීමේ පනත නමින් පනතක් එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ගෙනාවේ යුද්ධයෙන් පසුව යම් යම් ආණ්ඩුවේ - [බාධා කිරීමක්] යම් යම් දේවල් සිද්ධ වුණා නම් - [බාධා කිරීමක්]

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

අද හවස Adjournment Debate එකක් තිබෙනවා. ඒකෙදි මේ ප්‍රශ්නය යොමු කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද සවස විවාදයක් තිබෙනවා. [බාධා කිරීමක්] දැන් ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු කථානායකතුමනි, පොඩ්ඩක් පැහැදිලි කර ගන්න දෙන්නෙත් නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද සවස සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නය ඉදිරිපත් කරන කොට ඒ අවස්ථාවේදී පැහැදිලි කර ගැනීමට පුළුවනි. ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු මර්වින් සිල්වා ඇමතිතුමනි, කරුණාකර ආසනයට යන්න. ඔතැන හිට ගෙන ඉන්න ඔබතුමාට අයිතියක් නැහැ. ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, මගේ ආරක්ෂාව නොසැපයීම සම්බන්ධව 2009.10.21 වෙනි දින මා ඔබතුමාව දැනුවත් කළා. ඒ අනුව ඔබතුමා ක්ෂණිකව ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳව මා ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. ගරු කථානායකතුමනි, නමුත් ඉන් අනතුරුව නුගේගොඩ පොලිස් අධිකාරිතුමා විසින් ඔබතුමා වෙත එවන ලද ලිපියක් මා හට ලැබී තිබෙනවා. ඒ අනුව මගේ ආරක්ෂාව සඳහා ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රතිපාදන නැහැ කියන එක තමයි නුගේගොඩ පොලිස් අධිකාරිවරයා දැනුම් දී තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා අමතා අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, හරි. ඒක තමයි මා ඔබතුමා ගත් ක්‍රියා මාර්ගය පිළිබඳව මගේ ප්‍රශංසාව පුද කළේ. ගරු කථානායකතුමනි, මගේ ආරක්ෂාව සැලසීමට ප්‍රතිපාදන නැහැයි කියලා පොලිස්පතිතුමා දැනුම් දී තිබෙන බවයි දැන ගන්නට ලැබුණේ. ගරු කථානායකතුමනි, එතකොට මා වාගේම මේ පාර්ලිමේන්තුවට පත් වුණු පුත්තලම දිස්ත්‍රික්කයේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමාට වෙන්නප්පුව පොලීසිය විසින් නිලධාරින් දෙදෙනෙකුත්, ලැරින් පෙරේරා මැතිනියගේ ගෙදර ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරින් දෙදෙනෙකුත්, දයාශ්‍රිත තිසේරා ඇමතිතුමාගේ නිවසේ ආරක්ෂාවට වෙන්නප්පුව පොලීසියෙන් නිලධාරින් තුන් දෙනෙකු සහ වනාතවිල්ලුව පොලීසියෙන් එක් නිලධාරියකු වශයෙන් නිලධාරින් හතර දෙනෙකුත්, අපේ නියෝජ්‍ය කථානායක පියංකර ජයරත්න මැතිතුමාට මාදම්පේ පොලීසියෙන් නිලධාරින් තුන් දෙනෙකුත්, නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාගේ නිවසේ ආරක්ෂාවට කල්පිටිය පොලීසියෙන් නිලධාරින් හතර දෙනෙකුත්, පුත්තලම නගරාධිපතිතුමාට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි,

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. පුත්තලම නගරාධිපතිතුමාට ගෙදර ආරක්ෂාවට නිලධාරින් දෙදෙනෙකුත්, හලාවත නගරාධිපතිවරයාට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මම ඒ කරුණු ආරක්ෂක ලේකම්තුමාට දැන්වුවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

හරි, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඒක නොවෙයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හලාවත නගරාධිපතිවරයාගේ ගෙදර ආරක්ෂාවට එක නිලධාරියෙකුත්, ඒ වාගේම කේ.ඒ. බයිස් - [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] –

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ගැලරියේ සිටින බව කරුණාකර පියවරුන්ට - ගරු මන්ත්‍රීවරුන්ට- මා මතක් කරන්නට කැමැතියි. [බාධා කිරීමක්] කරුණාකර වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්නය නඟන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, කේ.ඒ. බයිස් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ගෙදර ආරක්ෂාවට වනාතවිල්ලුව පොලීසියෙන් නිලධාරින් හතර දෙනෙකුත්, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මා එතැනට එනවා, ගරු කථානායකතුමනි. වීරකුමාර දිසානායක මන්ත්‍රීවරයාට වනාතවිල්ලුව පොලීසියෙන් නිලධාරින් දෙදෙනෙකුත්, පියංකර ජයරත්න මහත්මයාට ආනමඩුව පොලීසියෙන් එක නිලධාරියෙකුත්, පළාත් සභා මන්ත්‍රී -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය ඕක නොවෙයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒකත් ගන්නවා, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය දැන් අහන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පියංකර ජයරත්න මැතිතුමාට ආනමඩුව පොලීසියෙන් එක නිලධාරියෙකුත්, පළාත් සභා මන්ත්‍රීනි ඉන්ද්‍රානි දසනායක මහත්මියට ආනමඩුව පොලීසියෙන් නිලධාරින් දෙදෙනෙකුත් ආදී වශයෙන් ලබා දීලා තිබෙනවා. සමන්සිරි හේරත් මන්ත්‍රීතුමාටත් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අපි දැන්වුවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මේ ආදී අන්දමට ඇමති ආරක්ෂක අංශයේ ආරක්ෂක භටයින්ට අමතරව නිවසේ ආරක්ෂාව සඳහා මේ සියලුම මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දීලා තිබෙනවා. එතකොට පොලිස්පතිවරයා ඔබතුමාට එවා තිබෙන ලිපියේ මගේ ආරක්ෂාව සඳහා එවැනි ප්‍රතිපාදන නැහැයිලු. එතකොට මං ඊට වඩා වෙනස් ක්‍රමයකට පත් වුණු මන්ත්‍රීවරයෙක්ද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය මා එතුමාගේ ප්‍රධානියා වන ආරක්ෂක ලේකම්තුමාට යොමු කළ බව පළමුවෙන් දැනුම් දුන්නා. කරුණාකර දැන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය නඟන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, ආරක්ෂක ලේකම්තුමාට යොමු කිරීම පිළිබඳවත් මා ඔබතුමාට ප්‍රශංසා කරනවා. නමුත් ගැටලුව තිබෙන්නේ එතකොට පොලිස්පතිතුමා කුමන ප්‍රතිපාදන යටතේද අනෙක් සියලුම දෙනාට ගෙවල්වලට මේ විධියේ අතිවිශාල ආරක්ෂාවක් දීලා තිබෙන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ගැන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාදයේ දී හරි ප්‍රශ්න කරන්න. දැන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය නඟන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාදය එන කොට රංගෙ බණ්ඩාර මරලා තිබුණොත් එහෙම, රංගෙ බණ්ඩාර ඉන්න ඉතිරි තැනටත් ගිනි තබලා තිබුණොත් එහෙම - ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය එන කොට මේ සියල්ල සිදු වෙලා තිබුණොත් එහෙම - එතැනින් එහාට වගකීම ගන්නේ කවුද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක නම් බරපතළයි. වරප්‍රසාද ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමා නැඟී සිටියේ ඇයි? [බාධා කිරීමක්] දැන් වෙලාව පෙරවරු 11.00යි. [බාධා කිරීමක්] නිශ්ශබ්ද වන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මේ ගරු සභාව වෙනුවෙන් නියෝගයක් දෙන්න පුළුවන්. මේ මන්ත්‍රීතුමාගේ ආරක්ෂාව වෙනුවෙනුත් ඒ අදාළ විධියටම මුදල් වෙන් කරවා දෙන්න. මේක ආරක්ෂක අමාත්‍යාංශයට ප්‍රශ්නයක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා ආරක්ෂක ලේකම්තුමාට -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මොකද, ඒකෙ පිටුපස හැංගෙන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] එතුමාට වරප්‍රසාද ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කිසිම - [බාධා කිරීමක්] වරප්‍රසාද ප්‍රශ්නය අහන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
එතුමා රීති ප්‍රශ්නයක් තිබෙනවාය කියපු නිසයි මා බැලුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පෙරවරු 11.00 යි වෙලාව. එහෙම නම් හෙටට කල් දමනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
නැහැ, නැහැ, මම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙනම් අහන්න.

## වරප්‍රසාද : 2009.10.22 දින විකාශය කරන ලද "පත්තර සිරස්තල" වැඩසටහනේදී කළ ප්‍රකාශය
### சிறப்புரிமை : 2009.10.22 ஆம் திகதி ஒலிபரப்பப்பட்ட"பத்தர சிரஸ்தல" நிகழ்ச்சியின்போதான கூற்று
### PRIVILEGE: COMMENT MADE IN "PATHTHARA SIRASTHALA" PROGRAMME AIRED ON 22ND OCTOBER, 2009

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 24 (6) යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මාගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් පිළිබඳව වූ යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමාගේ අවසරය අපේක්ෂා කරමි.

ගරු කථානායකතුමනි, මාගේ හලාවත නිවස සහ කාර්යාලයට ගිනි තබා විනාශ කිරීම සහ ඒ සම්බන්ධයෙන් මෙහෙයවනු ලැබූ පොලිස් පරීක්ෂණවල මන්දගාමීභාවය පිළිබඳව පාර්ලිමේන්තුව හමුවේ 2009.10.20 දින මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීම පිළිබඳව ප්‍රශ්නය මතු කරන ලද අවස්ථාවේ මා පෝස්ටරයක් සභාව හමුවේ ප්‍රදර්ශනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මාගේ වරප්‍රසාද උල්ලංඝනය වී විනාශ වී ගොස් ඇති ආකාරය ප්‍රකාශ කළෙමි.

ගරු කථානායකතුමනි, මා විසින් ප්‍රදර්ශනය කරන ලද විශාල ප්‍රමාණයේ ඉහත සඳහන් පෝස්ටරයේ ඉංග්‍රීසි බසින් සහ සිංහල බසින් පහත සඳහන් වැකි පැහැදිලිව ලියා තිබිණි.

ඉංග්‍රීසි බසින්, "Sri Lanka - democracy at work". සිංහල බසින්, "ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය".

ගරු කථානායකතුමනි, එය එසේ තිබියදී මා විසින් පාර්ලිමේන්තුවේදී මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධයෙන් එසේ මතු කළ ප්‍රකාශය පිළිබඳව 2009.10.22 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "පත්තර සිරස්තල" විස්තර කිරීම යටතේ හඩ්සන් සමරසිංහ නමැත්තකු විසින් පහත සඳහන් ප්‍රකාශය කරන ලදී.

"රංගෙ බණ්ඩාර මහත්මයාගෙන් අහන්න තියෙනව ප්‍රශ්නයක්. පාර්ලිමේන්තුවට ඔබතුමා ගෙනිහිල්ලා ආසනය ගාව එල්ල ගත්ත පෝස්ටරයෙ ලියලා තිබුණේ ඉංග්‍රීසියෙන්. රංගෙ බණ්ඩාර ඉංග්‍රීසියෙන් ලියලා. මම අගෞරව කරනවා නොවෙයි, රංගෙ බණ්ඩාර මහත්තයාට. මහත්තයද ඕක ලිව්වේ. ඔයාගෙ ඉංග්‍රීසි දැනුම කොහොමද?"

මේක දැන ගන්න මම ඊයේ මගේ පොඩි දරුවා ලවා ඉංග්‍රීසියෙන් ප්‍රකාශ කළා, ගරු කථානායකතුමනි. ඊ ළඟට හඩ්සන් සමරසිංහ නැමැත්තා මෙහෙම කියනවා:

"මේක කාට පේන්නද ලිව්වේ. ඉංග්‍රීසියෙන් පෝස්ටර් එකක් ගහලා පුත්තලමේ කට්ටියට පේන්නද? "

පුත්තලම දිස්ත්‍රික්කයේ තමයි වැඩිම විදේශගත ශ්‍රමිකයන් ඉන්නේ ගරු කථානායකතුමනි.

ඊ ළඟට කියනවා, "රංගෙ බණ්ඩාර ලොක්... මහත්තයෝ. මන්ත්‍රීතුමා මෙන්න මෙතැන තියෙනවා මේ දර්ශනය. විපක්ෂයේ දර්ශනය තමයි මොකක්ද? මේක පේන්න දැම්මා. කොහාටද, ඉංග්‍රීසි කියවන, ඉංග්‍රීසියෙන් වාර්තා කරන පුද්ගලයින්ට මේවා යවන්න. මානව හිමිකම් සංවිධානවලට, ජිනීවාවලට, වොෂින්ටන්වල යුනයිටඩ් නේෂන් එකට. මේ කට්ටිය ඉන්නකම් කළේ රටට විරුද්ධව මේ වාගේ හෙනහුරුකම්. රංගෙ බණ්ඩාරගෙ ඉංග්‍රීසි පෝස්ටරේ. රංගෙ බණ්ඩාර මහත්තයා ඉංග්‍රීසියෙන් ලියන්න කියන්න දන්නවා ඇති සමහර වෙලාවට. සමහර වෙලාවට? ඇයි, මේ ඉංග්‍රීසි පෝස්ටරයක් ගැහුවේ. පුත්තලම කට්ටියට කියන්නද?"

ගරු කථානායකතුමනි, මෙන්න හඩ්සන් සමරසිංහ නමැති හඩ්ඩාගේ කථාව.

ගරු කථානායකතුමනි, හඩ්සන් සමරසිංහ නමැති අයගේ ඉහත සඳහන් ප්‍රකාශය දෙස බලන විට ඔහු වුවමනාවෙන්ම නිර්ලජ්ජිත සහ අශික්ෂිත අන්දමින් අසත්‍ය ප්‍රකාශයක් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මගේ වරප්‍රසාද තත්ත්වය මෙන්ම කීර්තියට හානි සිදු කර ඇති බව ඔබතුමාට අවබෝධ වනු ඇත. එම පෝස්ටරයේ සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් පැහැදිලි ලෙස සඳහන්ව තිබියදී ඉංග්‍රීසියෙන් පමණක් ලියා තිබුණේ යැයි ප්‍රකාශ කිරීමෙන් ඔහු සිතාමතාම බරපතළ ලෙස වරදක් කර ඇත.

ගරු කථානායකතුමනි, හඩ්සන් සමරසිංහ නමැත්තාට පත්තර සිරස්තල කියවීම තුළින් එදිනෙදා පත්තරවල පළ වන පුවත් මහ

ජනයා වෙත ඉදිරිපත් කිරීමට සම්පූර්ණ නිදහස ඇත. එහෙත් එම සිරස්තල කියවීම මඟින් මහ ජනයා හමුවේ එම සිරස්තලයට වස්තු වූ කාරණය විකෘති කරමින් ඌන පූරණ යොදමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මාගේ චරිතය ඝාතනය කිරීම ඉතාමත් නින්දිත අයුරින් කර ඇති බව එමඟින් සනාථ වේ.

ගරු කථානායකතුමනි, මා විසින් මතු කරනු ලබන මෙම තැනැත්තාට එරෙහි වරප්‍රසාද උල්ලංඝනය කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ද මොහුගේ මෙම නිර්ලජ්ජිත ක්‍රියා කලාපය පෙන්වා දෙන ලදී. මෙම සභාව හමුවේ එතුමා විසින් කළ කථාවක් විකෘති කර ප්‍රකාශ කිරීම හේතුවෙන් එතුමා ඔහුට එරෙහිව වරප්‍රසාද ප්‍රශ්නයක් නඟන ලදී.

ගරු කථානායකුමනි, හඩ්සන් සමරසිංහ නමැති මෙම පුද්ගලයාට - මෙම පුද්ගලයා බහු විවාහයක් යටතේ දඬුවම් ලබා ඇති චරිතයක් තිබෙන පුද්ගලයෙක් බවට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කොටසක් මේ වරප්‍රසාද ප්‍රශ්නයේ නැහැ. [බාධා කිරීම්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)
(The Hon. A. P. Jagath Pushpakumara - Minister of Nation Building)
ගරු කථානායකතුමනි, එතුමාත් එහෙම නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය කරමින් ඔවුන්ගේ චරිත ඝාතනයේ යෙදීමට ඉඩ ප්‍රස්ථා නොදිය යුතුය.

එබැවින් මේ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කර බලා මෙම පුද්ගලයා වරප්‍රසාද කමිටුව හමුවට පමුණුවා සුදුසු කටයුතු කරන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා නැඟී සිටියේ ඇයි?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම -

**ගරු පියංකර ජයරත්න මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Piyankara Jayaratne - Deputy Speaker and Chairman of Committees)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමා?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, අපේ රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා මාගේ නම සඳහන් කළා. මාදම්පේ පොලීසියෙන් මාගේ නිවසට ආරක්ෂාව දීලා තිබෙන්නේ සිවිල් ආරක්ෂක භටයින්ගෙන් විතරයි. නැතුව වෙන ආරක්ෂාවක් දීලා නැහැ. ඒ ආරක්ෂාව හැම මන්ත්‍රීවරයකුගේ ගෙදරකටම දීලා තිබෙනවා. ඒ නිසා ඒ කොටස ඉල්ලා අස්කර ගන්න කියන්න. මට ප්‍රශ්නයක් ඒක. [බාධා කිරීම්] මම නියෝජ්‍ය කථානායක. මට ආරක්ෂාව දෙන්න බැඳිලා ඉන්නවා - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ කාරණාවත් ඒක තමයි.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මට ආරක්ෂාව දෙන්න බැඳිලා ඉන්නවා. ඒ නිසා ඒක ඉල්ලා අස්කර ගන්න. එතුමා එහෙම කියනවා නම් වැරදියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළ යුතුයි. [බාධා කිරීම්] නැත්නම් මේ මූලාසනයට වෙන කවුද එන්නේ? [බාධා කිරීම්] සම්පූර්ණයෙන්ම ආරක්ෂාව දෙනවා.

| 11 | National Police Commission | 01401 | Advances to Public Officers | 1,730,000 |
| 12 | Administrative Appeals Tribunal | 01501 | Advances to Public Officers | 444,000 |
| 13 | Commission to Investigate Allegations of Bribery or Corruption | 01601 | Advances to Public Officers | 3,477,000 |
| 14 | Commission to Investigate Allegations of Bribery or Corruption | 01602 | Advancing monies to be used in bribery detection as bribes | 2,333,000 |
| 15 | Department of Elections | 01701 | Advances to Public Officers | 10,550,000 |
| 16 | Auditor- General | 01801 | Advances to Public Officers | 22,904,000 |
| 17 | Office of the Parliamentary Commissioner for Administration | 01901 | Advances to Public Officers | 678,000 |
| 18 | Office of the Finance Commission | 02001 | Advances to Public Officers | 1,394,000 |
| 19 | National Education Commission | 02101 | Advances to Public Officers | 1,030,000 |
| 20 | Minister of Religious Affairs & Moral Upliftment | 10101 | Advances to Public Officers | 2,441,000 |
| 21 | Minister of Finance and Planning | 10201 | Advances to Public Officers | 7,144,000 |
| 22 | Minister of Defence, Public Security, Law and Order | 10301 | Advances to Public Officers | 21,839,000 |
| 23 | Minister of Plan Implementation | 10401 | Advances to Public Officers | 2,386,000 |
| 24 | Minister of Nation Building and Estate Infrastructure Development | 10501 | Advances to Public Officers | 28,741,000 |
| 25 | Minister of Disaster Management & Human Rights | 10601 | Advances to Public Officers | 1,236,000 |
| 26 | Minister of Tourism | 10701 | Advances to Public Officers | 2,135,000 |
| 27 | Minister of Posts and Telecommunications | 10801 | Advances to Public Officers | 4,138,000 |
| 28 | Minister of Justice and Law Reforms | 11001 | Advances to Public Officers | 5,534,000 |
| 29 | Minister of Healthcare and Nutrition | 11101 | Advances to Public Officers | 352,563,000 |
| 30 | Minister of Foreign Affairs | 11201 | Advances to Public Officers | 10,838,000 |
| 31 | Minister of Ports and Aviation | 11301 | Advances to Public Officers | 3,185,000 |
| 32 | Minister of Transport | 11401 | Advances to Public Officers | 3,222,000 |
| 33 | Minister of Petroleum and Petroleum Resources Development | 11501 | Advances to Public Officers | 1,234,000 |
| 34 | Minister of Trade, Marketing Development, Co-operatives and Consumer Services | 11601 | Advances to Public Officers | 3,203,000 |
| 35 | Minister of Highways and Road Development | 11701 | Advances to Public Officers | 1,963,000 |
| 36 | Minister of Agricultural Development and Agrarian Services | 11801 | Advances to Public Officers | 6,367,000 |
| 37 | Minister of Power and Energy | 11901 | Advances to Public Officers | 3,118,000 |
| 38 | Minister of Child Development and Women's Empowerment | 12001 | Advances to Public Officers | 7,735,000 |
| 39 | Minister of Public Administration and Home Affairs | 12101 | Advances to Public Officers | 11,212,000 |
| 40 | Minister of Mass Media and Information | 12201 | Advances to Public Officers | 3,518,000 |
| 41 | Minister of Urban Development and Sacred Area Development | 12301 | Advances to Public Officers | 3,518,000 |
| 42 | Minister of Social Services and Social Welfare | 12401 | Advances to Public Officers | 4,690,000 |
| 43 | Minister of Housing and Common Amenities | 12501 | Advances to Public Officers | 3,480,000 |
| 44 | Minister of Education | 12601 | Advances to Public Officers | 331,531,000 |

| *SRL No.* | *Ministry / Department* | *Item No.* | *Activities of the Government* | *Maximum Limits of Expenditure of activities of the Government Rs.* |
|---|---|---|---|---|
| 45 | Minister of Labour Relations and Manpower | 12701 | Advances to Public Officers | 10,420,000 |
| 46 | Minister of Rural Industries and Self-employment Promotion | 12801 | Advances to Public Officers | 2,515,000 |
| 47 | Minister of Vocational and Technical Training | 12901 | Advances to Public Officers | 8,130,000 |
| 48 | Minister of Local Government and Provincial Councils | 13001 | Advances to Public Officers | 3,539,000 |
| 49 | Minister of Enterprise Development and Investment Promotion | 13201 | Advances to Public Officers | 1,655,000 |
| 50 | Minister of Science and Technology | 13301 | Advances to Public Officers | 10,563,000 |
| 51 | Minister of Constitutional Affairs and National Integration | 13401 | Advances to Public Officers | 3,670,000 |
| 52 | Minister of Plantation Industries | 13501 | Advances to Public Officers | 2,853,000 |
| 53 | Minister of Sports and Public Recreation | 13601 | Advances to Public Officers | 1,770,000 |
| 54 | Minister of Indigenous Medicine | 13801 | Advances to Public Officers | 4,184,000 |
| 55 | Minister of Fisheries and Aquatic Resources | 13901 | Advances to Public Officers | 3,222,000 |
| 56 | Minister of Livestock Development | 14001 | Advances to Public Officers | 2,505,000 |
| 57 | Minister of Cultural affairs & National Heritage | 14201 | Advances to Public Officers | 11,157,000 |
| 58 | Minister Parliamentary Affairs | 14301 | Advances to Public Officers | 1,236,000 |
| 59 | Minister of Resettlement and Disaster Relief Services | 14501 | Advances to Public Officers | 2,929,000 |
| 60 | Minister of Industrial Development | 14901 | Advances to Public Officers | 4,002,000 |
| 61 | Minister of Foreign Employment Promotion and Welfare | 15101 | Advances to Public Officers | 1,074,000 |
| 62 | Minister of Irrigation and Water Management | 15201 | Advances to Public Officers | 3,595,000 |
| 63 | Minister of Land and Land Development | 15301 | Advances to Public Officers | 9,096,000 |
| 64 | Minister of Youth Affairs | 15601 | Advances to Public Officers | 2,368,000 |
| 65 | Minister of Environment and Natural Resources | 16001 | Advances to Public Officers | 3,438,000 |
| 66 | Minister of Internal Administration | 16101 | Advances to Public Officers | 1,216,000 |
| 67 | Minister of Youth Empowerment and Socio Economic Development | 16301 | Advances to Public Officers | 878,000 |
| 68 | Minister of Community Development and Social Inequity Eradication | 16401 | Advances to Public Officers | 1,215,000 |
| 69 | Minister of Water Supply and Drainage | 16601 | Advances to Public Officers | 1,653,000 |
| 70 | Minister of Export Development and International Trade | 16701 | Advances to Public Officers | 1,084,000 |
| 71 | Minister of Public Estate Management and Development | 16801 | Advances to Public Officers | 1,054,000 |
| 72 | Minister of Construction and Engineering Services | 16901 | Advances to Public Officers | 1,416,000 |
| 73 | Minister of Higher Education | 17101 | Advances to Public Officers | 1,604,000 |
| 74 | Minister of Supplementary Plantation Crops Development | 17201 | Advances to Public Officers | 704,000 |
| 75 | Department of Buddhist Affairs | 20101 | Advances to Public Officers | 7,841,000 |
| 76 | Department of Muslim Religious and Cultural Affairs | 20201 | Advances to Public Officers | 1,046,000 |
| 77 | Department of Christian Religious Affairs | 20301 | Advances to Public Officers | 858,000 |
| 78 | Department of Hindu Religious and Cultural Affairs | 20401 | Advances to Public Officers | 1,580,000 |
| 79 | Department of Public Trustee | 20501 | Advances to Public Officers | 1,927,000 |
| 80 | Department of Cultural Affairs | 20601 | Advances to Public Officers | 7,953,000 |
| 81 | Department of Archaeology | 20701 | Advances to Public Officers | 17,915,000 |
| 82 | Department of National Museums | 20801 | Advances to Public Officers | 4,619,000 |
| 83 | Department of National Archives | 20901 | Advances to Public Officers | 2,126,000 |
| 84 | Department of Information | 21001 | Advances to Public Officers | 4,261,000 |
| 85 | Department of Government Printer | 21101 | Advances to Public Officers | 23,374,000 |
| 86 | Department of Examinations | 21201 | Advances to Public Officers | 9,609,000 |
| 87 | Department of Educational Publications | 21301 | Advances to Public Officers | 2,835,000 |
| 88 | Department of Educational Publications | 21302 | Printing Publicity and Sales of Publications | 800,000,000 |
| 89 | Department of Technical Education and Training | 21501 | Advances to Public Officers | 27,908,000 |
| 90 | Department of Social Services | 21601 | Advances to Public Officers | 9,316,000 |
| 91 | Department of Probation and Child Care Services | 21701 | Advances to Public Officers | 6,034,000 |
| 92 | Department of Commissioner General of Samurdhi | 21801 | Advances to Public Officers | 7,597,000 |

| *SRL No.* | *Ministry / Department* | *Item No.* | *Activities of the Government* | *Maximum Limits of Expenditure of activities of the Government Rs.* |
|---|---|---|---|---|
| 93 | Department of Sports Development | 21901 | Advances to Public Officers | 2,382,000 |
| 94 | Department of Ayurveda | 22001 | Advances to Public Officers | 18,362,000 |
| 95 | Department of Labour | 22101 | Advances to Public Officers | 30,934,000 |
| 96 | Sri Lanka Army | 22201 | Advances to Public Officers | 824,342,000 |
| 97 | Sri Lanka Navy | 22301 | Advances to Public Officers | 251,465,000 |
| 98 | Sri Lanka Navy | 22302 | Stores ( Explosive items ) | 173,333,000 |
| 99 | Sri Lanka Air Force | 22401 | Advances to Public Officers | 201,235,000 |
| 100 | Department of Police | 22501 | Advances to Public Officers | 490,116,000 |
| 101 | Department of Immigration and Emigration | 22601 | Advances to Public Officers | 10,567,000 |
| 102 | Department of Registration of Persons | 22701 | Advances to Public Officers | 7,751,000 |
| 103 | Courts Administration | 22801 | Advances to Public Officers | 57,519,000 |
| 104 | Department of Attorney General | 22901 | Advances to Public Officers | 8,177,000 |
| 105 | Department of Legal Draftsman | 23001 | Advances to Public Officers | 2,257,000 |
| 106 | Department of Debt Conciliation Board | 23101 | Advances to Public Officers | 344,000 |
| 107 | Department of Prisons | 23201 | Advances to Public Officers | 50,525,000 |
| 108 | Department of Prisons | 23202 | Prisons Industrial and Agricultural Undertakings | 27,333,000 |
| 109 | Department of Government Analyst | 23301 | Advances to Public Officer | 3,364,000 |
| 110 | Registrar of Supreme Court | 23401 | Advances to Public Officers | 4,942,000 |
| 111 | Department of Law Commission | 23501 | Advances to Public Officers | 688,000 |
| 112 | Department of Official Languages | 23601 | Advances to Public Officers | 3,513,000 |
| 113 | Department of National Planning | 23701 | Advances to Public Officers | 3,426,000 |
| 114 | Department of Fiscal Policy | 23801 | Advances to Public Officers | 1,710,000 |
| 115 | Department of External Resources | 23901 | Advances to Public Officers | 3,442,000 |
| 116 | Department of National Budget | 24001 | Advances to Public Officers | 3,463,000 |
| 117 | Department of Public Enterprises | 24101 | Advances to Public Officers | 1,721,000 |
| 118 | Department of Management Services | 24201 | Advances to Public Officers | 2,233,000 |
| 119 | Department of Development Finance | 24301 | Advances to Public Officers | 1,358,000 |
| 120 | Department of Trade Tariffs and Investment Policy | 24401 | Advances to Public Officers | 2,387,000 |
| 121 | Department of Public Finance | 24501 | Advances to Public Officers | 2,227,000 |
| 122 | Department of Inland Revenue | 24601 | Advances to Public Officers | 24,110,000 |
| 123 | Sri Lanka Customs | 24701 | Advances to Public Officers | 29,314,000 |
| 124 | Sri Lanka Customs | 24702 | Expenses in Connection with Seized and Forfeited goods | 1,833,000 |
| 125 | Department of Excise | 24801 | Advances to Public Officer | 17,519,000 |
| 126 | Department of Treasury Operations | 24901 | Advances to Public Officers | 3,113,000 |
| 127 | Department of State Accounts | 25001 | Advances to Public Officers | 3,236,000 |
| 128 | Department of State Accounts | 25002 | Advances for Payments on behalf of other Governments | 1,766,000 |

| *SRL No.* | *Ministry / Department* | *Item No.* | *Activities of the Government* | *Maximum Limits of Expenditure of activities of the Government Rs.* |
|---|---|---|---|---|
| 129 | Department of State Accounts | 25003 | Miscellaneous Advances | 66,666,000 |
| 130 | Department of Valuation | 25101 | Advances to Public Officers | 7,011,000 |
| 131 | Department of Census and Statistics | 25201 | Advances to Public Officers | 18,278,000 |
| 132 | Department of Pensions | 25301 | Advances to Public Officers | 14,263,000 |
| 133 | Department of Registrar General | 25401 | Advances to Public Officers | 21,809,000 |
| 134 | District Secretariat, Colombo | 25501 | Advances to Public Officers | 16,187,000 |
| 135 | District Secretariat, Gampaha | 25601 | Advances to Public Officers | 21,107,000 |
| 136 | District Secretariat, Kalutara | 25701 | Advances to Public Officers | 21,754,000 |
| 137 | District Secretariat, Kandy | 25801 | Advances to Public Officers | 22,338,000 |
| 138 | District Secretariat, Matale | 25901 | Advances to Public Officers | 15,224,000 |
| 139 | District Secretariat, Nuwara-Eliya. | 26001 | Advances to Public Officers | 10,727,000 |
| 140 | District Secretariat, Galle | 26101 | Advances to Public Officers | 21,942,000 |
| 141 | District Secretariat ,Matara | 26201 | Advances to Public Officers | 16,337,000 |
| 142 | District Secretariat , Hambantota | 26301 | Advances to Public Officers | 14,403,000 |
| 143 | District Secretariat/ Kachcheri, Jaffna | 26401 | Advances to Public Officers | 13,174,000 |
| 144 | District Secretariat/ Kachcheri, Mannar | 26501 | Advances to Public Officers | 5,170,000 |
| 145 | District Secretariat/ Kachcheri, Vavuniya | 26601 | Advances to Public Officers | 4,539,000 |
| 146 | District Secretariat/ Kachcheri, Mullaitivu | 26701 | Advances to Public Officers | 4,533,000 |
| 147 | District Secretariat/ Kachcheri, Killinochchi | 26801 | Advances to Public Officers | 4,411,000 |
| 148 | District Secretariat/ Kachcheri, Batticaloa. | 26901 | Advances to Public Officers | 11,558,000 |
| 149 | District Secretariat, Ampara | 27001 | Advances to Public Officers | 19,075,000 |
| 150 | District Secretariat/ Kachcheri, Trincomalee | 27101 | Advances to Public Officers | 9,169,000 |
| 151 | District Secretariat, Kurunegala | 27201 | Advances to Public Officers | 33,420,000 |
| 152 | District Secretariat, Puttalam | 27301 | Advances to Public Officers | 16,997,000 |
| 153 | District Secretariat, Anuradhapura | 27401 | Advances to Public Officers | 21,394,000 |
| 154 | District Secretariat, Polonnaruwa | 27501 | Advances to Public Officers | 9,405,000 |
| 155 | District Secretariat, Badulla | 27601 | Advances to Public Officers | 15,500,000 |
| 156 | District Secretariat, Monaragala | 27701 | Advances to Public Officers | 10,780,000 |
| 157 | District Secretariat, Ratnapura | 27801 | Advances to Public Officers | 17,212,000 |
| 158 | District Secretariat, Kegalle | 27901 | Advances to Public Officers | 15,740,000 |
| 159 | Department of Foreign Aid and Budget Monitoring | 28001 | Advances to Public Officers | 1,740,000 |
| 160 | Department of Agrarian Development | 28101 | Advances to Public Officers | 112,168,000 |
| 161 | Department of Irrigation | 28201 | Advances to Public Officers | 54,862,000 |
| 162 | Department of Forest | 28301 | Advances to Public Officers | 29,014,000 |
| 164 | Department of Agriculture | 28501 | Advances to Public Officers | 56,433,000 |

| *SRL No.* | *Ministry / Department* | *Item No.* | *Activities of the Government* | *Maximum Limits of Expenditure of activities of the Government Rs.* |
|---|---|---|---|---|
| 165 | Department of Agriculture | 28502 | Maintenance of Agricultural Farms and Seed Sales | 107,000,000 |
| 166 | Department of Land Commissioner | 28601 | Advances to Public Officers | 8,220,000 |
| 167 | Department of Land Settlement | 28701 | Advances to Public Officers | 2,514,000 |
| 168 | Department of Surveyor General | 28801 | Advances to Public Officers | 52,253,000 |
| 169 | Department of Export Agriculture | 28901 | Advances to Public Officers | 10,440,000 |
| 170 | Department of Fisheries and Aquatic Resources | 29001 | Advances to Public Officers | 8,973,000 |
| 171 | Department of Coast Conservation | 29101 | Advances to Public Officers | 6,385,000 |
| 172 | Department of Animal Production and Health | 29201 | Advances to Public Officers | 9,251,000 |
| 173 | Department of Rubber Development | 29301 | Advances to Public Officers | 6,777,000 |
| 174 | Department of National Zoological Gardens | 29401 | Advances to Public Officers | 5,536,000 |
| 175 | Department of Commerce | 29501 | Advances to Public Officers | 1,752,000 |
| 176 | Department of Import and Export Control | 29601 | Advances to Public Officers | 1,754,000 |
| 177 | Department of the Registrar of Companies | 29701 | Advances to Public Officers | 1,890,000 |
| 178 | Department of Measurement Units, Standards and Services | 29801 | Advances to Public Officers | 3,356,000 |
| 179 | National Intellectual Property Office of Sri Lanka | 29901 | Advances to Public Officers | 1,385,000 |
| 180 | Department of Food Commissioner | 30001 | Advances to Public Officers | 4,915,000 |
| 181 | Department of Co-operative Development (Registrar of Co-operative Societies) | 30101 | Advances to Public Officers | 2,112,000 |
| 182 | Co-operative Employees Commission | 30201 | Advances to Public Officers | 684,000 |
| 183 | Department of Textile Industries | 30301 | Advances to Public Officers | 3,205,000 |
| 184 | Department of Meteorology | 30401 | Advances to Public Officers | 5,013,000 |
| 185 | Department of Up-Country Peasantry Rehabilitation | 30501 | Advances to Public Officers | 704,000 |
| 186 | Department of Sri Lanka Railways | 30601 | Advances to Public Officers | 202,340,000 |
| 187 | Department of Sri Lanka Railways | 30602 | Railway Stores Advance Account | 400,000,000 |
| 188 | Department of Motor Traffic | 30701 | Advances to Public Officers | 9,888,000 |
| 189 | Department of Posts | 30801 | Advances to Public Officers | 203,640,000 |
| 190 | Department of Buildings | 30901 | Advances to Public Officers | 7,802,000 |
| 191 | Government Factory | 31001 | Advances to Public Officers | 11,327,000 |
| 192 | Government Factory | 31002 | Government Factory Stores Advance Account | 40,000,000 |
| 193 | Government Factory | 31003 | Government Factory Work Done Advance Account | 80,000,000 |
| 194 | Department of National Physical Planning | 31101 | Advances to Public Officers | 5,410,000 |
| 195 | Department of Civil Security | 32001 | Advances to Public Officers | 25,040,000 |
| 196 | Department of National Botanical Gardens | 32201 | Advances to Public Officers | 3,614,000 |
| 197 | Department of Legal Affairs | 32301 | Advances to Public Officers | 233,000 |
| 198 | Department of Management Audit | 32401 | Advances to Public Officers | 696,000 |
| | | **Total** | | **6,222,467,000** |

**[The Hon. (Dr.) Sarath Amunugama]**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

[පූ. භා. 11.07]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ස්තුතියි, ගරු කථානායකතුමනි. ප්‍රථමයෙන්ම මේ විවාදය ආරම්භ කිරීමට -

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මේ වැඩේ ආරම්භ කළේ දෙරණ නැකතින්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මොන වැඩේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ නක්ෂත්‍රකාරයෝ එළවන්න කෝ. තේරුමක් නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, අය වැයක අවශ්‍යතාව සහ වැදගත්කම බොහෝ දෙනකු හරියට තේරුම් අරගෙන නැහැ. එකක් මේ අය වැයක වැදගත්කම පාර්ලිමේන්තුව තුළ සහ පාර්ලිමේන්තුවෙන් පිට බොහෝ දෙනෙක් දන්නේත් නැහැ. ඉතිහාසය තුළ අවුරුදු 1,500කට පමණ කලින් කෞටිල්‍ය නමැති ආර්ථික විශේෂඥයා අර්ථ ශාස්ත්‍රය ලියන කොට ඒ අර්ථ ශාස්ත්‍රය තුළ අය වැය ක්‍රමවේදය ඉතා පැහැදිලිව හඳුන්වා දුන්නා. ඕනෑම රටක අය වැයක් ඉදිරිපත් කිරීම ඒ පාලකයන්ගේ වග කීමක් හැටියට එහි පැහැදිලිව ප්‍රකාශ වෙලා තිබුණා. අය වැයක ලිප් ගල් හැටියට, එහෙම නැත්නම් ඒකේ මූලික ලක්ෂණ දෙකක් හැටියට තිබෙන්නේ මොනවාද? එයින් එකක් හැටියට තිබෙන්නේ accountability. අනෙක විනිවිදභාවය - transparency. ඕනෑම අය වැයක ඉතාම වැදගත් මූලික ලක්ෂණ දෙකක් තමයි ඒ. ඒ මූලික ලක්ෂණ දෙක තියෙන්න ඕනෑ වෙන මොකුත් නිසා නොවෙයි, මහ ජනයාගෙන් බදු වශයෙන් ආණ්ඩුවක් එකතු කර ගන්නා මුදල් වියදම් කරන්නේ කොයි ආකාරයෙන් ද කියන එක පැහැදිලි වන්නේ අය වැයකින් වීම නිසායි. මහ ජනයාගෙන් අය කරනු ලබන මුදල් වියදම් කරන ආකාරය පිළිබඳව ඉදිරිපත් වන්නේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මහ ජනයාගේ නියෝජිතයන්. ඒ නිසා තමයි අය වැයක් ඉදිරිපත් කිරීම විශාල වග කීමක් වන්නේ.

ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති 1977 යුගය. අය වැයක් ඉදිරිපත් කරන කාලයට මිනිස්සු තමන්ගේ ගෙවල් දොරවල්වල තිබෙන වැඩත් පසෙක දමලා, රක්ෂාවලට යන්නේ නැතිව සියලු දෙනාම තමන්ගේ ගෙදර තිබෙන රේඩියෝ එක, එහෙම නැත්නම් ටීවී එක දමා ගෙන ඒ අය වැයට ඇහුම් කන් දෙනවා. නමුත් කාලයක් තිස්සේ -මෑත කාලයේදී- අය වැය ප්‍රකාශය කරන දවසට ඒකට ඇහුම් කන් දෙන තත්ත්වයක් නැති වුණේ විශේෂයෙන්ම මේ අය වැය බාල්දු කරලා ඒක පුස්සක් බවට පත් කරපු නිසායි. විශේෂයෙන්ම ඒක සිද්ධ වෙලා තිබෙන්නේ 2005 "මහින්ද චින්තන" ආණ්ඩුව බලයට ආවාට පසුව-මෙතැන නියෝජ්‍ය මුදල් ඇමතිවරයාත් ඉන්නවා. එතුමාටත් මතක ඇති.- මේ වන විට අය වැය ලේඛන හතරක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අය වැය ඉදිරිපත් කරන අවස්ථාවල අය වැයට ඇතුළත් වූ, අන්තර්ගත වූ පොරොන්දු තඹ ශතයකට ගරු කරන්නේ නැතිව ඒ පොරොන්දු කඩ කරලා මහ ජනයා තුළ තිබුණ විශ්වාසය හෑල්ලුවට ලක් කරන ආකාරයට මේ රජය දිගටම කටයුතු කරලා තිබෙනවා.

මා උදාහරණ කිහිපයක් දක්වන්නම්. 2006 වසරේ අය වැය කථාවේ දී ජනාධිපතිතුමා මේ විධියට කියා තිබෙනවා:

"විවිධ රාජ්‍ය ආයතනවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා 2006 වර්ෂයේ දී උපාධිධාරින් 10,000ක් බඳවා ගැනීමට මම යෝජනා කරනවා. "

ඒ වාගේම 2007 "ලක්බිම" පත්‍රයක පළ වෙලා තිබෙනවා, "රැකියා විරහිත උපාධිධාරින් 20,000කට රාජ්‍ය සේවා රැකියා" කියලා.

ඊ ළඟට, 2008 අය වැය කථාවේ දී ජනාධිපතිතුමා නැවත මෙසේ කියා තිබෙනවා:

" පසු ගිය අය වැයෙන් උපාධිධාරින් 10,000ක් බඳවා ගැනීමට ද මා යෝජනා කළා. ඒ අනුව තරුණ අරුණ වැඩසටහනේ 2,088ක් ද ඇතුළත් ව විධිමත් බඳවා ගැනීම් පටිපාටිවලට අනුකූලව උපාධිධාරින් 15,000කට 2008 දී රැකියා දීමට පියවර ගෙන තිබෙනවා."

ජනාධිපතිවරයාගේ 2008 අය වැය කථාවේ එහෙම තිබෙනවා. අවස්ථා කීපයක, අය වැය කීපයක මේ වාගේ පොරොන්දු දුන්නා. මේක උපාධිධාරින්ගේ පත්වීම් සම්බන්ධයෙන් පමණක් නොවෙයි කියන්නේ. 2008 අය වැයේදී කිව්වා පෙට්‍රල් මිල අඩු කරන්නට පෙට්‍රල්වලට අය කරන බදු ඉවත් කරනවා කියලා. ඒක කළේ නැහැ. පෙට්‍රල් ලීටරයකින් රුපියල් 75ක් අය කරනවා. "ලක් සතොස" 200ක් ලංකාව පුරා විවෘත කරනවාය කිව්වා. ඒකෙන් බඩු මිල අඩු කරනවාය කිව්වා. ඒක සිද්ධ වුණේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
"ලක් සතොස" ආරම්භ කළා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
වතුවලට සහල් සහනයක් දෙනවා කිව්වා. වතුවලට සහල් සහනයක් දුන්නේ නැහැ. ඒ වාගේම ධීවරයන්ට ඩීසල් සහනයක් දෙනවා කිව්වා. ඒක දුන්නේ නැහැ. උපාධිධාරින්ට රස්සාවල් දෙනවා කිව්වා. මේවා කිව්වේ 2008 දී. මේවා කිසි දෙයක් දුන්නේ නැහැ.

ඊ ළඟට, 2009 අය වැය ගන්න. 2009 අය වැයේදී ආණ්ඩුව මොකක්ද කිව්වේ? ඒ දීපු පොරොන්දුවල තිබෙනවා, සමෘද්ධි හා අඩු ආදායම්ලාභින්ගේ, වතුකරයේ පවුල්වල අවුරුදු එකේ සිට පහ දක්වා දරුවන් වෙනුවෙන් රුපියල් 200ක මාසික දීමනාවක් 2009 ජනවාරි මාසයේ සිට දෙනවා කියන යෝජනාව. රුපියල් මිලියන 900ක් ඒකට වෙන් කරනවාය කිව්වා. මේ වසර තුළ එක දරුවකුටවත් කිරි වීදුරුවක් හැර රුපියල් 200 ගණනේ

ආණ්ඩුවෙන් ලබා දීලා නැහැ. ඒකත් පුස්සක් බවට පත් වුණා. ඊ ළඟට රජරට, රුහුණ, වයඹ, සබරගමුව, ඌව, වැල්ලවාය ආදී විශ්වවිද්‍යාල දියුණු කිරීමට රුපියල් මිලියන 950ක් අතිරේක ප්‍රතිපාදන හැටියට අනුමත කරනවාය කිව්වා 2009 අය වැයෙන්. අද විශ්වවිද්‍යාල සිසුන් මහ පාරේ වීථි ගානේ බැහැලා උද්ඝෝෂණය කරනවා තමන්ට අවශ්‍ය ඒ පහසුකම් ලබා දීලා නැහැ කියලා.

ගරු කථානායකතුමනි, 2009 දී නැවතත් කිව්වා, රණ විරුවන් වෙනුවෙන් තවත් අංග සම්පූර්ණ රණ විරු ගම්මාන කිහිපයක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 3,500ක් ලබා දෙනවාය කියලා. රණ විරුවන්ට එක නිවසක්වත් නොමිලේ දෙන්නට මේ ආණ්ඩුවට පුළුවන් වෙලා නැහැ. ඒවා දෙන්නේ පොලිය සහිත ණය ගෙවන ක්‍රමවේදය අනුවයි. ඉපලෝගම එක හැර වෙනත් එක රණ විරු ගම්මානයක්වත් 2009 දී ඉදි කරලා නැහැ. ඒවාට රුපියල් මිලියන 3,500ක් වෙන් කරනවාය කියලා පොරොන්දු වුණා මේ සභාවේදී. මෙන්න මේ ආකාරයට 2005 සිට අය වැයෙන් අය වැය ඉදිරිපත් කරමින් මහ ජනයාට විශාල බොරුවක් කරලා, මහ ජනයා සහමුලින්ම මුළා කරපු ආකාරය කවුරුත් දැක්කා. ගුරුවරුන්ගේ වැටුප් වැඩි කිරීම්, වැටුප් විෂමතා පිළිබඳව විසඳුමක් දුන්නේ නැහැ, පොරොන්දු වුණාට. ඒ නිසා අද අය වැයක් ඉදිරිපත් කළත් එකයි, අය වැය ඉදිරිපත් නොකළත් එකයි කියන මතයට මහ ජනයා ඇවිල්ලා හමාරයි. ඒක තමයි ඇත්ත තත්ත්වය. 2009 වසර වෙනුවෙන් මේ සභාවට අය වැයක් ඉදිරිපත් කළාට, ඒක නොකළත් මේකමයි සිද්ධ වන්නේ. මොකද, මේ මාස තුන ඇතුළත පරිපූරක ඇස්තමේන්තු 26ක් විටින් විට මේ සභාවට ගෙනැල්ලා ඉදිරිපත් කළා නියෝජ්‍ය මුදල් ඇමතිවරයා. අය වැයක් ඉදිරිපත් කරන්නේ අවුරුද්දකට. පරිපූරක ඇස්තමේන්තු කීපයක් ගෙනාවා. රුපියල් එකසිය තිස්හත්කෝටි විසිහයලක්ෂ පනස්තුන්දහස් එකසිය පනස් අටකට පරිපූරක ඇස්තමේන්තු 23ක් ගෙනාවා. එයින් පරිපූරක ඇස්තමේන්තු 14ක ඇමතිවරුන්ට සුඛෝපභෝගී වාහන ලබා ගැනීමට රුපියල් හත්කෝටි හැට අටලක්ෂ තිස්හය දහසක් තිබුණා. ඇමතිවරුන්ට ලබා දෙන වරප්‍රසාදවලට විටින් විට පරිපූරක ඇස්තමේන්තු හරහා මුදල් ලබා ගත්තාට, දුප්පත් අඩු ආදායම්ලාභී පවුල්වලට දෙන්න පොරොන්දු වෙච්ච රුපියල් 200 ලබා දෙන්න අවශ්‍ය රුපියල් මිලියන 900 ලබා දුන්නේ නැහැ පරිපූරක ඇස්තමේන්තුවලින්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා )**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - மக்கள் தொடர்பாடல், தகவல் அமைச்சரும் தொழில்முயற்சி அபிவிருத்தி, முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரும்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Mass Media and Information and Minister of Enterprise Development and Investment Promotion)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අමතක කර තිබෙනවා එක දෙයක්. පරිපූරක ඇස්තමේන්තුවලින් විශාල මුදලක් වෙන් කරලා තිබෙන්නේ මාර්ග සංවර්ධනයට. කරුණාකර කියන කොට හරියට කියන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ඇමතිතුමනි, මාර්ග සංවර්ධනය පමණක් කරලා මේ රටේ මහ ජනයා පෝෂණය කරන්න බැහැ. මාර්ග සංවර්ධනය කරනවාය කියලා ගුවන් පාලමක square foot එකක් වෙනුවෙන් රුපියල් එක්ලක්ෂ දහහත්දාහක් වැය කර තිබෙනවා. ලෝකයේ කොහේවත් එච්චර වියදමක් යන්නේ නැහැ. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. පරිපූරක ඇස්තමේන්තු දමලා, අනුමත කරලා, ඒ මුදල් නාස්ති කරනවා; දූෂණය කරනවා. ඔතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ රටේ මහ ජනයාට කන්න බොන්න නැතිව ඉන්න කොට, ළමයින් පෝෂණය කරන්න කිරි වීදුරුවක් දෙන්න බැරි වන කොට, අධ්‍යාපනය කඩා වැටෙන කොට, ඒවාට පරිපූරක ඇස්තමේන්තු නොදා ඇමතිවරුන්ට මුදල් ලබා ගන්න එකට අපි විරුද්ධයි. අප ඒක අනුමත කරන්නේ නැහැ. පරිපූරක ඇස්තමේන්තු දමලා පාරවල් හැදුවා කියලා ඒක සාධාරණීකරණය කරන්න බැහැ. අය වැයක් ඉදිරිපත් කරලා මූල්‍ය විනයක් ඇති වන්න ඕනෑ. මේ මූල්‍ය විනය නැති වීම නිසා තමයි අද ආණ්ඩුව බංකොලොත් වෙලා තිබෙන්නේ, අතුරු සම්මත ගිණුමක් ගෙනෙන තරමට. අය වැයක් ඉදිරිපත් කරන්න බැරි වුණා. [බාධා කිරීම්] මගේ කතාවේදී මා ඒක පැහැදිලි කරන්නම් ගරු ඇමතිතුමා. ඇමතිවරුන්ට ඇත්ත තිත්ත වන්න පුළුවන්. නමුත් අහ ගෙන ඉන්න. මගේ කතාවේදී මා පැහැදිලි කරන්නම්. මා බොරුවට චෝදනාවක් ගොඩ නඟන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මා කියන්න කැමැතියි 2005 සිට 2009 වන තුරු ඉදිරිපත් කරපු අය වැයවලින් මිනිස්සු මුළා කරපු බව. අන්තිමට 2010 වන කොට මොකක්ද වුණේ? 2010 වන කොට අය වැයක්වත් ඉදිරිපත් කරන්න බැරි තරමට මේ ආණ්ඩුව බංකොලොත් වෙලා, මේ ආණ්ඩුවට සිද්ධ වුණා අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර, නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

මෙච්චර කාලයක් IMF එපා කියාපු අය,-[බාධා කිරීම්] හොඳද, නැද්ද කියලා බලන්නේ. ලජ්ජා නැහැ. මේක තමයි දේශ ප්‍රේමීත්වය. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි මෙතුමන්ලාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න. නමුත් මගේ කාල වේලාව ඊට වඩා වටින නිසා මා ඒවාට උත්තර දෙන්න යන්නේ නැහැ. සරත් අමුණුගම ඇමතිවරයා ඊයේ මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අතුරු සම්මත ගිණුම් මේ ගරු සභාවට මීට පෙර නව වරක් ඉදිරිපත් කළා, ඒ නිසා තව එකක් ඉදිරිපත් කළාම මොකද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ අතුරු සම්මත ගිණුම් පිළිබඳව ඉතිහාසය දෙස විමසිලිමත් විමේදී පැහැදිලි වන්නේ, බොහෝ විට මැතිවරණයක් පැවැත්වීමෙන් ඇති වූ ප්‍රමාදයන් නිසා සම්ප්‍රදායානුකූලව අය වැයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබීම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට හේතු වී ඇති බවයි. කෙසේ වුවත් අනාගත මැතිවරණයක් හේතු කොට ගෙන අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීම මෙතෙක් අප රට තුළ සිදු වෙලා නැහැ. අනාගත මැතිවරණයක් බලාපොරොත්තු වෙමින් ඉන්න හැම ආණ්ඩුවක්ම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්නේ නැතිව අය වැයක් ඉදිරිපත් කරන්නයි බලාපොරොත්තු වන්නේ.

**ගරු ඩිව් ගුණසේකර මහතා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - அரசியலமைப்பு அலுவல்கள், தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Dew Gunasekara -Minister of Constitutional Affairs and National Integration)

නයිනා මරිකාර් ඉදිරිපත් කළා-

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

නයිනා මරිකාර් ඉදිරිපත් කළේ ජනාධිපතිවරණයයි, ප්‍රාදේශීය සභා මැතිවරණයයි දෙකම -

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා (ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - நிர்மாணத் துறை, பொறியியல் சேவைகள் அமைச்சர்)
(The Hon (Dr.) Rajitha Senaratne-Minister of Construction and Engineering Services)

ඒකම තමයි මේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

නැහැ, නැහැ. ඒ ඡන්ද දෙක තියාපු නිසා. ඔබතුමාට පොට වැරදිලා. මා ඒක පැහැදිලි කරලා දෙන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් - [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)

ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්] මගේ කතාව ඔබතුමා අහ ගෙන ඉඳලා කරුණාකර-

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ඔබතුමාගේ වාරයේදී ඔබතුමා ඒක කියන්න. [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

හැබැයි ඔබතුමා වරද පිළිගන්න අවශ්‍යයි. මේ ගරු සභාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා ගරු මන්ත්‍රීතුමා. මම ඒ හැන්සාඩ් වාර්තාවේ දිනයත් එක්කම සභාගත කරන්නම්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් ඕනෑම ආණ්ඩුවක් මහ ඡන්දයකට කලින් බලාපොරොත්තු වන්නේ-

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

තමුන්නාන්සේගේ කතාව වැදගත් විධියට කරන්න. අනුන්ගේ ලණු කන්නේ නැතිව.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

හරි, හරි. වැදගත් විධියට අහ ගෙන ඉන්න, ඇමතිතුමා. ඕනෑම රජයක් මැතිවරණයක් එන කොට අය වැයක් ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා. ජනප්‍රිය ජනතා අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාව උපයෝගී කර ගන්නවා.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன - மின்வலு, சக்தி அமைச்சர்)
(The Hon. W. D. J. Senewiratne - Minister of Power and Energy)

රවට්ටන්නද?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

අන්න හරි, ඇමතිතුමා. ඔබතුමා හරියට කිව්වා. ඔබතුමන්ලා අවුරුදු හතරක්ම රැවැට්ටුවා. මේ පාරත් රවට්ටන්න. නමුත් මෙවර රවට්ටන්නවත් ශක්තිය, හැකියාව, ප්‍රතිපාදන නැති නිසා අද අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

ගරු මන්ත්‍රීතුමා, මැතිවරණයක් අභිමුඛයේ තියා ගෙන එවැනි රැවටීමක් කරන්න මේ ආණ්ඩුව බලාපොරොත්තු නොවන නිසා තමයි අය වැයක් ඉදිරිපත් නොකළේ. අන්න ඒක හිතේ තියා ගන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කරපු ගිවිසුම මත, මහින්ද චින්තනයේ 36 වැනි පිටුවේ පැහැදිලිව කියලා තිබෙන දෘෂ්ටි වාදය මොකක්ද කියලා. අය වැය හිඟය පාලනය කිරීම, අය වැය පරතරය පාලනය කිරීම කළමනාකරණයේ විශේෂ ලක්ෂණයක් නොවේ කියා තිබෙනවා. එනිසා අය වැය පරතරය වැඩි වීමේ ප්‍රශ්නයක් නැහැයි කියන එක මහින්ද චින්තනය පිළිගත්තා. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ වසරේ අය වැය පරතරය සියයට 7කට අඩු කරන්න කියලා නියෝග කරලා තිබෙන අතර, ලබන වසර වන කොට අය වැය පරතරය සියයට 5.5කට අඩු කරන ලෙස කොන්දේසි පනවා තිබෙනවා. එම කොන්දේසි ක්‍රියාත්මක කරනවා නම්, මේ ආණ්ඩුවට සිද්ධ වන්නේ අඩු වී ගෙන යන ආදායම් ප්‍රමාණය වැඩි කරන්න මේ රටේ මහ ජනයාගෙන් අය කරන බදු ප්‍රමාණය වැඩි කිරීමයි. මහ ජනයාට බෙදා දෙන සහනාධාර, සුබසාධන වියදම් කප්පාදු කරන්න ආණ්ඩුවට සිද්ධ වනවා. එයින් තමයි අය වැය පරතරය පාලනය කරන්න පුළුවන් වන්නේ. ඒක හොඳට දැන ගෙන, තමන් බංකොලොත් වෙලා ඉන්න අවස්ථාවක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලපෑම් මත තමයි අය වැයක් ඉදිරිපත් නොකර මහ ඡන්දයක් තියලා, මහ ඡන්දයෙන් පසුවයි මහ ජනයා මුළා කරලා නැවත බඩු මිල වැඩි කරන්න, බදු අය කරන්න, සහන කපන්න ආණ්ඩුව උත්සාහ කරන්නේ කියන එක තමයි අතුරු සම්මත ගිණුමෙන් අපි දෙන අර්ථ කථනය වන්නේ. වෙන කිසිම හේතුවක් නොවෙයි, වෙන සම්ප්‍රදායක් අනුව හෝ ඊ ළඟට එන ආණ්ඩුවට අවස්ථාව දෙන්න ඕනෑ කියා කියන කථාව නොවෙයි, පැහැදිලිව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යටත් වෙලා අවුරුදු හතරක් ඒ අය වැය හරහා කරපු බොරුව තමයි මේ අතුරු සම්මත ගිණුමෙන් කරන්න යන්නේ.

සිංහල කියමනක කියනවා, "නංගි පෙන්නලා අක්කා දුන්නා වාගේ" කියලා කථාවක්. නමුත් මෙතැන කරන්නේ නංගි පෙන්නලා අම්මා දෙනවා වාගේ කථාවක්. අතුරු සම්මත ගිණුම පෙන්නලා -අය වැයක් වාගේ පෙන්නලා- මහ ජනයා මුළා කරන වැඩසටහනක්, ජනතාව හැල්ලු කරන ඉතාම සවුත්තු වැඩක් හැටියටයි අපි දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අතුරු සම්මත ගිණුමෙන් මාස හතරකට රුපියල් බිලියන 356ක් අනුමත කර ගෙන තිබෙනවා. මේ රුපියල් බිලියන 356න් ජනාධිපතිතුමා වෙනුවෙන් රුපියල් බිලියන 2.3යි. මාස හතරකට ජනාධිපතිතුමාට රුපියල් බිලියන 2.3යි. ඒ මාස හතරට උසස් අධ්‍යාපනයට රුපියල් බිලියන 1.9යි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයටම රුපියල් බිලියන 1.9යි. ජනාධිපතිතුමාගේ කාර්යාලයට රුපියල් බිලියන 2.3යි. මේ එක උදාහරණයක් පමණයි ගත්තේ. අද ඒ සියුන් මහ පාරේ උද්ඝෝෂණය කරනවා. තමන්ට අවශ්‍ය ඒ පහසුකම් ලබා දෙන්නේ

නැති බව මේවායින් ඔප්පු වන බව ඉතාම පැහැදිලියි. බදු ගෙවන්නාගේ බදු මුදල් අරගෙන මේ රටේ උපයන ආදායම, ඒ බදු අය කිරීම්, වියදම් කරන්නේ කොයි ආකාරයටද කියන එක ඉතාම පැහැදිලියි.

මේ වියදම් ලේඛනය බැලුවාම අතුරු සම්මත ගිණුමෙන් ආණ්ඩුවට රාජ්‍ය අංශය සඳහා අලුත් බඳවා ගැනීම් කරන්න බැහැ; රක්ෂාවල් දෙන්න බැහැ; විශ්‍රාම වැටුප් වැඩි කරන්න බැහැ. ඒ වාගේම අර්බුද ඇති සෞඛ්‍ය සහ අධ්‍යාපන අමාත්‍යාංශවලට මේ ලේඛනයෙන් අතිරේක මුදල් වියදම් ඉදිරිපත් කරන්න බැහැ. මේ ලේඛනයේ පඩි වැඩි කිරීමට කිසිවක් ඇතුළත් වෙලා නැහැ. මේ අතුරු සම්මත ගිණුමෙන් මාස හතරක වියදම් ලේඛනයක් පමණයි ඉදිරිපත් කර තිබෙන්නේ.

ඊයේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෘත්තීය සමිති රැස්වීමකට පැමිණ සිටි වෘත්තීය සංගම් සාමාජිකයන්ට ප්‍රකාශයක් කර තිබෙනවා. ජනාධිපති බලය පාවිච්චි කරමින් ජනවාරි මාසයේ සිට සියලුම රාජ්‍ය සේවකයන්ට වැටුප් වර්ධක -වැටුප් වැඩි කිරීම්- ලබා දෙන බව එතුමා එහිදී කියා තිබෙනවා. මේ අවුරුද්දේ අය වැයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිතුමා කියලා තිබෙනවා ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, එම වැටුප් වැඩි කිරීම නොවැම්බර් මාසයේ සිට -නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසයේ දිගටම- ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන බව. මේ ඉදිරිපත් කර තිබෙන අතුරු සම්මත ගිණුමේ වැටුප් වැඩි කිරීමක් පිළිබඳව සඳහන් වෙලා නැහැ. ඒවාට මුදල් වෙන් කරලා තිබෙන බව පැහැදිලි නැහැ. ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, ඔබතුමන්ලා පරිපූරක ඇස්තමේන්තු දවස ගණනේ ගෙනෙනවා නේ. හෙට මේ ගරු සභාවට පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙන්න. නොවැම්බර් මාසයේ සිට රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම් ලබා දෙන්න, අපි විපක්ෂයක් හැටියට ඒ සම්පූර්ණ යෝජනාව සම්මත කරනවා. හෙට පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙන්න. ඇයි, ඒක ජනවාරි මාසයේ ඉඳලා දෙන්න යන්නේ? හෙට පරිපූරක ඇස්තමේන්තුවක් දමා ඒකට මුදල් වෙන් කරලා නොවැම්බර් මාසයේ දෙසැම්බර් මාසයේ වැටුප් වැඩි කිරීම සඳහා මුදල් අනුමත කරලා ලබා දෙන්න කියා අපි එක්සත් ජාතික පක්ෂය හැටියට යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කිරීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කලබල වන්න එපා, ඔබතුමන්ලාගේ තවත් සටන් පාඨයක් රජය විසින් උදුරා ගැනීම ගැන. ඔබතුමාගේ කථාවෙන් පස්සේ මගේ පිළිතුරු කථාව තිබෙනවා. මා ඔබතුමාට ආරාධනා කරනවා, මේ කථාව කරලා දුවන්නේ නැතුව අහ ගෙන ඉන්න කියලා. රජයේ සේවකයින්ට වැටුප් ලබා දෙන විධිය, වැටුප් වැඩි කරන විධිය ඉතාම පැහැදිලිව මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න මා සූදානම්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

මීට කලිනුත් දෙන විධියයි, කරන විධියයි පෙන්නුවානේ ඇමතිතුමා. මීට කලින් කොච්චර පෙන්නුවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ඔබතුමන්ලාගේ සහයෝගය අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා මේ රටට සහයෝගය දෙන්නේ නැහැයි කියලා මම දන්නවා. ඒ නිසා කරුණාකරලා අහ ගෙන ඉන්න. ඒ වාගේම ඔබතුමා වැරදි ප්‍රකාශයක් කළා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන. මේක පැහැදිලි කරන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමා, මගේ කාලය දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කාලය දෙන්නේ නැහැ. 2009 අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොටත් මෙතුමා ඇවිල්ලා -කරුණාකර ඒ mike එක off කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මෙතුමා කථා කරන්නේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳවයි. එතුමාගේ වැය ශීර්ෂයේ වැඩි කොටසක් තිබෙන්නේ, සංවර්ධන වැඩසටහන්; විදේශාධාර මත ලංකාවේ කර ගෙන යන-

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

මම කථා කරනවා. I am on my feet, Mr. Deputy Speaker.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාවේදී ඒ ගැන විග්‍රහ කරන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009 දීත් මෙතුමා ඇවිල්ලා කිව්වා, ජීවන වියදම් අංකය අනුව රජයේ සේවකයන්ට ජීවන වියදම් දීමනාව වැඩි කරලා දෙනවාය කියලා. ජීවන වියදම් දීමනාව වැඩි කරනවාය කියලා දීපු පොරොන්දුව අනුව අද වන කොට -2009 දී- රජයේ සේවකයාට රුපියල් 3,500ක වාගේ ජීවන වියදම් දීමනාවේ වැඩි වීමක් වෙලා තිබෙන්න ඕනෑ. අය වැයෙන් එහෙම පොරොන්දු වුණාට මේ වන කොට රුපියල් 350කවත් වැඩි වීමක් වෙලා නැහැ. ඉතින් මේවායේ ක්‍රම හදලා තිබෙනවා. දෙන හැටි පෙන්වනවාය කියලා මීට කලිනුත් කියලා තිබෙනවා. අරවා දෙනවා, මේවා දෙනවා; කිරි දෙනවා, දූප්පත් පවුල්වලට රුපියල් 200ක් දෙනවා, රජයේ සේවකයන්ට වැටුප් වැඩි කරනවාය කියලා 2006 ඉඳලා දිගටම කිව්වා. මුදලුත් වෙන් කරලා තිබෙන බව පෙන්නුවා. මා දැන් කියෙව්වේ ඒකයි. දූප්පත් පුංචි දරුවන්ට රුපියල් 200 ගණනේ දෙන්න රුපියල් මිලියන 950ක්, තව වැඩකට රුපියල් මිලියන 3,500ක් වශයෙන් මුදල් වෙන් කළා. නමුත් මේවා දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා අසත්‍යයි. ඒ නිසා අපි කියනවා, ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් හෙට ගෙනෙන්න, අපි අනුමත කරන්නම් කියලා. මේ වැටුප් වැඩි වීම හෙට ඉඳලා ක්‍රියාත්මක කරන්න කියලා අපි මේ ගරු සභාවට යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ සේවකයන් දිගටම මුළා කරන්නේ ඇයි? හැම මැතිවරණයකදීම රජයේ සේවකයන්ගෙන් සියයට 60ක්, සියයට 70ක් මහින්ද චින්තනයට ඡන්දය දුන්නා. දකුණු පළාත් සභා මැතිවරණය ගත්තාමත් ඒ ඡන්ද ප්‍රතිශතය බලන කොට තමන්ට වැටුප් වැඩි කරයි කියන බලාපොරොත්තුවෙන්, තමන්ට ආපදා ණය දෙයි, නිවාස ණය දෙයි කියන විශ්වාසයෙන් රජයේ සේවකයන් මේ ආණ්ඩුවට ඡන්දය දී තිබෙන බව පෙනෙනවා. නමුත් අන්තිමට මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? මේ ආණ්ඩුව වැටුප් වැඩි කරනවාය කියලා 2006 ඉඳලා වචනවලින් පොරොන්දු දීලා, ජීවන වියදම් දීමනාව මෙපමණකින් වැඩි කරනවාය කියලා පටලවා ගෙන, රුපියල් 200ක්, රුපියල් 300ක් දීලා ඒකෙන් shape වෙන්න බලනවා. ඒක අසාධාරණයි. දෙනවා නම් ඇත්ත කියන්න. දෙන්නේ නැත්නම් නැහැයි කියලා කියන්න. ඒක තමයි විය යුත්තේ.

රජයේ සේවකයන්ට පඩි වැඩි කිරීම නොවෙයි වන්නේ. රජයේ සේවකයන්ට බදු වැඩි කිරීමක් වෙලා තිබෙනවා. මොකද, 2008 නොවැම්බර් මාසයේ ගෙනාපු සංශෝධන පනතේ Section 40 යටතේ රජයේ සේවකයන්ගෙන් අය කරන බදු ප්‍රමාණය වැඩි කරන්නට දැන් නියෝග කරලා ඒක ක්‍රියාත්මකයි. කලින් රජයේ සේවකයකුගේ වැටුපෙන් සියයට 50ක් බදුවලට අයත් වන්නේ නැහැ. දැන් සියලුම රජයේ සේවකයන්ගේ සම්පූර්ණ වැටුප බදුවලට ඇතුළත් වන බව මා විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ඕවා පස්සේ පැහැදිලි කරන්න, ඇමතිතුමා. මා දන්නවා, ඔබතුමා කියන එක. ඒ ලක්ෂ තුනක් අයින් කරන ඒවා ඔක්කොම දන්නවා. වැරදි නම් Section 132 and Section 132A as amended by Section 40 of the Inland Revenue (Amendment) Act, No. 9 of 2008 කියවා ඒ අනුව මට උත්තර දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න බැරි හේතුව නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් මා අහනවා. එතුමාගේ කථාවේදී ඒකට උත්තර දෙන්න. මට වෙලාව නැහැ, දැන් දෙන්න. ඒකට ප්‍රධානම හේතුව තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිය. ඒ කොන්දේසි නිසා බදු වැඩි කරලා, සහන කපන්න සිද්ධ වනවාය කියන එක තමයි අපි ගෙනෙන චෝදනාව. දැන් කොළේ වහලා තමයි වැඩේ කරන්නේ. මේ මාස හතර ඇඟ බේරා ගෙන ඡන්දයක් තබා, මිනිසුන් මුළා කරලා, මේ අවුරුදු හතර ගෙනාවා වාගේ ඉස්සරහට තවත් මාස හතරක් shape එකේ මේ වැඩේ ගෙන යන්නයි බලාපොරොත්තු වන්නේ. ඊට පස්සේ මිනිසුන්ට ගහන එක ගහනවා, නැති වෙන්නම. ඒ කියන්නේ බදු වැඩි කරලා, සහන කපන්න යන එක ඉතාම පැහැදිලියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
නියෝජ්‍ය මුදල් ඇමතිතුමා, වෙලාව නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා කියන්නේ, ඊ ළඟට පත් වන්නේත් අපිමද, ඔබතුමන්ලා නොවෙයි කියලාද? කරුණාකරලා ඒකට මට උත්තරයක් දෙන්න. අපි පත් වෙලා අපි කරන දේවල් ගැන කථා කරන්නේ ඔබතුමන්ලාට බලාපොරොත්තුවක් නැද්ද, ආණ්ඩුවක් පිහිටු වන්න? කරුණාකරලා මට උත්තරයක් දෙන්න. කරුණාකරලා උත්තරයක් දෙන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
හරි. උත්තරය දෙන්න ඉඩ දෙන්න කෝ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ලෝකයේ කොයිම රටකවත් විපක්ෂයක් කියන්නේ නැහැ, ඊ ළඟ ආණ්ඩුවට පත් වන්නේ කවුද කියලා. කරුණාකරලා මට උත්තරයක් දෙන්න. මගේ අවස්ථාවෙන් වෙලාව අරගෙන මට උත්තරයක් දෙන්න. මට උත්තරයක් දෙන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මම උත්තරය දෙන්නම්. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
උත්තරය දෙන්න පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඊ ළඟට පත් වන්නේ අපිද, ඔබතුමන්ලාද? කරුණාකරලා මගෙන් වෙලාව අර ගෙන පැහැදිලි උත්තරයක් දෙන්න. කරුණාකර උත්තරයක් දෙන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මී ළඟට එන්නේ අපිද කියලා එතුමා අහනවා. ඒ අය ආපහු එනවා කියලා එතුමාට විශ්වාසයක් තිබුණා නම් අය වැයක් ඉදිරිපත් කරයි නේ? ඒ ගොල්ලෝ දන්නවා මේක නැති වෙලා යනවා කියලා. ඒ නිසා තමයි අතුරු සම්මත ගිණුමක් දමලා තිබෙන්නේ කියලා ඒ ගොල්ලෝ කියනවා. අලුත් ආණ්ඩුවක් එනවා කියලා ඔබතුමන්ලාම කියනවා. [බාධා කිරීමක්] ඉතින් ගරු ඇමතිතුමනි, ඊ ළඟට මේ රට පාලනය කරන්නේ කවුද කියලා අපි නොවෙයි, ඔබතුමන්ලා නොවෙයි තීරණය කරන්නේ. මේ රටේ ඡන්ද දායකයන් ඒක තීරණය කරයි. හැම දාම මේ රටේ මහ ජනයා කොණ්ඩේ බැඳපු වීනුන් බවට පත් කරන්න එපා. හැම දාම තමුන්නාන්සේලාට බොරුවෙන් මේ වැඩේ ගෙන යන්න බැහැ. මේ රටේ මහ ජනයා දැන ගෙන - [බාධා කිරීමක්] විශේෂයෙන්ම දකුණේ ජනතාව තමුන්නාන්සේලාට ලබා දෙන ඡන්ද ප්‍රතිශතය ඉතාම පැහැදිලියි. අද මහ ජනයා වෙනස් වෙමින් වෙනත් ගමනකයි යමින් ඉන්නේ කියන එක තමුන්නාන්සේලාට ඉතාම පැහැදිලියි. ඊ ළඟට එන ඡන්දයේදී තමුන්නාන්සේලාට තේරෙයි, මොකක්ද වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්න නිසාම මේක වැදගත්. මේ දවස්වල මම නම් එතුමාට අලුත් නමක් හදලා තිබෙනවා. අර රජ කාලයේ දරුණු රජවරුන් යටතේ බදු අය කරන්න අය හිටියා. මරාළ බද්ද අය කරන්න පත් කරලා හිටියේ, ඒ කියන්නේ මරාළ බද්ද අය කරන්නේ මන්නන්නා කියන පුද්ගලයා. ඊට පස්සේ ධාන්‍ය බද්ද අය කරන පුද්ගලයාගේ නම උණ්ඩියා. ජනාධිපතිතුමා මන්නන්නා කෙනෙකුයි, උණ්ඩියා කෙනෙකුයි පත් කරලා තිබෙනවා. මන්නන්නා කියන්නේ රංජිත් සියඹලාපිටිය මැතිතුමා. උණ්ඩියා කියන්නේ -ධාන්‍ය බද්ද අය කරන්නේ- බන්දුල ගුණවර්ධන මැතිතුමා. ඉතින් මන්නන්නයි, උණ්ඩියයි වැඩේ දෙනවා ලස්සනට. ගම් ගණනේ ගිහින් එය කරනවා. රංජිත් සියඹලාපිටිය මැතිතුමා මොකක්ද කරන්නේ? කෑගල්ල දිස්ත්‍රික්කයේ මීදෙනිය ගමේ, මීදෙනිය හපුවිට පාර අයිනේ පුංචි පෙට්ටි කඩ තිබෙනවා; බුලත් තට්ටු තිබෙනවා. ඒ පෙට්ටි කඩවලට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ගිහින්, "ඔබගේ පිරිවැටුම කීයද, ඔබගේ මාස තුනක පිරිවැටුම පෙන්වලා ඒකෙන් සියයට එකක් ගෙවන්න ඕනෑ, මාස තුනකට ඉස්සරහිනුත් ගෙවන්න, අපිට

මේ මුදල් එකතු කරන්න කියා තිබෙනවා" කියලා බදු අය කරන්න පටන් අර ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලජ්ජයි කියන්න. පෙට්ටි කඩෙන්, බුලත් කඩෙන් බදු අය කරන එකම ආණ්ඩුව මේ මහින්ද චින්තන ආණ්ඩුව කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න මන්ත්‍රීතුමා. ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමා, අර කේවට්ටයා ගැනත් කියන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මහ ලොකුවට සහන දෙනවා කියලා කථා කරනවා. පාරේ යන මිනිහාට ඉඩ දෙන්නේ නැහැ, පොකට් එකට ගහනවා බදුවලින්. මේක සාධාරණද? මේ අතුරු සම්මත ගිණුම් දමලා මිනිස්සු මුළා කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එහෙම බදු එකතු කරලා තමයි මේ රට නිදහස් කර ගත්තේ. මෙතුමන්ලා දන්නේ නැහැ මේ විධියට රටට ආදායම් හොයලා දීලා තමයි මේ රටේ ත්‍රස්තවාදය පරාජය කිරීමේ මහා සටනට දායකත්වය ලබා දුන්නේ කියලා. මන්නන්නා ගැන කියන ගමන්ම කරුණාකරලා මේ රටට විරුද්ධව කේලාම් කියන කේවට්ටයා ගැනත් වචනයක් කියන්න කියලා මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියනවා මේ වාගේ බදු අය කරලා තමයි මෙච්චර ලොකු යුද්ධයක් කළේ කියලා. දැන් යුද්ධය ඉවර වෙලා මාස හයයි. මේ මාස හය තුළ පරිපූරක ඇස්තමේන්තු 24ක් ගෙනාවා. ඒ පරිපූරක ඇස්තමේන්තු විසිහතරෙන් පරිපූරක ඇස්තමේන්තු දහහතරක්ම ඇමතිවරුන්ට වාහන ගන්න. මේ මහ ජනයාගේ පෙට්ටි කඩෙන්, බුලත් තට්ටුවෙන් එකතු කරන බදු -මේ මුදල්- වැය කරන්නේ මේ ඇමතිවරුන්ට සුඛෝපභෝගී වාහන ගන්නද? ඒකද අතුරු සම්මත ගිණුමක් ගෙනැවිත් විනිවිදභාවය නැති කරන්නේ? ඒක තමයි අපි ගෙනෙන චෝදනාව ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේකට හැම දාම ඉඩ දෙන්න බැහැ. විපක්ෂය ඒකට සූදානම් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව ලොකු, ලොකු ගොඩනැඟිලි ගහනවා; අධිවේගී මාර්ග හදනවා; ගුවන් පාලම් හදනවා. නමුත් මේ ගුවන් පාලම් හැදුවා කියලා මහ ජනයාගේ බඩ පිරෙන්නේ නැහැ. දෙහිවල ගුවන් පාලම හදන්න ගිය වියදම් ගැන මම කියන්නම්. අන්න, ඉදි කිරීමේ ඇමතිවරයා මේ ගරු සභාවේ ඉන්නවා. බුර්ජ් කියන හොඳම ගුවන් පාලම තිබෙන්නේ ඩුබායිවලයි. ඒ බුර්ජ් කියන ඩුබායි ගුවන් පාලමට වර්ග අඩියකට වියදම් වුණේ රුපියල් 37,000යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ දෙහිවල ගුවන් පාලමට වර්ග අඩියකට ගිය වියදම රුපියල් 1,12,000යි. නුගේගොඩ ගුවන් පාලමට ගියේ රුපියල් 1,17,000යි. කැලණිය ගුවන් පාලමට ගියේ රුපියල් 2,64,000යි. එතකොට මේ මහ ජනයාගේ බදු සල්ලි. තමුන්නාන්සේලා මේවා හරියටද කරන්නේ? ලජ්ජයි කියන්න. බදු සල්ලි අය කරලා, මේ වාගේ ගුවන් පාලම්වලින් කොමිස් ගහනවා නම් මේවා සාධාරණද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේක බදු ගෙවන්නාට වෙන ලද ලොකු අසාධාරණයක්.

රජයේ ඇමතිවරු නම් මේ අධිවේගී මාර්ගවල, ගුවන් පාලම්වල උඩින් නේ යන්නේ. ඉතින් උඩ තිබෙන ඒවා තමයි පේන්නේ. උඩින් යන කොට පේන්නේ සුඛෝපභෝගී වාහන. එයාලාගේ මට්ටමේ හොඳ වාහනවල යන අය ගුවන් පාලම් උඩින් යනවා. නමුත් මම මේ ඇමතිවරුන්ට කියනවා මේ පාලම් යට පොඩ්ඩක් බලන්න කියලා. මේ පාලම් යට මේ රටේ විශාල පිරිසක් ඉන්නවා. රජයේ සේවකයන්, විශ්‍රාමිකයන්, පාසල් දරුවන්, කම්කරුවන්, කුලී වැඩකරුවන්, ත්‍රී-වීලර් හිමියන් ආදී මේ අයගේ ප්‍රශ්න දිහා මේ ඇමතිවරුන් බලන්නේ නැහැ; ඒ අයට ඒවා තේරෙන්නෙත් නැහැ; ඒ අය ඒවා දකින්නෙත් නැහැ. ගුවන් පාලම් උඩින් විතරක් ගිහිල්ලා තමුන්නාන්සේලා ඊ ළඟ ඡන්දය දිනනවාය කියා හිතා ගන්නවා නම් ඒක බොහොම හොඳ දෙයක්ය කියා මම කියන්න කැමැතියි. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම බැංකු පොලිය අඩු කිරීම ගැන විනාඩි පහක් හරි කතා කරන්න මා බලාපොරොත්තු වනවා. බැංකු පොලිය අඩු කරනවාය කිව්වාම මට හිනා ගියා. මොකද, රාජිත සේනාරත්න මැතිතුමා, මනෝ විජයරත්න මැතිතුමා එහෙම අපේ ආණ්ඩුවේ ඉන්න කොට අපි උද්ධමනය අඩු කරලා, න්‍යායාත්මකව බැංකු පොලිය අඩු කරලා, මේ රටේ ආර්ථික වර්ධනයක් ඇති කරන කොට, දේශ ද්‍රෝහීන්ය කියා මේ ආණ්ඩුවේ අය එදා අපට ඇඟිල්ල දික් කළා. බැංකු පොලිය අඩු කිරීමෙන් මේ රටේ විශ්‍රාමිකයන්ට, තැන්පත්කරුවන්ට විශාල අසාධාරණයක් වනවාය කියා එදා අපට ගැහුවත් අද මේ ආණ්ඩුව බැංකු පොලිය අඩු කරන න්‍යායට ඇවිල්ලා තිබෙනවා. ඒක විස්මයට පත් වන්න ඕනෑ කාරණයක්. රනිල් වික්‍රමසිංහ න්‍යාය දැන් මහින්ද චින්තනයත් උපුටා ගෙන තිබෙන බව ඉතාම පැහැදිලියි. දැන් එහෙම නම්, "යළි පුබුදමු ශ්‍රී ලංකා" හරි. අපි කරපු හැම දෙයක්ම දැන් තමුන්නාන්සේලා කරන්නේ ඇත්ත තේරෙන නිසා වෙන්න ඇති නේද? මෙතෙක් කල් දේශ ප්‍රේමිත්වය සළුවක්, සාටකයක්, බැම්මක් හැටියට පාවිච්චි කළා; යුද්ධය තාප්පයක් හැටියට පාවිච්චි කළා. දැන් ඒවා පාවිච්චි කරන්න, මහ ජනතාව එච්චර මෝඩ වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ බැංකු පොලිය ගැනත් යමක් කියන්න කැමැතියි. තෝමස් ජෙෆර්සන් තුන් වන ජනාධිපතිවරයා හැටියට - the third President of the USA - ලියුමක් යවා තිබෙනවා, භාණ්ඩාගාරික ලේකම්තුමාට. ඒ ලියුමේ එතුමා මෙහෙම කියා තිබෙනවා. මම බොහොම අමාරුවෙන් ඒක සිංහලට පරිවර්තනය කළා. එතුමා එහිදී බැංකු ගැන කියා තිබෙනවා. මේ ආණ්ඩුව බැංකු එක්ක ගනුදෙනු කරපු ආකාරයම තමයි එහිදී කියා තිබෙන්නේත්. එතුමා එහිදී මෙහෙම කියා තිබෙනවා. "ස්ථාවර යුද හමුදාවකට වඩා බැංකු ආයතන රටේ නිදහස් දිවි පැවැත්මට අනතුරුදායක යයි මම කල්පනා කරමි. පළමුව උද්ධමනය තුළින්ද, ඉන් පසුව අවපාතය තුළින්ද රට තුළ සංසරණය වන මුදල් නෝට්ටුවල අගය පාලනය කිරීමට යම් විටෙක ඇමෙරිකානු ජනතාව පුද්ගලික බැංකුවලට ඉඩ දුන හොත් බැංකු සහ ඒ වටා වර්ධනය වන ව්‍යවස්ථාපිත ආයතන විසින් දෙමාපියන් සටන් කොට දිනා ගත් දේ දේශය තුළ තම දරුවන් උන් හිටි තැන්වලට පවා අයිතියක් නැති බව වටහා ගන්නා දිනය දක්වා ජනතාව සතු සියලුම දේපොළවලට ඇති අයිතිය ඔවුන්ට අහිමි කරනු ඇත." තෝමස් ජෙෆර්සන් කියන්නේ ඇමෙරිකාවේ තුන් වන ජනාධිපතිවරයායි. [බාධා කිරීමක්] ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමනි, එතුමා අවුරුදු හැට හත්තෑවකට, සීයකට කලින් කියපු දේ මහින්ද චින්තනය අද කරනවා. විසිඑක් වන සියවසේ අද කරනවා. මම එහෙම කියන්නේ ඇයි? මහින්ද චින්තනය මොකක්ද කළේ? මේ රටේ උද්ධමනය -

**ගරු මනෝ විජයරත්න මහතා**
(மாண்புமிகு மனோ விஜயரத்ன)
(The Hon. Mano Wijeyeratne)
බැංකු කිහිපයයි නේ, -[බාධා කිරීමක්] මහජන බැංකුවයි, ලංකා බැංකුවයි නේ පෞද්ගලීකරණය කරන්න ගියේ. තෝමස් ජෙෆර්සන්ගේ- [බාධා කිරීමක්] 1800 ගණන්වල.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
හරි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම එතුමාට උත්තර දෙන්නේ නැහැ. එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. මම එතුමාට උත්තර දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද චින්තනය බලයට ආවාට පසුව මොකක්ද කළේ? සල්ලි අච්චු ගහන්න පටන් ගත්තා. සල්ලි අච්චු ගහපු එකේ ප්‍රතිඵලය වශයෙන් උද්ධමනය වැඩි වුණා. අච්චු ගහපු සල්ලි පාවිච්චි කළේ රජයේ නාස්තියටයි, වියදමටයි, ඇමතිවරු නඩත්තු කිරීමටයි. අපි ඒ ගැන දිගටම චෝදනා කළා. ගිනි පොලියට විදේශ ණය කෝටි ගණනක ගත්තා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ රටේ ජීවන වියදම වැඩි වුණා; උද්ධමනය වැඩි වුණා. උද්ධමනය සියයට 28ක් දක්වා යද්දී මේ රටේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ස්ථාවර තැන්පත්වලට සියයට 13කුත්, සාමාන්‍ය ඉතිරි කිරීම්වලට සියයට 5ක පොලියකුත් පමණයි දුන්නේ. මේ රටේ දුප්පත් අහිංසක විශ්‍රාමිකයන්, ග්‍රාමීය දුප්පත් පවුල්වල ඉතිරි කිරීම් කරන අයට ආණ්ඩුව මොකක්ද කළේ? උද්ධමනය සියයට 28ක් වෙලා තිබෙද්දි සියයට 5ක පොලියක් දෙන කොට ඇත්තෙන්ම තමන්ගේ ඉතුරු කිරීම්වල අවශේෂයක් වුණත් ඒ අය බංකොලොත් වුණා. ඒ නිසා තමයි බොහෝ දෙනෙක් තමන්ගේ සල්ලි ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් එළියට අර ගෙන, ලංකා බැංකුවෙන් එළියට අර ගෙන අර සක්විති කියන, ගෝල්ඩන් කී කියන හොර ආයතනවල තැන්පත් කළේ. ආණ්ඩුව බැංකු ක්ෂේත්‍රයේ විශාල හොරකමක්, ජඩකමක් කරලා, බැංකුවලට කෝටි ගණනක් හම්බ කරන්න ඉඩ දුන්නා අපි විටින් විට, විටින් විට මේක ගැන කථා කළා. දැන් අවුරුදු තුන, හතරක් ගත වෙලා, ලංකා ආර්ථිකය බංකොලොත් වෙලා. ලංකාවේ පාලකයන්ට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරියට ගිහින් දණ ගහලා කොන්දේසිවලට යටත් වෙලා ණය ගන්න සිද්ධ වෙලා, මේ රටේ බඩු මිල වැඩි වෙලා, ජීවන වියදම වැඩි වෙලා, මහ ජනයාගේ ආදායම් මාර්ග නැති වෙලා, දේශීය කර්මාන්ත විනාශ වෙලා තිබෙන අවස්ථාවක දැන් ආණ්ඩුව කියනවා, අපි බැංකුවල ණය පොලී අනුපාතය අඩු කරන්නම් කියලා. I would say this is too little, too late. මේක කරන්න තිබුණේ මීට කලින්. කමක් නැහැ, දැන් වුණත් කරනවා නම්. නමුත් මා අහන්න කැමැතියි, මේ වාගේ දෙයක් කරන්නේ ජනාධිපති නියෝගයකින්ද කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක කරන්න තිබෙන්නේ මූල්‍ය මණ්ඩලයෙන්. There is a Monetary Board in this country. මූල්‍ය මණ්ඩලය මේ රටේ මුදල් තත්ත්වය බලලා, ඒ අනුව තිබෙන න්‍යාය සකස් කරලා ඉන් පසුව තමයි පොලී අනුපාතය අඩු කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ජනාධිපතිතුමා එක පාරම ඕඩරයක් දුන්නා. ජනාධිපතිතුමාගේ ඕඩරයට මොකද වුණේ? රංජිත් සියඹලාපිටිය මැතිතුමා සාකච්ඡාවක් පැවැත්වුවා, ලංකා බැංකුවෙයි, මහජන බැංකුවෙයි නිලධාරින් එක්ක. ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේ දී උත්තර දෙන්න, මා දන්නා තරමට ඒ නිලධාරින් කියා තිබුණා, -විශේෂයෙන්ම මහජන බැංකුවේ නිලධාරින් කියා තිබුණා- තමන්ට දැනට සියයට 8ක පොලියට ණය දෙන්න විධියක් නැහැ කියලා. සියයට 8 - 12 අතර පොලියකට ණය දෙන්න අමාරුයි, සියයට 14ක් දක්වා තමන්ගේ ණය පොලී අනුපාතය අඩු කරන්නට පුළුවන් කියලා. මහජන බැංකුව එහෙම ප්‍රකාශ කරලා තිබුණා. මා දන්නා තරමට අද වන තුරු සියයට 8ක පොලියට ණය දෙන්න එම ආයතන සූදානම් බව අපට පෙනී යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟට මේ ප්‍රතිපත්ති වෙනස් වුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
තව විනාඩි දෙකකින් මා අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විනාඩියකින් අවසන් කරන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
හරි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005 දී මේ ආණ්ඩුව මොකක්ද කළේ? SME බැංකුවක් හැදුවා. ඒ SME බැංකුව හදලා තමන්ගේ හෙංචයියලාට, කෝටිපති මුදලාලිලාට ණය දෙන්න පටන් ගත්තා. නියෝජ්‍ය මුදල් ඇමතිතුමා ඒකට ඕනෑ නම් උත්තර දෙන්න. ඒ SME බැංකුවෙන් දීපු ණයවලින් සියයට 30ක් බොල් ණය බවට පත් වුණා. සියයට 30ක් non-performing loans. SME බැංකුව බංකොලොත් වුණා. SME බැංකුව බංකොලොත් වුණාට පසුව මේ පාර්ලිමේන්තුවට ගෙනල්ලා, පසු ගිය අය වැයේදී SME බැංකුව පූට්ටු කළා, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවට. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවත් බංකොලොත් වන්න ගියා. රුපියල් බිලියන 5ක් පසු ගිය අය වැයෙන් අනුමත කරලා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවට දුන්නා. ප්‍රතිඵලය මොකක්ද? භාණ්ඩාගාරයේ තිබෙන සල්ලි ඔක්කොම අරගෙන මේ බංකොලොත් වන බැංකුවලට දුන්නා. මේ බංකොලොත් වන බැංකු මොනවාද කළේ? මේ රටේ ඉන්න දේශීය කර්මාන්තකරුවන්ට, කුඩා කර්මාන්තකරුවන්ට අඩු පොලියට ණය දුන්නේ නැහැ. ඒ සල්ලි ටික අරගෙන මොකක්ද කළේ? තමන්ගේ හිතවතුන්ට, හෙංචයියලාට, මුදලාලිලාට ඒ ණය ටික දුන්නා. සියයට 30ක ණය ආපසු ලබා ගන්න බැරි වුණා. මහින්ද චින්තන ආණ්ඩුව අද මේ බැංකු ක්ෂේත්‍රය විනාශ කරලායි තිබෙන්නේ. ඒ නිසා දැන් බැංකුවලට සියයට 8ක පොලියට ණය දෙන්න කියලා නියෝග කළාට මේ බැංකුවලට ඒක කරන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැනත් මා අහන්න කැමැතියි. රජයේ සේවකයන් 21,000කට සියයට 4ක පොලියට නිවාස ණය දෙන්නට තිබෙනවා. මම අහන්නේ, ආණ්ඩුව සල්ලි ටික -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මා අවසන් කරනවා. මා අහන්නේ, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අනුව බැංකුවලට ඒ මුදල් තිබෙනවාද කියලායි. මා නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් අහනවා, රජයේ සේවකයන්ට සියයට 4ක පොලියට ණය දෙන්න සූදානම් නම් මේ රටේ සිටින අනෙක් අය කොහොමද ගෙවල් හදන්නේ කියා. රජයේ සේවකයන් විතරක්ද ගෙවල් හදන්නේ? ඒ අයටත් මේ ණය ලබා දීම ප්‍රමාද කළා. මේ රටේ ජීවත් වන අනෙක් අයට ගෙයක් හදන්න, සියයට 4ක පොලියට ණය ගන්න -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද නිවසක් හදන කෙනෙකුට, රජයේ සේවකයකුට වුණත් සිමෙන්තිවලට සියයට 50ක් බදු ගෙවන්න වනවා. සිමෙන්ති මිටියකට සියයට 50ක් බදු අය කරනවා. එතකොට රුපියල් සියයක මුදලට තිබුණු වර්ග අඩියක tile එකක් රුපියල් 200යි. රුපියල් 600ක මිලට තිබුණු වැසිකිළි පෝච්චියක් අද රුපියල් 1,300යි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න. මී ළඟට ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා. [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, දැන් මට අවස්ථාව දෙන්න. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වන්න. දැන් ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම තිබෙද්දී මේ ආණ්ඩුව අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමත් බංකොලොත් වීමක් විධියට ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
හරි, හරි. දැන් ඇති. ඔබතුමා වාඩි වන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.

[පූ. භා. 11.47]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා, අද දවසේ ආණ්ඩු පක්ෂයෙන් ආරම්භක කථාව කිරීමට අවස්ථාව ලබා දීම ගැන. කවදා හෝ එන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක, එතුමන්ලාගේ ඡායා කැබිනට්ටුවේ මුදල් ඇමතිවරුන් දෙදෙනෙක් දැනට නම් කරලා තිබෙනවා. නායකතුමාගේ අර ඇඟ බේරා ගැනීමේ න්‍යාය මත ඡායා කැබිනට්ටුවේ මුදල් ඇමතිවරුන් දෙදෙනෙකු සිටිනවා. ඒ දෙදෙනා අතරත් ලොකු තරගයක් තිබෙනවා. මා හිතන්නේ එතුමා බොහෝම වේගවත් කථාවක් කරලා අද යම් කිසි ලකුණු ගණනක් රැස් කළා මම ශුභ පතනවා, කවදා හෝ, අවුරුදු 50කින් හෝ එන ආණ්ඩුවක කබීර් හෂීම් මන්ත්‍රීතුමා -මගේ දිස්ත්‍රික්කයේ අසල්වැසියා- මුදල් ඇමති වේවා කියලා. මම බොහොම ආඩම්බර වනවා. ඊයේ රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාවට වඩා අද කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේ කථාව සාර්ථකයි වාගේ මට පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැරණි රජ දවසේ තනතුරු දෙකක් ගැන එතුමා කථා කළා. මම නම් අහලා නැහැ, "මන්නන්නා" කියලා චරිතයක් බදු එකතු කළාය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි "බම්මන්නා" කියලා චරිතයක් ඉඳලා තිබෙනවා. ඔහු බදු එකතු කරන කෙනෙක් නොවෙයි. බම්මන්නා කියන්නේ රජ්ජුරුවන්ගේ ඒ ඒ වෙලාවේ තිබෙන චරිතය නිරූපණය කරන විකට චරිතයක්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ඒ, ඇම්බැට්ටයා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
එතුමා, එතුමාගේ නායකයාගේ පරාජිත චරිතය- [බාධා කිරීමක්] දැන් ඉවසා ගෙන ඉන්න. එතුමාගේ නායකයාගේ පරාජිත චරිතය, එතුමා බම්මන්නාට ආරූඪ වෙලා ඉතාම හොඳින් මේ පාර්ලිමේන්තු සභාවට අද පෙන්වූවාය කියා මම විශ්වාස කරනවා. මම ඔබතුමාට ශුභ පතනවා. විකට නළුවකුගේ චරිතයක් රඟපෑවොත් ඔබතුමා දේශපාලකයකුට වඩා සාර්ථක වේවි. විකට නළුවකුගේ චරිතය රඟපාන්න මම ඔබතුමාට ආරාධනා කරනවා, දිස්ත්‍රික්කයේ සහෝදරයකු හැටියට. බම්මන්නාගේ චරිතයට ඔබතුමා ඉතාමත් ගැළපෙනවා.

ඊ ළඟ රජය කවුද කියලා ඔබතුමාම පිළිගත්තා. කවර දාවත් විපක්ෂයක් එහෙම පිළිගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම දූර්වල විපක්ෂයක් වුණත් කියන්නේ, "අප තමයි ඊ ළඟට බලයට එන්නේ" කියලා. නමුත් එක්සත් ජාතික පක්ෂය බොහොම ආඩම්බරයෙන්, බොහොම වේගයෙන් කථා කර කියනවා, ඊ ළඟ රජය එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අතිගරු ජනාධිපතිතුමා යටතේ පැවැත්වෙන රජයක් කියලා. අප සන්තෝෂ වනවා. ඒ ගැන අප තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වනවා. මීට වැඩිය ප්‍රචාරයක් ඉදිරි මැතිවරණ සමයක අපට අවශ්‍ය නැහැ. ඔබතුමන්ලාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන විවිධ මත ප්‍රකාශ වුණා. අය වැය ලේඛනය ඉදිරිපත් කරනවා කියලා මම ප්‍රකාශයක් කළා කියා කිව්වා. ඔව්. මම ප්‍රකාශ කළා. අපි අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න සූදානම් වන්නේ ජූනි මාසයේ ඉඳලා. ඒකට විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. හැම අමාත්‍යාංශයකින්ම තොරතුරු ලබා ගෙන, ඔවුන් සමඟ සාකච්ඡා කර, ඔවුන්ගේ වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කර, මුදල් අමාත්‍යාංශයට ලබා දිය හැකි සම්පත් පිළිබඳ සාකච්ඡා කර දීර්ඝ වැඩ පිළිවෙළක් කර ගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඒ දීර්ඝ වැඩ පිළිවෙළ පසු ගිය දා වන තුරු කර ගෙන ආවා. නමුත් මේ රටේ සැලකිය යුතු කණ්ඩායමක්, දේශපාලන අංශවලට සම්බන්ධ අය, ආර්ථික විද්‍යාඥයින් අතර මතයක් පැන නැඟුණා, ලබන වර්ෂයේ අප්‍රේල් වන විට අනිවාර්යයෙන්ම නව පාර්ලිමේන්තුවක් පත් විය යුතුයි කියා. ඒ නව පාර්ලිමේන්තුව තමයි ඒ අවුරුද්දේ මාස 8ක් මේ රටේ මූල්‍ය පාලනය ගැන වග කියන්නේ. එහෙම නම් ඒ පාර්ලිමේන්තුවට මේ අයිතිවාසිකම ලබා දිය යුතුයි කියලා මතයක් පැන නැඟුණා. අන්න ඒ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිගනිමින් තමයි අපි ඉතාමත් පැහැදිලිව -

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
පැහැදිලි කිරීමකට ඉඩ දෙන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
අහ ගෙන ඉන්න. අහ ගෙන ඉන්න. ඔබතුමා මට වෙලාව දුන්නේ නැහැ. ඒ නිසා කරුණාකර අහ ගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අතුරු සම්මත ගිණුමට ආවේ අන්න ඒ වැදගත් කාරණාවත් එක්කයි. මේ රටේ ඉතිහාසයේ අතුරු සම්මත ගිණුම් දහ වතාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්නේ එක්කෝ රටේ කලබලකාරි වාතාවරණයක් පවතින අවස්ථාවක; එහෙමත් නැත්නම් ඉදිරි ඡන්දයක් පැවැත්වෙන අවස්ථාවක; එහෙමත් නැත්නම් රජයක් පත් වෙලා ඒ නව රජයට අය වැය ලේඛනයක් ඉදිරිපත් කර ගන්න අවස්ථාවක් නොමැති අවස්ථාවක. අද ඒ කාරණා තුනෙන් වැදගත්ම අවස්ථාව වන ඉදිරියේ මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවක් නිසා අපි ඒ අයිතිවාසිකම නව පාර්ලිමේන්තුවට දීලා තිබෙනවා. නමුත් මෙතුමන්ලා හැම දාම විපක්ෂයේ සිටින්න සූදානම් කණ්ඩායමක් හැටියට ඒ අයිතිවාසිකම එතුමන්ලා දකින්නේ වැරදි පැත්තට. මම ඒ ගැන කනගාටු වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ඔබතුමා පිළිගන්නවා එහෙම නම් ආණ්ඩුව වෙනස් වනවා කියා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඒක ඔබතුමන්ලා දන්නවා නේ. තට්ටු කර බලන්න මොකක්ද කියලා. මට කෙටි වෙලාවයි තිබෙන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා බාධා නොකර අහ ගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රකාශයේ ඉතාමත් පැහැදිලිව තිබෙනවා, 2010 අප්‍රේල් වන විට මේ පාර්ලිමේන්තුවේ නිල කාලය අවසන් වන බැවින් 2010 මුදල් වර්ෂය වෙනුවෙන් අය වැයක් මෙම පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම සුදුසු නැහැ කියා. මැතිවරණයක් මඟින් පුළුල් මහ ජන මතයක් නිරූපණය වන සන්දර්භයක් තුළ ඉදිරියේදී පත්වීමට යෝජිත පාර්ලිමේන්තුවේ අභිමතය අප විසින් පවරා නොගත යුතු යයි අප විශ්වාස කරනවා. තේරුම් ගන්න. මැතිවරණයෙන් පසුව ජනතාව අලුතින් තෝරා ගනු ලබන මහ ජන නියෝජිතයින්ට එම අවස්ථාව දිය යුතු යැයි අප විශ්වාස කරනවා. ඒකයි අපේ පරමාර්ථය. හැබැයි මම සන්තෝෂ වනවා. නැවත වතාවක් මම කියන්නේ, මේ ලෝකයේ කිසිම විපක්ෂයක් නොකරන විධියට ඊ ළඟ ආණ්ඩුව කවුද කියලා, ඊ ළඟ ආණ්ඩුවත් මේ දැනට ආණ්ඩු කරන කණ්ඩායමමයි කියලා සුවිශේෂී සහතිකයක් එක්සත් ජාතික පක්ෂය සහ විපක්ෂය ලබා දී තිබෙන බවයි.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. Dew Gunasekara)
අපි වුණත් නව රජයක්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔව්, අපි වුණත් නව රජයක්. නමුත් ඒ සහතිකය පිළිබඳව මම විපක්ෂයට හදවතින්ම ස්තුති කරන්න සූදානම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමේ අරමුණ අලුත් ආණ්ඩුවට, අලුත් පාර්ලිමේන්තුවට අවස්ථාවක් දීමයි. කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, හිටපු මුදල් අමාත්‍ය නයිනා මරිකාර් මහතා 1989 සඳහා ඉදිරිපත් කරනු ලැබූ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කළේ මැතිවරණයෙන් පස්සේ කියලා. මෙන්න එතුමා කරපු ප්‍රකාශයේ සිංහල පරිවර්තනය. මම අදාළ හැන්සාඩ් වාර්තාවත් එක්කමයි ගෙනැවිත් තිබෙන්නේ. එතුමා එහි ඉතා පැහැදිලිව මෙහෙම කියනවා. මේ එතුමා කියන ආකාරය. "මම 1989 සඳහා විසර්ජන පනත ඉදිරිපත් කළේ නම් එය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ මහඟු සම්ප්‍රදායන් උල්ලංඝනයක් වීමට ඉඩ තිබුණි. මන්ද, අපේ රට සඳහා නව ජනාධිපතිවරයෙක් තෝරා ගැනීමේ මැතිවරණයක් පැවැත් වීමට ආසන්නව තිබූ බැවිනි. අනෙක් අතට එය ප්‍රායෝගික නොවන්නකි. මන්ද, විවිධ පක්ෂවලට අයත් අපි සියල්ලන්ම හදිසි මැතිවරණ සමයක මැද සිටින නිසා. එමෙන්ම මම සිතනවා, නව ජනාධිපතිවරයාට 1989 අය වැය ලේඛනයේ ව්‍යුහය තීන්දු තීරණ කිරීමට පූර්ණ අවස්ථාවක් ලබා දිය යුතුයි කියලා."

මේ කවුද කියන්නේ? නයිනා මරිකාර් හිටපු මුදල් ඇමතිතුමා. [බාධා කිරීම්] අහගෙන ඉන්න. එතුමා කියන්නේ ජනාධිපතිවරයා නිසා කියලා. ජනාධිපතිවරයා නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මුදල් පාලනය කරන්නේ. අද අපි කියන්නේ එයට නියම අයිතිවාසිකම තිබෙන්නේ පාර්ලිමේන්තුවට කියලායි. පාර්ලිමේන්තුවක් පත් කිරීම සඳහා මේ අවස්ථාව දෙන්නේ. එතුමා ජනාධිපතිවරයෙක් පත් වීම වෙනුවෙනුත් කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා හැටියට එතුමාට අවස්ථාව දීලා අතුරු සම්මත ගිණුමකට ගිහින් තිබෙනවා. අද අපි පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය පිළිබඳ නියම අයිතිවාසිකම ආරක්ෂා කරන්න අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළාම එතුමා ගල් පැළෙන අසත්‍ය මෙතැන ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලාගේම හිටපු ඇමතිවරයෙක් ගැන - [බාධා කිරීම්] මගේ වේලාව දෙන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
ඔබතුමා මගේ වේලාවත් ගත්තා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමන්ලාගේ ඊ ළඟ කථාවේදී මේකට පිළිතුරු දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චොක්සි ඇමතිතුමායි අවසාන අතුරු සම්මත ගිණුම ගෙනාවේ. දැන් මෙතුමන්ලා කියනවා, IMF එකේ ප්‍රශ්නයක් ගැන. මම අහන්න කැමතියි, - කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් එතකොට ආණ්ඩුවේ ඇමතිවරයෙක්- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රශ්නයක් නිසාද, එදා චොක්සි ඇමතිතුමාත් අතුරු සම්මත ගිණුමක් ගෙනාවේ කියලා. එතුමා 2002 අතුරු සම්මත ගිණුම සම්බන්ධව මෙහෙම කියනවා. එතුමා කළ කථාවේ සිංහල පරිවර්තනයේ මෙහෙම තිබෙනවා: "මෙවන් පරිසරයක් තුළ අලුතෙන් පත් වුණු එක්සත් ජාතික පක්ෂ රජයට ආයෝජකයන් සහ ආර්ථික වර්ධනය දිරිමත් කිරීම සඳහා විචක්ෂණ සහ දිරි ගන්වනසුලු විරස්ථායී මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්තීන් වර්ධනය කර ගත යුතු වේ. එවන් මහෝපකාරී මූල්‍ය ගිණුම් හා ප්‍රතිපත්ති අය වැය තුළින් ඉදිරිපත් කිරීම සඳහා අපි අතුරු සම්මත ගිණුමක් ගෙනාවා."

මොකක්ද මේ අතුරු සම්මත ගිණුමේ කතන්දරය? ඊ ළඟ පාර්ලිමේන්තුවට මේ රටේ ප්‍රධානම වගකීම ලෙසට පැවරෙන්නේ ත්‍රස්තවාදයෙන් නිදහස් කරලා දුන්නු මේ රට වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා යන රටක් බවට පරිවර්තනය කිරීමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න ඒ සඳහා නව පාර්ලිමේන්තුවට පූර්ණ අයිතිවාසිකම සලසා දීමට තමයි අපි අතුරු සම්මත ගිණුමක් ගෙනාවේ කියන එක මා මේ ගරු සභාවට පැහැදිලි කරන්න කැමැතියි.

ඒ වාගේම විපක්ෂයෙන් මේ විරෝධය නැඟෙනවා කියලා අපි දැන ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා ළඟ තිබෙනවා, 2009.09.30 වන දින "ලංකාදීප" පත්තරය. ඒකේ මෙහෙම කියනවා:

"අයවැය නොගෙනාවොත් එ.ජා.ප.ය නඩු මහට"

මොනවාද, මේ? බාල සටන් පාඨ. මෙහෙම කියන්නේ අතුරු සම්මත ගිණුම් හතක්, අටක් ගෙනාපු පක්ෂයක්. කාටද, මේ කියන්නේ? ගැලරියට කියන කියමන්. පක්ෂයේ ලේකම්තුමා කියනවා, " අතුරු සම්මත ගිණුමක් ආවොත් ඊට එරෙහිව පාරට බහිනවා" කියලා. මේ ගොල්ලන්ට සටන් පාඨ හිඟයක් පවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊයේ අපි දැක්කා, කථානායකතුමා පැහැදිලි තීන්දුවක් දුන්නා. අතුරු සම්මත ගිණුමක් ගෙනෙන්න පුළුවන්. ඒ යෝජනාව හැටියට සැලකෙන්නේ මේ ඉදිරිපත් කරන යෝජනාව. නමුත් අපි මෙතැන දී දැක්කා, ඉරාන පාර්ලිමේන්තුවේ නියෝජිත කණ්ඩායමක් බලා ගෙන ඉන්දැද්දී විපක්ෂ නායකතුමා සහ එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම හැසිරුණු ආකාරය. අපි මේක බලාපොරොත්තු වෙච්ච තත්ත්වයක්. මීට වැඩිය දෙයක් මේ විපක්ෂයෙන් අපි බලාපොරොත්තු වන්නේ නැහැ. පරාජිත විපක්ෂයක් හැටියට, බලාපොරොත්තු රහිත විපක්ෂයක් හැටියට, දිගින් දිගටම ආණ්ඩු පක්ෂය මේ රට පාලනය කරනවා කියන කාරණාව තුළ සිහින බොඳ වෙච්ච විපක්ෂයක් හැටියට ඔවුන්ගෙන් අපට මීට වැඩිය දෙයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්ය කියලා මා කල්පනා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම ඇහැව්වා, අතුරු සම්මත ගිණුම ගෙනාවේ මොන නීතියක් යටතේද කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(2) ව්‍යවස්ථාව යටතේ අතුරු සම්මත ගිණුමක් ගෙනෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම මා දැක්කා, ඊයේ මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අරගෙන එක්සත් ජාතික පක්ෂයේ shadow කැබිනට් එකේ මුදල් ඇමතිතුමා අනෙක් මුදල් ඇමතිතුමා ළඟට යනවා, එතැනින් තවත් මන්ත්‍රීවරයෙක් ළඟට යනවා. ගිහිල්ලා එතුමන්ලා අහන්න සූදානම් වුණේ මාස හතරක් කියන කථාව මේකේ නැහැයි කියලායි. මාස හතරක් කියලා කියන්න අවශ්‍ය නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි ඉතා පැහැදිලිව මෙහෙම තිබෙනවා:

"2010 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වී, 2010 දෙසැම්බර් මස 31 දිනයෙන් අවසාන වන්නා වූ, 2010 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා ප්‍රතිපාදන සැලසෙන විසර්ජන පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙන් අවසන් වන..."

2009 වසරට සාපේක්ෂව පරිපූරක ඇස්තමේන්තු කිහිපයක අත්‍යවශ්‍ය මුදලුත් සමඟ ඉදිරි මාස හතරක් සඳහා මුදල් වෙන් කර ගෙන තිබෙනවා. ඒ නිසා අපට මේ මාස හතරට මුදල් තිබෙනවා. අවශ්‍ය නම් අපට ජනවාරිවල දී මහ ඡන්දයට යන්නත් පුළුවන්; පෙබරවාරිවල දී යන්නත් පුළුවන්; මාර්තුවල දී යන්නත් පුළුවන්. අපට දිනය අවශ්‍ය නැහැ. නමුත් මාස හතරක් සඳහා තමයි අපි මුදල් වෙන් කර ගෙන තිබෙන්නේ. එතුමා මේක කියෙව්වා, එතැන මාස හතරක් කියන එක නැහැ, ඒකත් අර ගෙන පාර්ලිමේන්තුව වටේ දුවලා ලොකු තර්කයක් ගොඩ නඟන්න උත්සාහ කළා. මේකේ දිනයක් නැතිලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විපක්ෂයට කියන්න කරුණු නැහැ; සටන් පාඨ නැහැ. ඒ නිසා මොනවා හෝ දෙයක් උස්සා ගෙන තර්කයක් ගොඩ නැඟීමේ අසහනකාරී, අපහසුකාරී තත්ත්වයකට විපක්ෂය පත් වෙලා තිබෙනවාය කියන එක පැහැදිලි කරන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි. ජනාධිපතිතුමාගේ වියදම් පිළිබඳව මෙතුමන්ලා හැමදාම වැරදි තර්කයක් ගොඩ නඟනවා. එතුමාගේ වියදම් පසු ගිය වර්ෂයට වඩා වැඩි කරලා නැති බව ඉතා පැහැදිලියි. ඒ තිබුණු වියදම් ඒ ආකාරයටම අර ගෙන තුනෙන් එකකට යොදලා තිබෙනවා. ඒ වාගේම ඒ වියදම්වලින් වැඩි ප්‍රමාණයක් අඩංගු වන්නේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් කාර්යාලය, මූලික පදනම් ආයතනය, ශ්‍රී ලංකා පදනම, ජාතික පර්යේෂණ සභාව කියන ආයතනවලටයි. ඒ වාගේම මුළු ප්‍රමාණයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වනවා. ඒවා විදේශ ආධාර. විදේශ ආධාර යටතේ "ඊ-ශ්‍රී ලංකා" පරිගණක සේවාව ක්‍රියාත්මක වනවා. ඈත ගම් දනව්වල දරුවන්ට පන්සල හරහා, පල්ලිය හරහා, කෝවිල හරහා විශේෂ පරිගණක පුහුණුව ලබා දෙන සුවිශාල වැඩ පිළිවෙළකට යන මුදලත් ජනාධිපතිතුමාගේ වියදම් හැටියට එකතු කරලා දින 365න් බෙදලා, ඒවා ජනාධිපතිතුමාගේ වියදම් කියලා මහා විශාල ආන්දෝලනයක්, මහා විශාල චෝදනාවක් නඟන්න මෙතුමන්ලා උත්සාහ කරනවා මම දැක්කා. ඒක නිවැරදි කළ යුතුය කියලා මා කල්පනා කරනවා.

ඒ වාගේම අමාත්‍යාංශ සඳහා වෙන් කරන මුදල් අඩු කර තිබෙනවාය කිව්වා. කිසි සේත්ම නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි හැම අමාත්‍යාංශයකටම 2009 වර්ෂයට වෙන් කළ මුදලින් තුනෙන් එකක්, ඉදිරි මාස හතර සඳහා -අත්‍යවශ්‍ය පරිපූරක ඇස්තමේන්තුවලින් වෙන් කළ මුදලුත් සමඟ- අතුරු සම්මත ගිණුම මඟින් වෙන් කර තිබෙනවාය කියන එක මම වග කීමෙන් ප්‍රකාශ කරනවා. ඒ වාගේම සහන කැපීමක් ගැන කිව්වා. කිසිදු සහනයක් කපලා නැහැ. "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ හැම දාමත්, යුද්ධය කරන ගමනුත් සංවර්ධනය තිබුණා; සුබසාධනය තිබුණා. ඒ නිසා මෙතුමන්ලාට අලුතින් කියන්න දෙයක් නැහැ. මේ අතුරු සම්මත ගිණුම තුළත් පොහොර සහනාධාරය, සමෘද්ධි සහනාධාරය, පාසල් නිල ඇඳුම, පාසල් පෙළ පොත් ලබා දීම ආදී සියල්ලම අඩංගු වෙලා තිබෙනවාය කියන එක මම වග කීමෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ලබා දීම ගැන ප්‍රශ්නයක් එතුමා කථා කළා. ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබෙනවා ඒකට අපි සූදානම්ය කියලා. එතුමන්ලා අද හැඬූ කඳුළින් කථා කළාට ඒ කාලයේ රාජ්‍ය සේවකයන්ට සලකපු විධිය අපි දන්නවා. අංක 16 දරන චක්‍රලේඛනයක් ගෙනැල්ලා රාජ්‍ය සේවයට බඳවා ගැනීම සම්පූර්ණයෙන්ම නවත්වපු, ඒ වාගේම ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයකින් ලක්ෂ දෙක බැගින් රාජ්‍ය සේවකයෝ ගෙදර යවන්න කථා කරපු, රාජ්‍ය සේවකයාට තිබෙන ප්‍රධාන අයිතිවාසිකම වන විශ්‍රාම වැටුප මේ ගරු සභාවේ දී අහෝසි කරපු එක්සත් ජාතික පක්ෂයට හඬා වැටෙන්න අවශ්‍යතාවක් නැහැ. අපේ අතුරු සම්මත ගිණුම තුළ තිබෙන මුදල් කළමනාකරණය කිරීම තුළින්, අතිගරු ජනාධිපතිතුමා වැඩ කරන ජනතාවට ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කළ පරිදි අවශ්‍ය වැටුප් වැඩි වීම කරන්න අපි සූදානමින් ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ අතුරු සම්මත ගිණුම තුළ තිබෙන බව මම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ඒ වාගේම උපාධිධාරින්ට රැකියා ලබා දීම ගැන එතුමන්ලා බොහොම ශෝකයෙන් කථා කළා. උපාධිධාරින් 10,000කට රැකියා ලබා දෙනවා කියලා 2006 දී කරපු ප්‍රකාශයක් ගැන එතුමා කිව්වා. අපි 2005 දී උපාධිධාරින් 48,000කට රැකියා ලබා දුන්නා. ඉන් පසුව මේ වන විට රැකියා ලබා දී තිබෙන මුළු ප්‍රමාණය බැලුවොත් මේ රජය යටතේ අඩුම ගණනේ උපාධිධාරින් 65,000කටවත් රජයේ රැකියා සෘජුව ලබා දී තිබෙනවා. එහෙම නම් ඒ 48,000 ලබා දුන්නාට පස්සේ අඩුම ගණනේ 10,000කට, 15,000කට වැඩි ප්‍රමාණයක් උපාධිධාරින්ට අපි රැකියා ලබා දී තිබෙනවාය කියන එක මා වගකීමෙන් කියනවා. ඒ වාගේම 2010 දී රැකියා ලබා දීම සඳහා මේ වන විටත් උපාධිධාරින්ගේ සංගණනයක් ගන්නවා. එක පැත්තකින් රජයේ පුරප්පාඩු, අනෙක් පැත්තෙන් ඉතා විශේෂිත උපාධිධාරින් සඳහා තිබෙන ඇබෑර්තු ප්‍රමාණයත්, රැකියා විරහිත උපාධිධාරින් ප්‍රමාණයත් ගැන සංගණනයක් ගන්නවා. ඒ අනුව අපි සුවිශේෂී වැඩ පිළිවෙළක් හදන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිතරම පරිපූරක ඇස්තමේන්තු ගේනවා කියලා චෝදනාත්මක ස්වරූපයෙන් කථා කළා. පරිපූරක ඇස්තමේන්තුවක් ගේන්න සිදු වන්නේ විශේෂයෙන්ම අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේ දී

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

බලාපොරොත්තු නොවූ වියදමක් දරා ගැනීමට සිදු වූ විටයි. ඔබතුමා දන්නවා පසු ගිය වර්ෂය කියන්නේ ලෝකයේ විශාල ආර්ථික අවපාතයක් තිබුණු වර්ෂයක් බව. දැවැන්තම ත්‍රස්තවාදී සංවිධානය පරාජය කරපු තීරණාත්මක වර්ෂයක්. තෙල් මිල අහස උසට ගිය වර්ෂය. එවැනි වර්ෂයක රජය විසින් කලින් කරන ලද සමහර ඇස්තමේන්තු -වියදම් පැත්තෙන් වෙන්න පුළුවන්, ආදායම් පැත්තෙන් වෙන්න පුළුවන්- වෙනස් වන්න තිබෙන ඉඩ ඉතාමත් වැඩියි. එවැනි අවස්ථාවක වියදම් සඳහා නව අවසරයක් ගැනීම තමයි පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම මගින් කරන්නේ. ඒ වාගේ අභියෝගාත්මක අවිනිශ්චිත වර්ෂයක පරිපූරක ඇස්තමේන්තු ගැනීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, හිටපු ඇමතිවරයකු හැටියට එතුමා චෝදනාවට ලක් කිරීම පිළිබඳව මා කනගාටු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම අපට නිතර නිතර පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න සිදු වෙලා තිබෙන එක් කාරණාවක් තමයි, අවිනිශ්චිත ගිණුමෙන් කරන වියදම් මාස දෙකෙන් දෙකට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා පහු ගිය දා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විශේෂයෙන් නියමයක් කිරීම. එතකොට ඇමතිවරයකුට වන්න පුළුවන්, වෙන ආයතනයකට වන්න පුළුවන් වාහනයක් මිල දී ගැනීමට ඒ මුදල් යෙදුවත් අපි ඒක මාස දෙකකට සැරයක් මෙතැනට ඉදිරිපත් කරනවා. අන්න ඒ ගණන් හදා ගෙන පරිපූරක ඇස්තමේන්තු හතළිස් ගණනක් ගෙනාවාය කියලා මහා සටන් පාඨයක් මවා ගන්න, එක්කෝ දැනුවත්ව, එහෙම නැත්නම් නොදැනුවත්කම නිසා විපක්ෂය කටයුතු කිරීම ගැන මම කනගාටු වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම "ආර්ථිකය කඩා වැටිලා" කියන පහසු වචන විපක්ෂය හැම විටකම ප්‍රකාශ කරනවා. නමුත් අප මේ කථා කරන ආර්ථිකය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආර්ථිකයත් නොවෙයි; මේ ආණ්ඩුවේ ආර්ථිකයත් නොවෙයි; මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආර්ථිකයත් නොවෙයි. එය මේ රටේ ආර්ථිකය. ඒ නිසා කරුණාකර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට මේ "කඩා වැටීම" කියන වචනය වග කීමෙන් ප්‍රකාශ කරනවා නම් හොඳයි. මොකද අප පහු කළේ මහා විශාල යුද්ධයක් පැවතුණු යුගයක්. අවුරුදු 30ක් තිස්සේ තිබුණු යුද්ධය අපි නිමා කළා. ඒක කියනවාට සමහරු එච්චර ආසා නැහැ, පුනපුනා කියනවා කියලා. ඒක පුනපුනා කියන්න අවශ්‍යයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක කිසි කෙනකු බලාපොරොත්තු නොවුණු සුවිශේෂී ජයග්‍රහණයක්. ඒ වාගේම ඒ වකවානුවේ තමයි තෙල් බැරල් එක ලෝකයේ වාර්තාගත ඉහළම මිලට ගියේ. තෙල් කඳුළක් හෝ උපදවපු නැති රටක් හැටියට එහි සෘජු බලපෑම අපි විඳ ගත්තා.

ඒ වාගේමයි ලෝක ආර්ථික අවපාතය. අවුරුදු සියයකට වතාවක් ඇති වේ යැයි කියන ලෝක ආර්ථික අවපාතයට අපි මුහුණ දුන්නා. මුහුණ දුන්නා කියලා අපි නිකම් හිටියා නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රුපියල් බිලියන 16ක සුවිශේෂී කුඩා අය වැය ලේඛනයක් අතිගරු ජනාධිපතිතුමා තමන්ගේ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා අපහසුවට පත් වූ කණ්ඩායම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළා. තේ ගොවියා වන්න පුළුවන්, රබර් ගොවියා වන්න පුළුවන්, ඇඟලුම් කම්හල් හිමියා වන්න පුළුවන්, සංචාරක ව්‍යාපාර හිමියා වන්න පුළුවන් ඒ හැම දෙනා වෙනුවෙන්ම සුවිශේෂී වැඩ පිළිවෙළක් යොදපු නිසා තමයි මේ අවපාතය ලංකාවට දැනීමේ ප්‍රමාණය විශේෂ මට්ටමක රඳවා ගන්න, එහෙම නැත්නම් අඩු කරන්න අපට පුළුවන්කම ලැබුණේ කියන එකත් මා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ විශේෂ බාධක - යුද්ධය, තෙල් මිල, ලෝක ආර්ථික අවපාතය- සියල්ලම එක වර දැනුණු වර්ෂයක් තුළ ඇති වුණ ප්‍රතිඵලය බලමු. මා මෙය කියන්න හදන්නේ මේ ආර්ථිකය කඩා වැටුණාය කියලා චෝදනා කරන, හඬා වැටෙන කණ්ඩායමටයි. අපේ සේවා වියුක්තිය අද සියයට 5යි. රැකියා නැහැ කියා කෑ ගහනවා, මෙතුමන්ලා. 1994 වෙද්දී සියයට 14ක තිබුණු සේවා වියුක්තිය, නැත්නම් ශ්‍රම බලකායෙන් රැකියා නැති ප්‍රමාණය, යුද්ධයක් කරපු රටක වුණත් අපි සියයට 5කට ගෙනැල්ලා තිබෙනවා. ලෝකයේ බොහෝ දියුණු රටවල ආර්ථික වර්ධන වේගය ඍණ පැත්තට යද්දී සියයට 3කට වැඩි ආර්ථික වර්ධන වේගයක් මේ වර්ෂය තුළත් පවත්වා ගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මේ වර්ෂයේ ඉදිරි මාස දෙක වන කොට ඒ ප්‍රමාණය තවත් ඉහළට යාවි කියලා අපි බලාපොරොත්තු වනවා.

අපේ විදේශ සම්පත් ප්‍රමාණය ගන්න. අපි පසු ගිය වකවානුවේ තීරණාත්මක අවධිවලට ආවා විවිධ හේතු නිසා. අද විදේශ සම්පත් ප්‍රමාණය ඩොලර් බිලියන 4 ඉක්මවා යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රාජ්‍ය ණය ප්‍රමාණය ගැන හැම දාම හඬා වැටෙනවා. අපි ආණ්ඩුව භාර ගන්න කොට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 105ක් වෙච්ච ණය ප්‍රමාණය අද සියයට 80ට ගෙනෙන්න කටයුතු කර තිබෙනවා. රජයක වගකීම් සියල්ල, එනම් ආරක්ෂාව, සුභ සාධනය, සංවර්ධනය කියන සියල්ල ඉෂ්ට කරමින් ඒ ණය ප්‍රමාණය සියයට 80ක සීමාවට ගෙනෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම බැංකු පොලිය අඩු කිරීම ගැන අද මෙතුමන්ලා අනෙක් පැත්තට කථා කරනවා. මේක අවශ්‍ය නැහැ, මේක නිසා බැංකු කඩා වැටේවි, මේක නිසා ඉතිරි කරන්නන්ට ප්‍රශ්නයක් වනවා කියනවා. හැබැයි මේ සභාවට සාක්ෂි දෙන්න පුළුවන් නම්, මේ සෙංකෝලයට සාක්ෂි දෙන්න පුළුවන් නම් කියාවි මේ පවතින පොලී අනුපාතය මත කොහොමද ආයෝජකයන් කටයුතු කරන්නේ, කොහොමද ව්‍යාපාරිකයන් කටයුතු කරන්නේ, කොහොමද ගමේ ඉන්න ස්වයං රැකියාලාභියා කටයුතු කරන්නේ කියලා මෙතුමන්ලා මේ වර්ෂය තුළ කී වතාවක් මගෙන් ඇහුවාද කියලා. මෙතුමන්ලා එහෙම ඇහුවා. එදා එහෙම ඇහුවේ කුමන වුවමනාවකින්ද? ඒක අවංක වුමනාවට ඇහුවාද, නැත්නම් දේශපාලනික කරුණක් මත පමණක් එහෙම ඇහුවාද කියන සැකය මට ඇති වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් අපි පොලිය අඩු කළා, ජනාධිපතිතුමා මැදිහත් වෙලා දුන්නු නියෝගයක් අනුව. රටක උද්ධමන වේගය සහ පොලී අනුපාතය අතර යම් කිසි එකඟතාවක් තිබෙන්න ඕනෑ කියලා ආර්ථික විද්‍යාව අනුව අපි විශ්වාස කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් තවත් විනාඩියක් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මේ රටේ ඉදිරි ගමනට අත්‍යවශ්‍ය මූල්‍ය පද්ධතියේ සරලභාවය, පහසුභාවය මේ රටේ ජනතාවට ලබා දීමේ අරමුණින් බැංකු පොලී ප්‍රමාණය අඩු කරන්න අපි තීරණය කළා. හැබැයි කිසි සේත්ම එය බැංකු කඩා වැටීමකට හේතු වන්නේ නැහැ. මේ නිසා බැංකුවලින් ණය දෙන ප්‍රමාණය වැඩි වනවා. අය වීම් ප්‍රමාණය වැඩි වනවා. රටේ ආර්ථිකයේ ඇති වන පුළුල්භාවයේ අවසාන ප්‍රතිඵලය ලැබෙන්නේත් රටේ බැංකු ක්‍රමයට. ඒ නිසා ඔබතුමන්ලා කිසිම බියක් තියා ගන්න එපා. ඒ වාගේම රාජ්‍ය බැංකු ඉතා පැහැදිලිව කියා තිබුණා ඉතිරි කිරීමේ ගිණුම් සඳහා දීලා තිබෙන පොලිය අඩු කරන්නේ නැහැ කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමා මට නියමිත වෙලාව ඉවරයි. ඒ නිසා මට කතාව අවසන් කරන්න දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, point of Order එකක් ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ කථාවේදී ඉතාම පැහැදිලිව කිව්වා, ජනවාරි මාසයේ සිට රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි වීම පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරනවා කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔව්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් ඔබතුමාගේ කතාව අවසන් වන්න යන්නේ. නමුත් ඔබතුමා තවම පැහැදිලිව ඒ ගැන ප්‍රකාශ කළේ නැහැ. ඔබතුමා කතාව අතර මැදදී කිව්වා ඒ ගැන කියනවා කියා. ඒ පැහැදිලි ප්‍රකාශය කරන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මේක අහන්න කෝ ඉතින්. ඊයේ අපි ඉදිරිපත් කරපු පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ 11 වැනි පිටුව බලන්න. එහි ශීර්ෂ 240, සංවර්ධන වැඩසටහන යටතේ පුනරාවර්තන වියදමට රුපියල් බිලියන 7කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා. අපට ඒවා යොදා ගන්න පුළුවන් කිසි ප්‍රශ්නයක් නැතිව. දැන් ඔබතුමන්ලා මේවාට විරුද්ධ වන්නේත් නැහැ නේ. ඒ වාගේම මේ වැඩසටහනේ තිබෙන වියදම් අපට යම් කිසි ආකාරයෙන් කළමනාකරණයක් කරන්න පුළුවන්. මාස හතරකටයි අපි මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ මාස හතරට වෙන් කරපු මුදලින් ඉතිරි වන මුදල යොදා ගන්නත් පුළුවන්. ඒ නිසා කිසිම ගැටලුවක් නැතිව අපට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වීමකට යන්න පුළුවන්කම තිබෙනවා. ඔබතුමන්ලාත් ඒකට සහයෝගය දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලාත් හැම දාම මේවා නේ ඉල්ලුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද චින්තනයත් එක්ක අපි මේ රටේ, ජාතියේ සුවිශේෂී ගමනක් යන්න සූදානම්. නැවත පත් වන්නේත් එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයක් කියලා විපක්ෂයත් පුන පුනා පිළිගන්නවා. ඒ ගැන මා නැවත වතාවක් ස්තුතිවන්ත වනවා. දිගටම බලයේ ඉන්නේත් එක්සත් ජනතා නිදහස් සන්ධානය. එහෙම නම් කිසි ගැටලුවක් නැහැ. මට එක කනගාටුවක් තිබෙනවා, ඊ ළඟ පාර්ලිමේන්තුව පත් වන කොට අද මේ අපිත් එක්ක ගැටෙන, අපිත් එක්ක තර්ක කරන අපේ හිතවත් මිත්‍රයන්ගෙන් කී දෙනෙක් මේ පාර්ලිමේන්තුවට ඒවිද කියලා. ඒ පිළිබඳව පොඩි ශෝකයකුත් ඇතිව මගේ කතාව නිමා කරනවා. ස්තුතියි.

[අ. භා. 12.09]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුම සම්බන්ධ විවාදයට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් කරුණු ඉදිරිපත් කරන්නයි මා සූදානම් වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි මා මුලින්ම කියන්න කැමැතියි, මේ විවාදයේදී අය වැය විවාදයකදී කරන්නා වූ ප්‍රතිපත්තිමය කරුණු ගැනවත්, ආර්ථික උපාය මාර්ග ගැනවත් සාකච්ඡා කරලා තේරුමක් නැති බව. මොකද, ආණ්ඩුවෙන් එහෙම ඉදිරි දර්ශනයක් ඇතිව අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා නැති නිසා. ආණ්ඩුව ඉදිරිපත් කරලා තිබෙන්නේ ගණන් ඉලක්කම් ටිකක් විතරයි. ඒ නිසා රටේ ඊ ළඟ සංවර්ධන අරමුණු මොනවාද, රටේ ආර්ථික උපාය මාර්ග මොනවාද කියන එක සම්බන්ධයෙන් කිසිම අදහසක් මේ අතුරු සම්මත ගිණුම කියන කොළ තුන හතරෙන් ගන්න බැහැ. ආණ්ඩුව දැන් මේ අතුරු සම්මත ගිණුම ගැන කියන්නේ කිතුල් ගහට නැග්ග මිනිහා කියන කතාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිවරුන් ඔක්කෝම කියනවා, ජනාධිපතිවරයාත් කියනවා මේ පාර්ලිමේන්තුවට මුල්‍ය බලය දෙන්න ඕනෑ නිසා, ඊ ළඟට එන්න තිබෙන පාර්ලිමේන්තුවට, - ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමනි, ඔබතුමා විනාඩි දෙකක් ඉඳලා යන්න. මේ ප්‍රශ්නයට ඔබතුමාගෙන් උත්තරයක් ගන්න තිබෙනවා. –

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පැනලා යන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැයක් ඉදිරිපත් කරන්නේ නැත්තේ ඊ ළඟට එන්න තිබෙන පාර්ලිමේන්තුවට තමන් කැමැති අය වැයක් හදා ගන්න ඕනෑ නිසාය කියන පට්ටපල් බොරුව, තමන්වත් විශ්වාස නොකරන බොරුව දැන් පුනපුනා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා විශේෂයෙන්ම විධායක ජනාධිපති ධුරය ඇති වුණාට පස්සේ පත් වෙච්ච විධායක ජනාධිපතිවරු කවුරුවත් මේ පාර්ලිමේන්තුවට ගරු කරලා නැහැ කියා. ඒකයි ඇත්ත කතාව. මේ ජනාධිපතිවරයාත් ඇතුළුව හැම විධායක ජනාධිපතිවරයකුම පාර්ලිමේන්තුව පවත්වා ගෙන ගිහිල්ලා තිබෙන්නේ නිකම් තුට්ටු දෙකේ ආයතනයක් විධියට; තමන්ගේ ශාඛා සමිතියක් විධියට. ඒකයි ඇත්ත. ඊයේ මන්ත්‍රීවරු රාශියක් මේ අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් කතා කළා. මෙහි තිබෙන විධියට ජනාධිපතිවරයාට මාස හතරකට රුපියල් දසලක්ෂ දෙදහස් එකසිය අනුවක් වෙන් වෙද්දී, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වන අගමැතිවරයාට වෙන් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් දසලක්ෂ හැටපහයි. තිස්පස් ගුණයක් අඩුයි. පාර්ලිමේන්තුවේ ප්‍රධානියා අගමැති. එතුමා යටතේත් විවිධ ව්‍යාපෘති තිබෙනවා. නමුත් ජනාධිපතිවරයාට රුපියල් දසලක්ෂ දෙදහස් එකසිය අනුවක් මාස හතරට වෙන් වන කොට අගමැතිවරයාට වෙන් වන්නේ ඊට තිස්පස් ගුණයක් අඩුවෙන්. මේ ආණ්ඩුවේ හැම ඇමතිවරයාටම කාර් එකට පෙට්‍රල් ගහ ගන්නවා හැරෙන්න වෙනත් දෙයක් කරන්න මේ මාස හතරේදී පුළුවන්කමක් නැහැ. [බාධා කිරීමක්] මා ප්‍රශ්නය අහනවා. ඒවා ඔබතුමාගේ වෙලාවේදී පැහැදිලි කරන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ප්‍රශ්නය අහනවා. පරක්කු වන නිසා මා ප්‍රශ්නය අහන්නම්. මා අහන්න බලාපොරොත්තු වුණු ප්‍රශ්නය මේකයි. ජනාධිපතිවරයා ඊයේ කියලා තිබුණා,- [බාධා කිරීමක්] මගේ ප්‍රශ්නයට ගරු අමාත්‍යතුමා උත්තර දෙන්න. ඔබතුමාට ඕනෑ ඒවාට වෙන ඇමතිවරු ලවා උත්තර දෙන්න. මා ප්‍රශ්න කරන්නේ මේකයි. ඊයේ ජනාධිපතිවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති සාමාජිකයෝ එකතු වුණු රැස්වීමකදී කියා

තිබුණා, ලබන ජනවාරි මාසයේ පඩි වැඩි කරනවා කියා. එතැනම තිබෙනවා නේ, පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය ප්‍රතික්ෂේප කිරීමක්. අය වැයක් දමන්නේ නැතුව දැන් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරනවා. එතුමා පාර්ලිමේන්තුවේදී නොවෙයි, නිකම් රැස්වීමක් තියලා -union රැස්වීමකදී- කන්න දීලා කියනවා, ජනවාරි මාසයේ පඩි වැඩි කරනවා කියා. මෙතුමා නියෝජ්‍ය මුදල් ඇමති. මෙතුමා මොකක්ද කියන්නේ? මෙතුමා පඹයා. [බාධා කිරීමක්] රංජිත් සියඹලාපිටිය කියන පුද්ගලයා ගැන නොවෙයි මා කියන්නේ. ජනාධිපතිවරයා නිකම් union රැස්වීමකදී තමයි අය වැය තීරණ දැනුම් දෙන්නේ. නියෝජ්‍ය මුදල් ඇමතිවරයා මොකක්ද කියන්නේ? එතුමාට මොකක්වත් කියන්න බැහැ. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. රජයේ සේවකයන්ට පඩි වැඩි කරනවා කියලා කියනවා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොපමණකින් වැඩි කරනවාද කියන්න ඕනෑ. එතුමා මාරු වුණා. ඇයි මාරු වන්නේ? ප්‍රශ්න අහන විට එතුමා මාරු වනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පඩි වැඩි කරනවා නම් කියන්න ඕනෑ, කොපමණ ප්‍රමාණයකින් පඩි වැඩි කරනවාද, රුපියල් 100කින්ද, රුපියල් 1,000කින්ද, රුපියල් 5,000කින්ද කියා. ඊ ළඟට කියන්න ඕනෑ, කොතැනින්ද ඒකට මුදල් වෙන් වන්නේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා මීට සතියකට කලින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විශාල වැඩ වර්ජනයක් ක්‍රියාත්මක වුණ බව. ඒක සංකේතාත්මක වැඩ වර්ජනයක්. පඩි ප්‍රශ්නය සම්බන්ධ කර ගෙන ඒක ක්‍රියාත්මක වුණා. ජනාධිපතිවරයා කියනවා පඩි වැඩි වනවා කියා. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, වරාය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය කියන මේ ප්‍රධාන ආයතන හතර සංස්ථා ගණයට තමයි අයත්ව තිබෙන්නේ. එතකොට මේවායේ සේවකයන්ගේ පඩි වැඩි වනවාද? කොපමණ ප්‍රමාණයකින් පඩි වැඩි වනවාද? පඩි වැඩි කරන්න තිබෙන මූලාශ්‍රය මොකක්ද? රජයේ සේවකයන්ටත් පඩි වැඩි කරනවාය කිව්වා. රැකියා විරහිත උපාධිධාරීන්ට රක්ෂා දෙනවා කිව්වා. ඒවාටත් සල්ලි වෙන් කරනවා කිව්වා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිය වතාවේ ජනාධිපතිවරයා මුදල් ඇමති වශයෙන් මෙතැනට ඇවිත් අය වැය කථාවේදී කියපු දේවල්වත්, අය වැය ලේඛනයෙන් වෙන් කරපු මුදල්වත් අඩු ගණනේ ඒ ක්ෂේත්‍රවලට වෙන් කළේ නැහැ. ඒවා ලබා දුන්නේ නැහැ. ඇත්ත කථාව ඒකයි. පරිපූරක දම දමා ගියා. වැඩිපුර පරිපූරක දැම්මේ බැරි වෙච්ච ඒවා දෙන්න නොවෙයි, ජනාධිපතිවරයාට තිබෙන වෙනත් වෙනත් ව්‍යාපෘති සඳහා මුදල් ලබා ගන්න. ඒ නිසා තමයි අපේ මන්ත්‍රීවරු දැන් ප්‍රශ්න අහලා තිබෙන්නේ එක එක අමාත්‍යාංශවලට අය වැයෙන් කොච්චර වෙන් කළාද, තමන්ට කොච්චර ලැබිලා තිබෙනවාද කියා. ඒක හැම ඇමතිවරයෙක්ම දන්නවා. අඩු ගණනේ මේ ඇමතිවරුන්ට ආණ්ඩුවේ නීති අනුව ලැබෙන්න තිබුණු සෙස් බද්ද හම්බ වුණේ නැහැ. අපනයන සංවර්ධන මණ්ඩලයේ ඇත්ත කථාව ඒකයි. ඒකට ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා සාක්ෂියි. අපනයන සංවර්ධන මණ්ඩලයට පනත අනුව ලැබිය යුතු, නීතිය අනුව ලැබිය යුතු සෙස් බද්ද ලැබෙන්නේ නැහැ, කර්මාන්තකරුවන්ට අවශ්‍ය සහනය දෙන්න. මේ පාර්ලිමේන්තුවට ජනාධිපතිවරයාම ඇවිත් විසර්ජන පනතෙන් අනුමත කළ දේවල්, නීත්‍යනුකූලව කළ දේවල්වත් පසු ගිය අය වැයෙන් දීලා නැහැ.

එහෙම නම් මහින්ද රාජපක්ෂ මහත්මයා වෘත්තිය සමිති රැස්වීමකදී පඩි වැඩි කරන්නේ කොහොමද? කොහෙන්ද පඩි වැඩි කරන්නේ? මැදමුලනෙන් ගෙනෙල්ලාද? මේ ආණ්ඩුව කියනවා, මේ පාර්ලිමේන්තුවට මූල්‍ය බලය දීමේ අවශ්‍යතාව නිසා තමයි අය වැයක් ගෙනෙන්නේ නැත්තේ කියා; ඊ ළඟට එන්න තිබෙන පාර්ලිමේන්තුවට ඒක තීන්දු කරන්න ඕනෑ නිසාත් කියා.

නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයා රටෙන් ආපු විවේචනයට මුහුණ දෙන්න බැරිව, ඊයේ වෘත්තිය සමිති රැස්වීමේදී නිකම් පදික වේදිකාවේ කථාවලින් පඩි වැඩි කරන්න කථා කරන්නේ ඒකයි. ආණ්ඩුවේ අතුරු සම්මත ගිණුමක් ක්‍රියාත්මක වන වෙලාවක් මේ. ඒක අතුරු සම්මත ගිණුමට දමන්න තිබුණා නේ. අතුරු සම්මත ගිණුමට ඒක දමන්නේ නැතුව, union රැස්වීමකදී මිනිස්සු මේක ප්‍රශ්න කළාට පසුව, මේක වෘත්තිය සමිති නායකයෝ ප්‍රශ්න කළාට පසුව, මන්ත්‍රීවරු ප්‍රශ්න කළාට පසුව, මේ ගැන නිකම් තැන් තැන්වලදී කියන්නේ ඇයි? එහෙම නම් ඉතා පැහැදිලියි, පාර්ලිමේන්තුවට මූල්‍ය බලය ලබා දීමේ අරමුණක් මේ අතුරු සම්මත ගිණුමේ කොහෙත්ම නැහැයි කියලා.

මා තව කාරණාවක් කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මීට අවුරුදු දෙක තුනකට කලින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර මහත්මයා සම්බන්ධ වෙලා කරපු ගනුදෙනුවක් ගැන ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දුන්නා, පී.බී. ජයසුන්දර මහත්මයා පාර්ලිමේන්තුවට තිබෙන මූල්‍ය බලය ඉක්මවා ඔහුගේම වුණු වෙනම අය වැයක් පවත්වා ගෙන ගියාය කියලා. ඒක උසාවි නඩු තීන්දුවේ තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරතුමා ප්‍රශ්න කළා, අය වැයෙන් වෙන් කරපු නැති, අය වැයෙන් නීත්‍යනුකූලව ඔහුට ලබා නොදුන්නු රුපියල් මිලියන දෙදහස් ගණනක් ඔහු හසුරුවා තිබීම සම්බන්ධයෙන්. ඒ අනුව තමයි ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දුන්නේ, පාර්ලිමේන්තුවේ මූල්‍ය බලයත් ඉක්මවා ගිහින්, ඒවා නොසලකා කටයුතු කරපු, වංචනික ගනුදෙනුවකට හවුල් වුණු ඒ පුද්ගලයාව රාජ්‍ය සේවයෙන් අයින් කරන්න ඕනෑය කියලා. නමුත් ඔබතුමා දන්නවා, ලංකා ඉතිහාසයේ අරුම පුදුම දෙයක් වුණාය කියලා. එක පුද්ගලයකු වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු හත් දෙනෙක් වාඩි වෙලා නියෝගයක් දුන්නා. පී.බී. ජයසුන්දර, තමන්ගේ වැරැද්ද පිළිගත් පුද්ගලයා නැවත එතැනදී නිවැරැදිකාරයා වෙලා -

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)

උසාවිය තීරණයක් දීලා තිබෙනවා, ඒ තීරණය වැරැදි බවට. ඒ නිසා ඔබතුමාට ඒක ගැන පුද්ගලයකුට විරුද්ධව ප්‍රකාශ කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ඉස්සෙල්ලාම මම දැන ගන්න කැමැතියි, එතුමාගේ මයික් එක "ඔන්" වන්නේ කොහොමද කියලා.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)

උසාවියකින් තීරණයක් දුන්නාම ඒ තීරණය -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

මට මගේ අවස්ථාව දෙන්න, ගරු ඇමතිතුමා. ඇමතිතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මේකයි. දැන් මේ පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය කඩපු පුද්ගලයාට තමයි ජනාධිපතිවරයා නැවත වතාවක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් තනතුර දෙන්නේ. උසාවිය නියෝගය දුන්නත්, උසාවි නියෝග ක්‍රියාත්මක කරන්න ජනාධිපතිවරයා බැඳිලා නැහැයි කියලා එතුමාම කිව්වා. පෙට්‍රල් මිල අඩු කරන්න කියපු වෙලාවේ මිල අඩු කළේ නැහැ නේ. අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කරන්නේ උසාවියෙන් නොවෙයි; ජනාධිපතිවරයායි. ඉතින් ජනාධිපතිතුමාට තිබුණා නේ, මූල්‍ය බලය ඉක්මවා වැඩ කරපු පුද්ගලයාව මුදල් ලේකම් තනතුරට පත් නොකර ඉන්න.

**ගරු දි. මු. ජයරත්න මහතා**

(மாண்புமிகு டீ. எம். ஜயரத்ன)

(The Hon. D. M. Jayaratne)

ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා. ඒ අනුවයි පත් කළේ.

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Ratnayake)

ගරු ඇමතිතුමා, ඔබතුමාට අගමැතිකම ලැබෙනවා, ස්ථිරයි. ඒ නිසා කරුණාකරලා -

**ගරු දි. මු. ජයරත්න මහතා**

(மாண்புமிகு டீ. எம். ஜயரத்ன)

(The Hon. D. M. Jayaratne)

නැහැ. නැහැ. [බාධා කිරීමක්] මේ අවස්ථාවේදී කථා කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Ratnayake)

ඒක ඔබතුමාගේ අවස්ථාවේදී කරන්න, මගේ අවස්ථාව මට දීලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මට බාධා කරන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා එතුමාට උපදෙස් දෙන්න. මට බාධා කරන්න එපා. මා එතුමා ගැන කිව්වේ නැහැ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟ පාර්ලිමේන්තුවට අය වැයක් සම්මත කර ගන්න තිබෙන අයිතිය වෙනුවෙන් තමයි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන්නේ කියන එක පට්ටපල් අසත්‍යයක් කියලායි මම කියන්නේ. ඒක කිතුල් ගහට නැග්ග මිනිහා කියන කථාව වාගෙයි. හෙට අතුරු සම්මත ගිණුමේ ඡන්දය ගන්නවා. අපි ජනාධිපතිතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි, අපි අභියෝග කරනවා, කොතැනින්ද, කොහොමද, කොපමණ ප්‍රමාණයකින්ද, කාටද පඩි වැඩි කරන්නේ කියන එක ඊට කලින් වග කීමෙන් කියන්න කියලා, නිකම් union සාකච්ඡාවකදී නොවෙයි; නිකම් පදික වේදිකාවල කථාවලින් ජනතාව මුළා කරන්න ආණ්ඩුවේ පත්‍ර සහ රූපවාහිනිය පාවිච්චි කරන්නේ නැතුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ආර්ථිකය සම්බන්ධව පසු ගිය කාලයේ කියපු කථා ඔක්කොම අද අසත්‍ය බවට පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කථා කරන්න මා වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වන්නේ නැති නිසා කාරණාවක්, දෙකක් ගැන විතරක් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඔබතුමා දන්නවා, දැන් මෙතැනින් ගිය ගරු රංජිත් සියඹලාපිටිය මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිවරයා මීට සති දෙකකට, සති තුනකට කලින් ලංකාවේ කොටස් වෙළෙඳ පොළ ගැන මේ පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් කළ බව. ලංකාවේ කොටස් වෙළෙඳ පොළ ලෝකයේ වටිනාම, වේගයෙන්ම සංවර්ධනය වන, ලෝකයේ අංක එකේ කොටස් වෙළෙඳ පොළ කියලා එතුමා ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙනවා, ලංකාවේ කොටස් වෙළෙඳ පොළ සති පතා නිකුත් කරන "Weekly Market Review" කියන වාර්තාව. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වාර්තාවට අනුව දැන් ලෝකයේ වැඩිම වේගයෙන් කඩා වැටෙන කොටස් වෙළෙඳ පොළ බවට ලංකාවේ කොටස් වෙළෙඳ පොළ පත් වෙලා තිබෙනවා. මා මේ ඉලක්කම් කියන්න යන්නේ නැහැ. ඔක්කොම සෘණ වෙලා තිබෙනවා. දැන් ඔබතුමා දන්නවා, මේ සෘණ වෙන්න බලපෑ කාරණා කීපයක් තිබෙන බව. වැඩිම බලපෑමක් සහිත ප්‍රධාන කාරණයක් බවට පත් වුණේ, එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධයි කියන පුද්ගලයෙක් ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ විවිධ ආයතනවල මුදල් ආයෝජනය කර තිබීමයි. ඔබතුමා දන්නවා සුනාමියෙන් පස්සේ මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය Financial Intelligence Unit කියලා ඒකකයක් පිහිටවපු බව. ඒ කියන්නේ මූල්‍ය බුද්ධි අංශයක්. අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා සභාපතිත්වය දරන රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිත්වය හා බලපෑම පිළිබඳ කරුණු විමර්ශනය කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේදීත් අපි මේ මූල්‍ය බුද්ධි අංශය ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන තොරතුරු සහ කරුණුත් පෙන්වා දීලා ලංකාවට එන විදේශ ආයෝජන පිළිබඳව සොයා බැලීමේ වැදගත්කම, අවශ්‍යතාව අප පැත්තෙනුත් අවධාරණය කළා. ඒ ඒකකයේ වග කීමත් ඒකයි. දැන් අපි අහන්න කැමැතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රාජ් රාජරත්නම් කියන පුද්ගලයා ලංකාවේ ප්‍රධාන සමාගම් රාශියක මේ මුදල් ආයෝජනය කරන කොට -ඔහුගේ නමින් ආයෝජනය කරන්නේ, ඔහුගේ සමාගමින් ආයෝජනය කරන්නේ- මේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශය මොකද කළේ කියන එක. මේ ආණ්ඩුවේ මූල්‍ය බුද්ධි අංශය මොකක්ද කළේ? ඔහු මේ එක සමාගමක දෙකක එක කොටස ගණනේ ගත්ත පුද්ගලයෙක් නොවෙයි. ඔහු ලංකාවේ ප්‍රධාන සමාගම් රාශියක විශාල වශයෙන් කොටස් මිලදී ගත්ත පුද්ගලයෙක්. එතකොට කොටින්ගේ සල්ලිවලින් නේ මේ ගොල්ලෝ ලංකාවේ කොටස් වෙළෙඳ පොළ ඉහළම කොටස් වෙළෙඳ පොළක් බවට පත් කර ගෙන තිබෙන්නේ. කොටින්ගේ සල්ලිවලින් ඉහළම වෙළෙඳ පොළ බවට පත් කර ගෙන, ඒකට මෙතැන හුරේ දමලා, ඒක හෙළිදරව් වුණාට පස්සේ දැන් ඇටිකෙහෙල් කාපු උගුඩුවාගේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මෙන්න, කොටස් වෙළෙඳ පොළේ වාර්තාව සාක්ෂියි, ඔක්කොම සෘණ වෙලා තිබෙන්නේ. කොටස් වෙළෙඳ පොළ අගයන් ඔක්කොම සෘණ අගයන්ට වැටිලායි තිබෙන්නේ. ඒ නිසා යුද්ධයෙන් පසුව ලංකාවට එන විදේශ ආයෝජකයන් යම් කිසි ප්‍රමාණයකට බැලුවා නම් ඔවුන්ට ලංකාවේ ආයෝජනය කිරීමට තත්ත්වයක් ඇති වුණා. ඒ ඇති වුණු තත්ත්වය දැන් නැවත වතාවක් මොකද වෙලා තිබෙන්නේ? කෙටි කාලීනව හරි බිඳ වැටිලා තිබෙනවා, ආණ්ඩුවේ ඔය කියන මුදල් අමාත්‍යාංශය යටතේ - ජනාධිපතිවරයා යටතේ තිබෙන මුදල් අමාත්‍යාංශය හරහා- ඒ කටයුත්ත සිදු නොවීම නිසා. කළු සල්ලිවලින්, කොටි සල්ලිවලින් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොටස් වෙළෙඳ පොළ පසු ගිය කාලයේ කෘත්‍රිමව උඩ ගියේ. ඒ නිසා මම කියන්න කැමැතියි, මූල්‍ය බුද්ධි අංශයේ වගකීම ඉෂ්ට නොකර කොටින්ගේ සල්ලිවලට මෙහේ දමන්න දීලා ඒවායින් ලෝකයේ ඉහළම කොටස් වෙළෙඳ පොළ හදා ගෙන අද ඒක අසාර්ථක වෙලා තිබීමේ වගකීම මුදල් ඇමතිවරයා වශයෙන් ජනාධිපතිවරයාත්, ඒ වාගේම එතුමාගේ යටතේ ඉන්න සියඹලාපිටිය මහත්තයා, අමුණුගම ඇමතිතුමා වාගේ අය භාර ගන්න ඕනෑ බව. මුදල් ලේකම්වරයා භාර ගන්න ඕනෑ. මහබැංකු අධිපතිවරයාත් භාර ගන්න ඕනෑ. අද ලංකාවේ කොටස් ආයෝජකයන් පමණක් නොවෙයි, මේ කොටස් මිලදී අර ගෙන ඉන්න ලංකාවේ මැද පාන්තික සහ ඉහළ පාන්තික පවුල්වල ආයෝජකයන් විශාල දුෂ්කරතාවන්ට පත් වෙලා තිබෙනවා. මොකද, මේ කොටි සල්ලිවලට ආයෝජනය කරන්න දීලා ඒවායින් තමන්ගේ කොටස් මිල ඉහළ දමා ගන්න ගිහින් දැන් බිම වැටිලා ඉන්න නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ආණ්ඩුව කියනවා මුදල් සංචිත ගැන. ඒ ගැන කියන්න මම ලොකු වෙලාවක් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි කියන්න කැමැතියි මේ මුදල් සංචිත කථාවේත් ඇත්ත අගය. ඇත්ත අගය ආණ්ඩුව ඉලක්කම් විජ්ජාවකින් ඩොලර් බිලියන හතරක් පෙන්වනවා මිසක් සත්‍ය වශයෙන් ඩොලර් බිලියන හතරක සංචිත තිබෙනවාද කියන එකේ ගැටලුව ආණ්ඩුවම පළ කරන විවිධ වාර්තා අනුව පෙනෙන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේදී මම කල්පනා කළා මේ මුදල් සම්බන්ධ මාතෘකාව ගැන කථා කරන ගමන්ම රටේ දේශපාලන වශයෙන් වැදගත් වන මේ අතුරු සම්මත ගිණුම්වලටත් බලපා තිබෙන එක කාරණයක් ගැන කියන්න. අද ඔබතුමා දන්නවා මේ පාර්ලිමේන්තුවට මූල්‍ය බලය තිබෙනවා කියලා කිව්වාට සත්‍ය වශයෙන් පාර්ලිමේන්තුව රූකඩයක් වෙලායි තිබෙන්නේ කියා. අද පාර්ලිමේන්තු බලය රූකඩයක් බවට පත් වෙලා තිබෙනවා විධායක ජනාධිපති ධුරයත් එක්ක. පසු ගිය අවුරුදු 32 තුළම ඒ තත්ත්වයට තමයි පාර්ලිමේන්තුව පත් වෙලා තිබෙන්නේ. අද මේ අය වැයක් ගේන්නේ නැති එක වුණත් බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා රංජිත් සියඹලාපිටිය ඇමතිවරයා පාර්ලිමේන්තුවට එන යන

[ගරු බිමල් රත්නායක මහතා]

කෙනෙක් බව. එතුමා මෙතැන මන්ත්‍රීවරු ප්‍රශ්න කළ වෙලාවේදී කිව්වා, "අපි අය වැයක් ගේනවා" කියලා. එතුමා කිව්වා නේ, "සෙංකෝලයට සාක්කි දෙන්න පුළුවන් නම් සාක්කි දෙයි" කියලා. සෙංකෝලය කථා කළොත් කියන්න වන්නේ, "අය වැයක් ගේනවා කියලා රංජිත් සියඹලාපිටිය මහත්තයා කිව්වා" කියන එක තමයි. නමුත් නියෝජ්‍ය මුදල් ඇමතිතුමාවත් දන්නේ නැහැ, ඊට සතියකට පස්සේ, දවස් කීපයකට පස්සේ ආණ්ඩුවම කියනවා, "අපි අතුරු සම්මත ගිණුමක් ගේනවා" කියලා. ඒකෙන් හරි පැහැදිලියි. පාර්ලිමේන්තු ඡන්දය අප්‍රේල් මාසයේ තියන බව -ඊට කලින් ඡන්දයක් තිබිය යුතු බව- අපි කවුරුත් දන්නවා. ඒක අමුතු දෙයක් නොවෙයි. එහෙම නම් නියෝජ්‍ය මුදල් ඇමතිවරයා, මුදල් අමාත්‍යාංශය ලෑස්ති වුණා සාම්ප්‍රදායික විධියට අය වැයක් ගේන්න. ඒකට ලිපි ලේඛන සකස් කළා; චක්‍රලේඛ ගැහුවා. නිලධාරින්ට කිව්වා, ඒ විධියට වාර්තා හදන්නය කියා. හැබැයි හදිසියේ, ආණ්ඩුව මුහුණ දී තිබෙන දේශපාලන අර්බුද නිසා මොකද වුණේ? ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණයක් අර ගෙන හිර වෙලා තිබෙනවා. අද ආණ්ඩුව දෛනික මුදල් ප්‍රවාහය - cash flow එක - පවත්වා ගැනීම පිළිබඳ බරපතළ ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. අද ආණ්ඩුවට තමන්, නීත්‍යානුකූලව වෙච්ච පොරොන්දු - commitments - එකක්වත් ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අද ආණ්ඩුවට මතක් වනවා, අය වැයක් ගෙනෙන්න බැහැ, ඒ නිසා දැන් උපක්‍රමික ක්‍රියාවකට යන්න ඕනෑය කියා. එහෙම නම් මොකක්ද වෙන්නේ? ඒ උපක්‍රමික ක්‍රියාව ආර්ථිකමය අවශ්‍යතාවක් නොවෙයි. ඒ උපක්‍රමික ක්‍රියාව දේශපාලන අවශ්‍යතාවක්. ඒ දේශපාලන අවශ්‍යතාව තිබෙන්නේ රංජිත් සියඹලාපිටිය මහත්මයාට නොවෙයි. ඒක තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාටයි. එහෙනම් බලන්න. පාර්ලිමේන්තුව යට කරලා, මුදල් අමාත්‍යාංශය යට කරලා විධායක ජනාධිපතිවරයා මූල්‍ය තීන්දු ගන්නවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධායක ජනාධිපති ධුරය නිසා රටේ මුදල්වලට වෙලා තිබෙන නාස්තිය විතරක් නොවෙයි මුළුමහත් රටට වෙලා තිබෙන හානිය ගැනත් මම ඉතාම කෙටියෙන් වචන කිහිපයක් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා මොකද අපි -අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න පක්ෂවලින් අද ගත්තොත් එහෙම මම හිතන්නේ ඔක්කොමලා- එකඟ වෙලා තිබෙනවා එක දවසකට හරි විධායක ජනාධිපති ධුරය මේ රටට සුදුසු නැහැ කියා. ජනතා විමුක්ති පෙරමුණ ඒ ස්ථාවරයේ සිටියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ ස්ථාවරයේ සිටියා. සමසමාජ, කොමියුනිස්ට් කියන ඔය එල්ලිලා ඉන්න පක්ෂ ඒ ස්ථාවරයේ සිටියා. ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා තමයි 1978 දී විධායක ජනාධිපති ධුරය ඇති කරන වෙලාවේ ඒකේ තිබෙන නපුරු, විනාශකාරි තත්ත්වය ගැන මුලින්ම කෘතියක් පවා ලියා පළ කළේ. මේ සමහර ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඒක කියවලාත් ඇති. දැන් ඒ පුද්ගලයන් ඔක්කොම මේ පක්ෂයේ ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයත් අද පිළිගෙන තිබෙනවා විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුයි කියලා. එහෙම ගත්තොත් මේ පාර්ලිමේන්තුවේ පක්ෂවලින් සියයට 99ක්ම -පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225න් 220ක්ම වාගේ- නියෝජනය කරන පක්ෂවලින් විධායක ජනාධිපති ධුරය සුදුසු නැහැ කියන එක පිළිගෙන තිබෙනවා. මේක කොච්චර සුදුසුද නැද්ද කියන එක මම ප්‍රායෝගික උදාහරණයකින් කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා ලංකාවේ විධායක ජනාධිපතිවරු පස් දෙනෙක් ඉඳලා තිබෙනවාය කියා. ඒ පස් දෙනාගෙන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපති ධුරයට පත් වුණා, අවුරුදු 12ක් බලයේ ඉන්න. අවුරුදු 12ක් බලයේ ඉන්න ගියත්, හරියටම ගත්තොත් එතුමාට ඉන්න හම්බ වුණේ අවුරුදු 11යි. ජේ.ආර්. ජයවර්ධන කියන ජනාධිපතිවරයා ඒ අවුරුදු 11ක් විධායක ජනාධිපති ධුරය දරලා ඉවර වන කොට මේ රටේ විපක්ෂයේ දේශපාලන පක්ෂවලට එතුමා තිත්ත වෙලා තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජේ.ආර්. ජයවර්ධන කියන ජනාධිපතිවරයා තිත්ත වෙලා තිබුණා. ජනතා විමුක්ති පෙරමුණට තිත්ත වෙලා තිබුණා. විපක්ෂයේ පක්ෂවලට එපා වෙලා තිබුණා. මොකද, විපක්ෂයේ පක්ෂ කියන්නේත් ජාතික දේශපාලනයේ අත්‍යවශ්‍ය සාධකයි. ඊ ළඟට මේ රටේ පොදු ජනතාවගෙන් බහුතරයකට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එපා වෙලා තිබුණා. 1988 වන කොට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා පොදු ජනතාවටත් එපා වෙලායි තිබුණේ. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දැනීමේ හැටියට නම් 1988 වන කොට එක්සත් ජාතික පක්ෂයේත් සැලකිය යුතු මන්ත්‍රීවරුන් ප්‍රමාණයකට පවා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා තිත්ත වෙලා තිබුණා. කොටසකට තිත්ත වෙලා තිබුණා. ඒ නිසා තමයි ඒ වෙලාවේ ලොකු ඝෝෂාවක් තිබුණේ, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට වහාම ඉවත් වෙලා ප්‍රේමදාස මහත්මයාට අපේක්ෂකත්වය දෙන්න ඡන්දය තියන්නය කියලා. ඒ විධියට බලන කොට ජේ.ආර්. ජයවර්ධන විධායක ජනාධිපතිවරයා අවුරුදු 11ක් බලයේ ඉන්න කොට ඔහුව විපක්ෂයට එපා වෙලා; පොදු ජනතාවට එපා වෙලා; තමන්ගේ පක්ෂය වන යූඑන්පියටත් එපා වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා ආවා. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා ආවාට පසුව එතුමා අවුරුදු 6කට බලයට පත් වුණා. ඒ අවුරුදු හයෙන් එතුමට ඉන්න හම්බ වුණේ අවුරුදු හතරයි. එතුමාව ඝාතනය කළා. එතුමා අවුරුදු හතරක් ඉන්න කොට එතුමා විපක්ෂයට තිත්ත වෙලා තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිත්ත වෙලා තිබුණා. ජනතා විමුක්ති පෙරමුණට තිත්ත වෙලා තිබුණා. පොදු ජනතාවගෙනුත් අතිවිශාල ප්‍රමාණයකට එතුමා තිත්ත වෙලා තිබුණා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට එතුමා එපා වෙච්ච ප්‍රමාණය කොච්චරද කියනවා නම් ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා අවුරුදු දෙකක්, තුනක් බලයේ ඉන්න කොට මගේ දැනීමේ හැටියට ඉතිහාසයේ පළමු වතාවට එක්සත් ජාතික පක්ෂය දෙකට කැඩුණා. හතළිස් හයෙන් පසුව - [බාධා කිරීමක්] දැන් හරි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජේ.ආර්.ජයවර්ධන විධායක ජනාධිපති ධුරය දරද්දී එක්සත් ජාතික පාක්ෂිකයෝම කිව්වා, "ජේ.ආර් එපා, අපට ප්‍රේමදාස ඕනෑ" කියලා. ඒ, 1988 දී. හැබැයි 1988 ඉඳලා 1992 වන කොට එක්සත් ජාතික පක්ෂයට ප්‍රේමදාස මහත්මයාවත් එපා වුණා. එහෙනම් බලන්න, විධායක ජනාධිපති ධුරයේ ප්‍රේමදාස මහත්මයා අවුරුදු හතරක් ඉන්න කොට විපක්ෂයට එපා වෙලා, පොදු ජනතාවට එපා වෙලා, එක්සත් ජාතික පක්ෂයටත් එපා වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බලයට පත් වුණා. එතුමිය අවුරුදු 12කටයි බලයට පත් වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චන්ද්‍රිකා මැතිනිය අවුරුදු 12කට ආවාට, ඇත්තටම එතුමිය ජනාධිපතිකම කළේ අවුරුදු 9යි. හරියටම ගත්තොත් අවුරුදු 8 ½ යි. එතුමිය අවුරුදු 11යි, ජනාධිපති පුටුවේ සිටියේ. අවුරුදු 12ක් ඉන්න ලැබුණේ නැහැ, අවුරුදු 11න් එතුමියව යැව්වා, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් නිසා. ඔබතුමාත් දන්නවා ඇති, එම ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය නෛතික තීන්දුවක් වාගේම, එතුමියව එහෙම යවන්න, "චන්ද්‍රිකා මැතිනිය ඇති" කියන ජන මතයක් මේ රටේ තිබුණා. ඒ ජන මතය තමයි ඇත්තටම උසාවියේ තීන්දුවක් වශයෙන් ආවේ. එහෙනම් බලන්න, විධායක ජනාධිපති ධුරයට පත් වුණු චන්ද්‍රකා මැතිනියට අවුරුදු 11යි ජනාධිපති පුටුවේ ඉන්න ඉඩ ලැබුණේ. ඒ අවුරුදු 11නුත් අවුරුදු 8½ යි ජනාධිපතිකම කළේ. මොකද, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවැති අවුරුදු 2½ දී ජනාධිපතිතුමිය ජනාධිපතිකම කළේ බොහෝම අඩුවෙන්. එතුමියට කරන්න වුණේ පියන් ජොබ් එකක්. රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි ඒ කාලයේ තීන්දු ගත්තේ. එහෙනම් බලන්න, චන්ද්‍රිකා මැතිනිය අවුරුදු 12ක් ඉන්න ආවා, ඇත්ත ජනාධිපතිකම කළේ අවුරුදු 8½ යි. අවුරුදු 6 පනින කොට එතුමියව එපා වෙලා මිනිස්සු ඒ අතර මැද යූඑන්පී ආණ්ඩුවකුත් හැදුවා. අවුරුදු 11ක් එතුමිය ජනාධිපති ධුරයේ ඉඳලා යන කොට එතුමිය විපක්ෂයට එපා වෙලා; එතුමිය පොදු ජනතාවට එපා වෙලා. ඒ විතරක් නොවෙයි. චන්ද්‍රිකා මැතිනියව අද වැඩියෙන්ම එපා වෙලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක කාරකාදීන්ටයි. බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙනම් මේ විධායක ජනාධිපති ධුරයට විවිධ මට්ටම්වලින් ආපු පුද්ගලයන්, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, චන්ද්‍රිකා බණ්ඩාරනායක යන මේ තුන් දෙනාම අවුරුදු 12ක් පාලනය කරන්න ආවාට, පළමු වෙනියාව අවුරුදු 11න් යැව්වා,

දෙ වෙනියා අවුරුදු 4න් ගියා, තුන් වෙනියාව අවුරුදු 8 ½න් යැව්වා. මිනිසුන්ටත් තිත්ත වනවා, විපක්ෂයටත් තිත්ත වනවා විතරක් නොවෙයි, විධායක ජනාධිපතිවරුන්ව තමන්ගේ පක්ෂයටත් තිත්ත වනවා. ඒක තමයි දේශපාලනයේ සත්‍යය. එහෙනම් මහින්ද රාජපක්ෂ මහත්මයාට මොකක්ද වන්නේ? මහින්ද රාජපක්ෂ මහත්මයාටත් වන්නේ ඒකම තමයි. ඊට වඩා ඒක වනවා. බලන්න මේක ප්‍රස්තාරයකට ඇන්දොත්, ජේ.ආර්.ජයවර්ධන මහත්මයා අවුරුදු 11න් ගියා. ප්‍රේමදාස මහත්මයාව ඝාතනය වුණා. ඝාතනය නොවුණත් එතුමා දේශපාලන වශයෙන් විශාල අර්බුදයකට මුහුණ දුන්නා, යූඑන්පී එක දෙකට කැඩීම නිසා. එතුමා අවුරුදු 4න් ගියා. චන්ද්‍රිකා මැතිනිය අවුරුදු 12ක් ඉන්න ඇවිල්ලා අවුරුදු 8 ½න් ගියා. හැබැයි මම කියන්න කැමැතියි, මේ දුර එන්න එන්න අඩු වේගනයි යන්නේ. පත් වුණාට ඉන්න වෙන්නේ අඩු කාලයයි. මිනිසුන් ගහලා පන්නන ගාණට එනවා. හැබැයි මා කියන්න කැමැතියි, හිටපු ජනාධිපතිවරුන් තුන් දෙනාම තමන්ගේ පවුල් බලයක් හැදුවේ නැහැ කියා. අර නපුරු පුටුවේ වාඩි වුණාම ජනතාවටයි, විපක්ෂයටයි, තමන්ගේ පක්ෂයටයි තිත්ත වන ගාණට ආවාට ජේ.ආර්. ජයවර්ධන පවුල් බලයක් හැදුවේ නැහැ; ආර්.ප්‍රේමදාස මහත්මයා පවුල් බලයක් හදන්න උත්සාහ කළා, කරන්න බැරි වුණා; චන්ද්‍රිකා මැතිනියත් පවුල් බලයක් හැදුවේ නැහැ, හැම තැනම බණ්ඩාරනායකලා පිරෙව්වේ නැහැ. එහෙමත් තියෙද්දී තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායකව අවුරුදු 8½න් යැව්වේ. එහෙනම් අපි මේ ගැනත් අහන්න කැමැතියි. විධායක ජනාධිපතිකම දරන, මේ රටේ මුදල්වලින් සියයට 80ක් තමා යටතේ තිබෙන අමාත්‍යාංශවලට වෙන් කරන, තමන්ගේ පවුලේ කට්ටිය පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, ප්‍රාදේශීය සභාවේ හැම තැනම පුරවා ගෙන සිටින, පවුල් බලයක් දරන මේ පුද්ගලයාට -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே - மின்வலு அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Power)
ජනතා විමුක්ති පෙරමුණ කෝ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඔහොම තමයි ගරු ඇමතිතුමනි අනෙක් කට්ටියත් කිව්වේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
මගේ අවස්ථාව දෙන්න. [බාධා කිරීමක්] ඇමතිතුමාගේ අවස්ථාවේ දී කථා කරන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවස්ථාවේ දී තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත් කැපිලා, අද ඔය ජනාධිපතිතුමාගේ පුරෝහිතයන් වන්න හදන කට්ටිය රනිල් වික්‍රමසිංහ මහත්මයායි, චන්ද්‍රිකා නෝනායි එක්ක කුමන්ත්‍රණ කරන වෙලාවේ අපි ඇද ගෙන ගෙනැල්ලා එතුමාව ජනාධිපති පුටුවේ තැබුවේ. එහෙම කළේ වෙන මොකකටවත් නොවෙයි. ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ තිබුණේ කොටින්ට උදවු කරන ප්‍රතිපත්තියක්. ඒක පරාජයට පත් කර ගන්නට ජනතා විමුක්ති පෙරමුණේ අපට ඕනෑකම තිබුණා. ඒ නිසා ඒ කාර්යයට පමණයි අපි මහින්ද රාජපක්ෂ මහත්මයා ගෙනාවේ. ඒ නිසා තමයි අපි ඒ ආණ්ඩුවේ ඇමතිකම් භාර ගන්න ගියේ නැත්තෙත්. ඒ නිසාම තමයි අපි කොන්දේසියක් දැම්මෙත්, විධායක ජනාධිපති ධුරය අවුරුදු හයක පළමු වන කාල සීමාව ඇතුළේ අහෝසි කරන්නට ඕනෑ යි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධායක ජනාධිපති ධුරය පිළිබඳව ඉතිහාසයේ කරුණුයි මා කිව්වේ. අපි කාටත් මතක අතීතය. මා දුටුගැමුණු රජතුමා ගැන කියන්න ගත්තේ නැහැ. අපි දන්නා ඉතිහාසය අරගෙන බලන්න. ආපු විධායක ජනාධිපතිවරුන් තුන් දෙනාම ඔවුන්ගේ ධුර කාලය අවසන් වන්නට කිට්ටු වන කොට ජනතාවටත් එපා වෙලා, විපක්ෂයටත් එපා වෙලා, තමන්ම නියෝජනය කරන පක්ෂයටත් එපා වෙලා. එහෙනම් අපි කියන්න කැමැතියි, මේ ජනාධිපතිවරයා ඉතිහාසය වෙනස් කර පෙන්වයි කියා. කොහොමද දන්නවාද? අඩුම කාලයක් රටේ සිටි විධායක ජනාධිපතිවරයාය කියලා. ඒක වන්නේ අනික් අය නොකළ විධියට මෙතුමා පවුලක බලයකුත් ගොඩ නඟා ගෙන යන නිසා. වෙන ජනාධිපතිවරු ඒක කළේ නැහැ. මොහු ඒකත් කරනවා. ඒ නිසා පිරිහීමේ වේගය වැඩියි. මේක twenty-twenty විධියට පිරිහෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධායක ජනාධිපති ධුරය නිසා තමයි අද පාර්ලිමේන්තුව පඹයෙක් බවට පත් වෙලා තිබෙන්නේ; මේ ඇමතිවරු තීන්දු තීරණ ගන්න බැරි අය බවට පත් වෙලා තිබෙන්නේ. මම උදාහරණයක් කියන්නම්. ඛනිජ තෙල් සංස්ථාවේ උද්ඝෝෂණයට මොකක්ද හේතුව? ජූනි මාසයේදී ෆවුසි ඇමතිවරයා ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමතිවරයා වශයෙන් සේවකයන් එක්ක එකඟ වුණා, ඛනිජ තෙල් සංස්ථාව ලබා තිබෙන ලාභය අනුව සාපේක්ෂව පඩි වැඩි කිරීම අවුරුදු තුනකට පස්සේ දෙන්නම් කියා. අවුරුදු තුනක් දුන්නේ නැති එක එතුමා දෙන්න එකඟ වුණා. ඒක දෙන්න අදාළ විෂය භාර ඇමතිවරයා එකඟයි. ඒ සල්ලි ටික දෙන්න සංස්ථාවේ සල්ලි තිබෙනවා. නමුත් මොකක්ද කළේ? ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා වශයෙන් ඒක ප්‍රතික්ෂේප කළා. සේවකයන් සමඟ අත්සන් කර තිබෙන සාමූහික ගිවිසුමට අනුව ඒ සේවකයන්ට -සංස්ථාවල අයට- අය වැයෙන් පඩි වැඩි වන්නේ නැහැ. ඔබතුමා ඒක දන්නවා. රජයේ සේවකයන්ට පඩි වැඩි කළාය කියා සංස්ථා සේවකයන්ට ඒ විධියට පඩි වැඩි වන්නේ නැහැ. ඒ නිසා තමයි අවුරුදු තුනකට වතාවක් ඒ ගොල්ලන්ගේ පඩි වැඩි කරන්න සාමූහික ගිවිසුම් අත්සන් කර තිබෙන්නේ. ඊට අනුව විෂය භාර ඇමතිවරයා පඩි වැඩි කරන්න එකඟ වනවා. ජනාධිපතිවරයා එපා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විෂය භාර ඇමතිවරයාට තමන්ගේ ආයතනය පරිපාලනය කරන්න බැරි වීම නිසා තමයි උද්ඝෝෂණ ඇති වුණේ. [බාධා කිරීමක්] ඒක මම කිව්වා. ඛනිජ තෙල් සංස්ථාවේ උද්ඝෝෂණයක් ඇති වන්නේ නැහැ, විෂය භාර ඇමතිවරයාට තීන්දුව ගන්න ලැබුණා නම්; විෂය භාර ඇමතිවරයාට ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න තිබුණා නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි අප කියන්නේ විධායක ජනාධිපති ධුරය ක්‍රියාත්මක වන තුරු පාර්ලිමේන්තුවට වග කියන්නේ නැති, පාර්ලිමේන්තුවට එන්නේ නැති නායකයෙක් මේ රටේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් සිටින නිසා මේ රටේ පාර්ලිමේන්තුව කවදාවත් ස්වාධීන වන්නේ නැහැ කියලා; එයට මේ රටේ මූල්‍ය බලය ක්‍රියාත්මක කරන්න ලැබෙන්නේ නැහැ කියලා.

දැන් බලන්න, මේ පාර්ලිමේන්තුවට අගමැතිවරයා එනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු කරන විවේචනවලට, ඒ ගොල්ලන්ගේ කරුණුවලට, ඒ ගොල්ලන්ගේ තර්කවලට ඇහුම් කන් දෙනවා. ඇහුම් කන් දෙන්න අවස්ථාවක් ලැබෙනවා. සමහර විට අපි ඉස්සරහදී අගමැතිවරයා ඒක ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එහෙමයි. මනුෂ්‍යයෙක් අපට චෝදනාවක් කළොත් අප සමහර විට මුහුණට කියන්න පුළුවන්, අප ඒක ප්‍රතික්ෂේප කරනවා කියලා. නමුත් පසුව කල්පනා කරනවා, අර මිනිහා මේක කිව්වා කියලා. උදාහරණයක් මම කියන්නම්. මා ළඟ තිබෙනවා ශ්‍රී ලංකා හමුදාව යුද්ධයේදී පාවිච්චි කළ කාලතුවක්කු උණ්ඩවල කොපු ගැන විස්තරයක්. අපේ නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා මේක හැන්සාඩගත කළා. පිත්තල කොපු ටොන් 40,000ක ප්‍රමාණයක් අද ශ්‍රී ලංකා හමුදාව සතුව තිබෙනවා. ඔවුන් පාවිච්චි කළ ඒවා. ලාල්කාන්ත සහෝදරයා කුඩා සහ ග්‍රාමීය කර්මාන්ත ඇමති වශයෙන් සිටි කාලයේ තීන්දුවක් ගත්තා, ලංකාවේ රාජ්‍ය ආයතනවලින් ඉවත් කරන පිත්තල සහ අබලි ද්‍රව්‍ය අපනයනය කරන්නේ නැහැ, ඒවා ලංකාවේ කුඩා

[ගරු බිමල් රත්නායක මහතා]

කර්මාන්ත හිමියන්ට පිත්තල භාණ්ඩ නිෂ්පාදනයට ලබා දෙනවාය කියා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ පිත්තල භාණ්ඩ නිෂ්පාදකයෝ ඉන්නවා. අපේ දිමුතු බණ්ඩාර මන්ත්‍රීතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේත් පිත්තල භාණ්ඩ නිෂ්පාදකයෝ ඉන්නවා. [බාධා කිරීමක්] හිර වෙන්න කලින් ඉක්මනට යන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප එහෙම තීන්දුවක් ගත්තා. ඒ නිසා හමුදාව පාවිච්චි කළ වී 56 උණ්ඩයේ කොපුව, කාලතුවක්කු උණ්ඩයේ කොපුව දුන්නේ කාර්මික සංවර්ධන අධිකාරියට. ඒකෙන් තමයි පිත්තල නිෂ්පාදකයාට දුන්නේ. කාලතුවක්කු උණ්ඩවල කොපු ටොන් 40,000ක් සිංගප්පූරුවට අපනයනය කරන්න යනවා, කිලෝ එකක් රුපියල් 150 ගණනේ. ටොන් 40,000ක් කියන්නේ කිලෝ ලක්ෂ 400ක්. ඔබතුමා දන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිත්තල කිලෝ එකක් සාමාන්‍ය වෙළෙඳ පොළේ රුපියල් 350යි. ගෙවල්වලට ඇවිල්ලා සරනේරුව ගණනේ එකතු කරන සාමාන්‍ය මිනි බඩුකාරයාත් රුපියල් 220ක් විතර දෙනවා. පිරිසිදු පිත්තල කිලෝග්‍රෑමයක් රුපියල් 350ක් වනවා. හමුදාව පාවිච්චි කළ පිත්තල කොපුව විකුණන්න යන්නේ කොහොමද? කිලෝ ලක්ෂ 400ක් විකුණන්න යනවා, රුපියල් 150 ගණනේ. අපි රුපියල් 350 පැත්තකින් තියා හිතන්න. සාමාන්‍ය වෙළෙඳ පොළ මිල මට්ටම රුපියල් 300ක් නම් මේක විකුණන්න යන පුද්ගලයාට මේ හැම පිත්තල කිලෝවකින්ම රුපියල් 150ක් ගණනේ ලැබෙනවා. මේක විකුණන්න යන්නේ කවුද? මේක විකුණන්න යන්නේ ආරක්ෂක අමාත්‍යාංශය. ඊට අදාළ මේ ලේඛනය හැන්සාඩ්ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා, ආණ්ඩුවේ ඇමතිවරුන්ට මේක හොරෙන් හෝ හැන්සාඩ් එකෙන් බලන්න.

දැන් මොකක්ද, මේකට හේතුව? මේකට හේතුව මෙයයි. කුඩා කර්මාන්ත අමාත්‍යාංශයෙන් අපි මේ ගැන ඇහුවා. ඒ අදාළ අමාත්‍යාංශය කැමැතියි, මේක අරගෙන තමන්ගේ නිෂ්පාදකයාට දෙන්න. නමුත් අද අපි මේ චෝදනාව ඇමතිවරුන්ට කරනවා. එතකොට ඇමතිවරුන්ට හිතෙනවා, "මේකේ ඇත්තක් තිබෙනවාද කියලා හොයලා බලන්න ඕනෑ" කියලා. නමුත් මෙතැනට ජනාධිපතිවරයා එන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මෙතැනට ජනාධිපතිවරයා එන්නේ නැති නිසා මේ කථාව අහන්න හම්බ වන්නෙත් නැහැ. මගේ කථාව විතරක් නොවෙයි. විපක්ෂයේ කාගේවත් කථා අහන්න හම්බ වන්නේ නැහැ. ජනාධිපතිතුමා අද ඉන්නේ බංකරයක. එතුමා හම්බ වන්න පුළුවන්කම තිබෙන්නේ එතුමා කැමැති පිරිසකට පමණයි. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, සාමාන්‍ය මිනිහෙකුට එතුමාව හම්බ වන්න බැහැ. ආරක්ෂක ප්‍රශ්නය නිසා වන්නත් පුළුවන්. හැබැයි එතුමා ආරක්ෂාව ඇතුව හෝ මෙතැන මේ පුටුවට එනවා නම් මේකට ඇහුම් කන් දෙන්න පුළුවන්. බිමල් රත්නායක මන්ත්‍රීවරයා කියන්නේ අසත්‍ය කියලා දැන් ප්‍රතික්ෂේප කළත් මෙතැන අගමැතිවරයාගේ පුටුවේ ජනාධිපතිවරයා හිටියා නම් එහෙම නම් පස්සේ හිතන්න පුළුවන්, "මේකේ වැරැද්දක් තිබෙනවා"යි කියලා. අද ජනාධිපති මන්දිරයට යන්න පුළුවන් කාටද? එතුමා හම්බ වන්න පුළුවන් කාටද? අද එතුමාව හම්බ වන්න පුළුවන්කම තිබෙන්නේ එතුමාට "yes" කියන කට්ටියට විතරයි, එතුමාත් එක්ක තර්ක කරන කට්ටියට බැහැ. ඒකයි ඇත්ත. ඒක මේ ජනාධිපතිතුමා සම්බන්ධයෙනුත් සත්‍යයක්; චන්ද්‍රිකා නෝනා සම්බන්ධයෙනුත් සත්‍යයක්; ප්‍රේමදාස, ජේආර් මහත්වරු සම්බන්ධයෙනුත් සත්‍යයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ පාර්ලිමේන්තුවට මූල්‍ය නිදහස ලබා දෙන්න නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට ලබා දීලා තිබෙන මූල්‍ය නිදහස ලබා ගන්න නම් අනිවාර්ය වශයෙන්ම රටේ මුදල් ඇමතිවරයා, රටේ විධායකයේ ප්‍රධානියා පාර්ලිමේන්තුවට වග කියන කෙනෙක් වන්න ඕනෑ; පාර්ලිමේන්තුවට එන කෙනෙක් වන්න ඕනෑ.

---

* *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

එහෙම නැතුව ඊ ළඟ පාර්ලිමේන්තුවට අය වැයක් ඉදිරිපත් කරන්නට අවස්ථාව දෙනවාය කියන එක සම්පූර්ණ බොරුවක්. ඒක තීන්දු කරන්නේත් මේ ජනාධිපතිවරයා හිටියොත් ඔහුම තමයි. ඒ නිසා අපි කියන්නේ මේ අතුරු සම්මත ගිණුම දේශපාලන ව්‍යාපෘතියක්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත්, මුදල් ඇමතිවරයාත් පත් වෙලා ඉන්න දේශපාලන අවුල නිසා පඩි වැඩි කර ගන්න බැහැ; රැකියා නැති උපාධිධාරීන්ට අය වැයෙන් පොරොන්දු වෙච්ච රැකියා ටික දෙන්න බැහැ; යුද්ධය ඉවර වෙලා මාස හයකට පස්සෙත් ජනතාවට කිසිම සහනයක් දෙන්න බැරි වෙලා තිබෙනවා. බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය ඇරෙන්න මොන දෙපාර්තමේන්තුවද සාර්ථක වෙලා තිබෙන්නේ? යුද්ධය කරපු දෙපාර්තමේන්තු තුන ඇරෙන්න මොන අමාත්‍යාංශයද රටට ජයග්‍රහණය ගෙනැවිත් දීලා තිබෙන්නේ? සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත් මොකද වෙලා තිබෙන්නේ? ඇමතිවරුන්ට රට යන්න බැහැ. ඊයේ ඉරානයේ නියෝජිත පිරිසක් කථානායකතුමාගේ ගැලරියට ඇවිත් හිටියා. ඇමතිතුමා අපිට කිව්වා, ඉරාන නියෝජිත පිරිස මෙතැන ඉන්න වෙලාවේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කෑ ගැහුවාය කියලා. හැබැයි අපි ඒ ගොල්ලන් එක්ක සාකච්ඡාවට ගිය වෙලාවේ ඒ මන්ත්‍රීවරු අපෙන් ඇහුවේ -මෙතැන පොත් පොළවේ ගැහුවා එකට වඩා අපෙන් ඇහුවේ- "ඔය ගොල්ලන්ගේ රටේ සෞඛ්‍ය සැහෙන්න පිරිහිලා තිබෙනවා නේද?" කියලායි. මම අවංකව විශ්වාස කරනවා, ඉරානයට වඩා ලංකාවේ සෞඛ්‍ය මට්ටම හොඳට තිබුණා කියලා. ඉතින් මේ නියෝජිතයන්ට යන තොරතුරු මොකක්ද? පණිවුඩය මොකක්ද? අපි අහන්න කැමැතියි, මොන අමාත්‍යාංශයද තමන්ගේ කාර්ය සාධනය කරලා තිබෙන්නේ කියලා.

මේ බලන්න, මේ කොටස් වෙළෙඳ පොළ වාර්තාවේ ලංකාවේ අපනයන ක්ෂේත්‍රය පිළිබඳව, ලංකාවේ අනෙකුත් සේවාවන් පිළිබඳව සඳහන් වී තිබෙනවා. මේ වාර්තාවට අනුව ගත්තත් ඒ සියල්ලක්ම පහළට වැටිලායි තිබෙන්නේ. අපේ අපනයන අඩු වෙලා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි.

මෙතැන ඉන්න සමහර ගරු ඇමතිවරු සහභාගි වනවා, පාර්ලිමේන්තු COPE එකට. මම ඒකේ තොරතුරු කියන්න යන්නේ නැහැ. නමුත් පොදු අදහස මොකක්ද? COPE එකට ගියාම පොදු අදහස තමයි අපේ රට දවසින් දවස පහළට යනවාය කියන එක. ආණ්ඩුවේ ගරු ඇමතිවරුන්ගෙන් අපි අහන්න කැමැතියි, "ෂා! මේ ආයතනය නම් නියමෙට යනවා, මේ ආයතනයේ ආදර්ශය අනෙක් ආයතනවලටත් දෙන්න ඕනෑ" කියලා අපට හිතෙන එකම ආයතනයක්වත් ඒකට එනවාද කියලා. අපට එහෙම හිතෙනවාද? මා විශ්වාස කරනවා, අපේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය බයිලා මහතා -විපක්ෂයේ මන්ත්‍රීවරයකු වුණත්- විශාල කාර්ය භාරයක් එහි කරනවාය කියලා. ජෝන් සෙනෙවිරත්න අමාත්‍යතුමා එහි සභාපතිවරයා වශයෙන් ඉන්නවා. අපි අහන්න කැමැතියි, අපේ හිතට ශක්තියක් එන, අපේ හිතට තෘප්තියක් එන එක රාජ්‍ය ආයතනයක් එනවාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය ඇරෙන්න වෙන කිසිම දෙපාර්තමේන්තුවක් හරි පැත්තට හරවන්න මේ ජනාධිපතිවරයා අසමත් වෙලා තිබෙනවාය කියලා මා කියන්නේ ඒකයි. යුද්ධය කෙරිච්ච එක විතරයි තිබෙන්නේ. අනෙක් ඒවා ඔක්කොම රූපිතෙට යන්නේ. ඒ රූපිතෙට යන්නේ වැඩක් කරන්න පුළුවන්, වැඩක් කරන්න වුවමනාවක් හෝ තිබෙන අමාත්‍යවරුන්ට හා අමාත්‍යාංශවලට අවශ්‍ය කරන සාධාරණය, උදව්ව, ප්‍රතිපාදන පවා ලබා නොදී සමස්ත අය වැයෙන් -අතුරු සම්මත ගිණුමෙන් පවා- අතිවිශාල ප්‍රතිශතයක් ජනාධිපතිවරයා අරගෙන තිබෙන අවස්ථාවකයි. ඒ නිසා අපි කියන්නේ මේකයි. මේ අතුරු සම්මත ගිණුම ජනාධිපතිවරයාගේ දේශපාලන බංකොලොත්භාවය ප්‍රදර්ශනය කිරීමක්. මේ අතුරු සම්මත ගිණුම තමන්ගේ දේශපාලන ජයග්‍රහණ වෙනුවෙන් රට බිල්ලට දෙන්න ලැහැස්තියි කියන එක පිළිබඳ පණිවිඩයක්. මොකද, අපි දන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ලෝක ආර්ථික අර්බුදයකට මුහුණ දීලා ලංකාව තවත් අර්බුදවලට මුහුණ දීලා ඉන්න වෙලාවකදී මූල්‍ය විනය වැඩිපුර අවශ්‍යයි; මූල්‍ය පිළිබඳව සමාලෝචනය වැඩිපුර අවශ්‍යයි; මේ අර්බුදකාරී වෙලාවේ

ආණ්ඩුවේ හැම දෙපාර්තමේන්තුවක්ම, අමාත්‍යාංශයක්ම සම බරව පවත්වා ගෙන යන එක අවශ්‍යයි. එහෙම විවාදයක් ඇති වන්නේ අය වැය ලේඛනයක් ඉදිරිපත් වුණොත් විතරයි. එහෙම සාකච්ඡාවක් ඇති වන්නේ අය වැයක් සම්පාදනය වුණොත් විතරයි. එහෙම නැතිව මේ ක්‍රමවලින් වන්නේ මහ රජෙක්ව පුම්බන එක විතරයි. ඒ නිසා මේ අතුරු සම්මත ගිණුම ගෙන ඒම ගැනත්, අතුරු සම්මත ගිණුම ගැනත් ජනතා විමුක්ති පෙරමුණේ විරෝධය පළ කරමින්, මේ පාර්ලිමේන්තුවට වග නොකියන විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමකින් තොරව මේ රට හරි මාර්ගයට ගන්න බැහැයි කියන කාරණය සඳහන් කරමින් මා මාගේ කථාව අවසාන කරනවා. ස්තුතියි.

華亞國際有限公司
**Sino Asia International Private Limited**
Address: No. 1, Sims Lane, # 05-06, Singapore 387355
Tel : (65) 6744 0585 Fax: (65) 6747 3970

## BUSINESS REQUIREMENTS

## IN

## SALES & PURCHASE

## OF

## EXPENDED ARTILLERY SHELLS

## (EMPTY SHELLS)

### BUSINESS REQUIREMENTS FOR SALES & PURCHASE OF EXPENDED ARTILLERY SHELLS

1. **INTRODUCTION**

(a) We, Sino Asia International Private Limited, are a Singapore registered company (hereinafter shall be known as "Entity") that has found a niche in commodity trading in China. It has successfully aligned itself with several steel mills in China, as a provider of raw materials like, inter alia, iron ores, bauxites and chromium.

(b) Through its wide connections within China, Entity, in synergy with its group of associated companies in Singapore and China, is able to provide end product solutions from these mills such as steel plates, angle bars and high tensile deformed bars to shipyards. It also trades in aluminum products.

(c) Entity also acts as a springboard for China's investment companies in development projects in countries with resources but lack the financial capabilities to develop their country infrastructure and natural resources.

(d) Entity with its associated group of companies is also extensively involved in waste management energy projects using waste, palm kernel shells and coconut husks to produce active carbons and generate green gas as an alternative for LPG for use in Malaysia Peninsula, Sarawak and Sabah.

2. **BACKGROUND**

(a) Entity is able and willing to enter into a sales & purchase of expended artillery shells (empty shells) with Lanka Garments or the Ministry of Defense (hereinafter shall be known as "Supplier") based on daily, weekly or monthly roll basis.

(b) Payment shall be made on delivered quantity via an Irrevocable Transferred Documentary Letter of Credit. This is non negotiable.

(c) The accumulated total quantity is based on an estimated value of 40,000 MT. Final quantity shall be determined upon finalization of contract.

(d) The price shall be fixed at an agreed value of CNF USD2.06 per KG of expended (empty) artillery shells. This price shall be based on 68% or above content of copper in the shells. At Entity's option, Entity may reject shells with less than 62% copper content.

3. **REQUIREMENTS**

(a) Entity shall purchase the total available quantity from SUPPLIER, in which the quantity shall be delivered on a fixed delivery schedule to be determined by both parties.

(b) For the above premise, SUPPLIER shall sell the total available quantity to Entity on an exclusive basis. The available quantity shall be delivered on daily, weekly or monthly basis as per contractual obligations.

(c) Entity shall pay for the quantity shipped on fixed delivery schedule by Irrevocable Transferred Documentary Letter of Credit (DLC).

(d) For the first shipment, a delivery of twenty (20) MT of expended (empty) artillery shells in one container shall be made to establish the delivery process from Sri Lanka to point of destination. This is to ensure all parties are familiar with all documentation requirements (see sub-section [i] below) and clearances from all relevant authorities, including but not limiting to, Ministry of Defense and Customs & Excise Department. In absence of any permit or clearance, the Ministry of Defense shall be responsible and undertake to get all permits and/or clearances for the shipment of the expended (empty) artillery shells.

(e) Subsequent shipments shall be determined and confirmed prior to signing of Sales & Purchase Agreement.

(f) At Entity's option, the Entity shall advise the delivery destination prior to shipment. The destination countries are Singapore, Hong Kong, Taiwan or China.

(g) SUPPLIER shall ensure that the expended (empty) artillery shells are cut into 6 or more pieces and flattened before packing. Serial number and description on shells must be filed or grinded off. See Appendix A for photos.

(h) The base of shells as must be cut and discarded, that is, not part of the purchase.

(i) Each shell shall be thoroughly washed and shall be free of explosive powder, primer or detonator.

(j) Under the terms and conditions for the sales & purchase, SUPPLIER shall arrange with the Government of Sri Lanka to issue at its cost:

i. Export License (without restriction) for the expended (empty) artillery shells in whole or parts
ii. License to deal and trade in expended (empty) artillery shells
iii. Certificate of origin
iv. Certificate of non-encumbrance and free of liens
v. Certificate of non-explosive
vi. SGS (if China, CCIC) Certification for Quality & Quantity Assay
vii. Any other licenses, permits and clearance authorization documents

Documents, including but not limiting to, Ocean Bill of Lading, are required for LC payments.

(k) The Government of Sri Lanka shall also issue a Sovereign Guarantee and Protection for the delivery of the expended (empty) artillery shells and the safety of all personnel of Entity engaged directly or indirectly for the purchase and delivery of the expended (empty) artillery shells.

5. **ENTITY CONTACT**

Company: Sino Asia International Private Limited
Address: No. 1, Sims Lane, #05-06, Singapore 387355
Contact Person: Mr. Zhao Shou Zheng
Title: Managing Director
Mobile: +65 9737 1200
Email: zhao_shouzheng@yahoo.com

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මී ළඟට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමා. ඊට පෙර මූලාසනය සඳහා ගරු (පූජ්‍ය)උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේගේ නම යෝජනා කරන්න.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා (අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍ය සහ වැඩ බලන තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - ஏற்றுமதி அபிவிருத்தி, சர்வதேச வர்த்தக அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Export Development and International Trade and Acting Minister of Posts and Telecommunications )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ දී ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේ මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வண.) உடவத்தே நந்த தேரர்அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *took the Chair.*

[අ. භා. 12.49]

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன - மின்வலு, சக்தி அமைச்சர்)
(The Hon. W. D. J. Senewiratne - Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ නිසා තමයි හැම අවුරුද්දකම විසර්ජන පනතක්, නැත්නම් අය වැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සාකච්ඡා කරලා ඉදිරි වර්ෂයේ ආදායම් සහ වියදම් ගැන, එහෙම නැත්නම් අය වැය සම්බන්ධව සාකච්ඡා කරන්න පාර්ලිමේන්තුවට අවස්ථාව ලැබෙන්නේ. නමුත් අපි දන්නවා මේ රටේ මෑත ඉතිහාසය ගත්තාම අය වැයක් ඉදිරිපත් නොකර, අය වැයක් ඉදිරිපත් කළ යුතු වර්ෂයේ එක්තරා නිශ්චිත කාල සීමාවක් සඳහා ආදායම සම්බන්ධයෙන් ප්‍රකාශ කරන, වියදම සම්බන්ධයෙන් ප්‍රකාශ කරන අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා ඒ කටයුත්ත කරන බව. නමුත් අද ඒක ලොකු විවාදයකට හේතුවක් කර ගෙන තිබෙනවා. විපක්ෂය ඊයේ දවස පුරාත්, අද දවස පුරාත් මේ විධියට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීම වැරදියි කියන මතය තහවුරු කරන්න දිගින් දිගටම කථා කළා. නමුත් මම කියන්න ඕනෑ ඇත්ත වශයෙන්ම අතුරු සම්මත ගිණුමක් පළමුවෙන්ම ඉදිරිපත් කළේ 1931 වර්ෂයේ බව. 1931න් පස්සේ නව වාරයක් අතුරු සම්මත ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ නව වාරයෙන් වාර තුනක්, ඒ කියන්නේ 1982, 1988, හා 2002 කියන වර්ෂවල දී එක්සත් ජාතික පක්ෂය විසින් මෙවැනි අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කරලා මේ පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගෙන තිබෙනවා. නමුත් අද අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කිරීමට විරුද්ධව එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් ඉදිරිපත් කරන කරුණ තමයි අපි මේ ඉදිරිපත් කරන කරුණු සම්පූර්ණයෙන්ම පදනම් විරහිත බව.

ඇත්ත වශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයක් තහවුරු කිරීම ගැන අපි කවුරුත් සතුටු වන්නට ඕනෑ කියලා මා හිතනවා. හුඟක් වෙලාවට අපි කියන්නේ මේ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයන් විනාශ වන බවයි. අද මේ රජය තීන්දු කරලා තිබෙනවා ලබන අවුරුද්දේ මුල වන විට ජනාධිපතිවරණයත්, ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයත් පවත්වන්නට. ඒ විධියට මැතිවරණ දෙකක් එන මේ අවස්ථාවේ දැනට අය වැයක් සකස් කරලා, ඒක මේ පාර්ලිමේන්තුව මඟින් සම්මත කරලා ඒ අනුව කටයුතු කරන්න ගියොත් සමහර විට ලබන අවුරුද්ද මුල දී පත් වන රජයට කටයුතු කිරීමේ අපහසුවක් ඇති වනවා. මේ රජය කෙබඳු රජයක් ද කියන කාරණය නොවෙයි මෙතැන දී අපි සලකා බැලිය යුත්තේ. මොකද? අපට විශ්වාසයක් තිබෙනවා මේ රජයම නැවත පත්වනවාය කියලා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පවලට ගරු කරනවා නම් මෙතැන දී තේරුම් ගන්නට ඕනෑ ලබන අවුරුද්ද මුල දී අලුත් රජයක් එන බව. ඒ පත් වන අලුත් රජයට තමන්ගේ කටයුතු කර ගෙන යාම සඳහා අය වැය සකස් කිරීමට ඉඩකඩ ලබා දීම පිණිස තමයි අපි දැන් අය වැයක් ඉදිරිපත් නොකරන්නේ. එහෙම ඉදිරිපත් කරලා, සාකච්ඡා කරලා අනුමත කළාට පස්සේ ඒ පත් වන ආණ්ඩුවටත් සිද්ධ වන්නේ ඒ අනුමත කරන අය වැය පදනම් කර ගෙන කටයුතු කරන්නටයි. ඒක ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයට විරුද්ධ නිසා තමයි අද ඒකෙන් බැහැර වෙලා අද අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා කෙටි කාලයකට -මාස හතරක කාලයකට- අවශ්‍ය වන මුදල් ඉපැයීම සහ වැය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කියන එක මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, පී.බී. ජයසුන්දර මහත්මයා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් පත් වෙලා සිටිද්දී එතුමා විසින් කරන ලද, එහෙම නැත්නම් එතුමාගේ කාලයේදී සිද්ධ වෙච්ච ගනුදෙනුවක් සම්බන්ධව සුප්‍රීම් උසාවියේදී එතුමා වැරැදිකාරයා වුණාය කියලා. එතුමා වැරැදිකාරයා වුණාට පස්සේ නැවත වරක් විනිශ්චයකාරවරුන් හත් දෙනකුගෙන් යුක්ත විනිශ්චයකාර මණ්ඩලයක් විසින් ඔහු නිදහස් කළාය; නිදහස් කරලා නැවත ඒ තනතුරට පත් කළාය කිව්වා. මා හිතන විධියට එතුමා ඒ කරුණු හරියාකාරව තේරුම් අර ගෙන නැහැ. මොකද, පී.බී. ජයසුන්දර මහත්මයාට දඩයකුත් නියම වුණා. ඒ දඩයේ කිසිම වෙනසක් නැහැ. ඒ දඩය තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු ඇමතිතුමනි,-

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)
පොඩ්ඩක් ඉන්න කෝ. එතුමාට රජයේ කිසිම රැකියාවක් කරන්න බැහැ කියන නියෝගයක් ඒ වෙලාවේ සුප්‍රීම් උසාවිය දුන්නා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු ඇමතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය පිළිබඳව නොවෙයි මම ප්‍රශ්න කළේ. පී.බී. ජයසුන්දර කියන මහත්මයාම දිවුරුම් ප්‍රකාශයකින් පිළිගත්තා තමා වැරැද්දක් කළා කියලා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට වඩා වැදගත් වනවා ඒක.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)
මා ඒකට උත්තර දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
අපි කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නියෝගය දුන්නත් ජනාධිපතිවරයා මේක දන්නා නිසා -

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

මේ කාරණය ගැන -දිවුරුම් පෙත්සම ගැන- එතැනදී සලකා බැලුණා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. මට ඉඩ දෙන්න. නැවත වරක් විනිශ්චයකාරවරුන් හත් දෙනකුගෙන් යුක්ත විනිශ්චය මණ්ඩලයක් විසින් මේ කාරණය විශ්ලේෂණය කරද්දී පැහැදිලිව ප්‍රකාශ කරපු දෙයක් තමයි මේ දිවුරුම් පෙත්සම ඔහු විසින් දීපු දෙයක් නොවෙයි, ඔහුගෙන් ගත්ත දිවුරුම් පෙත්සමක් කියන එක. ඔහුට දිවුරුම් පෙත්සමක් දෙන්න නියෝග කළා. ඒ අනුව ඔහු පත් වෙලා හිටපු තත්ත්වය උඩ දිවුරුම් පෙත්සම දුන්නා. ඒ දිවුරුම් පෙත්සම දීලා ඔහු කියා සිටියා මා මීට පස්සේ රජයේ රැකියාවකට යන්නේ නැහැ කියලා. ඊ ළඟට ඔහු කිව්වා, මේක මම කැමැත්තෙන් දීපු එකක් නොවෙයි, ඒ වෙලාවේ තිබුණු පරිසරය හා කරුණු අනුව මට බලපෑමක් එල්ල වුණා දිවුරුම් පෙත්සමක් දෙන්න, ඒ නිසායි මම දිවුරුම් පෙත්සමක් දුන්නේ කියලා. මා හිතන්නේ නැහැ කෙනකුට තමුන්ගේ ජීවිත කාලය තුළම රක්ෂාවක් කරන්න බැරි වන ආකාරයේ තීන්දුවක් දීම කිසිම ආකාරයකින්, කිසිම නීති සිද්ධාන්තයක් අනුව සාධාරණයි කියලා. ඔහුට සිදු වෙච්ච ඒ අසාධාරණය නිවැරදි කිරීමක් තමයි සිද්ධ වුණේ කියන එක මා මෙතැනදී කියන්න ඕනෑ. පී.බී. ජයසුන්දර මහත්මයා ඒ කාරණය සම්බන්ධව වග කිව යුතුද, නැද්ද කියන කාරණය නොවෙයි මම කියන්නේ. සිද්ධාන්තමය වශයෙන් එතැනදී වරදක් වුණා කියන එකයි මා කියන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා රජයේ සේවකයන්ට පඩි වැඩි වන බවක් ඊයේ ජනාධිපතිතුමා ප්‍රකාශ කළා කියලා. සංස්ථා සේවකයන්ට මොකද වන්නේ කියලා ඔබතුමා ඇහුවා. මම තමුන්නාන්සේටත් මේ ගරු සභාවටත් මතක් කරන්න ඕනෑ, ඇත්ත වශයෙන්ම අපේ සංස්ථාවලත් පඩි වැඩි වන බව. අපි ඒ සම්බන්ධව දැනට තීන්දුවක් අර ගෙන තිබෙනවා. පහු ගිය දවස්වල ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම වෘත්තීය සමිති කැඳවලා මම ප්‍රකාශ කළා, ලබන අවුරුද්දේ ජනවාරිවල ඉඳලා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ටත් පඩි වැඩි වනවා කියලා. ජනවාරිවල වැඩි වන ඒ පඩිය බලපාන්නේ මේ නොවැම්බර් මාසයේ ඉඳලා. පඩි ගෙවීම කරනවා ජනවාරි මාසයේ ඉඳලා. නමුත් ඒ ගෙවන පඩිය බලපානවා 2009 නොවැම්බර් මාසයේ ඉඳලා. ඒ කාරණය මා පැහැදිලිව විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට කිව්වා. ඒ වාගේ අනෙක් සංස්ථාවලත් ඒ කටයුතු කෙරෙනවා. රජය වෙනුවෙන් මම පැහැදිලිව කියන්න ඕනෑ, රජයේ සේවකයන්ටත්, සංස්ථාවල සේවකයන්ටත් 2010 ජනවාරි මාසයේ ඉඳලා අනිවාර්යයෙන්ම පඩි වැඩි වීමක් දෙනවා කියන එක. කොපමණ ප්‍රමාණයකින්ද කියන එක පස්සේ කල්පනා කරන්න ඕනෑ. ඒ ගැන කථා කරනවා; සාකච්ඡා වනවා. සාමාන්‍යයෙන් විදුලිබල මණ්ඩලයේ පඩි වැඩි වන කොට ප්‍රතිශතයකින් වැඩි වන්නේ. ඒ ප්‍රතිශතය කුමක්ද කියන එක තීන්දු කිරීම සඳහා අපි දැන් කටයුතු කරනවා. ඒ තීන්දුව අනුව පඩි වැඩි වනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. පහු ගිය කාලය තුළ මේ රජය යටතේ කිසිම ආර්ථික සංවර්ධනයක් සිද්ධ වුණේ නැහැ, සෑම අංශයකින්ම පරිහානියක්, කඩා වැටීමක්, අර්බුදයක් තිබෙනවාය කියන එක තමයි අද මෙතැනදී කිව්වේ. නමුත් මා මතක් කරන්න ඕනෑ මේ වන කොට ඇත්ත වශයෙන්ම රටේ ආර්ථිකය ඉතාම සුබදායක තත්ත්වයට පත් වෙලා තිබෙන බව. අපේ ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා, අපේ රටේ ආයෝජනය කිරීම සඳහා පැමිණි ජර්මන් ජාතිකයන් පිරිසක් අමතලා කථා කළ එකක් ඊයේ හෝ පෙරේදා පත්තරයක තිබෙනවා මම දැක්කා. එවැනි තත්ත්වයක් අද රටේ තිබෙනවා. අද මේ රට විදේශිකයන්ට ඇවිල්ලා ආයෝජනය කරන්න, කර්මාන්ත ඇති කරන්න, නිෂ්පාදන ඇති කරන්න සුදුසු රටක් වශයෙන් විදේශිකයන් පිළිගෙන තිබෙනවා. ඒ නිසා අද විදේශීය ආයෝජන තත්ත්වයන් වර්ධනය වේ ගෙන යනවා. ඒක අප දකින දෙයක්. තමුන්නාන්සේලා යන්න නැඟෙනහිර වෙරළට. අද නැඟෙනහිර වෙරළ විශාල වශයෙන් දියුණු වේ ගෙන යනවා. අද ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්න ඉඩම් අර ගෙන, ඒවායේ හෝටල් හදන්න, ගොඩනැඟිලි හදන්න කටයුතු කර ගෙන යනවා. එවැනි විශාල වැඩ කොටසක් අද කර ගෙන යනවා.

එතකොට මෙවැනි තත්ත්වයක් උද්ගත වුණේ කොහොමද? මේ තත්ත්වය උද්ගත වුණේ පසු ගිය අවුරුදු තිහක් තිස්සේ තිබුණු යුද්ධය අවසාන කරලා මේ රටේ ජනතාවට විශ්වාසයක් තැබිය හැකි පරිසරයක් මේ රටේ ගොඩ නඟන්න අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය කටයුතු කරපු නිසාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

රටක ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් වන්නේ සාමය; නීතියේ ආධිපත්‍ය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමයි. සාමය තිබෙන්නට ඕනෑ. නිරන්තරයෙන් ප්‍රචණ්ඩත්වය, නිරන්තරයෙන් බෝම්බ පිපිරිලි, එහෙම නැත්නම් මිනිස් ඝාතන වැනි දේවල් සිද්ධ වනවා නම්, ඒ වාගේම දේපළ විනාශ වනවා නම් මේ රටේ සංවර්ධනය සඳහා දායක වන්න, ආයෝජනය කරන්න කිසිම කෙනෙක් කැමැති වන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අද නිදහස හා සාමය ස්ථාවරව පවතින නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ගමන් මඟ ශක්තිමත් කිරීම සඳහා රජයේ මූල්‍ය ප්‍රතිපත්ති නිසි ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කර ගෙන යනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා, රටක ආර්ථික දියුණුවක් ඇති කරන්න, රටේ නිෂ්පාදනය වැඩි කරන්න ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන්නේ යටිතල පහසුකම් දියුණු කිරීමයි කියන එක. අද ඒක විශාල වශයෙන් සිද්ධ වනවා. පාරවල් හදන්න, විදුලිය ලබා දෙන්න, අනෙකුත් පහසුකම් ලබා දෙන්න අද කටයුතු කර ගෙන යනවා. මා බොහොම සන්තෝෂ වනවා, උතුරු පළාතේ මවුලවිතුමන්ලා ගණනාවක් අද මේ ගැලරියට ඇවිල්ලා සිටීම ගැන. ඒ ගොල්ලන් ඇවිල්ලා සිටින්නේ මන්නාරම් ප්‍රදේශයේ, වව්නියා ප්‍රදේශයේ ඉඳලායි. අද ඒ අය බොහොම සන්තෝෂයෙන් දකුණට ඇවිල්ලා, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ වෙලාව ගත කරන්නේ ඒ අයගේ ප්‍රදේශවල අද සාමකාමී තත්ත්වයක් තිබෙන නිසායි. ඒ අයට ජීවත් වන්න පුළුවන් තත්ත්වයක්, ඒ වාගේම ඒ අයගේ පල්ලිවල දායකයන්ට ජීවත් වන්න පුළුවන් තත්ත්වයක්, හොඳ ආර්ථිකයක් ගොඩ නඟා ගන්න පුළුවන් තත්ත්වයක් අද තිබෙනවා. පසු ගිය දවස්වල ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමාත් සමඟ එතුමාගේ ප්‍රදේශයට යන්න මට අවස්ථාව ලැබුණා. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රදේශවල අද විශාල දියුණුවක් ඇති වනවා. ඒ දියුණුවට දායක වන්න මට පුළුවන්කම ලැබුණා, ඒ ප්‍රදේශයට විදුලිය ලබා දීමෙන්. ඒ ජනතාව ඉතාමත්ම සන්තෝෂයෙන් කථා කළා. "අද අපි අපේ ගොවිතැන් කටයුතු කරනවා. පොඩි කඩයක් හෝ දමා ගෙන අපි අද මොනවා හෝ වෙළඳාම් කරනවා. අපේ ළමයින්ට අද භයක් නැතිව පාසල් යන්න පුළුවන්කම තිබෙනවා. මීට ඉස්සර අපේ ළමයින් පාසල් ගිහිල්ලා ගෙදරට එනකම් ලොකු භයක් තිබුණා. අද ඒවා කිසිම දෙයක් නැහැ. අද ළමයින් පාසල් යවලා අපට කුඹුරුවලට ගිහිල්ලා වැඩ කර ගන්න පුළුවන්. අද ඒ වාගේ භය නැති තත්ත්වයක් තිබෙනවා." කිව්වා. ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමාත් සමඟ මා ගිය වෙලාවේ ඒ ප්‍රදේශවල ජනතාව එහෙම ප්‍රකාශ කළා. එවැනි තත්ත්වයක් අද රටේ තිබෙනවා. ඉතින් මේක තමයි සංවර්ධනයට අවශ්‍ය කරන පදනම; පරිසරය. අද ඒක ගොඩ නැඟෙමින් පවතිනවා. අන්න ඒ නිසා මා හිතනවා, එක්සත් ජාතික පක්ෂයත්, අනෙක් විරුද්ධ පක්ෂත් මේ වෙලාවේ කරන චෝදනා සම්පූර්ණයෙන් පදනම් විරහිතයි, ඒ වාගේම ද්වේෂයෙන් යුතුවයි මේ චෝදනා කරන්නේ කියලා.

අපි දන්නවා රජයේ ආදායමින් සියයට 90ක් බදුවලින් ලබා ගන්නා බව. ඒ වාගේම අපට සිද්ධ වුණා පසු ගිය කාලය තුළ සියයට 80ක් පමණ වක්‍රබදුවලින් ලබා ගන්න. ප්‍රධාන වශයෙන්ම මේ තත්ත්වය අපට උදා වන්න හේතුවක් තිබුණු බව කියන්නට ඕනෑ. අපේ රටටත් වඩා විශාල වශයෙන් ආර්ථික අවපාතයක් ජාත්‍යන්තරයේ ඇති වුණා. ඇමෙරිකාව, එංගලන්තය, ජපානය, යුරෝපා රටවල් වැනි බොහෝ දියුණු රටවල ආර්ථික අවපාතයක් ඇති වුණා. ඒ නිසා අපේ අපනයන නිෂ්පාදනයන් විකුණා ගන්න

[ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

බැරි තත්ත්වයක් තිබුණා. තේ, රබර් වැනි දේවල මිල පහත බැස්සා; මැණික්වල මිල පහත බැස්සා. අපේ කර්මාන්තශාලාවල නිෂ්පාදනය කරන දේවල් මිලට ගන්නා ප්‍රමාණය අඩු වුණා. මේ නිසා අපට යම් ආර්ථික අභේනියකට මුහුණ පාන්න සිද්ධ වුණා. ඒක අපි පිළිගන්නට ඕනෑ. නමුත් ඒකට අපි බොහොම සාර්ථකව මුහුණ දුන්නා. අනෙක් රටවල් මේ ආර්ථික අවපාතය තුළ, අර්බුදය තුළ හිර වෙලා කටයුතු කරන කොට අපට පුළුවන්කම ලැබුණා කොහොම හරි මේකට සාර්ථකව මුහුණ දීලා ඉස්සරහට එන්න. එහෙම පුළුවන්කම ලැබුණේ අවුරුද්දකට පමණ ඉස්සර වෙලා මේ තත්ත්වයට අනුව අපේ ආර්ථිකය දේශීය ආර්ථික අවශ්‍යතාවන් අනුව සකස් කර ගත් නිසායි. "අපි වවමු-රට නඟමු" වැනි සංකල්පයන් ඉදිරිපත් කරලා රටේ ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මේ රට තුළම නිෂ්පාදනය කිරීමට කටයුතු කළා. අපේ තේ, රබර් වැනි දේවල මිල අඩු වන කොට ඒ නිෂ්පාදකයන්ට තමුන්ගේ ආර්ථිකය ගෙන යැමට පුළුවන් වන විධියට, ඒ අයට ඒ කටයුතු කර ගෙන යැමට පුළුවන් වන විධියට රජයෙන් යම් යම් සහනාධාර දුන්නා. රජය දීපු ඒ සහනාධාර නිසා ඒ අයට පුළුවන්කම ලැබුණා තමුන්ගේ කර්මාන්ත අඩු ආදායමක් ලබමින් හෝ ගෙන යන්න. ඒවා වහන්න, එහෙම නැත්නම් ඒවා අත් හරින්න සිද්ධ වුණේ නැහැ.

පසු ගිය කාලයේ -මීට අවුරුදු 15කට 20කට ඉස්සෙල්ලා- තේ මිල පහත බහින කොට තේ වතු අත් හැරියා. දළු කඩන්නේ නැහැ. ඒවායේ කැළෑවල්, තණකොළ එළි කරන්නේ නැහැ. රබර් කැපීම අත් හරිනවා. ඒ රබර් කැළෑවට යනවා. නමුත් මේ ආණ්ඩුව ඒකට ඉඩ දුන්නේ නැහැ. තේ මිල පහත බහින කොට ආණ්ඩුව සහනාධාර දීලා අවම මිලක් පවත්වාගෙන යන්න කටයුතු කරලා ඒ වැවිලි කර්මාන්ත අංශය ස්ථාවරව පවත්වාගෙන යන්න කටයුතු කළා. අද ඉතා විශාල මිලක් -ඉහළ මිලක්- තේවලට ලැබෙනවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද අපේ ප්‍රදේශවල රුපියල් 60ක පමණ මිලක් අමු තේ දළු කිලෝ එකකට ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, වෙලාව අවසානයි.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මට තව විනාඩියක් දෙන්න.

රබර්වලටත් රුපියල් 200ක පමණ මිලක් ලැබෙනවා. ඒ වාගේම මැණික්වල මිල බැහැලා තිබුණත් දැන් හොඳ මිලක් ලැබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ගාලු දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික්කයේ, උඩ රට වැනි සෑම ප්‍රදේශයකම විශාල ජනතාවක් තමුන්ගේ ආර්ථිකය සකස් කර ගන්නා මාර්ගය බවට කුඩා තේ වතු පත් වෙලා තිබෙනවා. මෙවැනි දේවල් පවත්වාගෙන යන්න ආණ්ඩුවට පුළුවන්කම තිබුණත් අද ඒ තත්ත්වය විශාල වශයෙන් වර්ධනය වී ගෙන යන බව මම මතක් කරන්න ඕනෑ. අද කෘෂි කර්මාන්තයේ යෙදී සිටින අයට හොඳ මිලක් ලැබෙනවා. ඒ වාගේම අද යම් යම් තැන්වල ගම්මිරිස්, කුරුඳු වැනි දේවලට හොඳ මිලක් ලැබෙනවා. මේ නිසා අද ආර්ථිකයේ පෙර තිබුණු අයහපත් තත්ත්වය නැහැ කියන කාරණය මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

අදහස් දක්වන්න මට ලැබුණේ ටික වෙලාවයි. ඇත්ත වශයෙන්ම ඉදිරිපත් වෙලා තිබෙන අතුරු සම්මත ගිණුම සම්බන්ධව අනවශ්‍ය විවේචනයක් තමයි කරන්නේ. පැහැදිලිවම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය තහවුරු කිරීම සඳහා මාස හතරකට පමණක් මේ වාගේ ගිණුමක් ඉදිරිපත් කරලා මේ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න කටයුතු කිරීම තමයි මේකෙන් කළේ කියන එක මතක් කරන්න ඕනෑ.

[අ. භා. 1.03]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනයේ සිටින ගරුතර ස්වාමීන් වහන්ස, සාමාන්‍යයෙන් මේ කාලය වන කොට මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ පස් වන අය වැය ඉදිරිපත් කරන්න නියමිත වෙලා තිබුණත් මේ වන කොට ඒ ආණ්ඩුව මුහුණ පා සිටින දැවැන්ත දේශපාලන සහ ආර්ථික අර්බුදය ඉදිරියේ තමන්ගේ වගකීම් රට වෙනුවෙන් ඉදිරිපත් කරනවා වෙනුවට අතුරු සම්මත ගිණුමක් - Vote on Account එකක් - ඉදිරිපත් කරමින් අද ආණ්ඩුව මුහුණ පා සිටින ආර්ථික අර්බුදයේ සැබෑ ප්‍රමාණය රටට හෙළිදරව් කර තිබෙනවා. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රජයක් -එක්සත් රාජධානිය වේවා, ඉන්දියාව වේවා- හැම වෙලාවේම මැතිවරණයකට ඉස්සෙල්ලා පැවැත්වෙන අය වැයක් ගැන විශාල උනන්දුවකින් තමයි කටයුතු කරන්නේ. Election Budget එකක් කිව්වාම රජයත් දන්නවා, ජනතාවත් දන්නවා, ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණය සඳහා, ජනතාවගේ කැමැත්ත ප්‍රසාදය දිනා ගැනීම සඳහා වෙන දාටත් වඩා වැඩි සහන වරප්‍රසාද දීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ එක සිරිතක් බව. විශේෂයෙන්ම පළාත් සභා මැතිවරණය ජය ගන්නත් අසූ කෝටියක් මැතිවරණ පොරොන්දු ලබා දීපු මේ ආණ්ඩුව, හිරිකිතයකින් ලජ්ජාවකින් තොරව අවස්ථාවාදීව ජනතාව නොමඟ යවන්න පොරොන්දු ලබා දීපු මේ ආණ්ඩුව ඉතාමත්ම තීරණාත්මක මැතිවරණයක් හෝ මැතිවරණ දෙකක් පවත්වනවාය කියා මාස ගණනාවක් තිස්සේ කයිවාරු ගහමින් සිටින මොහොතක, ඒ අය මේ අවස්ථාව පාවිච්චි කරලා මැතිවරණය සඳහා ජනතා අය වැයක් පාවිච්චි නොකිරීම තුළින්ම ආණ්ඩුව මුහුණ පා තිබෙන අර්බුදයේ තරම රටට පැහැදිලි වන්න ඕනෑ.

එක පැත්තකින් ගැලරියේ "විසිල්" එකට රඟපාන රාජපක්ෂ ආණ්ඩුව මැදමුලනේ චණ්ඩි පාට් ප්‍රසිද්ධියේ විදේශ රටවලට පෙන්වමින් මේ රටේ සමහර කොටස් පිනෙව්වත්, මේ වන කොට මේ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ඒ අය විවේචනය කරන රටවලම කොන්දේසිවලට අහු වෙලා හමාරයි. මේ අයගේ මේ ක්‍රියා කලාපය නිසා අපේ රටට හැම දාම උදවු කරපු අපේ ජාත්‍යන්තර මිතුරන් අද අපේ හතුරන් බවට පත් වෙලා තිබෙනවා; එහෙම නැත්නම් පත් වෙමින් තිබෙනවා. මේ රජය තව දුරටත් පැවැතුණොත් මේ ජාත්‍යන්තර චණ්ඩිකම නිසා, මේ ජාත්‍යන්තර හබය නිසා අද ඵල විපාක විඳින්නට සිදු වෙලා තිබෙන්නේ, සිදු වෙමින් තිබෙන්නේ, ඉදිරියේදී සිදු වන්නේ වෙන කාටවත් නොවෙයි, මේ රටේ සාමාන්‍ය ජනතාවටයි.

අද ආර්ථික වශයෙන් පමණක් නොවෙයි; අනික් හැම ආකාරයටම අපට උදවු කරපු බොහෝ රටවල් අද අපෙන් ඈත් වෙලා තිබෙනවා. ලංකාව කියන්නේ පුංචි රටක් වුණත්, දුප්පත් රටක් වුණත් 1948න් පස්සේ අපේ දුප්පත්කමට, එහෙම නැත්නම් ප්‍රමාණයට වඩා ජාත්‍යන්තර කීර්තිය දිනා ගත් රටක්. ලංකාවේ නායකයන්ට -හැම ආණ්ඩුවකම හිටපු නායකයන්ට- වොෂින්ටන් නගරයේ ධවල මන්දිරයේ දොරවල් විවෘත වුණා වාගේම මොස්කව් නගරයේ ක්‍රෙම්ලින් එකේත් දොරවල් විවෘත වුණා. ලෝකයේ හැම තැනකින්ම අපේ රට, අපේ නායකයන්, අපේ ජනතාව පිළිගත්තා. අන්න ඒ නිසා තමයි පසු ගිය කාලයේදී ත්‍රස්තවාදයට විරුද්ධව ගෙන ගිය සටන්වලදී පවා අපට ඒ බලවත් රටවල් අපේ ප්‍රමාණයට වඩා, අපේ ශක්තියට වඩා, අපේ මුදල් බලයට වඩා අපට උදවු කළේ. ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනේදී 1998 දී ඇමෙරිකා එක්සත් ජනපදය ඇමෙරිකාව තුළ එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීම තුළින් අපට විශාල හයියක් දුන්නා. මට මතක හැටියට 1998 විතර එක්සත් රාජධානිය ඒ රට තුළ එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීම තුළින් අපේ රටට විශාල හයියක් දුන්නා. එවකට හිටපු අපේ ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේත්, ලක්ෂ්මන් කදිර්ගාමර් හිටපු විදේශ ඇමතිතුමාගේත් ඉල්ලීම් ඒ අය ඒ ආකාරයට ඉටු කළා.

ඒ විතරක් නොවෙයි. 2006 දී විදේශ ඇමතිවරයා වශයෙන් මා සිටින කොට යුරෝපීය සංගමයේ සාමාජික රටවල් වශයෙන් සිටියේ රටවල් 25යි. විදේශ අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ගේ

සහ ලේකම්වරුන්ගේ සහයෝගය ඇතුව ඒ රටවල් විසි පහ තුළම එල්ටීටීඊ සංවිධානයේ තහනම ලබා ගන්නට පුළුවන් වුණා. ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු රාජ්‍ය ලේකම්තුමිය කොන්ඩලීසා රයිස් මැතිනිය සමඟ සාකච්ඡා කරලා, නැඟෙනහිර ආසියාවෙන් එල්ටීටීඊ සංවිධානයට අවි ආයුධ ලබා ගැනීමේ වැඩ පිළිවෙළ නවත්වන්නට link group කියන කණ්ඩායමක් - Cambodia, මැලේසියාව, තායිලන්තය වැනි රටවල් එකතු වෙලා- කටයුතු කරපු නිසා ඒ අයගේ අවි ආයුධ මෙරටට ගෙන ඒම නවත්වන්නට පුළුවන් වුණා. මෙන්න මේ ආකාරයට අපට දිගින් දිගටම විවිධ ආකාරයේ උදවු කරපු රටවල් සියල්ලම අද මේ වන විට අපෙන් ඈත් කර ගෙන හමාරයි. ඒ රටවල් ඈත් කර ගෙන, අපේ රටට සත පහකින්වත් උදවු කරන්න බැරි ඒකාධිපති රාජ්‍යයන්ගේ ග්‍රහණයට අද අපේ ශ්‍රී ලංකාව ක්‍රමානුකූලව පත් වෙමින් තිබෙනවා.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)
තමුන්නාන්සේට කොච්චරක් සල්ලි දුන්නාද ඇමරිකාවෙන්?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි යුද්ධය සම්බන්ධයෙන් වෙනම විවාදයක් පවත්වමු.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, කොන්ඩලීසා රයිස් මැතිනිය තුන් වතාවක් හම්බ වෙලා මම ඇති කර ගත්ත පෞද්ගලික මිත්‍රත්වය උඩ මට පුළුවන් වුණා ඇමෙරිකාවේ සම්පූර්ණ සහයෝගය මේ ලංකාවට අර ගෙන දෙන්න. [බාධා කිරීම්] මේ අය විපක්ෂයේ ඉඳ ගෙන එල්ටීටීඊ සංවිධානයට කඩේ යන කාලයේ අපි තමයි ගරු ස්වාමීන් වහන්ස, ඒ පසු බිම සකස් කළේ. [බාධා කිරීම්] ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස - [බාධා කිරීම්] ඔබතුමාගේ කථාව පස්සේ කරන්න. [බාධා කිරීම්] එල්ටීටීඊ එකට කඩේ ගිහිල්ලා කොල්ලන්ගේ දත් ගලවන කාලයේ අපි මේවා කළා. [බාධා කිරීම්] දත් ගලවපු කාලයේ, මිනිස්සු මරපු කාලේ අපි මේ රට වෙනුවෙන්, මේ රටේ ජාතිය වෙනුවෙන් පෙනී සිටියා. දෙමළ, මුස්ලිම් මිනිසුන් වෙනුවෙන් මේ අය පෙළපාළි යන කොට අපි ඒ අය වෙනුවෙන් පෙනී හිටියා.

හොඳම ආරංචිය මේකයි. දැන් බලන්න, එන සතියේ ලංකාවට එන අලුත්ම අමුත්තා කවුද? බුරුමයේ රාජ්‍ය නායකයා යයි කියා ගන්නා, මීට අවුරුදු විස්සකට කලින් බුරුමයේ පැවැත්වූ නිදහස් මහ මැතිවරණයේදී දිනපු අවුන්ග් සාන් සූ කී මැතිනිය තවමත් හිරේ තියා ගෙන ඉන්න, හමුදා කුමන්ත්‍රණයකින් ඒ රට බාර ගත්ත රාජ්‍ය නායකයා තමයි අද ලංකාවට එන්නේ. මට ආරංචියි බුරුමයේ හමුදා නායකයා අපේ ලංකාවේ ජනාධිපතිවරයා -එහෙම නැත්නම් රජතුමා- රාජ්‍ය ගෞරව ඇතිව පිළිගන්න ලෑස්ති වෙලා ඉන්න බව. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මීට අවුරුදු දෙක තුනකට ඉස්සර වෙලා -2006 දී- භික්ෂූන් වහන්සේලා 1,000කට ආසන්න ප්‍රමාණයක් අමු අමුවේ ඝාතනය කරපු මේ හමුදා නිලධාරියාට මහනුවර දළ දා දැක්මකුත් ලෑස්ති කර තිබෙනවා කියලා අපිට ආරංචියි. මේ යන ගමන මොකක්ද කියලා අපි අහනවා. අපිට ඕනෑ තරම් දේවල් කථා කරන්න පුළුවන්. මේ යන ගමන මොකක්ද? අපි බුරුමය, එහෙම නැත්නම් - [බාධා කිරීම්] වියට්නාමය එක්ක එකතු වෙලා මේ රට සංවර්ධනය කරන්න පුළුවන්ද කියලා අහනවා. බුරුමයත් එක්ක, වියට්නාමයත් එක්කද මේ රට සංවර්ධනය කරන්න බලන්නේ? අපට අත හිත දෙන්න බුරුමයට පුළුවන්ද?

අපි දැක්කා ජනාධිපතිවරයා මීට මාස කීපයකට ඉස්සර වෙලා බුරුමයට ගිහින් ඩොලර් 50,000ක් උස්සා ගෙන ලංකාවට ආවා. හැබැයි බුරුමයට ගිය SriLankan Airlines අහස් යානයට බුරුමයෙන් ලැබුණු මුදලටත් වඩා වැඩි මුදලක් එතුමා ලංකා රජයෙන් වියදම් කළා. මෙන්න මේ වාගේ විහිළු තමයි කරන්නේ. බුරුමයට, වියට්නාමයට අපේ රැකී රක්ෂා ලබා දෙන GSP Plus සහනය ලබා දෙන්න පුළුවන්ද කියලා මම අහනවා. බුරුමයට, වියට්නාමයට, මේ අයගෙ මේ ඉන්න අලුත් මිතුරන්ට අපිට -මේ ලංකාවට- අවශ්‍ය Foreign Direct Investment, එහෙම නැත්නම් ඒ කර්මාන්තශාලා ගෙන එන්න පුළුවන්ද කියලා අප අහනවා. බුරුමයට, වියට්නාමයට- [බාධා කිරීමක්] අනේ! මේ කිසි දෙයක් දන්නේ නැති

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහනවා. මෙතුමා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තවත් කෙනෙක් විතරයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ආණ්ඩුවේ ඔබතුමා ඉන්න. [බාධා කිරීමක්] අනාගතය බලන්න. අපි කථා කරන්නේ නවීන, ජාත්‍යන්තර, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක ඉදිරි ගමන ගැනයි මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. මම අහන්නේ මේකයි. ඔහොම කෑ ගැහුවාට හෙට අනිද්දා රැකී රක්ෂා නැති වෙන්න යන අර තරුණ තරුණියන්ගේ රැකී රක්ෂා බුරුමයේ ඉන්න ඔය මනුස්සයා අපිට දෙනවාද?

නැහැ. අද මේ භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුවේ වැරදි ක්‍රියා මාර්ගය නිසායි. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් විදේශ කටයුතු ඇමතිවරයා හැටියට මම 2006 දී ජනාධිපතිවරයාගේ අවධානය යොමු කළා. 2006 දෙසැම්බර් 13 වන දා මම ජනාධිපතිතුමාට ලිපියක් ලියමින් දැන්නුවේ මොකක්ද? දැන් මම ඒ ලිපියේ කොටසක් කියවනවා:

"I am writing this letter to flag some grave concerns I have regarding the ground situation in the North and the East as well as some other matters related to the ethnic question.

These issues are seriously undermining our credibility as a Government in the eyes of the international community. As I have pointed out in several discussions recently, due to various 'omissions and commissions' on our part as the Government, our image internationally is deteriorating rapidly which may lead to serious repercussions for the country in the coming year.

As Your Excellency's Minister of Foreign Affairs, I would be failing in my Mission to highlight the true nature of the LTTE as a terrorist organization. Despite your duty if I do not highlight some of these concerns and the impending perils."

පිටු 10ක ලියුමක් මා එදා එතුමාට ලබා දුන්නා. මෙහිදී ඇත්ත වශයෙන්ම ඇති විය හැකි එල විපාක සම්බන්ධයෙන් පමණක් නොවෙයි අද අප මුහුණ පා තිබෙන ප්‍රශ්න ගැනත් අප කතා කළා. ඒ ලිපියේ තැනින් තැන තමයි මම මේ කියවන්නේ.

" More importantly, it will bring undue pressure on the Government and there may even be certain sanctions such as the withdrawal of the GSP+ concession, which would have a serious impact on our economy, and the livelihood of thousands of our youth would be at risk."

This was in December 2006. මට තවම මතකයි, එදා දෙසැම්බර් මාසයේ මේ ලියුම යවන්න ඉස්සෙල්ලා කිහිප වතාවක්ම මම ජනාධිපතිතුමා හම්බ වෙලා - විශේෂයෙන්ම ඒ අවුරුද්දේ සුදු වෑන් මිනී මැරුම් පටන් ගත්තායින් පසුව, ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් 5 දෙනෙක් මැරුවායින් පසුව, ඒ වාගේම මුතූර් ප්‍රදේශයේදී ප්‍රංශ කට්ටියක් -17 දෙනෙක්- මැරුවායින් පසුව විදේශ කටයුතු ඇමතිවරයා හැටියට මට මුහුණ

[ගරු මංගල සමරවීර මහතා]

පාන්නට තිබුණු බලපෑම් උඩ මම එතුමා හම්බ වෙලා- දිගින් දිගටම කිව්වා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට කිව්වා. බැසිල් රාජපක්ෂ මැතිතුමාට කිව්වා. ලලිත් වීරතුංග මැතිතුමාට කියා මේ තත්ත්වය නිවැරදි කර ගන්නය කියා යෝජනා කළා. දවසක් මම GSP Plus නැති වනවාය කියා තවත් වතාවක් අපේ ජනාධිපතිතුමාට එදා කියන කොට -එදා අපේ. අද නම් නැහැ. එදා අපේ ජනාධිපතිතුමා.- අන්තිමට ජනාධිපතිතුමා ලලිත් වීරතුංග දිහා බලා මොකක්ද කිව්වේ? ලලිත්, මේ මංගල මොකක්දෝ, හැම වෙලාවේම GSP Plus, GSP Plus, GSP Plus කියලා මතුරනවා. මොකක්ද, ඒ ලලිත්? කියා ඇහුවා. මෙන්න මේ විධියට තමයි එදා මේ බරපතළ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නට පුළුවන් වෙලාවේ මේ ආණ්ඩුව හැසිරුණේ. එසේ හැසිරුණා විතරක් නොවෙයි අන්තිමට මේවාට පිළිතුරු සොයනවා වෙනුවට මොකක්ද ආණ්ඩුව කළේ? අඩු පාඩු පෙන්වා මේ රට නිවැරදි මාර්ගයට ගත යුතුයි කී සියලු දෙනාටම රාජ්‍ය මාධ්‍යයෙන් මඩ ගහන්න පටන් ගත්තා. ඒ ලියුමේ අන්තිමට මම මෙහෙමත් සඳහන් කළා. එය මෙසේයි:

"Finally, I would like to express my concern about the manner in which allegations against the Government are handled by the state media. Instead of responding to the allegations made against us in a factual and credible manner, the people who make such allegations become victims of vicious personal attacks bordering on criminal defamation. A strategy of 'shooting the messenger' will only alienate the international community further away from us."

අපේ හොඳට අපි වෙනුවෙන් යම් යම් අඩු පාඩු පෙන්වන අයව විවේචනය කරලා, ඒ අයට මඩ ගහලා කරන ක්‍රියා මාර්ගයෙන් ජාත්‍යන්තර ප්‍රජාව තවදුරටත් අපෙන් ඈත් වෙයි කියන දෙය එදා මම කියා සිටියා.

අද ඒ තත්ත්වය වෙලා හමාරයි. ඒ තත්ත්වය නිසා අද මේ රට දුක් විඳින්න ආරම්භ කරලා හමාරයි. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ ගැන කියන්න ඉස්සෙල්ලා මම මේ ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේ ලිපියේ වැදගත්කම උඩ කරුණාකරලා මේ මුළු ලිපියම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මෙයට මට කිසි පිළිතුරක් ලැබුණේ නැහැ. වැරැදි, නිවැරදි කර ගත්තේ නැහැ. දින 46කට පසුව මට පිළිතුරක් නම් ලැබුණා, මාව විදේශ අමාත්‍යාංශයෙන් ඉවත් කළාය කියලා. ඒ හැරෙන්නට වෙන පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. අද මේ රජයේ අදූරදර්ශී ප්‍රතිපත්ති නිසා, ඒ වැඩ පිළිවෙළ නිසා අපි ජාත්‍යන්තරයේ දැඩි දෝෂාරෝපණයට ලක් වෙලා තිබෙනවා. ළිං ගෙම්බන්ට නම් පුළුවන් ඇති, ජාත්‍යන්තරය නැතිව ඉන්න. නමුත් දියුණු වන රටක් හැටියට ලෝකය අපට ඕනෑ. දියුණු වන රටවල් අපට ඕනෑ. ඒ අයගේ ශක්තිය, ඒ අයගේ මුදල්, ඒ අයගේ ආයෝජන අපට ඕනෑ. ඒ නිසා අපට ඒවා නැති කර ගන්නට බැහැ. මෙන්න මේ -

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

තමුන්නාන්සේගේ නායිකාවට කීයක් ලැබුණාද? සත පහක් ලැබුණේ නැහැ.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ ඔක්කොටම අපට පිළිතුරු දෙන්නට නම් පුළුවන්. නමුත් ඒවාට පිළිතුරු දෙන්න මට වෙලාවක් නැහැ. [බාධා කිරීමක්] මේවා කියන කොට ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින එක ගැන මා සතුටුයි. හැම වෙලාවේම ස්වෛරීභාවය ගැන කථා කරන කොට මේ සිටින අනෙක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේම එතුමාත් ස්වෛරීභාවය, ස්වෛරීභාවය, ස්වෛරීභාවය කියලා මතුරනවා. මොකක්ද මේ ස්වෛරීභාවය? මේ කියන එක ඉල්ලීමකින්වත් ස්වෛරීභාවය නැති වෙලාද කියලා මා තමුන්නාන්සේලාගෙන් අහනවා. [බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම ඒකට හොඳ පිළිතුරක් දීලා තිබෙනවා, පසුගිය නොවැම්බර් 01 වන ඉරිදා "රාවය" පත්‍රයේ කේ.ඩබ්ලිව්. ජනරංජන මහත්මයාගේ ලිපියකින්. මා ඒකෙන් කොටසක් කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

"කෙසේ වෙතත්, පළමුව කිවයුත්තේ, ජීඑස්පී ප්ලස් සහනය පිළිබඳ ප්‍රශ්නය ලංකාවේ ස්වෛරීභාවයට සම්බන්ධ කිරීම හුදෙක් එය අසන්නන් දේශප්‍රේමීත්වයේ සීතාම්බර පටවලින් සරසා ගොනාට ඇන්දවීමේ තර්කයක් බවය. එය ස්වෛරීභාවය පිළිබඳ ප්‍රශ්නයක් වන්නේ අඩුම ගණනේ කිසිවකු ලංකාවට ජීඑස්පී බලෙන් පටවා, එය දීමට නම් අහවල් කොන්දේසි ක්‍රියාත්මක කළ යුතුයැ'යි කියන්නේ නම්ය."

මේ ජීඑස්පී සහනය ලංකාවේ කාටවත් බලෙන් දුන්නේ නැහැ. මා හිතන්නේ 2003 දී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ තමයි මේක මූලික වශයෙන් සාකච්ඡා කළේ. ඊට පසුව 2005 ජූනි මාසයේ 27 වෙනි දා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් ඒ සඳහා තිබෙන යම් යම් කොන්දේසි අනුව ඒවා පිළිගත්තා. අද සිටින මුදල් අමාත්‍යාංශයේ ලේකම් පවා ඒවා බලලා, ඒ සියල්ලට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. අපි රටක් හැටියට එකඟ වුණු දෙයක්. තමුන්නාන්සේලාත් දන්නවා ඇති, එම සහනය ලැබීමට නම් මෙහි කියන විධියට මානව හිමිකම් පිළිබඳ කොන්දේසි කිහිපයකට අනුකූල වන්නට ඕනෑ කියා. ඒ වාගේම අපි ඒ සඳහා ඉල්ලුම් කරන කොට එහි කොන්දේසිවලට ඇතුළත් වන ප්‍රධාන ජාත්‍යන්තර සම්මුතීන් තුනක් ඇතුළුව මානව හා කම්කරු අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් 16ක් තමන් පිළිගත යුතුව ඇති බව හා රට තුළ සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වුණා. එදා කැබිනට් මණ්ඩලයේ මහින්ද රාජපක්ෂ අගමැතිවරයා වශයෙන් ඉඳ ගෙන මේ සම්මුතීන්වලට එකඟ වන බවට අපිත් එක්ක කැමැත්ත පළ කළා. මේ ඔක්කොම දේවල්වලට අපි කැමැතියි කියලා, රටවල් ඉතාමත්ම සුළු ප්‍රමාණයකට දෙන මේ වටිනා සහනය අපි එදා ලබා ගත්තා. මුළු ආසියාවෙන්ම මේ සහනය දැන් ලබා ගන්නේ මොංගෝලියාව විතරයි. නමුත් ශ්‍රී ලංකාවේ අපි, එදා දියුණු වෙමින් තිබෙන රටක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙලා තිබුණු රටක් හැටියට, ලෝකයේ පිළිගත් නායකයන් හිටපු රටක් හැටියට, බංගලි දේශය, පාකිස්තානය වැනි රටවල් මේ සහනය ලබා ගන්න අපිත් එක්ක රණ්ඩු වෙද්දී, යුරෝපීය සංගමයෙන් මේ සහනය එදා අපිට ලැබුණා. ඊට පසුව 2008 දී -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Also because of the tsunami. You must accept that.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඔව්, ඒක හරි. නමුත් සුනාමි ව්‍යසනයට ලක් වුණු තවත් රටවල් තිබුණා. සුමාත්‍රාව වාගේ රටවල්වලටත් දෙන්න තිබුණා. නමුත් සුනාමි ව්‍යසනය නිසාත් අපට මේක ලැබුණා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

සුනාමි ව්‍යසනය ඇති වීම GSP Plus ලබා ගන්න කොන්දේසියක් නොවෙයි. 2005 රෙගුලාසිවලවත්, 2008

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

රෙගුලාසිවලවත් සුනාමියක් ගැන තිබුණේ නැහැ. එහෙත් අපි අනෙකුත් කොන්දේසි සපුරා තිබුණු නිසා සුනාමියත් මතක තබා ගෙන උදවු කළා. සුනාමි ව්‍යසනය නොතිබුණත් එදා අපට මේක ලැබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රටේ කම්කරු අයිතිවාසිකම් නැද්ද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පොඩ්ඩක් ඉන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලාට සහභාගි වන්න මැතිවරණ නැද්ද? මොනවාද තමුන්නාන්සේ කථා කරන්නේ? මොකක්ද කොන්දේසි ගැන කථා කරන්නේ? මෙතුමා කථා කළේ ස්වෛරීභාවය ගැන.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
විපක්ෂයේ සන්ධානයේ කොන්දේසි නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ නැහැයි කියන්නේ මොනවාද? කියන්න පුළුවන් නම්. අපි උල්ලංඝනය කර තිබෙන්නේ මොනවාද කියා කියන්න. නිකම් වට්ටෝරුවක් කියවන්නේ නැතිව නිශ්චිත වශයෙන් - specifically - කියන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
කියන්න පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රටේ කම්කරු අයිතිවාසිකම් නැද්ද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලාගේ ආණ්ඩුව 1980 දී හැසිරුණු විධියට ද අප හැසිරෙන්නේ?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
80 කථාව ඉවරයි දැන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
1980 දී කොහොමද හැසිරුණේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
80 කට්ටියට දැන් මොනවාද කර තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මංගල සමරවීර මන්ත්‍රීතුමාත් අපත් එකට පෙළපාළි ගියේ මේ ගොල්ලන්ගේ හැසිරීමට විරුද්ධව. මේ ගොල්ලෝ කොහොමද එදා හැසිරුණේ? දැන් කථා කරනවා, කම්කරු අයිතිවාසිකම් ගැන.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
80 දේවල් නැවතත් කරන්න තමුන්නාන්සේලාට කවුරුවත් ජන වරමක් දුන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සාධාරණ ද කථාව? ඒ දවස්වල මුළු ජේවීපී එකම අරගෙන ගිහින් විනාශ කර දැමුවා. තමුන්නාන්සේලා පාරට බැස්සා මතකද, මේ ගොල්ලන්ට විරුද්ධව? මතකද, මේ ගොල්ලන්ට විරුද්ධව පාරේ ගියා? මතකද? [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. සමා වන්න. විපක්ෂයේ නොවෙයි ආණ්ඩු පක්ෂයේ. ළඟදීම විපක්ෂයේ. මට වැරදුණා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මංගල සමරවීර මන්ත්‍රීතුමා නියමිත කථාව කරන්න. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
2004 දී ජීඑස්පී සහනය දෙන්න එකඟ වුණා, අප කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කළ නිසා. ඊ ළඟට 2005 කැබිනට් මණ්ඩලයේදී මෙතුමා අත ඉස්සුවා සහන ඔක්කොම ඉල්ලා ගන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මෙතුමාත් කැබිනට් මණ්ඩලයේ සිටියා. 2005 කැබිනට් මණ්ඩලයේ ජීඑස්පී සහනයට අත්සන් කරන වෙලාවේ මේ දිනේෂ් ගුණවර්ධන ඇමතිවරයා සිටියා. දැන් බොරුවට අගමැතිකම ගැන සිහින මව මවා ඉන්නවා. අපේ දි.මු. ජයරත්න ඇමතිතුමාගේ බෙල්ල කපලා අගමැතිකම ගන්න දැන් බොරුවට නටනවා. හම්බ වෙන්න ඕනෑ මනුෂ්‍යයා එතැන ඉන්නවා. දැන් ඕවා කළාය කියා ඒවා ලැබෙන්නේ නැහැ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක්. පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්සේගෙන් අවසරයි. අද මංගල සමරවීර ගරු මන්ත්‍රීතුමා මේ සභාව අමතන අවස්ථාවේ සඳහන් කළා, තරුණයෝ මරපු යුගයක, බෙල්ල කැපූ යුගයක කියා. මම දැන ගන්න කැමතියි, ඒක මොන යුගයද කියා. [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා කොහොමත් කැපිලා ඉන්නේ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මංගල සමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මට ගොඩාක් කථා කියන්න තිබෙනවා. [බාධා කිරීම්] ඒවා වෙලාවට කියන්න. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මේ ස්වෛරීභාවය සම්බන්ධයෙන් කොන්දේසි තිබෙනවාය කියනවා නම් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම කියන්න ඕනෑ, මේ ගිවිසුමේ කොන්දේසිවල රට දෙකඩ කරන්නය කියා කොන්දේසියක් නැහැ කියන එක. ඔන්න රට දෙකඩ කරන්නය කියා කිව්වා නම් ඒක ස්වෛරීභාවයට හානියක්. මේ ලංකාව තුළ විදේශ හමුදා කඳවුරු පිහිටුවන්නය කියා කොහේවත් කියා නැහැ. ඒකේ ඇත්ත වශයෙන්ම අපේ රටේ ජනතාවට යහපත් වන කොන්දේසි තිබෙන්නේ. අපේ රටේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කළ කොන්දේසි තිබෙන්නේ. අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට මම කියනවා, ඕනෑ ගනුදෙනුවකට යම් යම් කොන්දේසි ඉටු කරන්න ඕනෑය කියලා ඕනෑම පුංචි ළමයෙක් වුණත් දන්නවාය කියන එක. නමුත් මේ තිබෙන කොන්දේසි රටට යහපත් කොන්දේසි. මෙහි තිබෙන එක අයහපත් කොන්දේසියක් මොකක්ද කියා මම ජී.එල්. පීරිස් ඇමතිතුමාගෙන් අහනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම රටේ ස්වෛරීභාවයට හානියක් වනවාද? මම අහනවා. දහහත්වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමෙන් රටට වන හානිය මොකක්ද? නිදහස් මැතිවරණ කොමිසමක් හැදීම රටේ ස්වෛරීභාවයට හානියක්ද? නිදහස් පොලිස් කොමිසමක් හැදීම රටේ ස්වෛරීභාවයට හානියක්ද? [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට වෙන් කර ඇති වෙලාව අවසානයි. [බාධා කිරීම්].

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මොකක්ද? මට ඇහුණේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට වෙන් කර ඇති වේලාව අවසානයි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම තවම පටන් ගත්තා විතරයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා පැය භාගයක් කථා කළා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මට වෙලාව දෙන්නම් කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා පැය භාගයක් කථා කළා. වෙන් කර ඇති වෙලාව අවසන්.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පැය භාගයක් ගත වෙලාවත් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මගෙන් වෙලාව දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි කීයක්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
විනාඩි පහක් දෙනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්සේගෙන් අවසරයි, මම අහනවා, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා එහෙම නම් කථා කරන්න. අකිල විරාජ් මන්ත්‍රීතුමාගේ වෙලාව දෙනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
එතුමාගේ සම්පූර්ණ වේලාවම ඕනෑ නැහැ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මේවායින් ස්වෛරීභාවයට හානි වන යෝජනාව කුමක්ද කියලා, ස්වෛරීභාවයට හානිවන කොන්දේසිය මොකක්ද කියලා

හරියටම කියන්නය කියලා ආණ්ඩුවෙන් මම ඉල්ලනවා. මම ඒ පිළිතුර බලාපොරොත්තු වන්නේ අපේ පැරණි ඇමතිවරුන්ගෙන්. මේ ඊයේ පෙරේදා ගෙම්බෝ වාගේ අනෙක් පැත්තට පැනපු - තනතුරුවලට පැනපු- අයගෙන් නොවෙයි. [බාධා කිරීම්] දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා වාගේ අයගෙන්, දි.මු. ජයරත්න ඇමතිතුමා වාගේ අයගෙන්, මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමා වාගේ අයගෙන් මම අහනවා, "මේකේ තිබෙන ස්වෛරීභාවයට හානි වන කොන්දේසි මොනවාද?" කියලා. මේකෙන් අහන්නේ මොකක්ද? "සම්මුතීන් තුනෙහි බැඳීම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නීති ලංකාවේ පනවා තිබෙනවාද?" ඒවා ලංකාවට හොඳ දේවල්. "ප්‍රායෝගික වශයෙන් එම බැඳීම් හා වගකීම් ක්‍රියාත්මක කෙරෙන්නේද?" මොකක්ද ඒකේ තිබෙන වරද? [බාධා කිරීම්] "මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට සහ උල්ලංඝනය කිරීම්වලදී ප්‍රතිකර්ම ලබා දීමට පිහිටුවා තිබෙන ආයතන නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද?" [බාධා කිරීම්] ඒ කරුණු සොයා බලන්නට තමයි මේ අය- [බාධා කිරීම්] ඊට පසුව අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඇහුව්වා, ඒවායේ තිබෙන කරුණු මොනවාද කියලා. කරුණාකරලා ඒ වාර්තාව කියවන්න. ඒ වාර්තාවේ අපි නොදන්නා කරුණුත් තිබෙනවා. අපිත් සමහර දේවල් හොයන්නේ ඒවායින්. මිනිස්සු මරපු ඒවා, මිනිස්සු උස්සපු ඒවා, සුදු වෑන් සංස්කෘතිය - [බාධා කිරීම්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
කොයි කාලයේද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
2005 සිට 2007 දක්වා මරපු ජනමාධ්‍යවේදීන්ගේ - ජනමාධ්‍යවේදීන් 20කගේ- ලැයිස්තුව මා සභාගත* කරනවා. [බාධා කිරීම්]

මේ විධියට මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මේ මොකක්ද සිදු වුණ - [ඝෝෂා කිරීම්] පොලීසිය, නීතිපති සහ අධිකරණය අද සම්පූර්ණයෙන්ම ඒ ග්‍රහණයට ලක් වෙලා තිබෙනවාය කියන එක මේ වාර්තාවේ කියනවා. [ඝෝෂා කිරීම්] සම්පූර්ණයෙන්ම ග්‍රහණයට ලක් වෙලා තිබෙනවාය කියනවා. [ඝෝෂා කිරීම්] ඒ විතරක් නොවෙයි, - [ඝෝෂා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනෙක් මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිශ්ශබ්ද වන්න. [ඝෝෂා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මානව හිමිකම් කොමිසමේ බලතල සම්පූර්ණයෙන්ම නැති කරලා, -[ඝෝෂා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිශ්ශබ්ද වන්න. අදාළ කථාව කරන්න ඉඩ දෙන්න. [ඝෝෂා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ ගොල්ලෝ හිතනවා, කෑ ගහලා මාව නවත්වන්න පුළුවන් කියලා. මගේ හැටි දන්නේ නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකරලා අදාළ කථාව කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
"මනුෂ්‍ය ඝාතන 17ක් සොයා බැලීමට පත් කරන ලද උදලාගම ජනාධිපති කොමිසමේ ක්‍රියාකාරිත්වය අඩ පණවීමද..."කියලා මේ වාර්තාවේ එක් කරුණක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපේ රටේ අපේ ජනතාවට වෙච්ච අසාධාරණකම් විදේශිකයන් හෝ ඒ අයගේ වාර්තාවලින් හෝ පෙන්වනවා නම් ඒකේ වැරැද්ද මොකක්ද කියලා මා අහනවා, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස.

මට කියන්නට තව ගොඩක් දේ තිබෙනවා. මම අකිල විරාජ් මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ කාලය ගත්තේ නැති වුණත් මම තවත් එක් කරුණක් අපේ පැරණි මැති ඇමතිවරුන්ගෙන් අහනවා. හරි, යම් කිසි විධියකට මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක වන්නේ නැත්නම්, යම් කිසි විධියකට මේ රටේ පොලීසිය ස්වාධීනව ක්‍රියාත්මක වන්නේ නැත්නම්, මේ රටේ අධිකරණය හරිහැටි ක්‍රියාත්මක වන්නේ නැත්නම් මේ රටේ ජනමාධ්‍ය නිදහස සම්පූර්ණයෙන්ම නැති කරලා තිබෙනවා නම් ඇයි, අපට - [ඝෝෂා කිරීම්] මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මම අහන්නේ මෙච්චරයි. [බාධා කිරීමක්] අන්තිමට මම ඔබතුමාගෙන් එකක් අහන්න කැමැතියි. මෙන්න මේ කරුණ අහනවා. ආධාර ඉල්ලා ගෙන තමුන්නාන්සේලාට හිඟමනේ යන්නට හොඳයි, සුද්දෝ ළඟට ගිහින් හිඟමන් කන්න හොඳයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - வீடமைப்பு அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Minister of Housing )
ඇයි, නෝර්වේ ගිහිල්ලා- [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ආධාර ඉල්ලන්න හොඳයි. හාල් පොත කපන්න කියලා සුද්දෝ කිව්වාම හාල් පොත කැපුවා. මුද්දර පොත කපන්න කිව්වා. [ඝෝෂා කිරීම්] මේ ඔක්කොම කරනවා. ඒවා කරන්න කිව්වාම ඒවා කරන කොට ආධාර දෙන රටවලට අපි ගිහින් කිව්වා, "තමුන්නාන්සේලාට පුළුවන් නම් මේවා නවත්වන්න" කියලා.

"...එහෙම නම් ආධාර දීමේ දී එය කොන්දේසියක් වශයෙන් දාන්නය කියන එක වැරදිද කියා මම තමුන්නාන්සේගෙන් අහනවා..."

මෙහෙම අහන්නේ මම නොවෙයි. ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා. එතුමා 1991 ජනවාරි මාසයේ 25 වැනි දින කියපු දෙයක් එදින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 424හි සඳහන්ව තිබෙනවා. [බාධා කිරීම්] එතුමා මේ පාර්ලිමේන්තුවෙන්ම අහනවා ආධාර කපන්නය කියන එක වැරදිද කියලා. ඒ අනුව එතුමා පිළිගන්නවා රටින් රටට ගිහිල්ලා ආධාර කපන්නය කියලා කිව්ව බව. [බාධා කිරීම්] එතුමා ඒවා පිළිගන්නවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ගීතාංජන ගුණවර්ධන ඇමතිතුමනි, තරහ ගිහිල්ලා තිබෙන්නේ ඇයි?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ බලන්න.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena )

හැන්සාඩ් වාර්තාවලින් නොවෙයි කථා කරන්නේ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකද? ඉඳ ගන්න. ඇයි තමුන්නාන්සේට ඉඳ ගන්න බැරිද? [බාධා කිරීම්]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මෙන්න තවත් එකක්. මේකත් අහන්න. මේ මම නොවෙයි කියන්නේ. මෙ 1990 ඔක්තෝබර් 25 වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 365. ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙන්න මේ විධියට අහනවා:

"සංස්ථා වහන්නය, රස්සාවලින් මිනිසුන් අයින් කරන්නය, හාල් පොත් නැති කරන්නය, අහිංසක දුප්පතාගේ බඩට ගහන්නය, සීනි මිල වැඩි කරන්නය, සී.ටී.බී. එක පෞද්ගලිකකරණය කරන්නය කියා ලෝක බැංකුවට කියන්න පුළුවන් නම්, එවිට ඒ කීම අනුව ඒ විධියට මේ ආණ්ඩුව නටනවා නම්, අපි ආධාර දෙන රටවලින් ඇහුවා,..."

මේ "අපි" කියන්නේ මම නොවෙයි, තමුන්නාන්සේලාගේ ලොක්කා.

"ඇයි බැරි ආධාර දෙන ගමන් බොලාට මේ රටේ මානව අයිතිය පිළිබඳ කොන්දේසියක් පනවන්න" කියා.

මෙන්න. "ඇයි බොලාට" අර නියම මැදමුලනේ භාෂාව. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් දන්නවා. අපේ දකුණේ හම්බන්තොට හොඳ භාෂාවෙන්ම එතුමා පාර්ලිමේන්තුවේ දී අහනවා, "මේවා කරනවා නම් ඇයි බොල උඹලාට බැරි මේකට කොන්දේසි පනවන්න?" කියලා. ඒ නිසාම තමයි අද මමත් අහන්නේ, ඇයි මොකක්ද මේකේ තිබෙන වැරැද්ද කියලා. [බාධා කිරීම්] මේ ක්‍රමය හඳුන්වලා දුන්නේ, රටක් වැරදි කරන කොට ඒ රටට තහංචි පනවන්නය කියලා ඉස්සර වෙලාම මේ පාර්ලිමේන්තුවේ යෝජනා කළේ වෙනත් කවුරුවත් නොවෙයි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන අපේ වර්තමාන මහ රජතුමායි. ඒ ගැන මේ හැන්සාඩ් වාර්තාවල සම්පූර්ණයෙන්ම තිබෙනවා. එහෙම නම් එදා හොඳ එක අද නරක් වුණේ කොහොමද? ඇත්ත වශයෙන්ම අපි එදා ප්‍රේමදාස යුගය විවේචනය කළාට, අද සිදු වන දේවලින් සියයට එකක්වත් එදා ප්‍රේමදාස යුගයේ සිදු වුණේ නැහැ. දැන් බලා ගෙන යන කොට මේ වාගේ භීෂණයක්, මේ වාගේ නාස්තියක්, මේ වාගේ විනාශයක්, මේ වාගේ සම්පූර්ණ දූෂණයක් තිබුණේ නැහැ. ප්‍රේමදාස ජනාධිපතිතුමා බෙරලියේ ඉඳලා ඇල්බට් ක්‍රසන්ට් එක දක්වා මාලිගා හද, හදා ගියේ නැහැ. [බාධා කිරීම්] අද ලංකාවේ හැම තැනකම මාලිගා හදලා ඉවරයි. අපි ළඟදිම ඒ මාලිගාවල පින්තූරත් පෙන්වන්නම්. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මෙන්න මේ තත්ත්වය යටතේ තමයි අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ- [බාධා කිරීම්] මේ තත්ත්වය ඇති කළේ වෙන කවුරුවත් නොවෙයි. අද මේ රට මේ තත්ත්වයට තල්ලු කළේ වෙන කවුරුවත් නොවෙයි. හෙට අනිද්දා රැකීරක්ෂා දහස් ගණනක් නැති වුණොත්, ඒ නැති කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, මේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ නොහැකියාව, බැරිකම නිසා බව ප්‍රකාශ කරමින් මා මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද ලිපිය:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
*Letter tabled:*

13 December 2006

**H.E. President Mahinda Rajapaksa**

Your Excellency,

I am writing this letter to flag some grave concerns I have regarding the ground situation in the North and the East as well as some other matters related to the ethnic question. These issues are seriously undermining our credibility as a Government in the eyes of the international community. As I have pointed out in several discussions recently, due to various 'omissions and commissions' on our part as the Government, our image internationally is deteriorating rapidly which may lead to serious repercussions for the country in the coming year. As Your Excellency's Minister of Foreign Affairs, I would be failing in my Missions to highlight the true nature of the LTTE as a terrorist organization. Despite your duty if I do not highlight some of these concerns and the impending perils.

As you are aware, during the first six months of your Presidency, confounding many critics, Sri Lanka achieved many significant and outstanding diplomatic victories in relation to our fight against terrorism. Under your guidance and leadership, my Ministry was able to launch a vigorous and effective campaign abroad through our diplomatic genuine invitation to the LTTE leader in your inaugural speech as President, the LTTE responded by unleashing yet another terrible phase of terror against the armed forces as well as innocent civilians. Yet you remained calm and restrained; your patience was commended by all sections of the international community and you were seen and respected as a leader who was genuinely committed to a negotiated settlement with the LTTE. Finally in April, when you were compelled to respond to the continuing campaign of terror by the Tigers with military operations 'limited in time and scope', the international community perceived the situation with a great degree of sympathy and understanding. As a result, the EU and Canada banned the LTTE and the US State Department initiated a special unit to monitor the activities of the LTTE subsequent to my meeting with DR. Condoleezza Rice in January. A contact group headed by the US was also formed to monitor the LTTE's arms procurement activities in Southeast Asia.

Since your State visit to India in December last year, Indo-Sri Lanka relations were further strengthened and even in the area of military procurement, India provided us with all our requested requirements. Subsequent to one such request I conveyed to the Indian Prime Minister and the Defense Minister, a special team was sent to Colombo within 48 hours to assess our needs. In fact, the former Indian High Commissioner Nirupama Rao informed me that India has not provided so much military help to Sri Lanka since IPKF days. UK and Australia have also come down heavily on LTTE fund raising. The Government of Japan reiterated their commitment to our sovereignty and threatened to ban the LTTE if they do not return to the negotiating table.

Despite the mounting pressure against the Government in recent months, my Ministry was also successful in stalling some UN human rights resolutions unfavorable to Sri Lanka. In fact, Prabhakaran's November 27th speech bears ample testimony to the effectiveness of the Government's diplomatic offensive when he accused the international community of siding with the Sri Lanka Government.

Unfortunately, during the last few months, as a result of various allegations made by sections of the international media and our inability to respond to such allegations in a credible manner, we are at risk of losing much of the goodwill gained during the last year. It is in this context I am writing to Your Excellency with a great sense of urgency, to highlight some concerns which need to be addressed immediately.

**HUMAN RIGHTS** :

There have been persistent reports about alleged abductions and extra-judicial killings attributed to government forces as well as the Karuna faction and the LTTE. These alleged abductions and killings have been reported both from cleared areas and uncleared areas. Whether or not these were committed by terrorist groups or Government agencies, it is the responsibility of the Government to investigate and prosecute the perpetrators in keeping with Sri Lanka's treaty commitments. When such prosecutions do not take place, the Government will be blamed for allowing a culture of impunity.

Under your directives, we have taken some action to address these problems. Justice Tilakawardene's Committee and special police teams are to investigate the most published cases. Trincomalee student killings and the killing of MP's Pararajasingham and Raviraj as well as Mr. Kethiswaran Loganathan and others are among these. The establishment of a hybrid Commission (local inquiry commission coupled with international observer groups) to investigate the killing of NGO workers in Muttur and other high profile human right cases is another innovative procedure to address this problem and to ensure there is no culture of impunity in Sri Lanka. This is a novel procedure that's been broadly appreciated. It allows international transparency without undermining our sovereign authority to investigate.

However, even anti-LTTE human right groups such as UTHR, Human Rights Watch and other civil society groups including those in South Sri Lanka, have continued to report about abductions and disappearances in Jaffna and even in Colombo. In addition, there have been instances of alleged disappearances of church personnel in operational areas and alleged disappearances of family members of relief organization employees including UN Agencies in Jaffna. These allegations are sent by anti-Sri Lanka lobby groups to UN human rights machinery and diplomatic missions in Colombo. These reports are also sent to foreign capitals by Diaspora groups which are funded by the LTTE.

Even when investigations are being carried out, the process of perpetrators being brought to justice is extremely slow. As a result, there is a perception that authorities are turning a blind eye to these matters. As such, the impression of a culture of impunity gains further credence.

Unfortunately, some local political parties and certain overactive local human rights campaigners take these issues to international organizations such as the Human Rights Council in Geneva and the UN Forum in New York.

This paucity of investigations and prosecutions coupled with continuing military activity by armed forces responding to LTTE terrorism is being portrayed internationally as a situation of grave human rights concern. European countries which have already banned the LTTE are now trying to pass resolutions against the Sri Lanka Government in order to balance the situation by bringing in strictures against the Government on human rights issues. We have been able to put pressure on EU countries to differ these resolutions so far but if such allegations continue, they will bring back another resolution at the next session of the Human Right Council early next year. Such adverse resolutions will give a propaganda advantage to the LTTE. More importantly, it will bring undue pressure on the Government and there may even be certain sanctions such as the withdrawal of the GSP+ concession, which would have a serious impact on our economy, and the livelihood of thousands of our youth would be at risk.

**ACTION TO BE TAKEN** :

(a) Expedite the operations of the inquiry commission.
(b) Issue instructions to the Police and Attorney General's Departments to bring to Court as many cases as possible which are being investigated.
(c) Create a Task force under the Ministry of Justice and Ministry of Human Rights to provide weekly briefings to all interested parties including the media and the diplomatic community on the progress of the investigations and court cases. There is no point in investigating if cases are not brought before the courts or no publicity is given. Despite repeated requests by the Foreign Ministry, this is not happening now.
(d) Issue instructions to the Police and Armed Forces to abide by human rights and humanitarian laws. This can be done by the Ministry of Defense through their "Human Rights Cell" headed by Brig. Mohanthi Peiris. Such action within the system will not affect the morale of the forces.

If these actions are not taken, even belatedly, and if the HR situation and the humanitarian situation worsen due to terrorist and military activity, western countries, especially the EU, and even India may launch international activities to bring pressure on the Government. The LTTE will derive political propaganda benefits from this. A similar situation arose during the UNP regime where large numbers of alleged disappearances were brought before international bodies. This kind of situation should be avoided at all cost.

**HUMANITARIAN SITUATION** :

It is understood that due to continuing terrorist violence and military activity, international organizations are preparing a Common Humanitarian Action Plan (CHAP) for January – June 2007. Assuming there will be an escalation of military action, the IDP population, now around 200,000, will rise to about 4000,000 by early next year. They also expect higher civilian causalities, property damage, forced recruitment of child soldiers by the LTTE and Karuna and increased terrorist violence giving rise to humanitarian and human rights emergencies in Wanni , Jaffna, Mannar, Trincomalee, Batticaloa and Ampara and in adjacent Sinhalese & Muslim areas. If these humanitarian emergencies are not addressed it could result in:

(a) Increasing international concern and condemnation of all parties to the conflict, especially the Government.
(b) Possibility of Sri Lanka situation being forcibly "dragged" before international bodies such as the Security Council, Human Rights Council, EU Parliament the US Congress etc.
(c) Possibility of India supporting international action against the Government if the outflow of refugees to India continues to increase resulting in added Tamil Nadu pressure on Delhi.

It is therefore necessary for the Government to immediately address the situation and preempt adverse international action. Since the Government has no access to certain areas and if it is necessary for the armed forces to take military action in these areas, it would be prudent for the Government to use international organizations available in Sri Lanka to supply humanitarian assistance. This would prevent any international initiatives from 'forcing themselves' on us and dictating intrusive humanitarian assistance.

I suggest that the Consultative Committee on Humanitarian Assistance, which has been already created with the participation of the Ministry of Defense and other line agencies as well as UN agencies in Colombo, study the Common Humanitarian Action Plan (CHAP) and take charge of any humanitarian action plan being proposed by local or international agencies. This would ensure the Government has control over the humanitarian situation in the event of any further escalation in the conflict. Such a step would also help avoid unnecessary conflicts with humanitarian agencies and civil society organizations that create propaganda advantages for the LTTE.

Such anticipatory preventive action would minimize or mitigate adverse international reaction due to escalation of military action. These mitigating measures would help alleviate increased IDP problems, human rights issues, food aid and food security, livelihood issues, especially the complaints of the fishing community and health and education concerns in the affected areas.

**CHILD SOLDIERS :**

The issue of child soldiers is one of the main planks on which the Government has maintained the high moral ground against the LTTE. The Government action against the LTTE's reprehensible acts of recruiting child soldiers was much appreciated by the international community. One of the main reasons for the EU ban on the LTTE, was this abhorrent practice of forced child recruitment.

The Foreign Ministry in consultation with NCPA had been working continuously to bring pressure on the LTTE regarding child soldiers by providing a variety of reports to international entities such as HCHR, Human Rights Watch and UNSG Representative Olara Otunnu to get the UN Security Council to bring the LTTE under sanctions. Immediately prior to Your Excellency's visit to New York, Human Rights Watch released a major report on LTTE fundraising. We are hope that in the very near future, the UN Secretariat will recommend sanctions on the LTTE under Security Council Resolution 1612.

However, as the Allan Rock episode Indicated, allegations about recruitment of child soldiers by Karuna and the Government inability to act against this practice have eroded the Government's high moral ground and helped the LTTE deflect criticism on this issue. When we first received indications of this problem as far back as June 2006, we alerted the Ministry of Defense, SCOPP and the other relevant agencies requested information and reports to negate and possibly preempt these allegations. Unfortunately no such information was forthcoming, and as a result, an opportunity to bring sanctions on the LTTE was diluted. What is more disturbing is that the Government is being dragged into a confrontation with international entities on an issue where the Government had maintained the high moral ground. There is the danger of Sri Lanka being brought before the Security Council regarding this issue.

This needs to be avoided and we must provide maximum cooperation to the UN to investigate and bring sanctions on LTTE on this issue. While we may justifiably criticize 'the messenger' Allan Rock, we must also address this issue where we had advance notice but did not take any preemptive and remedial action.

**ACTION TO BE TAKEN :**

(a) Even at this latter stage, the Ministry of Defense or NCPA should conduct an inquiry of their own on the alleged complicity the Karuna faction, the LTTE or any other entity deploying children for combat.

(b) The Government can not afford to face accusations that a person or entity is allowed to practice such war crimes on Sri Lankan territory. The Government needs to be completely transparent on this issue.

**DEVOLUTION :**

Despite heavy lobbying by the LTTE and its front organizations, the Government was finally able to convince the EU to impose a ban on the LTTE. The Foreign Ministry, under your Excellency's directives, worked resolutely on getting the LTTE proscribed in the EU and Canada. Even Prabhakaran acknowledged this fact in his speech of November 27. As you would recall, this decision by the EU provided the Government with an opportunity to launch a constitutional reform process. The international community, especially India welcomed this initiative. We must build on this platform and not demolish it.

Now that the Expert Committee has come up with two sets of recommendations, one supported by a majority of the Committee and the other supported by the minority, it is critical that we treat these proposals in a careful and well planned manner. Since Your Excellency has declared our policy on the resolution of the national question as 'maximum devolution of power that will ensure an undivided Sri Lanka', it is critical to use these reports, albeit two sets of views, to continue a political dialogue that will garner the support and synergies of moderate Tamil opinion, broad based public view of the South and the international community who favor devolution.

Our reaction to the output of this Committee should not create the impression that the Government is distancing itself from the policy of devolution which your Excellency articulated so well in our Parliament, At the UN General Assembly, Asia Society in New York and to PM Manmohan Singh. Above all, a devolution friendly policy is essential to carry forward your vision of making a distinction between the genuine aspirations of the Tamil people and the LTTE's polity as a terrorist group. If the Government is seen as an advocate of a devolution package that addresses the grievances of the Tamil people, The LTTE will become far less appealing to the Tamils.

I am of the opinion that it is not necessary for the Government to take a position that supports or rejects the two views expressed by the Expert Committee. Nor is it desirable for the Government distance itself from creative proposals on the devolution of power that will help to ensure an undivided Sri Lanka. The two sets of proposals are not mutually exclusive and are only a preliminary step in a continuous process of interaction at political and expert levels. By careful and creative fusion of these ideas, majority and minority segments can be made complementary to each other. These two reports represent a collection of substance for maximum devolution and safeguards for the centre against secession. Now that we have the primary material, we need to carefully structure and fuse these elements into a balanced framework that will facilitate consensus. This is possible through dialogue and we need not make any hasty pronouncements. The Government should continue to strongly advocate devolution as the instrument of a political solution to the national issue while nurturing its support base within Sri Lanka and internationally. Unlike the previous proposals, let us not allow this devolution effort be doomed to failure.

Finally, I would like to express my concern about the manner in which allegations against the Government are handled by the state media. Instead of responding to the allegations made against us in a factual and credible manner, the people who make such allegations become victims of vicious personal attacks bordering on criminal defamation. A strategy of 'shooting the messenger' will only alienate the international community further away from us.

Your Excellency, I wish to thank you for your support and extend to you my best wishes. With warm regards,

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ වචන ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මී ළඟට ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඒ වචන ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනවශ්‍ය දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මේ සඳහා ඔබවහන්සේගේ බලය, 78 වන ස්ථාවර නියෝගයේ බලය -

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද වෛරයෙන්, ක්‍රෝධයෙන් තමන්ගේ සියලු දේවල් වහ ගන්න ජනාධිපතිතුමාට විරුද්ධව කථා කළ දේවල්, ඒ අවලාද හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියා ඉල්ලා සිටිනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අවලාද කියන්නේ මොනවාද? එතුමා කියපු ඒවාද අවලාද? [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා කථා කරන්න.

[අ. භා. 1.42]

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා (අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - ஏற்றுமதி அபிவிருத்தி, சர்வதேச வர்த்தக அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Export Development and International Trade)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, GSP Plus ප්‍රශ්නය පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ වුණු නිසා ඒ සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම සුදුසුය කියා මා හිතුවා. මා කියන්න කැමැතියි අපේ ස්ථාවරය. පැහැදිලිව අපි පිළිගන්නවා GSP Plus සහනය ලබා ගැනීම සඳහා- [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අප පිළිගෙන තිබෙන කොන්දේසියක් තමයි මානව හිමිකම්වලට සම්බන්ධ ගිවිසුම් 27ක් මේ රටේ ක්‍රියාත්මක කළ යුතුය කියන එක. ඒක අපි පිළිගෙන තිබෙනවා. ඒත් පක්ෂ භේදයෙන් තොරව අප සියලු දෙනාම පිළිගත යුතු එක මූලික කරුණක් තිබෙනවා. GSP Plus සහනය ලබා ගැනීම සඳහා හෝ වෙන ඕනෑම අරමුණක් ඉටු කර ගැනීම සඳහා හෝ එක්තරා සීමාවකට එහා මේ රටේ අභ්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අභිමතය, ඒ බලය විදේශීය ආණ්ඩුවකට පැවරීමට අපි සූදානම් නැහැ. මා හිතන විධියට කිසිම දේශපාලන පක්ෂයක් ඒකට සූදානම් නැහැ. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ නිසා තමයි අපි දිගින් දිගටම කරුණු ඉදිරිපත් කරන්නේ. සවස 3.00ට මා හමු වන්න එනවා බ්‍රසල්ස් නගරයේ, යුරෝපීය කොමිෂන් සභාවේ ඉහළ නිලධාරියෙක්. අපි එතුමන්ලාට පැහැදිලිව කරුණු කියනවා. එතුමන්ලා පත් කරපු ඒ විශේෂඥ කමිටුවේ වාර්තාවේ නොයෙක් දෝෂ අන්තර්ගත වෙලා තිබෙනවා. ඒ අය ඒක නැහැ කියන්නේ නැහැ. ඒ අය අපට පූර්ණ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා ඒ සම්බන්ධයෙන් නියම තත්ත්වය යුරෝපීය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට. නොවැම්බර් 6 වන දාට ඉස්සෙල්ලා අපේ තර්ක ඉදිරිපත් කරන්නය කියලා ඒ අයම අපට පැහැදිලිව ආරාධනා කරලා තිබෙනවා. එතකොට අපි සියලු දෙනාම -අපේ විදේශ කටයුතු ඇමතිතුමා, මම, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා, ගරු මිලින්ද මොරගොඩ ඇමතිතුමා- ඒ වාර්තාව ගැඹුරු අධ්‍යයනයකට ලක් කරලා ඒකට සවිස්තරව පිළිතුරු සපයලා තිබෙනවා. ඒ ලියවිල්ල සම්පූර්ණ කරලා තව දවස් දෙකක් ඇතුළත බ්‍රසල්ස් නගරයට යැවීමට අපි වැඩ කටයුතු සලස්වා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරනවාද කියලා කියන්න.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒකේ කිසිම රහසක් නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ ඒක මේ සභාවට ඉදිරිපත් කරනවාද?

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒ කියන්නේ අපේ පිළිතුරද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, ඔව්.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඉස්සෙල්ලාම අපේ පිළිතුර ඒ අයට යවන්න ඕනෑ. මා දන්නේ නැහැ ඒ ගොල්ලෝ පිළිතුරක් එවාවිද කියා. ඒක හෙළිදරව් කිරීමට අපේ කිසිම විරෝධයක් නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපේ පිළිතුර තමුන්නාන්සේ මේ සභාවට ඉදිරිපත් කරනවාද?

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒ කියන්නේ අප යවන පිළිතුරද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, ඔව්.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මට ඒකට දැන් උත්තරයක් දෙන්න බැහැ. ආණ්ඩුව ඇතුළේ ඒ ගැන සාකච්ඡා කරලා මම තමුන්නාන්සේට කියන්නම්. තමුන්නාන්සේ ඒ පිළිබඳව මට ප්‍රශ්නයක් යොමු කරලා තිබෙනවා. මම ඒකට හෙට උදේ පිළිතුරු දෙනවා. මම ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ගැන සාධාරණව හිතන්න කියලා.

මා එක කාරණයක් කියන්නම්. මේ විධියේ දෙයක් එතැන කියනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් අහන කොට අග්‍ර විනිශ්චයකාරතුමාට තිබෙන බලය සම්බන්ධයෙන් හිතමු. ඒ කියන්නේ යම් කිසි නඩුවක් විභාග කිරීම සඳහා විනිශ්චය මඬුල්ල පත් කිරීම සම්බන්ධයෙන්. ඒ පිළිබඳව යම් යම් විවේචන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට පුළුවන්ද විදේශීය ආණ්ඩුවකට බලයක් පවරන්න? ඒ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා යම් යම් අවස්ථාවලදී මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විධායකයට විරුද්ධව, විධායක ශාඛාවකට විරුද්ධව ප්‍රතිකර්ම ලබා ගැනීමේ යම් යම් දුෂ්කරතා තිබුණා කියලා. දැන් මේ නිදර්ශනය ගැන අපි මොහොතක් හිතමු. යුද්ධය පැවැතුණු කාලයේදී -අද නොවෙයි- ඉතාම බිහිසුණු වාතාවරණයක් මේ රටේ පැවැතුණු අවස්ථාවේදී රජය තීරණය කළා කොළඹ නගරය තුළ මාර්ග බාධක අවශ්‍යයි කියලා. මනුෂ්‍ය ජීවිත ආරක්ෂා කිරීම සඳහා මාර්ග

[ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා]

බාධක අවශ්‍යයි කියලා රජය තීරණය කළා. ඊට විරුද්ධව යම් කිසි සංවිධානයක් මානව හිමිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒක සලකා බලලා නියෝගයක් කළා මේ මාර්ග බාධක ඉවත් කරන්න කියලා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි, මානව හිමිකම්වලට විරුද්ධයි, තමන් කැමැති තැනකට යෑමේ නිදහසට විරුද්ධයි, ඒ නිසා වහාම ඒ මාර්ග බාධක ඉවත් කරන්නය කියලා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් කළා. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලය ඒ ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි අවංකව හිතුවා මේක වැරැදි තීරණයක්, මේක ක්‍රියාත්මක කිරීම තුළින් ලොකු හානියක් සිදු වන්න පුළුවන් කියලා. ඒ කියන්නේ වටිනා මනුෂ්‍ය ජීවිත නැති වන්න පුළුවන් කියන ස්ථාවරයේ අපි පැහැදිලිව සිටියා. එහෙත් ඒක ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් නිසා ගැඹුරින් ඒ ප්‍රශ්නය ගැන හිතලා අපි තීරණයක් ගත්තා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය අපේ ගරු ඩිව් ගුණසේකර මැතිතුමා මෙතැන ඉන්නවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත වෙලා තිබෙනවා බලය බෙදීමේ න්‍යාය. ශ්‍රේෂ්ඨාධිකරණය එහෙම තීන්දුවක් දීපු නිසා අපි ඒකට හිස නැමුවා; ඒකට අවනත වුණා. එහෙත් අපි අවංකව හිතුවා, මේක වැරැදි දෙයක්, රටට හිතකර දෙයක් නොවෙයි, භයංකාර දෙයක් කියලා. ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා, ඊට පස්සේ ඔබතුමාගේම ප්‍රදේශයේදී ගරු ද.මු. දසනායක ඇමතිතුමා ඝාතනය කළ බව. මම ඔබතුමාට අවංකව මේ කාරණය කියනවා. එදා ඒ අවමංගල උත්සවයට මම සහභාගි වුණා. එතැනදී කථාවක් කළා ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා. එතුමා ඒ කථාවේදී කිව්වා, "මම හිරේ යන්න බය නැහැ. මම ඇත්ත කතා කරනවා" කියා. මා ඒ අවස්ථාවේ එතැන හිටියා. ද.මු. දසනායක ඇමතිතුමාගේ අවමංගල උත්සවයේදී ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා කරපු කතාවට මා ඇහුම් කන් දුන්නා. එතුමා කිව්වා, ඒ මාර්ග බාධක එදා ඉවත් නොකළා නම් මේ මිනී පෙට්ටියේ ඉන්න අපේ සහෝදර අමාත්‍යතුමා අද අප සමඟ ජීවතුන් අතර සිටිනවා කියලා. එතුමා එහෙම කිව්වා. ඊට සති කිහිපයකට පසුව ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමාටත් ඒ ඉරණමම අත් වුණා. අපි එදාත් කිව්වා, අදත් කියනවා ඒ තීරණය වැරදි තීරණයක් කියලා. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයක් නිසාත්, නීතියේ ස්වාධිපත්‍යයට ගරු කරන රජයක් නිසාත් අපි ඒක ක්‍රියාත්මක කළා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මෙන්න මේ විධියේ කරුණු තමයි අපි බ්‍රසල්ස් නගරයට ඉදිරිපත් කරන්නේ. ඔබතුමන්ලා කියනවා, බලය බෙදීමක් නැහැ, විධායකය හිතුවක්කාර විධියට කටයුතු කරන කොට ඒවා සීමා කරන්නට, ඒවා පාලනය කිරීමට කාර්යක්ෂම ප්‍රතිකර්ම ඉදිරිපත් වෙලා නැහැ කියලා. අපි කියනවා ඒක වැරදි මතයක්, ඒක වැරදි නිගමනයක් කියලා. අපි හැමෝම පෘථග්ජනයින්. අපි හැමෝම හැම දේම දන්නේ නැහැ. එම නිසා යුරෝපීය කොමිෂන් සභාව නිහතමානී ලෙස පිළිගන්නවා ඒ අයගෙන් යම් කිසි වැරදීමක් සිදු වුණා නම්, වැරදි නිගමනයකට පැමිණියා නම්, ඒ අයගේ විග්‍රහ, විශ්ලේෂණ දෝෂ සහිත නම් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා රජයට අවස්ථාව සපයා දිය යුතුයි කියලා. ඒ අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගන්නවා, මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, GSP Plus නැති වුණා කියලා ආණ්ඩුව වැටෙන්නේ නැහැ. ඒකෙන් හානියක් වන්නේ මේ රටේ දිළිඳු ජනතාවට. මා ඒක අද මා හමු වන්න එන ඒ උසස් නිලධාරි මහත්මයාට පැහැදිලිව කියනවා. අපේ ස්ථාවරය ඒකයි. ගරු මංගල සමරවීර මන්ත්‍රීතුමාට මා දෙන පිළිතුර තමයි GSP Plus සහනය මේ රටට ඉතාමත් හිතකරයි, ප්‍රයෝජනවත් දෙයක්, ඒ ගැන කිසිම සැකයක් නැහැ කියන එක. හැබැයි ඒ නිසා ඒ අයට දණ ගහලා, නමස්කාර කරලා කටයුතු කරන්න බැහැ. යම් කිසි සීමාවක් තිබෙන්න ඕනෑ. අපට විතරක් නොවෙයි, මේ GSP Plus සහනය ලැබිලා තිබෙන්නේ. අද ඒ සහනය භුක්ති විඳින රටවල් 15ක් තිබෙනවා. ඒ 15න් 11ක්ම ලතින් ඇමෙරිකානු රටවල්. ඒ 15න් 11ක්ම Southern American and Andean Region countries. දැන් මේ අය අපි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන මිනුම් දණ්ඩ, පොදුවේ ඒ සියලුම රටවල් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට පමණක් විශේෂ මිනුම් දණ්ඩක් භාවිත කරන්න බැහැ. ඒ මිනුම් දණ්ඩ භාවිත කරන -මා රටවල් නම් කරන්නේ නැහැ, ඒක වැරදි නිසා.- හැබැයි මේ GSP Plus සහනය භුක්ති විඳින ලතින් ඇමෙරිකාවේ පිහිටා තිබෙන ඒ රටවල් සම්බන්ධයෙන් මේ මිනුම් දණ්ඩ ඒ විධියටම ක්‍රියාත්මක කළොත් මොකක්ද ප්‍රතිඵලය? ඒ අයට මේ සහනය ලබා ගන්න පුළුවන් ද? එම නිසා අපි ලෝක ප්‍රජාව හමුවේ මේ රටේ ජනතාවට සාධාරණත්වය ඉල්ලා සිටිනවා. අපට පිනට දෙයක් ඕනෑ නැහැ කාගෙන්වත්. හැබැයි අපි කියනවා අපිට යම් යම් අයිතිවාසිකම් තිබෙන බව. ජාත්‍යන්තර නීතියක් කියලා දෙයක් තිබෙනවා. ඒ ජාත්‍යන්තර නීතියේ ගැබ් වෙලා තිබෙන යම් යම් අගයන් සංකල්පයන් තිබෙනවා. ඒ සංකල්පයන් උල්ලංඝනය කරමින් යම් කිසි තීරණයක් ගන්නවා නම් අපි ඒ තීරණය ප්‍රතික්ෂේප කරනවා. ඒ සම්බන්ධයෙන් අපට ගන්න පුළුවන් සියලුම ක්‍රියාමාර්ග අපේ පූර්ණ ශක්තිය යොදමින් අපි ගන්නවා. ගරු මංගල සමරවීර හිටපු ඇමතිතුමාට දෙන මගේ පිළිතුර ඒකයි. අපි ඒ සහනය ලබා ගන්න අවංක උත්සාහයක් දරනවා. අපි දැන් හදලා තිබෙන ලියැවිල්ල පිටු 35කින් විතර සමන්විත ලියැවිල්ලක්. ඒකේ එක කොටසක තිබෙනවා ඒ අයගේ වාර්තාවේ අඩංගු විවේචන. දෙ වන column එකේ තිබෙන්නේ ඒකට අපේ පිළිතුර. තුන් වැනි column එකේ තිබෙන්නේ ඒ සම්බන්ධයෙන් මෙතෙක් අර ගෙන තිබෙන පියවර හා අපි ගන්නට අපේක්ෂා කරන පියවර. මා හිතනවා ඒක ඉතාමත් සාධාරණයි කියලා. GSP Plus, GSP Plus කියමින් මේක ඕනෑමයි, ඕනෑමයි කියමින් මන්තරයක් වාගේ කියලා හරි යන්නේ නැහැ. ඒක ප්‍රයෝජනවත් බව ඇත්ත. හැබැයි අපි ඕනෑම දෙයක් කරන්න සූදානම්ද මේක ගන්න? විදේශීය රටක බලපෑම් අනුව මේ රටේ අධිකරණ තීරණ වෙනස් කිරීමට කටයුතු කරන්න අපි සූදානම් ද? කිසිම රජයක් ඒක කරනවා ද? කිසිම රජයක් මෙතෙක් කල් ඒක කරලා තිබෙනවා ද? ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කරන ආකාරය, නඩු ඇසීම, ඒ අයගේ ක්‍රියාමාර්ගය, මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන පිළිවෙළ, හුදෙක් මේ රටේ අභ්‍යන්තර කටයුතුවලට බලපාන සාධක, මේ සියල්ලක්ම විදේශීය ආණ්ඩුවක තීරණයකට ලක් කිරීමට මේ රටේ වග කිව යුතු කිසිම දේශපාලන පක්ෂයක් සූදානම් ද කියන ප්‍රශ්නය මා එඩිතරව මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. එම නිසා මේ ගැන හංගන්න දෙයක් නැහැ. රජයට පළා යන්න කිසිම හේතුවක් නැහැ. ඕනෑම මැතිවරණයකදී -ජනාධිපතිවරණයක් වේවා, පාර්ලිමේන්තු මැතිවරණයක් වේවා- අපේ ස්ථාවරය මේ රටේ ජනතාව පිළිගන්නා අයුරින් ඉදිරිපත් කිරීමට අපට ධෛර්ය, ශක්තිය තිබෙන බව මම මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්සේට මේ අවස්ථාවේදී ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, අද අපේ රටේ අලුත් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඊයේ සවස මා ඇමතුවා, මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, ජර්මනියෙන් ඇවිල්ලා සිටින ඉතාමත් ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයන් 48 දෙනෙක්. ගරු අතාවුද සෙනෙවිරත්න මගේ සහෝදර ඇමතිතුමාගේ පුත්‍රයා ෆ්‍රැන්ක්ෆර්ට් නගරයේ අපේ කොන්සල්වරයා. එතුමා ඒ සම්බන්ධයෙන් හුඟක් මහන්සි වුණා. ඒ අයත් සූදානම් මේ රටේ ආයෝජන අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට.

මේ අතුරු සම්මත ගිණුමෙන් අපි බලාපොරොත්තු වන්නේ මේකයි. අද අපේ රටේ ඇති වෙලා තිබෙන අලුත් තත්ත්වයට ගැළපෙන පරිදි අපේ රටේ ආර්ථිකය පෝෂණය කිරීමට, ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම තමයි අපේ අභිලාෂය, ඉලක්කය වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මගෙන් අහනවා නම් මේ රටේ ආර්ථිකය දියුණු කිරීමට තිබෙන ප්‍රධාන බාධකය මොකක්ද කියා, මම කිසිම පැකිලීමකින් තොරව කියනවා, අපේ ඉහළ පොලී අනුපාතිකයයි කියා. ඒක පහත හෙළීමට අපි පියවර අර ගෙන තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ට ඒකෙන් ලොකු ශක්තියක් ලැබෙනවා. ලෝකයේ ඉතාමත් ප්‍රබල ආර්ථික දෙදරණ අවස්ථා ඇති වුණා. අද වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේ මිලියන 2කට රක්ෂා නැති වෙලා. නිව් යෝර්ක් ප්‍රාන්තයේ පමණක් ලක්ෂ 2ක තට්ටු නිවාස අද හිස්. ඒවා ගන්න කිසිම කෙනෙක් නැහැ. ඒ විධියේ තත්ත්වයක් තුළ මේ රටේ ආර්ථිකය ආරක්ෂා කිරීමට අපට

පුළුවන් වෙලා තිබෙනවා. අපට හුදෙකලාව ජීවත් වන්න බැහැ. එහෙම තත්ත්වයක් තුළ අපේ ආර්ථිකයට යම් කිසි අහිතකර බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ඒ රටවල් මුහුණ දුන් ප්‍රශ්නවලට අපිට මුහුණ දීමට සිදු වුණේ නැහැ.

මට තව කොච්චර වෙලාව තිබෙනවාද, මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වෙලාව ඉවරයි.

**ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
එහෙම නම් මා ඉතාමත්ම කෙටියෙන් ප්‍රකාශ කරනවා, ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර. විශේෂයෙන්ම අපේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම, පොලී අනුපාතය පහළ හෙළීම, Tax Commission එකක් පත් කරලා තීරු බද්ද සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන කිරීම, වැටුප් වැඩි කිරීම, ගම් මට්ටමේ පාරවල් සෑදීම වාගේ ඒවාට අවශ්‍ය මුදල් වෙන් කිරීම ආදී සියල්ලක්ම කිරීම සඳහා තමයි අපි මේ අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. එසේ ප්‍රකාශ කරමින්, මේ අවස්ථාවේදී මෙයට පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාම සහයෝගය දීම ජාතික යුතුකමක් බව ඉතාමත් ගෞරවයෙන් නිහතමානී ලෙස සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 1.55]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන්ද්‍රයන් වහන්ස, අතුරු සම්මත ගිණුම සම්බන්ධව කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා. ආණ්ඩුව පසු ගිය කාල වකවානුව තුළම අය වැයක් ගෙනෙනවා කියා, අය වැයට සූදානම් කියා, අය වැය ගෙනෙන්න අවශ්‍ය කටයුතු ටික කරනවා කියා මහා පම්පෝරි ගහලා අවසාන වශයෙන් අතුරු සම්මත ගිණුමක් ගෙනල්ලා මෙතැන අත හැරලා නිකම් හිටියා. ආණ්ඩුවට ඒ ගැන ක්‍රියා කරන්න කාල වකවානුවක් තිබුණා; කාලයක් තිබුණා. පාර්ලිමේන්තු මැතිවරණයට තව මාස තුන හතරක් තිබෙනවා. එහෙම මැතිවරණයක් තියන්න තියෙද්දී අපි හිතුවා අය වැයක් ඉදිරිපත් කරලා ඒක ක්‍රියාත්මක කරලා රටේ ජනතාවට සහන දීලා IMF එකේ කොන්දේසි නැතුව මේ රට අර ගෙන යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරයි කියා. නමුත් ඇත්ත වශයෙන් අද ආණ්ඩුවේ නොහැකියාව බොහොම පැහැදිලිව පෙන්වා තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන ව්‍යවස්ථාව අනුවත්, 2003 දී මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳව අපි අලුත් පනතක් ගෙනාවා, මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත කියා, ඒ පනත අනුවත්, මේ අතුරු සම්මත ගිණුම ගෙනෙන එක ගෞරවණීය ස්වාමීන්ද්‍රයන් වහන්ස, අපි දකින්නේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න බැරි, වෙනත් සම්මත කළ යුතු නීති කෘත්‍යයන් කරන්නේ නැතුව කරපු වැඩ පිළිවෙළක් විධියටයි. නීතිය ගැන තැකීමක් නැති ආණ්ඩුවකට ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන්නු තීන්දු ක්‍රියාත්මක කරන්නේ නැති ආණ්ඩුවක් පාර්ලිමේන්තුව ඇතුළේ තමන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවාය කියන එක ඒ තරම් ලොකු කාරණයක් නොවෙයි. ඒ නිසා මේ ආණ්ඩුව මේ අතුරු සම්මත ගිණුම පටන් ගත්තේම රටේ නීතිය උල්ලංඝනය කරලායි. ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු කරන්නේ නැති ආණ්ඩුවක්, රටේ මානව හිමිකම්වලට ගරු කරන්නේ නැති ආණ්ඩුවක්, රටේ මාධ්‍යවේදීන් මරා දැමීමට එරෙහිව ක්‍රියාත්මක වුණු සෑම සිද්ධියකටම බීරි අලින්ට වීණා වයනවා වාගේ කථා කරන ආණ්ඩුවක්, ඒ විතරක් නොවෙයි, පාලිත රංගෙ බණ්ඩාර මහත්මයාගේ ගෙදරට ගිනි තබා හරියට මාසයක් දැන්; මාසයක් ඇතුළත විත්තිකාරයෝ පෙන්වා, විත්තිකාරයන්ගේ රූප පෙන්වා, ඇඳ හිස පත් පෙන්වා, ගෙවල්වල address පෙන්වා, ඉන්න මනුෂ්‍යයාගේ නම කියලා, මේ සියල්ලම කළාට පස්සේවත් මාසයක් තිස්සේ වැරැදිකාරයන් අත් අඩංගුවට ගන්න බැරි ආණ්ඩුවක් නීතිය ක්‍රියාත්මක කරයි කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන්ද්‍රයන් වහන්ස. ඉතින් ඒ නිසා අතුරු සම්මත ගිණුමත් නීතියට එරෙහිව, නීතියට පිටින් ගිය වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා.

මීට පෙර කථා කළ අපේ මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාටත් පොඩි කාරණයක් කියලාම මගේ කථාව පටන් ගත්තොත් හොඳයි. එතුමා හොඳ කථාවක් කිව්වා. එතුමා කිව්වා, GSP Plus නැති වුණාය කියලා ආණ්ඩුව වැටෙන්නේ නැහැයි කියලා. හරියට හරි. එතුමාට ඕනෑ, ආණ්ඩුව වැටෙන්නේ නැතුව තබා ගන්නයි. රටේ මිනිසුන්ට මොනවා වුණත් කමක් නැහැ; අහිංසක දුප්පත් මිනිසුන්ගේ රක්ෂා ටික නැති වුණත් කමක් නැහැ; ඒ මිනිසුන්ට හිඟා කන්න වුණත් කමක් නැහැ; ආණ්ඩුව තිබෙනවා නම්. ඉතින් ඒක එතුමාගේ ප්‍රාර්ථනයයි. ප්‍රශ්නයක් නැහැ. එතුමාට ඒක සාර්ථකව ඉෂ්ට කරන්න ලැබේවා!යි කියලා අපි ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ හීනය ආණ්ඩුව තබා ගැනීම තමයි. ගමේ ඉන්න මිනිහාට රක්ෂාව නැති වෙලා, කර්මාන්තශාලා ටික වහලා, යන එන මං නැතුව හිඟා කෑවත් කමක් නැහැ, ආණ්ඩුවේ ඇමති තනතුර දරා ගෙන, සැප වාහනවල ගිහිල්ලා, පිට රට ගිහිල්ලා, තමන්ගේ කාර්ය භාරය කර ගන්න තිබෙනවා නම්. අනේ! හොඳයි. ඒක තමයි එතුමාගේ කාර්ය භාරය. මට ලජ්ජා හිතෙනවා. එතුමා අපේ ගුරුවරයෙක් නිසා මා එතුමාව වැඩිය විවේචනය කරන්න යන්නේ නැහැ. මොකද, පසු ගිය කාල වකවානුවේ ඇමෙරිකාව, එංගලන්තය, ජර්මනිය වාගේ රටවල් එක්ක තමයි එතුමාගේ ආශ්‍රය තිබුණේ. අද වියට්නාමය, බුරුමය, එහා පැත්තෙන් ගියාම, කසකස්තානය -කිර්කිස්තානය, ගිජිකිස්තානය, ජිගිජිගිස්තානය- ආදී එක එක ජාතියේ රටවල් සමඟ අද මේ ආණ්ඩුවේ නායකයා ගහන ගහන පදයට නටමින් තමයි ක්‍රියාත්මක කර ගෙන යන්නේ. මා කනගාටු වන්නේ වෙනත් හේතුවක් නිසා නොවෙයි. එතුමාට තිබුණු ගෞරවය මේ ආණ්ඩුවෙන් අහිමි කර තිබීම ගැන ඇත්තටම මා කනගාටු වනවා. අපේ කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා කියන්නේ ලෝකයේ රටවල් එක්ක ගනුදෙනු කරපු කෙනෙක්. ඇමෙරිකාවත් එක්ක, බ්‍රිතාන්‍යයත් එක්ක ලංකාවේ සාම ක්‍රියාවලියට chief negotiator විධියට නායකත්වය දුන්න කෙනා. එහෙම බුද්ධියක් තිබෙන කෙනෙක්. මහාචාර්යවරයෙක්. ලංකාවේ ඉන්න ප්‍රථම නීති මහාචාර්යවරයා. අද එතුමාට සිද්ධ වෙලා තිබෙනවා, මේ ආණ්ඩුවේ කුණු හෝදන්න. ඒකයි මම කනගාටු වන්නේ. එතුමාට අද එදා තිබුණු තත්ත්වය නැහැ. අර පොඩි කාන්තාවෝ අරගෙන ගිහිල්ලා, කාන්තාවන්ගේ රූප ලාවණ්‍ය පාඨමාලා කිරීමේ වැඩ පිළිවෙළයි අද එතුමාට භාර දීලා තිබෙන්නේ. ඇත්තටම මට හරි ලජ්ජයි, ගරු හේමකුමාර නානායක්කාර ඇමතිතුමනි. අපි බොහොම ආදරය කරන කෙනෙක්. අපට කනගාටුයි.

**ගරු රෝහණ දිසානායක මහතා (නාගරික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க - நகர அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake -Minister of Urban Development)
ඊර්ෂ්‍යායිද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ඊර්ෂ්‍යාවක් නැහැ. මට කනගාටුව තිබෙන්නේ තමුන්නාන්සේලා ඒ මනුෂ්‍යයාට කර තිබෙන අපරාධය ගැනයි. මට වෙන ප්‍රශ්නයක් නැහැ. ලංකාවේ විතරක් නොවෙයි, මුළු ලෝකයම බොහොම ගරු කරන මහාචාර්යවරයෙක්. අද වැටිලා තිබෙනවා. අර වැල යන පැත්තට මැස්ස ගහනවා වාගේ, අද ආණ්ඩුව ගහන හැම එකටම මෙතැනට ඇවිල්ලා කථා කරනවා. අපි එතුමාට ගෞරවයක් තිබෙනවා. ඒකයි අපි කියන්නේ. ඒ ගෞරවය අපි ආරක්ෂා කරලා දෙන්නයි මේ හදන්නේ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එතුමා බ්‍රසල්ස්වලට ගිහිල්ලා, මේ යුරෝපීය සංගම්වලට ගිහිල්ලා මොනවාද කියන්නේ කියලා මට කියන්න. මාධ්‍යවේදීන් 20 දෙනෙක් මරා දමලා, මේ වන තුරු පරීක්ෂණයක් නැතුව තිබෙනවා. ඉතින් ගිහිල්ලා මොනවාද කථා කරන්නේ? ලෝකයේ ඕනෑ රටක් කථා කරලා කියනවා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවාය කියලා.

දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ජාතික පොලිස් කොමිසම ක්‍රියාත්මක වන්නේ නැත්නම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ක්‍රියාත්මක වන්නේ නැත්නම්, මැතිවරණ කොමිසම ක්‍රියාත්මක වන්නේ නැත්නම් මේවා ලෝකයේ සුද්දන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මේක ලංකාවේ ප්‍රශ්නයක්. සුද්දෝ ඇවිල්ලා අපේ රටට අත ගහනවාට මමත් විරුද්ධයි. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. සුද්දන්ට මේ රටට ඇවිල්ලා එක එක ඒවාට ඇඟිලි ගහන්න බැහැ. නමුත් මේ රටේ තිබෙන ප්‍රශ්නය විසඳා ගන්න බැරි නම්, මේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැත්නම්, නීතිය ක්‍රියාත්මක කරන්න කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තමන්ගේ දරුවන් -ළමයින්- අරගෙන ගිහින් පාර අයිනේ ඉඳ ගෙන ඉන්නවා නම්, එවැනි වෙනත් රටක් ලෝකයේ තිබෙනවාද? මේ ලෝකයේ එහෙම රටක් තිබෙනවාද? [බාධා කිරීම්] තමුන්නාන්සේටත් ඔච්චරයි වන්නේ. ඒකයි මම කියන්නේ. මෙහේ හිටියත් එකයි. කොහේ හිටියත් එකයි. තව මාස තුන හතරකින් තමුන්නාන්සේ මේ හරියේ -විපක්ෂය පැත්තේ- ඉන්නත් පුළුවන්. මම ඔය පැත්තේ -ආණ්ඩු පක්ෂය පැත්තේ- ඉස්සරහ ඉන්නත් පුළුවන්. තමුන්නාන්සේට ඔය ප්‍රශ්නය වුණොත් මමත් එනවා ඒකට. ඒකයි මම කියන්නේ. අපි මේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරනවා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මේ අතුරු සම්මත ගිණුම්වල ඉතිහාසයක් තිබෙනවා. පළමු වන අතුරු සම්මත ගිණුම ගෙනාවේ 1931 දී සර් ඩී.බී. ජයතිලක මැතිතුමා විසිනුයි. ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටු වීමත් එක්ක තිබුණු කාරණයක් නිසා එතුමා ඒ අතුරු සම්මත ගිණුම ගෙනාවා. අලුත් රාජ්‍ය මන්ත්‍රණ සභාවක් ඇති කිරීම නිසා කාලය මදි වුණා. 1960 දී පිලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. 1960 දී අලුත් මැතිවරණයක් තිබුණා. අලුත් ආණ්ඩුවක් බලයට ආවා. කාලයක් නැති වීම නිසා ඒ අතුරු සම්මත ගිණුම ගෙනාවා. 1971 දී ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා එතෙක් පැවැති සාමාන්‍ය මුදල් වර්ෂය වෙනස් කළා. ඒක නිසා එතුමාට අතුරු සම්මත ගිණුම ගේන්න සිද්ධ වුණා. 1982 දී රොනී ද මෙල් මහත්මයා අතුරු සම්මත ගිණුම ගෙනාවා. ඒ, ජනාධිපතිවරණය හා ජනමත විචාරණය එකට තිබුණු නිසයි. 1988 දී, නයිනා මරිකාර් මහත්මයා ජනාධිපතිවරණය තිබීම හේතු කොට ගෙන අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළා. 1994 දී පොදු පෙරමුණ බලයට පත් වුණා. ඒකත් එක්ක අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කෙරුවා, හදිසියේ අය වැයක් ඉදිරිපත් කරන්න තිබුණු කාල වකවානුව මදි නිසා. 1999 දී අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. 2001 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පැමිණි නිසා ඒ එක්කම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළා 2002 දී. දැන් 2009 සැප්තැම්බර් 22 වැනි දා රංජිත් සියඹලාපිටිය මහත්මයා මෙතැනට ඇවිත් මහා ලොකුවට කයිවාරු ගැහුවා, "අපි අය වැයට සූදානම්, අපි ලොකු අය වැයක් ගේනවා, රජයේ සේවකයන්ට සහන දෙනවා" කියලා. අන්තිමටම සියඹලාපිටිය මහත්තයාගේ සියඹලාපිටිය කථාව සියඹලා ටොෆියක් වුණා. ඒකයි අවසාන වශයෙන් වුණේ. දැන් ඒ සියඹලා ටොෆිය තමයි ලංකාවේ මිනිසුන්ට දීලා තිබෙන්නේ මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස.

දැන් බලන්න ගෞරවණීය ස්වාමීන් වහන්ස, මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා? මේ අතුරු සම්මත ගිණුම දිහා බලන්න. මම ඒකයි පටන් ගන්න කොටම කිව්වේ මේකේ වැරැද්දක් තිබෙනවා කියලා. ඒකත් එක්ක අපි කථා කරමු. දැන් මේ ඔක්කොම කථිකයෝ මොනවාද කථා කළේ? ඔවුන් කිව්වේ, "ලංකාවේ කොටස් වෙළෙඳ පොළ මහා ලොකුවට නැහලා තිබෙනවා" කියලායි. නමුත් දැන් බැහැලා තිබෙන්නේ. ඔබාමා එතුමාගේ ගිය ජනාධිපතිවරණයේදී කිව්වා, "Wall Street එක නැහලා තිබෙනවා, හැබැයි Main Street එක කඩා වැටිලා" කියලා. දැන් ඒක තමයි ලංකාවේ වෙලා තිබෙන්නේ. Wall Street එක නගිනවා; ලංකාවේ කොටස් වෙළෙඳ පොළ නගිනවා. හැබැයි ලංකාවේ Main Street එක කඩා ගෙන වැටිලායි තිබෙන්නේ. ලංකාවේ අහිංසක දුප්පත් මිනිහාට අද තමන්ගේ බඩු ටික ගන්න මුදල් ටික හරිහම්බ කර ගන්න විධියක් නැතිවයි ඉන්නේ. බඩු මිල වැඩි වෙලා. බදු වැඩි වෙලා. මිනිසුන්ට හිතා ගන්න බැරි තැනකට රට ගමන් කරමින් තිබෙන ආර්ථික කඩා වැටීමකුයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, දැන් සති කීපයකට කලින් අග්‍රාමාත්‍යතුමා කොටස් වෙළෙඳ පොළට ගියා. ගිහින් මහා ලොකුවට පෙන්නුවා, "ආසියාවේ ලොකුම කොටස් වෙළෙඳ පොළ තමයි මේ තිබෙන්නේ" කියලා. දැන් ආයෙත් යන්න කියන්න පුළුවන් නම් ලබන සතියේ විතර අගමැතිතුමාට. ගිහින් බලන්න කියන්න වැටිලා තිබෙන හැටි. ලංකාවේ හිටපු සුද්දෝ - ලංකාවේ හිටපු මිනිස්සු ටික ඔක්කොම- මුදල් ටික අහුලා ගෙන ආපහු ලංකාවෙන් යන්න ගියා. යුද්ධය අවසන් වෙලා දැන් මාස හයයි. එහෙම නම් කොටස් වෙළෙඳ පොළ අහස උසට නගින්න එපා යැ? ඇයි මේ කඩා වැටිලා තිබෙන්නේ? ලංකාවේ ආර්ථිකය ගැන විශ්වාසයක් නැහැ. ගන්න තීන්දු, තීරණ පිළිබඳ විශ්වාසයක් නැහැ. ටෙන්ඩර් පටිපාටියක් නැහැ. තමන්ගේ ගෝල බාලයන්ට, අර පැසිස්ට් Oligarchy එකක වාගේ කීප දෙනෙක් එකතු වෙලා කරන පාලනයකුයි මේකේ තිබෙන්නේ. ඉතින් පිට රට ඉන්න ආයෝජකයන්ට මෙහාට ඇවිත් මෙහේ සාමාන්‍ය සාධාරණ කාල පටිපාටියක් ඇතුළත තමන්ට කැමැති ව්‍යාපාරයක ආයෝජනය කරන්න අයිතියක් නැහැ ගෞරවණීය ස්වාමීන් වහන්ස. පෞද්ගලිකව මොනවා හරි වැඩ පිළිවෙළක් කර ගන්න ඕනෑ නම් කෙළින්ම යන්න ඕනෑ කීප දෙනෙක් ඉන්නවා. ඒ කීප දෙනා ළඟට ගියාම තමන්ගේ වැඩේ කර ගන්න පුළුවන්. ටෙන්ඩර් පටිපාටි ඕනෑ නැහැ. කොමිස් මුදල දුන්න ගමන් වැඩේ කෙරෙනවා ගෞරවණීය ස්වාමීන්ද්‍රයන් වහන්ස. ඔබවහන්සේටත් අවශ්‍ය වෙනවා නම් කවුරු හරි එක්ක යන්න, හදවතට එකඟව ඔබවහන්සේ කතා කරනවා නම්, ඔබවහන්සේ හිතනවා නම්, දැන් කල්පනා කර කර හිතුවොත් එහෙම -ඔබවහන්සේටත් කවුරු හරි කෙනෙක් ඇවිල්ලා කිව්වොත්, “අනේ ගෞරවණීය ස්වාමීන් වහන්ස මට වැඩක් කර ගන්න තිබෙනවා”ය කියා- ඔබවහන්සේ දන්නවා කවුරු ගාවටද යන්න ඕනෑ කියා. ඉතිහාසයේ එහෙම නොවෙයි. ඉතිහාසයේ BOI එකට ගිහින් application එකක් දමලා, ඒ application එක තව ටිකක් ඉස්සරහට ගියාම තව කරන්න ඕනෑ ටික කරලා -එහෙමයි- ගියේ. දැන් මොකුත් නැහැ. දන්නවා කවුරු ළඟටද යන්න ඕනෑ කියලා. ඒ නිසා අද -

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
හාමුදුරුවනේ, කා ළඟටද යන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ හාමුදුරුවෝ දන්නවා. අර කෙළවරේ ඉන්නවා උපදේශකයෙක්. අන්න එතුමා ළඟට ගියාම වැඩේ ගාණට කර ගත්ත හැකියි.

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
ජ්‍යොෂ්ඨ උපදේශක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජ්‍යොෂ්ඨ උපදේශක. ඔබවහන්සේ දන්නවා. මම කියන්න ඕනෑ නැහැ. අද ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ලංකාවේ බැංකු පොලී අනුපාතය අඩු කරලාය කියා දැන් මහ ලොකු කතාවක් ඇති වෙලා තිබෙනවා. පසු ගිය කාල වකවානුවේ ලංකාවේ රාජ්‍ය බැංකු වැඩියෙන්ම ණය දීලා තිබෙන්නේ භාණ්ඩාගාර බිල්පත් විධියට, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට, ලංකා විදුලිබල මණ්ඩලයට, මිහින් එයාර් එකට, ටෙලිකොම් එකට. රාජ්‍ය බැංකුවල තිබ්බ්ච සියලු ණය කන්දරාව දුන්නා, රාජ්‍ය අංශයට. පසු ගිය කාල වකවානුවේ ලංකාවේ රාජ්‍ය බැංකු ණය දීම සම්බන්ධයෙන් ගත්තොත් ආණ්ඩුවට සියයට 80ක්, 85ක් වශයෙන් සහ පෞද්ගලික අංශයට සියයට 10ක්, 12ක් වශයෙන් තමයි ණය දීලා තිබෙන්නේ. රාජ්‍ය බැංකුවලින් ආණ්ඩුවේ ආයතනවලට දෙන ණය ප්‍රමාණය දවස ගණනේ වැඩි වුණා. ලංකා බැංකුවේ, මහජන බැංකුවේ ණය අයිරාව කෝටි පන්දාහ, හයදාහ දක්වා වැඩි වුණා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස මම අහනවා මේ බැංකු පොලී අනුපාතය අඩු කිරීමෙන් වාසිය ලැබෙන්නේ කාටද කියලා. වැඩියෙන්ම ණය ගෙවන්න ඉන්න ආයතන ටික තමයි මේකෙන් වාසිය ලබන්නේ. මේක හරියට දකුණතින් දීලා වමතින් ගත්තා වාගේ වැඩක්. අද ගිහින් බැංකුවලින් ණය ගන්න හදන්න. පසු ගිය කාල වකවානුවේ සමහර බැංකුවල මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි වුණා. ඒ ටික දී ගන්න බැරි තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඉතින් මොකක්ද කරන්න ඕනෑ? පොලී අනුපාතය අඩු කළත් එන ආයෝජකයන්ට අලුත් ව්‍යාපාරයක් ආරම්භ කරන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ ගොල්ලගේ වැඩ පිළිවෙළ මොකක්ද? ඒ ගොල්ලගේ business plan එක මොකක්ද? ඒ ගොල්ල මොකක්ද කරන්න හදන්නේ? රක්ෂා කීයක් දෙනවාද? ලංකාවේ ආර්ථිකයට ලැබෙන ඵලදායිත්වය මොකක්ද? මෙන්න මේවා තමයි කතා කරන්න ඕනෑ. නමුත් මේකේ අවසාන ප්‍රතිඵලය වන්නේ, -මා අද කිව්වාය කියා ඔබවහන්සේ මතක තියා ගන්න, මූලාසනාරූඪ ගරු ස්වාමීන්වහන්ස. මේකේ අවසානය තමයි - political banking. දැන් ඔක්කොම කට්ටිය ඉල්ලුම් පත්‍ර අරගෙන එනවා. ඉල්ලුම් පත්‍ර අරගෙන ඇවිල්ලා, අරගෙන ඇවිල්ලා මේකේ හිර වෙනවා. දී ගන්න විධියක් නැහැ. අවසාන වශයෙන් ඇමතිවරයා කතා කරලා, අරයාට දෙන්නය, මෙයාට දෙන්නය කියලා ටෙලිෆෝන් එක අරගෙන බැංකුවේ මැනේජර්ට කිව්වාම සල්ලි ටික release කරන තැනකට තමයි දැන් මේක පත් වන්නේ. මේක තමයි අද ලංකාවේ අර මා කිව්ව මාෆියාව; අර තුන් හතර දෙනාගේ පාලනය. ඒ අයගේ ගෝලයන්ට, ඒ අයගේ ගෝල බාලයන්ට අවශ්‍ය විධියට තමයි පොලී අනුපාතය අඩු කිරීමේ වාසිය ගන්නේ කියා මම ඔබවහන්සේට කියන්න කැමැතියි.

ඒ වාගේම දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? ගරු දි.මු. ජයරත්න ඇමතිතුමනි, මහ බැංකුව සම්පූර්ණයෙන්ම -එහෙම පිටින්ම- දේශපාලනීකරණයට ලක් වෙලා. නිවාඩ් කබ්රාල් මහත්මයා ඉන්නවා. එතුමාගේ කල්පනාව ඊ ළඟට පාර්ලිමේන්තුවට එන්න වෙන්න ඇති. නමුත් මම කියන්නේ ඉතිහාසයේ කවර දාවත් මහ බැංකුව මේ විධියට දේශපාලනීකරණයට ලක් වුණේ නැහැ . ඔවුන් වග කිව්වා. ඔවුන්ගේ අනුපාතයන්, ඔවුන්ගේ ප්‍රතිශතයන් ලංකාවේ මිනිස්සු පාවිච්චි කළා. නමුත් අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අද සිද්ධ වෙලා තිබෙන්නේ මූලසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මහ බැංකුවේ අධිපති තමයි ගිහින් මහා සෑයවල් හදන්නේ. මිලියන 2,000 ගණනේ වියදම් කරලා ලංකාවේ මහා සෑයවල් නවයක් හදනවා. මහ බැංකුවෙන් තමයි පළමු වන එක දෙන්නේ. මම දන්නේ නැහැ, මහ බැංකුවේ කාර්ය භාරය මහ සෑයවල් හදන එකද කියා? බෞද්ධයකු විධියට මම හරිම කැමැතියි, ලංකාවේ ස්ථූප හදනවාට. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි රනිල් වික්‍රමසිංහ මහත්මයා මහ ලොකු දාගැබ හදනවාය කිව්වාම මේ ආණ්ඩුවේ ඉන්න අය කෑ ගහන්න පටන් ගත්තා. විමල් වීරවංශ මන්ත්‍රීතුමන්ලාගේ පාර්ශ්වයේ කට්ටිය කෑ ගහන්න පටන් ගත්තා, මහා සෑය හදනවාය කියා. හැබැයි දැන් මහා සෑයවල් නවයක් හදනවා. අද ලංකාවේ මිනිසුන්ට ජීවත් වන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මහා සෑයවල් හදලා ඒවා ඉවර කළා වාගේම අනික් අතට මිනිසුන්ගේ ආර්ථිකය හදන වැඩ පිළිවෙළත් මෙහිදී වැදගත් වනවා. අපේ ආගමේ කියන හැටියට ඉස්සෙල්ලා බඩට කන්න දීලා තමයි බුදු රජාණන් වහන්සේ බණ දේශනා කළේ. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒක ඔබවහන්සේ දන්නවා. එහෙම ඉතිහාසයක් තමයි තිබෙන්නේ. බුදු රජාණන් වහන්සේ වදාළා ඉස්සෙල්ලා කෑම කන්න දෙන්නය කියා. බඩට කන්න ටික දෙන්නය, දීලා ඉවර වෙලා බණ දේශනා කරන්නය කියා. එතකොට තමයි ඔහුට බණ අහන්න පුළුවන් ශක්තිය ලැබෙන්නේ කියා වදාළා. අද කෑමට වැඩ පිළිවෙළක් නැහැ. අද මේ වැඩ පිළිවෙළ දේශපාලනීකරණයට ලක් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රැකියා විරහිතභාවය ගැන අපේ රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා කිව්වා. රැකියා විරහිතභාවය සියයට 5 දක්වා අඩු වෙලා තිබෙනවාය කිව්වා. ඒක එහෙම පිටින්ම අසත්‍යයක්ය කියා මම කියනවා. අද සාමාන්‍ය පෙළ, උසස් පෙළ සමත් වෙච්ච අය, සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව එළියට එන අය රක්ෂා සොයා ගෙන ලක්ෂ හතරක්, පහක් එක දිගට පාරවල් ගානේ ඇවිදිනවා, තමන්ට රක්ෂාවක් සොයා ගන්න බැරුව. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මා ඔබවහන්සේට එක කාරණයක් කියන්නම්. ජාතික සම්මේලන ශාලාවේ කාර්යාල කම්කරු තනතුරකට ඇබෑර්තුවක් තිබුණා. කාර්යාල කම්කරු එක තනතුරයි. මේ එක තනතුරක් සඳහා 13,000ක් applications දමලා තිබුණා, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඉල්ලුම් පත්‍ර 13,000ක් තිබුණා. එම ඇමතිවරයා මට කිව්වා, එම ඇමතිවරයාට තවත් ඇමතිවරුන් තුන් දෙනෙකු විතර ඉල්ලුම් පත්‍ර ගෙනල්ලා දුන්නාලු. තමන්ගේ යාළුවෙකුගේ ගෝලයකුගේ ඉල්ලුම් පත්‍රයකුත් ගෙනැල්ලා දුන්නාලු, "මගේ ඉල්ලීමත් කරලා දෙන්න" කියලා. එතුමා කිව්වාලු, "එක තනතුරයි, ඉල්ලුම් පත්‍ර 13,000ක් ඇවිල්ලා තිබෙනවා" කියලා. මහ බැංකුවට කම්කරු තනතුරු සඳහා 20 දෙනෙකු ගන්න පසු ගිය කාලයේ ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. 40,000ක් ඉල්ලුම් පත්‍ර ආවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, සාමාන්‍යයෙන් මේ ඉල්ලුම් පත්‍ර 40,000ක ප්‍රමාණය 20න් බෙදලා බැලුවොත් එහෙම එක කම්කරු රක්ෂාවකට 2,000ක් ගණනේ ඉල්ලුම් පත්‍ර දමලා තිබෙනවා. දැන් මේ රක්ෂා ප්‍රශ්නයක් නැත්නම්, රැකියා වියුක්තිය අඩු වෙලා නම්, රැකියා වියුක්තිය සියයට 5කට බැහැලා නම්, ඇයි මේ පියන් තනතුරකට 25,000ක් ඉල්ලුම් කරන්නේ? ගාමිණී ලොකුගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ එක රැකියාවයි තිබුණේ, ඉල්ලුම් පත්‍ර 20,000ක් දමලා තිබුණා. පසු ගිය සතියේ මා කථා කරලා බැලුවාම බන්ධනාගාර රියැදුරු තනතුරු අටකට ඉල්ලුම් පත්‍ර 24,000ක් දමලා තිබුණා. ඇයි මේ? එක රක්ෂාවකට 25,000ක්, 30,000ක් මිනිස්සු ඉල්ලුම් පත්‍ර දමන්නේ ඇයි? ලංකාවේ රක්ෂා නැහැ. තමුන්නාන්සේලා අද කරලා තිබෙන්නේ වෙන එකක් නොවෙයි, ලංකාවේ පෞද්ගලික අංශය කඩා වට්ටලා, ලංකාවේ පෞද්ගලික අංශය දිරි ගැන්වීම අඩු කරලා, රාජ්‍ය අංශයට මේ සියල්ලම ගොනු කර ගැනීම. එහි ප්‍රතිඵලය තමයි මේ. මුළු රටේ සිටින මිනිස්සු ඔක්කොම කල්පනා කරනවා, පෞද්ගලික අංශයේ හොඳ රක්ෂාවක් කරනවාට වැඩිය හොඳයි, අර රාජ්‍ය අංශයේ නිකම් පියන් තනතුරක් ගන්න එක කියලා. මිනිසුන්ව වට්ටලා තිබෙන්නේ. රුපියල් කෝටි 23,000යි පසු ගිය වසරේ වැටුප් බිල. මේක තමයි අද සිදු කරලා තිබෙන්නේ. එතකොට රැකියා විරහිතභාවය අඩු වෙලායි කියලා අද මහ ලොකුවට පම්පෝරි ගැහුවාට, අද රැකියා විරහිතභාවය වැඩි වෙලායි තිබෙන්නේ. රැකියා උත්පාදනය කරන එකම ආයතනය බවට අද ආණ්ඩුවේම ආයතන ටික පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒකේ ප්‍රතිඵලය තමයි දවස ගාණේ රටේ රාජ්‍ය ආයතන කඩා ගෙන වැටෙන එක. මේවා ගැන කථා කරන්න ඒ කාලයේ නම් දේශ ප්‍රේමීන් සිටියා. දැන් ඒ දේශ ප්‍රේමීන්ගේ දේශ ප්‍රේමී සළු පිළි ගැලවිලා, දැන් ඒ ගොල්ලන් සුද්දොත් එක්ක කරට අත දමා ගෙන සිටින තැනට වැටිලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ දේශ ප්‍රේමිත්වය දැන් කොහේද තිබෙන්නේ කියලා මා අහනවා. ලංකාවේ රැකියා විරහිතභාවය දවස ගාණේ වැඩි වෙගන යනවා. විමල් වීරවංශ මැතිතුමනි, එක රක්ෂාවකට 20,000ක් ඉල්ලුම් පත්‍ර ලැබෙනවා. ඒකද දේශ ප්‍රේමිත්වය? මා ඒකයි අහන්නේ. අද දේශ ප්‍රේමිත්වයේ සළු පිළි ගැලවිලායි තිබෙන්නේ. ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් අද පාඩුයි. ඒ වාගේම ඉතිහාසයේ පාඩු නොලබපු ආයතනයක් වන ටෙලිකොම් එක අද පාඩු ලබනවා. එතකොට විදුලිබල මණ්ඩලය පාඩු ලබනවා. ඛනිජ තෙල් සංස්ථාව දවස ගාණේ පාඩු ලබනවා. පසු ගිය අවුරුද්ද ඇතුළත වරායේ පාඩුව

[ගරු දයාසිරි ජයසේකර මහතා]

රුපියල් මිලියන 9,000යි. මේවා ලාභ ලබපු ආයතන මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. මේ ලාභ ලබපු ආයතන සියල්ල දවසින් දවස, දවසින් දවස, මේ ආණ්ඩුව යටතේ පාඩු ලබන ආයතන බවට පත් වෙලා තිබෙන්නේ වෙන එකක් නිසා නොවෙයි, මේ ආණ්ඩුවේ තිබෙන අකාර්යක්ෂමකම, හොරකම, වංචාව නිසායි. මේ රටේ මිනිසුන්ගේ ජාතික ධනය කොල්ල කන අය, ඒ කොල්ල කන අයට ප්‍රශස්ති ගී ගායනා කරන්නට එකතු වෙලා සිටින අනෙක් අය, මේ සියලු දෙනා නිසා තමයි මේ රට කඩා වැටිලා තිබෙන්නේ කියලා මා කියන්න කැමැතියි.

ඊ ළඟට, ජනාධිපතිතුමාගේ අය වැය සම්බන්ධයෙන් අරගෙන බලමු. මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මේ රටේ ජනාධිපතිතුමන්ලාගේ ඉතිහාසය අරගෙන මා කියෙව්වොත්, 1978 දී පළමු වන ජනාධිපතිතුමා -ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා- රුපියල් මිලියන 30යි වියදම් කෙරුවේ, ජනාධිපති ලේකම් කාර්යාලය සහ ජනාධිපතිගේ වියදම් සඳහා. එතුමා ලේකම් කාර්යාලයක් තියා ගත්තේ නැහැ. එතුමා තියා ගත්තේ නැහැ, උපදේශකවරු. තමන්ට හෙංචයිකම් කරන්න වාහන දීලා, රුපියල් 30,000ක වැටුපක් දීලා මිනිස්සු වටේ තියා ගත්තේ නැහැ. මේ ලංකාවේ පාර්ලිමේන්තුව සහ කැබිනට් මණ්ඩලය එතුමාගේ උපදේශකයන් වන බවයි එතුමා හැම වෙලාවේම කිව්වේ. 1994 දී රුපියල් මිලියන 1,036යි ලංකාවේ ජනාධිපති කාර්යාලයේ සහ ජනාධිපතිතුමියගේ වියදම වුණේ. 1995 වන කොට මේ ප්‍රමාණය රුපියල් මිලියන 1,268යි. 1996 වන කොට මේ ප්‍රමාණය රුපියල් මිලියන 1,461යි. 1999 වන කොට මේ ප්‍රමාණය රුපියල් මිලියන 5,489ට නැග්ගා. 2000 වන කොට මේ ප්‍රමාණය නැග්ගා, රුපියල් මිලියන 7,157ට. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, තවත් පහළට, පහළට මම කියා ගෙන ආවොත්, 2008 සැප්තැම්බර් මාසය වන කොට රුපියල් මිලියන 9,217ක් මේ රටේ ජනාධිපතිවරයාට වියදම් කරලා තිබෙනවා. 2009 දී රුපියල් මිලියන 11,158යි. ලංකාවේ අය වැයෙන් සියයට 70ක් අද පාවිච්චි කරන්නේ ජනාධිපතිවරයා ඇතුළු ජනාධිපතිවරයා යටතේ තිබෙන අමාත්‍යාංශවල පාවිච්චිය සඳහායි. ඉතුරු ඒවාට අද මුදල් නැහැ. අද මේ සිටින ඇමතිවරුන්ට මුදල් නැහැ. හැම තැනකින්ම කපනවා. දවස ගණනේ ඇමතිවරුන්ගේ තිබෙන දේවල්වලින් කප කපා අයින් කරන තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා අද ඇමතිවරුන්ට අලුත් යෝජනා අරගෙන වැඩ කරන්න, වියදම් කරන්න සල්ලි නැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. බලන්න, 2008 අවුරුද්දේ අමාත්‍යාංශ 23ක නඩත්තුවට රුපියල් කෝටි 31,109යි. හැබැයි ඒ අමාත්‍යාංශ 23 තුළ රටේ සංවර්ධනයට ප්‍රාග්ධන වියදම් තිබෙන්නේ කෝටි 8,950යි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ගත්තොත් පරිපාලන වියදම්වලට කෝටි 8,638යි. හැබැයි සංවර්ධනයට තිබෙන්නේ සොච්චම් මුදලක් මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. රාජ්‍ය පරිපාලනයට කෝටි 250යි. මේක තමයි තත්ත්වය. එතකොට මොකක්ද මේ රටට වේගෙන යන්නේ? දවස ගණනේ ජනාධිපතිවරයාගේ වටේ සිටින අයගේ, ඒ හෙංචයියන්ගේ, තමන්ගේ ගෝලයන්ගේ වියදමට ගන්න මුදල් ටික වැඩි කර ගන්නවා. රටේ ජනතාවට, රටේ අමාත්‍යාංශවලට දෙන මුදල් ටික දවසින් දවස අඩු වෙලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ මොකක්ද?

මේ අය වැය අනුව ජනාධිපතිවරයාගේ එක දවසක වියදම විතරක් රුපියල් ලක්ෂ 190ක්; මිලියන 19ක්. ගෞරවණීය ස්වාමීන් වහන්ස, එතකොට ඔබවහන්සේත් මමත් වියදම් කරන එක විනාඩියකට ජනාධිපතිවරයා රුපියල් 13,000ක් වියදම් කරනවා. හැබැයි සාමාන්‍ය අහිංසක දුප්පත් මිනිහා මාසයක් දුක් විඳලා ගන්නේ රුපියල් 5,000යි. අපේ සෙල්ලසාමි ඇමතිතුමන්ලාගේ සියලු දෙනා එකට එකතු වෙලා උද්ඝෝෂණය කරලා කෑ ගහලා මාස ගණනක් මහන්සි වෙලා වතුකරයේ අයගේ දවසක වැටුප රුපියල් 500ක් කර ගන්න බැරිව ගියා. ඒක 500 කර ගන්න බැරිව ගියා. රුපියල් 400ක් දීලා නිකම් ඉන්නවා. හැබැයි ජනාධිපතිවරයාගේ එක විනාඩියට -

**ගරු මනෝ ගනේෂන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
සමා වන්න. සෙල්ලසාමි මන්ත්‍රීතුමාගේ කවුරුවත් උද්ඝෝෂණය කළේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. අපි හිතමු, එතුමන්ලාත් අයිති වන වතුකරයේ සියලු දෙනා කියලා. වතුකරයේ දවස් ගණනක් වර්ජනය කර ලංකාවේ මිලියන ගණනක් පාඩු කරලා රුපියල් 500ක් ඉල්ලූ මිනිසුන්ට රුපියල් 400යි මේ ආණ්ඩුව දුන්නේ. ඒකට තොණ්ඩමන් මහත්මයලා කට්ටිය ගිහිල්ලා එකඟ වුණා. සටන සම්පූර්ණයෙන්ම පාවා දුන්නා. පාවා දීලා රුපියල් 400 ගිවිසුමට අත්සන් කළා. හැබැයි මනෝ ගනේෂන් මන්ත්‍රීතුමන්ලා කිව්වා, "නැහැ, අප ඊට වැඩිය රුපියල් 500කට මහන්සි වෙමු"යි කියලා. ඒක ඇහුවේ නැහැ. ගිහිල්ලා ජනාධිපතිතුමාට උදවු කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට වෙන් කර ඇති වෙලාව අවසානයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව එක විනාඩියක් මම ඔබවහන්සේගෙන් ඉල්ලනවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද මේ වකවානුව වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? ජනාධිපතිතුමා මේ සියලු දේවල් පාවිච්චි කර අරලිය ගහ මන්දිරයේ දන් සැල දැමුවා. මම අහනවා, ජනාධිපතිතුමාට ගිහිල්ලා ඇමෙරිකාවේ ඔබාමාට අතට අත දෙන්න පුළුවන්ද කියලා. එංගලන්තයේ ගෝඩන් බ්‍රවුන්ට අතට අත දෙන්න පුළුවන්ද? ඕස්ට්‍රේලියාවේ කෙවින් රඩ්ට අතට අත දෙන්න පුළුවන්ද? දැන් අතට අත දෙන්නේ කාටවත් නොවෙයි, මියන්මාරයට, නේපාලයට, ඇෆ්ඝනිස්ථානයට, ලිබියාවට, කසකස්ථානයට, වියට්නාමයට. මියන්මාරයට ගිහිල්ලා ආධාර අර ගෙන ආවේ ඇමෙරිකන් ඩොලර් 55,000යි. රුපියල්වලින් ගත්තොත් 63,25,000යි. ඒ ගුවන් ගමන යන විට ගිය එක ආයෝජකයෙක් කියලා තිබුණා, “මම හෙට වන කොට ඕනෑ නම් ඩොලර් ලක්ෂ 5ක් දෙන්නම්” කියලා. මේ, වියට්නාමයේ වැඩ කරන්න ලංකාවෙන් ගිය එක් කෙනෙක්. මෙන්න මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මේ ගොල්ලන්ට අද ලෝකයේ රටවල් උදවු කරන්නේ නැහැ. ලෝක සිතියම ගත්තොත් මේ පැත්තෙන් ගිය රටවල් දැන් මේ පැත්තෙන් යන්නේ ගෞරවණීය ස්වාමීන් වහන්ස. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. මේ රටේ හදපු ජාතික ආර්ථිකය දවස ගණනේ කඩා ගෙන වැටිලා තිබෙනවා. දවස ගණනේ මේ ආණ්ඩුවේ වියදම් ටික වැඩි වෙලා තිබෙනවා. ඇමතිවරුන්ට විතරක් නොවෙයි. පසු ගිය සති කිහිපය ඇතුළත වෙඩි නොවදින වාහන 20ක් -bulletproof වාහන 20ක්- ගෙනාවා. ඒ වාහන 20 අද පාවිච්චි කරන්නේ කවුද කියා හොයා බැලුවොත්, ඇමතිවරු නොවෙයි, ඇමතිවරුන්ගේ බිරින්දෑවරුත් මේවා පාවිච්චි කරනවා. එල්ටීටීඊ සංවිධානය ඉවරලු. අද තවමත් පාරවල් වහනවා. අද මිනිසුන්ට යන්න එන්න බැහැ. තවමත් ඇමතිවරුන් එක්ක වාහන 10, 15 පිටු පස්සේ යනවා. කාව ආරක්ෂා කරන්නද මේ? ඒ නිසා මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මේ ආණ්ඩුවේ මේ තිබෙන්නේ තමන්ගේ අවසානය වෙනුවෙන් කනත්තට තල්ලු වෙමින් යන වාතාවරණයක්ය කියලා. ඒ නිසා -

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ඒ ගොල්ලන්ගේ නෝනලාත් ඒවා පාවිච්චි කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. නෝනලාත් ඒවා පාවිච්චි කරනවා, ඒ ගොල්ලන්ටත් වෙඩි වදියි කියලා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අද ආණ්ඩුව අවසාන ගමන් යමින් ඉන්නේ. මම කියන්න කැමැතියි, අවසානයේ ආණ්ඩුව මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කෙරුවේ ඒ බව දැන ගෙන. ඊ ළඟ මහ මැතිවරණයෙන් පස්සේ ජාතික න්‍යාය පත්‍රය අතට අරගෙන, මේ රට ඉදිරියට ගෙන යන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. මේ රටේ මිනිසුන් සියලු දෙනාම පොදු විපක්ෂයත් එක්ක, එකට එකතු කර ගත්තු අලුත් නායකයෙක් එක්ක රට ඉදිරියට ගෙන යන්න පුළුවන් රටේ නියම ජාතික බලවේග -විමල් වීරවංශ මැතිතුමන්ලාගේ ජාතික බලවේග නොවෙයි- එකතු කරපු රට ඉදිරියට ගෙන යන ජාතික න්‍යාය පත්‍රයක් එක්ක හදන පාර්ලිමේන්තුවේ අය වැය ඉදිරිපත් කරන්නේ අපියි කියන එක ප්‍රකාශ කරමින් මා මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු දි.මු. ජයරත්න ඇමතිතුමා. විනාඩි 14ක් තිබෙනවා.

[අ. භා. 2.22]

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)
මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, ආණ්ඩුවට චෝදනා ඉදිරිපත් කරන බොහෝ මන්ත්‍රීවරු කල්පනා කරන්නේ නැහැ, අවුරුදු තිහක් මේ රටේ තිබුණු ත්‍රස්තවාදී ක්‍රියාමාර්ගයන් තුළ කොච්චර දුරට අපේ ආර්ථිකයට හානි සිද්ධ වුණාද කියලා. ඒ වෙනුවෙන් විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරලා මේ රට නිදහස් ලංකාවක් බවට පත් කළා. එසේ නිදහස් ලංකාවක් බවට පත් කිරීමේදී කොච්චර විශාල මුදලක් වැය කරලා තිබෙනවාද කියලා බලන්න ඕනෑ. ඒ ගොල්ලෝ ඒ ගැන කල්පනා කරන්නේ නැහැ. මේ ක්‍රියා මාර්ගයන් ඉවර වෙලා දැනට මාස ගණනකුයි ගත වෙලා තිබෙන්නේ. ඒ මාස ගණන තුළ මේ රට සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත කරලා, රටේ බලාපොරොත්තු සියල්ලම ඉෂ්ට කරන්න පුළුවන්ද?

අද මුළු ලෝකයම ආර්ථික අවපාතයකට වැටිලා තිබෙනවා. ලෝකයේ දියුණුම රටවල් වන ඇමෙරිකාව වාගේ රටවලුත්, යුරෝපයේ රටවල් බොහොමයක්මත් ඉතාම අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ලක්ෂ ගණනින් සේවකයෝ එළියට දමා තිබෙනවා. කර්මාන්තශාලා වසා දමලා. එක්සත් ජනපදය අපෙන් රබර් මිල දී ගත්තා. ඒවා නතර කෙරුවා. මම ඇහුවා, "ඇයි හේතුව?" කියලා. "අපේ භාණ්ඩ විකුණන්න විධියක් නැහැ, ඒ නිසා කර්මාන්තශාලා වහලා තිබෙනවා"යි කියලා අපිට කිව්වා. මේ විධියේ තත්ත්වයක් මුළු ලෝකයේම ඇති වෙලා තියෙද්දී මේ රජය, මහා භාණ්ඩාගාරය ගත්ත ක්‍රියාමාර්ගය තුළ තමයි මේ තරමින් හෝ අපට ජීවත් වන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. දියුණු රටවලට පවා අසීරු තත්ත්වයකට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තියෙද්දී මේ රට මේ තරමින් ආරක්ෂා කර තිබෙන එක ඕනෑ තරම් ප්‍රමාණවත්ය කියලා මා විපක්ෂයට කියන්න කැමැතියි.

ඒ එක්කම රැකියා ප්‍රශ්නය සම්බන්ධව කථා කරනවා. අද රැකියා ප්‍රශ්නය බලපා තිබෙන්නේ ලංකාවට පමණක් නොවෙයි. ජපානය ආර්ථික වශයෙන් විශාල ලෙස දියුණු රටක්. ජපානයේ රස්සා නැතිකම නිසා දවසකට සෑහෙන ප්‍රමාණයක් සිය දිවි නසා ගන්නවා. ඇමෙරිකාවේත් ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. ප්‍රවෘත්තිවලින් ඒක අපට පෙන්නුම් කරලා තිබෙනවා. දියුණු රටවලටත් ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තියෙද්දී -ලෝකයේත් එවන් තත්ත්වයක් තියෙද්දී - මේ වාගේ යුද්ධයකට මුහුණ දුන් ලංකාව වාගේ රටකට - අපට - මුහුණ දෙන්නට තිබෙන තත්ත්වයන් මොනවාද කියලා බලන්න ඕනෑ.

අපේ තේ සියයට 50ක් විකුණන්න බැරි වුණා; රබර් විකුණන්න බැරි වුණා; පොල් විකුණන්න බැරි වුණා. ඒ වාගේ අපේ නොයෙක් භාණ්ඩ ලෝකයට විකුණා ගන්න බැරි වුණා. එතකොට රස්සාවල් ඇති වීමත්, ජීවන තත්ත්වය උසස් කිරීමත් කරන්නේ කොහොමද කියන එකයි ප්‍රශ්නය. මෙතෙක් කාලයක් අපි ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා හිටියා. විපක්ෂයේ අය කියන්නේ හුඟක් දුරට "ඇමෙරිකාවත් එක්ක, එංගලන්තයත් එක්ක, අනෙකුත් රටවලුත් එකක් ඒකාබද්ධ වෙලා ක්‍රියා කරන්න ඕනෑ"යි කියලායි. ඒ රටවල් සමඟ ක්‍රියා කරන්නට පටන් ගත්තාට පස්සේ තමයි ලෝකයට මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් ඇති වුණේ.

රුසියාව ලෝකයේ ප්‍රධාන රටක් හැටියට තියෙද්දී ඇමෙරිකාව දෙ වෙනි තැනට තියෙද්දී, ලෝකය දෙකට බෙදිලා තිබුණා. තුන් වෙනි ලෝකයේ රටවල් සියල්ලක්ම ඒක රාශි වෙලා තුන් වන ලෝකයේ පුංචි රටවල් සියල්ලක් ආරක්ෂා කළා. මෙහෙම බෙදීම් ඇති වුණේ නැහැ. ජාතිවාදී බෙදීම්, ආගම්වාදී බෙදීම්, boundary බෙදීම් ලෝකයේ ඇති වුණේ නැහැ. ඇමෙරිකාවත් එක්ක ධනවාදී රටවල් බලයට ආවාට පස්සේ තමයි මුළු ලෝකයේම මේ විධියේ විනාශයක් ඇති වෙලා තිබෙන්නේ. අන්තිම පුංචි රටවල්වල, නොදියුණු රටවල්වල නොයෙක් විධියේ කලබලකාරී තත්ත්වයන්, යුද්ධ ඇති කරලා ජනතාව විනාශයට පත් කරලා තිබෙනවා. ඇමෙරිකාව තමයි අද මධ්‍යම ආසියාවේ රටවලට යුද බෝම්බ දමලා, නොයෙක් විධියට ළමයින් මරලා, කාන්තාවන් මරලා, සාමාන්‍ය ජනතාවත් මරණ තත්ත්වයට පත් කරලා තිබෙන්නේ. ඒ රටවල එහෙම තත්ත්වයන් තියෙද්දී ලංකාවේ අද ඇති වෙලා තිබෙන ස්වාධීනත්වයටත් පහර ගහන්න උත්සාහ කරන බවක් හොඳට පෙනෙනවා. ලංකාව පමණක් නොවෙයි, ලෝකයම හුරා කෑමේ වැඩ පිළිවෙළකුයි ධනපති රටවල් අද කර ගෙන යන්නේ. ණය දීම තුළින් සහ අනෙක් සියලු ක්‍රියාමාර්ගවලින් ඒකයි කරන්නේ. GSP කියලා කථා කරනවා තමයි, GSP සහනය ගන්න ඕනෑ කියන එකට මමත් "නැහැ"යි කියලා කියන්නේ නැහැ. එහෙම වුණාට මොකද, ඒ තත්ත්වයන් තුළින් රටවල් සම්පූර්ණයෙන්ම වසඟයේ තබා ගෙන වහලුන් බවට පත් කර ගැනීමේ උත්සාහයයි ධනවත් රටවල් අද ක්‍රියාත්මක කර ගෙන යන්නේ. එහෙම කරලා ඒ රටවල තත්ත්වයන් ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් දියුණු තියුණු කර ගැනීමේ උපක්‍රමශීලී ව්‍යාපාරයන් ක්‍රියාත්මක කරන අතර, දුප්පත් රටවල් හිඟමනට පත් කිරීමේ වැඩ පිළිවෙළක් තමයි අද ක්‍රියාත්මක කර ගෙන යන්නේ. විපක්ෂය ඒ ගැන මොහොතකටවත් කල්පනා කරන්නේ නැහැ. විපක්ෂය කියන්නේ දණ ගහලා, කකුළ ලෙව කාලා, සපත්තු ලෙව කාලා හෝ ඒ අයගෙන් ප්‍රයෝජන ගන්නය කියලායි. අවුරුදු 2500ක ඉතිහාසයක් ඇති ජාතියක් හැටියට, රටක් හැටියට ඒ විධියට දණ ගහ ගෙන, සපත්තු ලෙව කාලා ඒ දේවල් ක්‍රියාත්මක කර ගන්න අපි කැමැති නැහැ. මේ රට මුළු ලෝකයේම දියුණු තත්ත්වයක් ඇති, ඉතිහාසයක් ඇති රටක් හැටියට, ජාතියක් හැටියට නැඟී සිටීමට අපට අයිතියක් තිබෙනවා; ශක්තියක් තිබෙනවා. හැම දාම විපක්ෂය කථා කරන්නේ හිඟන්නා වාගේ ගිහිල්ලා හිඟා කාපල්ලා, උන්ගේ දණහිස් ලෙව කාපල්ලා, පිටිපය ලෙව කාපල්ලා කියන එකයි. ජාතියක් හැටියට ඒකට එකඟ ද කියලායි අපි අහන්නේ. මේ රටේ ජනතාව ඒකට එකඟ නැහැ. යුද්ධය පවතින කාල පරිච්ඡේදය තුළ දී යුද හමුදාව පමණක් නොවෙයි, මේ රටේ සියලුම ජනතාව දේශපාලන පක්ෂ භේදයෙන් තොරව ජාතියට ආධාරයක් දුන්නා; හදවතින් ආධාරයක් දුන්නා. එහෙම කළේ මේ ජාතියේ ශ්‍රේෂ්ඨභාවය ආරක්ෂා කිරීම සඳහායි. ඒ නිසා මේ ලෙව කන වැඩ පිළිවෙළවල් ගැන, හිඟන වැඩ පිළිවෙළවල් ගැන මා නම් කල්පනා කරන්නේ නැහැ. විපක්ෂය කිව්වත් ආණ්ඩුව ඒ විධියේ දේවල් කරන්න සූදානම් වන්නේ නැහැ. [බාධා කිරීමක්]

[ගරු දි. මු. ජයරත්න මහතා]

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැම වෙලාවේම ප්‍රකාශ කරන්නේ ජනාධිපතිතුමාගේ ප්‍රශ්න ගැනයි. අතිගරු ජනාධිපතිතුමා ප්‍රධානියා හැටියට හිටපු නිසා තමයි ජනාධිපතිවරු හතර දෙනකුගෙන් පස්සේ තිස් අවුරුද්දක් පැවතුණ යුද්ධය අවුරුදු දෙකහමාරකින් අවසන් කර දමලා ලංකාව ඒකීය රටක් බවට පත් කළේ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ ගැන දැන් ලෝකය ලජ්ජාවට පත් වෙලා තිබෙනවා. ඇමෙරිකාව කිව්වේ ප්‍රභාකරන් එක්ක සාකච්ඡා කරන්න, සාකච්ඡා කරලා මේක විසඳන්න, ලංකාවට යුද්ධය පරාජය කරන්න බැහැ කියලායි. නමුත් අපේ ඉතිහාසය, අපේ ලේවල ශක්තිය ලෝකයට පෙන්වලා, රාම-රාවණාගේ කාලයේ ඉඳලා අපේ ඉතිහාසයේ තිබුණු ඒ ශක්තීන් පෙන්වලා අපේ දරුවෝ යුද්ධය ජයග්‍රහණය කළා. ඒකට ඇමෙරිකාවත්, අනෙකුත් රටවලුත් ලජ්ජාවට පත් වෙලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ රටවල් ගණනාවක් යුද්ධ කළත් එක රටකටවත් ජයග්‍රහණය කරන්න ඒ අයට බැරි වුණා. ඇමෙරිකාවට ඉරානය යටත් කරන්න පුළුවන් වුණාද? හොරෙන් අහස් යාත්‍රාවලින් ගිහිල්ලා ඉරානය යටත් කර ගන්න වැඩ පිළිවෙළක් ඇති කළා. ඉරානය යටත් කර ගන්න බැරි වුණා. යුද්ධ කරලා වියට්නාමය යටත් කර ගන්න පුළුවන් වුණාද? බෝම්බ හෑදුවා. නොයෙක් අකාරයෙන් ඔවුන් යටපත් කර ගන්න සූදානම් වුණා. නමුත් කරන්න බැරි වුණා. නමුත් ලංකාව - [බාධා කිරීමක්] ඔබතුමා මොන ජාතියේ ද මා දන්නේ නැහැ. නමුත් ලංකාවේ සිටින ලාංකික ජනතාව හැටියට, අපේ ඉතිහාසයෙන් පැවතෙන මිනිසුන් හැටියට ඒක අපට ආඩම්බරයක්. මුළු ලෝකයම පරාජයට පත් කරලා ජාතියක් හැටියට ගොඩ ඒම ගැන මා නම් ආඩම්බර වනවා. මම මගේ ලෙයින්ම සතුටු වනවා කියලා ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස.

අපේ හමුදාව, හමුදා නායකයන් අපකීර්තියට පත් කරලා ඒ තුළින් අපි වැරදියි කියන තත්ත්වයකට ගේන්නට අද නොයෙක් නොයෙක් ආකාරයෙන් බලනවා; ලෝක ඉතිහාසයට ගෙන යන්නට උත්සාහ කරන බවක් අපට බොහොම පැහැදිලිව පෙනෙනවා. නමුත් ශ්‍රී ලංකාවාසී ජනතාව හැටියට අපේ මේ විපක්ෂයත් ඒ විධියට කල්පනා කරන එක ගැන මම කනගාටු වනවා. අපට පෙනෙන්නේ බොහෝ විට විපක්ෂයත් එහාට පුළුවන් තරම් පන්දම් අල්ලා ගෙන, මේ රටේ තිබෙන ගෞරවය, උත්තරීතරභාවය නැති කර දමන්න උත්සාහ කරන බවයි. විපක්ෂය ඒ විධියට කල්පනා කරනවා නම්, ක්‍රියා කරනවා නම් ඒ අය මේ ලංකාවේ ලෙයින් උපන් මිනිස්සු නොවෙයි කියලායි අපට කියන්න තිබෙන්නේ. ඒ අය කියනවා අපේ උරුමයන් නැති කර තිබෙනවාය, අයිතිවාසිකම් නැති කර තිබෙනවාය කියලා. මොකක්ද, නැති කරලා තිබෙන අයිතිවාසිකම? යුද්ධය පවතින කාල පරිච්ඡේදය තුළ දී ලෝකයේ හැම තැනකම, හැම දාම මිනී මැරුම්, හොරකම් ආදී නොයෙකුත් දේවල් ඇති වනවා. මොකද, පාලනයක් ගෙන යන්න බැහැ. හරියාකාරව පාලනයක් සිද්ධ වන්නේ නැහැ. නමුත් අද ඒ තත්ත්වය හුඟක් දුරට අහෝසි කරලා මේ රට යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම ඉවර කරන්නට තවත් අවුරුදු කිහිපයක් ගත වනවා. ඒක අපි කවුරුත් දැන ගන්නට ඕනෑ. යුද්ධයක් ඇති වුණු රටක සාමය, සමාදානය ඇති වන්නේ සැහෙන කාලයක් ගත වුණාට පස්සේයි. අද ඒක කොච්චර දුරට ඇති වෙලා තිබෙනවාද? විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන්ට එදා පුළුවන් වෙලා තිබුණාද බය සැක නැතුව පාරවල යන්න? යූඑන්පී එකේ කී දෙනකු මැරුවාද? අපේ පක්ෂයේ කී දෙනකු මැරුවාද? සාමාන්‍ය ජනතාව කී දෙනකු මරලා දැම්මාද? අදත් එහෙමම තිබෙනවාද? අද ඒවා නැති කරලා තිබෙනවා නේද? අද භය නැතුව පාරේ යන්න පුළුවන් තත්ත්වයක් ඇති කර තිබෙනවා නේද? ඒවා ගැන ඇයි කථා කරන්නේ නැත්තේ? ඒවා සම්පූර්ණයෙන්ම වහලා දමලා, එහෙම කිසිම දෙයක් වුණේ නැහැ කියලා පෙන්වලා, අතීතයේ ඉඳලා හැම දාම එකම තත්ත්වයම තිබුණා වාගේ පෙන්වලා තමයි අද කථා කරන්නේ. මාස හතරක්, පහක් යන කොට මේ රට මේ කියන තරමට ගොඩ නහන්න පුළුවන් වුණා. ඒක විශ්වකර්මයාටවත් පුළුවන් එකක්ද කියා කල්පනා කරලා බලන්න ඕනෑ. තමන්ගේ තත්ත්වය රැක ගෙන, තමන්ට බලය ලබා ගැනීම සඳහා උපක්‍රමශීලීව, වැරැදි ආකාරයට ජනතාව පොලඹවා ගැනීමේ උත්සාහයකයි, ජනතාව රැවටීමේ උපායකයි විපක්ෂය යෙදිලා තිබෙන්නේ. නමුත් ඒකට මේ රටේ ජනතාව රැවටෙනවා කියලා අපට කොහොමවත් කියන්න පුළුවන්කමක් නැහැ.

ජාතික ආණ්ඩුවක් ගැන කිව්වා. හරි ජාති කථා තමයි මෙතුමන්ලා කරන්නේ. "ජාතික" පැත්තක දමලා, ජාති කථා තමයි කරන්නේ. ඒ වාගේ කථා කියලා බලයට එන්න පුළුවන්ද කියලා බලනවා. බලයට ආවායින් පස්සේ පෙනේවි මොකක්ද ඇති වන තත්ත්වය කියලා. මේ රටට විපත්ති ගෙනෙන ආකාරයට, මේ රට අවමානයට ලක් වන ආකාරයට යටින්, රහසින්, අරහෙන් මෙහෙන් උදවු උපකාර කරලා අපේ ජාතික අභිමානය විනාශ කිරීමට උත්සාහ කරන පුද්ගලයන් හැටියට විපක්ෂය නම් දරනවා, ඉතිහාසයට වැටෙනවා කියන එක මට ප්‍රකාශ කරන්න පුළුවන්. හොරෙන් හරි, උඩින් හරි, පහළින් හරි මේ තත්ත්වය ඇති කිරීම සම්පූර්ණයෙන්ම වැරැදි සහගතයි. වෙන රටවල නම් තමන්ගේ රටට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ඇති වෙච්ච හැම අවස්ථාවකදීම, සියලුම පක්ෂ එකතු වුණා. සියලුම පක්ෂ එකතු වෙලා ඒ රට ආරක්ෂා කර ගෙන, ගෞරවය ආරක්ෂා කර ගෙන ක්‍රියා කරලා තිබෙනවා. හැම රටක්ම වාගේ එහෙම කරලා තිබෙනවා. මෙච්චර දීර්ඝ කාලීන ඉතිහාසයක් තිබෙන, සභ්‍යත්වයක්, සංස්කෘතියක් තිබෙන ජාතියක් හැටියට ශ්‍රී ලංකාවේ අයට ඒ වාගේ හිතන්න බැරි එක ගැන මම බොහොම කනගාටු වනවා. මේ මොළ ගෙඩිවල මොනවාද තිබෙන්නේ කියා පරීක්ෂා කරලා බලන්න සිද්ධ වනවා කියලා මට කල්පනා වනවා මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස.

ඒ වාගේම දැන් කියනවා මේ රටේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම නැති කර තිබෙනවා කියලා. අධිකරණය විවේචනය කරනවා. අධිකරණයට විරුද්ධව ක්‍රියා කරන්න කියන මත ගොඩ නහලා තිබෙනවා මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. නමුත් අපි කොච්චර ලස්සනට, කොච්චර හොඳට මේවා ආරක්ෂා කර ගෙන ක්‍රියා කරලා තිබෙනවාද? අද වැරැදි තත්ත්වයක් මේ සමාජය තුළ ඇති වෙලා තිබෙනවාද? මොකවත්ම නැහැ කියලා මම කියන්නේ නැහැ. සාමාන්‍යයෙන් එහෙම දේවල් ඇති වනවා. ජීවත් වන මිනිස්සු අතරේ, පණ තිබෙන මිනිස්සු අතරේ නොයෙක් නොයෙක් වැරැදි ඇති වීම සාමාන්‍ය තත්ත්වයක්. ඒක මේ සමාජයේත්, මුළු ලෝකයේමත් තිබෙන තත්ත්වයක්. නමුත් ඒවා බොහොම වැඩියෙන් වර්ණනා කරලා, බොහොම දියුණු තියුණු තත්ත්වයට පත් කරලා ලෝකයටත් පෙන්වනවා, අපේ රට මෙහෙමයි, අපේ මිනිස්සු මෙහෙමයි, අපේ ක්‍රියාකාරිත්වය මෙහෙමයි කියලා. එහෙම පෙන්නුම් කරන ආකාරයට තමයි විපක්ෂය අද ක්‍රියා කර ගෙන යන්නේ.

ජනාධිපතිතුමා සම්බන්ධවත්, රජය සම්බන්ධවත් නොයෙක් නොයෙක් ආකාරයෙන් යම් යම් දේවල් කිව්වාට මේ ආණ්ඩුව තුළින් තමයි පහු ගිය කාල පරිච්ඡේදය තුළ මේ රටේ ගම් ප්‍රදේශවලට වැඩියෙන්ම සේවාවක් කළේ. මෙතෙක් ඇති වෙච්ච ඒ සියලු ආණ්ඩුවලට වඩා, "ගම නැගුම", "මග නැගුම" වාගේ ව්‍යාපාරවලින් සාමාන්‍ය ගම්බද ජනතාවට විශාල සේවාවක් ඉෂ්ට කරලා තිබෙනවා. කලින් හුඟක්ම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වුණේ නගර ප්‍රදේශවලයි. ඒකට කිව්වේ, "කොළඹට කිරි - ගමට කැකිරි" කියලා. එදා නගරයට කිරි හම්බ වෙලා ගමට කැකිරි හම්බ වුණාට දැන් තමුන්නාන්සේලාට කැකිරි නොවෙයි කිරිත් හම්බ වෙලා තිබෙන බව මම කියන්න කැමැතියි. හැම ගමකටම වාගේ සැහෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඉස්සර එහෙම ක්‍රියාත්මක වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඉස්සර ප්‍රාදේශීය සභාවකට, ගම් සභාවකට මුදලක් හම්බ වුණේ සාමාන්‍ය වැඩකට දෙකකට පමණයි. ඉස්සර පැවැති රජයන්වලින් වැඩකට දෙකකට පමණයි මුදලක් හම්බ වුණේ. නමුත් දැන් එහෙම නොවෙයි. විශාල මුදලක් ගම්බද ප්‍රදේශවලට ලැබිලා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක නැහැ කියන්න කාටවත් පුළුවන්කමක් නැහැ. ඒක නැහැ කියනවා නම් ඒ කියන්නේ ද්‍රෝහිකමටයි. ජාතියේ ද්‍රෝහීන් හැටියටයි ඒ කියන්නේ කියන එක මා ප්‍රකාශ කරන්න කැමැතියි.

කොහොම නමුත් අපි විපක්ෂයට කියනවා, මීට ඉස්සර වෙලා නව වතාවක් මේ පාර්ලිමේන්තුවට අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. පාර්ලිමේන්තුව කියන්නේ සම්ප්‍රදායයි. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ නීතිය ප්‍රධාන නැහැ. සම්ප්‍රදායයි එංගලන්තයේ පාර්ලිමේන්තුව ආරක්ෂා කරන්නේ. එංගලන්තයේ පාර්ලිමේන්තුව අනුගමනය කිරීමකුයි අපි මේ පාර්ලිමේන්තුව තුළින් කරන්නේ. ඒ සම්ප්‍රදාය ක්‍රියාත්මක කිරීමේදී ඒක වැරැදියි කියලා දැන් කියන්නේ කොහොමද කියලා මම අහනවා. එහෙම කථා කරන්නේ එක්කෝ වැරැදි තත්ත්වයක් පෙන්නුම් කිරීමේ ක්‍රියාමාර්ගයක් හැටියට. එහෙම නැත්නම් නොදන්නාකම නිසා කියන එකයි අපට ප්‍රකාශ කරන්න තිබෙන්නේ. කෙසේ වුවත්, මේ අතුරු සම්මත ගිණුම හරියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා විපක්ෂයේත් ආධාරය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ලබන මැතිවරණයේදී ජයග්‍රහණය කරන්නේත් මේ ආණ්ඩුවම තමයි. මේ ආණ්ඩුවමයි ආයේත් ජයග්‍රහණය කරන්නේ. ඔය "ජාති" කතා මොනවා කිව්වත් හරි යන්නේ නැහැ. මේ රටේ ජනතාව සම්පූර්ණයෙන් සැදී පැහැදී ක්‍රියාත්මක වෙලා ඉන්නේ මේ රජය තව දුරටත් බලයට පත් කරලා මේ රට දියුණු කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නයි. යුද්ධය අවසන් කරලා රට සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ දැන් ආරම්භ කරලා තිබෙනවා. තමුන්නාන්සේලාත් ආධාර උපකාර කළෝතින් ඒ ආරම්භ කරපු වැඩ පිළිවෙළ තුළින් ලංකාව ලෝකයේ දියුණු රටක් බවට පත් කිරීමට පුළුවන් වනවා කියන එක ප්‍රකාශ කරමින්, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස ඔබවහන්සේට ස්තුති කරමින් මා නතර වනවා.

[අ. භා. 2.38]

**ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා**
**(மாண்புமிகு கே. வி. சமந்த வித்தியாரத்ன)**
(The Hon. K.V. Samantha Vidyaratne)

මුලසුන හොබ වන ගරු ස්වාමීන් වහන්ස, 2010 වසරට අදාළ අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ මොහොතේ අපි දන්නවා, අදත්, පසු ගිය දවස් කිහිපය තුළත් රටේ ලොකු ආන්දෝලනයකට ලක් වුණු, රටේ අවධානය යොමු වුණු විශේෂ කාරණයක් තිබෙන බව. ඒ තමයි අපේ රටේ හිටපු හමුදාපති, වර්තමාන ඒකාබද්ධ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සරත් ෆොන්සේකා මැතිතුමා මේ වන විට ඇමෙරිකාවේ පෞද්ගලික සංචාරයක නිරත වෙමින් සිටින බවත්, ඇමෙරිකාව එතුමාගෙන් ප්‍රශ්න කිරීම සඳහා සූදානම් වන බවත් දැන ගන්නට ලැබීම. එය මේ රටේම ආන්දෝලනයට ලක් වෙලා තිබෙනවා. ඔහුගෙන් ප්‍රශ්න කිරීමට නියමිතව තිබුණේ අද අපේ රටේ වේලාවෙන් සවස 3.00ට. හැබැයි මේ වන විට අපට විශ්වාසදායක ලෙස ආරංචි වෙලා තිබෙනවා, ප්‍රශ්න කිරීමට ලබා දුන්නු ඒ වේලාවත්, සියල්ලත් ප්‍රතික්ෂේප කරලා සරත් ෆොන්සේකා මැතිතුමා තමන්ගේ මව් භූමියට එන්නට අද ලංකා වේලාවෙන් පෙ.ව. 11.00ට වොෂිංටන් නුවරින් පිටත් වෙලා තිබෙන බව. ඔහු හෙට උදෑසන 4.45ට කටුනායකින් මේ මාතෘ භූමියට පය තබනවා. අපි සතුටු වනවා ඒ ගැන. අපි බොහොම ගෞරවාන්විත විධියට ඔහුට ප්‍රණාමය පුද කරනවා. අධිරාජ්‍යවාදීන් හමුවේ, ඇමෙරිකාව හමුවේ දණ නොනමා, ඔවුන්ගේ ප්‍රශ්න කිරීම් හමුවේ දණ ගහන්නේ නැතිව එය ප්‍රතික්ෂේප කරලා, තමන්ගේ මාතෘ භූමියේ ගෞරවය ආරක්ෂා කරලා ආපසු මේ මාතෘ භූමියට එන්න තරම් ශක්තියක් ධෛර්යයක් ඒ හිත තුළ තිබීම සම්බන්ධයෙන් නැවත වතාවක් අපේ ගෞරවය, ප්‍රණාමය මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී එතුමාට පුද කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, වෙන දා නම් අපි සෑම අවුරුද්දකම නොවැම්බර් මාසයේ දෙසැම්බර් මාසයේ විවාදයට ලක් කරන්නේ ඉදිරි වර්ෂයට ඉදිරිපත් කරනු ලබන විසර්ජන පනත් කෙටුම්පත, නැත්නම් අය වැය ලේඛනය. සෑම ආණ්ඩුවකම වග කීමක් තමයි, ඉදිරි වර්ෂය සඳහා වන ආර්ථික වැඩ පිළිවෙළ ඊට පෙර වර්ෂයේ අවසාන මාස කිහිපයේ පාර්ලිමේන්තුවේ විවාද කරලා සම්මත කර ගැනීම. අපි පසු ගිය වසර ගණනාවකම ඒ විධියට විසර්ජන පනත් කෙටුම්පත නැත්නම් අය වැය ලේඛනය සම්මත කර ගනු ලැබුවා. නමුත් අවාසනාවකට වාගේ මේ රජයට 2010 වසරට ආර්ථික වැඩ පිළිවෙළක් නොමැති බැවින් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා අද ඒ ගැන විවාදයට ලක් කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, වසරට මාස 12ක් තිබෙනවා. අද මේ සම්මත කර ගන්න හදන ආර්ථික වැඩ පිළිවෙළෙන් - මේකට වැඩ පිළිවෙළක් කියන්නත් බැහැ- මාස හතරක් සඳහා වියදම් කිරීමට අවශ්‍ය මුදල් පමණයි වෙන් කර ගනු ලබන්නේ. පසු ගිය වසරවල අය වැය විවාදය පැවැත් වුණ අවස්ථාවල මේ අපේ මේස පිරෙන්නට අපට පොත් පත් ලැබෙනවා. ලොකු අය වැය ලේඛනයක් ලැබෙනවා. ඒ වාගේම එක් එක් අමාත්‍යාංශ ඉදිරි වර්ෂයේ කරන වැඩ පිළිවෙළ සටහන් කරලා අපට ලබා දෙනවා, “මෙන්න මේ ව්‍යාපෘති තමයි අපි කරන්නේ” කියලා. නමුත් අද එහෙම එකක් අපට ලැබිලා නැහැ. මේ න්‍යාය පත්‍රයේම ඉලක්කම් ප්‍රමාණයක් සටහන් කරලා දීලා තිබෙනවා මෙන්න මෙහෙමයි මේක කෙරෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අද මේ රට ඉතා අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියලා අපි කියන්නේ නිකම්ම නොවෙයි. ඉදිරි වර්ෂයට අදාළ ආර්ථික වැඩ පිළිවෙළ, ඒ සඳහා මුදල් සම්පාදනය කර ගන්නා ආකාරය, ඒ මුදල් වියදම් කරන ආකාරය අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ, මේ රටේ මුදල්වලට වග කියන පාර්ලිමේන්තුවේ කතා කරන්න බැරි තත්ත්වයකට පත් වනවා කියන්නේ ඉතා කනගාටුදායක තත්ත්වයක්. ආණ්ඩුව මොන තර්ක ගෙනාවාත් ඒක කනගාටුදායක තත්ත්වයක්. අපි එහෙම කියන්නේ, මාස හතරකට වෙන් කරන මේ මුදල් ප්‍රමාණය වෙන් කරනවාත් එක්කම රටේ තවත් ආයතන ගණනාවක් අර්බුදයට පත් වන නිසායි. කල්පනා කරලා බලන්න. මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අපේ රටේ පළාත් 09ක් තිබෙනවා. දැන් ඒ පළාත්වල පළාත් සභා පිහිටුවා තිබෙනවා. ඒ පළාත් සභාවල අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේ කොහොමද? ඒක ඉදිරිපත් කරන එක ලෙහෙසි පහසු වන්නේ නැහැ. ඇයි? ඊයේ පෙරේදා බස්නාහිර පළාත් සභාවේ අය වැය ලේඛනයක් එළි දැක්වූවා. අපි දන්නේ නැහැ කොහොමද කළේ කියා. ඇයි? මේ පාර්ලිමේන්තුවෙන් බස්නාහිර පළාත් සභාවට 2010 වසරේ වෙන් කරන්නේ මෙන්න මේ මුදල් ප්‍රමාණයයි කියා තීන්දුවක් ගන්නේ නැතුව එතැන කොහොමද ඒක හදන්නේ? හිතලුවක් පමණයි. හිතලා මෙන්න මෙච්චර ප්‍රමාණයක් ලැබෙනවා කියා හදන්න පුළුවන්. ඒ නිසා අද පළාත් සභාත් අකර්මණ්‍ය තත්ත්වයට පත් වෙලා. මහ ආණ්ඩුවෙන් ප්‍රාදේශීය සභාවට, නගර සභාවට වෙන් කරන වාර්ෂික මුදල් ප්‍රමාණය දැන ගන්නේ නැතුව කොහොමද අපේ රටේ පළාත් පාලන ආයතන ඒ මුදල් ප්‍රකාශන සකස් කරන්නේ? ඔහොම නිකම් ඉලක්කයට පුරෝකථනය කර එකක් හදා ගන්න පුළුවන් වෙයි. නමුත් ඒක නිශ්චිත ලෙස හදන්න බැහැ. ඒ නිසා රාජ්‍යයම අරාජිකත්වයට, අකර්මණ්‍ය වන තත්ත්වයට පත් කරන ලේඛනයක් බවට මේක පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මහින්ද රාජපක්ෂ රජය අපේ රටට පළාත් සභා මැතිවරණ එව්වා වාගේ මේ ගෙවන්නේ. කෑලි කරලා කෑල්ලෙන් කෑල්ල වෙන් කර එවනවා. එකින් එක තියලා බලනවා. අය වැය ලේඛනයත් කෑලි කරලා තිබෙන්නේ. ඒ නිසා මාස හතරට එක බැගින් අතුරු සම්මත ගිණුමක් එවන්න වාගේ තමයි සූදානම. මේක අතුරු සම්මත නොවෙයි හතුරු සම්මත ගිණුමක්; හතුරන්ට සම්මත වූ ගිණුමක්; රටේ ජන සම්මතයට, සම්ප්‍රදායට, නීතියට අවනත වෙච්ච නැති ගිණුමක්. ඒ නිසා මේක හතුරු සම්මත ගිණුමක්. මේක රටට සුබදායක නැහැ. ඒ නිසා මැතිවරණ කෑලි කළා වාගේ අය වැයත් කෑලි කරන්න පටන් අර ගෙන තිබෙනවා. අය වැය ලේඛනයක් එන කොට අපේ රටේ ජනතාව සාමාන්‍යයෙන් බලා ගෙන ඉන්නවා, රජයේ සේවකයෝ බලා ගෙන ඉන්නවා පඩිය වැඩි වෙයි කියා. පෞද්ගලික අංශයේ සේවකයෝ බලා ගෙන ඉන්නවා, “අපිටත් මොනවා හරි යහපතක් වෙයි” කියා; බඩු මිල අඩු වෙයි කියා. ගොවියා බලා ගෙන ඉන්නවා ගොවියාට සහනයක් ලැබෙයි කියා. එහෙම බලාපොරොත්තු තියා ගෙන හිටපු රටේ වැසියන්ගේ සියලු බලාපොරොත්තු සුන් වෙලා තිබෙනවා; සුන්නද්දූලි කර දමා තිබෙනවා. ඒ නිසා මේකෙන් වැටුප් වැඩි වන්නෙත් නැහැ. බඩු

[ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා]

මිල අඩු වන්නෙත් නැහැ. බදු අඩු වන්නෙත් නැහැ. අලුත් රැකියා එන්නෙත් නැහැ. මොනවාවත් මේ අතුරු සම්මත ගිණුමේ සඳහන් වෙලා නැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඒ නිසා මේකේ මොකවත් නැහැ. මේ ආණ්ඩුවට මොකවත් නැහැ. ඒකෙන් කිය වෙන්නේ එහෙමයි. අතුරු සම්මත ගිණුමේ පතුරු ගැලවී ගැලවී යන කාලය ඇවිල්ලා තිබෙන්නේ. එවන් ගිණුමක් ගැන කථා කරන්න ගියාම කථා කරන්න දෙයක් හොයා ගන්න බැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. බංකොලොත් ආණ්ඩුවක බංකොලොත්භාවය ප්‍රදර්ශනය කිරීමේ ගිණුමක් බවට මේක පත් වෙලා තිබෙනවා. මාස හතරකට තමයි මුදල් වෙන් කරන්නේ. කොහොමද වෙන් කර තිබෙන්නේ?

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මා ළඟ පසු ගිය අවුරුද්දේ, 2008 නොවැම්බර් - ඒ කියන්නේ මේ අවුරුද්දට අදාළ මුදල් ප්‍රකාශනයේ මූලික තොරතුරු - අය සහ වැය සාරාංශය තිබෙනවා. ඒකට අනුව මේ 2009 අවුරුද්දට පසු ගිය අය වැය ලේඛනයෙන් මූලධන වියදම් සඳහා වෙන් වෙලා තිබුණා, රුපියල් කෝටිවලින් කිව්වොත් රුපියල් කෝටි 43,940ක්. පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර තිබුණා, රුපියල් කෝටි 80,391ක්. ඒ අපි මේ ගත කරන අවුරුද්දට. ඒ අනුව පසු ගිය අවුරුද්දේ මූලධන වියදම් සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ මුළු මුදල රුපියල් කෝටිවලින් ගත්තොත්, රුපියල් කෝටි 1,24,331ක්. එහෙම නම් මාස හතරකට පසු ගිය අවුරුද්දේ මුදල වෙන් කර බැලුවොත්, ඒක කොටස් තුනකට වෙන් කළොත් මුල් මාස හතරට ආ යුතුයි රුපියල් කෝටි 41,443ක්. ඒ කියන්නේ මේ 2009 අවුරුද්ද. මුල් මාස තුනට වෙන් වෙලා තිබුණා, රුපියල් කෝටි 41,443ක්. හැබැයි මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මේ අතුරු සම්මත ගිණුමෙන් 2010 වසරේ මාස හතරකට වෙන් කර තිබෙන්නේ මූලධන වියදම රුපියල් කෝටි 15,898යි. පුනරාවර්තන වියදම සඳහා රුපියල් කෝටි 19,747යි. දෙකම එකතු කළාම රුපියල් කෝටි 35,646.55යි. එතකොට 2009 වර්ෂයට සාපේක්ෂව මේ 2010 අවුරුද්දේ මාස හතරට අඩු කර තිබෙනවා, රුපියල් කෝටි 5798.28ක්. සියයට 15ක් කපලා. එහෙම කප්පාදුවකට තමයි ඇවිත් තිබෙන්නේ. ඒ නිසා ඒවා හංගලා. එහෙන් මෙහෙන් කරලා. අර්බුදයක් නැහැ කිය කියා කපනවා. එහෙම ආපු එකක් තිබෙන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් හරියට විග්‍රහ කර බලනවා නම් මේ රටේ 2010 වසර කියන්නේ අවාසනාවන්ත වසර බවට පත් වන එක වළක්වන්න බැහැ. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය අඩු කර නැහැ. පසු ගිය අවුරුද්ද ඉක්ම වන ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. එම වැය ශීර්ෂයට ජනාධිපතිවරණයක් එන මොහොතක මූලධන වියදම් සඳහා පමණක් මාස හතරට වෙන් කර තිබෙනවා, රුපියල් කෝටි 138.82ක්. පුනරාවර්තන වියදම් අත් හැරලා මා කියන්නේ. නමුත් මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මේ රටේ දුප්පතුන් නඟා සිටු වීමේ වැඩ පිළිවෙළ වුණු සමෘද්ධිය සඳහා සමෘද්ධි කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුවට 2010 මුල් මාස හතරට වෙන් කර තිබෙන්නේ රුපියල් කෝටි 0.10යි, ඊයේ අපට දීපු ලේඛනයට අනුව. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට 2010 මුල් මාස හතරට වෙන් කරලා තිබෙන්නේ රුපියල් කෝටි 9.46යි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වෙන් කර තිබෙන්නේ රුපියල් කෝටි 13.16යි. නමුත් ජනාධිපතිවරයාට මූලධන වියදම් සඳහා වෙන් කර තිබෙනවා, රුපියල් කෝටි 138ක්. මොකක්ද, මේකේ සාධාරණය? මෙය, මේ රටේ ජනතාව වෙනුවෙන් හැදුණු අතුරු සම්මත ගිණුමක්ද, එහෙම නැත්නම් ජනතාවට වෙච්ච හතුරු සම්මත ගිණුමක්ද කියලා මුලින් ප්‍රශ්න කළේ එවැනි කරුණු කාරණාත් එක්කයි.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මෙවන් ගිණුමක් පිළිබඳව තමයි අද අපට සාකච්ඡා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. කල්පනා කරලා බලන්න. මා මුලිනුත් කිව්වා, අය වැය ලේඛනයක් කියන්නේ අවුරුද්දක් පුරාවට මේ රජය එකතු කර ගන්නා මුදලත්, ඒ මුදල වියදම් කර ගන්නා ආකාරයත්, ඉදිරි වර්ෂයේ ආර්ථික වැඩ පිළිවෙළත් එළි දක්වන ලේඛනයක් කියලා. ඒක සෙල්ලම් එකක් නොවෙයි. නමුත් අද ඒ ලේඛනය මේ තත්ත්වයට වැටුණේ ඇයි කියලා අපි ප්‍රශ්න කරනවා. මේ ආණ්ඩුව කියන්නේ, "ලබන මහා මැතිවරණයෙන් පස්සේ පත් වන ආණ්ඩුවට අය වැය ලේඛනය සකස් කර ගන්න අපි ඉඩ දීලා තිබෙනවා"ය කියලායි; "සදාචාර සම්පන්න ක්‍රමයකට අපි ආවා"ය කියලායි. නැහැ. එහෙම බැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඒක නීතියක් බවට පත් වුණොත්, ඔය කියන එක සම්මතයක් බවට පත් වුණොත් තවත් වෙනසක් කරන්න ඕනෑය කියලා අපි කියනවා. මොකක්ද, වෙනස? එහෙම නම් මේ රටේ මැතිවරණ පවත්වන්න, අවුරුද්ද අවසානයේ. එතකොට පත් වන ආණ්ඩුවට පුළුවන්, ඊ ළඟ අවුරුද්දට අය වැය ලේඛනය හදා ගන්න. ඔය කියන එක නොවෙයි ඇත්ත කාරණය. ඇත්තටම මේකේ සැඟවිලා තිබෙන අදහස මොකක්ද?

අතුරු සම්මත ගිණුමකට මේ ආණ්ඩුවට යන්න වුණේ ඇයි? මේ කියන එක පැත්තකට දමන්න. දැනුමක්, තේරුමක් තිබෙන මේ රටේ හැම දෙනාටම තේරෙනවා, ඇත්ත මේ කියන එක නොවෙයි කියලා. අපි දන්නවා, මැතිවරණය අවුරුද්ද මුලක පැවැතුණත් මීට පෙරාතුව මේ රටේ තිබුණු ආණ්ඩු අය වැය ලේඛන සකස් කළ බව. එහෙම සම්ප්‍රදායක් මේ රටේ තිබුණා. ඒක තමයි නීතිය. ඒක තමයි සම්මතය. ඇයි ඒකට පයින් ගහන්නේ? බංකොලොත්කම වසා ගන්නට කියන කාරණයක් මිසක වෙනත් යමක් නොවෙයි මේකේ තිබෙන්නේ. ඇත්ත සැඟවුණු හේතුව මොකක්ද? මේ ආණ්ඩුවට අතුරු සම්මත ගිණුමකට එන්න වුණේ ඇයි කියලා අපි ප්‍රශ්න කරනවා. ඇත්ත හේතුව, රට ලොකු ආර්ථික අර්බුදයකට මුහුණ දීලා තිබෙන එකයි. ආදායම් අඩු වෙලා; වියදම් වැඩි වෙලා; දුවන්නට බැරි තත්ත්වයට පත් වෙලා; මැතිවරණ දෙකක් අභිමුඛව තිබෙනවා.

ආණ්ඩුව මේ වන විට සාකච්ඡා කරනවා, ජනාධිපතිවරණයකට යා යුතුයි කියලා; මහා මැතිවරණයකට යා යුතුයි කියලා. එවන් මොහොතක සහන සපයන්න බැරි අය වැය ලේඛනයක් ආවොත් කොහොමද, මැතිවරණවලට මුහුණ දෙන්නේ? අපි දන්නවා, ඉතිහාසයේ නම් රටේ යම් ආර්ථික හයියක් තිබුණු කාලයේ මැතිවරණයක් එන කොට ඡන්ද ලබා ගැනීම සඳහා ආණ්ඩු බොහොම කැමැත්තෙන් ජනතාවට සහන ටිකක් වැඩි කරන බව; සහන අය වැය ගෙනෙන බව. එහෙම සහන අය වැයකුත් නැති තත්ත්වයට මේ ආණ්ඩුව පත් වෙලා. අසහනයට පත් වී තිබෙන්නේ රජයයි; මේ ආණ්ඩුවයි. ඒ බංකොලොත්කම වසා ගන්න වෙනත් අසත්‍ය, මුසාවාද ඇද බාමින්, "පත් වන ආණ්ඩුවට අය වැය ලේඛනය හදන්න ඉඩ දීලා අපි අතුරු සම්මත ගිණුමකට යනවා"යි කියන්නේ ඇත්ත කථාව වහලායි. මේ ආණ්ඩුවට ඔච්චර හයියක් තිබෙනවා නම්, ඔච්චර විශ්වාසයක් තිබෙනවා නම් ජනතාවටත් හොඳට සහන දීලා, ඔය මැතිවරණ දෙකත් කරන්න අය වැය ලේඛනය ගෙනෙන්නේ නැත්තේ ඇයි කියලා අපි අහනවා. මෙතුමන්ලාට පුළුවන් නම් අය වැය ලේඛනය ගෙනෙනවා. ගෙනෙන්නේ නැත්තේ, ඇත්ත තත්ත්වය අමාරු නිසායි. ගෙනෙන්න බැහැ. ඇත්ත අය වැය එළියට දැම්මොත් ඔය මැතිවරණවලට මුහුණ දෙන එක ලෙහෙසි පහසු වන්නේ නැහැ. ඒක වහලා දමලා, වෙනම කථා ගොතලා මෙතැන වෙනම කථාවක් කියනවා. ඒ නිසා මේ රටේ ජනතාව ඇත්ත තේරුම් ගත යුතුයි කියලා අපි හිතනවා, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. කල්පනා කර බලන්න. මේ ආණ්ඩුවේ ඇම්බැට්ටයෝ එහෙම කිව්වාට ඇත්ත ඒක නොවෙයි.

එක්සත් ජාතික පක්ෂය සහ මේ රටේ පැවැති ආණ්ඩු මේ රටේ ආර්ථිකය ගෙන ගිය මාර්ග ගත්තාම දැන් අපේ රටේ ආර්ථිකය බොහොම අර්බුදයකට ලක් වෙලා තිබෙන බව අපි දන්නවා. හඳුන්වා දීපු ආර්ථික උපාය මාර්ග බංකොලොත් වෙමින් එන්නේ. දැන් ඒවා එකින් එක අර්බුදයට පත් වෙමින් තිබෙන්නේ. කර්මාන්ත වැහෙමින් යනවා; කෘෂි කර්මාන්තය ක්‍රම ක්‍රමයෙන් අර්බුදයට පත් වෙමින් තිබෙනවා; රාජ්‍ය සේවය දියාරු වෙමින් තිබෙනවා. ඉතින් මෙවැනි තත්ත්වයක් ඇතුළේ ආණ්ඩුවට ගොඩ එන්න බැහැ. රාජ්‍ය ආදායම වැටිලා. මේකට මහින්ද රාජපක්ෂ විතරක් නොවෙයි; මේ රටේ පැවැතුණු ආණ්ඩු සියල්ලම වග කියන්න ඕනෑ. ඒ ගිය මාර්ගයේ අනිටු ඵල විපාක දැන් අපේ රට තෙළන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා රටේ ආදායම අඩු වන්නට පටන් ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඒක අපට පෙන්නුම් කරන්න පුළුවන්, 2009 අවුරුද්දේ මැද අපට දුන්නු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේඛනයෙන්. "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2009 -" මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් නිකුත් කළා. ඒ වාර්තාවේ ඉතා පැහැදිලිව තිබුණා, රාජ්‍ය ආදායම වැටී තිබෙන ආකාරය. කොහොමද වැටිලා තිබෙන්නේ? 2008 අවුරුද්දට -ගිය අවුරුද්දට- අදාළ අය වැය ඉදිරිපත් කරන කොට රුපියල් මිලියන 7,94,000ක් ආදායම ලැබෙනවා කියලා ඇස්තමේන්තු කරලා අපිට පෙන්නුවා. හැබැයි සත්‍ය වශයෙන්ම 2008 අවුරුද්ද ඉවර වෙන කොට ලැබුණේ අඩු ආදායමක්. කීයද? ලැබුණු ඇත්ත ආදායම තමයි රුපියල් මිලියන 6,63,000ක්. රුපියල් මිලියන 89,000ක් අඩු වුණා. 2008 දී ඇස්තමේන්තු කරපු ප්‍රමාණයෙන් රුපියල් මිලියන 89,000ක් අඩු වුණා. අද තත්ත්වය ඊටත් වැඩිය නරකයි. 2009, 2008ටත් එහා ගිහින් ඇස්තමේන්තු කරපු ආදායම බරපතළ ලෙස කඩා ගෙන වැටිලා තිබෙනවා. දැන් තත්ත්වය ඒකයි. එහෙම තත්ත්වයක් තුළ ආදායම වැටෙන කොට කොහොමද ජනතාවට සහන දෙන අය වැයක් සකස් කරන්නේ? ඒක තමයි වහන්නේ. ඕක තමයි ඇත්ත කාරණය. සහනයක් දෙන්න බැහැ. ආදායම වැටිලා. ඇයි ආදායම වැටෙන්නේ? බදු ගෙවන්න හැකියාවක් නැහැ; කර්මාන්ත වැහෙනවා. "අපි වවමු - රට නඟමු" කිව්වාට කෘෂි කර්මාන්තය නැඟිටලා නැහැ. රටේ ජනතාව බදු පීඩනයට අහු වෙලා. ඒ අතරේ රටේ ගොවියා ගොවිතැනින් නික්මෙන තත්ත්වයට පත් වෙලා. පිට රටින් සියලු දේ ගේන තත්ත්වයට පත් වෙලා. ඒ හින්දා බංකොලොත් වෙමින් යන්නේ. මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අද එහෙම තත්ත්වයක් තමයි රටේ තිබෙන්නේ.

2009 වසරේ මුල් මාස පහ තුළ 2008 වසරේ එම කාලයට සාපේක්ෂව බදු ආදායම විතරක් සියයට 6.7ක් අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ 2008ට වඩා අඩු වීම 2009 මුල් මාස පහ තුළ සියයට 6.7යි. බදු නොවන ආදායම අඩු වෙලා තිබෙනවා සියයට 27.9ක්. ඔන්න තත්ත්වය. ඉතින් ඔහොම තත්ත්වයක් තියා ගෙන, "2010ට මෙච්චර ආදායමක් එනවා, මෙහෙම සහන දෙනවා" කියලා පුරෝකථනය කරන්නේ කොහොමද? දෙන්න බැහැ මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. අද වන කොට ආදායම වැටෙනවා. රාජ්‍ය වියදම වැඩි වනවා. ගිය අවුරුද්දේ ඇස්තමේන්තු කරපු ප්‍රමාණයට වැඩිය සියයට 28කින් රාජ්‍ය වියදම වැඩි වුණා. ඒ වැඩි වීම ඔප්පු කළා, මෙතැනට පරිපූරක ඇස්තමේන්තු හතළිස් ගණනක් ආවා. ඒකට සියඹලාපිටිය ඇමතිතුමා අදත් කිව්වා, "එහෙම ගේන්න වෙනවා. හදිසි අවශ්‍යතාවන්ට ගේන්න වනවා" කියලා. මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, දියුණු රටක් නම්, දියුණු රජයක් නම් ඒ රජයට පුළුවන් වෙන්න ඕනෑ එන අවුරුද්ද දැන්මම පුරෝකථනය කරන්න, "මෙච්චරයි ආදායම. ඒක මෙහෙමයි වියදම් කරන්නේ" කියලා. හැබැයි එහෙම කළත්, දියුණු තත්ත්වයක් ඇතුළේ වුණත් ඒ හිතන එක වෙනස් වෙන්න පුළුවන් ගෞරවණීය ස්වාමීන් වහන්ස. හදිසි තත්ත්වයක් ආවොත්, ආපදාවක් ආවොත්, සුනාමියක් ආවොත්, ගං වතුරක් ආවොත්, හදිසි යුද්ධයක් ආවොත් ඔන්න හදිසි තත්ත්වයක් ඇති වනවා. ඒකට මුදල් වෙන් කරලා තියන්න බැහැ නේ? අන්න එතකොට පරිපූරක එන්න පුළුවන්. හදිසි තත්ත්වයන්වලට ද මේ පරිපූරක ආවේ? නැහැ. ඇමතිවරුන්ට වාහන ගේන්න කියන්නේ හදිසි තත්ත්වයක්ද? ඒක පරිපූරකවල ගේන්න ඕනෑද? හදිසි තත්ත්වයකට ඇමතිවරුන්ට වාහන ගේනවාලු! ඊයේ ඉදිරිපත් කරපු පරිපූරකයේ තිබෙනවා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමතිතුමාට විදේශ ගමන් යන්න කියලා රුපියල් ලක්ෂ දහයක මුදලක් වෙන් කරලා. ඉතින් ඒක හදිසි තත්ත්වයක්ද? ඕකට මේ පරිපූරක ගේන්න ඕනෑද? මේ තිබෙන්නේ බංකොලොත්භාවය; බැරිකම. ඒ වාගේ තත්ත්වයටයි අද වැටිලා තිබෙන්නේ. රටේ ජනතාව ගැන කල්පනා කරන්නේ නැතිව ආණ්ඩුව අනිසි විධියට වියදම් කරන්න පටන් අර ගෙන තිබෙනවා. අද රට බොහොම අමාරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියලා ඔබවහන්සේත් දන්නවා.

රජයේ සේවකයන් දැන් වසර ගණනාවක ඉඳන් උද්ඝෝෂණය කරනවා පඩිය වැඩි කරලා දෙන්න කියලා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඊයේ ප්‍රකාශ කළා රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරනවා කියලා. ඒක මේ අතුරු සම්මත ගිණුමේ නැහැ. මුදල් වෙන් කරලා නැහැ. සියඹලාපිටිය ඇමතිතුමාගෙන් ඇහුවාට පස්සේ එතුමා මේ නිකම් වැය ශීර්ෂයක අංකයක් කියලා කියයි ඒකේ මුදල් තිබෙනවා කියලා. එහෙම එකක් හරියට ප්‍රකාශ කළේ නැහැ. මුදල් වෙන් කරපු බවක් මේකේ හරියට පැහැදිලිව නැහැ. අපි අහනවා වෙන් කළා නම් කීයක්ද වැටුප් වැඩි වීම දෙන්නේ කියලා. එහෙම ගණනක් නිශ්චිත කරලා නැහැ. රජයේ සේවකයන්ට විතරක් නොවෙයි, මේ රටේ වැඩ කරන හැම ජනතාවගේම වැටුප වැඩි වන්න අවශ්‍යයි ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඒ ජීවත් වීමේ අමාරුව නිසායි. ඒක රජය පිළිගන්නවා නම් රජයේ සේවකයන්ට වැටුප් වැඩි කරනවා වාගේම ආණ්ඩුව වග කියන්න ඕනෑ පෞද්ගලික අංශයේ සේවකයන් ගැනත්. පෞද්ගලික අංශයේ සේවකයන් තමයි මේ රටේ වැඩියෙන් ඉන්නේ. ඔවුන්ගෙත් ජීවන තත්ත්වය නඟා සිටු වන්න නම්, ඒ වැටුණු තත්ත්වයෙන් නැඟිටව වන්න නම් ඔවුන්ගේ වැටුප වැඩි කරන්න ඕනෑකම තිබෙනවා. ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, වතු කම්කරුවාටත් සාධාරණය ඉෂ්ට වුණේ නැහැ. පසු ගිය දා හාම් පුතුන්ගේ සංගමය එක්කත් කථා කළා. ඒ සාධාරණය ඉෂ්ට වුණේ නැහැ. ඔවුන්ගෙත් වැටුප වැඩි වන්න ඕනෑකම තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගෞරවණීය ස්වාමීන් වහන්ස. මේ රටේ ගොවි ජනතාව ඉන්නවා. ඔවුන් කිසිම සරණක් නැති ජනතාවක් බවට පත් වෙලා ඉන්නවා. ඔවුන්ට බීජ ටික මිලදී ගන්න බැහැ; කෘෂි රසායන ද්‍රව්‍ය ටික මිලදී ගන්න බැහැ; ඒ සඳහා යොදවන යෙදැවුම්වල මිල වැඩි වෙලා තිබෙනවා; අස්වැන්නට සාධාරණ මිලක් නැති වෙලා තිබෙනවා. ඔවුන්ට සාධාරණය ඉෂ්ට වන්න ඕනෑ. ඒකට තමයි ඉදිරි වර්ෂයට ආර්ථික වැඩ පිළිවෙළක් අවශ්‍ය වන්නේ. කෝ, ඒ වැඩ පිළිවෙළ කියලා අපි අහනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට වෙන් කර ඇති වෙලාව අවසානයි.

**ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே. வி. சமந்த வித்தியாரத்ன)
(The Hon. K.V. Samantha Vidyaratne)
මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස, මා අවසන් කරන්නම්.

කෝ ඒ වැඩ පිළිවෙළ කියා මම අහනවා. එහෙම වැඩ පිළිවෙළක් මේ ලේඛනයේ නැහැ. ඒ හින්දා බොරු පුරාජේරුකම් වැඩක් නැහැ. ඇම්බැට්ටයන්ගේ කතාවලින් මේක නවත්වන්න බැහැ. අද රට බොහොම දරුණු තත්ත්වයකට පත් වෙලායි තිබෙන්නේ. අපේ ගම්වල හාමතට වැටිච්ච මිනිස්සු ඉන්නවා; තුන් වේල කන්න නැති මිනිස්සු ඉන්නවා. එහෙම කිව්වාම සමහරුන් හිතන්න පුළුවන් එහෙම නැහැ කියා. කවුරු හරි ඒකට අභියෝග කරනවා නම් එන්න, අපි එක්ක යන්නම් එහෙම තැන් පෙන්වන්න. පසු ගිය දවස්වල බොන්න වතුර නැතුව මිනිස්සු දහ දුක් වින්දා. දැන් තමයි වැහි ටිකක් වැටෙන්න පටන් අර ගෙන තිබෙන්නේ. ඒත් කෑම ටික නැති මිනිස්සු තවම දහ දුක් විඳිනවා. එවැනි තත්ත්වයක් තුළ ඒ මිනිසුන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න බැරි අතුරු සම්මත ගිණුමක් තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ. ඒක නිසා තමයි අපි මේකට කිව්වේ මේක අතුරු සම්මත ගිණුමක් මිසක මේක රටේ ජනතාවට සහන දෙන ලියවිල්ලක් නොවෙයි කියලා; ගිණුමක් නොවෙයි කියලා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ඒ නිසා මේ වත්මන් රජයට වග කීමක් තිබෙනවා, මේ වාගේ ප්‍රෝඩාවන් නොකර එක්කෝ ඇත්ත තත්ත්වය රටට කියන්න. අපේ ආදායම වැටිලා, -ආදායම අඩු වෙලා- වියදම වැඩි වෙලා කියා කියන්න ඕනෑකම තිබෙනවා. රටේ ආදායම අඩු වන කොට තමයි පසු ගිය මාසයේ තව එක උගුලකට අසු වුණේ. මේ රට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් දැවැන්ත ණය මුදලක් ගත්තා. මේ තිබෙන්නේ, ඒ සඳහා දෙපාර්ශ්වය හුවමාරු කර ගත්තු ලිපි ලේඛන. මේ තිබෙන්නේ අභිප්‍රාය පළ කිරීමේ ලිපි. ඒවාට අනුව ගෞරවණීය ස්වාමීන් වහන්ස, ඔවුන් මේ ණය ඇපකරය දුන්නේ ආණ්ඩුවට කොන්දේසි

[ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා]

දමලායි. නැහැ කියනවා නම් ඒක අපට ඔප්පු කරන්න පුළුවන්. සියඹලාපිටිය ඇමතිතුමාලාගේ අත්සනින් නිකුත් කරපු ලිපි මේ. ඒවායේදී කොන්දේසි දැම්මා, ඉදිරියේ අය වැය පරතරය අඩු කරන්න ඕනෑය කියා. අය වැයක පරතරය අඩු කරනවා නම් කොහොමද හාමුදුරුවනේ අඩු කරන්න තිබෙන්නේ? අය වැය පරතරය අඩු කරන්න ඕනෑ වියදම අඩු කරලා ආදායම වැඩි කරලායි. කොහොමද වියදම අඩු කරන්නේ? මේ පාලකයෝ එක් කෙනෙක්වත් තමන්ගේ සාක්කුවෙන් වියදම අඩු කරන්න සූදානම් නැහැ. අඩු කරන්න සූදානම ජනතාවට දෙන සහනයෙන්. එහෙම නම් සහන කපන්න වනවා. අලුත් රැකියා දෙන්න බැහැ; බඩු මිල අඩු කරන්න බැහැ; බදු අඩු කරන්න බැහැ. සහන කපලා වියදම අඩු කරන්න සිද්ධ වනවා. ඊ ළඟ මහ මැතිවරණයෙන් පසුව එහෙම අය වැයක් ගෙනෙන්න තමයි මේ කට්ටිය පෙරුම් පුරා ගෙන ඉන්නේ. ඒ ඇත්ත, අතුරු සම්මත ගිණුමකින් වහලා මේ රටට පෙන්වන්නයි හදන්නේ. වියදම අඩු කරනවා, එහෙම. කොහොමද ආදායම වැඩි කරන්නේ? ආදායම වැඩි කරන්න වෙන්නේ බදු වැඩි කරලායි. එහෙම නම් ඒ වැඩි කරන්න වෙන්නේ ඇත්ත අය වැය ලේඛනයකිනුයි. ඒකට එකඟතාව පළ කර තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට. අන්න ඒ ජාතියේ හතුරු එකඟතාවන්වලට පැමිණිලා අද රටේ ජනතාව මුළා කරලා, මේ ජාතියේ ගිණුමක් ගෙනල්ලා, දැන් තමන්ගේ තිබෙන තත්ත්වයන් පවත්වා ගෙන ගිහිල්ලා මැතිවරණය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය කර ගෙන මේ එන්නේ රටේ ජනතාවට සලකන්න නොවෙයි කියා අපි කියනවා, ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඒ නිසා ඇත්ත තත්ත්වය හෙළි කරලා, මේ රටේ ජනතාවට එක්කෝ ඇත්ත කියලා, ඒ අමාරු ඔක්කොම විඳ ගෙන ඇත්ත අය වැය ලේඛනයක් හදන්නය, එහෙම නැත්නම් කරුණාකරලා ඔය ආණ්ඩු බලයෙන් අයින් වෙලා මේ රටේ ජනතාවට සලකන්න පුළුවන් ආණ්ඩුවක් පිහිටුවා ගන්න ඉඩ ප්‍රස්තාව දීලා, මේ රටේ ජනතාවට ඒ වාසනාවන්ත අවස්ථාව උදා කරලා දීලා සමු ගන්නය කියා අපි ඉල්ලනවා. ඒ සඳහා නායකත්වය ගන්න අපේ පක්ෂය සූදානම්. ඒ නිසා මේ හතුරු සම්මත ගිණුමට අපේ විරෝධය ප්‍රකාශ කරමින් නවතිනවා. ස්තුතියි.

[අ. භා. 3.00]

**ගරු ඩිව් ගුණසේකර මහතා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு டியூ குணசேகர - அரசியலமைப்பு அலுவல்கள், தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Dew Gunasekara -Minister of Constitutional Affairs and National Integration)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, කවදත් හොඳ කතාවක් කරන මගේ මිත්‍ර සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමාගේ කතාවෙන් පසුව කතා කරන්න ලැබීම ගැන සන්තෝෂ වනවා. එතුමා කතා කළේ මේක අය වැයක්ය කියා උපකල්පනය කර ගෙනයි; හිතා ගෙනයි. මේක අය වැයක් නොවෙයි. ඒක තමයි පළමු වැනි කාරණාව. අය වැයක්ය කියා හිතා ගෙන අය වැය පිළිබඳව කතාවක් තමයි එතුමා කළේ. [බාධා කිරීමක්] අනේ, මේ මට බාධා කරන්න එපා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මට තිබෙන්නේ කෙටි වේලාවක් නිසා මතු කරපු ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයන්න මා බලාපොරොත්තු වනවා. පළමු වන කාරණාව මේකයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කතා කරමින් යළිත් වරක් නීති ප්‍රශ්නයක් මතු කළා. ගරු කථානායකතුමා ඒ පිළිබඳව පැහැදිලි තීරණයක් දී තිබේද්දිත් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා යළි යළිත් ඒ ගැන නීති ප්‍රශ්නයක් මතු කරනවා. විපක්ෂ නායකතුමාම මතු කරපු මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අනුව බැලුවත් ඒකේ අවශ්‍යතාව සපුරා ලමින් තමයි අපි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන්නේ. එතුමා කියා සිටියා, මේ සඳහා විශේෂ යෝජනාවක් ගෙනෙන්නය කියලා. ඒ විශේෂ යෝජනාව තමයි මේ ගෙනෙන්නේ. ඒ වාගේම එහි 26(2) වගන්තිය යටතේ තිබෙනවා, ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට දන්වන්න ඕනෑය; එයට හේතු කාරණා දන්වන්නට ඕනෑය කියලා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, සති දෙකකට ඉස්සර වෙලා ගරු සභානායකතුමා විසින් නීතියේ අවශ්‍යතාවන් අනුව මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා, අපි මෙවැනි දෙයක් කරන්න යනවාය කියලා. එම නිසා ඒ නීතිය අනුවම -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ඇමතිතුමනි, මොහොතකට නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (வண.) உடவத்தே நந்த தேரர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு இரா. சந்திரசேகர்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. RAMALINGAM CHANDRASEKAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු ඩිව් ගුණසේකර මහතා**

( மாண்புமிகு டியூ குணசேகர)

( The Hon. Dew Gunasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේ නීතියේ අවශ්‍යතාවන් අපි අකුරටම සපුරාලමින් තමයි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන්නේ. මේක අලුත් දෙයක් නොවෙයි; අමුතු දෙයක් නොවෙයි; අමුතුවෙන් තෝරා බේරා ගත යුතු දෙයකුත් නොවෙයි; අලුතෙන් පැහැදිලි කර ගත යුතු දෙයකුත් නොවෙයි. මෙය සාමාන්‍ය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන හැම රටකම ක්‍රියාත්මක වන දෙයක්. වර්ෂ එක්දහස් අටසිය ගණන්වල ඉඳලා මේක අත් හදා බලපු දෙයක්. අපේ රටේත් 1931 ඉඳලාම අත් හදා බලපු දෙයක්. මේක ප්‍රායෝගික උපකරණයක්. විශේෂ හේතු නිසා ආණ්ඩුව විසින් අය වැයක් ඉදිරිපත් කරන්නේ නැහැ යි කියලා තීන්දුවක් ගත්තාම, ඊ ළඟට මෙවැනි අතුරු සම්මත ගිණුමක් ගෙනෙන එක සම්ප්‍රදායක්, දිගින් දිගටම. ඒ අනුව තමයි මේ කටයුතු කරලා තිබෙන්නේ. ඒක නිසා මේක ප්‍රජාතන්ත්‍රවාදයට හරස්ව ගත්තු ක්‍රියා මාර්ගයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මූල්‍ය පාලනයේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා තමයි මේ අතුරු සම්මත ගිණුමක් ගෙනාවේ. මොකද, කවුරුත් දන්නවා අපි මැතිවරණයකට යන්න ඉන්න බව. අපි හදිසියෙන් අය වැයක් ඉදිරිපත් කළා නම් ඒ ගැනත් අද කෙනෙකුට තර්ක කරන්නට පුළුවන්. එහෙම නම් විපක්ෂය මතු කරන ප්‍රශ්නය තමයි, සල්ලි වියදම් කරලා මැතිවරණය දිනා ගන්න අය වැයක් ගෙනාවාය කියන එක. ඒ තර්කය ඉදිරිපත් කරනවා. අද අනෙක් විදියට තර්කය ඉදිරිපත් කරනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදී විදියට, මේ සල්ලි මැතිවරණයකට පාවිච්චි කරන්නට ඉඩකඩ නොතබා, මූල්‍ය පාලනයක අවශ්‍යතාව තේරුම් ගනිමින් තමයි මේ තීරණයට බැස්සේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඒ ගැන ඊට වඩා කථා කරන්නට යන්නේ නැහැ.

ඊ ළඟට තවත් ප්‍රශ්න දෙක, තුනක් මතු කළා. ඒවාට පිළිතුරු සපයන්නට ඕනෑ. හරියට පසු ගිය කාලයේ මේ රටේ නොහිටපු කට්ටියක් වාගෙයි එතුමන්ලා කථා කළේ. අපි 2005 නොවැම්බර් මාසයේ 19 වැනි දා රජය භාර ගන්න කොට මේ රට සුනාමියෙන් පීඩනයට පත් වෙලා තිබුණු රටක්. ඒ පළමු වන කාරණය. දෙවනුව, අපට මුහුණ දෙන්නට සිදු වුණා ගෝලීය ආහාර හිඟයකට. ඊ ළඟට අපට මුහුණ දෙන්නට සිදු වුණා, ඉන්ධන අර්බුදයකට. ලෝක ඉතිහාසයේ පළමු වන වතාවට තෙල් බැරලය ඩොලර් එකසිය හතළිස් ගණනකට ගියා. එවන් අවස්ථාවක් කිසි දාක තිබුණේ නැහැ. එවැනි බරපතළ අර්බුදයකට අපට මුහුණ දෙන්නට

සිදු වුණා. ඊ ළඟට අපට මුහුණ දෙන්නට සිදු වුණා, 1929න් පසුව ඇති වුණු ගෝලීය මූල්‍ය අර්බුදයකට. ඊ ළඟට ඒ මූල්‍ය අර්බුදය හේතුවක් කර ගෙන අපට ආර්ථික අවපාතයකට මුහුණ දෙන්නට සිදු වුණා. අපේ රටට පමණක් නොවෙයි, මුළු ලෝකයටම - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල් 192ක් තිබෙනවා නම් ඒ රටවල් 192ටම- බලපාපු, දුප්පත්, පොහොසත්, දියුණු, නොදියුණු හැම රටකටම, ප්‍රජාතන්ත්‍රවාදී, ඒකාධිපති, රාජාණ්ඩු හැම එකකටම බලපාපු සාධක තමයි මේ තිබුණේ.

අපේ ආර්ථිකය පුංචි ආර්ථිකයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලෝක ආර්ථිකයේ වටිනාකම කියන්නේ, ට්‍රිලියන 60ක්. නැත්නම්, බිලියන 60,000ක්. අපේ ආර්ථිකය බිලියන 35යි. චුට්ටි ආර්ථිකයක්. බිලියන 60,000ක ආර්ථිකයකින් බිලියන 35ක පංගුවක් තමයි අපේ ආර්ථිකය. මේ පුංචි ආර්ථිකයට මේ වාගේ මහා දැවැන්ත සාගරයක, මහා ලෝක ආර්ථිකයේ මේ වාගේ අර්බුද ගොඩක් එන කොට අපිට ඒවාට මුහුණ දෙන්නට සිදු වනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිසි කෙනෙක් මේ ගැන කථා කළේ නැහැ. මේ තරම් අර්බුද තිබිලත් ආසියාවේ රටවල්වලින් වේලාසනින් මේ අර්බුදයෙන් ගොඩ ආපු එක් රටක් තමයි අපේ රට. ඇත්ත වශයෙන්ම අද ලෝකයේ රටවල්වලින් ආසියානු මහාද්වීපයේ රටවල් තමයි මේ අර්බුදවලින් ඉස්සෙල්ලාම ගොඩ ඇවිල්ලා තිබෙන්නේ. චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මේ රටවල් ඔක්කෝම ආසියානු මහාද්වීපයේ රටවල්. අපේ පුංචි රට වුණත්, පුංචි ආර්ථිකය වුණත්, ආණ්ඩුව අරගෙන ගිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මූල්‍ය ප්‍රතිපත්තිය යන fiscal monitoring ප්‍රතිපත්ති දෙක නිසා කොතරම් බාධක තිබුණත් අපට ශක්තියක් තිබුණා ඒවා හරියට හසුරු වන්නට. එසේ හසුරු වන ගමන් අපේ අමාත්‍යාංශවල තිබෙන අනවශ්‍ය වියදම් කපා හැර අරපරිස්සමින් අපට මේ අර්බුදයට මුහුණ දෙන්න සිදු වුණා. ඒ තරම් බරපතළ අර්බුදයක්. ලෝකයේ තිබෙන මහා දැවැන්තම ආර්ථිකය වන ඇමෙරිකානු ආර්ථිකය අවුරුද්දක් ගිහිල්ලාත්, අලුත් ජනාධිපතිවරයකු ඇවිල්ලාත් ඇමෙරිකානු ට්‍රිලියන හතරහමාරක් විතර පොම්ප කරලාත් තවමත් පණ ගන්වන්න බැරි වෙලා තිබෙනවා. ඊයෙත් ඔබාමා ජනාධිපතිතුමා කියා තිබෙනවා, යන්තම් අපට ආර්ථිකය පණ ගන්වන්න තව අවුරුදු දෙකක්වත් යනවා කියලා. එහෙව් වකවානුවක, එය පසු බිම් කර ගෙන තිබුණු අපේ ආර්ථිකය යුද්ධයක් කරන ගමන්ම යන්තම් පණ ගන්වන්න අපට පුළුවන් වුණා. යුද්ධයට බිලියන 250ක් පමණ ගියා. 1983 දී, එනම් යුද්ධය ආරම්භ වුණු පළමු වන වර්ෂයේ අප යුද්ධයට වැය කළේ බිලියන එකයි. 2009 වන විට මෙය බිලියන 250 දක්වා ඉහළ ගිහින් තිබුණා. එවැනි විශාල ධනස්කන්ධයක් අප යුද්ධයට වියදම් කළා. කාගෙන්වත් ආධාර ලැබුණේ නැහැ. මේ රටේ ජනතාවගේ සල්ලි තමයි යුද්ධය සඳහා පාවිච්චි කළේ. එහෙම සල්ලි පාවිච්චි කරලාත් අපි මිනිස්සු බඩගින්නේ නොතබා ආර්ථිකය රැක ගත්තා. ඒ කිසිවක් තුට්ටුවකටවත් ගණන් නොගෙන තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කළේ. ගණන් නොගෙන නොවෙයි. හොඳටම දන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව අරගෙන බලන්න. වැඩි විස්තර කියන්න මට වෙලාව නැහැ. මම ඒ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නම්. එතුමා අගමැතිවරයා වශයෙන් සිටි අවුරුදු දෙකේ කාලය -2002 සිට 2004 කාලය- අරගෙන බලන්න. දළ දේශීය නිෂ්පාදනය බැලුවොත් එදාට වඩා වැඩියි, අපි. ජාතික ඉතිරි කිරීම් බැලුවොත් එදාට වඩා වැඩියි, අපි. ආයෝජන බැලුවොත් එදාට වඩා වැඩියි, අපි. විදේශවලින් ලැබුණු සම්පත් බැලුවොත් එදාට වඩා වැඩියි, අපි. එදා මේ අර්බුද එකක්වත් තිබුණේ නැහැ. යුද්ධයක් කරන ගමන්ම මූල්‍ය අර්බුදයකට, ආහාර අර්බුදයකට, ඉන්ධන අර්බුදයකට, මේ සියල්ලකටම මුහුණ දෙමින් අපි ඒ විධියට කටයුතු කර තිබෙනවා. ඒ පැත්ත ගැන කිසිදු අගය කිරීමක් ඇත්තේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන් මතු කළ තව ප්‍රශ්නයක් තමයි බැංකු පොලී ප්‍රමාණය හදිසියෙන්ම අඩු කළාය කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2005 අය වැය ඉදිරිපත් කළ දවසේ ඉඳලා හැන්සාඩ් වාර්තා අර ගෙන බලන්න. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථාවල එක ප්‍රධානම කාරණාවක් තමයි ගිනි පොලිය අඩු කරන්න, පොලිය අඩු කරන්න කියන එක. වර්ෂයක් වර්ෂයක් පාසා හැම විවාදයකදීම මෙතැන කථා කළේ පොලිය අඩු කරන්න කියලායි. පොලිය අඩු කරන්න බැරි වුණු හේතු තිබුණා. ඒ වෙලාවේ පොලිය අඩු කරන්න පුළුවන් තත්ත්වයක් වුණාද? රටේ උද්ධමනය වැඩි වන කොට පොලිය වැඩි කරන්න ඕනෑ, උද්ධමනය පාලනය කරන්න. අපේ උද්ධමනය දැන් බැහැලා තිබෙන්නේ. ඒ නිසා තමයි පොලිය අඩු කරන්න අපට ඉඩකඩ ලැබුණේ. ආර්ථික විද්‍යාවේ සාධක ගොඩක් තිබෙනවා. එක සාධකයක් අනුව කටයුතු කරන්න බැහැ. සියලුම සාධක අර ගෙන තුලනය කරලා තමයි අපි විසඳුම් ඉදිරිපත් කරන්න ඕනෑ. අද උද්ධමනය බැහැපු නිසා අපට ඉඩකඩ ලැබුණා, පොලී අනුපාතය අඩු කරන්න. ඒ නිසා සියයට 8 සිට 12 දක්වා පොලිය අඩු කළා. දැන් කියනවා, බැංකු ටික කඩා ගෙන වැටෙයි කියලා. මේ කියන්නේ කවුද? මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න ඕනෑය කියලා කිව්ව අය. මහජන බැංකුවයි, ලංකා බැංකුවයි දෙකම පෞද්ගලීකරණය කර තිබුණා නම් මේ මූල්‍ය අර්බුදය වෙලාවේ අපේ ආර්ථිකය මුළුමනින්ම බිඳ වැටිලා. ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටුණා. බැංකු ඔක්කොම කඩා වැටුණා. එංගලන්තයේ බැංකු ඔක්කොම කඩා වැටුණා. යුරෝපයේ බැංකු ඔක්කොම කඩා වැටුණා. අපි ඇත්ත වශයෙන්ම අපේ ආර්ථිකය රැක ගත්තේ මහජන බැංකුවයි, ලංකා බැංකුවයි රාජ්‍ය මැදිහත් වීම්වලින් පාලනය කළ නිසායි. මේවා සත්‍ය දේවල්. මේවා යථාර්ථයට පදනම් වුණු කාරණා. මේවා තුට්ටු දෙකකටවත් සලකන්නේ නැතිව තමන් අනුගමනය කරන ආර්ථික න්‍යායයන් උඩ, එහෙම නැත්නම් ජනතාව මුළා කිරීමේ අරමුණ ඇතිව වැරදි අදහස්, විකෘති කළ අදහස් මෙතැන ඉදිරිපත් කරනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණාවක් ඔවුන් ඉදිරිපත් කළා. පොලී අනුපාතය ගැන කිව්වා. පොලී අනුපාතය අඩු කළාම එයින් මොකක්ද වන්නේ? පොලිය අඩු වන කොට සිදු වන පළමු වන කාරණය මිනිසුන් වැඩියෙන් ණය ගැනීමයි. ඊ ළඟට ඒක ආයෝජනයට බලපානවා. ආයෝජනය වැඩි වන කොට ඒක නිෂ්පාදනයට බලපානවා. නිෂ්පාදනය වැඩි වන කොට රැකියා වැඩි වනවා. ඒ චක්‍රය එහෙමයි යන්නේ. ඇත්ත වශයෙන්ම පොලිය වැඩි වෙලායි තිබුණේ. උද්ධමනය සියයට 28ක් වන කොට උද්ධමනය පාලනය කරන්න අපට තිබුණු එකම උපකරණය තමයි පොලී අනුපාතය. එය වැඩි කරලා උද්ධමනය අඩු කරන්න ඕනෑ. අපි අඩු කරලා තිබෙනවා. දැන් උද්ධමනය අඩු වෙච්ච තත්ත්වයක් යටතේ හොඳ වාතාවරණයක් නිර්මාණය වුණා, අපට පොලී අනුපාතය අඩු කරන්න.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ගණනුත් හදලා කියලා තිබුණා, People's Bank එකින් බිලියන 1.9ක පාඩුවක් වන බව. එතුමා accountant කෙනෙක් හන්දා accountant කෙනෙක් විධියට -එතුමා ආර්ථික විද්‍යාඥයෙක් නොවෙයි- ගණන් හදලා බලලා කියනවා, People's Bank එකින් රුපියල් බිලියන 1.9ක loss එකක් එනවා කියලා. නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොලිය අඩු වන කොට business වැඩි වනවා. මුදල් ප්‍රසාරණය වැඩි වනවා. මුදල් ප්‍රසාරණය වැඩි වන කොට අඩු කරන පොලී ප්‍රමාණය adjust වනවා. ඊ ළඟට වැඩියෙන් business ඇති වන කොට ඒ ප්‍රමාණය වහාම -ක්ෂණිකව- අඩු වුණත් ඊ ළඟට වර්ෂය අවසානය වන කොට අපේ ලාභ ප්‍රමාණය වැඩි වනවා. ඒක ආර්ථික විද්‍යාවේ මූලික සරල න්‍යායයක්. ඒවාවත් බලන්නේ නැතුව නිකම්ම ජනතාව මුළා කිරීම සඳහා කියනවා, "දැන් People's Bank එක ඉවරයි" කියලා. People's Bank එක පෞද්ගලීකරණය කරන්න ඕනෑය කියලා එහෙම පිටින්ම පිඹුරුපත් හදාපු කණ්ඩායම තමයි අද මේක ඉදිරිපත් කරන්නේ. ඒ නිසා ඒ තර්ක පිළිගන්න අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ.

තවත් කාරණාවක් ඉදිරිපත් කරලා තිබුණා. ඒ, අපි ඔක්කොම රටවල් තරහ කර ගෙන කියලා. අපේ මංගල සමරවීර මහතා මගේ මිත්‍රයා. එතුමාගේ කථාවේදී කියා සිටියා, අපි ඔක්කොම රටවල් තරහ කර ගෙන කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ විදේශ ප්‍රතිපත්තිය සියලු රටවල් එක්ක හොඳ සුහද මිත්‍රශීලි තත්ත්වයක් පවත්වා ගෙන යැමයි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි තේරුම් ගත යුතුයි, ලෝකය වෙනස් වන බව.

[ගරු ඩිව් ගුණසේකර මහතා]

තේරුම් ගන්න ඕනෑ, ලෝක ආර්ථික වේගය කොයි තරම් වේගයකින් වෙනස් වෙමින් යනවාද කියලා. අද ලෝකයේ ප්‍රධානම ආර්ථිකය තිබෙන්නේ ඇමෙරිකාවේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
( குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා, තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
( The Hon. Dew Gunasekara)

ඇමෙරිකාව අභිභවා මහා දැවැන්ත ආර්ථිකයන් මතු වෙමින් තිබෙනවා. ප්‍රධාන ආර්ථිකය ඇමෙරිකාව. දෙ වෙනි ආර්ථිකය ජපානය. තුන් වෙනි තැනට තිබුණු චීනය මේ අර්බුදය නිසාම දැන් දෙ වෙනි තැනට ළඟා වෙමින් තිබෙනවා. ආසියානු මහාද්වීපයේ රටවල් හයක තිබෙන දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකාව අභිභවා ගිහින් තිබෙනවා. ඒවායේ අගය ට්‍රිලියන 17යි. ඇමෙරිකාවේ ට්‍රිලියන 13යි. මුළු ලෝකයේම ආර්ථික වෙනස් වෙමින් තිබෙනවා. අද අත්ලන්තික් සාගරයේ සිට පැසිෆික් සාගරය පැත්තට තමයි ආර්ථික මධ්‍යස්ථානය මාරු වෙමින් තිබෙන්නේ. ඇමෙරිකාවේ සිට පීකිං නගරයට තමයි මාරු වෙමින් තිබෙන්නේ. මේක පවතින යථාර්ථයක්. ඒ නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය සකස් කර ගැනීමේදී, ජාත්‍යන්තර ආර්ථික සම්බන්ධතා සකස් කර ගැනීමේදී අපට පරණ විධියට -සාම්ප්‍රදායික විධියට- කටයුතු කරන්න බැහැ. සුද්දන්ගේ කාලයේ අපි හිටියා, එංගලන්තයත් එක්ක. නමුත් ඇමෙරිකාවත් එක්ක හිටියේ නැහැ. ලෝක දැවැන්ත ආර්ථිකයක් තිබුණු රටවල් එක්ක පුංචි ආර්ථිකයක්, එනම් බිලියන 35ක ආර්ථිකයක් තිබෙන අපි ඉදිරි අවුරුදු දහය වන කොට වඩා කිට්ටු වන්න ඕනෑ ඉන්දියාවත් එක්ක, චීනයත් එක්ක, ඉන්දුනීසියාවත් එක්ක, එනම් ආසියාවේ රටවල් එක්කයි. ඒ නිසා දැන් සිටම අපේ ආණ්ඩුව ඒ ගැන තීරණය අර ගෙන තිබෙනවා. අපි ඒක ගැන කියන්නේ නැහැ. අපි ඇමෙරිකාවත් එක්ක තරහ වෙනවා යැ, එංගලන්තයත් එක්ක තරහ වෙනවා යැ. ඔවුන් කියන කියන කොන්දේසිවලට අද අපට යටත් වන්න අවශ්‍ය වන්නෙත් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. අවසන් කරන්න.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
( The Hon. Dew Gunasekara)

අපි දුර්වල තත්ත්වයේ ඉන්න කාලයේ අපට කොන්දේසි දැම්මා. දැන් කිසිම කොන්දේසියකට යටත් වන්න අවශ්‍ය වන්නේම නැහැ. GSP Plus නැති කළත් ඩොලර් බිලියන 250ක් අපට හොයා ගන්න පුළුවන් නම් ඒක පියවන්න අපට පුළුවන්. එවැනි ශක්තිමත් තත්ත්වයකයි අපි ඉන්නේ. ඒ නිසා මේ අතුරු සම්මත ගිණුම ඇත්ත වශයෙන්ම තාවකාලික දෙයක්. ඒක ඉදිරිපත් කරන්නේ පසු කාලයකදී අලුත් ආණ්ඩුවකට ඉඩකඩ විවෘත කරන්න ඕනෑ නිසායි. අලුත් ජනාධිපතිවරයෙක්, - පරණ ජනාධිපතිවරයා ආවත් එතුමා අලුත් ජනාධිපතිවරයෙක් වෙන්නේ නැහැ. - පාර්ලිමේන්තුවත් අලුත් පාර්ලිමේන්තුවක්, ආණ්ඩුවත් අලුත් ආණ්ඩුවක්, - ඒවායේ ප්‍රතිපත්ති වෙනස් වන්න පුළුවන්. හුඟක් දේවල්වල වෙනස්කම් වන්න පුළුවන්. - ඒ හන්දා ඒ අලුත් ආණ්ඩුවට ඉඩකඩ සලසන්න ඕනෑ, 2010 අය වැය සම්පාදනය කරන්න. අන්න ඒ පරම චේතනාව අනුව තමයි අපි මේ අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

[අ. භා. 3.16]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉතාම කෙටි කාලයක් වුණත් මට ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මම ඒ සම්බන්ධයෙන් කරන කථාව පසෙක තබලා අපේ ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා මේ අවස්ථාවේදී කළ ප්‍රකාශයක් ගැන යමක් කියන්න ඕනෑ. ආර්ථිකය පිළිබඳ සමස්තය ගැන හිතලා තීරණ ගන්න ඕනෑය, ඒ වාගේම 2001 - 2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යුගයේ ආර්ථිකය කඩා වැටිලා තිබුණාය, ඒ වාගේ කාරණා ටිකක් එතුමා ඉදිරිපත් කළා. මා හිතා ගෙන හිටියේ ඔබතුමා විද්වතෙක් කියලායි. ඔබතුමාට අමතකද දන්නේ නැහැ, 2001 දී එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව ගන්න කොට තමයි ආර්ථිකය කඩා වැටිලා තිබුණේ කියන එක. ආර්ථිකය සෘණ අගයක් වෙලා තිබුණා. කටුනායක එයාර් පෝට් එකට ගහලා ගුවන් යානා විනාශ වෙලා තිබුණා. කොළඹ හැම තැනම බෝම්බ පුපුරනවා. අලි මංකඩ අල්ලලා. පුනරින් අල්ලලා. උතුරේ අපට තිබුණු හමුදා කඳවුරු නැති වෙලා. [බාධා කිරීමක්] ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමනි, ඔබතුමා කථා කරන වෙලාවේ මා බාධා කළේ නැහැ නේ. [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන වෙලාවේ මා බාධා කළේ නැහැ. ඒ නිසා මට කථා කරන්න දීලා වැදගත් විධියට ඉඳ ගන්න. ඔබතුමා කථා කළා. දැන් මම කථා කරනවා. ඔබතුමා විද්වතෙක් නම්, වැදගතෙක් නම් ඉඳ ගන්න. එම නිසා මා හිතන විධියට 2001 දී අපි ආණ්ඩුව ගන්න කොට තිබුණ ආර්ථික තත්ත්වය ගැන කාටවත් අපැහැදිලිකමක් නැහැ. නමුත් එදා පොලී අනුපාතය සියයට විසි ගණනකට නැඟලායි තිබුණේ. හොඳින් කළමනාකරණය කරපු නිසා බැංකු පොලී අනුපාතය සියයට 9ට කෘත්‍රිමව ගේන්න නොවෙයි, සමස්ත ආර්ථිකය තුළින්ම ස්වාභාවිකව ගේන්න අපට පුළුවන්කම ලැබුණා; අපි ඒකට දක්ෂ වුණා. ඒ නිසා තමයි අපි ආර්ථිකය ශක්තිමත් කළේ; අපට ආධාර දුන්නේ. අපේ පාක්ෂිකයෝ අපට බැණ බැණ යද්දීත් අනවශ්‍ය විධියට රැකියා දෙන්නේ නැතිව අපි හොඳට ආර්ථිකය කළමනාකරණය කළා. ඒ නිසා තමයි අපි 2003 දී මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත - Fiscal Management (Responsibility) Act එක- ගෙනාවේ. ඒ අනුව තමයි අය වැය පරතරය සියයට 5ට තබා ගන්න ඕනෑ කියන ප්‍රතිපත්තිය අපි පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගත්තේ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් කෝටි 26,000ක් ණය ආධාර ගන්න කොට ඒක IMF එකේ; ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නීතියක් බවට පත් කළා. මේ රුපියල් කෝටි 26,000ක් ණය ආධාර ගන්න කොට අවසානයේ අය වැය පරතරය සියයට 5ට ගේන්න ඕනෑ කියන එක කොන්දේසියක් කළා. එහෙම නම් මම පැහැදිලිව කියනවා, මේ ආර්ථිකය වෙනත් විධියකට මවා පාන්න හැදුවාට කළ යුත්තේ ඒක නොවෙයි කියන එක. ආර්ථිකය හසුරු වන්න අපි දක්ෂ වුණා. තමුන්නාන්සේ මොන කාරණය සම්බන්ධයෙන් චෝදනාවක් කිව්වත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආර්ථිකය සම්බන්ධයෙන් වග කීමෙන් වැඩ කළාය කියන එක ඔළුව තිබෙන ඕනෑ කෙනකුට තේරෙනවා.

මීට පෙරත් රජයන් විසින් අතුරු සම්මත ගිණුම් ගෙනැවිත් තිබෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. පසු ගිය දවස්වල දිගින් දිගටම පරිපූරක ඇස්තමේන්තු ගෙනාවා. ඒ වාගේම අද මේ අතුරු සම්මත ගිණුම ගෙන ඒමෙන් අපට පැහැදිලිව පෙනෙනවා අය වැයක් ඉදිරිපත් කරන්න ආර්ථික ශක්තියක් ආණ්ඩුවට නැහැයි කියන එක. මැතිවරණයක් ඉලක්ක කර ගෙන ජනතාව ඉල්ලන රැකියා බිහි කරන්න පුළුවන්කමක් නැහැ. ජීවන වියදම වැඩි වෙලා. වැටුප් වැඩි කරන්න පුළුවන්කමක් නැහැ. මේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න පුළුවන්කමක් නැහැ. ප්‍රධාන වශයෙන්ම අද මේ අතුරු සම්මත ගිණුම ගේන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඒක නිසායි. අපි කවුරු කොහොම කිව්වත් අද මේ ආර්ථිකය දරුණු කඩා වැටීමකට ලක් වෙලා අවසන්. වැරදි මූල්‍ය කළමනාකරණය නිසා අපි ලොකු අගාධයකට ගිහිල්ලා අවසන්. ආණ්ඩුව අද එක එක පැළැස්තර යොදන්නේ ඒ නිසාය කියන එක මට පැහැදිලිව කියන්න පුළුවන්.

බැංකු පොලී අනුපාතය කෘත්‍රිමව අඩු කරන්න පසු ගිය දවස්වල ආණ්ඩුව තීරණය කළා. බැංකු පොලී අනුපාතය සියයට 8ත්, 12ත් අතර කියලා නියෝග කරද්දී මේ බැංකුවල කොච්චර තැන්පත්කරුවෝ ඉන්නවාද කියලා ඔය ආර්ථික විශේෂඥයෝ ගෙනැල්ලා ඇහුවාද කියලා මම මේ ආණ්ඩුවෙන් අහනවා. ඒ වාගේම බැංකු පොලිය සියයට 8ත්, 12ත් අතරට ගෙනාවේ ඒ පිළිබඳව හොඳ විශ්ලේෂණයක් කරලාද කියලා මා අහනවා. අද මම බැංකුවලට කථා කරලා ඇහුවාම ඒ අය කියන්නේ, "නැහැ, අපට පොලී අනුපාතය සියයට 8ත්, 12ත් අතරට ගේන්න බැහැ. අපි 15ටයි ගේන්නේ, අපි 14ටයි ගේන්නේ, තමන්ගේ තීරණය අනුව තමයි බැංකු පොලී අනුපාතය තබා ගන්නේ" කියලා ඒ ගොල්ලෝ පැහැදිලිව කියනවා. එහෙම නම් ඒකෙන් පෙනෙනවා ඔය හදිසියේ ගන්නා සමහර තීරණ මැතිවරණ ඉලක්ක කර ගෙන, කෘත්‍රිමව බලෙන් ආර්ථිකයට පටවන්න හදන තීරණ බව. ඒවා සාර්ථක වන්නේ නැහැ කියලා මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මේ IMF එකෙන් - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් - රුපියල් කෝටි 26,000ක ණය මුදල ගන්න කොට ආණ්ඩුව පැහැදිලි එකඟතාවලට එළඹුණා. සංක්‍රාම වියදම් අඩු කරන්න ආණ්ඩුව එකඟ වුණා. සංක්‍රාම වියදම් කියන්නේ මොනවාද? පොහොර සහනාධාරය කපන්න සිදු වනවා. සමෘද්ධි සහනාධාරය කපන්න සිදු වනවා. ජනතාවට දෙන සහනාධාර කපන්න වනවා. දැන් එහෙම නොවුණොත් ඊ ළඟ වසරේ ඒක අනිවාර්යයෙන්ම කරන්න වෙනවාය කියන එක මා වග කීමෙන් කියනවා. ඒ වාගේම යම් විවිධ තහංචිවලට ලක් වෙමින් තමයි මේ රුපියල් කෝටි 26,000ක ණයක් ගත්තේ. සංවර්ධනය සඳහා ඒකෙන් ශත පහක්වත් යොදවන්න බැහැ. ඒ රුපියල් කෝටි 26,000ම යොදවන්න වන්නේ අපි ගත්ත ණය ගෙවන්න පමණයි. ඒකයි මේකේ තිබෙන භයානකකම. හොඳ ආර්ථික සැලැස්මක් මේ ආණ්ඩුවට අවශ්‍ය වෙලා තිබෙන්නේ අන්න ඒක නිසායි කියන එක මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ඒ සඳහා අපට වග කීමක් තියෙන්න ඕනෑ. එක පැත්තකින් පරිපූරක ඇස්තමේන්තු ගේනවා. අනෙක් පැත්තෙන් අතුරු සම්මත ගිණුමක් ගෙනැල්ලා මුදල් සම්මත කර ගන්නවා. හැබැයි අපි කවුරුවත් හිතුවාද, මේ ආණ්ඩුවේ වියදම් පාලනය කරන්න ඕනෑ කියලා? මේ ආණ්ඩුවේ ඉහ වහා ගිය වියදම්. මිහින් එයාර් එකට කියලා රුපියල් කෝටි ගණනක් විනාශ කළා. මහාමාර්ග අමාත්‍යාංශය යටතේ මඟ නැඟුමටත් එහෙමයි. මට එකින් එක කියන්න කාලයක් නැහැ. ගුවන් පාලම්වලින් රුපියල් කෝටි ගණනක මුදල් ප්‍රමාණයක් විනාශ කළා. අහිංසක මිනිසුන්ගේ කඳුළු බින්දු, බඩගින්න මතින් තමයි මේවා විනාශ කරන්නේ. ඇමතිවරුන්ට වාහන ගන්න රුපියල් කෝටි 137යි. තව වියදම් විවිධ දේවලට. විදේශ රටවල සංචාරය කරන්න, එහේ පාටි දමන්න, එහේ උපන් දින සාද පවත්වන්න විදේශ ඇමතිවරයා රුපියල් කෝටි 45,000ක් ගන්නවා.

**ගරු හුසේන් අහමඩ් බයිලා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹுசெயின் அஹமட் பைலா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Hussain Ahamed Bhaila - Deputy Minister of Foreign Affairs)

අසත්‍ය චෝදනා කරන්න එපා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

කාගේ බූදලයක්ද මේ? අම්මාගේ අප්පාගේ බූදලයක්ද මේ? අහිංසක ජනතාවගේ කඳුළු, දහඩිය අතරින් එකතු වන මුදල් තමයි මේවාට යොද වන්නේ. මම කියනවා, අද ගම්වල ජීවත් වන ජනතාව -

**ගරු හුසේන් අහමඩ් බයිලා මහතා**
(மாண்புமிகு ஹுசெயின் அஹமட் பைலா)
(The Hon. Hussain Ahamed Bhaila )

ඔය කියන්නේ පට්ටපල් අසත්‍ය.



**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

බයිලා ගහන්න එපා. බයිලා මහත්මයා කරුණාකර වාඩි වන්න, බයිලා ගහන්නේ නැතුව. [බාධා කිරීම්] අද ගම්වල ජීවත් වන ජනතාවට තුන් වේල කන්න විධියක් නැහැ. අද දරුවන් පාසලට යවා ගන්න විධියක් නැහැ. පාසල් පොත් පත් ටික අර ගෙන දෙන්න විධියක් නැහැ. පොරොන්දු වුණු පෝෂණ මල්ලත් නැහැ. පොරොන්දු වුණු කිරි වීදුරුවත් නැහැ. පොරොන්දු වුණු කිසිවක් අද ඉටු වෙලා නැහැ. එහෙම නම් මම කියනවා මේ නිස්කාරණයේ වියදම් කරන මුදල් ඉතුරු කරන්න; මේ මුදල් කපා හරින්න කියලා. එකසිය ගණනක ඇමති මණ්ඩලයක් පත් කරලා, අතිවිශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා මේ විනාශ කරන මුදල් කන්දරාව කොපමණද කියලා ගණන් හදලා බලන්න. අපි ළඟ තිබෙනවා ඒ සියලුම සංඛ්‍යා ලේඛන. ජනතාව විශ්වාස කළා යුද්ධය අවසන් වුණාම සියල්ල හරි කියලා. යුද්ධය කාලයේ මේ ආණ්ඩුව ජනතාවට කිව්වා බඩ පටි තද කර ගන්න, බඩට උඩින් රට තියා ගන්න කියලා. ජනතාව ඉවසුවා. නමුත් බඩට උඩින් රටත් තියා ගෙන, උපදේශකවරුත් බර ගණනක් තියා ගෙන, එකසිය ගණනක ඇමති මණ්ඩලයකුත් තියා ගෙන ඉන්න ජනතාවට අද හුස්ම ගන්න බැහැ; මේ බර උහුලා ගන්න බැහැ. ජනතාව අමාරුවෙන් ඉන්නේ. එහෙම නම් ඒ යුද්ධයට ගිය මුදල් - රුපියල් කෝටි ගණනක, බිලියන ගණනක මුදල් - අද කොහේටද යන්නේ කියලා මම අහනවා. කාගේ සාක්කුවටද යන්නේ කියලා මම අහනවා. ජනතාව විශ්වාස කරපු විධියට බඩු මිල අඩු නොවුණත් බඩු මිල වැඩි නොකර තියා ගන්න පුළුවන්කම ආණ්ඩුවට තිබෙන්න ඕනෑ. ජනතාවට සහන දෙන්න ආණ්ඩුවට හැකියාව තිබෙන්න ඕනෑ. අද පාරේ දහස් ගණන් උපවාස කරනවා, ජීවත් වන්න බැහැ, ජීවන වියදම වැඩියි කියලා. තරුණයෝ එළියට බැහැලා රැකියා ඉල්ලනවා. උපාධියක් ගත්ත තමන්ට රැකියාවක් ලබා දෙන්න කියනවා. මේවාට විසඳුම් සොයන්න ඕනෑ කියලා මම කියනවා. අපි මෙතැනට ඇවිල්ලා, එක් එක් කෙනාගේ තර්ක බිඳලා ගියාට හරි යන්නේ නැහැ. පාරට ගියාම ජනතාව අතරට තමයි අපි වැටෙන්නේ. [බාධා කිරීමක්] තව මාස දෙක තුනකින් තමුන්නාන්සේලා වැටෙන්නේත් ජනතාව අතරට; අපි වැටෙන්නේත් ජනතාව අතරට. ඔය බයිලා මහත්මයා වැටෙන්නේත් ජනතාව අතරට තමයි ඊ ළඟ මැතිවරණයට ගියාම. ඒ නිසා මා තමුන්නාන්සේලාට කියන්නේ - [බාධා කිරීම්] බයිලා මහත්මයා, කරුණාකර ඔබතුමා කලබල නොවී ඉන්න. මේ මම කියන ඒවා අසත්‍ය නම් ජනතාව අතරට ගියාම, මැතිවරණයකට ඉදිරිපත් වුණාම තමුන්නාන්සේලාට තේරේවි මොකක්ද මේකේ ඇත්ත ස්වභාවය කියලා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන නිසා අතුරු සම්මත ගිණුමක් ගෙනැල්ලා මුදල් අනුමත කර ගන්න තමුන්නාන්සේලාට පුළුවන් වෙයි. නමුත් එහෙම කළා කියලා අහිංසක ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ, ජනතාවගේ බඩගින්න නිවෙන්නේ නැහැ, ජනතාවගේ අමාරුකම් විසඳෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන කල්පනාකාරීව හිතලා අපි තීරණ ගත යුතුයි කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.25]

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා (ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன - நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர்)
(The Hon (Dr.) Rajitha Senaratne-Minister of Construction and Engineering Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හිතන හැටියට අපේ අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා එතුමාගේ නායකයා වෙනුවෙන් කථාවක් පැවැත්වූවා. ලියලා දුන්නු කථාවක්ද කොහේදෝ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
**(**மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்**)**
(The Hon. Akila Viraj Kariyawasam)
නැහැ, නැහැ.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
**(**மாண்புமிகு **(**வைத்தியகலாநிதி**)** ராஜித சேனாரத்ன**)**
(The Hon (Dr.) Rajitha Senaratne)

මේ කියපු කථා ඇහුවාම, ඒවා ඇත්ත නම් එතුමන්ලාට සියයට 75ක් ඡන්ද හම්බ වන්න ඕනෑ. නමුත් හම්බ වෙලා තිබෙන්නේ සියයට 25යි. ඩී. එස්. සේනානායක මහත්මයාගෙන් පස්සේ එක්සත් ජාතික පක්ෂය ලංකා ඉතිහාසයේ වැටුණු බංකොලොත්ම බංකොලොත් තත්ත්වයට මේ නායකයාත්, මෙතුමන්ලාත් පත් කරලා ඉවරයි. ජේ. ආර්. ජයවර්ධන මහත්මයා වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනාවේ සදාකාලිකව ආණ්ඩුව ගෙන යන්නයි. ඒ මොකද, කිසි දවසක තුනෙන් දෙකක බලයක් හම්බ වන්නේ නැහැ. එහෙව් සමානුපාතික ඡන්ද ක්‍රමයක් යටතේ තුනෙන් දෙකක ප්‍රතිශතයක් ලබපු ආණ්ඩුවට කියනවා ගිහිල්ලා මහ ජනතාවගෙන් ඉගෙන ගන්නලු. අපි නොවෙයි, මහ ජනතාවගෙන් තමුන්නාන්සේලා ඉගෙන ගන්න. තමුන්නාන්සේලා ඔය කථා කරන දේශපාලන කුණුහරුප ගැන ගිහිල්ලා මිනිසුන්ගෙන් අහන්න. එතකොට කියලා දේවි.

හරි. 2001 ඉඳලා 2003 දක්වා ආර්ථික වර්ධනයක් තිබුණා. හැබැයි රස්සාවක් දුන්නාද? පඩියක් වැඩි කළාද? සංවර්ධන කටයුත්තක් කළාද? මොරගහකන්ද ව්‍යාපාරය පටන් ගන්න කියලා මම කිව්වාම, "No, Rajitha, no more irrigation in Sri Lanka" කියලායි කිව්වේ. එහෙමයි කිව්වේ. අද වාරිමාර්ග ව්‍යාපෘති පහක් හදනවා. එදා එක සංවර්ධන කටයුත්තක් කළාද, සහනයක් දුන්නාද, පොහොර ටික රුපියල් 350ට දුන්නාද? Graphs ගහලා පෙන්නුවා, ජීවන තත්ත්වය මෙච්චර හොඳයි, අච්චර හොඳයි කියලා. මිනිසුන්ට මොනවාද හම්බ වුණේ? Graphs විතරයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා එනවා; ටී.වී. එකේ දානවා කටු අත්තක්; ඊට පස්සේ මල් පිපෙනවා. මල් පිපෙන කල් ඉන්න කිව්වා. 2004 දී මල් පිපෙව්වා අපට. මල් පිපෙන කාලෙට අපව සුන්නද්දූලි කරලා දැම්මා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, fiscal policy එක ගැන කිව්වා. එතුමා කියනවා ඒ fiscal policy එක IMF එක පිළිගත්තා කියලා. නැහැ. IMF එක කිව්වා, fiscal policy එක ගේන්න කියලා. ගෙනාවාම එදා අපේ ආණ්ඩුව පිළිගත්තා. අනෙක් පැත්තට ඒකයි වුණේ. IMF එක තමයි කිව්වේ fiscal policy එක ගේන්න කියලා. අපි ගෙනාපු එක ඒ ගොල්ලන් පිළිගත්තේ නැහැ. ඒ ගොල්ලන් අපට කිව්වා ගෙනෙන විධිය. රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් අහන්න. තමුන්නාන්සේලාත් එක්ක නොවෙයි කතා කළේ. එදා ලෝක බැංකුව දිගින් දිගටම කිව්වා, මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්නය කියලා. ලෝක බැංකුවේ සභාපතිතුමිය එන දවසට කලින් දවසේ රනිල් වික්‍රමසිංහ මහත්මයා මට කතා කරලා, "රාජිත අරලියගහ මන්දිරයට එන්න" කිව්වා. මගෙන් ඇහුවා, "හෙට මම මොකද කියන්නේ" කියලා. මා කිව්වා, "සාමය තමයි වැදගත්. ආර්ථිකය දියුණු කරන්න නම් ඉස්සෙල්ලාම සාමය ගෙනෙන්න ඕනෑ. වාමාංශික වෘත්තීය සමිති ඔක්කෝම ඉන්නවා, සාමය වෙනුවෙන්. සාමය ගෙනෙනකම් මේවා ගේන්න බැහැ" කියන්න කියලා. ඒ විධියට කථා කරන්න කිව්වා. එහෙමයි යාන්තම් බේර ගත්තේ. අද මේ ආණ්ඩුව එක රාජ්‍ය ආයතනයක්වත් පෞද්ගලීකරණය කරලා නැහැ. එක රාජ්‍ය ආයතනයක් විකුණලා ශත පහක් හම්බ කරලා නැහැ. එදා යූඑන්පී ආණ්ඩුව අවුරුදු 17ක් තිස්සේ රාජ්‍ය ආයතන 46ක් පෞද්ගලීකරණය කරලා සල්ලි හම්බ කළා. චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මියගේ ආණ්ඩුව 2001 වන කොට රාජ්‍ය ආයතන 47ක් පෞද්ගලීකරණය කරලා සල්ලි හම්බ කළා. මේ ජනාධිපතිතුමා රාජ්‍ය ආයතන විකුණලා ශත පහක්වත් හම්බ කරලා නැහැ. අපට භාර දුන්නු රාජ්‍ය ආයතන බංකොලොත් වෙලා තිබුණු ඒවා. පෞද්ගලීකරණය කරන ලැයිස්තුවේ තිබුණේ. අද ඒ රාජ්‍ය ආයතන හොඳට පවත්වා ගෙන යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
**(**மாண்புமிகு உறுப்பினர் ஒருவர்**)**
(An Hon. Member)
මහා මාර්ගවල ටෙන්ඩර් කරන්න එපා කිව්වා රාජ්‍ය අංශවලට.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
**(**மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன**)**
(The Hon (Dr.) Rajitha Senaratne)

ඔව්. ඊ ළඟට ආර්ථිකය කඩා ගෙන වැටිලා කියනවා. කොහේද? මං පෙන්වන්නම් ආර්ථිකය කඩා ගෙන වැටිලාද කියලා. මේ තිබෙන්නේ මේ රටේ මේ අවුරුද්දේ ආර්ථිකය සම්බන්ධයෙන් IMF එකේ නියෝජිතයෙක් සැප්තැම්බර් 23 වන දා "The Island" පුවත් පතට දුන්න සම්මුඛ සාකච්ඡාවක වාර්තාවක්. තමුන්නාන්සේලා කියවන්න. මේකේ කොහේද, තිබෙන්නේ ආර්ථිකය කඩා ගෙන වැටිලා කියලා. කොහේද තිබෙන්නේ? මෙහෙමයි තිබෙන්නේ.

" 'We are satisfied with the Central Bank's audit and accounting positions and we would constantly update the reviews,' he said. Aitken also dismissed allegations that the Central Bank had sold gold reserves."

මේවා මේ ගොල්ලන් කියාපුවා. රත්තරන් විකුණනවාය කියලා පසු ගිය කාලයේ ගහපු පව.

ඒ වාගේම,

"Had that happened we would have known about it and it never came up for discussion,"

"The government has committed itself to a budget deficit of 7 percent and there is no doubt the government would stick to this commitment. When we look at the revenue and expenditure performance so far, it is feasible that the government would achieve the deficit goal," Aitken said.

He went on to say that since the IMF facility was granted Sri Lanka had not introduced new taxes….."

තමුන්නාන්සේලා අසත්‍ය කියන්න එපා, එක එක් කෙනාට බදු ගහනවා කියලා. IMF එකේ නියෝජිතයෙක් තමයි මෙහෙම කියන්නේ.

"……. but revenue had come in from the existing base."

ඒ වාගේම, මෙසේ කියා තිබෙනවා:

"Aitken said the IMF was not proposing any taxes……"

ඒ ගොල්ලන් අලුත් බදු පනවන්න කියලාත් නැහැ. එතකොට මේ ගොල්ලන් තමයි මේ ඉල්ලන්නේ. මොකද, ඡන්දය දිනා ගන්න. ඒ විතරක් නොවෙයි, ඒ ගොල්ලන් මෙහෙමත් කියනවා:

"On the expenditure side, Aitken said the IMF did not want expenditure cuts on healthcare, education and subsidy payments, such as for fertilizer."

සෞඛ්‍ය වෙනුවෙන්වත්, අධ්‍යාපනය වෙනුවෙන්වත් තිබෙන සහනාධාර එකක්වත් කපන්න IMF එක බලපෑම් කළේ නැහැ ආණ්ඩුවට. එහෙනම් මොකටද කපන්නේ? අසත්‍ය කියන්න එපා.

"Aitken also said the IMF was confident that the Ceylon Petroleum Corporation and Ceylon Electricity Board would breakeven by 2011."

ඒකත් ලාභදායී වනවා, 2011 වන කොට. මෙන්න IMF නියෝජිත වාර්තාව. මීට වඩා ලොක්කෝ ඉන්නවා ද? තමුන්නාන්සේලා වඳින දේවාල මේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
**(**மாண்புமிகு உறுப்பினர் ஒருவர்**)**
(An Hon. Member)
අර හර්ෂ ද සිල්වා -

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
**(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன)**
**(The Hon (Dr.) Rajitha Senaratne)**

හර්ෂ ද සිල්වාට වැරදිලා. මට එයා හම්බ වුණාම කිව්වා. මේ ගොල්ලන් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති පොත කියවලා තිබෙනවා. ඒ පොතෙත් එහාට කිසිවක් නැහැ. ඒ කියන්නේ ඒ පොත උඩ තමයි වෙළෙඳ පොළ අනුව පෞද්ගලීකරණය කිරීම කරන්නේ. ගිහිල්ලා හොඳට කියවලා බලන්න. අද මොනවාද ලතින් ඇමෙරිකාවේ සිදු වන්නේ? පසු ගිය අය වැය වෙලාවේ මගේ කතාවේදී මා මේවා පෙන්වා දුන්නා. මොකක්ද ලතින් ඇමෙරිකාව කරන්නේ? අද ලතින් ඇමෙරිකානු ස්වදේශීය ආර්ථිකයක් ගොඩ නැඟෙන්නේ කොහොම ද? තමුන්නාන්සේලා අන්න ඒවා හොඳට කියවලා බලන්න. එතකොට ඇස් දෙක ඇරේවි, මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද කියලා. මේක අලුත් දෙයක් නොවෙයි. මේක තමයි බ්‍රසීලයේ ලූලා ද සිල්වා කරන්නේ. මේක තමයි වැනිසියුලාවේ චාවේස් කරන්නේ. මේක තමයි බොලිවියාවේ මොරාලස් කරන්නේ. මේක තමයි නිකරගුවාවේ ඔටේගා කරන්නේ. මේක තමයි චිලියේ අයෙන්ඩාගේ මිනිබිරිය කරන්නේ. මේක අලුත් දෙයක් නොවෙයි. නමුත් අද මේක දියුණු වනවා. අලුත් තත්ත්වය ඒක බව මතක තියා ගන්න. ඒක නිසා ඇස් දෙක ඇර ගෙන බලන්න.

බැංකු පොලිය කෘත්‍රිමව අඩු කළා කියනවා. මොකක්ද කෘත්‍රිමව අඩු කළාය කියන්නේ? ආණ්ඩුවෙන් නේ අඩු කළේ. අපේ ආණ්ඩුව කාලයේ අඩු කළේ කවුද? අඩු කළේ ඒ බැංකු ද? නැහැ. අපේ මුදල් අමාත්‍යාංශයෙන් අඩු කළේ. එකෙන් එක හරි අඩු කළේ එහෙමයි. කෘත්‍රිම කියලා එකක් නැහැ. බැංකු පොලිය අඩු වනවා. බිලියන 4ක ලාභයෙන් බිලියන 1ක් කපලා බිලියන 3ක් මිනිසුන්ට බෙදන කොට වැරදියි කියනවා ද? අද ඔය කථා පවත්වන්න පවත්වන්න, ඔය බූත තර්ක කථා කළාම යූඑන්පී එකට ඡන්දය දෙන්න ඉන්න මිනිහෙක් ඡන්දය දෙන්නේ නැහැ. ඒක තමයි වන්නේ. රනිල් වික්‍රමසිංහ මෙතැන කකුල් දෙක තියා ගෙන හිටියත් පපුව එහේ වැඩ කරන්නේ. කැබිනට් මණ්ඩලයට ගිහින් අහන්න මා කියපු ඒවා; එස්.බී. දිසානායක කියපු ඒවා; ගාමිණී ලොකුගේ කියපු ඒවා. අතැන හිටපු ඩී.ජේ.මු. ලොකුබණ්ඩාර එදා කැබිනට් මණ්ඩලයේ කථා කරපු ඒවා. ඒවා කළා නම් එදා ආණ්ඩුව ගෙන යනවා. එදා ඒවා එකක්වත් කළේ නැහැ. කොහේද හිටපු ටයි කෝට්කාරයෝ කට්ටියක් අරගෙන ඇවිත් අපට දේශපාලනය උගන්වන්න හැදුවා. ඒකෙන් තමයි විනාශ වුණේ.

ඒ විතරක් නොවෙයි, අද කියනවා, බැංකු පොලිය අඩු කළේ නැහැල්ලු. ඊයේ බැංකුවෙන් මා ඇහුවා, රුපියල් 60,000ක් ගෙවන්න තිබෙන මගේ overdrafts දෙක ගැන. දැන් ඒවා රුපියල් 50,000කට අඩු වෙලා. සියයට 12.5ට ලංකා බැංකුව overdraft පොලිය අඩු කරලා. [බාධා කිරීමක්] මේ කියනවා බොරුලු. මේ කොහේ තියෙන බැංකුද දන්නේ නැහැ. ලංකාවේ ඒවාද දන්නේ නැහැ.

දැන් පෙන්නුවා, මිහින් ලංකා ආයතනයේ IMF loan එක. මොකටද මිහින් ලංකා ආයතනය හැදුවේ? මිහින් ලංකා සංකල්පය මොකක්ද? දුප්පත් මිනිහාට, මැද පෙරදිග ඉන්න අපේ සහෝදරියකුට හදිසියේ අම්මා නැති වුණා කියා දැන ගත්තාම අඩු ගණනේ ටිකට් එකට මෙහාට එන්න. වයසක ආච්චිලාට අම්මලාට වන්දනාවේ යන්න; බුද්ධගයාවට යන්න. මේ budget airline කියන එක ලෝකයම පිළිගත්ත දෙයක්. මේක නැති එකක් නොවෙයි. ඒකේ ආර්ථික අපහසුකම් නිසා අලාභ වෙන්න පුළුවන්. ඒක දූෂණයක් කියලා කියන්නේ කොහොමද? ඒ විතරක් නොවෙයි.

හැම දාම ඇමති මණ්ඩලය කථා කරනවා. [බාධා කිරීමක්] ඇමති මණ්ඩලයේ වියදම ගණන කීයද කියන්න. [බාධා කිරීමක්] ඒ මුළු වියදමෙන් කීයද? මුළු වියදමෙන් දශම 08යි. ඇමති මණ්ඩලය කපලා රුපියල් සියයේ බඩුවෙන් ශත 5ක් විතර අඩු කරන්න පුළුවන්. ඕකද අඩු වීම? ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් අහන්න, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන වෙලාවේ - මේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට මතක ඇති - මොකක්ද කිව්වේ කියා. [බාධා කිරීමක්] මේ පැත්තෙන් - ආණ්ඩුවෙන් - 27 දෙනෙක් ගන්නවා කිව්වා. මා ඇහුවා, ඒ 27 දෙනාව ගන්නා විට මේ කට්ටිය - [බාධා කිරීමක්] තමුන්නාන්සේ දන්නේවත් නැහැ. තමුන්නාන්සේ හිටියේවත් නැහැ. ඒ රනිල් වික්‍රමසිංහගෙන් මා ඇහුවා, 27 දෙනා ගත්තාම කොහොමද මේ කට්ටියට ඇමතිකම් දෙන්නේ කියා. මට කිව්වා, "රාජිත, ගිහින් ඔක්කොටම ඇමතිකම් පොරොන්දු වන්න" කියා. එතකොට මා ඇහුවා, "එතකොට අපේ කට්ටිය" කියා. එතකොට කිව්වා, "අපේ කට්ටිය ඔක්කොටම දෙනවා. ඇමති මණ්ඩලය සියයක් වුණත් කමක් නැහැ. අපි ආණ්ඩුව ගෙන යන්න එය සියයක් කරලා හරි ගෙන යනවා" කියා. ඒකම තමයි මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කරලා තිබෙන්නේ. අලුත් දෙයක් නොවෙයි. මතක තියා ගන්න. අසත්‍ය කථා කරන්න එපා, තමන්ට බැරි වුණු දේවල් අනුන් කරන කොට.

අද රැකියා නැති වෙනවාලු. ලක්ෂ අටහමාරයි මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත් වන කොට ලංකාවේ රැකියා. අද ලක්ෂ 12ක් රාජ්‍ය සේවයේ ඉන්නවා. ලක්ෂ තුනහමාරක් - [බාධා කිරීමක්] මා යූඑන්පී එකේ ඉඳලා ඇවිල්ලා මේ ටිකට එක්දහස් ගණනකට රක්ෂා දීලා තිබෙනවා. යූඑන්පී ආණ්ඩුවේ අවුරුදු දෙකහමාරටම මම ලොක්කාට විරුද්ධව හොරෙන් එදා දුන්නේ රක්ෂා 74යි. මතක තියා ගන්න. අද එක් දහස් ගණනක් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජනතාව දන්නේ නැහැයිලු. ජනතාව හොඳට දන්නවා. ඒක නේ මේ ඡන්ද ප්‍රතිඵල ලැබෙන්නේ. තමුන්නාන්සේලා ඉස්සෙල්ලා වාඩි වෙලා බලන්න, “අපේ පැත්තේ මොනවාද වැරදි; ඇයි, අපිට ඡන්දය දෙන්නේ නැත්තේ” කියා. අන්න ඒක අධ්‍යයනය කරන්න. එතකොට ඇත්ත තේරෙනවා. බොරුවට මෙතන තප්පුලැවට ඕක හම්බ වන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ සැරේ ජනාධිපතිවරණය බලන්න මොකක්ද වන්නේ කියා. තමුන්නාන්සේලාගේ "පොදු අපේක්ෂකයා" අර තිස්ස අත්තනායක මහත්මයා හංගා ගෙන ඉන්නවා නේ. චූඩා මාණික්‍යය. ඒක හොරකම් කරයි කියා. Nominations දුන්නාට පස්සෙලු පොදු අපේක්ෂකයා ගෙනෙන්නේ. පොදු අපේක්ෂකයෙක් ඉන්නවා නම් ඉස්සෙල්ලාම ගෙනෙන්න ඕනෑ. එතකොට නේ මිනිස්සු දන්නේ මෙන්න මෙයා අපි ඡන්දය දෙන්න ඕනෑ අපේක්ෂකයා කියා. එයා හංගා ගෙන. මා හිතන්නේ වැඩිවියට පත් වෙලා ඇති. තවම පොදු අපේක්ෂකයා එළියට බැහැලා නැහැ. මොනවාද මේ කථා? අපේ අපේක්ෂකයා මහින්ද රාජපක්ෂ. කියන්න ඔය ගොල්ලන්ගේ පොදු අපේක්ෂකයා කවුද කියා. සරත් ෆොන්සේකාව බොරුවට විකුණනවා. අද බොරුව ගෙන යනවා. මේ යූඑන්පී කාරයන්ව nomination දවස වෙනකම් "චූන්" කරනවා. මොකද, සරත් ෆොන්සේකා එනවා; සරත් ෆොන්සේකා එනවා කියා. ඒවි, සරත් ෆොන්සේකා. එයා ඇමෙරිකාවේ. එයා එන්නේ නැහැ. අපිත් එක්ක කියලා තිබෙනවා. ඒ nomination දවසට අන්තිමට කොයි ෆොන්සේකාද එන්නේ? රනිල් ෆොන්සේකා. වෙන කවුරුවත් නොවෙයි එන්නේ. මේ රනිල් ෆොන්සේකා එන්නේ. එතකොට පැරදිලා ඉවරයි; nomination දවසට පැරදිලා ඉවරයි. සරත් ෆොන්සේකා එන්නේ නැහැ. මතක තියා ගන්න. අන්තිමට ඔය ෆොන්සේකා ගෙනෙන්න තමයි ඔක්කොම පව් කෙළින්නේ. [බාධා කිරීමක්] අන්න ඒක තමයි නංගි පෙන්වලා අක්කා ගන්නවා කියන්නේ. සරත්ව පෙන්නලා රනිල් ගන්නවා. දැන් ගත්තොත් ඕකට විරුද්ධව එස්.බී. එනවා. ඕකට අනෙක් ඔක්කොම විරුද්ධ වනවා. මට යූඑන්පී එකේ මන්ත්‍රීවරු කියනවා, “Ranil can propose; we will dispose” කියා. එහෙමයි කියන්නේ. රනිල්ට අහු වන්නේ නැහැ. දැන් මේ අන්තිම දවස එනවා. සරත් එනවා, එනවා කියලා අරයා එනවා. එතකොට වෙලාව නැහැ. එයා තමයි එන්නේ. [බාධා කිරීමක්] අකිලට කමක් නැහැ. සියයට 10 හම්බ වුණොත් හරි. ඒ නිසා මේ දේශපාලන බොරුවෙන් ඉවත් වන්න. ඉවත් වෙලා මතක තබා ගන්න, මේ රට නිදහස් වෙලා තිබෙනවාය කියලා.

මේ රටේ මානව අයිතිය ගැන කථා කරනවා. දැන් තරම් හොඳ මානව අයිතියක් මේ රටේ තිබුණාද? මේ රටේ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ට අද නිදහසේ පාරේ බැහැලා යන්න පුළුවන්. ඊට වඩා මානව අයිතියක් තිබෙනවාද? මේ රටේ මිනිස්සු අද බෝම්බවලට

[ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා]

මැරෙන්නේ නැහැ. මේ රටේ මිනිස්සු අද එල්ටීටීඊ එකේ ත්‍රස්තවාදයට මැරෙන්නේ නැහැ. ඉතින් ඒක නොවෙයිද, මානව අයිතිය? මොන යුද්ධයේදීද අසාධාරණය වුණේ නැත්තේ? ඒක නේ අපි යුද්ධයට විරුද්ධ. අපි යුද්ධයට විරුද්ධයි. ඇයි? ලෝකයේ තිබෙන හැම යුද්ධයටම අපි විරුද්ධයි. නමුත් අවසානයේදී අපි තීන්දුවකට ආවා. අර න්‍යායයක් තිබෙනවා, "සාමයට ඇති කෙටිම මාර්ගය යුද්ධය නම් යුද්ධයට ප්‍රවිෂ්ට වන්න" කියලා. අන්න එතැනදීයි අපි යුද්ධයට ආවේ. අපි යුද්ධයට අදත් විරුද්ධයි; හෙටත් විරුද්ධයි. ඒ මොකද? යුද්ධයේදී අසාධාරණකම් වනවා; මානව අයිතිය කැඩෙනවා; මිනිස්සු මිය යනවා; මිනිස්සු පීඩාවට පත් වනවා. එහෙම නැතුව යුද්ධයක් කොහේද? 1988 ජේවීපී එක ඉවර කරන කොට අපි සහයෝගය දුන්නා. එදා අපි ආණ්ඩුවට කෙළින්ම සහයෝගය දුන්නා. එදා අපි මානව අයිතිය ගැන කථා කළේ නැහැ. ඒක ඉවර කළා. එදා ජේවීපී එක පරාජය වීම තමයි මානව අයිතිය දිනා ගැනීම. අද එල්ටීටීඊ එක පරාජය කිරීම තමයි මානව අයිතිය දිනා ගැනීම. ඒක තමයි මූලික මානව අයිතිය. ඒක මතක තබා ගන්න.

ආර්ථික දර්ශක ගැන අද තමුන්නාන්සේලා කථා කරනවා. කොයි ආර්ථික දර්ශකය ද අඩු වෙලා තිබෙන්නේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

විනාඩියෙන් නම් අවසන් කරන්න අමාරුයි. එහෙම නම් දැන්මම නවත්වා දමන්නම්. මොකද, මා ළඟ තිබෙනවා, සියලුම ආර්ථික දර්ශක. මා ඉක්මනට ඉක්මනට කියවා ගෙන යන්නම්. මේ බලන්න කෝ. අද ආර්ථිකයේ කැඩපත මොකක්ද? ආර්ථිකය හොඳද, නරකද කියන කැඩපත තමයි කොටස් වෙළෙඳ පොළ. අද ලෝකයේ පස් වන හොඳම කොටස් වෙළෙඳ පොළ ලංකාවේ කොටස් වෙළෙඳ පොළයි. 1000ට වැටිලා තිබුණු කොටස් වෙළෙඳ පොළ අද 3000 ඉක්මවා තිබෙනවා. මේ ගොල්ලෝ කියනවා, ආර්ථිකය කඩා ගෙන වැටිලාලු. සියයට 98යි. මාසයකට ආදායම රුපියල් මිලියන 180යි. අද විදේශ සංචිතය කීයද? තමුන්නාන්සේලා කිව්වා නේ විදේශ සංචිතය 1,000ට බැහැලා කියලා. දැන් කීයද? දැන් විදේශ සංචිතය රුපියල් බිලියන 5 ඉක්මවා තිබෙනවා. අර එළුවාගේ පිටි පස්සේ යනවා වාගේ තමුන්නාන්සේලා බලා ගෙන ඉන්නවා, කොයි වෙලාවක හෝ ඕක කඩා ගෙන වැටෙයි කියලා. වැටෙන්නේ නැහැ. ආණ්ඩුව වැටෙන කාලේ ඉවරයි. අර මංගල සමරවීර උන්නැහේ හිතනවා, කොහේ හෝ ඉන්න සුද්දෙක් ආණ්ඩුව හදලා දෙයි කියලා. එයාටත් රනිල් වික්‍රමසිංහගේම රෝගය හැදිලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා අපට කිව්වේ, "භය වෙන්න එපා. ජෝර්ජ් බුෂ් අපව බේරා දෙනවා. අපේ ටෝනි බ්ලෙයාර් අපව බේරා දෙනවා. ආණ්ඩුව කැඩෙනවා. එන ඡන්දෙට මේ මේ දේවල් කරනවා. මම යනවා"යි කියලායි. මම කියනවා, "සර් පාර්ලිමේන්තුව විසුරුවනවා"යි කියලා. එතුමා කියනවා, “Do not worry, Rajitha; do not worry. That will never happen. The international community has promised me. Do not worry” කියලා. කොයි කාටත් එහා මම දන්නවා, චන්ද්‍රිකාගේ මොළේ වැඩ කරන හැටි. මා දන්නවා, එයාට මොන foreignද, මොන international ද කියලා මොකක්වත් නැහැ. දැන් හිතුවා; දුන්නා වැඩේ; සඳුදා වන කොට ඉවරයි. “I got an SMS” කිව්වා. හරිද? ඒ නිසා මතක තබා ගන්න. සියලු ආර්ථික දර්ශක මෙතැන තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

මේ සියලු ආර්ථික දර්ශක අද ඉහළ යනවා. තරුණ අකිල, තරුණ සමිතිය ඉවර කරලා වැඩිහිටි සමිතියේත් සභාපති වන තුරුම ඔය විධියට යන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. ඊ ළඟට ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා. [බාධා කිරීම්]

[අ. භා. 3.40]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - கடற்றொழில், நீரக வளமூலங்கள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Fisheries and Aquatic Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීම්] කථා කරන්න බැහැ නේ. මට වැඩිපුර කාලය දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා. එතුමා ඉලක්ක කීපයක් සඟවා ගෙන තිබුණත් ඒවා කියන්න මා බලාපොරොත්තු වනවා. නමුත් මට එකක් කියන්න ඕනෑ. මේ අතුරු සම්මත ගිණුම ගැන බොහෝ දේ කථා කළා, එහෙම එකක් ගෙනෙන්න බැහැයි කියලා. පළමු වන වරටයි අතුරු සම්මත ගිණුමක් ගෙනෙන්නේ කියන කථන්දරයක් කියලා, නොයෙකුත් තර්ක විතර්ක කළා. මට මතක් වන්නේ, 1970 දශකයේ වෙච්ච දේයි. 1970 ආණ්ඩුව පත් වුණා. 1971 දී අතුරු සම්මත ගිණුමක් පාස් කර ගන්න සිද්ධ වුණා. එයට හේතුවක් වුණේ ඒ කාලයේ පැවැති 1971 කැරැල්ලයි. 1970 පිහිටු වූ ආණ්ඩුව ළදරුවාට ගැහුවා. ගහලා, 1971 දී අතුරු සම්මත ගිණුමක් පාස් කර ගන්න සිද්ධ වුණා. හේතුව ඒ කාලයේ මුදල් වර්ෂය ආරම්භ වුණේ ඔක්තෝබර් මාසයේ 01 වන දායි. දැන් වාගේ නොවෙයි. ඔක්තෝබර් මාසයේ 01 වන දාට අනුමත කර ගන්න ඕනෑ නිසා, අය වැය ලේඛනය සකස් කර අවසන් කරන්න නොහැකි නිසා 1972 සිට මුදල් වර්ෂය ලිත් වර්ෂයකට ගෙන ඒමේ අවශ්‍යතාවක් ඇති වුණා. එම නිසා 1971 සැප්තැම්බර් මාසයේ 30 වන දා අවසන් වුණු මුදල් වර්ෂය 1971 දෙසැම්බර් මාසයේ 31 වන දාට ගෙනෙන්න වුණා. ඉතින් ඇත්තටම ජේවීපී එක කරපු විවේචන ගැන නම් මම කනගාටු වනවා. ජනතා විමුක්ති පෙරමුණ නිසාම 1971 දී අතුරු සම්මත ගිණුමක් සම්මත කර ගන්න මේ පාර්ලිමේන්තුවට සිද්ධ වුණා. අපි එතැනින් නවතිමු. නමුත් මේ රටේ ආර්ථිකය ගැන කථා කරද්දි ඉතාමත් සුබදායක වාතාවරණයක් ඉස්සරහට එන බවට අප උපකල්පනය කරනවා.

දැන් ඔබතුමා කථා කළා Fitch ශ්‍රේණිගත කිරීම ගැන. Standard and Poor’s සහ Fitch ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනය විසින් ශ්‍රේණිගත කිරීමේදී ශ්‍රී ලංකාව සඳහා ඉහළම අගයක් දීලා තිබෙනවා. පොඩි එකක් නොවෙයි. එතුමා ගෙනාපු තර්ක සම්පූර්ණයෙන්ම අසත්‍යයි. ඉහළම අගයක් දුන්නා විතරක් නොවෙයි, ඒක නිසා තමයි අපට ණය ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මේ යුද්ධය අවසන් වුණු නිසා මෙතෙක් කල් අපට නොලැබුණු ප්‍රදේශ අලුතින් ප්‍රයෝජනයට ගන්න පුළුවන්. මොකක්ද උදාහරණය? ත්‍රිකුණාමලයේ වරාය. දැන් අප හම්බන්තොට වරාය හදනවා. වරායන් රාශියක් ඇති කරනවා. නමුත් අපට මෙච්චර කල් ලෝකයේ තිබෙන ස්වාභාවික දෙ වැනි වරාය පාවිච්චි කර ගන්න බැරිව ගියා. දැන් ඒ වරාය පාවිච්චි කරන්න පුළුවන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කොච්චර නැව් ගේන්න ඕනෑද? හාරන්න ඕනෑද? නැහැ. අපිට පාවිච්චි කරන්න බැරි වෙලා තිබුණ ප්‍රදේශ පාවිච්චි කිරීමට දැන් අවකාශය ලැබිලා තිබෙනවා. මුහුදෙනුත් තුනෙන් දෙකේ කොටසක් අපට හිමි වෙලා තිබෙනවා. ඒ නිසා බලාපොරොත්තු සහගතව අද ආර්ථිකයේ ලොකු වර්ධනයක් සිද්ධ වෙමින් යනවා.

උදාහරණයක් වශයෙන් මෙතුමන්ලා කොටස් වෙළෙඳ පොළ ගැන කථා කළා. මේ කොටස් වෙළෙඳ පොළෙන් තවමත් තුනෙක් එකයි රටේ ආර්ථිකයට පාවිච්චි කරන්නේ, අපේ ජනතාව. පොලිය අඩු වුණා, අරවා මේවා කියලා වැඩක් නැහැ. කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න පුළුවන්. දැන් ආයෝජනය කරන්නේ තුනෙන් එකයි. මේක ටිකක් දන්න කට්ටිය විතරයි; ඔය රවි කරුණානායක, කීප දෙනකු විතරයි. ලොකු ලොකු කට්ටිය එකතු වෙලා මේක පාවිච්චි කරලා කියනවා, "පොලී අනුපාතය අඩු කෙරුවා" කියලා. නමුත් මේකේ තවත් තුනෙන් දෙකක ප්‍රමාණයක් තිබෙනවා ආයෝජනය කරන්න. අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා වාගේ අපේ කොටස් වෙළෙඳ පොළ අගය ඉතාමත්ම ඉහළ අගයකට වාර්තා කර තිබෙනවා. ඉතින් මේක බලාපොරොත්තුවක් නොවෙයිද? රටේ ආර්ථිකය ගැන දන්න කට්ටිය මේ ගැන මොනවාද කියන්නේ කියලා මම අහනවා.

ඊ ළඟට මම කියන්න කැමැතියි, ලංකාවට වැඩියෙන්ම ආයෝජන ආවේ මේ කාලයේ බව. කවුරු මොනවා කිව්වත් අපි නිර්භීතව ඒක කියනවා. ආයෝජන මණ්ඩලය තියෙද්දි වසර 31කට ඇවිත් තිබෙන මුළු ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 5,400යි. නමුත් මේ වර්ෂ හතරේදී ඩොලර් මිලියන 2,700ක් ආයෝජනය කර තිබෙනවා. බලන්න, 31යි, 4යි සංසන්දනය කරන්න. මේවා නිකම් ආවාට ගියාට කියන කතන්දර නොවෙයි. 2009 වර්ෂයේ ලෝකයේ ආයෝජන කඩා වැටීම සියයට 52යි. 52ක් වෙද්දි අපේ ආයෝජනය ඩොලර් මිලියන 2,700ක් දක්වා උපයා ගැනීමට හැකියාවක් ඇති වුණා, අතිගරු ජනාධිපතිතුමාගේ කාලයේදී. දැන් කොහොමද මේ ආර්ථිකය කඩා වැටුණාය කියන්නේ? දැන් ආර්ථිකය ක්‍රියාත්මක වෙනවා; activate වෙනවා. මේ activate වන්න හේතුව තමයි රටේ ස්ථාවරභාවය ඇති වීම. මේ ස්ථාවරභාවය ඇති කරන්නේ නැතිව කිසිම දවසක රටක් දියුණු කරන්න බැහැ. මේ ස්ථාවරභාවය ඇති කිරීමට ගත්ත උත්සාහයන් සියල්ලම ව්‍යර්ථ වෙලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ, අපේ චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේ සහ එක්සත් ජාතික පක්ෂය කාලයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කාලයේත් ස්ථාවරභාවය ඇති කරන්න ගත්ත උත්සාහයන් ව්‍යර්ථ වෙලා තිබෙනවා.

මම අකිල විරාජ් මන්ත්‍රීතුමාගේ කථාව අහ ගෙන හිටියා. එතුමා කිව්වා එතුමන්ලාගේ කාලයේ ලොකු සංවර්ධනයක් වුණාය කියලා. ඒ කාලයේ එක රස්සාවක් දුන්නාද? රාජ්‍ය අංශය පුළුල් කෙරුවාද? සංවර්ධනය කෙරුවාද? අද බලන්න සංවර්ධනය කොහේද යන්නේ කියලා. අද සංවර්ධනය ඉතා වේගයෙන් ක්‍රියාත්මක වනවා; එක පාරටම ක්‍රියාත්මක වනවා. සාමාන්‍යයෙන් මේ වාගේ රටක මේ වාගේ යුද්ධයක් තිබුණාම සංවර්ධනය ක්‍රියාත්මක වීමේ වේගය හුඟක් මන්දගාමී වනවා. නමුත් මේ වෙද්දි පුදුම වේගයකින් යටිතල පහසුකම් ටික දියුණු වෙනවා. මම උදාහරණයක් කියන්නම්. මම ඉන්නේ ජාඇල. ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාත් ඉන්නේ ජාඇල. අපි දෙන්නාට කොළඹට යනවාට වඩා වේගයෙන් පුත්තලමට යන්න පුළුවන්. පාරවල් සංවර්ධනය වනවා. අනුරාධපුර පාර සංවර්ධනය වනවා; පොළොන්නරුව පාර සංවර්ධනය වනවා. ඒ වාගේම කටුනායක පාර හැදෙනවා. නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය හැදෙනවා. ඊ ළඟට ත්‍රිකුණාමලයේ හැදෙනවා. වරායන් හැදෙනවා. හම්බන්තොට හැදෙනවා. මේ එක් විටම සංවර්ධනය ඇති කිරීම තුළින් ආර්ථික වර්ධනයක් ඇති වන්නේ නැද්ද? රස්සා ඇති වන්නේ නැද්ද? රට දියුණු වන්නේ නැද්ද'? මේ තිබෙන අස්ථාවරභාවය නැති වන්නේ නැද්ද? බලාපොරොත්තුව තිබෙනවා. විශ්වාසය තිබෙනවා. ඒ විශ්වාසය ඇති කරන්න කරපු ආයෝජනය අද ඵලදායක වෙලා තිබෙනවා. මොකක්ද උදාහරණය? එක උදාහරණයක් තමයි හමුදාවට විශාල පිරිසක් බඳවා ගැනීම. යුද්ධයට වියදම් කරන ප්‍රමාණයෙන් වැඩි හරියක් යන්නේ හමුදාවේ පඩිවලටයි. කවුද ඒ පඩි ගන්නේ? ගම්වලින් ගිය හමුදාවේ නිලධාරිනුයි. ගම්වලින් තමයි වැඩි හරියක් සෙනඟ හමුදාවට බැඳුණේ. අද ඒ ප්‍රදේශවල ආර්ථිකය activate වනවා. ජපානයට ගියාම අපේ ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා දැකලා ඇති, හැම තැනකම එක හා සමාන දියුණුවක් තිබෙන බව. අපි එතුමාගේ ආසනයේ ඡන්දය කරන්න ගියා. අද එතුමාගේ ආසනය දියුණු වෙලා. පාරවල් හැදෙනවා. අතුරු පාරවල් හැදෙනවා. හොඳම ඉස්පිරිතාලය හැදිලා. සංවර්ධන වේගය වැඩි වෙලා. ඉතින් හැම තැනකම දියුණුවක් තිබෙනවා. දැන් කොළඹට අවතීර්ණය වන ප්‍රමාණයත් දිනෙන් දින අඩු වෙලා කොළඹ පිරිස් දැන් ඒ පැත්තට යනවා. දැන් කොළඹ හෝටල්වලට සෙනඟ අඩුයි. පිට පළාත්වල හෝටල්වලට වැඩියි. නිලාවැලි පැත්තට වැඩියි. ඉතින් මේක දැන ගන්න ආර්ථිකය පිළිබඳව ලොකු විග්‍රහ කරන්න ඕනෑ නැහැ. මහා ලොකු තර්ක විතර්ක කරනවාට වඩා පෙනෙන්න තිබෙන දෙය, දකින්න තිබෙන දෙය, ප්‍රායෝගිකව අත් විඳින්න තිබෙන දේවල් ගැන බලන්න ඕනෑ. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය ගැන අද රජය බලාපොරොත්තුවක් තියා ගෙන ඉන්නවා. එම නිසා රජයට හැකියාව තිබෙනවා, බලාපොරොත්තුව තිබෙනවා, මේ වැඩ කර ගෙන යන්න. එසේ නොවනවා නම් මෙච්චර ප්‍රමාණයක් ණය දෙනවාද? ඉල්ලනවාට වැඩි ණය ප්‍රමාණයක් අපට ලබා දීලා තිබෙනවා. එම නිසා මේ රටේ සංවර්ධනය ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. රට කර්මාන්ත අංශයෙන් දියුණු වෙලා තිබෙනවා. ඒ වාගේම 2008 වසරේදී දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 40.7ක් වෙලා තිබෙනවා. ඒක සියයට 25.8ක වැඩි වීමක්. 2008 වසරේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් 2014 දක්වා වැඩි වෙලා තිබෙනවා. රාජිත සේනාරත්න ඇමතිතුමාට කියන්න බැරි වුණු ටික මම කියන්නම්. සංඛ්‍යා ලේඛන ටික මා සතුව තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර තිබෙනවා. සියලු ජාතීන්ගේ අවශ්‍යතාවන් සඳහා රජය ප්‍රමුඛත්වය දී තිබෙනවා. උතුරු පළාතේ යහ පාලනය-[බාධා කිරීමක්] ඒ වාගේම වවුනියාවේ මැතිවරණ පවත්වා තිබෙනවා. 2009 අගෝස්තු මාසයේදී උතුරු පළාතේ, යාපනය සහ වවුනියාව නගර සභාවල පළාත් පාලන මැතිවරණ පවත්වා තිබෙනවා. මේ රටේ සාමය නොතිබුණා නම් ඒ මැතිවරණ පවත්වන්න පුළුවන් වනවාද කියා මා අහනවා. ඒ මැතිවරණ තිබ්බේ අවුරුදු කීයකට පසුවද කියා මා අහනවා.

ඊ ළඟට උතුර සංවර්ධනය කෙරෙන බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළ යටතේ දින 180 වැඩ පිළිවෙළ දැන් සාර්ථක වෙලා ඉවරයි. දැන් මොකක්ද ඕනෑ? දැන් මධ්‍යකාලීන සංවර්ධන ක්‍රියාවලිය ඉෂ්ට කරන්න ලෑස්ති වනවා. එහෙම ලෑස්ති වෙද්දී බලාපොරොත්තුව කුමක්ද? ඒ අනුව දැන් යන්ත්‍රෝපකරණ රාශියක් ගෙනල්ලා ඉලක්කගත කාලයකදී management එකක් යටතේ කඩිනම් සංවර්ධනය ගෙනි යන්න පුළුවන් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කතාව පටන් ගත්තා විතරයි. මා හිතන්නේ කිසිම පදනමක් නැති තර්ක, විතර්ක තමයි මේ ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීමක්] ජනතා විමුක්ති පෙරමුණෙන් කෑ ගැහුවා අතුරු සම්මත ගිණුම් තැබුවාය කියා. අතුරු සම්මත ගිණුම් නවයක් තියා තිබෙනවා නේ. එක ගිණුමක් තියන්න හේතු වුණේ තමුන්නාන්සේලා අවුරුද්දෙන් ආපු ආණ්ඩුවට ගහපු හින්දායි. ඒක තමයි, එක. එතැනින් තමයි පටන් ගත්තේ. ඊ ළඟට තවත් යම් කිසි හේතුවක් තිබෙනවා. මේ හේතු සොයලා බලද්දි සාධාරණ හේතුවක් තිබෙන්නේ අපට විතරයි. යුද්ධයක් නිමා කරලා, මැතිවරණයක් පවත්වා අලුත් ආණ්ඩුවක් එද්දී ඒ ආණ්ඩුවට අවකාශයක් නැද්ද තමන්ටම ආවේණික අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න. ඒ ආණ්ඩුවටම ආවේණික අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න අයිතියක් නැද්ද? අතිගරු ජනාධිපතිතුමාට මේ රටේ හිටපු අමාත්‍ය මණ්ඩලය වෙනස් කිරීමේ අයිතිය ලබා දීම තුළින් තවත් කාර්යක්ෂමතාව වැඩි කරන්න එතුමාට අවකාශය ලබා දීලා ඒ budget එක, එහෙම නැත්නම් ඒ මංගල අය වැය ලේඛනය මෙතැනට ඉදිරිපත් කරලා කතාවක් පවත්වන්න එතුමාට අයිතියක් නැද්ද? දැන් කෙරුවා නම් එහෙම කියයි, ඔන්න අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නට ඇවිල්ලා එතුමා කතා කරලා ජනාධිපති මැතිවරණය ජයග්‍රහණය කිරීමට කටයුතු කළාය කියා.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. මහින්ද රාජපක්ෂලා චණ්ඩි විදියට තමයි මංගල සමරවීරලා හැඳින්වූයේ. ඔව්, චණ්ඩි

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

තමයි. අපි කියන්නේ නැහැ, චණ්ඩි නොවෙයි කියා. කවුද මේ චණ්ඩිකම පිළිගෙන තිබෙන්නේ? ත්‍රස්තවාදය නැති කිරීමේ ක්‍රමය හදාරපු එකම චණ්ඩියා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාය කියා අද පිළිගෙන තිබෙනවා. කවුද එහෙම කියන්නේ? එහෙම කියන්නේ ඉන්දියාවයි. ඉන්දියාව ජය ගැනීමේදී රාජපක්ෂ මොඩලය [බාධා කිරීමක්] ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 60 වන සංවත්සරය සමරද්දී ඉන්දියාවේ Indian Defence Review සඟරාව කියා තිබෙනවා, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය විනාශ කළ ආකාරය ලොවටම ආදර්ශයක්ය කියා. ඒ ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නිවැරදි දේශපාලන නායකත්වය -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එම සඟරාවේ ලේඛක ශෂී කුමාර් යන අය කියලා තිබෙනවා, ත්‍රස්තවාදය නැති කිරීමේ මොඩලය හැටියට "රාජපක්ෂ මොඩලය" භාර ගන්න කියලා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා.

[අ. භා. 3.52]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (අධිකරණ අමාත්‍යතුමා සහ වරාය සංවර්ධන අමාත්‍යතුමා )**
(மாண்புமிகு டிலான் பெரேரா - நீதி அமைச்சரும் துறைமுகங்கள் அபிவிருத்தி அமைச்சரும்)
(The Hon. Dilan Perera - Minister of Justice and Minister of Ports Development)
මට වෙලාව කොපමණ තිබෙනවාද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
පස්වරු 4.00ට තව තිබෙන්නේ විනාඩි 8යි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
හරි, හරි, ඔබතුමා කථා කරන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔබතුමා මූලාසනයේ සිටි වෙලාවක මීට ඉස්සර වෙලා මට අසාධාරණයක් වුණා. ඒ නිසායි මා වෙලාව කියලාම පටන් ගන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
අසාධාරණයක් වන්නේ නම් නැහැ, වේලාව වැඩි වෙනවා මිසක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔබතුමා එහෙම කරලා තිබෙනවා. මම කියලාම අද පටන් ගත්තේ ඒකයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
එහෙම කියන්න එපා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ දී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමාව මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලලිත් දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லலித் திஸாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LALITH DISSANAYAKE *took the Chair.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ විවාදයේ දී මතු වුණු සියලු කාරණාවලට පිළිතුරු දෙන්න මට හැකියාව ලැබෙන්නේ නැහැ. නමුත් කාරණා කිහිපයකට විතරක් පිළිතුරු දෙන්නට ඕනෑ. මුලින්ම පිළිතුරු දෙන්නට ඕනෑ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ මනාප ඡන්දවලින් ආපු බදුල්ල දිස්ත්‍රික්කයේ සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමා කියපු කාරණයකට. මේ ගරු සභාවේ දී එතුමා කිව්වා, මේක තමයි ආණ්ඩුවේ අවසාන අය වැය සම්බන්ධයෙන් කථා කරන විවාදය කියලා. හැබැයි ඒ එතුමාගේ අවසාන විවාදය. එතුමාට ඊ ළඟ අය වැයේ දී මේ සභාවේ කථා කරන්නට වෙන්නේ නැහැ. ඊ ළඟ අය වැයේ දී ආයෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයව ගොනාට අන්දවලා එතුමාට ඒ අයගේ කර පිටින් ඇවිල්ලා, තමන්ව පත් කරපු ආණ්ඩුවටම පහර ගහන්නට වෙන්නේ නැහැ. එතුමා කථාව පටන් ගත්තේ කොහොමද? මේ අතුරු සම්මත ගිණුම, මේක "අතුරු" නොවෙයි, "හතුරු" කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට ඉතිහාසය කියවලා එන්න කියන්න. මේ පළමු වන අතුරු සම්මත ගිණුම නොවෙයි. මේ පළමු වන වතාව නොවෙයි. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාව තිබෙන කාලයේත් සර් ඩී.බී. ජයතිලක මහත්මයා මේ වාගේ අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ගෙනාවා. 1960 දී ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. 1971 දී ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. 1982 දී රොනී ද මෙල් මහත්මයා අතුරු සම්මත ගිණුමක්

ගෙනාවේ ඇයි? ඒ වෙලාවේ ජනාධිපතිවරණයයි, ජනමත විචාරණයයි දෙකක් පවත්වන්න තිබුණා. දැන් නම් ළඟ තිබෙනවා, පාර්ලිමේන්තු මැතිවරණයයි, ජනාධිපතිවරණයයි. ඒ වෙලාවේ පාර්ලිමේන්තු මැතිවරණයක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ තමන්ගේ ධුර කාලය ජනමත විචාරණයකින් දික් කර ගැනීමේ ප්‍රෝඩාකාරී මැතිවරණයක් ළඟ තිබුණා. ඒ මැතිවරණය ළඟ තිබෙනවාය කියලා, ඊට පසුව ජනාධිපතිවරණයක් තිබෙනවාය කියලා රොනී ද මෙල් මහත්මයා අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. ඒ නිසා තමන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රී කාලය ප්‍රෝඩාවකින් දික් කර ගැනීමේ ජනමත විචාරණය ළඟ තියා ගෙනත් රොනී ද මෙල් මහත්මයා ඒ වෙලාවේ ගෙනාවේ අතුරු සම්මත ගිණුමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ වෙලාවේ පාර්ලිමේන්තු මැතිවරණයක් ළඟ එනවා. ජනතාවගේ ඉල්ලීම මතම හදිසි ජනාධිපතිවරණයකුත් එනවා. ඒක නේ මේ ගොල්ලන් කුලප්පු වෙලා ඉන්නේ. එවැනි අවස්ථාවක අතුරු සම්මත ගිණුමක් ගෙන එන එක තමයි සාධාරණ. වැරැදිලාවත් අය වැයක් ගෙනාවා නම් මේ ගොල්ලන් මොකක්ද කියන්නේ? එහෙනම් මේ ගොල්ලන් කියනවා, මේ ගෙනෙන්නේ මැතිවරණ අය වැයක් කියලා. අනිවාර්යෙන්ම කියනවා. දැන් අය වැයක් ගෙනාවාම ඒකට මැතිවරණ අය වැයක් කියලා මඩ ගහන්න බැරි තැන, අය වැයක් ගෙනෙන්නේ නැතිව මොකටද අතුරු සම්මත ගිණුමක් ගෙනාවේ කියලා දැන් අහනවා. අය වැය ගෙනල්ලා සහන දුන්නා නම් ඒ සහන මල්ල පෙන්වලා කියනවා, මේක මැතිවරණ අය වැයක් කියලා. අනිවාර්යයෙන්ම කියනවා, මේක ඡන්ද අය වැයක් කියලා. හැබැයි අතිගරු ජනාධිපතිතුමා එහෙම කළේ නැහැ. එතුමාට තිබුණා, ඡන්ද අය වැයක් ගෙනෙන්න. එතුමා හැම දාම කිව්වේ, "මම බලන්නේ ඡන්ද දිනන එක ගැන නොවෙයි හිතන්නේ, රට ගැනයි" කියලායි. අලුත් ආණ්ඩුවක් එනවා. විපක්ෂයේ අද මහා අඳෝනාව වෙලා තිබෙන මේ කැබිනට් මණ්ඩලයත් ඒ ආණ්ඩුවේ 35ට අඩු වනවා. ඒ 35කට අඩු වුණු කැබිනට් මණ්ඩලයත් එක්ක අලුතෙන් හදන ආණ්ඩුවට අවස්ථාව තිබෙන්නට ඕනෑ, තමන්ගේ අමාත්‍යාංශවලට ඒ ඒ වැය ශීර්ෂ වෙන් කර ගන්න. ඒ සඳහායි මේ අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණට ඒ අය වැයේ දී මේ පාර්ලිමේන්තුවේ ඉන්න බැරි වන එක ඇත්ත. ඒක ඇත්ත. අන්න ඒ මරු විකාරයෙන් මේ කෑගහන්නේ. "අනේ! අපට ආයෙත් අය වැය විවාදයකට සම්බන්ධ වන්න බැහැ"යි කියලා දැන ගෙන ඒ මරු විකාරයෙන් මේ කෑ ගහන්නේ. ඒ මරණ උණ හැදිලා මේ කෑගහන්නේ. එහෙම නැතිව මේ අතුරු සම්මත ගිණුම් පිළිබඳව ඉතිහාසය මේ අය නොදැන නොවෙයි.

ගිය සුමානේ ඉඳලා කෑගැහුවේ මොකටද? පඩි වැඩි කරන්නේ නැහැයි කියලා. දැන් ජනවාරි මාසයේ ඉඳලා පඩි වැඩි කරනවා, arrears එක්ක. නොවැම්බර් මාසයේ සිට arrears එක්ක ජනවාරි මාසයේ පඩි වැඩි කරනවා. දැන් ඒක කියන්නට බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලා තිබෙන්නේ මොකක්ද? තමන් මැතිවරණ එකින් එක, එකින් එක පරාජය වන කොට, තමන්ගේ පක්ෂය දේශපාලන වශයෙන් ශූන්‍ය වන කොට, ලත් තැනම ලොප් වන කොට ඒවාට පිළිතුරු සොයන්නට බැරිව විවිධ බංකොලොත් දේශපාලන කථා කියන එකයි මේ වෙන්නේ. මම ඔට්ටු දාලා කියන්නම්, මට ආරංචි තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් රාශියක් මේ වන විට එක්සත් ජාතික පක්ෂයේ විවිධ ව්‍යාපාරිකයන්ගේ සහයෝගයෙන් ඊ ළඟ අවුරුද්දේ රට අත හැර යන්න ඉන්නවාය කියා. සමහර අය දැනටම එංගලන්තයට යන්න සූදානම්; ඕස්ට්‍රේලියාවට යන්න සූදානම්. ඒ වාගේ පගා දීලා, ඒ වාගේ තාන්න මාන්න දීලා තමයි අද මේ අය එක්සත් ජාතික පක්ෂයේ නැට්ටෙ එල්ලිලා ඉන්නේ. මේක ජනතාව දැන ගන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ ඉතිහාසයේ කළා වාගේම නැවත මේ රට ලේ විලක් කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සූදානම් කර ගෙන ඉන්නේ. අර පැත්තෙන් ශිෂ්‍යයෝ පාරට බස්සවනවා. ශිෂ්‍යයෝ පාරට බස්සවා ශිෂ්‍යයෙක් දෙන්නෙක් මරා ගෙන ඒ ශිෂ්‍යයන්ගේ මළ කඳන් නැවත වතාවක් අර ගෙන ගිහිල්ලා මළ මිනී දේශපාලනය කරන්න හදනවා. අප කවුරුත් මේ ගැන අවදියෙන් ඉන්නට ඕනෑ. කම්කරුවෝ පාරට බස්සවලා ඒ අය මරලා ඒ අයගේ මළ කඳන් අරගෙන යන්නයි මේ උත්සාහ කරන්නේ. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා පොලීසියට උපදෙස් දුන්නේ ශිෂ්‍ය උද්ඝෝෂණ එන විට, ශිෂ්‍ය පෙළපාළි එන විට ඒ අය එක එක අයගේ රූවටීම් මත එන නිසා කුළු පොලු දමා ශිෂ්‍යයන් භය කරන්න එපා; ශිෂ්‍යයන්ට පහර දෙන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ අද මේ විධියට බෙරිහන් දෙන්නේ මොකද? ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයේ අවසාන කාලය මේ යන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ මළගමේ අවසාන අවධිය මේ යන්නේ. ඒ මර ලතෝනියේ හඬ තමයි අද බදුල්ලේ සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමාගෙන් ඇහුණේ කියා මම කියන්න ඕනෑ. බදුල්ල දිස්ත්‍රික්කයේ මෙවර පළාත් සභා මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ හතර වැනියා. තුන් වැනියාට ආවේ චන්ද්‍රසේකරන් මහත්මයාලා. මුළු දිස්ත්‍රික්කයේම ඡන්ද ගත්තේ 11,000යි. ඒ නිසා ඒ ලතෝනිය තමයි මේ ඇහෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට කියනවා ආර්ථිකය ගැන. නිදහසින් පස්සේ පිට පිටම අවුරුදු හතරක් සියයට 6කට වැඩි ආර්ථික වර්ධන වේගයක් මේ රටේ තිබුණා නම් තිබුණේ කාගේ කාලයේද? වර්තමාන ජනාධිපතිතුමාගේ කාලයේ. 2005, 2006, 2007, 2008 පිට පිටම අවුරුදු හතරක් සියයට 6කට වැඩි ආර්ථික වර්ධන වේගයක් එක දිගට පවත්වා ගෙන ආවා නම් පවත්වා ගෙන ආවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ. යුද්ධයත් නිවැරදිව කරමින් ත්‍රස්තවාදය පරාජය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් දියත් කරමින් තමයි එසේ කළේ. අද රැකියා වියුක්තිය අඩු වෙලා. මේවා නේද ආර්ථිකයක් මනින අපේ දර්ශකයන්.

කොටස් වෙළෙඳ පොළ ඉතිහාසයේ කවදාවත් නැති විධියට ඉහළ ගිහිල්ලා. ඉස්සර කිව්වේ ඇමෙරිකාවට හෙම්බිරිස්සාවක් හැදුණාම ලංකාව වාගේ රටවලට නිව්මෝනියාව හැදෙනවාය කියලායි. ඇමෙරිකාවට නිව්මෝනියාව හැදුණා. ලංකාවට නිව්මෝනියාව හැදුණේ නැහැ. පුංචි කැස්සක් හැදුණා විතරයි. ඉස්සර කිව්වේ එහේට කැස්ස නම් මෙහේට නිව්මෝනියාව කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ආර්ථිකය කළමනාකරණය කිරීමත් නිවැරදිව මේ රජය කර තිබෙනවා. ඒ නිසා තමයි අප කියන්නේ මේ අවස්ථාවේදී අවශ්‍ය කරන්නේ මේ රටේ රණ විරුවන් ලබා ගත්තා වූ ජයග්‍රහණවලට නිවැරදි දේශපාලන අර්ථයක් දෙන්න සියලු ශ්‍රී ලාංකිකයන් එකතු වුණු ශ්‍රී ලාංකික චින්තනයක් ගොඩ නැඟීමයි ඕනෑ කියලා. ශ්‍රී ලාංකික චින්තනය තමයි සැබෑ ජාතික චින්තනය විය යුත්තේ. එහෙම නැතිව එක එක අය කුට්ටි කුට්ටි කෑලි කඩා ගෙන උතුරේ අයට ඕනෑ විධියට දෙමළ චින්තනයකුත්, දකුණේ අයට ඕනෑ විධියට සිංහල චින්තනයකුත්, තව නැඟෙනහිර කොටසකට ඕනෑ විධියට මුස්ලිම් චින්තනයකුත් නොවෙයි. ජාතික චින්තනය කියලා විය යුත්තේ ශ්‍රී ලාංකික චින්තනයක්. සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සියලු දෙනාගේම එකතුවෙන් ඇති වුණු ශ්‍රී ලාංකික චින්තනයක් ඇති වන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන නායකත්වය තමයි ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සපයන්නේ. ත්‍රස්තවාදීන් පරාජය කර මේ ලබා ගත්තා වූ ජයග්‍රහණවලින් පස්සේ ඊ ළඟට අප පා තබන්න ඕනෑ අන්න ඒ චින්තනයට යන්න. ඒ චින්තනයට යන්න නම් මේ විධියට ඇස් පනා පිට මේ රජය කළ හොඳ දේවල් පෙනි පෙනී ඒවා පටු දේශපාලන වාසි සඳහා අනික් පැත්තට හරවනවා නම් ඒ වැඩේ කරන්න දෙන්න බැහැ.

ජනතාව පළාත් සභා මැතිවරණ ගණනාවකදී මොකක්ද කියලා තිබෙන්නේ? ජනතාව දීලා තිබෙන පණිවිඩය මෙන්න මේකයි. 2005 ජනාධිපතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානය ලක්ෂ 48ක් ඡන්ද ගත්තා. ඒ උතුරු පළාත හැර. ඒ එක්කම 2008, 2009 පළාත් සභා මැතිවරණවල දී එක්සත් ජනතා නිදහස් සන්ධානය ලක්ෂ 51ක් ඡන්ද ගත්තා. 2008, 2009 පළාත් සභා මැතිවරණයේ දී යූඑන්පියට හිමි වුණේ ඡන්ද ලක්ෂ 26යි. ජනාධිපතිවරණය හා සංසන්දනය කරන කොට සන්ධානය ඡන්ද ලක්ෂ 25ක් ඉදිරියෙනුයි ඉන්නේ. මෙන්න මේක දන්නවා, යූඑන්පී එකේ අය. මේක දන්නවා, ජේවීපී එකේ අය. ඒ නිසා තමයි අද අපට මේ මර ලතෝනිය ඇහෙන්නේ. ඊයේ විපක්ෂ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

නායකතුමා හංස ගීතය ගායනා කළා. අද සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුව ඇතුළේ මර ලතෝනිය දිග ඇරියා. මේක ඇතුළේ තිබෙන දේශපාලන සත්‍යය මොකක්ද? ඒ ගොල්ලෝ සියලු දෙනාම දන්නවා, මේ ඉවර වුණු පළාත් සභා මැතිවරණ ප්‍රතිඵල ගත්තාම සන්ධානය වැඩි ඡන්ද ලක්ෂ 25ක් ඉදිරියෙන් ඉන්න බව. මෙන්න මේ සත්‍යය දැන ගෙන තමයි එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා පසු ගිය වතාවේ පළාත් සභා මැතිවරණයේ දී කියනවා ඇහුණේත්; අපට පත්තරවලින් දකින්නට හම්බ වුණේත්, "ජනාධිපතිතුමා ඉන්නෙත් හම්බන්තොටයි, විකල්ප ජනාධිපතිතුමා ඉන්නෙත් හම්බන්තොටයි" කියලා. මේ සත්‍යය සමහර යූඑන්පී එකේ මන්ත්‍රීවරු දැන ගෙන ඉන්නවා. ඒ ගොල්ලෝ දන්නවා, මේ කපේ - ඊ ළඟ අවුරුදු දහයේ පහළොවේදී - ආයෙත් ජනාධිපතිවරු එන්නේ නැහැ, එනවා නම් ජනාධිපතිතුමෙක් එන්නෙත් තව අවුරුදු පහළොවකින්, ඒත් හම්බන්තොටින් කියලා. "මම තමයි විකල්ප ජනාධිපති" කියලා එතුමාට කිව්වේ. නොකියා කිව්වා, "ලක්ෂ 25ක ඡන්ද ප්‍රමාණයකින් එක්සත් ජනතා නිදහස් සන්ධානය ඉදිරියෙනුයි ඉන්නේ. ඒ නිසා කවුරු ඉල්ලුවත් පරාදයි, වැඩක් නැහැ. තව අවුරුදු පහළොවකින් එහා එන ජනාධිපති මම තමයි" කියලා ඒ වෙලාවේ කිව්වේ ඒ නිසාම තමයි. ඒ සත්‍ය ඒ ගොල්ලෝ තේරුම් අරගෙන අද පස්සට වෙලා බලන් ඉන්න එක ගැන අපි සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ගරු මංගල සමරවීර මන්ත්‍රීතුමා GSP Plus එක ගැන කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ GSP Plus එක එන්න ඉස්සර වෙලා ලංකාවට GSP සහනය තිබුණා. මට වඩා හොඳට මේ ගැන ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමා එතුමාගේ කථාවේදී කියයි. අද "ලංකාදීප" පත්තරයේ "කාලීන සටහන"හි මේ පිළිබඳව ආයෝජන මණ්ඩලයේ සභාපතිතුමා ඉතාම හොඳින් කියලා තිබෙනවා. මේ GSP Plus එක ආවේ GSP එක තිබුණු නිසා. Plus කියන්නේ ධන නේ. අපට GSP සහනය තිබුණා. GSP සහනය යටතේ ලැබෙන සියලු දේවල් අපට ලැබෙමින් තිබුණා. ඊට අමතරව සහනයක් හැටියට GSP Plus ආවා. දැන් GSP Plus සහනයත් එහෙම පිටින්ම අකුළා ගන්න තවම යුරෝපය තීන්දු කරලා නැහැ; යුරෝපා සංගමය තීන්දු කරලා නැහැ. යුරෝපය එක්ක එකතු වෙලා, යුරෝපය එක්ක ඒකාබද්ධ වෙලා, හවුල් වෙලා මේ රටේ ව්‍යාපාර කරන යුරෝපයේ ආයෝජකයන් මේ වන කොට යුරෝපා සංගමයට GSP Plus එක තියන්නයි කියලා අවශ්‍ය කරන ඉල්ලීම් කරනවා. හැබැයි Plus එක නැති වුණත් GSP එක නැති වන්නේ නැහැ. තිබුණු GSP එක තිබෙනවා. තිබුණු GSP එකට Plus එක අත්සන් කරන කාලයේ තිබුණු කොන්දේසි වලංගු වන්නේ නැහැ. කොන්දේසි අත්සන් කළා, ඒක Plus එකට වලංගුයි. Plus එක අවලංගු වුණා කියලා GSP Minus වෙන්නේ නැහැ. ඒ නිසා මේ මහ යකා කියන තරම් කළු නැහැ. අපිට නැති වුණොත් නැති වන්නේ Plus කෑල්ල විතරයි; GSP Minus වෙන්නේ නැහැ; GSP එක තිබෙනවා. හැබැයි Plus එකත් නැති කරන්න විරුද්ධ පක්ෂයෙන් දරන උත්සාහය පරාජය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළයි රජය කර ගෙන යන්නේ. ඒ නිසා මේ වෙලාවේ ලංකාවේ ආණ්ඩුව කියලා තිබෙන එකම දේ, "මේ රටේ ස්වෛරීභාවයට හානියක් වන විධියට වැඩ කරන්නේ නැහැ, වෙන ඕනෑම කොන්දේසියකට අත්සන් කරන්න අපි එකඟයි." කියන එකයි.

අද උදේ මංගල සමරවීර ඇමතිතුමා බෙරිහන් දීලා කිව්වා, ස්වෛරීභාවයට හානියක් වන දෙයක් මේ ගිවිසුමේ කොහේවත් නැහැයි කියලා. මංගල සමරවීර ඇමතිතුමනි, ස්වෛරීභාවයට හානියක් නැත්නම් GSP Plus එක ලැබෙනවා, කිසි අවුලක් නැහැ. රජය පැත්තෙනුත් කියන්නේ ස්වෛරීභාවයට හානි වන ආකාරයේ කොන්දේසි ආවොත් එකඟ වන්නේ නැහැයි කියලායි. මංගල සමරවීර ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට ස්වෛරීභාවයට හානියක් නැත්නම් Plus එකත් එනවා. Plus එක නාවොත් GSP Minus වෙන්නේ නැහැ, GSP එක එහෙමම තිබෙනවා. Plus එකෙන් අහිමි වන දේට අවශ්‍ය කරන සහනය දෙන්න ලංකාවේ ආණ්ඩුව සූදානමින් ඉන්නේ.

මේ වේලාවේදී මගේ කථාව මා අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද අපට අවශ්‍ය කරන්නේ bat එකෙන් bat කරන්න ඕනෑ වෙලාවට බෝලෙන් bat කරන විපක්ෂයක් නොවෙයි. අද bat එකෙන් ගහන්න ඕනෑ වේලාවට bat එක වෙනුවට බෝලෙන් bat කරන්න යනවා. බෝලෙන් bowl කරන්න ඕනෑ වේලාවට bat එකෙන් bowl කරන්න යනවා. ඒ වාගේයි විපක්ෂයට මේක පෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ත්‍රස්තවාදය පරාජය කරලා, සාමය ගෙනැල්ලා, ලංකාවේ භූමියෙන් තුනෙන් එකක් අපේ ආයෝජනවලට, අපේ රටේ සංවර්ධනයට යොදා ගන්න පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙනවා. වෙරළෙන් තුනෙන් දෙකක් ලැබිලා තිබෙනවා. ඒ අනුව අපේ රට සංවර්ධනය කරන්නට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ අවශ්‍ය කරන්නේ පාරේ බැහැලා, එක එක ආකාරයේ විගඩම් කරමින් දඟලන එක නොවෙයි. දැන් අවශ්‍ය කරන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාම එකතු වෙලා පාට, පක්ෂ භේද පැත්තකට දමලා, අතිගරු ජනාධිපතිතුමා මේ රටට ලබා දුන්නා වූ ඒ ජයග්‍රහණ වටා ඒක රාශි වෙලා ඊ ළඟ පියවර තියන්නයි. ඊ ළඟ පියවර තමයි, ත්‍රස්තවාදය, යුද්ධය ජයග්‍රහණය කළා වාගේම ආර්ථික යුද්ධයත් ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය කරන වට පිටාව හදා ගන්න එක. ඒ සඳහා අපි මේ අතිගරු ජනාධිපතිතුමා වටා ඒක රාශි වෙමින් ගමන් කරමුය කියලා විරුද්ධ පක්ෂයේ අයට ආරාධනා කරමින් මා නිශ්ශබ්ද වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(**தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු අරියනේත්‍රන් මන්ත්‍රීතුමා.

**[பி.ப. 4.08]**

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பி. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2010ஆம் ஆண்டின் முதல் நான்கு மாதங்களுக்குரிய செலவினங்களுக்கான கணக்கு வாக்குப்பணம் இங்கே சமர்ப்பிக்கப்பட்டிருக்கிறது. அது சம்பந்தமான விவாதத்திலே தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றி கூறுகின்றேன். கடந்த காலங்களிலே இந்த நாட்டிலே நிலவிய யுத்த சூழ்நிலைக்கு அப்பால், இப்பொழுது சமாதான சூழ்நிலை நிலவுவதாக அமைச்சர்கள் கூறுகின்றபோதிலும், கிழக்கு மாகாணத்திலே உண்மையில் நில ஆக்கிரமிப்புத்தான் இடம்பெறுகின்றது. "திறந்த வீட்டிற்குள் நாய் புகுந்ததைப்போன்று" கிழக்கு மாகாணத்தின் பல்வேறு இடங்களையும் பல்வேறுபட்டவர்கள் ஆக்கிரமிக்கின்றார்கள். இன்று இதனைக் கேட்பதற்கும் பார்ப்பதற்கும் யாருமற்றவர்களாக கிழக்கு மாகாணத்தில் வாழ்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் இருந்து வருகின்றார்கள்.

கடந்த வாரம் நான் மட்டக்களப்பு மாவட்டத்துக்குச் சென்றிருந்தபோது, குறிப்பாக நான் பிரதிநித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தின் பட்டிப்பளைப் பிரதேசச் செயலாளர் பிரிவிலுள்ள கெவுளியாமடு என்ற கிராமத்திலே 1990ஆம் ஆண்டு யுத்த சூழ்நிலை காரணமாக இடம்பெயர்ந்த தமிழ் மக்களின் காணிகள் பறிபோயுள்ளமை பற்றி மக்கள் என்னிடம் முறையிட்டார்கள். பட்டிப்பளைப் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்டதும் அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களின் எல்லையில் அமைந்திருக்கின்றதுமான இக்கிராமத்தில் தமிழ் மக்களுக்குச் சொந்தமான சுமார் 30 ஏக்கர் காணி பறிபோயுள்ளது. அந்தக் காணிச் சொந்தக்காரர்களுடைய பெயர், காணி விஸ்தீரணம் பற்றிய விபரங்களை இப்பொழுது நான் பட்டியலிட்டு வாசிக்கின்றேன்: சின்னத்தம்பி நேசராசா - 6 ஏக்கர், கணபதிப்பிள்ளை - 4 ஏக்கர், சிவக்கொழுந்து - 5 ஏக்கர், கருணை அம்மா - 3 ஏக்கர், ராஜனி அருளம்பலம் - 3 ஏக்கர், குமரப்பா அருளம்பலம் - 2 ஏக்கர், குமரப்பா அழகிப்போடி - 4 ஏக்கர்.

மேற்படி காணிகளே பறிபோனவையாகும். அன்று அங்கு சுமார் 99 குடும்பங்கள் வாழ்ந்து வந்தன. 1990ஆம் ஆண்டு அங்கிருந்து இடம்பெயர்ந்த அவர்கள் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள களுதாவளை என்ற இடத்திலே வசித்து வந்தார்கள். சமாதானச் சூழல் ஏற்பட்டதற்குப் பின்பு அவர்கள் மீண்டும் அங்கு சென்றபொழுதுதான் அங்கு சிங்கள மக்கள் அத்துமீறி புதிதாக 45 கொட்டில்களை அமைத்துள்ளமை பற்றித் தெரியவந்தது. அதேநேரம் "அங்கு தமிழ் மக்களும் நாங்களும் ஒற்றுமையுடன் காலாகாலமாக வாழ்ந்து வந்தோம்; இப்பொழுது இவர்கள் எங்கிருந்து வந்தார்கள் என்பது எங்களுக்குத் தெரியாது; இவர்கள் இங்கு வருவதை நாங்களும் விரும்பவில்லை" என்று அந்த எல்லைக் கிராமத்தில் ஏற்கெனவே இருந்த சிங்கள மக்கள் கூறியிருக்கின்றார்கள். எனவே, இவ்வாறான குடியேற்றங்கள் இடம்பெறுவதைச் சிங்கள மக்கள்கூட உறுதிப்படுத்தியிருக்கின்றார்கள்.

கிழக்கு மாகாணத்திலுள்ள திருகோணமலை, அம்பாறை, மட்டக்களப்பு ஆகிய மாவட்டங்களிலே எங்கெங்கு இவ்வாறான குடியேற்றங்கள் இடம்பெறுகின்றன என்பதைப் பற்றி நான் கடந்த செப்ரெம்பர் மாதம் 17ஆம் திகதி மேதகு ஜனாதிபதி அவர்களுக்குக் கடிதம் ஒன்றை அனுப்பியிருந்தேன். அதற்குப் பின்பு ஜனாதிபதி அவர்கள் கடந்த ஒக்ரோபர் மாதம் 21ஆந் திகதி சம்பந்தப்பட்ட மாவட்ட அரசாங்க அதிபர்களுக்கு இது சம்பந்தமாகக் கடிதம் எழுதியிருக்கின்றார். அந்தக் கடிதத்தில், இவ்வாறான ஒரு குடியேற்றம் இடம்பெறுவது பற்றி மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் முறையிட்டிருப்பதாகக் குறிப்பிட்டுள்ள ஜனாதிபதி அவர்கள், இது சம்பந்தமாக விசாரணை செய்து பூரண அறிக்கை ஒன்றைச் சமர்ப்பிக்குமாறும் உத்தரவிட்டிருக்கின்றார். எனவே, ஜனாதிபதி அவர்கள் ஒரு நல்ல முடிவை எடுத்திருக்கின்றார் என்றுதான் நான் நினைக்கின்றேன். அதேநேரம் நான் எழுதிய கடிதத்துக்குப் பதில் கடிதம் எழுதியுள்ளமை குறித்து ஜனாதிபதி அவர்களை நான் பாராட்டுவதோடு, அந்த நடவடிக்கையையும் வரவேற்கின்றேன். அவர் உரியமுறையில் விசாரணை செய்து இந்தக் குடியேற்றத்தைத் தடுத்து நிறுத்துவார் என்றும் நம்புகின்றேன்.

இதற்கு அப்பால் இன்னுமொரு விடயம் இருக்கிறது. அதாவது, மட்டக்களப்பிலுள்ள பழம்பெரும் பாலமான கல்லடிப் பாலத்தைப் புனரமைப்புச் செய்வதற்கு சுனாமி நிவாரணத் திட்டத்தின்கீழ் வெளிநாட்டு நிறுவனம் ஒன்று நிதி வழங்கியிருந்தது. அதற்கான ஆரம்ப வேலைகளும் அங்கு இடம்பெற்றுவந்தன. ஆனால், இப்பொழுது அந்த நிதி அதற்குப் போதவில்லையென்று கூறி, நடைபெற்றுக்கொண்டிருந்த வேலைகள் நிறுத்தப்பட்டுள்ளதாகவும் அதற்காக ஒதுக்கப்பட்ட நிதி வேறோரு பிரதேசத்தின் அபிவிருத்தித் திட்டத்துக்குச் செலவழிக்கப்படவிருப்பதாகவும் நாங்கள் அறிகின்றோம். எனவே, அடிக்கல் நாட்டப்பட்டு ஆரம்பிக்கப்பட்ட அந்த பாலத்தின் நிர்மாண வேலைகளைத் தொடர்ந்தும் முன்னெடுத்துச் சென்று மக்களுக்குச் சிறந்த போக்குவரத்து வசதியை ஏற்படுத்திக் கொடுக்கவேண்டியது இங்கிருக்கின்ற அமைச்சர்களின் கடமையாகும் என்பதையும் நான் இவ்விடத்திலே கூறிவைக்க விரும்புகின்றேன்.

உண்மையிலே, அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை ஆகிய மாவட்டங்களில் மூவின மக்களும் வாழ்ந்து வருகின்றார்கள். 1990ஆம் ஆண்டு நடந்த இனக்கலவரத்தின்போது அங்கிருந்த சிங்கள மக்கள் இடம்பெயர்ந்து சென்றிருக்கிறார்களென்பதை நாங்கள் அறிவோம்; அவர்கள் மீண்டும் அந்த இடங்களிலே குடியேற்றப்படவேண்டுமென்பதில் நாங்கள் உறுதியாக இருக்கின்றோம். ஆனால், குடியேற்றம் என்ற போர்வையிலே, ஏற்கெனவே குடியிருந்த மக்களுக்குப் பதிலாக வேறு ஆட்களை அல்லது மேலதிகமானவர்களைக் குடியேற்றுகின்றபோது அங்கே பாரிய இன முறுகல் தோன்றக்கூடிய ஒரு சூழ்நிலை ஏற்பட இடமுண்டு. அதனால்தான் இவ்வாறான குடியேற்றங்கள் இடம்பெறுவதைத் தடுத்து நிறுத்துமாறு நாங்கள் கேட்டுக்கொள்கின்றோம். மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற பிரச்சினைகளில் மிக மோசமானதொரு பிரச்சினையாக இது இருக்கின்றது. அங்கிருக்கின்ற பிரதேச செயலாளருக்கோ அல்லது மாவட்ட அரசாங்க அதிபருக்கோ ஏன், புதிதாகத் தெரிவுசெய்யப்பட்டிருக்கின்ற கிழக்கு மாகாண சபையின் உறுப்பினர்களுக்கோகூடத் தெரியாமல்தான் இந்த மீள்குடியேற்றம் செய்யப்படுகின்றது. நினைத்த மாத்திரத்திலே 'புல்டோசர்'ஐக் கொண்டு சென்று காணிகளிலுள்ள மரங்கள் போன்றவற்றை அழித்து, அந்தக் காணிகளைப் பிடிக்கின்ற அமைச்சர்கள் இருக்கிறார்கள். அப்படியான அமைச்சர்களின் பெயர்களைக் கூற நான் விரும்பவில்லை. இந்தப் போக்கு பெரும்பான்மையின சிங்கள அமைச்சர்கள் சிலரிடமும் இருக்கின்றது; சிறுபான்மையின முஸ்லிம் அமைச்சர்களுக்கும் இருக்கின்றது. அமைச்சர்கள் தங்களின் பதவியை எந்தவகையிலும் காப்பாற்றிக்கொள்ளட்டும். ஆனால், தயவுசெய்து காணி பிடிக்கும் அமைச்சர்களாக மட்டக்களப்புக்கு வரவேண்டாமென்பதை நான் இவ்விடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இந்தக் காணிப் பிரச்சினை தொடர்பாக ஆராய்வதற்கு ஓர் ஒழுங்கான கட்டமைப்பை - குழுவொன்றை - அமைக்க வேண்டும். அது, கிழக்கு மாகாணத்திலிருக்கின்ற சகல கட்சிகளையும் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்களை அல்லது கட்சி உறுப்பினர்களை மற்றும் சிவில் சமூகத்தினரை உள்ளடக்கியதாக அமைக்கப்பட வேண்டும். இந்த வகையில், அந்த மக்களின் உண்மை நிலையை உணர்ந்து அவர்களுக்கான காணிப் பகிர்வைச் செய்வதாக இருந்தால் நிச்சயமாக அது ஒரு சிறந்த தீர்வாக இருக்கும். ஆனால், அவ்வாறான எந்தவொரு நடவடிக்கையையும் எடுக்காமல் அமைச்சர்களின் செல்வாக்கைப் பயன்படுத்தி அல்லது அவர்களின் வேண்டுகோளை நிறைவேற்றும் வகையில் சில படையதிகாரிகளின் துணையுடன் இவ்வாறான குடியேற்றங்கள் நடப்பதைத் தயவுசெய்து தடுத்து நிறுத்துங்களென்று ஜனாதிபதி அவர்களிடமும் இந்த அரசாங்கத்தின் அமைச்சர்களிடமும் நான் வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன்.

இலங்கையைப் பொறுத்தமட்டிலே இன்றிருக்கின்ற பொருளாதார நிலையிலே சாதாரணமாக ஐந்து பேர் வாழ்கின்ற ஒரு குடும்பத்துக்கு மாதத்திற்கு ஏறக்குறைய முப்பத்தையாயிரம் ரூபாய் செலவாகிறதென்று ஒரு புள்ளிவிபரம் தெரிவிக்கிறது. இந்த வகையில், 2010ஆம் ஆண்டின் முதல் நான்கு மாதங்களுக்கான கணக்கு வாக்குப்பணப் பிரேரணை இங்கே முன்மொழியப்பட்டிருந்தாலும்கூட, வருகின்ற ஆண்டில் நாடு பாரியதொரு பொருளாதார நெருக்கடியைச் சந்திக்க வேண்டிய நிலை ஏற்படுமென்று நான் நினைக்கின்றேன். ஒருபுறத்தில் அரசாங்கத்தினால் தற்போது ஒருசில பொருட்களுக்கான விலைகள் குறைக்கப்பட்டிருந்தாலும்கூட, மறுபுறத்தில் 'வரி' என்ற போர்வையிலே பல்வேறுபட்ட பொருட்களின் விலை அதிகரிக்கப்பட்டுக்கொண்டிருக்கிறது. யுத்தத்தைக் காரணங்காட்டிப் பல்வேறுபட்ட பொருட்களுக்கான விலையதிகரிப்பு ஏற்கெனவே இடம்பெற்றுவிட்டது. சமாதானம் நிலவுகின்ற இந்தச் சூழ்நிலையிலும் இவ்வாறானதொரு பொருளாதார நெருக்கடி தோன்றுமாக இருந்தால் அது எதிர்காலத்திலே மக்களுக்குப் பாரிய பாதகமான விளைவை ஏற்படுத்தக்கூடும். யுத்தம் முடிவுறுத்தப்பட்டிருப்பதாகவும் சமாதானம் நிலவுவதாகவும் கூறப்படுகின்றது. ஆனால், சமாதானத்தைத் தேடியலைகின்றவர்களாகத்தான் வடக்கு, கிழக்கில் வாழ்கின்ற மக்கள் இருந்துகொண்டிருக்கிறார்கள். தங்களுடைய அரசியல் அபிலாஷைகளை நியாயபூர்வமாகத் தீர்க்கக்கூடிய வகையில் ஓர் அரசியல் தீர்வுத்திட்டம் இன்னும் முன்வைக்கப்படவில்லை. இந்த நிலை தொடருமாக இருந்தால் சமாதானம் என்பது கேள்விக்குறியாகத்தான் இருக்குமே தவிர, பிரச்சினைகளுக்கு நிரந்தரமான தீர்வை எட்ட வாய்ப்பிருக்காது என்பதை நான் இவ்விடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

உண்மையிலே, தற்போதைய சூழ்நிலையில் வடக்கு, கிழக்கிலே பல்வேறுபட்ட அபிவிருத்தித் திட்டங்கள் இடம்பெறுவதாகக் கூறினாலும்கூட, கிழக்கு மாகாணத்தைப் பொறுத்தமட்டிலே அங்கு மீள்குடியேறிய மக்களின் ஜீவனோபாயச் செயற்பாடுகள் நிறுத்தப்பட்டிருக்கின்றன அல்லது குறைக்கப்பட்டிருக்கின்றன. ஆகவே, அதற்கான நிலைமையைத்

[ගරු පී. අරියනේත්‍රන් මහතා]

தோற்றுவிக்கவேண்டிய அல்லது அதற்கான வசதிகளை அவர்களுக்கு வழங்க வேண்டிய ஒரு சூழ்நிலையே அங்கு காணப்படுகின்றது. அதைவிட அவர்களுக்கான ஏனைய வசதிகளும் செய்து கொடுக்கப்படவில்லை. குறிப்பாக மட்டக்களப்பிலிருந்து இடம்பெயர்ந்து சென்ற மக்கள் திருகோணமலை மாவட்டத்திலே தொடர்ந்தும் பல்வேறுபட்ட அசௌகரியங்களைச் சந்தித்துக் கொண்டிருக்கின்றார்கள். அதேபோல வன்னியிலிருந்து இடம்பெயர்ந்து வந்த மக்கள் மட்டக்களப்பிலே உறவினர்களிடம் கையளிக்கப்பட்டபோதிலும் அவர்களுக்கு உதவி வழங்குவதில் இன்னமும் காலதாமதம் காட்டப்படுகின்றது. எனவே, அவர்களுக்கான மீள்கட்டமைப்பு வசதிகளைச் செய்து கொடுக்குமாறு நான் இவ்விடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். உண்மையிலே வடக்கு, கிழக்கிலே கடந்த காலங்களில் பேரவலத்தைச் சந்தித்த மக்கள் இன்னும் நிம்மதியான ஒரு வாழ்க்கையை வாழ முடியாதிருக்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்திலே கால்நடைப் பண்ணையாளர்கள், மீன்பிடித் தொழிலாளர்கள், விவசாயிகள் போன்ற பல்வேறுபட்ட மக்கள் வாழ்ந்து வருகின்றார்கள். ஏற்கனவே அங்கு மானாவாரிச் செய்கையில் ஈடுபடுகின்ற மக்கள் உன்னிச்சைப் பகுதியை மேய்ச்சல் தரையாகப் பயன்படுத்தி வந்தனர். தற்பொழுது உன்னிச்சைக் குளத்திலிருந்து மட்டக்களப்பு நகருக்கு குடிநீர் வழங்குவதற்கான திட்டம் ஒன்று மேற்கொள்ளப்படுவதனால் கால்நடைகளை வளர்ப்பதற்கு முடியாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. அதற்கு மாற்றீடாக கெவுளியாமடுப் பகுதியிலுள்ள மேய்ச்சல் தரையைப் பயன்படுத்த முடியுமானபோதிலும் அதனை அண்டிய பகுதியிலே குறித்த குடியேற்றங்கள் இடம்பெறுவதனால் இந்தக் கால்நடைப் பண்ணையாளர்கள் அங்கு போவதற்கு அஞ்சுகின்றார்கள். ஆகவே, இந்த அச்ச சூழ்நிலையை நீக்குவதற்குப் பொறுப்புவாய்ந்த அதிகாரிகள் முன்வர வேண்டும் என்று நான் கேட்டுக் கொள்கின்றேன்.

கிழக்கு மாகாண சபை உறுப்பினர்கள், குறிப்பாக இரா. துரைரெட்ணம் அவர்கள், இந்தக் குடியேற்றம் சம்பந்தமாக மாகாண சபையில் பலமுறை சுட்டிக்காட்டி, கிழக்கு மாகாண முதலமைச்சருக்கு எழுத்துமூலமாக அறிவித்திருந்தபோதிலும் அதற்கான எந்தவொரு நடவடிக்கையும் இதுவரை மேற்கொள்ளப்படவில்லை. முதலமைச்சரைப் பொறுத்தமட்டில் அவர், தனக்கு அந்த அதிகாரம் வழங்கப்படவில்லை என்றும் தனக்குமேல் இன்னுமோர் ஆட்சி அதிகாரம் நடைபெறுகின்றது என்றும் அதனால் தனக்கு அதனை நிறைவேற்றி வைக்க முடியாதிருக்கின்றது என்றும் வெளிப்படையாகவே பல்வேறு ஊடகங்களுக்கும் கூறியிருக்கின்றார். ஆகவே, சில அமைச்சர்கள் இவ்வாறான சாதகமான நிலைமையைப் பயன்படுத்தித் தங்களுக்குச் சார்பானவர்களை அங்கு குடியேற்றுகின்ற ஒரு நிலைமையே காணப்படுகின்றது. எனவே, இதனைத் தடுத்து நிறுத்தவேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

මීළඟට ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ. භා. 4.21]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டலி சம்பிக்க ரணவக்க - சுற்றாடல், இயற்கை வளங்கள் அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka-Minister of Environment and Natural Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර රජය විසින් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙන්නේ අපට, මේ රටට ඉදිරි කාලයේදී ඉතාම වැදගත් මහා පිම්මක් පැන ගැනීමට සිදුව ඇති නිසයි. අද අප මේ රටේ ආරක්ෂක ස්ථාවරත්වය ගොඩ නහා තිබෙනවා. තව දශක ගණනාවකට ත්‍රස්තවාදයට, බෙදුම්වාදයට, අන්තවාදයට ඉඩක් නැහැ. සන්නද්ධ අරගලවලින් මේ රට ඇති වන්න ලේ හැළුවා. ඒ ලේ වන්දිය මේ රටේ ජනතාව ලබා දුන්නා. නැවත වතාවක් එවැනි ආකාරයේ ආරක්ෂක ප්‍රශ්නයක්, ආරක්ෂාවේ ස්ථාවරත්වයට හානියක්, ලේ වැගිරීමක්, ප්‍රචණ්ඩ ක්‍රියාවක් ඇති නොවන ආකාරයට දශක ගණනක් ඉදිරියට යන විධියේ බලගතු ආරක්ෂක ස්ථාවරත්වයක් අපි ගොඩ නඟලා තිබෙනවා. දැන් අපේ ඊ ළඟ ඉලක්කය දේශපාලන ස්ථාවරත්වය ගොඩ නහා ගැනීමයි. ඒ දේශපාලන ස්ථාවරත්වයේ පළමු වටය පළාත් සභා මැතිවරණවලින් අපි ලබා ගත්තා. ඊ ළඟට මහා මැතිවරණය. අවශ්‍ය වුණොත් ජනාධිපතිවරණය පවත්වලා තව අවුරුදු හයකට ප්‍රධාන මැතිවරණ නැති ස්ථාවර දේශපාලන වටපිටාවක් මේ රටේ ජාතික දේශපාලනයේ ගොඩ නහා ගැනීමයි රජයේ ඉලක්කය. එතකොට මැතිවරණවලින් භේද භින්න වීම, මැතිවරණවලින් ප්‍රශ්න මතු කරන එක නැතිව යනවා. රට අස්ථාවර කරන්න මැතිවරණ යොදා ගන්නා විදේශ කුමන්ත්‍රණකරුවන්ට එය කරන්න හම්බ වන්නේ නැහැ.

ජේ. ආර්. ජයවර්ධන 1982 දී ජනමත විචාරණයට ප්‍රථම කිව්වා, ලංකාවේ මැතිවරණ සිතියම අවුරුදු 10කට අකුළනවාය කියලා. එහෙම තමයි ඔහු පටන් ගත්තේ ඔහුගේ ස්ථාවරත්වය ගොඩ නඟන්න. ජනමත විචාරණ තබලා, ඡන්ද කොල්ල කාලා ප්‍රචණ්ඩ ආකාරයට දේශපාලන ස්ථාවරත්වය ලබා ගන්න ඔහු උත්සාහ කළා. මේ රජය ගමන් කරන්නේ මැතිවරණ සිතියම අකුළලා නොවෙයි. මැතිවරණ සිතියම දිග හැරලා, හැකි සෑම ඡන්දයක්ම ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වලා,මහ ජනතාවගේ කැමැත්තෙන්, ජන මතයෙන් දේශපාලන ස්ථාවරත්වය සය අවුරුද්දකට ශක්තිමත් කර ගන්නයි. එයයි රජය බලාපොරොත්තු වන්නේ. ඒ සය අවුරුද්දෙන් පස්සේ මේ රටට අභිමි වෙච්ච අවස්ථාවන් මොනවාද, රට දිනා ගත යුතු අවස්ථාවන් මොනවාද කියා බලා දැවැන්ත ඉදිරි වැඩ පිළිවෙළක්, මහා ඉදිරි පිම්මක් අපි මේ රටට යෝජනා කරනවා, ඊ ළඟ මහා මැතිවරණවලදී. ඒක මේ ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම සඳහාය කියලා, මානව හිමිකම් ආරක්ෂා කර ගැනීම සඳහාය කියලා, මානව හිමිකම් කඩ කරපු, අත්වල ලේ තැවරිච්ච, ඒ ජාත්‍යන්තර හොරුන්, ජාත්‍යන්තර මං කොල්ලකරුවන් රටේ යහ පාලනය ගැන කථා කරනවා වාගේ විහිළුවක් නොවෙයි. මේ රට මේ මහ පොළොව මත ඇත්තටම ගොඩ නඟන්නට පුළුවන් වන මහා ඉදිරි පිම්මක්, මේ රට ලෝකයේම උතුම් රට බවට පත් කරන දැවැන්ත වැඩසටහනක් සඳහායි ඒ දේශපාලන ස්ථාවරත්වය අප ලබා ගන්නේ. ඒක ලබන අප්‍රේල් මාසයේදී අලුත් අය වැයක් හැටියට, අලුත් වැඩ පිළිවෙළක් හැටියට ඉදිරිපත් කරන්න රජය බලාපොරොත්තු වනවා. ඒ වාගේම ආරක්ෂක ස්ථාවරත්වය, දේශපාලන ස්ථාවරත්වය එක්ක ආර්ථික ස්ථාවරත්වය සාර්ථක කර ගන්න, සමාජයීය ස්ථාවරත්වය සාර්ථක කර ගන්න අයාලේ ගිය සමාජයට අලුත් ඉලක්ක ලබා දීලා මේ රට මේ මහා ඉදිරි පිම්මට සූදානම් කිරීමයි අපේ ඉලක්කය වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අද අප තවත් කාරණයක් කියන්න ඕනෑ. එදා යුද්ධය කරන අතරේ, වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඒ ත්‍රස්තවාදී යන්ත්‍රණය විනාශ කරන අතරේ විදේශ බලවේග විසින් එල්ල කරනු ලැබූ සියලු බලවේග කළමනාකරණය කරලා, පරාජය කරලා රටේ ශක්තිමත් ජාතික මත වාදයක් ඇති කරන අතරේ, රටේ සියලුම මූලෝපායික ආර්ථික ක්‍රියාදාමයන් ශක්තිමත් කරන්න රජය වැඩ කළා. 1992 ඉඳන් විදුලිබල සැලැස්මක් ක්‍රියාත්මක කරන්න පැවැති කිසිම රජයකට හැකි වුණේ නැහැ. යළි පහළොස් අවුරුද්දකට මේ රටේ විදුලි බල හිඟයක් ඇති නොවන ආකාරයේ විදුලි බල සැලැස්මක් අප ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒක ලබන අවුරුද්දේ ඉඳන් ක්‍රියාත්මකයි. එතකොට මේ රටේ ඉදිරි කාලයේදී විදුලි බල ප්‍රශ්නයක් එන්නේ නැහැ. අද එක්සත් ජාතික පක්ෂයේ සමහර අය කියනවා, ජේ. ආර්. ජයවර්ධන යුගය තමයි ස්වර්ණමය යුගය කියලා. ජයවර්ධන මහත්මයා මේ රටේ විදුලි බල පද්ධතියට එකතු කළා වාගේ පස්

ගුණයක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ කාලය ඇතුළේ අපි එකතු කර තිබෙනවා රටේ ඉදිරි පිම්ම සූදානම් කරන්න. ඒ වාගේම මහා පරිමාණයේ මාර්ග පද්ධති, වරාය පද්ධති, නාවික පද්ධති, ගුවන් පථ ආදි සියලුම ආකාරයේ යටිතල පහසුකම්වල සියලුම මූලික කටයුතු ඒ දැවැන්ත යුද්ධයේ සෙවණැල්ල යටතේ අපි කළා. කොළඹ වරාය තිබුණා මෙන් තුන් ගුණයක් විශාල වරායක් ලෙස අද ඉදි කරලා තිබෙනවා. දැවැන්ත අන්තර්ජාතික වරායක් හම්බන්තොට ඉදි වනවා. ගාල්ලේ වරාය පුළුල් කරනවා. ත්‍රිකුණාමලය වරාය පුළුල් කරනවා. කන්කසන්තුරේ, ඔලුවිල් වරායවල් පුළුල් කරනවා. එක වර වරායන් පහක් අන්තර්ජාතික මට්ටමට ගෙන එනවා. විජාතිකයන් මේ රටට පැමිණියාට පස්සේ වරාය ක්ෂේත්‍රයේ සිදු වෙච්ච ලොකුම ඉදිරි පිම්ම මේකයි.

ඒ වාගේම අද ගුවන් පථ සියල්ලම විධිමත් කරලා තිබෙනවා. අද කටුනායක ගුවන් තොටු පොළ අන්තර්ජාතික මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. තවත් අන්තර්ජාතික ගුවන් තොටු පොළක් මත්තල ඉදි වනවා. ලෝකයේ බටහිර සිට නැඟෙනහිරට යන ගුවන් යානාවල ගුවන් කේන්ද්‍රයක් බවට මේ රට පත් කිරීමට අවශ්‍ය කරන සියලුම යටිතල බලය ගොඩ නඟලා අවසන්. වරාය කේන්ද්‍රයක්, නාවුක කේන්ද්‍රයක් බවට පත් කරන වැඩ පිළිවෙළ ගොඩ නඟලා අවසන්. එපමණක් නොවෙයි. මූල්‍ය කේන්ද්‍රයක් ගොඩ නඟන්න පුළුවන් ආර්ථික ස්ථාවරත්වය දැන් ගොඩ නඟලා තිබෙනවා. ලෝකයේ හොඳම කොටස් වෙළෙඳ පොළත්, අන්තර්ජාතික බැංකු පද්ධතියේ මධ්‍යස්ථානයක් බවට රට ඉදිරි දශකයේදී අපි ගෙන එනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එපමණක් නොවෙයි, ජලාශ පද්ධති ගණනාවක් ඉදි කළා. එදා එක්සත් ජාතික පක්ෂය මහවැලිය විදේශිකයන්ට දීලා, ඒ විදේශිකයෝ කෝටි ගණන් වැඩියෙන් ගණන් හිලවු හදලා රට ණය උගුලකට ගෙනාවා. අද වන තෙක් මහවැලිය ඒ ණය ගෙවලා ඉවර වෙලා නැහැ. අපි දේශීය ඉංජිනේරුවන් පාවිච්චි කරලා වෙලි ඔය හැදුවා; මව් ආර හැදුවා; වෙහෙරගල හැදුවා; අද රඹකැන් ඔය හදනවා. හෙට හැඩ ඔය හදනවා. ඒ වාගේම මොරගහකන්දෙන්, කළු ගඟෙන් විශාල ජල යෝජනා ක්‍රමවලට වැඩ කටයුතු යොදලා ඉවරයි. රටේ සියලුම වාරි කර්මාන්ත ශක්තිමත් කරන්න, මුළු රටේම ජල සංරක්ෂණය කරමින්, ඒ මහා කෘෂිකාර්මික ඉදිරි පිම්මට අවශ්‍ය කරන වටපිටාවත් දැන් සකස් කරලා ඉවරයි. අද 'A' ශ්‍රේණියේ සියලුම මාර්ග carpet කරලා යන්න පුළුවන් විධියට සකස් කරලා, විශේෂයෙන්ම ගම්මානවල පාරවල් ගොඩ නැඟිලා ඉවරයි. එහෙම නම් මේ මහා යටිතල පහසුකම් ඇති කිරීමේ පිම්ම අපි සකස් කරලා තිබෙන්නේ ඊ ළඟ අවස්ථාවේ දී අපේ ගමේ, අපේ නගරයේ පුංචි පාර හදන්න, අපේ ගමේ, අපේ නගරයේ නාගරික මධ්‍යස්ථානය හදන්න, අපේ ගමේ, අපේ නගරයේ වාණිජ මධ්‍යස්ථානය හදන්න, පාසල හදන්න, විශ්වවිද්‍යාලය හදන්නයි. මේ මැතිවරණයට ඉදිරි පිම්ම ගැනීම සඳහා ඊ ළඟ අවුරුදු දහයේදී, අර මහා මට්ටමින් කෙරුණු යටිතල පහසුකම්වලට අමතරව කුඩා මට්ටමේ යටිතල පහසුකම් පිළිබඳ දැවැන්ත මූලෝපායික වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කරනවා. ඒ වාගේම අපේ ඉදිරි මඟ මොකක්ද? අද මේ තිබෙන අශුද්ධ සන්ධානයේ ඉදිරි මඟ මොකක්ද? කොහොම හරි ජනාධිපති මහින්ද රාජපක්ෂ පුටුවෙන් ඇද දැමීමේ මඟ පමණයි. මේ රටේ ජීවත් වන දෙකෝටියක් ජනතාවගේ ප්‍රාර්ථනාත් එක්ක තිබෙන අපේ මඟ මොකක්ද? දශක හයක් අපට අහිමි වුණු දේවල් නැවත දිනා ගැනීමයි. අපේ රට නාවුක කේන්ද්‍රයක් බවට පත් කරන්න අවස්ථාව තිබුණා. සිංගප්පූරුවත්, ඩුබායි රටත් අපේ ඒ අවස්ථාව උදුරා ගත්තා. අපි දැන් වේගයෙන් ගමන් කරමින් සිටින්නේ ඒ අහිමි වුණු අවස්ථාව නැවත දිනා ගැනීම සඳහායි. මේ රට ගුවන් කේන්ද්‍රයක් බවට පත් කර ගැනීමේ හැකියාව තිබුණා. සිංගප්පූරුවත්, ඩුබායි රටත්, අද වන විට කටාර් රාජ්‍යයත් ඒ අවස්ථාව අපෙන් උදුරා ගෙන තිබෙනවා. ඉදිරි හය අවුරුද්දේ දී ඒක නැවත වතාවක් දිනා ගැනීම සඳහා මහා ඉදිරි පිම්මක් පනින්නයි මේ ජාතිය සූදානම් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එපමණක් නොවෙයි. අප ඉදිරියේ දී මේ රට බලශක්ති කේන්ද්‍රයක් බවට පත් කරනවා. අපේ රටේ නියම දේශ සීමා අයිතිය පිළිබඳ ලියවිල්ල පසු ගිය මැයි මාසයේ 08 වැනි දා එක්සත් ජාතීන්ගේ සමුළුවට; එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කළා. ඒ ලියවිල්ලට අනුව දැන් වටිනාකම් ඇගැයීම කර ගෙන යනවා. ඒ ඇගැයීම කළාට පස්සේ අපට ඒ මහා සාගර පද්ධතියක් අයිති වනවා. ඒ සාගර පද්ධතියේ තිබෙන තෙල් හා ගෑස් සම්පතත්, අනෙකුත් ඛනිජ සම්පත්වල අයිතියත් අපේ දූ දරුවන්ට ලැබෙනවා. මේ මහා මැතිවරණයේ දැවැන්ත ඉදිරි පිම්මේ කොටසත් හැටියට ලංකාව බලශක්ති කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා වෙච්ච ඒ මහා, දැවැන්ත වැඩ පිළිවෙළක් ඊ ළඟ අය වැයෙන් අපි ඉදිරිපත් කරනවා. ඒ විතරක් නොවෙයි. මේ රට දැනුමේ කේන්ද්‍රයක් බවට පත් කරන්න, තොරතුරු තාක්ෂණයේ කේන්ද්‍රයක් බවට පත් කරන්න අපි කටයුතු කරනවා. මේ රටේ උගත් ජනතාව අපේ තිබෙන දැවැන්තම සම්පතයි. මේ කලාපයේ අපේ රට තරම් උගත් ජාතියක්, මේ කලාපයේ අපේ රට තරම් දැනුමින් ව්‍යුත්පන්න ජාතියක්, ජනතාවක් තවත් නැහැ. මේ රටේ ජනතාවගෙන් දසලක්ෂයක් උගත් ජනතාව අද විදේශවලයි ජීවත් වෙන්නේ. ඒ අයගේත් සහයෝගය අරගෙන මේ රට දැනුමේ කේන්ද්‍රයක් බවට, දැනුම බෙදා හරින කේන්ද්‍රයක් බවට, තොරතුරු තාක්ෂණයේ කේන්ද්‍රයක් බවට, ඒ වාගේම නව පරිගණක තාක්ෂණයේ කේන්ද්‍රයක් බවට පත් කිරීමට අවශ්‍ය කරන ඒ මූලික වටපිටාවත් මේ වන කොට ගොඩ නඟලා අවසන්. ඒ නිසා බැංගලෝරයට නො දෙවෙනි අලුත් තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානයක් බවට, තොරතුරු තාක්ෂණික කේන්ද්‍රයක් බවට පමණක් නොවෙයි, වාණිජ හුවමාරු මධ්‍යස්ථානයක් බවට ගොඩ නඟන ඒ මහා ඉදිරි පිම්මටත් රට සූදානම් කරලායි තිබෙන්නේ, මේ ඉදිරි දශකයේ ඉදිරියට යන්න.

එපමණක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි කාලයේදී තෙල් මිල වැඩි වීම අපි බලාපොරොත්තු වෙනවා. තෙල්, ඉන්ධනයක් හැටියට තව දශක පහකින් අපට සම්පූර්ණයෙන් අහිමි වෙනවා. තෙල් දහනය නිසා ඇති වෙලා තිබෙන දේශ ගුණික විපර්යාස විසින් මහා බරපතළ ප්‍රශ්න අප ඉදිරියේ පැන නංවා තිබෙනවා. නියඟය, ගං වතුර, ඒ වාගේම මැසි මදුරු උවදුර ව්‍යාප්ත වීම, මුහුද ගොඩ ගැලීම වැනි බරපතළ පාරිසරික ප්‍රශ්න ඉදිරියේ අද ලෝකය හරිත ආර්ථිකයක් ගැන කතා කරන තැනට පත්වෙලා තිබෙනවා. අන්න ඒක ගැනත් අපි කල්පනා කරලා තිබෙනවා. ඒ සඳහා අපි "හරිත ලංකා" නමින් දස අවුරුදු වැඩ පිළිවෙළක් ලබන වසරේ සිට දියත් කරන්න බලාපොරොත්තු වෙනවා. එමඟින් පිරිසිදු බලශක්තිය, පුනර්ජනනීය බලශක්තිය නිපද වන්න; පිරිසිදු කර්මාන්ත ඇති කරන්න; කාබනික ගොවිතැන දෙසට මේ රටේ ගොවිතැන ගෙන යන්න; අපේ බලශක්තිය, අපේ ඖෂධ, අපේ ආහාර, අපේ පොහොර අපේ ජනතාව විසින්ම නිපද වන නව වැඩ පිළිවෙළකට රට ගෙන යන්න අපි යෝජනා කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. නව නගර, හරිත වාස්තු විද්‍යාත්මක නගර, හරිත ප්‍රවාහන සේවාවන් රටට හඳුන්වා දීම සඳහා වන දැවැන්ත සැලසුමක් ඒ "හරිත ලංකා" වැඩ පිළිවෙළ ඇතුළේ ගැබ් වෙලා තිබෙනවා. ඉතින් මේවා තිබෙනවා ද, මේ විපක්ෂයේ අශුද්ධ සන්ධානයට? මොනවාද ඒ ඇත්තන්ට ජනතාව ඉදිරියට ඇවිල්ලා කරන්න තිබෙන්නේ? රට මෙවැනි දැවැන්ත ඉදිරි පිම්මකට ආර්ථික, සමාජීය, පාරිසරික හැම ක්ෂේත්‍රයෙන්ම ගමන් කරන කොට අතළොස්සක් එකතු වෙලා අශුද්ධ සන්ධානයක් හදලා සටන් පාඨ ටිකක් ජනතාවට ලබා දීලා තිබෙනවා. සටන් පාඨවලින් මේ රටට ලැබෙන මෙහෙවරක් නැහැ. රණ විරුවන් විසිහයදහසක් ජීවිත පූජා කරලා රටට නිදහස ලබා දීලා තිබෙන්නේ සටන් පාඨවලින් ආපසු එය හරවන්න නොවෙයි. මේ නිදහස අපට ලබා දීලා තිබෙන්නේ අන්තවාදී බලවේග තුන හතරකට එකතු වෙලා ඒ මහා ජාතික වැයම ආපසු හරවන්න නොවෙයි. කොළඹදී ගිවිසුම් අත්සන් කරනවා. බ්‍රසල්ස්වලදී රට පිළිබඳ වාර්තා නිකුත් වෙනවා. නිව්යෝර්ක් නගරයේදී අපට රහැණිව නොයෙක් ආකාරයේ ප්‍රචාරණ යන්ත්‍රණයන් ක්‍රියාත්මක කෙරෙනවා. මේ සියල්ලම එකට ගැට ගැසිලා, කැටි ගැසිලා තමයි මේ ගමන් කරන්නේ. තැන තැන උද්ඝෝෂණ ඇති කර ගෙන, තැන තැන සටන් පාඨවලට රට කොටු කරන්න, හතළිස් වසරක් රට ආපස්සට ඇදපු ඒ රතු සහෝදරවරුනුත් ඒ මගේම යනවා. තිස් අවුරුද්දක ත්‍රස්තවාදය පරාජය කළා වාගේ අද අප ඉදිරියේ තිබෙන ප්‍රධානම අභියෝගය තමයි හතළිස් අවුරුද්දක් මේ

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

රට ආපස්සට ඇදපු ඒ විරෝධතා දේශපාලනය, ඒ කාලකණ්ණිවාදය අපේ විශ්වවිද්‍යාලවලිනුත්, මේ සමාජයෙනුත් තුරන් කරලා රට ඉදිරි ගමනකට සූදානම් කිරීම. අන්න ඒ නිසා ඉදිරි මැතිවරණවලදී අප පරාජය කරන්න බලාපොරොත්තු වන්නේ බෙදුම්වාදය පමණක් නොවෙයි. අප පරාජය කරන්න බලාපොරොත්තු වන්නේ, විදේශවල ඉඳ ගෙන කුමන්ත්‍රණ කරමින් මේ රට දේශපාලන අස්ථාවරත්වයකට ගොඩ නඟලා ඒ අතීතයට මේ රට ඇද ගෙන යන්නට හදන ඒ බලවේගවල කුමන්ත්‍රණ පමණක් නොවෙයි. මේ රට ඇතුළේම කඳ පණුවෝ රැළක් වාගේ ඉඳ ගෙන රටේ ආර්ථිකය, සමාජ දේහය ඉතාමත්ම දුෂ්ට අන්දමින් විනාශ කරමින් රට ආපස්සට ගෙන යන්න හදන ඒ සියලුම පිළිකාවන් ඉවත් කරලා රට මේ මහා ඉදිරි පිම්මට සූදානම් කිරීමයි අපේ බලාපොරොත්තුව. අන්න ඒ අනාගතවාදය සඳහා, ඒ අනාගතවාදයේ නිර්මාතෘවරු වීමට, ඒ අනාගතවාදයේ සාක්ෂිකරුවන් වීමටයි මේ රටේ ජනතාව ඊ ළඟ මැතිවරණවලදී ඡන්දය දෙන්නේ. එහෙම නැතිව ජනාධිපති ධුර අහෝසි කරන්න, මානව හිමිකම් රකින්න ඔය දශක ගණනක් වයසු සටන් පාඨවලට නොවෙයි. අපේ ජනතාව තමන්ගේ දූ දරුවන්ගේ ඒ දැවැන්ත අනාගතය වෙනුවෙන් ලබන මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කරන බව මා කියන්න ඕනෑ. ඒ වාගේම අපි කියන්න ඕනෑ, පොදු සන්ධාන අද බිහි කර තිබෙන බව. බොහොම කඩිමුඩියේ 2007 අගෝස්තු මාසයේ හයිඩ් පාර්ක් එකට එකතු වෙලා තමයි මේ සන්ධානය හදා ගත්තේ. ප්‍රශ්නය අද මේකේ නායකයා නැති වීමයි. මේකේ නායකයා පසු ගිය මැයි 19 වන දා නන්දිකඩාල් කළපුවේදී මිය පරලොව ගියා. එයා තමයි මේකේ නියම නායකයා. නායකයා නැතුව තමයි මේ කවන්ධය අද එළියට ඇවිත් තිබෙන්නේ. එයාගේ අණසක අනුව තමයි මේ කට්ටිය ඒ කාලයේ ක්‍රියා කළේ. අද ඒ නායකයා නැතුව -හිස නැතුව- කවන්ධය ඇවිල්ලා "අනේ අපි යාළුයි, අපිට රට බාර දෙන්න" කියා ඉල්ලලා තිබෙනවා. මොනවාද තියෙන්නේ? සටන් පාඨ විතරයි. මේ රටේ සමාජයීය වර්ධනයක් ගැන හිතලා දුරදිග බලලා යම් මෙහෙවරක් කරපු එක්සත් ජාතික පක්ෂයත් සටන් පාඨවලට යට වුණු පක්ෂයක් වීම තමයි රටේ අභාග්‍යය. නමුත් එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, මුස්ලිම් කොංග්‍රසය ආදී මේ සියලුම දේශපාලන පක්ෂවල, කොටි සංවිධානය යන මේ සියල්ලේම සිටි රටේ ඉදිරි ගමන ගැන, රටේ අනාගතය ගැන කැක්කුම තිබෙන අනාගත වාදයක් ගැන විශ්වාස කරන සටන් පාඨවලට යට නොවුණු ඒ දේශ මාමක බලවේගය මේ මහා ඉදිරි ගමනට දැන් එකතු වෙලා ඉවරයි. ඒ ගහ ආපසු හරවන්න කොල්ලුපිටියේ කුරුඳුවත්තේ ටයි කෝට් ත්‍රස්තවාදයට කිසිම ඉඩක් නැති බව අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ ටයි කෝට් ත්‍රස්තවාදය පිටුපස යමින් මේ රට ආපහු හරවන්න පොඩි පොඩි ඇත්තොත් යම් යම් අලගු පලගු කර ගෙන යනවා. ඒ සියලු දෙනාටම තමයි අපි මේ කියන්නේ. මහා සමාජ ප්‍රවාහයක් ඇරඹිලා තිබෙනවා. මහා ගඟක් ඉදිරියට ගලා ගෙන යනවා. කරුණාකර, ඇවිල්ලා ඒකට මිශ්‍ර වන්න. ඒකට මුසු වෙලා ජාතියේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන්න. එහෙම නැත්නම් තමන්ටත්, රටටත් අනාගතයක් නැහැ.

මේ අතුරු සම්මත ගිණුම ආරම්භයක් පමණයි. මහා අනාගතයක් සඳහා, දැවැන්ත අනාගත වාදයක් සඳහා මුළු රටම මහා ඉදිරි පිම්මක් සඳහා සූදානම් කරන ඒ නව වැඩ පිළිවෙළ ඉදිරි කාලයේදී ඉදිරිපත් වනවා. සටන් පාඨ දේශපාලනයෙන් ආපසු හැරුණු, අතර මං වුණු තුංකුදු වෙච්ච ජාතිය කෙළින් කරවලා ලැබුණු ආරක්ෂක ස්ථාවරත්වය, ලැබුණු දේශපාලන ස්ථාවරත්වය ඔස්සේ රටම අලුත් මඟකට ගෙන යන මහා පිම්මකට ගෙන යන ඒ වැඩසටහනට දායක කර ගන්න, ඉදිරි ගමනට එකතු වන්න කියා ඔබ හැමගෙන්ම ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ඊ ළඟට ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.38]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමා)**

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - தொழில் உறவுகள், மனிதவலு அமைச்சர்)

(The Hon. Athauda Seneviratne - Minister of Labour Relations and Manpower)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ දේශපාලනය මේ රටේ සංවර්ධනයට යෝග්‍ය වූ පරිසරයට යොමු වෙලා ගමන් කරන වෙලාවක් මේක. පළමුවෙන්ම රටක සංවර්ධනයට වුවමනා කරන්නේ සාමය. අවුරුදු 30ක් විතර තිබුණු ඒ කුරිරු තත්ත්වය වෙනස් වෙලා අද සාමයක් ඇති වෙලා තිබෙනවා. ඒ සාමයත් සමඟ අපේ ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, දැන් සංවර්ධන යුද්ධය ආරම්භ කරන්න ඕනෑ කියා. එතුමාගේ සංවර්ධන යුද්ධය කියන එකට අපි සියලු දෙනාම දායක වෙන්න ඕනෑ. ඒ සංවර්ධන යුද්ධයේ සෙබළ සෙබළියන් වෙන්න අපි සියලු දෙනාම ක්‍රියා කිරීම වැදගත් වෙනවා, රටක් හදන්න. විශේෂයෙන් මේ රට තුළ ගොඩ නඟා ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළ දැන් ආරම්භ කිරීම පමණක් නොවෙයි, දැන් සංවර්ධනය කිරීම පමණක් නොවෙයි, ජනාධිපතිතුමා මේ අවුරුදු තුන හතර තුළම සංවර්ධනයත් කළා. යුද්ධය කළා පමණක් නොවෙයි, සංවර්ධනයත් කළා. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා එතුමාගේ සංවර්ධන වැඩ පිළිවෙළ අනුව විදුලි බලාගාර ගණනාවක් ආරම්භ කෙරුවාය කියා. වරායන්, ගුවන් තොටු පොළවල්, අධිවේගී මාර්ග, ධීවර වරායන් ඒ වාගේම මේ රටේ "ගම නැඟුම", "මඟ නැඟුම" සියලු අංශවලින් ඒ සංවර්ධන වැඩ පිළිවෙළ යොමු කෙරුවා. "අපි වවමු - රට නඟමු" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කෙරුවා. අපේ රණවක ඇමතිතුමා ඒ ගැන කථා කළ නිසා මම ඒ පැත්ත ගැන වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

රටේ සුභසාධනය ගනිමු. සුභසාධනයට කිසිම හානියක් නොකර අධ්‍යාපන, සෞඛ්‍ය, සමෘද්ධි, පොහොර සහනාධාරය, පාරවල් හැදීම, විදුලිය සැපයීම මේ ආදී සුභසාධන වැඩ සියල්ලක් කර ගෙන ගියා.

එපමණක් නොවෙයි. රාජ්‍ය සේවයේ රැකී රක්ෂා ප්‍රමාණය ලක්ෂ 3කින් අඩු කරන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් යෝජනා කර තිබුණු රටක ඒ වෙනුවට රාජ්‍ය සේවයේ රක්ෂා ලක්ෂ තුනක් ලබා දුන්නා. එතකොට අපි රක්ෂාත් ලබා දුන්නා.

සාමය ඇති කිරීම සඳහා ත්‍රස්තවාදය අවසාන කිරීම විශාල කාර්යයක්. ඊ ළඟට ඒවා නතර නොකර -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ඇමතිතුමනි, නිශ්ශබ්ද වන්න. මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ලලිත් දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லலித் திஸாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. LALITH DISSANAYAKE *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)

(The Hon. Athauda Seneviratne)

සංවර්ධනයයි, සුභසාධනයයි, රැකී රක්ෂා සැපයීමයි මේ සියලු කටයුතු එකට කර ගෙන ගියා. මේ රටේ යුද්ධයක් කළා විතරක්

නොවෙයි, මේ සියලු කටයුතුත් ඉෂ්ට කරන්න යෙදුණා. සංවර්ධනය තුළින් මේ රටේ ඉදිරි ගමනට අවශ්‍ය වන පදනම සකස් කළා. අද උද්ධමනය සියයට එකයි දශම ගණනකට බැහැලා තිබෙනවා. උද්ධමනය බැහැලා තිබෙනවා. රැකී රක්ෂා හිඟය සියයට 5.8ට බැහැලා තිබෙනවා. ඒ වාගේම ඒ තත්ත්වය පදනම් කර ගෙන රටේ සංවර්ධනයට උදවු වන්න මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ පොලී අනුපාතය අඩු කරලා තිබෙනවා. පොලී අනුපාතය අඩු කිරීම සංවර්ධනයට ඉතා වැදගත්. ව්‍යාපාරිකයන්ට ණය ලබා ගෙන සංවර්ධන වැඩ කර ගෙන යන්නට ඒ මඟින් මහා ශක්තියක් ඇති කරලා තිබෙනවා. මේ වැඩ පිළිවෙළ තත්ත්වයන් නිසා අනාගතයේ මේ රටේ ඒ තත්ත්වය තවත් ශක්තිමත් කරන්න, මේ හොඳ වැඩ පිළිවෙළ නිසා, මේ ක්‍රමානුකූලව ගමන් කරන වැඩ පිළිවෙළ නිසා මේ රටේ ජනාධිපතිතුමා යටතේ පවතින ආණ්ඩුව මහා ප්‍රබල ආණ්ඩුවක් බවට පත් වුණා. ආණ්ඩුව ගෙන යන්න අවශ්‍ය කරන මන්ත්‍රීවරුන් ගණන අපට සිටියේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව සමඟ සිටියා නම් අදත් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයෙන් විශාල කොටසක් - පළුවක් - ගැලවිලා මෙහාට - ආණ්ඩු පක්ෂයට - ආවා. ඒ අය මේ ජනාධිපතිතුමා ගැන කොච්චර විශ්වාසයක් තැබුවාද කිව්වොත්, ඒ අය වෙනම කණ්ඩායමක්, පක්ෂයක් හැටියට සිටියා නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළට ඇතුළු වෙලා මේ ආණ්ඩුව ශක්තිමත් කරන්න එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණෙන් කොටසක් ගැලවිලා මේ පැත්තට - ආණ්ඩු පක්ෂයට - ඇවිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] මොකක් හෝ කියන්න එපා යැ. ඒකට ඉඩ දෙමු. ඒ විතරක් නොවෙයි. වතුකරයේ අපේ තොණ්ඩමන් ඇමතිතුමා - CWC එක පක්ෂයක් වශයෙන් - ආණ්ඩු පක්ෂයට ඇවිල්ලා තිබෙනවා. ඊ ළඟට කඳුරට ජනතා පෙරමුණත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හෙට වන කොට ඔක්කොම එනවාලු.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
හරි, හරි. ආවත් මෙහේ ශක්තිය තිබෙනවා.

ඊ ළඟට ජාතික හෙළ උරුමයත් මේ පැත්තට - ආණ්ඩු පක්ෂයට - ඇවිල්ලා අපිත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ලංකා සම සමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, EPDP, EPRLF කියන පක්ෂ පමණක් නොවෙයි, කොටි සංවිධානයේ හිටපු නැඟෙනහිර කොටස්, උතුරේ කොටස් පවා මේ ජනාධිපතිතුමා එක්ක එක් වෙමින් සිටිනවා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
කවුද, කරුණා සහෝදරයාද?

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
පිල්ලෙයාන් මහ ඇමති බවට පත් වෙලා නැඟෙනහිර පළාතේ නොතිබුණු බලයක් එතැනත් ගොඩ නැඟිලා මේ ආණ්ඩුව ශක්තිමත් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එතකොට -[බාධා කිරීමක්] අපේ දේශපාලන සාකච්ඡාවලට ගිය දේශපාලන කඳවුරේ හිටපු නායකයා - විනයාගමූර්ති මුරලිදරන් මහත්මයා - ආණ්ඩු පක්ෂයට ඇවිත් ඇමතිවරයෙක් වෙලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපතිකමකටත් පත් වෙලා ඉන්නවා. මේ ගලා යන වැඩ පිළිවෙළ වඩා හොඳ නිසා ආණ්ඩුව ශක්තිමත් කරන්න මේ විධියට සියලු කොටස් එකතු වෙලා තිබෙනවා.

ඒ වාගේම TNA එකේ වුණත් එක්තරා පිරිසක් ආණ්ඩුව ගැන පැහැදිලා ආණ්ඩුවේ පැත්තට එකතු වන්න සිටින බවටත් අපට ආරංචි තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපට ආරංචියි එතුමන්ලා එනවා කියලා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඔව්. ඒ පිරිසෙනුත් කොටසක් අපට ඒවි. එක්සත් ජාතික පක්ෂය යාපනය නගර සභාවට තරග කළා. ඡන්ද 83යි ලැබුණේ. ඒ අයගේ තත්ත්වය ඒ ආකාරයට බැහැලා තිබෙනවා. එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ අපත් එක්ක ඉන්න කාලයේ බස්නාහිර පළාතේ පළාත් සභාවට පළාත් සභා මන්ත්‍රීවරු විසිතුන් දෙනෙක් තේරුණා. දැන් මේ සැරේ තනිවම ගිහින් විසිතුන, තුනට බැස්සා. ජනතා විමුක්ති පෙරමුණේ බලය විසිතුන, තුනට බැස්සා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ඕනෑම එක තිබෙනවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ වාගේම, කලින් දකුණු පළාතේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 15ක් විතර හිටියා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු පළාතෙත් ඔවුන්ගේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රමාණය - බලය - තුනට බැස්සා. ඒ වාගේම මධ්‍යම පළාතට ජනතා විමුක්ති පෙරමුණෙන් එකම මන්ත්‍රීවරයෙක්වත් පත් වුණේ නැහැ. ඌව පළාතේ එකට බැස්සා. වයඹ පළාතේ එකට බැස්සා. ජනතා විමුක්ති පෙරමුණ මේ ආණ්ඩුව පෙරළන්නේ කොහොමද? දැන් ඔවුන් මේ බැහැලා බැහැලා, බිමට වැටිලා ඉන්නේ. දැන් මේ තත්ත්වය තුළ මම පෙන්වන්නේ ඒකයි. එක්සත් ජාතික පක්ෂයටත් ඒකමයි වෙලා තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණටත් ඒකමයි වෙලා තිබෙන්නේ. මම මේ කියන්නේ පක්ෂ විතරක් මෙහාට එකතු වෙලා පමණක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයෙන්, ජේවීපී එකෙන් කොටස් කැඩිලා ආවා විතරක් නොවෙයි, ගමේ ඡන්ද දායකයොත් වෙනස් වෙලා මේ ආණ්ඩුව එක්ක එකතු වෙලා ඡන්දය දුන්නා. ඒක නිසා තමයි තුනෙන් දෙකේ බලයක් ලබා ගෙන ඒ කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ; ඒ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒක නිසා අද මහා ශක්තියක් ඇති වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මම තමුන්නාන්සේට මතක් කරන්නේ මේකයි. අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ ඔක්කොම එකතු වෙලා රටේ ඡන්ද දායකයනුත්, පහළිනුත්, ගමිනුත් මේ සියල්ල එකතු වෙලා ඉන්න නිසා අද මේ ආණ්ඩුව ශක්තිමත්, දැවැන්ත බලවේගයක් වෙලා තිබෙනවා. බණ්ඩාරනායක මැතිතුමාගෙන් පස්සේ, අවුරුදු 50කට පස්සේ මේ වාගේ දැවැන්ත බලවේගයක් මේ රටේ දේශපාලනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මුල් කර ගෙන ඇති වෙලා නැහැ. දැන් මහා දැවැන්ත බලයක් ඇති වෙලා තිබෙනවා. මෙතුමන්ලා පළාත් සභා අටත් පරාදයි. ඒ වාගේම මුස්ලිම් කොංග්‍රසයේ නායකයා මේ ආණ්ඩුව ඇතුළේ ඉඳලා එළියට බැහැලා ගිහිල්ලා මහ ඇමති වෙන්න තරග කළා. අලියාගේ ඇඟේ එල්ලිලා ගිහිල්ලා අලියා ලකුණින් තරග කළා. මොකද සිද්ධ වුණේ? එහෙම ගිහිල්ලා නැඟෙනහිර පළාතත් පරාද වුණා. මුස්ලිම් කොංග්‍රසයේ හතරෙන් තුනක් මෙහේ. හතරෙන් එකයි එහේ ඉන්නේ. හතරෙන් එකයි කැඩිලා ගියේ. හතරෙන් තුනක් මෙහේ. ඒ නිසා මේක ජාතික ආණ්ඩුවක් විධියට ශක්තිමත්ව ගොඩ නැඟී තිබෙනවා. ජාතික ආණ්ඩුවක ස්වරූපයට ගොඩ නැඟී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

මේ රජය ජාතික ආණ්ඩුවක මට්ටමට ගොඩ නැඟී තිබෙනවා. අද එක්සත් ජාතික පක්ෂයට අපේක්ෂකයෙක් සොයා ගන්න නැහැ. අද එහෙන්, මෙහෙන් හොයනවා. ඊ ළඟට, ජේවීපී එකටත් කෙනෙක් නැහැ. ඒ ගොල්ලත් කෙනෙක් හොයනවා. ඒ ගොල්ලන්ටත් දමන්න කෙනෙක් නැහැ. එක්සත් ජාතික පක්ෂ නායකයා පන්නන්න කැරලි ගහපු අවස්ථා කීයක් තිබෙනවාද? අද මේ පැත්තෙන් ඉදිරිපත් වන නායකයා ජනාධිපතිතුමායි. මේ රට වෙනුවෙන් ජාතික වශයෙන් ඉදිරිපත් වන නායකයා එතුමායි. එතුමා මේ රට බේරා ගත් නායකයායි. මේ ආණ්ඩුව කර ගෙන ආපු වැඩවල හොඳ ප්‍රතිඵල නිසා මේ රටේ දැවැන්ත ශක්තියක් ගොඩ නැඟී තිබෙනවා. ඒකට ජාත්‍යන්තර වශයෙනුත් කුමන්ත්‍රණ තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. ඇමෙරිකාවේදී ගෝඨාභය රාජපක්ෂට මොකක් හරි කරන්න පුළුවන්ද කියා බලන්න ෆොන්සේකා මහත්මයාගෙනුත් ප්‍රශ්න අහනවාලු. මේවා කුමන්ත්‍රණ. එදා යූඇන්පීයේ ලොක්කා කිව්වා, ගෝඨාභය අයින් කරලා ජානක පෙරේරා දමන්නය කියා. එතැන තමයි ජාත්‍යන්තර කුමන්ත්‍රණය තිබුණේ. දෙ ගොල්ලම එකට එකතු වෙලා තිබෙනවා. මේ සියල්ල පරාජය කර ගෙන යන්න මේ රටේ ජනතාව පෙළ ගැසී සිටිනවා. තමුන්නාන්සේලා මොන ජාති දැම්මත් මේ රට ගොඩ නඟමින් මේ ගමන යන බව මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා.

[අ. භා. 4.53]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - மக்கள் தொடர்பாடல், தகவல் அமைச்சரும் தொழில்முயற்சி அபிவிருத்தி, முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரும்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Mass Media and Information and Minister of Enterprise Development and Investment Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ ඒ ගැන අද දිනයේ වචන කිහිපයක් කතා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වනවා. විශේෂයෙන්ම, එක්සත් ජාතික පක්ෂයේත්, ජනතා විමුක්ති පෙරමුණේත් මන්ත්‍රීතුමන්ලා හුඟක් වෙලාවට කතා කළේ මේ ආර්ථිකය බංකොලොත් වෙලා තිබෙනවාය; රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ඉතාම දුර්වලය, ඒ වාගේම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්නේ රජයට අය වැයක් ඉදිරිපත් කරන්න බැරි නිසාය කියායි. විශේෂයෙන්ම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළේ මොකද කියන කාරණය ගැන බොහෝ දෙනෙක් කථා කළ නිසා මම නැවත ඒ ගැන කතා කරන්නේ නැහැ.

වසර 25කට, 30කට පසුව ප්‍රථම වතාවට නිදහස්ව මුළු රටේම ආර්ථිකය හැසිරවීමේ ක්‍රියාවලිය එක හා සමාන මට්ටමකට ගෙන ඒමට අද අපට පුළුවන් වෙලා තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ වසර හතරක කාල පරිච්ඡේදය තුළ අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ රටේ සාමය, සමාදානය ඇති කරලා මේ රට එක්තරා විධියකට එක තැනකට ගෙන එන්න. කොටින්ම කියනවා නම් කෝච්චියක් පීල්ලෙන් පිට පැනලා තිබුණු වෙලාවක, ඒ කෝච්චිය ඔසවා පීල්ලට තබන්න අපට පුළුවන්කමක් ලැබී තිබෙනවා.

අද අපි කල්පනා කරන්නේ මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කරන එක ගැනයි. එක්සත් ජාතික පක්ෂය බොහෝ විට කියන්න උත්සාහ කරන්නේ අපේ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළට වඩා ඔවුන්ගේ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ හොඳයි කියන එකයි. මම මේ අවස්ථාවේදී ඉතාමත්ම ඕනෑකමින් කියන්න කැමැතියි, මේ රටේ තිබුණු ත්‍රස්තවාදය නැති කිරීම සඳහා වූ වැඩ පිළිවෙළ කළමනාකරණය කිරීමේදීත්, ඒ වාගේම ආර්ථික සංවර්ධනය සඳහා වන යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා වන වැඩ පිළිවෙළේදීත් අප එක සමාන කාර්යක්ෂමතාවක් දක්වා තිබෙනවාය කියා. ඒක කාටවත් නැහැ කියන්න බැහැ. මෙතැන කථිකයන් ගොඩක් කතා කරපු නිසා මම ඒ ගැන කතා කරන්නේ නැහැ.

අපි විශේෂයෙන්ම ආයෝජන මණ්ඩලය ගැන කතා කළොත් 2009 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා ව්‍යාපෘති 246ක් සඳහා ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙනවා. මෙයින් 207ක් ක්‍රියාත්මක කිරීම සඳහා අපි අවසරය ලබා දීලා තිබෙනවා. එම ආයෝජනයන් ක්‍රියාත්මක වුවහොත් එම සෘජු ආයෝජනය රුපියල් බිලියන 135ක් පමණ වන බව මා කියන්නට කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අනුව නව රැකියා අවස්ථා 20,371ක් පමණ නිර්මාණය කරන්නට පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

අනෙක් පැත්තෙන් මේ රටේ අපේ ආර්ථික කළමනාකරණය පිළිබඳව ඉතා වැදගත් දර්ශකයක් තමයි, උද්ධමන වේගය පාලනය කිරීම. උද්ධමන වේගය පාලනය කිරීම 2008 ඉඳලා මේ දක්වා ගණන් බැලුවොත්, 2009 ජනවාරියේ දී සියයට 10.7 ඉඳලා මේ වන කොට සියයට 1කට ආසන්න ප්‍රමාණයක් දක්වා අපි පහළ දමා ගෙන තිබෙනවා. ඒ කියන්නේ එක අගයක් කරා අපි ඇවිල්ලා තිබෙනවා. එතකොට - [බාධා කිරීමක්] අපි කිව්වේ "single digit" ක්‍රමයකට අපි ඇවිල්ලා තිබෙනවාය කියලායි. [බාධා කිරීමක්] සියයට 5 වුණත් - [බාධා කිරීමක්] 2008 ජනවාරි වන කොට සියයට 20කට වඩා ඉහළ ගිය, 2008 අප්‍රේල් මාසය වන කොට සියයට 25කට වඩා ඉහළ ගිය උද්ධමන වේගය එවැනි අඩු අගයකට ගන්නට ලැබීම ලොකු ජයග්‍රහණයක්. [බාධා කිරීමක්] මා කථා කළේ, ඔක්තෝබර් මාසය වන කොට සියයට 1.4යි කියලායි. ඉතින් ඒ නිසා මේක එක අගයකට ලබා ගැනීමෙන් අපි ඉතාමත් වැදගත් කාර්යයක් කරලා තිබෙනවාය කියලා මා හිතනවා. උද්ධමන අනුපාතය මේ විධියට වෙනස් කර ගැනීමෙන් අපි ඉතාමත්ම විශාල ජයග්‍රහණයක් ලබලා තිබෙනවා. මේ රටේ ආර්ථිකය කඩා වැටිලා, බංකොලොත් වෙලා කියලා තමුන්නාන්සේලා අරවා මේවා කිව්වත්, උද්ධමන වේගය ක්‍රමිකව අඩු කර ගැනීමෙන් මේ රටේ ආර්ථික වර්ධනය පිළිබඳව අලුත් මතයක් ඉදිරිපත් කිරීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමාත් දන්නවා ඇති, අපි අවුරුදු හතරක් එක දිගට සියයට 6කට වඩා ආර්ථික වර්ධන වේගයක් ලබා ගත්තා. පසු ගිය අවුරුද්දේ ලෝක ආර්ථිකය කඩා වැටීම නිසා, මුළු ලෝකය පුරාම ආර්ථිකයේ සෘජු පසු බැසීමක් දකින්නට තිබෙනවා. 2009 අවුරුද්දේ පළමු වන කාර්තුව අරගෙන බැලුවොත්, ලෝකයේ රටවල් ගණනාවක ආර්ථිකය සෘණ අගයන් ගන්නේ. මා ඒ පිළිබඳව පැහැදිලි කරන්නට යන්නේ නැහැ, කාලය මදි නිසා. සිංගප්පූරුව මේ අවුරුද්දේ සෘණ සියයට 9.6ක ආර්ථික වර්ධනයක් ලබා ගන්නවා. [බාධා කිරීමක්] ඔව්, සිංගප්පූරුව. බ්‍රිතාන්‍ය සෘණ සියයට 9.3ක ආර්ථික අවපාතයකට ගමන් කරමින් සිටිනවා. දකුණු කොරියාව සෘණ සියයට 4.25යි. නමුත් මේ කාලය තුළ ඉන්දියාව සියයට 5.8කුත්, චීනය සියයට 8.6කුත් වශයෙන් ආර්ථික වර්ධන වේගය වාර්තා කරනවා. අපි 2009 අවුරුද්දේ පළමු වන කාර්තුවේ දී ඉතාමත්ම හොඳ ආර්ථික කළමනාකරණයක් හරහා සියයට 1.5ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගෙන තිබෙනවා. දෙ වන කාර්තුව සලකා බලන කොට අපි සියයට 2.5ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගෙන තිබෙනවා. එය ඒ මට්ටමෙන් පවත්වා ගෙන යන්නට අපට පුළුවන් වුණොත් අපි ඉතාම ඉහළ මට්ටමක ආර්ථික කළමනාකරණයක් පවත්වා ගනියි කියලා මා කල්පනා කරනවා.

ඒ වාගේම අපේ රැකියා වියුක්ති අනුපාතය ගත්තොත් ඉතාම පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක ආර්ථික අර්බුදය හමුවේ අපි දැකපු දෙයක් තමයි, මුළු ලෝකයේම ලක්ෂ ගණනින් රක්ෂා නැති වීම. ඇමෙරිකාවේ පමණක් නිවාස දසලක්ෂයක් බැංකුවලට සින්න වුණා. කෝටියක් පමණ රැකියා මාර්ග අහිමි වුණා. නමුත් අද අපට පුළුවන් වෙලා තිබෙනවා, තිබෙන රැකියාවන් එලෙසම පවත්වා ගනිමින් රැකියා වියුක්ති අනුපාතය අඩු කර ගැනීමට. 2009 අවුරුද්දේ පළමු වන කාර්තුවේ අපේ රැකියා වියුක්ති

අනුපාතය සියයට 5.3යි. 2009 දෙ වන කාර්තුවේ සියයට 6.3ක් දක්වා රැකියා වියුක්තිය අඩු කර ගැනීමට අපි ක්‍රියා කරලා තිබෙනවා. 2002 - 2004 දක්වා වූ එක්සත් ජාතික පක්ෂ පාලන කාලය අපි ගත්තොත්, ඔය මහා ලොකු ආර්ථික විප්ලවයන් ගැන කථා කරන වකවානුව ඇතුළේ ලංකාවේ රාජ්‍ය අංශයේ රැකියාවලට කිසිම කෙනකු බඳවා ගත්තේ නැහැ. තිබෙන ප්‍රමාණයත් අඩු කිරීම තමයි ඔවුන්ගේ උපාය මාර්ගය වුණේ. සහනාධාර කපා හැරීම, ඒ වාගේම පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා නිර්මාණය නොකිරීම ආදී කටයුතුවලින් ආර්ථිකය එක්තරා විධියකින් stagnate කර ගනිමින්, ඒ කියන්නේ එක තැනක තබා ගනිමින් ක්‍රියා කිරීමට තමයි ඔවුන් කටයුතු කළේ.

අද උපාධිධාරින් ගැන කථා කරනවා. සමහරු කියනවා, අපි උපාධිධාරින්ට රැකියා දෙන්නේ නැහැ කියලා. අපි මේ වන කොට උපාධිධාරින් 58,156කට රක්ෂා ලබා දීලා තිබෙනවා. ඉදිරියේදීත් අපි රටේ තිබෙන ඇබෑර්තු සංඛ්‍යාව මත උපාධිධාරින්ට රැකියා මාර්ග ලබා දීමට බලාපොරොත්තු වනවා; ඒ සඳහා කටයුතු කරලා තිබෙනවා. ආණ්ඩුව ඉතාමත්ම නිවැරදි තීන්දුවක් ගත්තා. විශේෂයෙන්ම මේ වසරේ සිට ගුරුවරු පත් කිරීමේදී ඒ සඳහා විශේෂයෙන්ම උපාධිධාරින්ට ඉඩකඩ ලබා දිය යුතුයි කියන අදහස ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව 2004 වසරේ සිට මේ දක්වා 2,61,897ක් රජයේ රැකියාවලට අපි බඳවා ගෙන තිබෙනවා. රැකියා සැපයීම ඉතාමත්ම වැදගත් අංශයක් හැටියට අපි සලකනවා. ඒ අංශයෙනුත් අපේ කාර්යක්ෂමතාව අපි පෙන්වා තිබෙනවා. ඒ වාගේම අය වැය හිඟය අවම මට්ටමක පවත්වා ගැනීම සඳහා අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ඉතා හොඳින් කර තිබෙනවා. විශේෂයෙන් වර්තන ගිණුමේ ශේෂය 2003 දී සෘණ 3.3යි. 2004 දී සෘණ 3.9යි. 2005 දී සෘණ 2.7යි. 2006 දී සෘණ 2.9යි. 2007 දී සෘණ 1.6යි. 2008 දී එය ධන 0.9ක් දක්වා වර්ධනය කිරීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. අය වැය හිඟයත් 2008 වන විට කලින් තිබුණු වර්ෂය හා සසඳන විට සෘණ 7.7 ඉඳලා සෘණ 6.7 දක්වා අඩු කර ගැනීමට අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම පුනරාවර්තන වියදම් දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සලකා බලන විට අප දිගින් දිගටම අඩු කර ගනිමින් ඉන්නවා. 2003 දී සියයට 19ක් වුණු පුනරාවර්තන වියදම් - දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට - 2008 වන විට සියයට 16.2ක් දක්වා අඩු කර ගැනීමට අපි කටයුතු කර තිබෙන බව මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. ප්‍රාග්ධන වියදම්, විශේෂයෙන්ම අපේ ගම්බද පාරවල් ආදිය හදන්න, ඒ වාගේම වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා වන ප්‍රාග්ධන වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත් විට 2003 දී සියයට 5ක් පමණයි. 2008 වන විට අපි එය සියයට 7.6ක් දක්වා වර්ධනය කර තිබෙනවා. ඒ කියන්නේ මෙවැනි ආර්ථික ප්‍රශ්න ලෝකය පුරා තිබියදී අපේ ගම්බද ප්‍රදේශවලත්, නගර බද ප්‍රදේශවලත් යටිතල පහසුකම් වර්ධනය කිරීමේ උපරිම වේගයක් කරා අපි ළං වෙලා තිබෙනවා. ඒ නිසා මේ අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදය අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයට නිවැරදි දත්තයන් සමඟ කථා කළොත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අපේ දුබලකම් තිබෙනවාය කියා කොයි විධියකටවත් කොහේවත් තැනක කියන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ කියා මා විශ්වාස කරනවා.

බැංකු පොලී අනුපාතය අපි ස්ථාවර මට්ටමකට පත් කර ගෙන තිබෙනවා. මේ අවුරුද්දේ බැංකු පොලී අනුපාතය අපි ඉතාම පහළ මට්ටමකට ගෙනැල්ලා මේ රටේ ව්‍යාපාරිකයන්ට ආයෝජනය සඳහා වැඩි අවස්ථාවක් අපි ලබා දෙනවා. අපි සාමාන්‍යයෙන් බැංකු පොලී අනුපාතය ගණන් හදා තිබෙන්නේ සියයට 8 සිට සියයට 12 දක්වා ප්‍රමාණයක තබා ගන්නයි. එතකොට ඒක මේ රටේ ව්‍යාපාරිකයන්ට, එහෙම නැත්නම් කුඩා මට්ටමේ ආයෝජනය කරන අයට ඉතාම හොඳයි. මේ තත්ත්වයන් අපට ලබා ගන්න පුළුවන් වෙයි කියා පැහැදිලිවම අපට පෙනෙනවා. අපෙන් ණයක් අරගෙන ඒක ආපසු ගෙවන පොලී ප්‍රතිශතය සියයට 8 සිට සියයට 12 දක්වා මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම ඉතාමත්ම හොඳ දෙයක්ය කියා මා හිතනවා. එයත් ක්‍රමානුකූලවයි අඩු වන්නේ. ක්‍රමානුකූලව අඩු වෙමින් තමයි ගමන් කර තිබෙන්නේ.

ඒ වාගේම අපට ලොකු චෝදනාවක් ආවා, අපේ ආර්ථික කළමනාකරණයේදී අපේ විදේශ සංචිතවල අඩු පාඩුවක් දකින්න තිබෙනවාය කියා. එහෙම අඩු පාඩුවක් තිබුණා. විශේෂයෙන් ත්‍රස්තවාදය තීව්‍ර අවස්ථාවේ දී වියහියදම් නිසා අපේ යම් අඩු පාඩුවක් වුණත් මේ වන කොට ඇමෙරිකන් ඩොලර් බිලියන 5,000ක මට්ටම දක්වා වර්ධනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු දේවල් අපි කරන්නේ මේ රටේ සමාජ සුබසාධන සහ ආදායම් ප්‍රතිව්‍යාප්ත වැඩසටහන් දියත් කරන අතරේදීයි. අපි සමෘද්ධි සහනාධාරය අඩු කරලා නැහැ. අපි අධ්‍යාපනය නොමිලයේ ලබා දෙන එකේ අඩු පාඩුවක් කරලා නැහැ. ඒ වාගේම අපි සෞඛ්‍ය සේවාවේ අඩු පාඩුවක් කරලා නැහැ. පොහොර සහනාධාරයේ අඩුවක් කරලා නැහැ. ඒ සියල්ලම කරන ගමන් තමයි අපි මේ ආදායම් ප්‍රතිව්‍යාප්ත වැඩ පිළිවෙළ කරන්නේ. ඒ වාගේම මේ නිසාම අපි ඒ ගොල්ලන්ට කියනවා, මහජන සුබසාධනය සඳහා - අමතර සුබසාධනය සඳහා - අපි වැය කළ මුදල අපි ක්‍රමානුකූලව වැඩි කර තිබෙනවාය කියා. අධ්‍යාපනයට කරන වියදම 2008 වන විට රුපියල් මිලියන 1,10,178 දක්වා වැඩි කර තිබෙනවා. ඊට කලින් වසරේ එය රුපියල් දසලක්ෂ 92,540යි. සෞඛ්‍ය සේවය වෙනුවෙන් 2007 දී මිලියන 68,702යි. එය 2008 දී 79,846යි. සුබසාධනය සඳහා 2007 දී රුපියල් මිලියන 91,747යි. 2008 දී රුපියල් මිලියන 97,315යි. ඒ වාගේම ප්‍රජා සේවා සඳහා 2007 දී රුපියල් මිලියන 23,787 යි. 2008 දී එය රුපියල් මිලියන 27,795 දක්වා වැඩි කිරීමට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. රාජ්‍ය සේවයේ වැටුප් විශාල මට්ටමකින් අපි වැඩි කෙරුවා. ඒක නැහැ කියලා කිසි කෙනකුට කියන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමා හැම වසරකම වාගේ රාජ්‍ය සේවක වැටුප් ප්‍රමාණයන් උපරිම තලයක් දක්වා වැඩි කරලා තිබෙනවා. මම ඒක කියන්නම්. 2004 දී රාජ්‍ය සේවයේ වැටුප් සඳහා තිබුණේ රුපියල් මිලියන 30,246 යි. 2008 වන කොට එය රුපියල් මිලියන 66,402ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. 2004 දී ආරක්ෂක සේවාවන්වල වැටුප් සඳහා රුපියල් මිලියන 41,486යි. 2008 වන කොට එය රුපියල් මිලියන 88,979ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. විශ්‍රාම වැටුප් සඳහා 2004 දී රුපියල් මිලියන 36,444යි. 2008 වන කොට එය රුපියල් මිලියන 73,000 දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඒ වාගේමයි, අපේ විදේශ ප්‍රතිපත්ති. අපි මෙතෙක් කල් සම්බන්ධතා පැවැති විදේශ රටවල් සමඟ සම්බන්ධතා වැඩි කර ගත්තා වාගේම විදේශ සම්බන්ධතා ඇති කර ගත්තු අලුත් රටවල් රාශියක් තිබෙනවා. මෙය, අපේ විදේශ ඇමතිතුමාගේ, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ විදේශ ප්‍රතිපත්තියේ ඉතා විශිෂ්ට වකවානුවක් කියලා මම හිතනවා. කවුරු චෝදනා කෙරුවත්, විශේෂයෙන් ඉරානය සමඟ, මියන්මාරය සමඟ, චීනය සමඟ, ඉන්දියාව සමඟ, පාකිස්තානය සමඟ වාගේම වියට්නාමය වැනි රටවල් සමඟත් වෙන දාට වඩා වැඩියෙන් සම්බන්ධතා ඇති කිරීමට අපි විශාල වෙහෙසක් දරලා කටයුතු කරලා තිබෙනවා. නොබැඳි රටක් හැටියට අපි සෑම රටක් සමඟම අපේ විදේශ ප්‍රතිපත්ති එක සමානව පවත්වා ගෙන යන අතරතුර, මෙතෙක් කල් සබඳතා නොපැවැත්වූ රටවල් ගණනාවක් සමඟ මිත්‍ර සබඳතා පැවැත් වීමෙන් අපේ රටේ ආර්ථික වර්ධනයට විශාල මෙහෙයක් සිදු වෙලා තිබෙනවා කියන එක අමතක කරන්න නරකයි.

1952 දී ඇති කර ගත් චීන-ශ්‍රී ලංකා රබර්-සහල් ගිවිසුමත් ආන්දෝලනාත්මක ගිවිසුමක් බව අපි දන්නවා. නමුත් අපි එවැනි රටවල් සමඟ මිත්‍ර සබඳතා ඇති කර ගැනීමට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් රුසියාව සමඟ ඇති කර ගත් මිත්‍රත්වයේ විශාල වර්ධනයක් දකින්නට තිබෙනවා. ඒ නිසා සාම්ප්‍රදායික වන රටවල් සමඟ සහ සාම්ප්‍රදායික නොවන රටවල් සමඟ එකතු වීමෙන් අපේ විදේශ ප්‍රතිපත්තියේ විශාල වෙනසක් අපි නිර්මාණය කරලා තිබෙනවා.

නොයෙකුත් අයට නොයෙකුත් දේවල් කියන්න පුළුවන්. මම අද දැක්කා, විදේශ කටයුතු ඇමතිතුමාටත් දොස් කියනවා. නමුත් මේ කාලය තුළ විදේශ කටයුතු ඇමතිතුමා හැටියට රටවල්

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

විශාල ගණනාවකට ගිහිල්ලා කරන ලද දේවල ප්‍රතිඵල තිබෙනවා. එක ප්‍රතිඵලයක් තමයි, මේ රටට විදුලි බලය ලබා දෙන්න අපට ඉරානයෙන් දැවැන්ත ආධාර මුදලක් ලැබීම. ඉරානයෙන් ලැබෙන මේ මුදලත් සමඟ අපට පුළුවන් වනවා මුළු ලංකාවේ සෑම නිවාසයකටම 2011 වන කොට විදුලි බලය සපයලා අවසන් කරන්න. චීන රජයත් සමඟ අපේ තිබෙන ගිවිසුම අනුව අපි දැවැන්ත ගල් අඟුරු විදුලි බලාගාරයක් හදනවා. ඒ අනුව අපි වර්ෂ කීපයක් ඇතුළත මෙගාවොට් 300 සිට මෙගාවොට් 900 දක්වා නව විදුලිබල ධාරිතාවක් විදුලි පද්ධතියට එකතු කරනවා. එක්සත් ජාතික පක්ෂය ඒක නවත්වලා තිබුණේ; අත හැරලා තිබුණේ.

ඒ වාගේමයි ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතියත්. එක්සත් ජාතික පක්ෂයේ විදුලිබල හා බලශක්ති ඇමතිවරයා වෙලා හිටපු කරු ජයසූරිය මහත්තයා ඒක ආරම්භ කරන්න ආරාධනා පත්‍රයත් ගහලා, cancel කෙරුවා. අද වන විට ඒ වැඩ හුඟක් දුරට නිමා වෙලා තිබෙනවා. එයින් මේ අවුරුද්දේ මෙගාවොට් 150ක් අපේ විදුලි ධාරිතාවට එකතු වනවා. ඒ අනුව ඔබ පිළිගන්නවා ඇති, මේ රටේ සංවර්ධනය වෙනුවෙන් අපි කොයි තරම් දුරට කටයුතු කරනවාද කියලා.

වසර 50ක් තුළ මේ රටේ සිටි මහා දැවැන්ත ආර්ථික විශේෂඥයන්ට කරන්න බැරි වුණු හම්බන්තොට වරාය අපි චීන ආධාර යටතේ නිමා කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ චීන ආධාර යටතේ අපි මේ කටයුත්ත නිමා කරපුවාම ඒ මුහුදු මාර්ගයේ නැව් 200ක් දවසකට ගමන් කරනවා නම් අඩු ගණනේ එයින් 10ක් අපේ රටට පැමිණියොත් විශාල ආර්ථික වර්ධනයකට ඉඩකඩ ලැබෙනවාය කියලා මම හිතනවා.

තුන් වන කාරණාව මේකයි. ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදුව සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන වැඩ පිළිවෙළකට අපි ඉරානය සමඟ කටයුතු කරමින් ඉන්නවා. අපේ විදේශ ප්‍රතිපත්තිය නිසා සාම්ප්‍රදායික නොවන මිත්‍ර රටවල් රාශියක් අපට සම්බන්ධ වෙලා වැඩ කරනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ඉතාමත්ම ඉහළ මට්ටමක එකමුතුභාවයෙන් අපි කටයුතු කරලා තිබෙන බව. විශේෂයෙන් අපි ලිබියාව සමඟ ගනුදෙනු කරමින් ඉන්නවා. ඒ අනුව අපි මෙතෙක් කල් ගනුදෙනු කරපු බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඇමෙරිකාව වාගේ රටවල් සමඟ ගනුදෙනු කරනවා වාගේම නොබැඳි ප්‍රතිපත්තියක් යටතේ අනෙකුත් රටවල් සමඟත් කටයුතු කරමින් විදේශ ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට අපට හැකි වෙලා තිබෙනවා. ඒ නිසාම අපේ දේශපාලන ගමන් මඟෙහිත් විශාල වෙනසක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ප්‍රථම වතාවට තුනෙන් දෙකක බහුතරයක් ලබා ගැනීමට අපේ පළාත් සභාවලට පුළුවන් වෙලා තිබෙනවා. අපි ඇති කර තිබෙන වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව ජනතාව තුළට ගලා ගෙන යනවාය කියන එකත්, ජනතාව අපේ ප්‍රතිපත්ති පිළිබඳව එකඟතාවක් දක්වනවාය කියන එකත් ඒකට ප්‍රධාන හේතුවක්. මේ සමානුපාතික නියෝජන ක්‍රමය, දකුණට ගෙන ගිහින් ඔර්ලෝසුවේ බට්ටා නවත්වන්න ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හදපු ක්‍රමය, වම් පැත්තට ගෙනැල්ලා නවත්වා ගැනීමට අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මොන මැතිවරණය ආවත්, කවුරු තරග කරන්න ආවත්, මොන තරම් ශබ්ද කළත් අන්තිමට ඒවා බොල් හඬවල් බවට පත් වෙලා, නිශ්ශබ්දතාව සහිතව ඊ ළඟ දශකයේ අතිගරු ජනාධිපතිතුමා යටතේ අපේ සන්ධානය තුළින් රටේ උපරිම සංවර්ධනය ඇති කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්න කටයුතු සිදු වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒක තමයි අපේ බලාපොරොත්තුව. අපි මේ වන විට එක්සත් ජාතික පක්ෂයේ වැඩි ඡන්ද ප්‍රමාණය 2,96,980කට අඩු කරලා තිබෙනවා. පොඩි ගණනක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය ඒකට උත්තර දෙන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමය තුළින් පළාත් සභාවල තුනෙන් දෙකක බලයක් ලබා ගැනීම වාගේම, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂයේ අනෙකුත් පක්ෂවල ඡන්ද ප්‍රමාණයත් අඩු වෙලා තිබෙන නිසා ඒක සිදු වුණේ කොහොමද කියලා බලන්න දැන් ඒ ගොල්ලන්ට අභ්‍යන්තර සාකච්ඡා පවත්වන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක සිදු වන්න අපේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ ගැට ගැහුණු ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ඉමහත් ලෙස ඉවහල් වුණාය කියලා අපි කල්පනා කරනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, යුද්ධයෙන් විනාශ වුණු උතුරු නැඟෙනහිර සංවර්ධනය දැන් අපි විශාල වශයෙන් කර ගෙන යන බව. ඒ ගැන මම එක උදාහරණයයි කියන්නේ. ඊයේ පෙරේදා අපි හදපු කින්නියා පාලම මේ රටේ තිබෙන දැවැන්තම, දිගම පාලම බවට සනිටුහන් වනවා. නැඟෙනහිර පළාත තුළ සිදු කරන දැවැන්ත සංවර්ධනය, උතුරේ ඇති කරන දැවැන්ත සංවර්ධනය සඳහා මේ රටේ කිසිම කාලයක නොයෙදූ තරම් මුදල් ප්‍රමාණයක් යොද වන්නට අපි කල්පනා කරනවා.

අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට යටත් වුණා කියලා විපක්ෂයෙන් තවත් චෝදනාවක් කරනවා. මූල්‍ය අරමුදල සමඟ කිසි යම් හෝ ආකාරයක කොන්දේසියකට පැමිණිලා නැහැ කියන එක අපි ඉතා පැහැදිලිව, වග කීමෙන්, ඉතා ඕනෑකමින් මේ පාර්ලිමේන්තුවට දන්වා සිටිනවා. අපට එවැනි කොන්දේසි දමලාත් නැහැ. 1970 දශකයේ තිබුණු ලෝකයමයි අදත් තිබෙන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කොන්දේසි ඉදිරිපත් කරන්න ඕනෑ කියලා කවුරුත් කල්පනා කරනවා. එහෙම එකක් නැහැ. ලෝකයේ ආර්ථික අවපාතයත් සමඟ කොන්දේසි සහිත ණය දීමේ ක්‍රමයත් සම්පූර්ණයෙන් ඉවත් වෙලා, රටවල ආර්ථිකය උස්සන්න පුළුවන් ක්‍රමයක් කරා එය වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා තමන්ගේ දේශපාලන කටයුතු කරමින්, නිවැරදි ලෙස ප්‍රතිපත්ති ඉටු කිරීමට ඒ රටවලට හොඳ වටපිටාවක් ලැබිලා තිබෙනවා.

අපි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන්නේ ඊ ළඟ අවුරුද්දේ පවත්වන මැතිවරණයකින් ඇති වන නව පාර්ලිමේන්තුවකට තමන්ගේ නව ප්‍රතිපත්ති සමඟ නව අය වැයක් ඉදිරිපත් කිරීමට ඉඩ දීමටයි. මේ අතුරු සම්මත ගිණුම සම්මත වීමෙන් ඉදිරි මාස හතර සඳහා අපට මුදල් හදල් ලැබෙනවා. මේ රටේ ජනතාවගේ සුබ සිද්ධිය, ජනතාවගේ ඉදිරි ආර්ථික සංවර්ධන වේගය ලබා ගැනීමට අවශ්‍ය කරන සෑම උපාය මාර්ගයක්ම ඒ තුළ අන්තර්ගත බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමා - පැමිණ නැත.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි "විවාදය දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2009 නොවැම්බර් 05 වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.***
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2009 நவம்பர் 05, வியாழக்கிழமை மீளத் தொடங்கும்.*
*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Thursday, 05th November,2009.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

# ඇමෙරිකා එක්සත් ජනපදය ජනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් කරුණු විමසීමට උත්සාහ කිරීම
## ஐக்கிய அமெரிக்க இராச்சியம் ஜெனரல் சரத் பொன்சேகாவிடம் விசாரணை செய்ய முயற்சித்தமை
## ATTEMPTS TO QUESTION GENERAL SARATH FONSEKA BY UNITED STATES OF AMERICA

**ගරු මුසම්මිල් මොහොමඩ් මහතා**
(மாண்புமிகு முஸம்மில் மொஹமட்)
(The Hon. Mussammil Mohamed)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"පසුගිය දා ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචාරයක නිරතව සිටි ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානී සරත් ෆොන්සේකා මහතාගෙන් ඇමෙරිකාවේ අභ්‍යන්තර ආරක්ෂක කටයුතු දෙපාර්තමේන්තුව විසින් ගරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධයෙන් විමසීමක් කරන ලදී.

ඒ අනුව සරත් ෆොන්සේකා මහතාව එම දෙපාර්තමේන්තුව විසින් සම්මුඛ සාකච්ඡාවක් සඳහා කැඳවා තිබුණි. මෙමඟින් ඇමෙරිකා එක්සත් ජනපදය උත්සාහ දරන්නේ කොටි ත්‍රස්තවාදය පරාජය වෙනුවෙන් උර දුන් සේනාධිනායක හා ආරක්ෂක ලේකම්ට විරුද්ධව චෝදනා එල්ල කර ඔවුන්ට එරෙහිව ක්‍රියා මාර්ග තේරීම බව මෙමඟින් පැහැදිලිය.

ඉහත සඳහන් පියවර දැඩි ලෙස හෙළා දකින මෙම පාර්ලිමේන්තුව කවර ලෙසකින්වත් ත්‍රස්තවාදයට එරෙහිව ගනු ලබන පියවරවලට එරෙහිව එක්සත් ජනපදය ගනු ලබන සෑම පියවරක්ම දැඩි ලෙසට හෙළා දකින බව මෙම පාර්ලිමේන්තුවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ දැවැන්ත ආන්දෝලනයකට තුඩු දුන් මේ ප්‍රශ්නය, මේ රටේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන්ගේ අභිමානය සම්බන්ධයෙන්, ඒ වාගේම අපේ රටේ අභිමානය සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නයක් හැටියට අපි දකිනවා. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් හිතුවක්කාර ලෙස, ඒ වාගේම සදාචාර විරෝධි ලෙස ඔවුන්ගේ වුවමනාවන් සඳහා අප වැනි රටකට මෙවැනි බලපෑම් එල්ල කිරීම අද වාගේම සදාචාර විරෝධී ලෙස ඔවුන්ගේ වුවමනාවන් සඳහා අපවැනි රටකට මෙවැනි බලපෑම් එල්ල කිරීම අද ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන, ඒ වාගේම මානව හිමිකම් අගයන කිසිම රටක් අනුමත නොකරන දෙයක්. එය රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වන ආකාරයන්ට පටහැනියි. ඒ නිසා අපි විශ්වාස කරනවා, එක්සත් ජනපදය මේ කරන ලද ක්‍රියාව මුළුමහත් ලෝකයටම දෙන ලද වැරැදි ආදර්ශයක් බව. ඒ නිසා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, අපේ රටේ අභිමානය සම්බන්ධයෙන් කරන ලද මේ ක්‍රියාව දැඩි ලෙස හෙළා දකිමින් පාර්ලිමේන්තුවට මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර කටයුතු හා ආගමන විගමන දෙපාර්තමේන්තුව පසු ගිය දා ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම්වරයාට එල්ල වී ඇතැයි කියන ඊනියා මානව හිමිකම් චෝදනා ගැන ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාගෙන් යම් කරුණු ප්‍රමාණයක් දැන ගන්න සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න අවශ්‍යයි කියලා දැනුම් දී තිබුණා. ඒ ආන්දෝලනයට ලක් වෙච්ච ප්‍රශ්නය පිළිබඳව ගරු මුසම්මිල් මොහොමඩ් මන්ත්‍රීතුමා මේ සභාවට ගෙනාපු මේ යෝජනාව ස්ථිර කරන්න මා පළමුවෙන්ම කැමැතියි.



ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, මිනී මරු ත්‍රස්තවාදය පරාජයට පත් කිරීමේ සටනට බටහිර රටවල් සහයෝගය නොදුන්නු බව. ඒ නිසාම ඒ අය බලනවා, ඒ සටනට පුරෝගාමිත්වය ගත්තු අයට - සේනාධිනායකයා වන්න පුළුවන්, ආරක්ෂක ලේකම්වරයා වන්න පුළුවන්, ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් වන්න පුළුවන් - එරෙහිව ගත හැකි පියවර ඔවුන්ගේ පැත්තෙන් ගන්න. මේ සඳහා තමයි, ආරක්ෂක ලේකම්වරයාට එල්ල වී ඇතැයි කියන ඊනියා චෝදනා පිළිබඳව සම්මුඛ සාකච්ඡාවක් ඇමෙරිකා එක්සත් ජනපදයට ගිය අවස්ථාවේදී ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා සමඟ පවත්වන්න ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර කටයුතු හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පියවර ගෙන තිබුණේ. මේ ප්‍රශ්නය මතු වෙච්ච වෙලාවේ දැනට ශ්‍රී ලංකා රජය අනුගමනය කර තිබෙන ක්‍රියාමාර්ගයට අනුව අපට දැන ගන්න ලැබිලා තිබෙනවා, සරත් ෆොන්සේකා මැතිතුමා රජය විසින් දුන්නු උපදෙස් අනුව ඒ සම්මුඛ සාකච්ඡාවට සහභාගී නොවී නැවත ශ්‍රී ලංකාව බලා පැමිණීමට දැන් කටයුතු කර තිබෙනවාය කියා. ඇත්ත වශයෙන්ම කළ යුතුව තිබුණු නිවැරැදිම පියවර රජය විසින් අර ගෙන තිබෙන බව ඒකෙන් පැහැදිලිව පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මාතෘකාව වන්නේ මේක නොවෙයි. මේ ක්‍රියාදාමය මඟින් ඉතාම පැහැදිලිව පෙනෙන දෙයක් තිබෙනවා. සමහරු පහු ගිය කාලයේ කට මැත දෙඩෙව්වා, ලෝකයේ යුද අපරාධ අධිකරණයට මේ රටේ රණ විරුවන් ගෙන යන්න බැහැ, සේනාධිනායකයා ගෙන යන්න බැහැ, එහෙම ගිවිසුම් අත්සන් කරලා නැහැ, ඒ නිසා එහෙම තර්ජනයක් නැහැ, නිකම් බොරු කියන්න එපා කියලා. යුද අපරාධ අධිකරණයට ගෙන යන්න පුළුවන්ද බැරිද කියන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. යුද අපරාධ අධිකරණයට ගෙන යන්න පුළුවන් වුණත්, බැරි වුණත් මේ රටේ ආරක්ෂක ප්‍රධානීන් දඩයම් කරන්න හදන එකයි ප්‍රශ්නය. මේ රටේ ආරක්ෂක ලේකම්වරයා ගැන මොකටද ජෙනරාල් ෆොන්සේකාගෙන් අහන්නේ? ආරක්ෂක ලේකම්වරයාට එල්ල වෙලා තිබෙන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් චෝදනා ගැන මොනවාද එතුමාගෙන් අහන්නේ? එහෙම අහන එකෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? ඒ මඟින් බලාපොරොත්තු වන්නේ මේ මහා සටනට නායකත්වය දුන්නු බලවේගවලට එරෙහිව, ඒ සටනට මූලිකත්වය දුන්නු, පුරෝගාමිත්වය දුන්නු උදවියට එරෙහිව ක්‍රියාමාර්ග ඉදිරියට ගන්න නොවෙයිද? එහෙම නොවෙයි නම් මොකටද එවැනි සම්මුඛ සාකච්ඡාවක් ගෙනෙන්නේ? ඒ අනුව පැහැදිලිව පෙනෙනවා, ඒ මිනී මරු ත්‍රස්තවාදය පරාජයට පත් කිරීම හේතුවෙන් මේ විජාතික දුෂ්ට බලවේගය කෝපයට පත් වෙලා, ඉතාම වියරුවට පත් වෙලා මේ රටට හතුරු මෙහෙයුම, මේ ජාතියට හතුරු මෙහෙයුම අඛණ්ඩව ඉදිරියට ගෙන යන බව. ඒ නිසා තමයි අපි විශ්වාස කරන්නේ මේ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සෑම දේශපාලන ව්‍යාපාරයක්ම, සෑම මහජන නියෝජිතයෙක්ම - ඇමෙරිකා එක්සත් ජනපදය වෙන්න පුළුවන්, වෙනත් බටහිර කුමන රාජ්‍යයක් හෝ වෙන්න පුළුවන් - මේ රටේ මිනී මරු ත්‍රස්තවාදය පරද්දන්න කටයුතු කරපු ඒ ආරක්ෂක අංශ ප්‍රධානීන්ට එරෙහිව, ආරක්ෂක ලේකම්වරයා ඇතුළු ඒ සියලු දෙනාට එරෙහිව, මේ ගෙන යන ඒ උත්සාහයට එරෙහිව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හැටියට අපි අපේ විරෝධත්වය, පිළිකුල ප්‍රකාශයට පත් කිරීම අත්‍යවශ්‍යයි කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ මඟින් පැහැදිලිව පේනවා, ඒ අන්තර්ජාතික බලවේග තව දුරටත් මේ රටට එරෙහිව තමන්ගේ බලපෑම, තමන්ගේ ක්‍රියා මාර්ග දියත් කරන්න උත්සාහ කරන බව. පසු ගිය කාලයේ එල්ල කරපු විවිධ චෝදනාවලින් මේක පෙනුණා. ඒ වාගේම සමහර රූපවාහිනී නාළිකා හමුදාවට විරුද්ධ ගොතලා පළ කරපු මාධ්‍ය වාර්තාවලින් මේක පෙනුණා. හිලරි ක්ලින්ටන් නෝනාගේ ප්‍රකාශයෙන් මේක පෙනුණා. ඒ වාගේම මේ අවස්ථාවේදී මේ සිද්ධියෙනුත් නැවත

[ගරු විමල් වීරවංශ මහතා]

මේ ප්‍රවණතාව ඉතාම මැනැවින් පැහැදිලිව පේනවා. ඒ අනුව මේ රටේ සියලු ප්‍රගතිශීලී දේශ මාමක බලවේග කල්පනා කර බලන්න ඕනෑ, මේ තත්ත්වයට කොහොමද මුහුණ දෙන්නේ කියලා. අපි ජාතියක් හැටියට භේද බින්න වුණොත් අසමගි වුණොත් මේ අන්තර්ජාතිකව එන බලපෑමට මුහුණ දෙන්න පුළුවන්ද? මේ කොටු කරලා, වට කරලා පහර දෙන්න හදන්නේ මේ රටට මිස වෙන කාටවත් නොවෙයි. මේ ගහන්නේ මේ රටට සාමය උදා වීම ගැන වේදනාවට පත් වෙච්ච, වෛරයට පත් වෙච්ච බලවේග මිස වෙන කවුරුවත් නොවෙයි. ඒ නිසා තමයි අපි ඉතාම පැහැදිලිව කියන්නේ, අන්තර්ජාතිකව ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළුව ඒ බලවේග දියත් කරන මේ ප්‍රහාරයට එරෙහිව, මේ රටට හතුරු මේ ක්‍රියාදාමයට එරෙහිව ජාතියක් හැටියට සමගි සම්පන්නව මුහුණ දීම අත්‍යවශ්‍යයි කියලා. එහෙම නැතුව ආණ්ඩුව මොනවාද කළේ කියලා බලා, ආණ්ඩුවයි හිටපු යුද හමුදාපතිවරයායි කොටවලා ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්ද බලා, එහෙම නැත්නම් ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ව කොටවලා ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්ද කියලා බලා, ඒ කාව හරි පොදු අපේක්ෂකයෙක් කර ගන්න පුළුවන්ද කියලා බලා, තමන්ට අපේක්ෂකයෙක් නැති හන්දා නැති අපේක්ෂකයෙක්ව මේ කවුරු හරි අතරින් මවා ගන්න පුළුවන්ද කියලා බලා පටු ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ අර්ථයෙන් භේද බින්නතාව වර්ධනය කළොත්, ඒ කුළල් කා ගැනීම රෝපණය කළොත්, ඒ බීජ වැපුරුවොත් ඒකේ වාසිය නිසැක වශයෙන්ම ගන්නේ මේ රටට හතුරු මේ දුෂ්ට අන්තර්ජාතික බලවේග. ඒ නිසා තමයි අපි විශ්වාස කරන්නේ අඩු ගානේ මේ සිද්ධියෙන්වත් අත් දැකීමක් අරගෙන, මේ සිද්ධියෙන්වත් මොළය පාදා ගෙන කටයුතු කළ යුතුයි කියලා. දැන් මේ සිද්ධිය ඇති වෙච්ච වෙලාවේත් සමහරු උත්සාහ කළා, ආණ්ඩුව මොනවාද කරන්නේ, සරත් ෆොන්සේකා මහත්මයාගෙන් ප්‍රශ්න කරන්න ඉඩ දීලා ආණ්ඩුව බලා ගෙන ඉන්නවාද කියා වැරදි මතයක් ගොඩ නඟන්න. විදේශ කටයුතු ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මා එතුමාගෙන් දැන ගන්න කැමැතියි, මෙයට අදාළ සියලු කාරණා. සරත් ෆොන්සේකා මහතාට අභ්‍යන්තර කටයුතු හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරින් මේ දැනුම් දීම කරලා පැය කීයකට පස්සේද ශ්‍රී ලංකා රජය මේ ගැන දැන ගත්තේ, දැන ගත්තාට පස්සේ ශ්‍රී ලංකා රජය ගත්ත පියවර මොනවාද, ඇමෙරිකා එක්සත් ජනපදයේ ක්‍රියාදාමයට එරෙහිව ගත්ත පියවර මොනවාද කියලා මේ සභාවට දැනුම් දීමේ වග කීමක් එතුමාට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හුදකලා සිද්ධියේදී මේ සිද්ධිය විතරක්ම නොවෙයි අපි දකින්නේ. මේ සිද්ධිය හරහා පෙන්වන ඇත්තක් තිබෙනවා. ඒ තමයි ත්‍රස්තවාදය පරාජයට පත් කළාට ඒ පිටුපස හිටපු අන්තර්ජාතික බලවේග තමන්ගේ මෙහෙයුම - ශ්‍රී ලංකාවට හතුරු මෙහෙයුම - නතර කරලා නැහැ කියන එක. ඒ අය අද බලනවා, ෆොන්සේකා මහත්තයාගෙන් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගැන තොරතුරු අහ ගන්න. හෙට බලයි, ෆොන්සේකා මහත්තයා ගැන තව කෙනෙකුගෙන් තොරතුරු අහ ගන්න. මේ විධියට තොරතුරු එකතු කරලා මේ සූදානම් වෙන්නේ මොකාටද කියන ප්‍රශ්නය අපි බලන්න ඕනෑ. පක්ෂ පාට භේදයකින් තොරව අපි එක දෙයක් විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මිනී මරු ත්‍රස්තවාදය පරද්දලා මේ රටට සාමය ගෙන එන්න කැප වුණු ඒ සියලු දෙනා වෙනුවෙන්ම මුළුමහත් ජාතියට තිබෙනවා, අනිවාර්ය යුතුකමක් හා වග කීමක්. ඒ සියලු දෙනාම රැක ගන්න, ඒ අයට හතුරුව එන අන්තර්ජාතික ඕනෑම මෙහෙයුමකට එරෙහිව ක්‍රියා මාර්ග තෝරන්න, ඒ වෙනුවෙන් පෙනී සිටින්න පක්ෂ භේදයකින් තොරව, පාට භේදයකින් තොරව මුළුමහත් ජාතියටම විශාල වග කීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයත් තමන්ගේ පටු දේශපාලන අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා යොදා ගන්න සමහරු බලා ගෙන ඉන්නවා. ඒ අය බලනවා, මෙතැනදීත් සරත් ෆොන්සේකා මහතායි, ආණ්ඩුවයි අතර ගැටුමක් තිබෙනවාය කියලා පෙන්වන්න. ගැටුමක් තිබෙනවා නම් ඒ ගැටුම පාවිච්චි කරලා, නැති ගැටුමක් හදලා හරි, ඇති ගැටුමක් මවලා හරි, ඒ ගැටුම තිබුණත් නැතත් ඒක පාවිච්චි කරලා, ඒක වවා ගෙන කාලා ඒකෙන් තමන්ගේ දේශපාලන පනම් අට බේරා ගන්න බලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ පාපතර ව්‍යායාමය, මේ රටට හතුරු බලවත්ම ක්‍රියා දාමය කියා අපි තේරුම් ගන්න ඕනෑ. සංඝ සමාජය භේදභින්න කරන එක අපි කියනවා, මහා පාප කර්මයක් කියා. ඒ වාගේම තමයි මේ මහා සංග්‍රාමයට නායකත්වය දුන්න සේනාධි නායකයා ඇතුළු ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්, ආරක්ෂක ලේකම්වරයා ඇතුළු ඒ සියලු දෙනා භේද භින්න කරලා, කොටවලා ඒකෙන් කවුරු හරි වාසියක් ගන්න හදනවා නම් එය මේ නූතන යුගයේ, මේ මොහොතේ මහා පාප කර්මයක් මිසක් වෙන දෙයක් නොවෙයි කියන එක. ඒ මඟින් තමන්ගේ පාරාජිකා වූ දේශපාලන ඉරණම බේරා ගන්න හදනවා නම්, හතර ගාතෙන් වැටිලා ඉන්න තමන්ගේ දේශපාලන පන නළ ඒ මඟින් රැක බලා ගන්න හදනවා නම්, ඒක තරම් ද්‍රෝහිකමක් තවත් ඉතුරු වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි ඉතාම පැහැදිලිව තේරුම් ගත යුතු වැදගත් දෙයක් තිබෙනවා. ඒ තමයි මේ රට. මේ, ඉදිරියේ මහා මැතිවරණ ක්‍රියාදාමයකට යොමු වන්න තිබෙන රටක්. 2005 ජනාධිපතිවරණයේදීත් ජාතික බලවේගයි, විජාතික බලවේගයි හැටියට දෙකට බෙදුණා. එදා ඒ ජාතික බලවේගයි, විජාතික බලවේගයි හැටියට දෙකට බෙදිලා ඒ විජාතික බලවේගවල ඒජන්තයාට එරෙහිව පෙරමුණු බැඳ ගන්න, කඳවුරු බැඳ ගන්න පුළුවන් වුණු නිසා තමයි මිනී මරු ත්‍රස්තවාදය කම්මුතු කරන මේ මහා ජනතා ජයග්‍රහණය අවුරුදු හතර පිරෙන්න කලින් දිනවලා දෙන්න, මේ රටට ලබා දෙන්න පුළුවන් වුණේ. දැන් බලනවා ඒ ජනතා ජයග්‍රහණය ආපස්සට හරවලා නැවත 2005 දී පරදවපු ඒ දුෂ්ට විජාතික බලවේගවල නියෝජිත හවුලට නැවත කරළියට එන්න පොට පාදලා දෙන්න. ඒ සඳහා මේ රටේ ආරක්ෂක අංශ අතර භේද වපුරලා ආරක්ෂක ප්‍රධානීන් අතර භේද වපුරලා ඒ භේද වවා ගෙන කාලා ඒකෙන් ජීවත් වන්න හදනවා සමහර දේශපාලන බලවේග.

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට ලොකු වග කීමක් තිබෙනවා. එක පැත්තකින් එක්සත් ජනපදය ප්‍රමුඛ දුෂ්ට බලවේගය මේ සූදානම් වන්නේ වෙන මොකකටවත් නොවෙයි. මේ සූදානම් වන්නේ එක ගලෙන් කුරුල්ලෝ තුන්, හතර දෙනෙක් බාවන්න. එක අතකින් ආරක්ෂක ලේකම්වරයා ගැන හිටපු යුද හමුදාපතිවරයාගෙන් අහනවා. අනෙක් අතින් ඒ මඟින් අනියමින් බලපෑමක් හිටපු යුද හමුදාපතිවරයාටත් තියෙනවා. ඔබ හැසිරෙන ආකාරය දිහා බලා අපිට ඔබ ගැන තීරණ ගන්න වනවා කියන අනියම් තර්ජනයක් මේකේ ඇතුළත ගැබ් වෙලා තිබෙනවා. එක ගලෙන් කුරුල්ලෝ කීප දෙනෙක් බාවන මෙහෙයුම තමයි දියත් වෙලා තිබෙන්නේ.

අද පත්තරවල තිබෙනවා දැක්කා, වික්‍රමසිංහ මහත්මයා ඇමෙරිකා එක්සත් ජනපදයේ බ්ලේක් මහත්මයාටද කාටද කථා කරලා ඇහුවාලු. චන්ද්‍රිකා නෝනා හිලරි නෝනාට කථා කරලා ඇහුවාලු. හිලරි නෝනා හමුදාව යුද උපක්‍රමයක් හැටියට ස්ත්‍රී දූෂණයේ යෙදුණායි කියලා කියපු වෙලාවේ චන්ද්‍රිකා නෝනා කථා කළේ නැහැ. එතුමිය ස්ත්‍රියක් නිසා වෙන්න ඇති. කථා කළේ නැහැ. මේ වෙලාවේ එතුමිය කථා කරලා ඇහුවාලු. ඇහුවේ මොනවාද කියා අපි දන්නේ නැහැ. කථා කළා කියන එක විතරයි පත්තරවල තිබෙන්නේ. දෙදෙනා කථා කරලා ඇහුවායි කියලා විතරයි තිබෙන්නේ. ඇහුවාම මොනවාද දන්නේ නැහැ කිව්වේ? "කොහොම හරි ප්‍රශ්න කරන්න. කොහොම හරි ගෝඨාභයට විරුද්ධව මොනවා හරි අහ ගන්න." එහෙමද දන්නේ නැහැ කිව්වේ. කියපු දෙයක් සඳහන් වෙලා නැහැ. ඒක නොවෙයි ඕනෑ. විවෘතව කියන්න ඕනෑ. එක්සත් ජනපදයටවත්, මොන බලවතෙකුටවත්, මිනී මරු ත්‍රස්තවාදය කම්මුතු කරපු එක ආරක්ෂක අංශ ප්‍රධානියකුට එරෙහිව මේ විධියට තොරතුරු එකතු කරන්න, මේ විධියට චෝදනා ගොනු කර ගන්න, මේ විධියට කරුණු විමසන්න අයිතියක් නැහැ කියලා භය නැතුව කියන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. එහෙම කියන්නේ නැතුව අරයාට කථා කළා මෙයාට කථා කළා කියා බොරුවට ප්‍රවෘත්ති පොම්ප කර වැඩක් වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අනෙක් අතට අපි තේරුම්

ගන්න ඕනෑ මේක පොදුවේ මේ රටට හතුරුව එල්ල වන මෙහෙයුමක් බව. මේකෙන් දේශපාලන වාසි ගන්න බලන්නේ නැතුව මේකෙන් එක එක දේශපාලන න්‍යාය පත්‍ර පෝෂණය කර ගන්න බලන්නේ නැතුව, මේකට සමඟි සම්පන්න වෙලා මුහුණ දීම අත්‍යවශ්‍යයි. මෙතැනදී ඉතාම පැහැදිලිව පෙනෙනවා එදා - 2005 දී - වාගේම අදත් විජාතික බලවේග හදන්නේ මේ රටට සාමය උදා කර ගෙන, ගෞරවාන්විත සාමය අත් පත් කර ගෙන ඒ මඟින් ලබා ගත්තු ජයග්‍රහණත් සමඟ ඉදිරියට යන ගමන ආපස්සට හරවලා 2005 දී පරාජයට පත් කරපු දූෂ්ට බලවේගවලට නැවත කරළිය විවෘත කර දෙන්නයි හදන්නේ කියලා. ඒ කුමන්ත්‍රණය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත රඟ දක්වමින් තිබෙන්නේ. ඒ නිසා අපිට ලොකු වග කීමක් තිබෙනවා; ලොකු යුතුකමක් තිබෙනවා. ඒ බව හරියට හඳුනා ගෙන 2005 දී ඒ විජාතික හවුල පරාජයට පත් කරන්න ක්‍රියා මාර්ග තේරුවා වාගේම ඒ හවුල පිටුපස්සේ සිටින අන්තර්ජාතික බලවේග තමයි මේ මෙහෙයුම දියත් කරන්නේ. ඒ නිසා ඒ සියල්ල එකට තියලා පරද්දලා මේ රටේ ආරක්ෂක අංශ ප්‍රධානීන්ට එරෙහිව, ඒ සටනට නායකත්වය දුන්න බලවේගවලට එරෙහිව දියත් කොට තිබෙන මහා අන්තර්ජාතික මෙහෙයුමට එරෙහිව මුළුමහත් ජාතිය සමඟි සම්පන්නව නැඟී සිටිය යුතුයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාම එක මතයක ඉඳ ගෙන ඒ ක්‍රියාදාමයට එරෙහිව නැඟී සිටිය යුතුයි කියන කරුණ අවධාරණය කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**\
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.

ඊ ළඟට ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, සරත් ෆොන්සේකා මැතිතුමාට ඇමෙරිකාවෙන් නිල ආරාධනාවක් - official invitation එකක් - තිබුණු බව. නමුත් එතුමා ඇමෙරිකාවට යන්න දවස් කීපයකට කලින් එම නිල ආරාධනාව ඉල්ලා අස් කර ගත්තා. එතකොට සරත් ෆොන්සේකා මැතිතුමා අවසාන වශයෙන් ඇමෙරිකාවට ගියේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිල ගමනක් නොවෙයි. ඒක පෞද්ගලික ගමනක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමා, එතුමා ගියේ පෞද්ගලික ගමනක් නොවෙයි. ඇමෙරිකානු රජයේ ආරාධනාවක් නොතිබුණාට එතුමා නිල ගමනක් ගියේ. එතුමාට සල්ලි වියදම් කළේ රජයෙන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට කථා කරන්න දෙන්න කෝ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රජයෙන් සල්ලි වියදම් කළේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මටත් කථා කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පෞද්ගලික ගමනක් නම් එතුමා එතුමාගේ අතේ සල්ලිවලින් යන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කථා කරන එක මම අහ ගෙන සිටියා නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා කියන එක වැරැදියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. වැරැදි නැහැ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සරත් ෆොන්සේකා මැතිතුමාට ලැබුණු නිල ආරාධනාව ඇමෙරිකානු රජය එතුමා යන්න දවස් කීපයකට කලින් ඉල්ලා අස් කර ගත්තා. එතුමාට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් - diplomatic passport එකක් - තිබුණු එක ඇත්ත. නමුත් එතුමා ගියේ පෞද්ගලික ගමනක්. මා කියන්නේ මේකයි. එතුමා පෞද්ගලික ගමනක් යන කොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගමන ගැන එතුමාට උපදෙස් දෙන්න තිබුණා. විදේශ කටයුතු අමාත්‍යාංශයට, ඒ වාගේම ආරක්ෂක නිලධාරීන්ට මෙතුමාට උපදෙස් දෙන්න තිබුණා. "ඔබතුමා යන්නේ පෞද්ගලික ගමනක්"ය කියලා. නමුත් ඒ අවශ්‍ය උපදෙස් එතුමාට ලැබුණේ නැහැ. සරත් ෆොන්සේකා මැතිතුමාට යන්න ඇරියේ ඇයි? මුලදී තිබුණේත් නිල ගමනක්. ඒ ආරාධනාව ඉල්ලා අස් කර ගත්තා. ඇමෙරිකන් තානාපතිවරිය එතුමා හම්බ වෙලා එතුමාට කිව්වා, "ඒ චෝදනා හරි වෙන්න පුළුවන්, වැරැදි වෙන්න පුළුවන්, ඇමෙරිකාවේ සෙනේට් සභාවටයි, කොංග්‍රස් මණ්ඩලයටයි යුද අපරාධ සම්බන්ධයෙන් වාර්තාවක් තිබෙන නිසා" කියලා. ඒකයි ඉල්ලා අස් කර ගත්තේ. අවසාන වශයෙන් එතුමා ගියේ පෞද්ගලික ගමනක්. අපේ විදේශ කටයුතු ඇමතිතුමා අද උදේ කියලා තිබෙනවා, "කලින් නියම කර ගත් කටයුත්තක් සඳහා නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික ගමන් බල පත්‍රයක්..." කියලා. කටයුත්තක් තිබුණේ නැහැ. There was no official invitation from the US Government. It was entirely a private visit. ඉතින් විදේශ කටයුතු ඇමතිතුමා පාර්ලිමේන්තුව නොමඟ ඇරලායි තිබෙන්නේ, කලින් නියම කර ගත් කටයුත්තක් සඳහා කියලා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
I will reply to what you are saying now when I speak.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කලින් නියම කර ගත් කටයුත්තක් තිබුණේ නැහැ. ඒකයි මම කියන්නේ. [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒ කියන්නේ මේ ගොල්ලෝ ඒ කුමන්ත්‍රණයේ විත්තිකාරයෝ. ඒ ගොල්ලෝ සියල්ල දන්නවා. කලින් නියම කර ගත්තේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අනික් එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් - [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සරත් ෆොන්සේකා මැතිතුමාගෙන් ප්‍රශ්න කිරීම ගැන මේ අය - [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ඒ රණ විරුවන් නැති කරන්න එක්සත් ජාතික පක්ෂය - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක නවත්වන්න කෝ. මොකක්ද මේ? [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා මට කථා කරන්න ඉඩ අරගෙන දෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකක්ද මේ? ගරු නියෝජ්‍ය කථානායකතුමා, මේක නවත්වන්න කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා මට කථා කරන්න ඉඩ අරගෙන දෙනවාද? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ෂිඃ කැතයි, කැතයි. [බාධා කිරීමක්] සැල්වේෂන් ආමි එකට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ආචාර්ය මර්වින් සිල්වා ඇමතිතුමා, කරුණාකර වාඩි වන්න. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සරත් ෆොන්සේකා මැතිතුමාගෙන් ප්‍රශ්න කිරීම ගැන යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

මොකක්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔබතුමා දන්නවාද, දැනට මාස දෙකකට විතර කලින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇමෙරිකාවට ගියාම එතුමාගෙන් ප්‍රශ්න කළ බව? ඔබතුමා දන්නවාද?

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ඔව්. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ප්‍රශ්න කෙරුවා. එතකොට අපි ආණ්ඩුවෙන් මේ කාරණය අහනවා. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රකාශය මත තමයි සරත් ෆොන්සේකා මහත්මයාගෙන් ප්‍රශ්න කරන්න උත්සාහ ගත්තේ කියන එක මම මේ සභාවට දැනුම් දෙනවා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

කවුද කිව්වේ? [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සරත් ෆොන්සේකා මහත්මයාට කියන්න තිබුණා, "මගෙන් ප්‍රශ්න කෙරුවා, ඔබතුමාගෙනුත් ප්‍රශ්න කරයි, යන්න එපා" කියලා. නමුත් එතුමා කිව්වේ නැහැ. එතුමා රටට හෙළි කෙරුවෙත් නැහැ, පාර්ලිමේන්තුවට හෙළි කෙරුවෙත් නැහැ, එතුමාගෙන් ප්‍රශ්න කළා කියලා. එම නිසා - [බාධා කිරීම්] ඔව්, ඔව්. පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට කථා කරන්න ඉඩ අරගෙන දෙනවාද? මේක නවත්වනවාද? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මර්වින් සිල්වා ඇමතිතුමා කරුණාකර නිශ්ශබ්ද වෙලා ඉඳ ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එකට තේ එක බීලා ඔහොම කරනවාද? ඉඳ ගන්න කෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හරි. දැන් ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන්න.

**ග රු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියකියා හිටියේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඇමෙරිකාවේදී ප්‍රශ්න කළා කියන එක. එහෙම කරපු නිසා අපේ සරත් ෆොන්සේකා මහත්මයා යන කොට එතුමාට කියන්න තිබුණා, "යන්න එපා.

මගෙන් ප්‍රශ්න කෙරුවා, ඔබතුමාගෙනුත් ප්‍රශ්න කරයි" කියලා. නමුත් එතුමා කිසි කෙනෙකුට කිව්වේ නැහැ එතුමාගෙන් ප්‍රශ්න කෙරුවා කියලා. ඉතින් මොකක්ද මේ ප්‍රශ්නය? ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ප්‍රශ්න කරපු එක ගැන ආණ්ඩුව යෝජනා දමන්නේ නැහැ. [බාධා කිරීම්] මොකක්ද අරමුණ? ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ප්‍රශ්න කෙරුවා. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ආණ්ඩුව පැත්තෙන් දෙන්න වෙලාව එහෙම නම්. [බාධා කිරීම්] ඔතැන ඉඳ ගෙන හිනා වෙලා හරි යන්නේ නැහැ නේ? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ මොකක්ද කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇමතිතුමා කථා කරන්න දෙන්නේ නැද්ද? එහෙම නම් අපි යමු යන්න. අපි යමුද එහෙම නම්? [බාධා කිරීම්] ඔබතුමා කථා කරන්න දෙන්නේ නැති නිසා අප යනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, කථාවට ඉඩ දෙන්න. පිළිතුරු කථාව ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා කරන නිසා ඔබතුමා කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා මේවා නවත්වන්නේ නැත්නම් අපි යනවා. [බාධා කිරීම්] ඔබතුමා එහෙම නම් තනිවම මේක කරන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඇමතිතුමා කරුණාකර ඉඳ ගන්න. හරි. ඔබතුමා කථා කරන්න. පිළිතුරු කථාව ගරු ඇමතිතුමා කරන නිසා ඔබතුමා කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂය අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්න හදනවා කියලා. අපි නොවෙයි. [බාධා කිරීම්] ආණ්ඩුවේ ඇමතිවරු නේද රූපවාහිනියට ගිහින් සරත් ෆොන්සේකා මැතිතුමාට බැන්නේ. [බාධා කිරීම්] ආණ්ඩුවේ ඇමතිවරු නේද? මට නම් වශයෙන් - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි යමු. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කථා කරන්න දෙන්නේ නැහැ නේ? මේ ගොල්ලෝ මොකක්ද මේ කරන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] මර්වින් සිල්වා ඇමතිතුමා, කරුණාකර, - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද? [බාධා කිරීම්] මොකක්ද මේ කරන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මර්වින් සිල්වා ඇමතිතුමා කරුණාකර ඔබතුමාගේ ආසනයට යන්න. [බාධා කිරීම්] ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීම්] කිරිඇල්ල මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි. හරි. බොහොම ලස්සනයි!

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වන්න, මර්වින් සිල්වා ඇමතිතුමා. ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීම්] පිළිතුරු කථාවේදී ගරු ඇමතිතුමා කියයි. [බාධා කිරීම්] දැන් කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] ලලිත් දිසානායක මන්ත්‍රීතුමා කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] පිළිතුරු කථාවේදී කියයි. ඔබතුමා ඉඳ ගන්න. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සරත් ෆොන්සේකා මැතිතුමා එදා හොඳ නැහැ, අද හොඳයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ ඇමතිවරු තමයි රූපවාහිනියට ගිහින් සරත් ෆොන්සේකා මහත්මයාට බැන්නේ. [බාධා කිරීම්] ආණ්ඩුවේ ඇමතිවරු. [බාධා කිරීම්] මම කියන්නම්. හරිද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
බොහොම ලස්සණයි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. ඇමතිතුමාගේ පිළිතුරු කතාවේදී ඇමතිතුමා නිවැරදි කරයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එදා ෆොන්සේකා හොඳ නැහැ, අද හොඳයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට මේක මෙහෙය වන්න බැහැ. ඔබතුමා ඉල්ලා අස් වෙන්න. ඔබතුමාට මේක මෙහෙය වන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට මේක මෙහෙය වන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මට මෙහෙය වන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
පුළුවන් තමයි. දැන් පෙන්නුවා නේ මෙහෙයවන හැටි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මට පුළුවන්. ඔබතුමා විෂයයට අදාළව කතා කරනවා නම් ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
විෂයයට අදාළව තමයි කතා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා මට අභියෝග කරන්න එන්න එපා. ඔබතුමා කතා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කතා කරන්නේ විෂයයට අදාළව තමයි. ඔබතුමා ඔතැනට වෙලා හිනා වෙවී ඉන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මට හිනා වෙන්න බැරි කමක් නැහැ. මට හිනා වෙන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි, හරි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ඇත්ත කතා කරනවා නම් ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඇත්ත කතා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත නේන්නම් කතා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කතා කරන්න. කරුණාකරලා කතාව ඉවර කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ, මම කියන්නේ අසත්‍ය කියලා ද? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට එහෙම කථා කරන්න බැහැ. ආණ්ඩුව වෙනුවෙන් කථා කරන්න නොවෙයි ඔතැනට ආවේ ඔබතුමා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ ආසනයට යන්න. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කතා කරන්නේ නැත්නම් මම වෙන කෙනෙකුට අවස්ථාව දෙනවා. [බාධා කිරීම්] ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කතා කරන්නේ නැත්නම් බිමල් රත්නායක මන්ත්‍රීතුමාට - [බාධා කිරීම්] කරුණාකර ඔබතුමා කතා කරන්න. [බාධා කිරීම්] ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට එක වතාවක් කිව්වා. කරුණාකර ඉඳ ගන්න. ලලිත් දිසානායාක මන්ත්‍රීතුමනි. කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඒ ගරු මන්ත්‍රීතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය මාස දෙක ඇතුළත ආණ්ඩුවේ ඇමතිවරු සරත් ෆොන්සේකා මැතිතුමාට රූපවාහිනියෙන් අපහාස කළා.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
කවුද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කිව්වා, ආමි ජෙනරාල්ලාට රට පාලනය කරන්න දුන්නොත් රට ඉවරයි කියලා. [බාධා කිරීම්] හේමකුමාර නානායක්කාර මහත්මයා බැන්නා. මර්වින් සිල්වා බැන්නා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි - [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඇමතිතුමාට පිළිතුරු කතාවේදී උත්තර දෙන්න පුළුවන්. කරුණාකරලා ඉඳ ගන්න. [බාධා කිරීම්] එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. එතුමාගේ කතාවෙන් පසුව පිළිතුරු කතාවේදී තමුන්නාන්සේ කතා කරන්න. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
සරත් ෆොන්සේකා මැතිතුමාට ගොනා කිව්වා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. මම ගොනා කිව්වේ ආණ්ඩුවට. ආණ්ඩුවටයි ගොනා කිව්වේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මර්වින් සිල්වා ඇමතිතුමනි, දැන් මම ඔබතුමාට අවවාද කළා. කරුණාකරලා ඉඳ ගන්න. එතුමා එහෙම කිව්වා නම් ඒක ඉල්ලා අස් කර ගනීවි. එතුමා එහෙම ප්‍රකාශයක් කරලා නැහැ. කරුණාකරලා ඉඳ ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ගොනා කිව්වේ ආණ්ඩුවටයි. හමුදාවට නොවෙයි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඉඳ ගන්න. විනයක් තිබෙනවා නම් කරුණාකර ඉඳ ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සරත් ෆොන්සේකා මැතිතුමා පිට රටදී කියා තිබෙනවා, "යුද්ධ කළේ මම. මේ ගොල්ල කළේ කොමිස් ගහපු එක විතරයි" කියලා. මේ ගොල්ල කොමිස් ගහපු එක විතරයි. යුද්ධ කෙරුවේ හමුදාව. මේ ගොල්ල ඔක්කොමලා කොමිස් ගැහුවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, ඇමතිතුමා පිළිතුරු කතාව කරාවි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කතා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුල ඉඳන්ම මම කියකියා සිටියේ, සරත් ෆොන්සේකා මැතිතුමා ඇමෙරිකාවට යන කොට - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සරත් කිව්වාම පනිනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සරත් කිව්වාම බය වෙලා. ඇයි බය? ඇයි බය? [බාධා කිරීම්] මේ ඔක්කොම බය වෙලා. අයියෝ ඔච්චර බයද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙපාර්ශ්වයම නිශ්ශබ්ද වෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔක්කොම බය වෙලා. මෙතුමාත් බය වෙලා. සරත් ෆොන්සේකා කියන නමට ඔච්චර බය ඇයි?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සරත් කියපු ගමන් බඩ යනවා කට්ටියට. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කතා කරන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කතා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතින් මට කතා කරන්න දෙන්නේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බැහැ, බැහැ, එහෙම බැහැ. [බාධා කිරීම්] මට ආණ්ඩුව පැත්තෙන් වෙලාව ඕනෑ. මට කථා කරන්න දුන්නේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක ඇත්ත. මා පිළිගන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට කථා කරන්න දුන්නේ නැහැ නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
"සරත්" කිව්වාම හරක් වාගේ හැසිරෙනවා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආයෙත් බය වෙලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
"සරත්" කිව්වාම හරක් වාගේ අද හැසිරෙනවා මෙතැන. [බාධා කිරීම්] ඇයි ඔච්චර බය? "සරත්" කිව්වා විතරයි, මෙතැන හරක් වාගේ හැසිරෙනවා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇයි ඔච්චර බය? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලලිත් දිසානායක මන්ත්‍රීතුමා, - [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
How can I speak?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්] ඔබතුමා කථාව කර ගෙන යන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අර විදේශ කටයුතු ඇමතිතුමාත් කියනවා, කෑ ගහන්නේ නැතිව ඉන්න කියලා. [බාධා කිරීම්] අහ ගෙන ඉන්න. අර, ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. අපේ පැත්තේ ඉඳලා ඇවිල්ලා ඉන්නේ. [බාධා කිරීම්] අර ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් කියනවා, ඉඳ ගන්න කියලා. ඒක අහලා ඉඳ ගන්න. [බාධා කිරීම්] අර ජේනවාද? ඉඳ ගන්න කියලා කියන්නේ. [බාධා කිරීම්] අහන්නේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න, ලලිත් දිසානායක මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] මට ඔබතුමාව නම් කරන්නට වෙනවා, එහෙම වුණොත්. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අර කෝට්ටේ සංවිධායකතුමාට - [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් වාඩි වන්න කෝ. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට කථා කරන්න දුන්නේ නැහැ නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, කරුණාකර එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය ඇති වුණේ සරත් ෆොන්සේකා මැතිතුමා මේ ලංකාවෙන් පිට වන කොට- [බාධා කිරීම්] - ඇයි බය වන්නේ ඔච්චර? [බාධා කිරීම්] ආයෙත් බය වෙලා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
"සරත්" කියන්නේ නැතිව අපි වෙන මොකක් කියන්නද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමාගේ නම කියන්න බැරිද? [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙනම් සරත් කියන්නේ නැතිව මොකක් කියන්නද? "සරත්" කිව්වාම බය වෙලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ෆොන්සේකා මහත්මයා කියලා කියන්නද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

බිමල් රත්නායක මන්ත්‍රීතුමාට කාලය දෙන්න තිබෙනවා. [බාධා කිරීම්] ඔබතුමා කථාව අවසන් කරන්න. බිමල් රත්නායක මන්ත්‍රීතුමාට කාලය දෙන්න තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතින් ඔබතුමා මට කථා කරන්න වෙලාව දුන්නේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මොකද, විපක්ෂයට පැය භාගයයි, ආණ්ඩු පක්ෂයට පැය භාගයයි තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කථා කරන්න දෙන්නේ නැහැ නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
විපක්ෂයේ පැය භාගය තමුන්නාන්සේ දෙන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තමුන්නාන්සේ දෙන්න ඕනෑ. ඒක මූලාසනයේ සිටින තමුන්නාන්සේගේ යුතුකම.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කෑ ගහන්න දීලා තමුන්නාන්සේ මෙතැන බුදිය ගෙන ඉන්නවා නම් අපේ වෙලාව දෙන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මම නම් බුදිය ගෙන නැහැ. ඇහැර ගෙන ඉන්නේ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා කරුණාකර අවසන් කරන්න. බිමල් රත්නායක මන්ත්‍රීතුමාට වෙලාව දෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට කථා කරන්න දෙන්නේ නැහැ, නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉතින් මට කථා කරන්න දෙන්නේ නැහැ නේ. කොහොමද කථා කරන්නේ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ඔබතුමාගේ කාලය අවසාන කරන්න වෙනවා. මොකද, බිමල් රත්නායක මන්ත්‍රීතුමාට විනාඩි දහයයි තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කථාව අවසන් කරන්න, කථා කරන්න දුන්නේ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි විමල් වීරවංශ මහත්මයාට බාධා කළාද? නැහැ නේ. අපි මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට බාධා කළාද? නැහැ නේ. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? කථා කරන්න ඉඩ දෙන්න කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ, සරත් ෆොන්සේකා මැතිතුමා ගියේ - ලංකාවෙන් පිට වුණේ - පෞද්ගලික ගමනක්. ඒක රාජ්‍ය තාන්ත්‍රික ගමනක් නොවෙයි. ඔහුට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් තිබුණාට ඒක පෞද්ගලික ගමනක්. ඊට කලින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇමෙරිකාවට ගිය වෙලාවේත් එතුමාගෙන් ප්‍රශ්න කරලා තිබුණා. එම නිසා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට යුතුකමක් තිබුණා ඒ බව කියන්න. ආණ්ඩුවට යුතුකමක් තිබුණා, "ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ප්‍රශ්න කරලා තිබෙනවා, ඔබතුමාටත් මේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වෙයි" කියලා සරත් ෆොන්සේකා මැතිතුමාව දැනුවත් කරන්න. නමුත් එහෙම අවවාදයක් සරත් ෆොන්සේකා මැතිතුමාට දුන්නේ නැහැ. විදේශ කටයුතු ඇමතිතුමා හැටියට - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔය ආයෙත් නැඟිටිනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
යම් කිසි වග කීමක් තිබෙනවා. මේ අයට සරත් ෆොන්සේකා මැතිතුමා ගැන ඔච්චර කැක්කුමක් තිබෙනවා නම්, ඔය විධියට ඔච්චර කැක්කුමක් තිබෙනවා නම් ඔහුට අවවාද කරන්නට තිබුණා. [බාධා කිරීම්] නමුත් එහෙම අවවාදයක් දුන්නේ නැහැ. අනෙක් එක, මා කියන්නට ඕනෑ, කවුරුත් හදන්නේ මේ කලබලකාරී අවස්ථාවන්වලදීත් යම් කිසි වාසියක් ලබා ගන්නයි. ආණ්ඩුවයි, සරත් ෆොන්සේකායි අතර ප්‍රශ්නයක් තිබෙනවා. මුළු ලෝකයම අද ඒක දන්නවා. [බාධා කිරීම්] ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීම්] ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ගන්න - [බාධා කිරීම්] අපේ විමල් වීරවංශ මන්ත්‍රීතුමා කියන විධියට ඒ ප්‍රශ්නවලින් යම් යම් පිරිස් ප්‍රයෝජන ගන්නට උත්සාහ කරනවා. ආණ්ඩුවේ ඇමතිවරු ටීවී එකෙන් එතුමාට බැන්නා. එතුමාට 60 වන සංවත්සරය වෙනකන් ඉන්න දුන්නේ නැහැ. ඇයි ඉන්න දුන්නේ නැත්තේ? එතුමා කිව්වා, "මම මේ වාගේ යුද්ධයක් කරපු කෙනෙක්. මට 60 වන සංවත්සරය දක්වා ඉන්න දෙන්න"යි කියලා. දුන්නේ නැහැ. ඇයි? [බාධා කිරීම්] ඉතින් අද මුළු ලෝකයම දන්නවා, ආණ්ඩුවයි, සරත් ෆොන්සේකායි අතර ප්‍රශ්නයක් තිබෙන බව. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
කිසි ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳයි, ඔබතුමා කියනවා නම් ප්‍රශ්නයක් නැහැ කියලා, මම මෙය කියවන්නද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කොටස කියවා මා අවසන් කරන්නම්. TIMES NOW Channel on 3rd November, 2009, had broadcast under the headline, "SL govt. distances itself from war hero,"

I quote:

"The Sri Lankan Government on Monday (November 2) distanced itself from its highest ranking military officer amidst allegations of human rights violations. Speaking exclusively to TIMES NOW, Sri Lankan cabinet Minister Douglas Devananda has said that the Government's stand could differ from chief of defence staff …."

ඒ කියන්නේ ආණ්ඩුවේ ස්ථාවරයයි, සරත් ෆොන්සේකා මහත්මයාගේ ස්ථාවරයයි වෙනස් කියලා ඩග්ලස් දේවානන්ද මහත්මයා කියා තිබෙනවා.

It further states,

"Devananda claims that for political reasons, General Fonseka could talk about things that actually never happened. The Minister says that Fonseka's statements could differ from the government's stand because opposition parties are trying to get him to join politics."

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා සභාගත කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
එතකොට මේ ඩග්ලස් දේවානන්ද මැතිතුමාම කියනවා, ආණ්ඩුවේ ස්ථාවරයයි, සරත් ෆොන්සේකා මැතිතුමාගේ ස්ථාවරයයි වෙනස් කියලා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි. මන්ත්‍රීතුමා ඔය වාර්තාව සභාගත කරනවාද? [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකෙන් පෙනෙනවා, අර්බුදයක් තිබෙන බව. මේ කැබිනට් ඇමතිවරයෙක්. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ඔය වාර්තාව සභාගත කරන්න. [බාධා කිරීමක්] ස්තුතියි. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බිමල් රත්නායක ගරු මන්ත්‍රීතුමාට මයික් එක දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ- [බාධා කිරීමක්] මෙම ලියවිල්ල **සභාගත*** කරමින් මා නවතිනවා.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

**SL govt distances itself from war hero**
3 Nov 2009, 0758 hrs IST

The Sri Lankan Government on Monday (November 2) distanced itself from its highest ranking military officer amidst allegations of human rights violations. Speaking exclusively to Times Now, Sri Lankan cabinet Minister Douglas Devananda has said that The Government's stand could differ from chief of defence staff General Sarath Fonseka's Statements.

Dvevananda claims that for political reasons, General Fonseka could talk about things that actually never happened. The Minister says that Fonseka's statements could differ from the government's stand because opposition parties are trying to get him to join politics.

He said, "He (Fonseka) is trying to enroll in politics, so he may say something different from what actually happened. Opposition parties in Sri Lanka are trying to bring him into politics. May be as a third force. That is our government's stand."

Meanwhile, Sri Lankan Foreign Minister Rohitha Bogollagama said, "I have accordingly met earlier this afternoon with Her Excellency, Mrs. Patricia Butensi, the US Ambassador to Sri Lanka, to convey through Her Excellency the message that the Department of Homeland Security should forthwith desist from any ende avour to interview General Fonseka."

The Lankan government's stand comes at a time when it has demanded that Washington drop an attempt to question Fonseka over alleged human rights violations during the last phase of the war against the LTTE. The US Department of Homeland Security wants to interview Fonseka to gather information against the Lankan Defence Secretary Gotbaya Rajapakse. Fonseka is currently on a trip to the US.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් මම ඉදිරිපත් කරන්න කැමතියි. ප්‍රථමයෙන්ම ගත්තොත් සරත් ෆොන්සේකා මහතාව ඇමෙරිකානු ආගමන විගමන සහ ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න කරනවා කියන තොරතුර දැන ගත්තාට පස්සේ ජනතා විමුක්ති පෙරමුණ ලෙස ඒ පිළිබඳව අපේ ස්ථාවරය ප්‍රකාශ කළා. ඒක තමයි ඇමෙරිකානු එක්සත් ජනපදයට හෝ වෙනත් කිසිදු

රාජ්‍යයකට අපේ රටේ ආරක්ෂක ප්‍රධානීන්ගෙන්, අපේ රටේ වෙනත් නිලධාරින්ගෙන්, අපේ රටේ පුරවැසියන්ගෙන් අපේ රටේ ස්වෛරීත්වය ඉක්මවා ගිහින් ප්‍රශ්න කරන්න කිසියම් අයිතියක් නැහැ කියන එක. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ මේ රටේ ස්වෛරීත්වය වෙනුවෙන්, මේ රටේ අභිමානය වෙනුවෙන්, ඒ වාගේම නොබැඳි, කොන්ද කෙළින් තියා ගත්ත විදේශ ප්‍රතිපත්තියක් වෙනුවෙන් දිගටම තමන්ගේ ප්‍රතිපත්තියේ සිටින පක්ෂයක්. ඒ නිසා අපි සරත් ෆොන්සේකා මහත්මයා වේවා, වෙනත් නිලධාරියෙක් වේවා, වෙනත් දේශපාලනඥයෙක් වේවා, අපේ ස්ථාවරය තමයි විදේශ රටකදී හෝ විදේශ රටකට ගිහිල්ලා හෝ ප්‍රශ්න කරන්න කිසියම් කෙනකුට අයිතියක් නැහැ කියන එක. ඒක අපේ පක්ෂයේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයාත්, ඒ වාගේම ඊට පසු අවස්ථාවලදීත් අපි මේක ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - ඔබතුමා දන්නවා ඇති - මේ සරත් ෆොන්සේකා මහත්මයා ඇමෙරිකාවේ පුරවැසිභාවය ලබා ගැනීම නැත්නම් එහි ස්ථිර පදිංචිය සඳහා - පුරවැසිභාවයම නොවෙයි - ඉල්ලුම් කර තිබෙන බව අපි මාධ්‍ය හරහා දැන ගත්තා. ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපදයට අයිතියක් තිබෙනවා, ඒ ස්ථිර පදිංචිය ලබා දීම සඳහා පමණක් - ඉන් එහා යන කරුණු නොවෙයි, ඔහුගේ තනතුරට අදාළ කරන ප්‍රශ්න නොවෙයි, රටේ අභ්‍යන්තර යුදමය තත්ත්වයන්ට, ආරක්ෂාවට අදාළ වන ප්‍රශ්නයක් නොවෙයි - අදාළ වන පෞද්ගලික කරුණු ඔහුගෙන් විමසන්න. මොකද, ඒක ඇමෙරිකා එක්සත් ජනපදයේ ස්ථිර පදිංචිය හෝ පුරවැසිභාවය ලබා ගන්න යන ඕනෑම කෙනෙක් - වෙනත් රටක පුරවැසිභාවය ලබා ගන්න යන කෙනෙක් - මුහුණ දිය යුතු තත්ත්වයක්. නමුත් ඇමෙරිකා එක්සත් ජනපදය ඉන් එහාට ගිහිල්ලා දේශපාලන සහ යුදමය කරුණු පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කිරීමේ සූදානමක්, ඒ පිළිබඳව වුවමනාවක් ඔවුන් තුළ තිබුණා කියන එක අපි දැක්කා. ඒ අනුව තමයි අපි අපේ ස්ථාවරය ප්‍රථමයෙන්ම ප්‍රකාශයට පත් කළේ. නමුත් එතුමා ස්ථිර පදිංචිය සඳහා ලබා දී තිබෙන ලිපිනය ඇමෙරිකාවේ ඔක්ලහෝමා ප්‍රාන්තයට අදාළ එකක් නිසා ඔක්ලහෝමා ප්‍රාන්තයේ ආගමන විගමන බලධාරින් -ස්වදේශ ආරක්ෂක අමාත්‍යාංශය විසින්- ඔහුට කියා තිබුණා, ඔහුගේ ස්ථිර පදිංචියට අමතරව වෙනත් අභ්‍යන්තර යුදමය කරුණු පිළිබඳව අපේ රටේ වෙනත් තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වනවාය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනයි වැදගත්කම තිබෙන්නේ. එතුමා ශ්‍රී ලංකාවේ මෑත කාලයේ බිහි වුණු විශිෂ්ටතම යුද හමුදා නිලධාරියා වශයෙන්, මේ යුද්ධයේ සැබෑ යුදමය නායකත්වය දුන්න නිලධාරියා වශයෙන් එතුමා ඇමෙරිකාවේ ස්ථිර පදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු ලිපිලේඛන අනුව ඔහු ඒ පරීක්ෂණයට සහභාගි විය යුතුව තිබුණා. ඒ, ලංකාව පිළිබඳව තොරතුරු ලබා දෙන්න නොවෙයි, ඔහුගේ ස්ථිර පදිංචිය පිළිබඳව අදාළ කරුණු විමසීමේ පරීක්ෂණයට. එය දඩමීමා කර ගෙන තමයි ඇමෙරිකානු බලධාරින් ඒ ප්‍රශ්න කිරීම කරන්න ගියේ. අපි එතුමාට අපේ ගෞරවය පුද කරන්න කැමැතියි, අද එතුමා තමන්ගේ ස්ථිර පදිංචිය සඳහා වන Green Card එකට අදාළව කරන පරීක්ෂණයටත් මුහුණ දෙන්නේ නැතුව, ඇමෙරිකානු එක්සත් ජනපදය විසින් කරන්න ගිය පරීක්ෂණවලට මුහුණ දෙන්නේ නැතුව නැවත අපේ රට බලා එන්න තීන්දු කරලා තිබෙන එක ගැන. එතුමා ඒ පරීක්ෂණ පැත්තකට දමලා තිබෙනවා. අපි එතුමාට ගරු කරනවා.

අපි කියන්න කැමැතියි, මෙන්න මේක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදෙස් කුමන්ත්‍රණ කියන ඒවා මේ රටට හැම දාම වෙලා තිබෙනවා. ඒ විදෙස් කුමන්ත්‍රණවලට ඇත්තටම මුහුණ දුන්නු අයත් ඉන්නවා. ඒවාට විරුද්ධව හැම දාම එක ස්ථාවරයක ඉඳ ගෙන සටන් කරපු පිරිසකුත් ඉන්නවා. ඒ වාගේම විදෙස් කුමන්ත්‍රණ තමන්ගේ දේශපාලන වුවමනාවන් සඳහා බිල්ලෝ මවන්න පාවිච්චි කරන අවස්ථාවන් ද තිබෙනවා

පසු ගිය කාලයේ විශේෂයෙන්ම යුද්ධයෙන් පස්සේ, යුද්ධය ඇරෙන්න වෙන මෙලෝ දෙයක් කර ගන්න බැරි වුණාට පස්සේ ආණ්ඩුවෙන්, ජනාධිපතිතුමාම ප්‍රකාශ කරන්න පටන් ගත්තා, එතුමාව යුද අධිකරණයකට ගෙන යන්න වැඩ පිළිවෙළක් විදේශීය වශයෙන් තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සවස 2.00ට පැවැත් වුණු විදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී විදේශ කටයුතු ඇමතිවරයාගෙන් සහ ලේකම්තුමාගෙන් අපි නිශ්චිත වශයෙන් ප්‍රශ්න කර සිටියා, - ඒකට විදේශ කටයුතු ඇමතිතුමා සාක්ෂි දරනවා - ලංකාවේ දේශපාලනඥයෙක් නොවෙයි, ලංකාවේ හමුදා නිලධාරියෙක් නොවෙයි, ලංකාවේ නිකම්ම නිකම් පුරවැසියෙක්වත් විදේශ යුද අධිකරණයකට ගෙන යන්න පුළුවන්ද කියලා. විදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී ඒ පිළිබඳව එතුමා පැහැදිලිව දැනුම් දුන්නා, කිසිදු ආකාරයකින් එහෙම ගෙන යන්න පුළුවන්කමක් නැහැ කියා. ලංකාවේ නීතිය අනුව, ලංකාව ස්වාධීන රාජ්‍යයක් වශයෙන් ලංකාවේ ජනාධිපතිවරයාවත්, හමුදා නිලධාරින්වත්, වෙනත් කවුරුවත් හෝ ගමේ නිකම්ම නිකම් සිරිසේන කෙනෙක්වත් විදේශ යුද අධිකරණවලට ගෙන යන්න බැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක මේ ජනාධිපතිතුමා දන්නේ නැද්ද? ඒක මේ නිලධාරින්, ලොකු දේශපාලනඥයන් දන්නේ නැද්ද? දන්නවා. ඒක දැන දැන බොරුවට කියනවා, "බුදු අම්මෝ! මාව අල්ලා ගෙන යන්න හදනවෝ" කියලා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඇමතිතුමා, මේ -,[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙතැන තිබෙන්නේ ප්‍රශ්නය මොකක්ද? අද මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි ඇමෙරිකාවට ප්‍රශ්න කරන්න පුළුවන් කවුරු ගැනද කියන එක. ප්‍රශ්න කරන්න පුළුවන් ඇමෙරිකන් පුරවැසියන් ගැන. අපි මේ පාර්ලිමේන්තුවේ කියලා තිබෙනවා, - [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්න කැමැතියි, මේ පාර්ලිමේන්තුවේදී අපේ කණ්ඩායම් නායක අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කළ ඉල්ලීමක් ගැන. අපට තිබෙන තොරතුරු හැටියට සරත් ෆොන්සේකා මහත්මයාගෙන් තොරතුරු ගන්න යනවාය කියන්නේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගැනයි. මීට සති දෙකකට කලින් අපි දන්නේ නැහැ, සරත් ෆොන්සේකා මහත්මයා කොහේ යන්න ඉන්නවාද කියලා. ඇමෙරිකාවේ යනවාද, වෙන කොහේ යනවාද කියලා දන්නේ නැහැ. මීට සති තුනකට කලින් තමයි මේ පාර්ලිමේන්තුවේදී අපි ඉල්ලා සිටියේ, ආරක්ෂක ලේකම්වරයාටත්, හිටපු ත්‍රිවිධ හමුදාපතිවරුන්ටත්, ඉන්න ත්‍රිවිධ හමුදාපතිවරුන්ටත් ජීවිතාන්තය දක්වා ආරක්ෂාව සපයන්න කියලා. අපි ඒ ගැන ප්‍රශ්නයක් මතු කළා. අපි එතැනදී ආරක්ෂක ලේකම්වරයා, යුද හමුදාපතිවරයා කියලා වෙනසක් කළේ නැහැ. තවම අපේ ඒ ප්‍රශ්නයට උත්තර දීලා නැහැ. ඇත්ත කථාව මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි කියන්න කැමැතියි සරත් ෆොන්සේකා මහත්මයා අද ආදර්ශයක් දීලා තිබෙන බව. Green Card එක ඕනෑ නැහැ, තමන්ගේ මාතෘ භූමියට එරෙහිව ප්‍රශ්න කරන්න යනවා නම් Green Card පැත්තක තියලා ලංකාවට එන්න එතුමා ලෑස්තියි. තමන්ගේ සහෝදරයා වෙච්ච ජනාධිපතිතුමා යුද අධිකරණයකට ගෙන යන්න හදනවා කියලා අද කියනවා. ජනාධිපතිතුමාත් කියනවා, ඇමෙරිකාවෙන් ප්‍රශ්න කරන්න යනවා කියලා. අපි ඒ අයට කියන්න කැමැතියි, ඔය තුට්ටු දෙකේ ඇමෙරිකානු පුරවැසිභාවය අත් හරින්න කියලා. අද ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට, බැසිල් රාජපක්ෂ මහත්තයාට මොකක්ද කරන්න තිබෙන්නේ? තමන්ගේ අයියා ඇමෙරිකාවේ යුද අධිකරණයකට හෝ නැත්නම් වෙන කොහේට හෝ කුදලා ගෙන යන්න හදනවා නම් මොකක්ද ඉස්සර වෙලාම කරන්න තිබෙන්නේ? ඉස්සර වෙලාම කරන්න තිබෙන්නේ, තමන්ගේ සහෝදරයාට විරුද්ධව ඒ කැත වැඩ කරන්න හදන රටේ පුරවැසිභාවය තමාට එපා කියලා ඒකෙන් අස් වෙන එක නේ. සරත් ෆොන්සේකා මහත්තයා Green Card එක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සෝමවංශ අමරසිංහ කොහේ ඉඳලාද ආවේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෝමවංශ අමරසිංහ සහෝදරයා මේ ලංකාවේ ඇරෙන්න වෙනත් කිසිම රටක පුරවැසිභාවය අර ගෙන නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නිශ්ශබ්ද වන්න. ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා, කරුණාකරලා ඉඳ ගන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
සෝමවංශ සහෝදරයා ලංකාවේ ඇරෙන්න කිසිම රටක පුරවැසිභාවය අර ගෙන නැහැ. අපට ඉන්නේ එහෙම නායකයෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
අපිට ඉන්නේ එහෙම නායකයෝ. ෆොටෝවලට ලංකාවේ පොළොව සිප ගන්න නායකයෝ නොවෙයි. ඇත්ත දේශ ප්‍රේමී නායකයෝ අපේ පක්ෂයේ ඉන්නේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. [බාධා කිරීම්] අපට බාධා කළත් කියන්න තිබෙන්නේ මේකයි. මේ යෝජනාව ආණ්ඩුවෙන්ම ඉදිරිපත් කරලා ආණ්ඩුවම මේ යෝජනාවට බාධා කරමින් කෑ ගහලා මේක අවුල් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අවශ්‍ය මොකක්ද? මාතෘ භූමියේ ස්වාධීනත්වය අපට අවශ්‍යයි. මාතෘ භූමියේ ස්වෛරීත්වය අවශ්‍යයි. එල්ටීටීඊ සංවිධානය පරාජයට පත් කරපු දේශපාලනඥයන්, හමුදා නිලධාරීන්, හමුදා සොල්දාදුවන් මේ සියලු දෙනාම රැක ගන්න අවශ්‍යයි. ඒ වාගේම ඔවුන් රැක ගත යුත්තේ විදේශ කුමන්ත්‍රණවලින් විතරක් නොවෙයි. දේශීය කුමන්ත්‍රණවලිනුත් රැක ගත යුතුයි. මේ රටේ කවුරුත් පිළිගන්නවා යුද්ධය කරපු ප්‍රධාන හමුදා නායකයා සරත් ෆොන්සේකා කියලා. [බාධා කිරීම්] ඒ සරත් ෆොන්සේකාට අද මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු, නිලධාරීන් දමලා පහර දෙනවා කියන එක පැහැදිලි සත්‍යයක්. [බාධා කිරීම්] අද සරත් ෆොන්සේකා මහත්තයාගේ ආරක්ෂාවේ සමහර කොටස් අයින් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඒ නිසා අපි කියන්න කැමැතියි, හමුදා නායකයන්, හමුදා වීරයන් බේරා ගන්න ඕනෑකම තිබෙන්නේ විදේශ කුමන්ත්‍රණවලින් විතරක් නොවන බව. තමන්ගේ සොරකම්වලට, තමන්ගේ වංචාවලට, තමන්ගේ දේශපාලන ගමනට, තමන්ගේ වංචනික, දූෂිත දේශපාලන ගමනට රට බේරා ගත් ඇත්ත හමුදා නිලධාරීන් බාධා වන විට ඔවුන්ට ගහන, ඔවුන්ව කපන, ඔවුන්ගේ තනතුරු ලබා නොදෙන ජීවාත් පරාජයට පත් කරන්න ඕනෑ. මේ තිබෙන්නේ ඒක. මම අද උදේත් කිව්වා. හමුදාවේ කාලතුවක්කු කොපු ටිකත් පිට රටට විකුණලා හම්බ කර ගෙන කන ජාතියේ ආරක්ෂක අමාත්‍යාංශයක් තිබෙන්නේ. [බාධා කිරීම්] මේ තිබෙන්නේ ඒ තොරතුරු. [බාධා කිරීම්] මේ තිබෙන්නේ ඒවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට එකඟ වන්න පුළුවන් තැනක් තිබෙනවා. [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා පිළිතුරු කථාව කරන්න. [බාධා කිරීම්]

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Rohitha Bogollagama - Minister of Foreign Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම - [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
මට බාධා කළ නිසා මගේ කථාව අවසන් කරන්න බැරි වුණා. ඔබතුමා මට තව තත්පර තිහක් දෙන්න මම අවසාන කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි කියන්නේ රටක් වශයෙන්, දේශපාලන වශයෙන් අපට එකඟ වන්න පුළුවන් තැනක් තිබෙන බවයි. මොකක්ද? අපේ මාතෘ භූමිය වෙනුවෙන් කටයුතු කරපු දේශපාලනඥයන්, හමුදා නිලධාරීන් විදේශ කුමන්ත්‍රණවලින් විතරක් නොවෙයි, දේශීය වශයෙනුත් ඔවුන්ට කරන පහර දීම්, ඔවුන්ට කරන නිග්‍රහ කිරීම්, ඔවුන්ට කරන අපහාස කිරීම් නතර කරලා, ජීවිතාන්තය දක්වා ආරක්ෂා කරන්න ඕනෑ. අපට ඒකට එකඟ වන්න පුළුවන්. එහෙම නැතුව අපට වෙනත් දේවලට එකඟ වන්න බැහැ. මම කියන්න කැමැතියි, ආණ්ඩුවේ ලොකු නිලධාරීන්ද ඇතුළු -[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුසම්මිල් මොහොමඩ් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් රජය වෙනුවෙන් කරුණු දක්වන්නට මේ අවස්ථාව ලබා දීම ගැන මම සන්තෝෂ වනවා.

මෙහිදී සරත් ෆොන්සේකා ජෙනරාල්තුමාගේ ඇමෙරිකා සංචාරය නිල සංචාරයක් නොවෙයි කියලා එක්සත් ජාතික පක්ෂය අර්ථ කථනය දැක්වුවා. මා මූලික වශයෙන් එයට පිළිතුරු දෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාව දැනුවත් කරන්න ඕනෑ. එතුමා ඇමෙරිකාවට ගියේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් උඩයි. එතුමා පෙන්ටගනයට නැත්නම් ඇමෙරිකාවේ ආරක්ෂක මණ්ඩලයට, ආරක්ෂක දෙපාර්තමේන්තුවට ගිහිල්ලා එතැන උසස් නිලධාරීන් හම්බ වෙලා ඇමෙරිකා එක්සත් ජනපදයේ සහකාර රාජ්‍ය ලේකම් රොබට් ඕ. බ්ලේක් මහතා මුණ ගැහෙන්න බලාපොරොත්තු වුණා. එතුමා මුණ ගැහෙන්න අවස්ථාව ලැබුණේ නැහැ. අනතුරුව තමයි එතුමා ඔක්ලහෝමාවල එතුමාගේ නිවසට යෑම සඳහා කටයුතු කළේ. ඉන් අනතුරුව තමයි අද මේ විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙන පණිවුඩය මූලික වශයෙන් ලැබුණේ. 28 වැනි දා එතුමාට ඔක්ලහෝමා ප්‍රාන්තය භාර එක්සත් ජනපදයේ ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ටෙලිෆෝන් පණිවිඩයක් ලැබුණා. ඒ ටෙලිෆෝන් පණිවිඩයේ අන්තර්ගත වුණේ ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ගැන, මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ චෝදනා ගැන සම්මුඛ සාකච්ඡාවකට එතුමාගේ පැමිණීම අපේක්ෂා කරනවා කියන එකයි. එයින් පැය 48කට පස්සේ සරත් ෆොන්සේකා ජෙනරාල්තුමා මේ ගැන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාව දැනුවත් කළා. ඒ කියන්නේ 30 වැනි දා. ඉන් අනතුරුව වොෂිංටනයේ ඉන්න, අපගේ නිත්‍ය තානාපති ජාලිය වික්‍රමසූරිය මහතා දැනුවත් කරලා එතුමාගේ සහාය ලබා දුන්නා රජය වෙනුවෙන්. එතුමා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා; ඉතාම උසස් නිලයක් දරන කෙනෙක්. එතුමාගේ අවශ්‍යතාව සඳහාත්, එතුමාගෙන් මේ ගැන පැහැදිලි කර ගැනීම සඳහාත් අවශ්‍ය සම්පූර්ණ රාජ්‍ය තාන්ත්‍රික සහයෝගය ලබා දෙන්නට කියලා අපි අපේ තානාපති ජාලිය වික්‍රමසූරිය මහතා දැනුවත් කළා. ඉන් අනතුරුව තමයි, ඒ සම්බන්ධයෙන් නොවැම්බර් 04 වැනි දින - ඒ කියන්නේ අද - ඔක්ලහෝමා ප්‍රාන්තයේ, ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලිපියක් එව්වේ, නොවැම්බර් මාසයේ 04 වැනි බදාදා සවස 3.00 වන කොට සරත් ෆොන්සේකා මැතිතුමාට ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන්න කියලා.

ගරු බිමල් රත්නායක මහතා විසින් ඇමෙරිකාවේ නීතිය ගැන අර්ථ කථනය වැරැදි ලෙස උපුටා දැක්වූවා. ඇමෙරිකානු රජයේ ස්ථාවරය, රට ඇතුළේ ඉන්න, ඇමෙරිකාවේ ජීවත් වන හෝ ඇමෙරිකාවට පැමිණෙන, ඇමෙරිකාවෙන් Green Card එකක් හෝ වේවා, යම් වීසා බලපත්‍රයක් හෝ වේවා එහි නිත්‍ය නිවැසියකු විධියට හෝ ලබා ගෙන ඇත්නම් මොන අපරාධයක් සම්බන්ධයෙන් හෝ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේ අවකාශයක් තිබෙන බවයි. ඒ හා සමගාමීව අපි කටයුතු කළා, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඇමෙරිකානු රජයට දන්වන්න. නොවැම්බර් 02 වැනි දින - පෝය දින - ලංකාවේ නිවාඩු දිනයක්. ශ්‍රී ලංකාවේ සිටින ඇමෙරිකා එක්සත් ජනපද තානාපතිවරිය වන පැට්‍රීසියා බුටෙනිස් මහත්මිය මගේ කාර්යාංශයට ගෙන්වලා මම එතුමියට ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළා. සරත් ෆොන්සේකා ජෙනරාල්වරයා ශ්‍රී ලංකාව වෙනුවෙන් කටයුතු කරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා, ඔහු දැන ගෙන තිබෙන සියලු තොරතුරු - privileged information හෙවත් වරප්‍රසාද සහිත තොරතුරු - කිසි විටෙකත් කිසිදු ආකාරයකින් තෙ වැනි පාර්ශ්වයකට ලබා දීමේ හැකියාවක් නොමැති බව කිව්වා. එහෙම නම් මේ තොරතුරු ගවේෂණය කිරීමට හෝ ලබා ගැනීමට හෝ යම් ක්‍රියාදාමයක් අනුගමනය කරන්නට ශ්‍රී ලංකා නිලධාරිවරයකු සම්බන්ධයෙන් කුමන හෝ විදෙස් රටක් කටයුතු කිරීම නීති විරෝධි, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් නොගැළපෙන, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව පලුදු කරන්නක් සහ උල්ලංඝනය කිරීමක් කියන එක අපි කිව්වා.

ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා ඇමෙරිකාවේ සංචාරයේ යෙදුණේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා විධියටයි. ඇමෙරිකාවේ ජීවත් වන පුරවැසියකු විධියට නොවෙයි. ඒ නිසා මම ඒ තත්ත්වය නොවැම්බර් 02 වැනි දා සවස 3.00ට ඇමෙරිකානු රජය වෙත ලිඛිතව දැනුම් දුන්නා. ඉන් පස්සේ ඒ හා සමගාමීව වොෂිංටන් නුවර සිටින අපේ තානාපතිවරයා ලවා ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව - the United States Department of State - වෙතත් ඒ කාරණය අපි ලිඛිතව යොමු කරවූවා. අපි දන්වා සිටියා, ඔක්ලහෝමා ප්‍රාන්තයේ අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් යවා තිබෙන ලිපියට අනුකූලව කෙරෙන සම්මුඛ පරීක්ෂණය වහාම නතර කළ යුතු බව හා එවැනි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමේ අවකාශයක් මේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව උඩ නොමැත යන්න අපේ ස්ථාවරය වන බව. ඒ වාගේම ඊට අනුව අපි පසු ගිය පැය 48 පුරාම සරත් ෆොන්සේකා මහතා වෙනුවෙන් එතුමා දරන ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි නිලයේ තිබෙන ගරුත්වයත්, එතුමාගේ පෞද්ගලික ගරුත්වයත් ආරක්ෂා කරන්නට අවශ්‍ය සියලු කටයුතු මෙහෙයවූවා. ඒ අනුව අපි එතුමා ඔක්ලහෝමා නුවරින් කැඳවා ගත්තා, වොෂිංටන් නුවර අපේ තානාපතිතුමා ළඟට. අපේ තානාපතිතුමාගේ ඒ ආරක්ෂාව යටතේ, ඒ සහයෝගය යටතේ එතුමා අද ඇමෙරිකාවෙන් එන්න පිටත් වෙලා තිබෙනවා. ඇමෙරිකාවේ වෙලාව බලන කොට අපට වඩා පැය 10ක් පිටුපසයි. ඇමෙරිකාවේ වොෂිංටන් නුවර Dulles Airport එකෙන් ලංකාවේ වේලාවෙන් අද උදේ 10.00ට අපේ තානාපතිතුමාගේ සම්බන්ධතාවෙන් එතුමා ගුවන්ගත වී දැන් එතුමා ලංකාවට එමින් සිටිනවා. මෙන්න මේකයි අප කළේ. Plane එකටත් ගිහින් භාර දීලා, එතුමාට තිබෙන ඒ ආගමන විගමන ක්ෂේත්‍රවලින් යම් බලපෑමක් ඇති වේවිය කියන කරුණු කාරණා සියල්ලම ආවරණය කරලා, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාව අපි ඒ තාක් දුරටම ගෙන ගිහිල්ලා කටයුතු කරලා තිබෙනවා කියන එක අද මට මේ ගරු සභාවේදී කියන්නට පුළුවන්. මා උදේ ඒක ගැන කිව්වේ නැත්තේ - අද උදේ මා කථා කරන කොට පෙ.ව. 10.30යි.- ඒ වන කොටත් ගුවන් යානය තිබුණේ Dulles Airport එකේ. ඒ නිසයි මා තව ටිකක් කාලය ගත්තේ, ඒක නියම විධියට පිටත් වෙන කල්. ඒ අනුව තමයි - [බාධා කිරීමක්] ඇමෙරිකාවේ වෙලාවත් මම දන්නවා, හුඟක් රටවල වෙලාවන් දන්නවා.

එම නිසා අද මේ ගරු සභාවේදී මා ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය මර්දනය කරන්නට ගෙන ගිය ඒ ක්‍රියාදාමය තුළ ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීත්වය ආරක්ෂා කළා පමණක් නොවෙයි, අද ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාවට යම් ආකාරයක බලපෑමක් ඇති වනවා නම් ඒ බලපෑම වළක්වන්නටත් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සියලු කටයුතු කිරීමේ හැකියාවත් තිබෙනවාය කියන එක.

අද ලංකාවේ පත්තරයකට JVP එකෙන් statement එකක් දුන්නා කියලා සරත් ෆොන්සේකා මැතිතුමාගෙන් ප්‍රශ්න නොකර ලංකාවට එවන්නේ නැහැ, අපි කොච්චර කතා කළත්. එතැන තමයි මේ සම්බන්ධතාව අප ගොඩ නඟන්නට ඕනෑ. අපි කරුණු කාරණා රටවල්වලට ඉදිරිපත් කරන්නට ඕනෑ. මේ රටේ තිබෙන ඒ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවත්, පිළිගැනීමත් සහ ඒ රටවල් අතර තිබෙන ඒ සහයෝගිතාව අපි එළි දක්වන්නට ඕනෑ. ඒ වාගේම ඇමෙරිකාවේ නීතිය ගැන අපි මෙතැන කතා කළ යුතු නැහැ. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඒ නීතිය ගැන යම් කොටසක් ආවරණය කළා. ඒක ගැන සම්පූර්ණයෙන් ආවරණයක් කරනවා නම්, අර්ථ නිරූපණයක් කරනවා නම් අපට ඉතාමත්ම පැහැදිලියි, ඇමෙරිකාවේ තිබෙන නීති පද්ධතිය ඒ රටේ සුවිශේෂී අවශ්‍යතාවන්වලට ගැළපෙන ආකාරයට සකස් කර ගෙන තිබෙන නීති පද්ධතියක් බව. කෙනකු Green Card එකක් බලාපොරොත්තුවෙන්, Green Card එකක අවසරයෙන්, Green

[ගරු රෝහිත බෝගොල්ලාගම මහතා]

Card එකක සහයෝගයෙන් තවත් රටක ජීවත් වෙන්න උත්සාහ කරනවා නම් ඒ රටේ නීති පද්ධතිය තුළ තමුන් ගැවසීමේ අවකාශය අනිවාර්යයෙන්ම අවශ්‍ය බව ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ වෙලා තිබෙනවා. එහෙම නම් අද ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා විධියට එතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්න අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හැම විටම කටයුතු කළා. ඒ සඳහා මට අවශ්‍ය සියලුම උපදෙස් ලබා දුන්නා. මේ අනුව තමයි අද අපට පුළුවන් වුණේ ඒ අවශ්‍යතාව හරියාකාරයට ඉෂ්ට කරන්න. මෙතැන දේශපාලනයක් නැහැ. එතුමා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා. එතුමා පිට රටක ඉන්න අවස්ථාවකදී අපේ ආරක්ෂක ලේකම්වරයා ගැන එතුමාගෙන් තොරතුරු ලබා ගන්න යම් උත්සාහයක් කරනවා නම්, ඒ නිසා අපේ ආරක්ෂක ලේකම්වරයාට ඒ අනුව අගතියක් කරන්න කටයුතු කරනවා නම් ඒක කිරීම වැළැක්වීමේ හැකියාව අපි සතුව තිබිය යුතුයි; විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය සතුව තිබිය යුතුයි. විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යවරයාට ඒ හැකියාව තිබෙන්නට ඕනෑ. විශේෂයෙන්ම අපට දක්වපු ඒ අන්‍යෝන්‍ය සහයෝගයට ඇමෙරිකානු රජයට මා මේ අවස්ථාවේදී කෘතවේදී වන්නට ඕනෑ. ඒ නිසායි මේ සා ඉක්මනට, අපි දැනුවත් වෙලා පැය 72ක් ඇතුළත සියලු කාර්යාංශවලින්, විශේෂයෙන්ම ඔක්ලහෝමාවලින් වොෂිංටන්වලට ගෙනැල්ලා, වොෂිංටන්වල තිබෙන ඒ සම්බන්ධතාවන් තුළින් අවශ්‍ය විධියට, නියම විධියට, නිසි ලෙසට නැවත එතුමාට ලංකාවට ඒමේ මාර්ගය සලසා දීමේ හැකියාව අපට ඇති වුණේ. විශේෂයෙන්ම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇහුවා ඇයි, එතුමාට යන්න දුන්නේ කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කතාව අවසන් කරන්න.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමාට යන්න දීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, නිල වශයෙන් පෙන්ටගනයට ගිහිල්ලා එතුමාගේ සාකච්ඡාව කරන්න එතුමාට හැකියාව තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. එතුමා යම් රටක රාජ්‍ය ලේකම්වරයෙක් නැත්නම් නියෝජ්‍ය රාජ්‍ය ලේකම්වරයෙක් නැත්නම් සහකාර රාජ්‍ය ලේකම්වරයෙක් මුණ ගැසීම වළක්වන්න අපිට අවශ්‍ය නැහැ. ඒක තමයි හරි ක්‍රමය. මොකද, ඒ කාලවලදී අපේ නොයෙකුත් අවශ්‍යතාවන් පිරිමසා ගන්න සහයෝගය ලැබුණු යම් යම් අවස්ථාවන් තිබෙනවා. මේ අනුව කටයුතු කිරීමට එතුමාටත් නිදහස තිබෙනවා. ඒ අනුව තමයි අපේ ගෞරවය එතුමාට ලබා දුන්නේ. ඒ වාගේම එතුමාට අගෞරවයක් වන අවස්ථාවේදී ශ්‍රී ලංකා රජය වශයෙන් මාණ්ඩලීය ප්‍රධානී ජනරාල් සරත් ෆොන්සේකා මහතා කිසිදු අතවරයකින් තොරව නැවත ලංකාවට කැඳවා ගැනීමේ කටයුත්තත් අපි ඉෂ්ට කර තිබෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මින් අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.15ට, 2009 නොවැම්බර් 05 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.15 மணிக்கு பாராளுமன்றம், 2009 நவம்பர் 05, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.15 p.m. until 9.30 a.m. on Thursday, 05th November, 2009.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 6.15 p.m. on 04.11.2009** |
| **Final set of manuscripts Received from Parliament** | **:** | **4.10 p.m. on 16.11.2009** |
| **Printed copies dispatched** | **:** | **19.11.2009 Morning** |

දායක මුදල්: පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු.2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍යා නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 5, කිරුළපන, මායා මාවත. අංක 132 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දා ට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 132, மாயா அவெனியு, கிருளப்பனை, கொழும்பு 5** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 132, Maya Avenue, Kirulapone, Colombo 5. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.